# සාර්ථකත්වයේ සබැඳියාව

PEOPLE'S LEASING

පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்

THE TRUSTED LEADER

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
වාර්ෂික වාර්තාව

**2021/22**

# සාර්ථකත්වයේ සබැඳියාව

වසංගතය මගින් අප හට එක් පාඩමක් ඉගැන්වූයේ නම්, ඒ වනාහී පීඩනය යටතේ වුවද යමක් සිදුකිරීමේ විෂයපථය පුලුල් කරන්නා වූ අනුගතවීමේ ක්‍රමෝපායක් අනුගමනය කිරීමේ වැදගත්කමයි. තිරසාරත්වයේ මූලිකාංග පවත්වාගෙන යන අතරතුර, සිදුකල හැකි උසස්ම ඩිජිටල් ක්‍රමවේදයන් ඔස්සේ, අපගේ සන්නාමය ව්‍යාප්ත කිරීම මුල් කරගෙන අපගේ ක්‍රමෝපාය ක්‍රියාවට නැංවුනි. මෙම වසරේදී, අපගේ ප්‍රගතිය කෙරෙහි ඩිජිටල් සේවාවන් බෙහෙවින් දායක වූ අතර, එහිදී ගනුදෙනුකරුවන් වෙත ඉහළ මට්ටමේ සේවාවක් ලබාදෙමින් අවිනිශ්චිත කාලසමයකදී වැඩිදුර සේවා පිවිසුමක් සහ පහසුවක් අත්විදීමේ අවස්ථාව උදා කරන ලදී.

එමනිසා, අවිනිශ්චිත යුගයකදී, අපි දිගින් දිගටම අප හා අපගේ පාර්ශ්වකරුවන් අතර සාර්ථක සබැඳියාවක් පවත්වා ගනිමින්, අප ප්‍රගතිය කරා යන ගමනේදී තිරසාර සබඳතා ගොඩනංවා ගැනීමට සමත් වීමු.

මෙම වාර්ෂික වාර්තාව අපගේ වෙබ් අඩවියෙහිද
පළ කොට ඇත.
www.plc.lk/pdf/ar/plc-annual-report-2021-22-English.pdf

අන්තර්ජාලය ඔස්සේ වැඩිදුර තොරතුරු සඳහා www.plc.lk වෙත පිවිසෙන්න.

# සාර්ථකත්වයේ සබැඳියාව

# සභාපතිවරයාගේ පණිවුඩය



"පීපල්ස් ලීසිං මගින් ශ්‍රී ලාංකීය ප්‍රජාව හා අත්වැල් බැඳගනිමින්, දෙපාර්ශ්වයේම අරමුණු හා අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීමෙහිලා වන සේවා චාරිකාවේ 25 වැනි සංවත්සරය සමරන ලදී. මෙම වසරේදී බොහෝ අභියෝගයන් මධ්‍යයේ ගනුදෙනුකරුවන් වෙත අපරිමිත සහන ලබාදෙමින්, රු. බිලියන 4.66 ක් වූ අපගේ ඉහළම බදු පසු ලාභය වාර්තා කිරීමට හැකිවීම ඔස්සේ සමාගමෙහි පළමු ආයතනික මාර්ගෝපදේශී ප්‍රතිපත්තිය වෙත අපගේ වන කැපවීම මැනවින් පිළිබිඹු කෙරේ. ලෝක ආර්ථිකය යථා තත්ත්වය පත්වෙමින් ඇති පසුබිමක් තුල තිරසාර හා නම්‍යශීලී දේශීය ආර්ථිකයක් ගොඩනංවා ගැනීමෙහිලා වන අභියෝගාත්මක වටපිටාව තුළ මෙකී ප්‍රතිපත්තිය අන් කවරදාටත් වඩාත් වර්තමානය තුළ වැදගත් වේ. ඩිජිටල්කරණය වසර තුළ ක්‍රමෝපායික ප්‍රමුඛතාව වූ අතර අප විසින් අපගේ ක්‍රියාවලීන් අනුකූලනය සදහා පියවර ගන්නා ලදී. ඉන් අනතුරුව ලද කඩිනම් ජයග්‍රහන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත් වූ අතර වැඩි වැඩියෙන් ව්‍යාපෘතිමය සන්ධිස්ථානයන් අත්පත් කරගැනීම සඳහා වන කැපවීම සැබැවින්ම දිරිගන්වන සුලු විය. අපගේ පළමු ප්‍රතිපත්තියෙහි දක්වා ඇති පරිදි, පිරිවැය අවම කරගනිමින් ගනුදෙනුකරුවන් වෙත විශිෂ්ට සේවාවක් සැලසීම සඳහා වන අපගේ මීළග සේවා පරිච්ඡේදය තුළ මෙකී පරිවර්තනය වැදගත් තැනක් ගනු ලබන අතර එය මවිසින් වසර තුළදී අප විසින් අත්පත් කරගන්නා ලද සාර්ථකත්වයෙහි සබැඳි තේමාව වශයෙන් යොදා ගැනිනි."

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය



"ගනුදෙනුකරුවන් වෙත අති විශිෂ්ට සේවාවක් සැපයීමේ 25 වසරක සන්ධිස්ථානය සනිටුහන් කිරීමට අතිශය යෝග්‍ය වූ පසුබිමක් සකසමින්, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වසරේදී පීපල්ස් ලීසිං මගින් එදා මෙදා තුර සමාගමෙහි ඉහළම බදු පසු ලාභය වන රුපියල් බිලියන 4.66 වාර්තා කරන ලද බව ප්‍රකාශ කරනුයේ ඉමහත් සතුටිනි. බෙදාහාදාගත් සෞභාග්‍යය කාලීන අවශ්‍යතාවයක් වන මේ යුගයේදී, අවිනිශ්චිතතාවය සහ දෝෂ සහගත තත්ත්වයන් වර්ධනය වෙමින් පැවති අඛණ්ඩ තෙවන වසරේදී, ගනුදෙනුකරුවන් සහ සේවකයින් සමග එක්ව කටයුතු කරමින් ඔවුන් වෙත අපරිමිත වටිනාකම් නිර්මාණය කිරීමට සමාගම සමත් විය. මෙකී ප්‍රතිඵල මගින් අපගේ වටිනාකම් සහ දර්ශනය තුළ ජීවත් වෙමින්, අප සමාගම නිර්මාණය කිරීමෙහිලා අප සේවා කණ්ඩායම තුළ පැවති අප්‍රතිහත ධෛර්‍යය විදහා දක්වේ. අපගේ සැලසුම වනුයේ පරිපූර්ණ සහ ඵලදායී ඩිජිටල් පරිවර්තනයක් කෙරෙහි වන අතර, එහිදී අත්කර ගනු ලබන ප්‍රගතිය සමග අපගේ බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වකරුවන් සමගාමීව තබා ගනිමින් අදාළ පරිවර්තිත ක්‍රියාවලීන් ගනුදෙනුකාර පහසුව, සවිබලකරණය සහ වේගවත් සැකසුම් කාලසීමාවන් කෙරෙහි යොමු වන බවට තහවුරු කෙරේ. වසර තුළදී අත්කර ගත් ජයග්‍රහනයන් සැබැවින්ම දිරිගන්වන සුලු වූ අතර එළඹෙන වසරේදී අපගේ පරිවර්තන ක්‍රියාවලිය ඵලදායී අයුරින් ඉදිරියට ගෙනයාම අපගේ අපේක්ෂාව වේ."

ශමින්ද්‍ර මර්සලින්
*ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී*

# මූල්‍ය ප්‍රාග්ධනය

**රු. බිලියන 4.66**
බදු පසු ලාභය
(2020/21 - රු.බිලියන 4.03)

**රු. බිලියන 13.05**
ශුද්ධ පොලී ආදායම
(2020/21 - රු. බිලියන 11.92)

**රු. බිලියන 180.76**
සමස්ත වත්කම්
(2020/21 - රු. බිලියන 166.55)

## ආයෝජක තොරතුරු

| වෙළඳපොළ ප්‍රාග්ධනය | |
|---|---|
| වසර | (රු. බිලියන) |
| 2020/21 | 20.11 |
| 2021/22 | 15.29 |

| කොටසකට ශුද්ධ වත්කම් | |
|---|---|
| වසර | රු. |
| 2020/21 | 20.15 |
| 2021/22 | 20.57 |

| කොටසකට අවසාන වෙළඳපොළ මිළ | |
|---|---|
| වසර | රු. |
| 2020/21 | 11.80 |
| 2021/22 | 8.10 |

| ලාභාංශ ගෙවීමේ අනුපාතය | |
|---|---|
| වසර | (%) |
| 2020/21 | 24.22 |
| 2021/22 | 46.79 |

අපහායන ගාස්තු සහ වෙනත් අලාභ




කොටස් හිමිකරුවන්ගේ අරමුදල




තැන්පතු




ණය සහ ලැබිය යුතු දේ කළඹ



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## පළාත් අනුව ශාඛාජාලා ව්‍යාප්තිය

| පළාත | ශාඛා සංඛ්‍යාව | කවුළු කාර්යාල | රන් ණය මෙහෙයුම් ශාඛා |
|---|---|---|---|
| උතුරු පළාත | 7 | 6 | 6 |
| වයඹ පළාත | 11 | 7 | 4 |
| මධ්‍යම පළාත | 11 | 7 | 8 |
| උතුරු මැද පළාත | 7 | 6 | 4 |
| නැගෙනහිර පළාත | 8 | 8 | 3 |
| බස්නාහිර පළාත | 36 | 4 | 15 |
| සබරගමුව පළාත | 9 | 10 | 2 |
| ඌව පළාත | 6 | 5 | 1 |
| දකුණු පළාත | 16 | 9 | 3 |

දේපළ, පිරියත සහ උපකරණ සංයුතිය



# බුද්ධිමය ප්‍රාග්ධනය

**රු. බිලියන 6.51**
සන්නාම වටිනාකම
(2020/21 - රු. බිලියන 8.13)

**රු. මිලියන 21.97**
අස්පෘශ්‍ය වත්කම්
(2020/21 - රු. මිලියන 146.45)

**වසර 18,000 කට අධික**
සේවකයින්ගේ සමුච්චිත සේවා කාලය
(2020/21 - වසර 17,000 කට අධික)




# මානව ප්‍රාග්ධනය

**2,245**
සමස්ත සේවක සංඛ්‍යාව
(2020/21 - 2,343ක)

**90.16%**
රඳවාගැනීමේ අනුපාතය
(2020/21 - 93.80%)

**144**
නව බඳවාගැනීම්
(2020/21 - 81)



# සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

**125,789**
ණය හිමි ගනුදෙනුකරුවන්
(2020/21 - 177,773)

**රු. මිලියන 27.53**
ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන්හි ආයෝජනය
(2020/21 : රු. මිලියන 17.60)

**309,977**
තැන්පතු ගනුදෙනුකරුවන්
(2020/21 291,319)

**382,913**
සමස්ත ගනුදෙනුකරුවන්
(2020/21 : 353,414)

භූගෝලීය වශයෙන් ගනුදෙනුකරුවන්ගේ බෙදීයාම




# ස්වභාවික ප්‍රාග්ධනය

**4,681.72**
සමාගමෙහි කාබන් පියසටහන
($tCO_2e$)
(2020/21 : 3,810.88$tCO_2e$)

**5.182.58**
සමූහයෙහි කාබන් පියසටහන
($tCO_2e$)
(2020/21 - 4,381.67$tCO_2e$)

**රු. මිලියන 1.87**
පාරිසරික සංරක්ෂණය සඳහා ආයෝජනය
(2020/21 : රු. මිලියන 2.77)

# තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා වන අපගේ සමෝධානික එළඹුම

සාරාංශගත විග්‍රහය

| මෙහෙයුම් පරිසරය කෙරෙහි බලපෑම | ප්‍රාමාණික තේමාව | වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේදී අවධානය යොමුවූ තිරසාර සංවර්ධන ඉලක්ක | වටිනාකම් නිර්මාණය/සංරක්ෂණය සහ හානිවීම | ක්‍රමෝපායික අරමුණු | ප්‍රමුඛ ප්‍රාග්ධන සහභාගීත්වයන් |
|---|---|---|---|---|---|
| ලෝක ප්‍රවණතාවක් වශයෙන් සහ නූතන ආර්ථිකයේ වර්ධන සාධකයක් වශයෙන් ඩිජිටල්කරණය | ඩිජිටල්කරණය | 8, 9, 11 | ඩිජිටල්කරණය සේවක කාර්යක්ෂමතාවය සහ ඵලදායීත්වය වර්ධනය කිරීමෙහිලා උපකාරී වේ. එමගින් පිපල්ස් ලීසිංහි සේවාවන් සැකසීමේ කාලය වර්ධනය කරමින් ගනුදෙනුකරුවන් හට පුලුල් පරාසයක පැතිරුනු ගනුදෙනු රැසක් සිදුකිරීමේ අවස්ථාව උදා වේ. | තිරසාර වර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම<br>ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>නිෂ්පාදිත ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| ක්ෂේත්‍රයේ සමාගම් අතර තියුණු තරගකාරීත්වය | ගනුදෙනුකාර අත්දැකීම | 16 | ගනුදෙනුකාර අත්දැකීම, සමාගමෙහි කීර්තිනාමය හා සන්නාමය මෙන්ම තැන්පතු හා ණය ලබාදීමේ කළඹෙහි තිරසාර වර්ධනය සම්බන්ධ ප්‍රධාන තරගකාරී වාසියක් වේ. | ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| ලෝක ආර්ථික අවගමනය<br>ක්‍රමිකව දැඩි වන්නා වූ මූල්‍ය ප්‍රතිපත්තිය<br>වසංගතය මගින් රටේ ආර්ථිකය වෙත අහිතකර බලපෑම<br>ක්ෂේත්‍රය මන්දගාමී වර්ධනයක් විඳහා දක්වීය | තිරසාර මූල්‍ය ඔස්සේ තිරසාර වර්ධනය | 8, 9 | තිරසාර මූල්‍ය සැලසුම් මගින්, සිය කාර්යයන් සම්බන්ධයෙන් වගකීමේ අවශ්‍යතාව පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කරමින්, සමාජ හා පාරිසරික ක්‍රියාපටිපාටිය වෙත ඔවුන්ගේ අනුකූලතාවය තහවුරු කෙරේ. | තිරසාර වර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම<br>ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය | මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>ස්වභාවික ප්‍රාග්ධනය |

| ඉලක්කගත ප්‍රධාන පාර්ශවකරුවන් | අපගේ ප්‍රතිචාරය | බලපෑම | අවදානම් කාණ්ඩය | GRI තේමාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
|---|---|---|---|---|
| ගනුදෙනුකරුවන්<br>සේවකයින් | භෞතික මධ්‍යස්ථාන මත පදනම්වූ සංකල්පයන්ට සීමා නොවූ නව්‍ය ගනුදෙනුකාර අත්දැකීම්<br><br>(PLC Touch/QR/DCHEQUE/CAPP) | අගය එකතු කල සේවා විශිෂ්ටත්වය තුළින් සවිමත් ගනුදෙනුකාර බලඇණියක් සහ තිරසාර තරගකාරී වාසිය<br><br>නව්‍ය හා පරිපූර්ණ විසඳුම් ඔස්සේ සන්නාමය සවිමත් කරන්නා වූ සවිබලග න්වන ලද සහ කැපවීමෙන් යුතු ශ්‍රම බලකාය | මෙහෙයුම් අවදානම<br><br>තොරතුරු තාක්ෂණ හා තොරතුරු සුරක්ෂිතතා අවදානම | |
| ගනුදෙනුකරුවන්<br>සේවකයින් | නව්‍ය පහසුකම් හඳුන්වාදීම සහ ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය | අගය එකතු කල සේවා විශිෂ්ටත්වය තුළින් සවිමත් ගනුදෙනුකාර බලඇණියක් සහ තිරසාර තරගකාරී වාසිය<br><br>පාර්ශ්වකාර විශ්වාසය ආකර්ශනය කරගන්නා වූ සහ රඳවාගන්නා වූ සවිමත් සන්නාම වටිනාකම සහ ස්ථාවර වෙළඳපොළ කොටස | කීර්තිනාම අවදානම | GRI 417 |
| දේශීය ප්‍රජාවන්<br>ගනුදෙනුකරුවන් | පීපල්ස් ලීසිං මගින් අඛණ්ඩවම සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යවසායකයින් සඳහා ණය ලබාදීම සහ හරිත ණය ප්‍රවර්ධනය කෙරෙන අතර, එහිදී තිරසාර මූල්‍යකරණ ප්‍රතිපත්ති අනුග මනය කෙරේ.<br>තවද, පසුගිය වසර තුන පුරා සපයන ලද සමාසහන සහ සෙසු සහන මගින් තිරසාර මූල්‍යකරණය කෙරෙහි වන සමාගමෙහි කැපවීම තහවුරු කෙරේ. | ලාභදායීත්වය සහ ව්‍යාපාරික පරිමා වර්ධනය ස්ථාවර හා ප්‍රබල සමාගමක් බිහිවීම කෙරෙහි හේතු වේ.<br><br>අවිනිශ්චිත සමාජ ආර්ථික වටපිටාවක් තුළ තිරසාර ව්‍යාපාරික වර්ධන අවනුවවන් කටයුතු කරන ලදී. | ණය අවදානම<br><br>ක්‍රමෝපායික අවදානම | GRI 201 |

# තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා වන අපගේ සමෝධානික එළඹුම (සබැඳේ)

සාරාංශගත විග්‍රහය

| මෙහෙයුම් පරිසරය කෙරෙහි බලපෑම | ප්‍රාමාණික තේමාව | වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේදී අවධානය යොමුවූ තිරසාර සංවර්ධන ඉලක්ක | වටිනාකම් නිර්මාණය/සංරක්ෂණය සහ හානිවීම | ක්‍රමෝපායික අරමුණු | ප්‍රමුඛ ප්‍රාග්ධන සහභාගීත්වයන් |
|---|---|---|---|---|---|
| රට දරුණු ආර්ථික අර්බුදයක් අත්දකිමින් සිටී | මූල්‍යමය තිරසාරත්වය | 1, 8, 9, 10, 11, 12 | සියලු පාර්ශ්වකරුවන්ගේ අභිමතයන් සුරකිනමින්, රටෙ ආර්ථික අර්බුදය තුළ පීපලස් ලීසිං මූල්‍යමය වශයෙන් ස්ථාවරව සිටින බවට තහවුරු කිරීම | තිරසාර වර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම<br>අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය මගින් ක්‍රියාවට නැංවීම තුලින් විශිෂ්ටත්වය අත්කර ගැනීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| ලෝක වසංගත තත්වයන් | සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව | 3, 8, 16 | 2020 මාර්තු මස සිට, කෝවිඩ් 19 වසංගතය මගින් ව්‍යාපාර කටයුතු කෙරෙහි බාධා පමුණුවන ලදී. එහිදී අප විසින් අපගේ සේවකයින් වෙත සුරත්ෂිත සේවා වටපිටාවක් සහ ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ සේවාවක් සපයන ලදී. | තිරසාර වර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම<br>අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය | මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක වෙත අනුකූලතාවය | සම්පත් ප්‍රශස්තීකරණය | 3, 6, 7, 8, 11, 12, 13, 14, 15 | සම්පත් ප්‍රශස්තීකරණය කාර්යක්ෂමතාවය සහ ලාභ කොටස වර්ධනය සහ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කෙරෙහි අතිශය වැදගත් වන අතර එය සමෝධානික චින්තනයේ මූලික පදනම වේ | පාරිසරික සහ සමාජයීය සාධක සමෝධානය | මූල්‍ය ප්‍රාග්ධනය<br>නිෂ්පාදිත ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>ස්වභාවික ප්‍රාග්ධනය |

| ඉලක්කගත ප්‍රධාන පාර්ශවකරුවන් | අපගේ ප්‍රතිචාරය | බලපෑම | අවදානම් කාණ්ඩය | GRI තේමාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
|---|---|---|---|---|
| දේශීය ප්‍රජාවන්<br>ගනුදෙනුකරුවන්<br>ආයෝජකයින්<br>සේවකයින්<br>ව්‍යාපාර සහකරුවන්<br>රජය සහ නියාමකයින් | නව රථවාහන සඳහා කල්බදු වලින් ඔබ්බට ගිය විවිධාංගීකෘත පහසුකම් කළඹක් සහ නව පහසුකම් සම්බන්ධ අවදානම කළමනාකරණය | මූල්‍යමය ස්ථාවරත්වය, තිරසාර ව්‍යාපාරික වර්ධනයේ වඩාත්ම වැදගත් ප්‍රමුඛතාවය බවට පත්ව ඇත. | ක්‍රමෝපායික අවදානම් | |
| සේවකයින්<br>ගනුදෙනුකරුවන්<br>දේශීය ප්‍රජාවන් | කෝවිඩ් ප්‍රතිකාර සහ සත්කාර සවිමත් කිරීම උදෙසා රජයේ රෝහල් සහ කඩිනම් සත්කාරක මධ්‍යස්ථාන වෙත වෛද්‍ය සහ වෛද්‍යමය නොවන උපකරණ පරිත්‍යාග කිරීම<br>රෝගී හිතකාමී වටපිටාවක් නිර්මාණය කිරීමෙහිලා රිජ්වේ ආර්යා රෝහලෙහි සහ මහරගම අපේක්ෂා රෝහලෙහි මින් මැදුරු පවත්වා ගෙන යාම<br>කෝවිඩ් පූර්වෝපාය වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවන්හි විශේෂිත විධිවිධාන යෙදීමට කටයුතු කිරීම<br>තංගල්ල මූලික රෝහලෙහි ඉදිරි පරිශ්‍රය සහ මූලික ප්‍රතිකාර ඒකකය පිළිසකර කරමින් රෝද පුටු දෙකක් පරිත්‍යාග කිරීම | සමාජ ආර්ථික අවිනිශ්චිතතාව මධ්‍යයේ වුවද තිරසාර වර්ධනය අත්පත් කරගන්නා ලදී | මෙහෙයුම් අවදානම<br>මානව සම්පත් අවදානම | GRI 403<br>GRI 410<br>GRI 416<br>GRI 418 |
| දේශීය ප්‍රජාවන්<br>ගනුදෙනුකරුවන්<br>ආයෝජකයින් | දිගු කාලීනව හරිත ශාඛා සංකල්පය<br>දඹුල්ල සීගිරිය බලකොටුව සහ පොළොන්නරුව ගල් විහාරයේ සන අපද්‍රව්‍ය වෙන්කිරීමේ ඒකක සවිකරීම<br>පින්නවල අලි අනාථාගාරයෙහි අධ්‍යාපනික දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම<br>පාරිසරික සවිඥාණිකත්වය සහිත ආයතනික සහකරුවකු වශයෙන් බැද්දගාන තෙත් බිම් උද්‍යානයේ පාරිසරික සංරක්ෂණ පුවරු සවිකිරීම. | සම්පත් සංරක්ෂණයෙහි ලා ඩිජිටල්කරණය සහ පිරිවැය අරපිරිමැසුම් දායක වැඩසටහන් ඇතුලු කඩදාසි රහිත ව්‍යපෘතීන් ක්‍රියාත්මක කිරීම | මෙහෙයුම් අවදානම<br>ක්‍රමෝපායික අවදානම<br>කීර්තිනාම අවදානම | GRI 302<br>GRI 305<br>GRI 306 |

## තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා වන අපගේ සමෝධානික එළඹුම (සබැඳේ)

සාරාංශගත විග්‍රහය

| මෙහෙයුම් පරිසරය කෙරෙහි බලපෑම | ප්‍රාමාණික තේමාව | වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේදී අවධානය යොමුවූ තිරසාර සංවර්ධන ඉලක්ක | වටිනාකම් නිර්මාණය/සංරක්ෂණය සහ හානිවීම | ක්‍රමෝපායික අරමුණු | ප්‍රමුඛ ප්‍රාග්ධන සහභාගීත්වයන් |
|---|---|---|---|---|---|
| රජය විසින් දේශීය ආර්ථිකය නගා සිටුවීමෙහිලා පුද්ගලික හා රාජ්‍ය හිමිකාරීත්වය සහිත ආයතන වලින් සහාය ඉල්ලා සිටින ලදී | අන්තර්ග්‍රහනය කරන ලද මූල්‍ය සහ අවම අසමානතා | 1, 8, 9, 10 | අපගේ පැවැත්ම පිළිබඳ සාමූහික අරමුණ සහ රටේ අන්තර්ග්‍රහනය කරන ලද වර්ධනය උදෙසා ගනු ලැබූ ප්‍රමුඛ පියවර | ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| වර්තමාන තරගකාරී පීඩනය තුළ ප්‍රශස්ත කුසලතා ආකර්ශනය සහ රඳවාගැනීම | මානව කුසලතා සංවර්ධනය | 4, 5, 8, 10 | අපගේ සේවකයින් අපගේ සේවය පිළිබඳ තානාපතිවරුන් වන අතර ඔවුන් පුහුණු කිරීම මගින් සේවක කාර්යසාධනය, සහභාගීත්වය සහ රඳාපැවැත්ම වර්ධනය වේ. අප විසින් සමස්ත සමාජය නගා සිටුවීම සඳහා එහි වන දායකත්වය පිළිබඳ අවබෝධ කොට ගෙන ඇත. අප විසින් ඉහළ මට්ටමේ අධ්‍යාපනය අගය කොට සළකනු ලබන අතර බොහෝ ආකාරයන්ගෙන් අධ්‍යාපනික අභිවෘද්ධිය සඳහා අතහිත දෙනු ලැබේ. | අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය මගින් ක්‍රියාවට නැංවීමේ විශිෂ්ටත්වය අත්කර ගැනීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| රෙගුලාසි වෙත අනුකූල වීම සහ විනිවිදභාවයේන යුතු සමාගමක් වශයෙන් පැවැත්ම ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයෙහි කඩිනම් අවශ්‍යතාවය් බවට පත්ව ඇත | ආචාරධර්ම, සුපිළිපන්බව සහ අනුකූලතාවය | 1, 5, 8, 10, 16, 17 | නියාමිත ක්ෂේත්‍රයක් තුළ මෙහෙයුම් සිදුකිරීමේදී, ආචාරධර්ම, සුපිළිපන්බව සහ අනුකූලතාවය අපගේ සෑම කාර්යයකටම පාහේ බලපායි | සදාචාර සම්පන්න, විවෘත සහ විනිවිදභාවයෙන් යුතු සේවා වටපිටාවක් පවත්වාගෙන යාම තුළින් වගකීම් සහගත නියමුත්වය අන්තර්ග්‍රහනය<br>සමෝධානික මෙහෙයුම් සහ සමාජයීය සාධක | මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |

| ඉලක්කගත ප්‍රධාන පාර්ශවකරුවන් | අපගේ ප්‍රතිචාරය | බලපෑම | අවදානම් කාණ්ඩය | GRI තේමාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
|---|---|---|---|---|
| දේශීය ප්‍රජාවන්<br>ගනුදෙනුකරුවන් | අපගේ සැලසුම් බොහොමයක් අන්තර්ග්‍රහන මූල්‍යකරණය සහ ගනුදෙනු කිරීමේ පහසුව සළසයි | සමාජ හා පාරිසරික අසමානතා කළමනාකරණය<br><br>වගකීම් සහගත මූල්‍ය සහ ප්‍රජාවන් කෙරෙහි ආයෝජනය තුළින් සවිබල ගන්වන ලද ප්‍රජාවන් | ණය අවදානම | |
| සේවකයින් | පුහුණු පැය 110,764 ක් (LMS පුහුණුව ඇතුලුව)<br><br>දිරිගැන්වීමේ වැඩසටහන් (ප්‍රධාන කාර්යාලය සහ දීප ව්‍යාප්ත ශාඛාවන්)<br><br>ජූලි සහ ජනවාරි මාස වලදී පදනම් හා අන්තර්මධ්‍ය මට්ටමේ දෙවන පෙළ කුසලතා තිළිණ සඳහා AAT තිළිණ පදනම වෙත මූල්‍ය සහාය පිරිනමන ලදී. | නව්‍ය සමස්ත විසඳුම් ඔස්සේ සන්නාමය සවිමත් කරන්නා වූ සවිබලගන්වන ලද කැප වූ ශ්‍රම බලකාය<br><br>ඉහළ සහභාගීත්වයක් සහිත, තෘප්තිමත් සහ දිරිගන්වන ලද ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම<br><br>වඩාත්ම යෝග්‍ය වූ කුසලතා ආකර්ශනය සහ රඳවා ගැනීම | මානව සම්පත් අවදානම | GRI 401<br>GRI 404<br>GRI 405<br>GRI 406<br>GRI 407 |
| රජය සහ නියාමකයින් | දැඩි සාංගමික පාලන ක්‍රියාකාරකම් පවත්වාගෙන යන ලදී<br><br>අපගේ විනිවිදභාවයෙන් යුතු වාර්තාකරණ පද්ධතීන් ආවර්තිතව හඳුනාගනිමින් ඇගයුමට ලක් කරන ලදී | දැඩි පාලනය, නියාමන පාලනය සහ වැඩිදියුණුකරන ලද අවදානම් කළමනාකරණය සඳහා ඉල්ලුම<br><br>තිරසාර බෙදාහදාගත් වටිනාකමක් නිර්මාණය කිරීමෙහිලා ජාතික හා දේශීය ප්‍රමුඛතාවන් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී | අනුකූලතා අවදානම | GRI 205<br>GRI 207<br>GRI 307<br>GRI 308<br>GRI 413<br>GRI 414<br>GRI 419 |

## තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා වන අපගේ සමෝධානික එළඹුම (සබැඳේ)

සාරාංශගත විග්‍රහය

| මෙහෙයුම් පරිසරය කෙරෙහි බලපෑම | ප්‍රාමාණික තේමාව | වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියේදී අවධානය යොමුවූ තිරසාර සංවර්ධන ඉලක්ක | වටිනාකම් නිර්මාණය/සංරක්ෂණය සහ හානිවීම | ක්‍රමෝපායික අරමුණු | ප්‍රමුඛ ප්‍රාග්ධන සහභාගීත්වයන් |
| --- | --- | --- | --- | --- | --- |
| වර්තමාන බලශක්ති අර්බුදය සහ ඉහළ උද්ධමන පීඩනය මගින් ප්‍රජාවගේ ක්‍රය ශක්තිය පහත හෙළනු ලැබ ඇත | ගනුදෙනුකාර මූල්‍යමය සෞඛ්‍යය |  | වර්තමාන බලශක්ති අර්බුදය තුළ මගී ප්‍රවාහන ක්ෂේත්‍රය වෙත සමාගමෙහි නිරාවරනය සැළකිය යුතු බලපෑමකට ලක් වූ අතර මෙකී ගනුදෙනුකරුවන් හට ක්‍රියාකාරී එළඹුම් ඔස්සේ සිය ජීවනෝපාය යථා තත්ත්වයට පත් කර ගැනීමට සහාය වීම ණය අවදානම කළමනාකරණයේදී ප්‍රමුඛතාවක් විය | තිරසාර වර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය |
| වර්තමාන බලශක්ති අර්බුදය තුළ මගී ප්‍රවාහන ක්ෂේත්‍රය සැළකිය යුතු බලපෑමකට ලක් විය. | ව්‍යාපාරික අඛණ්ඩතාවය |  | බැංකු නොවන මූල්‍ය ආයතන සාමාන්‍යයෙන් අත්‍යාවශ්‍ය සේවාවක් වශයෙන් සැලකෙන බැවින් ව්‍යාපාරික පරිශ්‍රයන් මෙහෙයුම් තත්ත්වයෙන් පවත්වා ගෙන යාම අවශ්‍ය විය. අඛණ්ඩ බලශක්ති අර්බුදය පීපල්ස් ලීසිං හි මෙහෙයුම් සඳහා බලපෑම් ඇති කල හැකි පසුබිමක් හමුවේ ව්‍යාපාර අඛණ්ඩත්වය පවත්වා ගෙන යාම ප්‍රධාන ප්‍රමුඛතාවක් බවට පත් ව ඇත. | තිරසාර වර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම | මූල්‍ය ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය |
| කාලගුණ විපර්යාස පිළිබඳ විශ්වීය දැක්ම | කාලගුණ ක්‍රියාමාර්ග |  | පීපල්ස් ලීසිං මගින් සිය ක්‍රියාවලීන් වෙත වෙනස්කම් සිදුකරමින් සහ මූල්‍ය සැලසුම් වෙත එහා පිවිසුම වෙනස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කරමින් පහළ මට්ටමේ කාබන් ආර්ථිකයක් වෙත පරිවර්තනය වීමේ අවශ්‍යතාවය කෙරෙහි සහාය දක්වනු ලැබේ. | පරිසර හා සමාජයීය සාධක සමෝධානය | මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>සමාජ හා සබඳතා ප්‍රාග්ධනය<br>ස්වභාවිකප්‍රාග්ධනය |

| ඉලක්කගත ප්‍රධාන පාර්ශවකරුවන් | අපගේ ප්‍රතිචාරය | බලපෑම | අවදානම් කාණ්ඩය | GRI තේමාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
|---|---|---|---|---|
| ගනුදෙනුකරුවන්<br>දේශීය ප්‍රජාවන් | ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඔස්සේ බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන් වෙත සහන ලබාදීම උදෙසා "හිතමිතුරු" වැඩසටහන හඳුන්වාදීම | අනාගතයට ගැළපෙන ව්‍යාපාර කටයුතු සඳහා අධාර සපයන ලදී | ණය අවදානම | |
| සේවකයින්<br>ගනුදෙනුකරුවන් | පීපල්ස් ලීසිං මගින් සිය ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම් නැවත විමසා බලමින් වර්තමාන අභියෝග පිළිබිඹු වන පරිදි ඒවා ප්‍රතිශෝධනය කරන ලදී. | ව්‍යපාර අඛණ්ඩත්වය තහවුරු කරමින්, ව්‍යාපාරික ක්‍රමෝපාය රටේ මෑතකාලීන ආර්ථික වෙනස්වීම් සමග අනුකූලනය කරන ලදී. | මෙහෙයුම් අවදානම<br>ක්‍රමෝපායික අවදානම | |
| දේශීය ප්‍රජාවන්<br>ගනුදෙනුකරුවන් | සංරක්ෂණය සම්බන්ධ සවිඥාණික සහකරුවකු වශයෙන් බැද්දගාන තෙත් බිම් උද්‍යානයේ පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු ස්ථාපනය<br>දිගු කාලීව හරිත ශාඛා සංකල්පය<br>කඩදාසි රහිත කාර්යාල ව්‍යාපෘතීන් | සේවා පරිශ්‍රය වෙත පහළ කාබන් ආර්ථිකයක අවශ්‍යතාවය අවබෝධ කෙරෙන්නා වූ වටපිටාවක් පිළිබඳ සමාජයානුයෝජනය | | GRI 302<br>GRI 305<br>GRI 306 |

# ඉදිරි දැක්ම




ණය ගුණාත්මකභාවය වර්ධනය කිරීම

ප්‍රශස්ථ ලෙස ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාම

ණය වර්ධනය සමගින් තැන්පතු වර්ධනය අනුකූලනය

පුනර්ජනනීය බලශක්ති මූලයන් තිරසාර අයුරින් භාවිත කිරීම

# පටුන


## 01
**ආයතනික විග්‍රහය**
මෙම වාර්තාව පිළිබඳව 1
අප සමාගම පිළිබඳව 3
අපගේ ගමන්මග 10
සභාපතිවරයාගේ පණිවුඩය 14
ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය 18

## 23
**වටිනාකම් නිර්මාණ ආකෘතිය**
වටිනාකම් නිර්මාණ ආකෘතිය 26
පාර්ශ්වකාර සහභාගීත්වය 28
මෙහෙයුම් වටපිටාව 31
ප්‍රාමාණිකත්වය 34
අපගේ ක්‍රමෝපාය 40

## 44
**කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය**
සමූහ ව්‍යාපාර රේඛා සමාලෝචනය 45
මූල්‍ය ප්‍රාග්ධනය 60
නිෂ්පාදිත ප්‍රාග්ධනය 76
බුද්ධිමය ප්‍රාග්ධනය 80
මානව ප්‍රාග්ධනය 88
සමාජ හා සබඳතා ප්‍රාග්ධනය 96
ස්වභාවික ප්‍රාග්ධනය 106

## 116
**නායකත්වය**
අධ්‍යක්ෂ මණ්ඩලය 117
ආයතනික කළමනාකාරීත්වය 121
ආයතනික පාලනය 124
සමාගමෙහි කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 156
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 162
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 164
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු විමර්ශන කමිටු වාර්තාව 166
නාමයෝජනා කමිටු වාර්තාව 168
අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 170
අනුකූලතා අවදානම් කළමනාකරණය 173
අවදානම් කළමනාකරණ සමාලෝචනය 176

## 198
**මූල්‍ය වාර්තා**
මූල්‍ය දින දර්ශනය 199
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම 200
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව 202
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 203
ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම් ප්‍රකාශය 204
ස්වාධීන විගණකවරයාගේ ප්‍රකාශය 205
මූල්‍ය ප්‍රකාශය - අන්තර්ගතය පිළිබඳ වගුව 208
ආදායම් ප්‍රකාශය 209
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 210
මූල්‍ය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය 211
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 212
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 214
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 215

## 340
**අනුශාංගික වාර්තා**
කාර්තුමය විශ්ලේෂණය 341
දස වසරක සාරාංශය 343
ආදායම් වාර්තාව ඇමරිකානු ඩොලර් වලින් 345
මූල්‍ය ස්ථාවරය පිළිබඳ වාර්තාව ඇමරිකානු ඩොලර් වලින් 346
තිරසාරත්ව වාර්තාකරණය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව 347
GRI අන්තර්ගත නාමාවලිය 349
කෙටි යෙදුම් 352
අනුපාතයන්හි පදනම 354
ආයතනික තොරතුරු 355
රැස්වීම පිළිබඳ දැනුම්දීම 356
පෙරකලාසි පෝරමය 357

# මෙම වාර්තාව පිළිබඳව

GRI | 102-10, 102-12, 102-45, 102-46, 102-48, 102-49, 102-50, 102-51, 102-52, 102-53, 102-54, 102-56




අප විසින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි 9 වැනි සමෝධානික වාර්ෂික වර්තාව මෙසේ ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. පෙර වසරවල ප්‍රතිඵල සහ සෙසු සමාගම් අතර සන්සන්දනාත්මක පහසුකම් සලසමින්, අපගේ කාර්යසාධනය පිළිබඳව සංක්ෂිප්ත අයුරින් සමතුලිත හා පරිපූර්ණ දැක්මක් ලබාදීම අපගේ අපේක්ෂාව වේ. ආයතනික වාර්තාකරණයේ විශිෂ්ටත්වය සඳහා වන අප අඛණ්ඩ ප්‍රයත්නය අනුව යමින් 2020/21 අවසන් වූ වසරෙහි අපගේ පෙර වාර්ෂික වාර්තාව වෙත අර්ථාන්විත වෙනස්කම් සිදුකිරීමට අප විසින් මෙහිදී අවධානය යොමු කරන ලදී.

## පිළියෙල කිරීමේ පදනම

### විෂයපථය සහ සීමාවන්

- මූල්‍ය වාර්තා වලින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සහ එහි පරිපාලිත සමාගම් හය ("සමූහය") ආවරණය කරයි.
- මෙම වාර්තාවේ තිරසාරත්ව වාර්තාකරණ සීමාව මගින් මව්සමාගමෙහි, එනම් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ("සමාගම") හි මෙහෙයුම් ආවරණය කෙරේ.

### නියාමන ආකෘතික රාමු

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ප්‍රමිති
- ලියාපදිංචි මූල්‍ය කල්බදු සමාගම් වෙත නිකුත් කරන ලද නියෝග, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ
- කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනත

### ස්වේච්ඡාවෙන් ආදේශ කරගන්නා ලද ආකෘතික රාමු

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ සභාවේ (IIRC) IR ආකෘතිය 2021
- ග්ලෝබල් රිපෝර්ටින්ග් ව්‍යාපෘතිය මගින් නිකුත් කරන ලද GRI සම්මතයන්
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක

මෙම වාර්තාව GRI සම්මතඃ Core option අනුව පිළියෙල කොට ඇත.

## සහතිකත්වය

අදාළ සටහන් සහිත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලද අතර ඔහුගේ සහතික කිරීමේ වාර්තාව පිටු අංක 205 සිට 207 දක්වා ඉදිරිපත් කෙරේ. විගණකාධිපති විසින් ආයතනික පාලන උපදෙස් සමඟ සමාගමේ අනුකූලතාව සඳහා බාහිර සහතිකයක් නිකුත් කර ඇත. මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය විගණකාධිපති විසින් සමාලෝචනය කර ඇති අතර ඒ සම්බන්ධ ඔහුගේ මතය 165 පිටුවේ දැක්වේ. GRI අවශ්‍යතා සමග අනුකූලතාවය සම්බන්ධ සහතිකත්වය අර්න්ස්ට් ඇන්ඩ් යංග් විසින් සපයනු ලැබ ඇති අතර ඔවුන්ගේ වාර්තාව පිටු අංක 347 සිට 348 දක්වා ඉදිරිපත් කොට ඇත.

## ESG වෙත කැපවීම සහ සමෝධානික චින්තනය

සිය ආයතනික තීරණ ගැනීමේ ක්‍රියාවලිය වෙත සමෝධානික චින්තනය සඳහා පහසුකම් සලසමින්, 15 වසර කට පෙර කල්තබා GRI වාර්තාකරණය ඇතුළත්වීම මගින් සමාගම ඇතුළත ESG වාර්තාකරණ මූලධර්ම ආදේශ කරගැනීමට සමාගමට හැකි විය. අපගේ ක්‍රමවේදයන් කලක් තිස්සේ දැනුවත්භාවයෙන් යුතු සහ විෂය මූලික තීරණ ගැනීම සඳහා විශ්වසනීය මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු යොදාග ැනීම සඳහා වර්ධනය විය. ඒ අනුව, ක්‍රමවේදයන් ක්‍රියාවට නංවා ඇත්තේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් අවබෝධ කරගනිමින් අපගේ මෙහෙයුම් වටපිටාවෙහි වෙනස්වීම් නිරීක්ෂණය කරමින්, අපගේ පාර්ශ්කරුවන් වෙත තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි අපගේ හැකියාව වෙත ඒවායේ බලපෑම තක්සේරු කල හැකි අයුරිනි. සමෝධානික චින්තනය ඔස්සේ ආයතනික නම්‍යශීලීත්වය සවිමත් කිරීම සඳහා අප කටයුතු කරන අතරතුර මෙම ක්‍රියාවලිය මගින් අපගේ සම්පත් වෙන්කිරීම හැඩගස්වන්නා වූ අනාගතයේදී සිදුවිය හැක අවදානම් සහ අවස්ථාවන් තක්සේරු කිරීම සඳහාද පහසුකම් සැලසේ.

# මෙම වාර්තාව පිළිබඳව

## අපගේ වාර්තාව තුළ සංචරනය

**ප්‍රාග්ධනයන්**

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජ හා සබඳතා ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය

**පාර්ශ්වකරුවන්**

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- ආයෝජකයින්
- ව්‍යාපාරික සහකරුවන්
- රජය සහ නියාමකයින්
- දේශීය ප්‍රජාවන්



## තිරසාරත්ව තොරතුරු

මෙම වාර්තාවේ අන්තර්ගතය සමාගමෙහි ස්ථාපිත කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් උකහා ගන්නා ලද අතර එයට මානව සම්පත් තොරතුරු පද්ධතිය, පරිසර කළමනාකරණ ආකෘතිය සහ පාර්ශවකාර ප්‍රතිචාර ලබා ගැනීම සඳහා පවතින ක්‍රියාවලීන් ඇතුළත් වේ. ඒකාබද්ධ චින්තනය සහ වාර්තාකරණය ප්‍රවර්ධනය කරමින් ප්‍රාමාණිකත්වය නිර්ණය කිරීමේ ක්‍රියාවලිය සහ අදාල තිරසාර ව්‍යාපෘතීන් සැකසීම සඳහා මේවා යෙදවුම් වශයෙන් යොදාගෙන ඇත.

## වසර තුළ සැලකිය යුතු වෙනස්වීම් සහ ප්‍රතිප්‍රකාශයන්

වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ සමාගමෙහි හෝ සැපයුම් දාමයේ කිසිදු සැලකිය යුතු වෙනසක් හෝ මූල්‍යමය හෝ තිරසාර තොරතුරු සම්බන්ධ ප්‍රතිප්‍රකාශයන් අවශ්‍ය වන ආකාරයේ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් සිදු නොවීය.

තවද, විෂයපථය හෝ සීමාවන් ආශ්‍රිතව පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදයන්ගෙන් කිසිදු සැළකිය යුතු වෙනස්කම් නොපැවතිනි. කෙසේවුවද, වඩාත් යහපත් ඉදිරිපත් කිරීමක් සහ වර්තමාන වසර සමග සන්සන්දනය කිරීමේ හැකියාව උදෙසා පෙර වසරෙහි මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් අදාළ අවස්ථාවන්හිදී සංශෝධනය කොට ඇත.

## ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශ

ක්‍රමෝපායන් සම්බන්ධ කළමනාකාරිත්වයේ ඇගයුම ඇතුලුව මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කෙරෙන ඇතැම් තොරතුරු සමූහයේ ව්‍යාපාර අංශවල විමර්ශනයන්, ආවර්තිත ප්‍රාග්ධන ඉලක්ක, අවදානම් කළමනාකරණ සමාලෝචනය සහ ප්‍රධාන පණිවුඩ අවබෝධයන්, අපේක්ෂාවන්, උපකල්පනයන්, පුරෝකථනයන්, මත හා අදහස් මත පදනම් වූ ඉදිරි දැක්ම පිළිබද ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ. මෙකී ඇස්තමේන්තු ඒවා ආශ්‍රිත විවිධ පරාසයන්ගෙන් අවිනිශ්චිතතාවන්ගෙන් සමන්විත වුවද මෙම ඉදිරි දැක්ම පිළිබද ප්‍රකාශ සපයනු ලැබ ඇත්තේ සමූහයේ අනාගත කාර්යසාධනය පිළිබද තක්සේරු කිරීමට උපකාරී වනු පිණිස වන අතර ඒවායේ නිරවද්‍යතාවය තහවුරු කරග හැක්කේ අපගේ පාලනයෙන් ඔබ්බෙහි පවතින අනාගත සිදුවීම්, ප්‍රතිපලයන් සහ බලපෑම් පිළිබද අපරදෘෂ්ටියෙන් බැලීමෙන් පමණි. තවද, එවැනි ඉදිරි දැක්ම පිළිබද ප්‍රකාශයන්ගෙන් පැවසෙන හෝ හැගවෙන අනාගත කාර්යසාධනය හෝ ප්‍රතිපල පිළිබද කවර හෝ පුරෝකථනයකින් අනාගත කාලසීමාවන්හිදී සමූහයේ සැබෑ කාර්යසාධනය හා ප්‍රතිපල ප්‍රාමාණිකව වෙනස් විය හැක. කෝවිඩ් 19 වසංගතයේ සමාජ ආර්ථික බලපෑම් මෙන්ම, පෙර නොවූවිරූ ආර්ථික, ව්‍යාපාර සහ වෙළදපොල තත්ත්වයන් මගින් අවිනිශ්චිතතාවය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ යන අතර වාර්තාකරණ දින වන විට පවා අදාළ තොරතුරු අතිශය වෙනස්වන සුලු තත්ත්වයක පවතින බැවින් මෙම වාර්තාව පරිශීලනය කරන අයවලුන් හට ස්වයං තීරණ ගැනීම සදහා මෙයින් උපදෙස් දෙනු ලැබේ. පවතින අවිනිශ්චිත තත්ත්වය හමුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි ඇතුළත් තොරතුරු පිළිබදව කිසිදු ප්‍රතිකර්මයක් හෝ බැඳීමක් භාර නොගැනේ.

## ප්‍රතිචාර සහ විමසීම්

අප විසින් ඔබගේ ප්‍රතිචාර අගය කොට සළකන අතර එළඹෙන වසරේ වාර්ෂික වර්තාව වැඩිදියුණු කිරීම සඳහා ඒවා යොදාගැනේ. වාර්ෂික වාර්තාව පිළිබද විමසීම් සඳහා පහත දැක්වෙන නිලධාරියා අමතන්න:

ප්‍රධාන කළමනාකරු - මූල්‍ය
**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී**
නො. 1161, මරදාන පාර,
කොළඹ 8, ශ්‍රී ලංකාව.
තැපැල් කේතය: 00800
දුරකථන: +94 11 263 1631

## පිළිගැනුම

මෙම වාර්තාවේ ඇතුළත් සියළුම තොරතුරු සමාගමේ ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තරව සමාලෝචනය කරන ලද අතර මෙම වාර්තාවේ ආයතනික පාලනය යටතේ දක්වා ඇති ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් අනුව ස්වාධීනව තහවුරු කොට ඇත.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂිකව වාර්තාවේ මෙම වාර්ෂික වාර්තාව සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිගැනේ. ඒකාබද්ධ වාර්තාවේ සුපිලිපන් බව තහවුරු කිරීම සම්බන්ධ ඔවුන්ගේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලබන අතර 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි ඒකාබද්ධ වාර්ෂික වාර්තාව <IR> ආකෘතිය 2021 අනුව ඉදිරිපත් කොට ඇති බව ඔවුන්ගේ මතය වේ.

**සුජීව රාජපක්ෂ**
*සභාපත/අධ්‍යක්ෂ මණ්ඩලය*

**ෂමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී*

# අප පිළිබඳව

GRI | 102-4, 102-16

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (පීපල්ස් ලීසිං/සමාගම) ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බැංකු නොවන මූල්‍ය ආයතනයක් වන අතර එය මෙරට විශාලතම රාජ්‍ය හිමිකාරීත්වයක් සහිත බැංකුවක් වන මහජන බැංකුවේ පරිපාලිතයකි. විශේෂිත කල්බදු සමාගමක් වශයෙන් 1996දී මෙහෙයුම් අරඹන පීපල්ස් ලීසිං 2011 දී කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කෙරිණි. එතැන් පටන් පීපල්ස් ලීසිං විවිධාංගීකරණය වූ බැංකු නොවන මූල්‍ය ජනනය සිදුකරන ආයතනයක් වශයෙන් ක්ෂේත්‍රය තුළ වර්ධනය වූ අතර මේ වන විට එය සතුව බංග්ලාදේශයේ විදේශ පරිපාලිතයක්ද සමගින් පරිපාලිතයන් හයක් පවතී.

## අපගේ දැක්ම

ගනුදෙනුකරුවන් සඳහා හිතකාමී, නිර්මාණාත්මක සහ පූර්ණ නව්‍යකරණ විසඳුම් සපයන්නකු ලෙස මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම



## අපගේ මෙහෙවර

තිරසර තරඟකාරී ප්‍රතිලාභ පවත්වා ගනිමින් ආයතනික සේවා විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීම උදෙසා අගය එක් කළ තරඟකාරී සේවා සැපයුමකට කැපවීම

## වටිනාකම්

| ආර්ථික ශක්‍යතාව | සමාජයීය වගවීම | පාරිසරික වගකීම |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| ජනතාවගේ ව්‍යාපාරයකි | 382,913 ගනුදෙනුකරුවන් | 2,245 සේවකයින් | 111 ශාඛාවන් |
| වෙළෙඳපොළ කොටස | 11.37% සමස්ත වත්කම් | 12.89% තැන්පතු | 12.47% ණය සහ අත්තිකාරම් |

* බැංකු නොවන මූල්‍ය ආයතන තොරතුරු 2022.03.31. දිනට ශ්‍රී ලංකා මහ බැංකු සංඛ්‍යාලේඛන වලින් ලබාගැනුනි.

| | | | |
|---|---|---|---|
| මූලික තක්සේරුකරණයන් | රු. බිලියන 15.29 වෙළෙඳපොළ ප්‍රාග්ධනිතය | රු. බිලියන 6.51 සන්නාම තක්සේරුව | රු. බිලියන 38.82 ශුද්ධ වත්කම් |

# අප පිළිබඳව

GRI | 102-5

## මූල්‍යමය අන්තර්ග්‍රහනය සිදුකරන්නා වූ මූල්‍ය ආයතනයක් ලෙස

මූල්‍යමය අන්තර්ග්‍රහනය පදනම් කොට ගත් මූලධර්ම මත බිහිකෙරුනු පීපල්ස් ලීසිං, දේශීය ආර්ථිකයේ කොදුනාරටිය බඳු ව්‍යාපාර ආරම්භ කිරීම්, ක්ෂුද්‍ර ව්‍යවසායකතයින් සහ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත මූල්‍ය සම්පාදනය කරන්නා වූ සමාගමක් වශයෙන් කීර්තියට පත්ව ඇත. මහජන බැංකුවේ පරිපාලිතයක් වශයෙන්, සමාගම සිය මව් සමාගමෙහි සවිමත් දේශීය අධිකාරීත්වයේ ප්‍රතිලාභ අත්විදින අතර එය මුල් වර්ෂ වල සිට මේ දක්වා වර්ධනය වීම කෙරෙහි උපකාරී විය. 25 වසරකට අධික කාලයක් තිස්සේ ව්‍යාපාරික මෙහෙයුම් සිදුකරමින්, පීපල්ස් ලීසි. සිය ප්‍රධාන ව්‍යාපාර ධාරාවට දායක වන්නා වූ පරිපාලිතයන් සමගින් ශක්තිමත් මූල්‍ය ආයතනයක් බවට පත්වීමට සමත් විය.




| පරිපාලිතය | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
|---|---|---|---|---|---|---|
| හිමිකාරීත්වය | 75% | 100% | 100% | 100% | 100% | 51% |
| ප්‍රධාන ක්‍රියාකාරකම් | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම | සම්ප්‍රදායික බැංකුකරණ සේවාවන් ලබාගැනීම අසීරු පුද්ගලයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවා ලබාදීම | මෝටර් රථ සමූහ කළමනාකරණය, මෝටර් රථ තක්සේරුකරණය, රක්ෂණ ඇගයුම් සහ මෝටර් රථ අලුත්වැඩියාව | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් | කාර්යාල සංකීර්ණයක් මෙහෙයවීම | නිශ්චල සහ චංචල දේපළ වෙත කල්බදු සහ ණය ලබා දීම |
| සංස්ථාපිත රට | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාව | බංග්ලාදේශය |
| සේවක සංඛ්‍යාව | 615 | 171 | 65 | 7 | 2 | 43 |
| බදු පසු ලාභයට (රු. මිලියන) | 778.51 | 181.58 | 152.99 | 240.76 | 102.22 | 110.42 |
| වත්කම් (රු. මිලියන) | 12,102.54 | 3,070.80 | 444.79 | 2,738.09 | 2,655.37 | 14,544.08 |

## අපගේ සමාජ-ආර්ථික බලපෑම

පහත රූප සටහනින් දැක්වෙන පරිදි අපගේ සමාජ-ආර්ථික බලපෑම බහුවිධ වේ.






ස්වභාවයෙන්ම, ණය ප්‍රමාණයන් කුඩා වන අතර ඒවා අනාගත ප්‍රගතිගාමී ව්‍යාපාරිකයින් රැසක් අතර බෙදී යයි. අපගේ අන්තර්ග්‍රහන එළඹුම මගින් අපගේ සැලසුම් ඒවායේ වටිනාකම් සහ කාලසීමාවන් ඇතුලුව ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා අනුව සැකසෙන අතර අපගේ ඉස්ලාමීය සැලසුම් මගින් ශරියා නීතියේ විශේෂිත අවශ්‍යතාවන් සපුරාලනු ලැබේ.

### වටිනාකම මත පදනම්ව ණය, කල්බදු සහ වෙනත් අත්තිකාරම් සංඛ්‍යාව






දිවයින පුරා ව්‍යාප්ත වූ නියෝජනයක් සහිත බැංකු නොවන මූල්‍ය ආයතනයක් වශයෙන්, අප විසින් ආයෝජනය සහ ධන උත්පාදනය සඳහා ක්‍රමවත් බැංකුකරණ සැලසුම් ලබාගැනීමට අපහසු ප්‍රජාවන් වෙත ළඟා මේන් ඔවුන් වෙත මූල්‍ය පහසුකම් සලසනු ලබන අතර එය සමස්ත ජනතාවගෙන් අතිමහත් බහුතරය විසින් අවබෝධ කොට ගෙන ඇත.

### අගය මත පදනම්ව ස්ථාවර තැන්පතු සංඛ්‍යාව




### පළාත්බද වශයෙන් තැන්පතු පදනම (රු. මිලියන)




### පළාත් අනුව ණය, කල්බදු සහ වෙනත් අත්තිකාරම් කළඹ (රු. මිලියන)



# අප පිළිබඳව

පීපල්ස් ලීසිං පසුගිය වසර තුනක කාලය පුරා රටේ ආර්ථික අවගමනය හමුවේ ඉහළ නංවනු ලද දැවැන්ත කම්පනයන්හිදී ගනුදෙනුකරුවන් වෙත සහාය දක්වන ලද අතර මේ වන තුරු එම කාර්යයෙහි නිරතව සිටී.

**පමාසහන සංඛ්‍යාව**




**පිරිනමන ලද හිතමිතුරු ණය පහසුකම් (සහන බස් රථ ණය සැලසුම)**




ජනතාව වෙත විවිධ වූ තාක්ෂණික සේවාවන් ලබාදෙමින් අපගේ ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ ප්‍රගතිය තහවුරු කරමින් අප විසින් අන්තර්ග්‍රහන ඩිජිටල්කරණය කෙරෙහි කැපවී කටයුතු කරනු ලැබේ.

**9,736**
ඩවුන්ලෝඩ් කිරීම්

PLC ONLINE

**රු. මිලියන 3,981.60**
ඇප් ඔස්සේ සිදුකරන ලද ගනුදෙනු වල වටිනාකම

PLC ONLINE

**99,179**
ඇප් ඔස්සේ සිදුකරන ලද ගනුදෙනු සංඛ්‍යාව

ආර්ථික ප්‍රගතිය සඳහා සියලුම පළාත් සහභාගී වන බවට තහවුරු කරමින්, දීපව්‍යාප්ත නියෝජනය මගින් සියලු පළාත තුළ සේවකයින් 2,245 ක් වෙත රැකියා අවස්ථා නිර්මාණ කරන ලදී.



ආර්ථිකය වෙත එකතු කරන ලද වටිනාකම් පහත දැක්වෙන ප්‍රකාශයන්හි ඉදිරිපත් කෙරේ.

GRI 201-1

## එකතු කරන ලද ආර්ථික වටිනාකම (EVA)

දින 365 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය සහ 2% අවදානම් වාරිකයට සමානුපාතික ආර්ථික ගාස්තුවක් සැළකිල්ලට ගැනීමේදී, 2021/22 මූල්‍ය වර්ෂය සඳහා පීපල්ස් ලීසිං මගින් එකතු කරන ලද ආර්ථික වටිනාකම රු.මිලියන 845.48 කි. මෙමගින්, අභියෝගාත්මක වටපිටාවක් තුළ වුවද කොටස් හිමිකරුවන් වෙත ආර්ථික අනුපාතික ආදායමට ඉහළින් අප විසින් නිර්මාණය කරන ලද වටිනාකම පිළිබිඹු වේ.

### එකතු කරන ලද ආර්ථික වටිනාකම

| වසර සඳහා | 2021/22<br>රු. මිලියන | 2020/21<br>රු. මිලියන |
|---|---|---|
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | 38,818.31 | 34,341.43 |
| එකතු කිරීම - අපහායනය සඳහා සමුච්චිත ප්‍රතිපාදන | 9,887.57 | 9,267.94 |
| එකතු කිරීම - සමුච්චිත වෙළඳපොල ගොඩනැංවීමේ වියදම් | 425.25 | 560.43 |
| අඩු කිරීම - විලම්බිත බදු වත්කම් | (1,146.73) | (415.84) |
| | **47,984.40** | **43,753.96** |
| **වෙත ආරෝපනය කල යුතු** | | |
| කොටස් හිමිකරුවන් | 4,659.01 | 4,033.02 |
| එකතු කිරීම - වසර සඳහා වෙළඳපොල ගොඩනැංවීමේ වියදම් | 189.63 | 39.06 |
| එකතු කිරීම - අපහායනය ප්‍රතිපාදන | 619.63 | 517.70 |
| එකතු කිරීම - වසර සඳහා විලම්බිත බදු ගාස්තු | (673.45) | (69.51) |
| | **4,794.82** | **4,520.27** |
| ආර්ථික පිරිවැය % (සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය + 2% අවදානම් වාරිකය) | 8.61% | 7.29% |
| ආර්ථික පිරිවැය | 3,949.34 | 3,027.95 |
| **ආර්ථික අගය එකතු කිරීම** | **845.48** | **1,492.32** |

## එකතු කරන ලද වෙළඳපොල වටිනාකම (MVA)

වසර පුරා පැවති ප්‍රාග්ධන වෙළඳපොලෙහි දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන්, සමාගමෙහි කොටස් මිල පහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 මාර්තු 31 දිනට එකතු කරන ලද වෙළඳපොල වටිනාකමද පහත වැටුනි.

### එකතු කරන ලද වෙළඳපොල වටිනාකම

| වසර සඳහා | 2021/22<br>රු. මිලියන | 2020/21<br>රු. මිලියන |
|---|---|---|
| **වෙළඳපොල ප්‍රාග්ධනිතය/ස්කන්ධ වල වෙළඳපොල වටිනාකම** | 15,286.28 | 20,114.31 |
| | | |
| **කොටස් හිමිකරුවන්ගේ අරමුදල්** | 38,818.31 | 34,341.43 |
| | | |
| **එකතු කරන ලද වෙළඳපොල වටිනාකම/(පහත වැටුනු)** | **(23,532.03)** | **(14,227.12)** |

# අප පිළිබඳව

## එකතු කරන ලද වටිනාකමෙහි බෙදීයාම

ප්‍රධාන වශයෙන් පොලී ආදායම පහත වැටීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව උත්පාදනය කරන ලද ආර්ථික වටිනාකමෙහි සුලු අඩුවීමක් නිරූපනය වේ. කෙසේවුවද, සේවකයින්, රජය සහ ප්‍රජාව වෙත බෙදාහරින ලද ආර්ථික වටිනාකම පසුගිය වසරට සාපේක්ෂව ඉහළ නැංවුනි. තැන්පතු හිමිකරුවන් වෙත ගෙවන ලද තැන්පතු පදනම් පොලියෙහි 23.71% ක සුලු අඩුවීමක් පිළිබිඹු වූ අතර වසර තුළදී කොටස් හිමිකරුවන් වෙත ගෙවන ලද ලාභාංශ වල සැළකිය යුතු ඉහළ යාමක් වාර්තා විය.

| | 2021/22 රු. මිලියන | 2020/21 රු. මිලියන |
|---|---|---|
| **උත්පාදනය කරන ලද සෘජු ආර්ථික වටිනාකම** | | |
| පොලී ආදායම | 23,881.53 | 24,983.45 |
| ගාස්තු හා කොමිස් ආදායම | 1,876.52 | 1,818.68 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 983.33 | 301.68 |
| උත්පාදනය කරන ලද ආර්ථික වටිනාකම | 26,741.38 | 27,103.81 |
| **බෙදාහරින ලද ආර්ථික වටිනාකම** | | |
| ප්‍රාග්ධන සම්පාදකයින් වෙත | | |
| කොටස් හිමිකරුවන් වෙත ලාභාංශ | 2,179.93 | 976.62 |
| ණය ලබාගැනීම් සඳහා පොලිය | 3,029.26 | 2,835.85 |
| තැන්පතු පොලිය | 7,802.92 | 10,228.46 |
| | 13,012.11 | 14,040.93 |
| **සේවකයින් වෙත** | | |
| වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ | 4,002.41 | 3,465.37 |
| | 4,002.41 | 3,465.37 |
| **රජය වෙත** | | |
| ආදායම් බදු වියදම් | 2,664.54 | 1,909.08 |
| මූල්‍ය සේවා මත බදු | 1,645.11 | 1,222.63 |
| ගෙවන ලද වෙනත් බදු | 48.51 | 18.37 |
| | 4,358.16 | 3,150.08 |
| **ප්‍රජාව වෙත** | | |
| ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතීන් වෙනුවෙන් | 29.40 | 20.37 |
| | 29.40 | 20.37 |
| **මෙහෙයුම් පිරිවැය** | | |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 700.04 | 722.99 |
| ණය හා ලැබිය යුතු දේ සහ වෙනත් අලාභ සඳහා අපහායන ගාස්තු | 777.04 | 1,143.05 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 2,056.59 | 1,590.08 |
| | 3,533.67 | 3,456.12 |
| **බෙදාහරින ලද ආර්ථික වටිනාකම** | 24,935.75 | 24,132.87 |
| **රඳවාගත් ආර්ථික වටිනාකම** | 1,805.63 | 2,970.94 |

### බෙදාහරින ලද ආර්ථික වටිනාකම 2021/22




- කොටස් හිමිකරුවන්
- ණයහිමියන්
- තැන්පත්කරුවන්
- සේවකයින්
- රජය
- ප්‍රජාව
- මෙහෙයුම් පිරිවැය
- රඳවාගත් වටිනාකම

### බෙදාහරින ලද ආර්ථික වටිනාකම 2020/21




- කොටස් හිමිකරුවන්
- ණයහිමියන්
- තැන්පත්කරුවන්
- සේවකයින්
- රජය
- ප්‍රජාව
- මෙහෙයුම් පිරිවැය
- රඳවාගත් වටිනාකම

# අරමුණු සහගත ව්‍යාපාරයක වශයෙන් අපගේ ආයතනික මාර්ගෝපදේශන මූලධර්ම

**01** අපගේ ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණ වන්නේ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර හා ජීවනෝපායන් සවිබලගැන්වීම සඳහා අවැසි මූල්‍යමය අන්තර්ග්‍රහනය ප්‍රවර්ධනය කරමින් උපදේශන සේවාවන් සැපයීමයි.

**02** අපගේ අරමුණ සාක්ෂාත් කරගන්නා අතර එයට අවැසි විනිවිදභාවය සහ වගවීම සුරකින්නා වූ පාලන පද්ධතියක් අප සතු වේ.

**03** අපගේ පාර්ශ්වකරුවන් වෙත සමානුපාතී ප්‍රතිලාභ සහතික කරමින් ව්‍යාපාරික ආචාරධර්ම අනුකූලව සහ වගකීම් සහගතව පරිපූර්ණ මූල්‍ය සේවාවන් ලබාදෙමින් අපගේ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපි කැපවීමෙන් යුතුව කටයුතු කරමු.

**04** ආර්ථික හැකියාව, පාරිසරික වගකීම සහ සමාජ වගවීම අපගේ සියලුම ව්‍යාපාරික මෙහෙයුම් වලට ආවේණික මූලික හර පද්ධතීන් වේ.

**05** අපගේ මූලික වටිනාකම් කළමනාකරණ ක්‍රියාවලීන් වෙත ඇතුළත් කරමින් යහපත් ආයතනික පුරවැසිභවයක් අපි තහවුරු කරන්නෙමු.

**06** තිරසාර සම්පත් ප්‍රශස්තීකරණයෙන් සහ වගකීම් සහගත ණය ලබාදීම් ඔස්සේ පරිසරය වෙත සිදුවන අපගේ බලපෑම අවම කිරීමට අපි කටයුතු කරන්නෙමු.

**07** වසර පුරා අපගේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් කෙරෙහි ප්‍රතිචාර දක්වමින් අපගේ සමාජයීය බලපත්‍රය අපි තහවුරු කරගන්නෙමු.

**08** අති විශිෂ්ට සේවා අත්දැකීමක් ලබාදීම උදෙසා ඩිජිටල් සාක්ෂරතාවය ඇතුලුව, අපගේ සේවකයින්ගේ ධාරිතාවය අපි ඉහළ නංවන්නෙමු.

**09** අපගේ ව්‍යාපාරික අරමුණු වලට අනුව අර්ථගන්වා ඇති ඉලක්ක සපුරාගැනීම සඳහා පුද්ගල හා කණ්ඩායම් වශයෙන් අපගේ සේවකයින්ගේ වන දායකත්වය අගයමින් අපි අපගේ ජයග්‍රහන සමරන්නෙමු.

**10** තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරනු ලබන ජාතික හා ගෝලීය ආකෘතිකරාමු වෙත අපි අපගේ සහයෝගය ලබාදෙන්නෙමු.

**ශමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී*

# අපගේ ගමන් මග



**1995**
පෞද්ගලික සීමිත වගකීම් සහිත සම සමාගමක් වේ වශයෙන් සංස්ථාපනය කෙරුණි

**1996**
1996 මැයි (31) වැනි දින මහජන බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයක් වශයෙන් වාණිජ මෙහෙයුම් ඇරඹීය

**සේවකයින්** - 3
**ශාඛා ජාලය** - ශාඛා නොමැත
**මුළු ස්කන්ධ** - රු. මිලියන 10
**තැන්පතු** - භාර නො ගැනුණි
**විවිධාංගීකරණය** - කිසිදු පරිපාලිතයක් නැත
**සැලසුම් පරාසය** - කල්බදු සහ කුලී පිට ගැනුම් පමණි

**1997/98**
අපේක්ෂා සහ සහගත වර්ධන සැලසුම් වල පළමු පියවර වශයෙන් පළමු ශාඛාව මහනුවර දී විවෘත කෙරිණි

**2011/12**
කොටස් වෙළඳ වෙළඳපොළේ දෙවැනි විශාලතම මූලික කොටස් නිකුතුව ඔස්සේ කොළඹ කොටස් වෙළඳ පොළේ ප්‍රධාන පුවරුවේ ලැයිස්තුගත විය

**2012/13**
2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ෆිනෑන්ස් ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා බලපත්‍රය හිමි විය

**2013/14**
සිය පරිපාලිතය වන පීපල්ස් ෆයිනෑන්ස් පීඑල්සී සමග හවුල්කාරිත්වය සාර්ථකව සම්පූර්ණ කරන ලදී

**2015/16**
ණය සහ ලැබිය යුතු දෑ කළඹ රුපියල් බිලියන 100 කඩඉම පසු කළේය

**2016/17**
විසි වෙනි සංවත්සරය සැමරීම/ බංග්ලාදේශයේ ව්‍යාපාරයක් සඳහා මූලික කටයුතු ඇරඹීම/ සියවෙනි ශාඛාව පිහිටුවීම

**2017/18**
පීපල්ස් ඔන්ලයින් ඇප් එක හඳුන්වාදීම/ බංගලාදේශයේ මෙහෙයුම් ඇරඹීම

**2020/21**

25 වැනි සංවත්සරය

තැන්පතු - බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ විශාලතම තැන්පතු පදනම

**2021/22**

සමාගම් ඉතිහාසයේ ඉහළම බදු වලට පසු ලාභය රු. බිලියන 4.66

ඩිජිටල් පරිවර්තනය
- PLC Touch හඳුන්වාදීම
- පීපල්ස් පේ වේ
- CAPP හඳුන්වාදීම
- DCHEQUE ඇප් හඳුන්වාදීම

සේවකයින්ගේ සමුච්චිත සේවාව - වසර 18,000 කට අධික විය

විවිධාංගීකරණය - පරිපාලිතයන් 6 (පොදු ලැයිස්තුගත සමාගමක් සහ විදේශ පරිපාලිතයක් ඇතුලුව)

සැලසුම් පරාසය - පහත දක්වෙන ආකාරයෙන් විවිධාංගීකරණයට ලක් කෙරිණි
- ණය ලබාදීමේ සැලසුම්
- ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්
- ඉස්ලාමීය ණය ලබාදීමේ සැලසුම්
- ඉස්ලාමීය තැන්පතු සැලසුම්

**2009/10**

විවිධාංගීකරණය වූ මූල්‍ය සේවා සම්පාදකයෙකු වශයෙන් සමාගමේතත්ත්වය තවදුරටත් ස්ථාවර කරමින් පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයන් වශයෙන් පීපල්ස් ඉන්ෂුවරන්ස් අරඹන ලදී

**2008/09**

නව ව්‍යාපාරයන් වෙත විවිධාංගීකරණය වෙමින් පරිපාලිතයන් දෙකක් එනම් පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් සහ පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් අරඹන ලදී

**2002/03**

මෙහෙයුම් අරඹා වසර හතක් වැනි කෙටි කාලයකදී කල්බදු ක්ෂේත්‍රයේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්විය

**2007/08**

මහජන බැංකුවේ කවුළු කාර්යාල ඔස්සේ සුවිශේෂී සංකල්පයක් හඳුන්වා දෙන ලදී



අපගේ පරිපූර්ණ ගනුදෙනුකාර සේවාව වෙත සම්බන්ධ වෙමින්



# සභාපතිවරයාගේ පණිවුඩය

GRI | 102-14



# ''අපගේ අරමුණ වනුයේ මූල්‍යමය අන්තර්ග්‍රහනය ප්‍රවර්ධනය කරමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාකයින්ගේද ඇතුලුව, ජීවනෝපායන් නගා සිටුවමින් ව්‍යාපාරයන් සවිබලගැන්වීම උදෙසා උපදේශන සේවාවන් ලබාදීමයි.''

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී මගින්, ශ්‍රී ලාංකේය ප්‍රජාව සමග කටයුතු කරමින් ඔවුන් සමග අන්‍යෝන්‍ය ඉලක්ක හා අභිලාෂයන් සාක්ෂාත් කරගනිමින් ඉදිරියට ගමන් කරන්නා වූ 25 වැනි සේවා වසර මෙසේ සනිටුහන් කරනු ලබයි. මෙම වසරේදී අතිශය අභියෝගාත්මක තත්ත්වයන් තුළ ගනුදෙනුකරුවන් වෙත සහන රැසක් ලබාදෙන අතරතුර රු. බිලියන 4.66 ක් වන සමාගමෙහි ඉහළම බදු පසු ලාභය වාර්තා කිරීම තුළින් සමාගමෙහි ප්‍රථම පරමාදර්ශී ප්‍රතිපත්තිට කෙරෙහි වන කැපවීම පිළිබිඹු වේ. මෙම ප්‍රතිපත්තිය අන් කවරදාකටත් වඩා අදට වැදගත් වන්නේ, ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම හා සමගාමී තිරසාර සහ ඔරොත්තුදීමේ හැකියාවන්ගෙන් යුතු ආර්ථික රටාවක් ඔස්සේ බහුවිධ අර්බුදයන් ජයගැනීමට මුලු මහත් දේශයම එක්ව කටයුතු කරන පසුබිමක් තුළ අප පසු වන බැවිනි.

මව් සමාගමෙහි කාර්යසාධනයේ සවිමත් දායකත්වයෙන් යුතුව, රු. බිලියන 4.82 ලාභයක් වාර්තා කරමින් පීපල්ස් ලීසිං සමූහයද නම්‍යශීලී කාර්යසාධනයක් අත්පත් කර ගන්නා ලදී. පීපල්ස් මයික්‍රෝ කොමර්ස් සමාගම සහ පීපල්ස් ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගමද පිළිවෙලින් රු. මිලියන 181.5 ක් සහ රු. මිලියන 152.99 ක් වශයෙන් ඔවුන්ගේ ඉහළම ලාභයන් වාර්තා කලේය. පෙර වසරට සාපේක්ෂව 13.90% ක පහත වැටීම කෙරෙහි සමූහයේ විශාලතම පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස්හි ලාභ පහළයාම ප්‍රධාන වශයෙන් හේතු විය.

### තවත් අභියෝගාත්මක වසරක්

2021 පෙබරවාරි මස ඇරඹී දීපව්‍යාප්ත ප්‍රතිශක්තිකරණ වැඩසටහන හමුවේ වුවද, මූල්‍ය වර්ෂය ආරම්භ වූයේ කෝවිඩ් 19 වසංගතයේ තෙවන රැල්ල සමගිනි. ශ්‍රී ලංකාවට, මෙය ආර්ථික ආඝාතියෙහි සහ තෙවන අඛණ්ඩ වසර වූ අතර, වසර ගත වෙද්දී විභේද රේඛාවන් තවත් පුලුල් වීම සිදුවිය. අක්‍රමවත් බාධාවන්, වසර අවසානය වන විට ඉන්ධන මිල ඉහළයාම් සහ ඉන්ධන හිගය හේතුවෙන් මගී ප්‍රවාහනය කෙරෙහි දිගින් දිගටම අහිතකර බලපෑම් එල්ල විය. 2020 ජනවාරි මස සංචාරක කර්මාන්තය සඳහා රට විවෘත කෙරුනද, ජාත්‍යන්තර සංචාරක පැමිණීම් යථා තත්ත්වයට පත්වූයේ 2021 නොවැම්බර් වැනි දිගු කලකට පසුය. මෙම වර්ධන තත්වය 2020 මාර්තු පමණ වන තෙක් පැවති අතර දිවයිනේ ඇතිවූ නොසන්සුන්කාරී පසුබිම තුළ ප්‍රධාන සංචාරක වෙළඳපොල වල සංචාරක අනතුරු ඇඟවීම් හමුවේ නැවතත් එය ක්ෂේත්‍රය බිඳවැටිනි. මෙහිදී උද්ගත වූ ආහාර හා ඉන්ධන හිගය හේතුවෙන් අධෛර්යයට පත් සංචාරයක් රැසක් සිය සංචාරයන් අවලංගු කළහ. විදුලි සංදේශ සන්නිවේදනය වාර්තා කරනු ලබන වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර එහිදී රට වසාදැමීම් වලදී ව්‍යාපාරික අඛණ්ඩතාවය පවත්වාගෙන යමින් රෝගය වැළදීමේ අවදානම අවම කිරීම උදෙසා අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් සේවා ස්ථානයන්ට වාර්තා කරන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙම පසුබිම හමුවේ, වසර තුළදී ආර්ථික දර්ශක පහත වැටුනු අතර එහි අවසන් ප්‍රතිඵලය වූයේ එදා මෙදා තුර ශ්‍රී ලංකාව ගත කරන ලද අඳුරුම යුගය සනිටුහන් කරමින්. 2022 අප්‍රියෙල් මස රජය විසින් විදේශ මුදල් වලින් නම් කරන ලද ණය ගෙවීමට අපොහොසත් වන බවට ප්‍රකාශයට පත් කිරීමයි. ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) මගින් මනින ලද පරිදි, උද්ධමනය, 2022 මාර්තු වන විට 21.5% දක්වාද 2022 අප්‍රියෙල් වන විට 33.8% දක්වා ඉහළ යමින් අවදානම් සහගත ප්‍රජාවන් වෙත දැඩි ආර්ථික දුෂ්කරතා පමුණුවන ලදී. ආහාර උද්ධමනය 2002 මාර්තු මස පැවති 29.5% සිට 2022 අප්‍රියෙල් වන විට 45.1% දක්වා ඉහළ ගිය අතර, එම කාලසීමාවේදීම ආහාරමය නොවන උද්ධමනය 14.5% සිට 23.9% දක්වා ඉහළ ගියේය. ප්‍රමාණාත්මක සහන හේතුවෙන් වසර ආරම්භයේදී එදා මෙදා තුර පහළම අගයක පැවති පොලී අනුපාත, පුළුල් වෙමින් පැවති විභේද රේඛාවන් කළමනාකරණය සඳහා රජය විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන් 2021 දෙවන භාගයේදී සාමාන්‍ය මට්ටමේ ඉහළ යාමක් පෙන්නුම් කලේය. කෙසේවුවද, ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වඩාත් දැඩි පියවර වෙත යොමුවීම අවශ්‍ය වූ පසුබිමක් තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් 2022 අප්‍රියෙල් 8 වැනි දින ප්‍රතිපත්ති පොලී අනුපාත 700 bps වලින් ඉහළ නංවන ලදී. දින 364 භාණ්ඩාගාර භාණ්ඩාගාර බිල්පත් 2021 මාර්තු මස පැවති 5.11% සිට 2022 මාර්තු මස වන විට 12.28% දක්වා ඉහළ ගිය අතර, මූල්‍ය වර්ෂය අවසන් වූ වහාම අත්විඳින ලද බරපතල උච්ඡාවචනය පිළිබිඹු කරමින් 2022 අප්‍රියෙල් මස වන විට එය 24.09% දක්වා තියුණු ඉහළයාමක් වාර්තා කලේය. පහත දක්වෙන පරිදි, සාමාන්‍යය බරතබන ලද තැන්පතු අනුපාතය (AWDR) විලම්බනය වුවද, සාමාන්‍යය බරතබන ලද මූලික අනුපාතය (AWPR) සමාන ආකාරයකින්ම 2021 මාර්තු මස පැවති 9.85% සිට 2022 අප්‍රියෙල් මස වන විට 16.38% දක්වා ඉහළ ගියේය. ගනුදෙනුකරුවන් සඳහා ණයගැනීමේ පිරිවැය ඉහළ නංවන අතර, මිල ස්ථාවරත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා එය අවශ්‍ය ගැළපුමකි.

මූල්‍ය වර්ෂයේ මාස 11 ක් පුරා පටු පරාසයක් තුළ කළමනාකරණය කරන ලද විනිමය අනුපාතය, 2022 මාර්තු මස ප්‍රබල අයුරින් ඉහළනැංවුනු අතර 2022 අප්‍රියෙල් මස අවසානය වන විට විනිමය අනුපාතය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල් 319.44 ක් වශයෙන් වාර්තා විය. මාර්තු මස අවසානය වන විට මෙරට විදේශ විනිමය සංචිත ඇ.ඩො. බිලියන 1.9 ක් වූ අතර ඉන් ඇ.ඩො. බිලියන 1.5 ක් අසම්භාව්‍යතාවන්ට යටත්වීම හේතුවෙන් භාවිත කල හැකි සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 0.4 ක් තරම් සුලු ප්‍රමාණයක් විය. මෙහිදී අනිවාර්යයෙන්ම, පසුගිය වසරට වඩා මෙම වසරේ අස්වැන්න බොහෝසෙයින් පහළ මට්ටමක පවතිනු ඇති බවට අනාවැකි පළකෙරෙන පසුබිමක් තුළ සහල් ආනයනය ආදිය තුළින් ආහාර හිගය වළකාගැනීම සඳහා කටයුතු කල යුතු බැවින් මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීම කෙරෙහි මුදල් ප්‍රතිපත්තියෙහි අතිශය පහළ ප්‍රමුඛතාවක් හිමි වනු ඇත.

ඇතැම්විට අප විසින් අවධානය යොමුකරනු ලබන අගය මගින් ඵලදායී රැකියාවන්හි නිරත නොවන ජනගහනය ඒවායේ නිරත වන ජනගහය ඉක්මවා යා හැකි තත්ත්වයක් තුළ, විරැකියාව 5.5% සිට 5.1% දක්වා පහළ ගියද ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2020 පැවති 50.6% සිට 2021 දී 49.9% දක්වා පහතවැටීම තුළින් මෙහි ධනාත්මක බලපෑම අවප්‍රමාණ විය.

# සභාපතිවරයාගේ පණිවුඩය

## පාර්ශ්වකාර අපේක්ෂාවන් සපුරාලීම

පෙර වසරේදී මෙන්ම, අප විසින් අපගේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා අපගේ ක්‍රමෝපායන් සකසන ලද අතර එය ආතතිය සම්බන්ධ පූර්ව ලක්ෂණ විදහා දක්වන ලද මෙහෙයුම් වටපිටාවක් වෙත ගළපන ලදී. පෙර වසරේදී, පීපල්ස් ලීසිං මගින් 2020/21 සඳහා පමාසහන 59,000 කට අධික ප්‍රමාණයක් ලබාදෙමින් එකී සහනයන් ඔස්සේ අසීරුතාවලින් මිදීම සඳහා බොහෝ දෙනෙකුට සහාය විය. කෙසේවුවද, අක්‍රමවත් රට වසාදැමීම්, ප්‍රවාහන පහසුකම් භාවිතයේ සීමාවන්, වත්කම් නිපැයුම් අසීරුතා සහ උද්ධමනය හේතුවෙන් අපගේ ගනුදෙනුකරුවන් බොහොමයක් වෙත අහිතකර බලපෑම් ඇති විය. ඒ අනුව, මහ බැංකු රෙගුලාසි වලට අනුකූලව අප විසින් වාරික නොගෙවූ මෝටර් රථ අත්පත් කරගැනීම නවතා දමන ලද අතර ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ ක්‍රියාකාරී එළඹුමක් ආදේශ කරගැනුනි.

### සංඛ්‍යාත්මකව මෙහෙයුම් වටපිටාව 2021/22

**ආර්ථික වර්ධනය සහ වෙනත් දර්ශක**

| | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| | ඇස්තමේන්තුව | පුරෝකථනය | |
| ලෝකය | 6.1% | 3.6% | 3.6% |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව | 7.3% | 5.4% | 5.6% |
| ශ්‍රී ලංකාව | 3.6% | 2.6% | 2.7% |
| බංග්ලාදේශය | 5.0% | 6.4% | 6.7% |
| **භාණ්ඩ මිල** | | | |
| ඉන්ධන | 67.3 | 54.7% | -13.3% |
| ඉන්ධන නොවන | 26.8% | 11.4% | -2.5% |
| **පාරිභෝගික මිල** | | | |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව | 2.2% | 3.5% | 2.9% |
| ශ්‍රී ලංකාව | 6.0% | 17.6% | 12.9% |

*මූලය: ලෝක ආර්ථික දර්ශකය 2022 අප්‍රියෙල්*

| | 2021 | 2020 | % |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය (ඇ.ඩො. බිලියන) | 84.5 | 81.0 | 4.32 |
| ඒකපුද්ගල ආදායම (ඇ.ඩො. බිලියන) | 3,815 | 3,695 | 3.25 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය (%) | 49.9 | 50.6 | (0.7) |
| විරැකියාව (%) | 5.1 | 5.5 | (0.4) |
| **දළ දේශීය නිෂ්පාදිත වර්ධනය - ක්ෂේත්‍රය අනුව (රු.බිලියන)** | | | |
| කෘෂිකර්ම | 686.48 | 672.93 | 2.01 |
| කර්මාන්ත | 2,557.00 | 2,427.87 | 5.32 |
| සේවා | 5760.31 | 5,595.18 | 2.95 |

| | April 2022 | March 2022 | March 2021 |
|---|---|---|---|
| උද්ධමනය (%) | 33.8 | 21.5 | 5.1 |
| දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය (%) | 24.09 | 12.28 | 5.11 |
| සාමාන්‍යය බරතබන ලද තැන්පතු අනුපාතය AWDR (%) | 5.52 | 5.17 | 5.20 |
| සාමාන්‍යය බරතබන ලද තැන්පතු අනුපාතය AWPR (%) | 16.38 | 9.85 | 5.78 |
| විනිමය අනුපාතය (රු: 1ඇ.ඩො) | 319.44 | 255.81 | 196.98 |
| විදේශ විනිමය සංචිත (ඇ.ඩො. බිලියන) | 1.81 | 1.92 | 4.06 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

ක්ෂේත්‍රයේ නම්‍යශීලී ඔරොත්තුදීමේ හැකියාව සවිමත් කිරීම සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ගේ අභිලාෂයන් සුරැකීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ක්ෂේත්‍ර ඒකාබද්ධකරණ සැලසුම ක්‍රියාවට නැංවීම අරඹන ලදී. අදාළ ක්‍රියාවලිය සමග සම්බන්ධ වීමට පීපල්ස් ලීසිං සූදානම් නමුත් අපගේ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කරන්නා වූ අත්පත් කරගැනීම් කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

අපගේ ක්‍රමෝපායික අරමුණු ඉටු කර ගැනීම සඳහා සේවක අභිලාෂයන් සපුරාලීම ප්‍රධාන වන අතර සමාගම මගින්, අපගේ සේවකයින් සංවර්ධනය, රඳවාගැනීම සහ දිරිමත් කිරීම තහවුරු කරමින් ආයතනය නිසි පරිමාණයෙන් පවත්වාගෙන යාම සඳහා අංග සම්පූර්ණ වැඩසටහනක් දියත් කරන ලදී. මෙහිදී වසර පුරාම සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කෙරුනු අතර, ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා සුරක්ෂිතතා ක්‍රියාදාමයන් තවදුරටත් ඉහළ නංවන ලදී. අපගේ මානව සම්පත් ක්‍රමෝපාය, මෙම වාර්තාවේ දක්වා ඇති ප්‍රතිඵල අත්පත් කරගැනීමේදී අතිශය වැදගත් තැනක් ගත් අතර ඔවුන්ගේ ගැටලු නිරාකරණය ආයෝජකයින් ඇතුලු සියලු පාර්ශවකරුවන්ගේ පරම අභිමතය අනුව සිදුකෙරිණි.

## ඩිජිටල්කරණය

ඩිජිටල්කරණය වසර තුළ ක්‍රමෝපායික ප්‍රමුඛතාවක් වශයෙන් සැළකුනු අතර, එහිදී අපගේ ක්‍රියාවලීන් අනුකූලනය කිරීම කෙරෙහි අවධානය යොමු විය. එහි ප්‍රතිපලයක් වශයෙන් අත්පත් කරගත් කඩිනම් ජයග්‍රහන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතුටට පත් වූ අතර, වැඩි වැඩියෙන් ව්‍යාපෘති සන්ධිස්ථානයන් සනිටුහන් කිරීම සඳහා වූ කැපවීම සැබැවින්ම ඔවුන් දිරිගන්වන සුලු විය. මා විසින්, වසර තුළදී අප අත්පත් කරගත් ජයග්‍රහන සඳහා සබැඳි තේමාව වශයෙන් යොදාගත් අපගේ පළමු ප්‍රතිපත්තියෙහි දක්වා ඇති පරිදි. අනාගතයේදී පිරිවැය කාර්යක්ෂමතාවය ඔස්සේ ගනුදෙනුකරුවන් සමග ඵලදායී අයුරින් සම්බන්ධ වීමට සහ ඔවුන් සැබැවින්ම සවිබල ගැන්වීම සඳහා මෙකී පරිවර්තනය අත්‍යාවශ්‍ය වේ.

## ආයෝජකයින් වෙත වටිනාකම් අත්පත් කරදීම

### පීපල්ස් ලීසිං - සමාගම

ශුද්ධ පොලී ආදායම් වර්ධනය සඳහා උපකාරී වූ පොලී වියදම් පහළයාම හේතුකොට ගෙන, පැහැරහරින ලද පොලී කපාහැරීමෙන් පසුව වුවද සමාගම ලාභදායීත්වය අතින් ප්‍රබල වර්ධනයක් වාර්තා කලේය. සෑම පිරිවැයක් හෝ ප්‍රයත්නයක් මගින්ම හඳුනාගත් පාර්ශවකරුවකු වෙත වටිනාකම් නිර්මාණය කෙරෙන බව තහවුරු කරමින් අපගේ වටිනාකම් එක් නොකරන ක්‍රියාකාරකම් පහත හෙළමින් පිරිවැය කළමනාකරණය මගින් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී. ණය කළමනාකරණය

සඳහා දරන ලද ප්‍රයත්නයන් සහ යොදවන ලද සම්පත් පිළිබිඹු කරමින් වසර තුළදී අත්විඳින ලද බහුවිධ අභියෝග හමුවේ වුවද අක්‍රීය වත්කම් අනුපාතය 9.21% සිට 8.78% දක්වා පහත වැටිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ණයස සහ ලැබිය යුතු දේ සම්බන්ධ අපහායන ගාස්තු රු. මිලියන 1,043.84 සිට රු. මිලියන 655.43 දක්වා 37.21% කින් පහත වැටුනු අතර ප්‍රතිපාදන ආවරනය 2020/21 පැවති 64.16% සිට 2021/22 දී 72.99% දක්වා වර්ධනය විය.

ගනුදෙනුකරුවන්ගේ අධිණයගැතිභාවය වළකාගනිමින්, මෙහෙයුම් වටපිටාවට සමගාමීව නව ණය ලබාදීම් සම්බන්ධයෙන් අප විසින් අනුගමනය කරන ලද ප්‍රවේශම් සහගත එළඹුම නිසාවෙන්, වසර තුළදී 9.86% ක සීමාකාරී වර්ධනයක් ශේෂ පත්‍රයෙහි දක්වේ. අප විසින් දිගින් දිගටම කොටස්කර ලාභාංශ නිකුත් කිරීම මගින් ප්‍රාග්ධන ස්ථාවරයන් සවිමත් කිරීමේ ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන ලදී. වසර තුළදී, අප විසින් රු. 2,179.93 ක කොටස්කර ලාභාංශ නිකුත් කරන ලද අතර, අපගේ ප්‍රාග්ධන අනුපාතයන් නියාමන අවශ්‍යතාවන්ට බොහෝ ඉහළ මට්ටමක පවතී.

## පීපල්ස් ලීසිං - සමූහය

2021/22 මූල්‍ය වර්ෂය සඳහා සමූහයේ කාර්යසාධනය බදු වලට පසු ලාභය වශයෙන් රු. බිලියන 4.82 ක් වාර්තා වීමෙන් පිළිබිඹු වේ. ශුද්ධ පොලී ආදායම, අපහායනයන් සහ සෙසු පිරිවැය කළමනාකරණය කරන ලද අතර, පීපල්ස් ඉන්ෂුවරන්ස්හි හිමිකම්පෑම් සහ ප්‍රතිලාභ රු. බිලියන 3.23 ක් දක්වා 21.22% කින් ඉහළ නැංවුනි. මෙය පීපල්ස් ඉන්ෂුවරන්ස් වෙත අහිතකර අයුරින් බලපෑ අතර සමූහයේ ලාභදායීත්වය පහල හෙළීම සඳහා දායක විය.

සමූහයේ නම්‍යශීලීත්වය ගොඩනැංවීම සඳහා වන අවධානය විදහා දක්වමින්, මට්ටම 1 සහ සමස්ත ප්‍රාග්ධන අනුපාතයන් පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් 17.72% සහ 18.58% සිට 18.76% සහ 19.67 දක්වා වර්ධනය විය. ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම මගින් පීපල්ස් ලීසිංහි ශ්‍රේණිගත කිරීම A+(lka) වශයෙන් තහවුරු කරන ලද අතර, කෙසේවුවද, ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින ආර්ථික සහ මූල්‍ය වෙළපොල උච්ඡාවචනයන් හමුවේ පීපල්ස් ලීසිං ඇතුලු බැංකු නොවන මූල්‍ය ආයතන 12 ක් සෘණාත්මක ශ්‍රේණිගත කිරීම් වශයෙන් ස්ථානගත කරන ලදී.

## පාර්ශවකාර අවධානාත්මක නායකත්වය

මෙහෙයුම් වටපිටාවේ වෙනස් වන සුලු අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය අවධානයෙන් පසු විය. වසර තුළ අවදානම් මට්ටම් ඉහළ ගිය බැවින් අවගමනකාරී අවස්ථාවන් ප්‍රගතිගාමී අවස්ථාවන් ඉක්මවා ගිය නිසාවෙන්, අවදානම් කළමනාකරණය ප්‍රධාන අවධානාත්මක අංශයක් විය. වර්ධන ගාමකය කඩිනම් කිරීමට පෙර අප විසින් තිරසාර ලෙස යථා තත්ත්වයට පත්වීම අවශ්‍ය වූ බැවින්, අවිනිශ්චිතතාවය මධ්‍යයේ පැහැදිලි ගමන්මගක් සොයා යාමේදී හේතු මූලයන් සම්බන්ධයෙන් කටයුතු කල හැකි පරිපූර්ණ විසඳුම් අවශ්‍ය විය. සංශෝධනයන් සහ නවව ප්‍රතිපත්ති හඳුන්වාදීම සමගින් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම අඛණ්ඩවම සිදුකෙරිනි අපගේ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය යන අපගේ පරම අරමුණ කෙරෙහි අප අවබෝධයෙන් පසුවන බවට තහවුරු කිරීම උදෙසා, ක්‍රමෝපායික දිශානතිය කළමනාකරණයේදී කාර්යසාධනය අධීක්ෂණය අතිශය වැදගත් වේ.

අත්පත් කරගත් කාර්යසාධනය හමුවේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021/22 සඳහා රු. මිලියන 2,179.93 ක සමස්ත වටිනාකමකින් යුත් කොටසකට රු. 1.25 බැගින් වූ කොටස්කර ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස්හිමියන්ගේ අනුමැතිය සඳහා කොටසකට රු. 0.50 බැගින් වූ අවසන් ලාභාංශයක්ද නිර්දේශ කරනු ලබයි.

## වර්ධන ගාමකය නිර්මාණය කිරීම

බොහෝසෙයින් වසරේ වැඩි කාලයක් පැවති සහයෝගී මුදල් ප්‍රතිපත්තිය හේතුවෙන්, 2021 දී ධනාත්මක වර්ධන ගාමකයක් නිර්මාණය වූ අතර එය 2021 අප්‍රියෙල් 6% පුරෝකථනය හා සමගාමී විය. කෙසේවුවද, උද්ධමනාකාරී පීඩනයන් මතුවීම සහ වර්ධනයවීම හේතුවෙන් බොහොමයක් මහ බැංකු මගින් මුදල් ප්‍රතිපත්ති දැඩි කොට ඇති බැවින් විභේද රේඛාවන් පුළුල් වෙමින් පවතී. රුසියානු යුක්රේන යුද්ධය හේතුවෙන් 2022 සහ 2023 සඳහා වන ලෝක ආර්ථික වර්ධන පුරෝකථනයන් 3.6% දක්වා පහළ අතට සංශෝධනය කොට ඇත. මානවීය අර්බුදයට අමතරව, මෙම රටවල් විශාල වශයෙන් ඉන්ධන සහ තිරිඟු නිෂ්පාදනය කරන බැවින් මෙම යුද්ධය හේතුවෙන් ආහාර සහ ඉන්ධන සැපයුම කෙරෙහිද පීඩනයක් එල්ල වී ඇත. පනවා ඇති සම්බාධක සහ ලෝක බැංකුකරණ පද්ධතිය වෙත රුසියාවේ පවතින සීමිත සබදතාවය හේතුවෙන් ලෝක වෙළඳ කටයුතු කෙරෙහිද අහිතකර බලපෑමක් ඇති වේ.

ඉහත විස්තර කරන ලද පරිදි රට පවතිනුයේ ඉතා අසීරු තත්ත්වයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කවර හෝ පාර්ශවකරුවකු හට ජයග්‍රහනය ලැබිය හැකි වන්නේ, අප සැම එක්ව ජයග්‍රහනය කලහොත් පමණක්ම වන බැවින් අපගේ සැලසුම් නම්‍යශීලී සහ පාර්ශවකරුවන් කෙරෙහි අවධානය යොමු කෙරෙන ඒවා විය යුතු වේ. අනාගත ගමන් මාර්ගය විය යුතු වන්නේ සාමූහික සෞභාග්‍යයයි. මෙහිදී, සීමාකාරී වර්ධනය, ණය අවදානම කළමනාකරණය සඳහා ක්‍රියාකාරී එළඹුමක්, ප්‍රතිචාරාත්මක හා වගකීම් සහගත නායකත්වය මත පාදක වූ ප්‍රාග්ධනීකරණය සහ ද්‍රවශීලතාවය ඔස්සේ ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැංවීම කඩනම් අවශ්‍යතා වේ.

තවද, තරගකරුවන් සංචිතයක් අතුරින් විශේෂිත වීමට මෙන්ම පවතින සීමිත අවස්ථාවන් යොදාගනිමින් අපගේ සියලුම පාර්ශවකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා වර්තමාන තත්ත්වය තුළ අප විසින් සමූහ මට්ටමින් නීල සමුද්‍ර (Blue Ocean) ක්‍රමෝපාය අනුගමනය කිරීම අවශ්‍ය වේ.

අපගේ සැලසුම් වෙත සවිමත් ශේෂ පත්‍රයක සහයෝගය හිමි වන අතර අනාගත ලක්ෂණ යහපත් තත්ත්වයට පත් වන විට කඩිනම්ව ඒවාට අනුගත වීම සඳහා අපි සූදානමින් පසුවෙමු. අඛණ්ඩවම අපගේ ආර්ථිකයේ කොඳුනාරටිය වශයෙන් පවතින සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සවිබල ගන්වමින්, ඔවුන්ට යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය දක්වමින්, ඔවුන් ජාත්‍යන්තර අවස්ථාවන් හා සම්බන්ධ කරමින් අවශ්‍ය වර්ධන ගාමකය නිර්මාණය කිරීම සඳහා සියලු ප්‍රයත්නයන් දරනු ලැබේ.

## ප්‍රණාමය

අවසාන වශයෙන්, සිය කැපවීම සහ මෙම අභියෝගාත්මක කාලසමයේදී සමාගම මෙහෙයවීම පිළිබඳව සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත මාගේ ප්‍රණාමය හිමි වේ. එමෙන්ම, සැළකිය යුතු අවිනිශ්චිතතාවක් සහිත වසරක් තුළ ප්‍රබල කාර්යසාධනයක් අත්පත් කරගැනීම සඳහා ලබාදෙන ලද නායකත්වය වෙනුවෙන් ශමින්ද්‍ර මර්සලින් මහතා වෙත මාගේ ස්තුතිය හිමි වේ. ප්‍රබල අභියෝගයන් හමුවේ සමාගම් ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභය වාර්තා කරමින්, සිය සමාගම් සවිබලගැන්වීම සඳහා සාමූහිකව කටයුතු කිරීම සම්බන්ධයෙන් පීපල්ස් ලීසිං සමූහයේ සියලු සේවා කණ්ඩායම් වෙත මාගේ කෘතඥතාවය පුද කෙරේ.

අප හා එක්ව විසිපස් වසරක අපගේ සේවා ගමන්මග සකසා ගැනීමට දායක වූ අපගේ පාර්ශවකරුවන් ගෞරවයේ සිහිපත් කරමි. මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් වෙත ස්තුතිය පුද කරන අතර අවසන් වශයෙන් පසුගිය වසර 25 ක කාලය තුළ අප කෙරෙහි තබන ලද අචල විශ්වාසය වෙනුවෙන් අපගේ කොටස්හිමිකරුවන් වෙත ප්‍රණාමය පුද කෙරේ.



**සුජීව රාජපක්ෂ**
*සභාපති*

2022 ජූලි 26
කොළඹ

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය



# ''පීපල්ස් ලීසිං මගින් සිය ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභය වන රු. බිලියන 4.66 අත්පත් කොට ගත් අතර එය පෙර වසරට සාපේක්ෂව 15.52% ක වර්ධනයකි.''

හිතවත් පාර්ශ්වකරුවනි,

25 වසරක ජනතා සේවාව මැනවින් සනිටුහන් කරමින්, පීපල්ස් ලීසිං මගින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගමෙහි එදා මෙදා තුර ඉහළම බදු පසු ලාභය වන රු. බිලියන 4.66 වාර්තා කරන ලද බව ප්‍රකශයට පත් කරන්නේ ඉමහත් සතුටිනි. මෙම අවස්ථාවේ පවතින අවශ්‍යතාවය වන සාමූහික සෞභාග්‍යය අනුව යමින්, පීපල්ස් ලීසිං, අවිනිශ්චිතතාවන් සහ පුළුල් වෙමින් පවතින විභේද රේඛාවන් සහිත අඛණ්ඩ තෙවන වසරේදීත් සියලු දෙනා හට වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා ගනුදෙනුකරුවන් සහ සේවකයින් යන දෙපාර්ශවය සමගින්ම සහයෝගයෙන් කටයුතු කලේය. අපගේ දර්ශනය යථාර්තයක් බවට පත් කිරීම උදෙසා අපගේ වටිනාකම් තුළ ජීවමාන වෙමින් මෙම සමාගම නිර්මාණය කරන්නා වූ අපගේ සේවක මණ්ඩලයේ අප්‍රතිහත ධෛර්‍යය මෙම ප්‍රතිඵල තුළින් මැනවින් පැහැදිලි වේ.

## රිදී ජුබිලි සැමරුම

විශේෂිත කල්බදු සමාගමක් වශයෙන් සුලු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ සුවිශේෂී අවශ්‍යතා සපුරාලීම සඳහා 1996 මැයි 31 වැනි දින සංස්ථාපිත සීමාසහිත පීපල්ස් ලීසිං සමාගම, මේ වන විට අතිශය තරගකාරී ක්ෂේත්‍රයක් තුළ 11.37% ක වෙළඳපොළ කොටස් හිමිකාරීත්වයක් සහිත අංග සම්පූර්ණ මූල්‍ය සමාගමක් බවට පරිවර්තනය වී තිබේ. අප විසින් මෙම තත්ත්වය අත්පත් කරගන්නා ලද්දේ, දිවයින පුරා පිහිටි ශාඛාවෙන් 111 ක් ඔස්සේ මූල්‍යමය අන්තර්ග්‍රහනය සම්බන්ධ අපගේ දර්ශනය මත පාදක වූ ඓන්‍ද්‍රීය වර්ධනය තුළිනි. අපගේ වර්ධනය කෙරෙහි අපගේ කාර්ය මණ්ඩලය ප්‍රශංසනීය දායකත්වයක් දැක්වූ අතර මෙම වසර ආසන්නය වන විට අපගේ ශ්‍රම බලකාය 2,245 ක් විය. ඔවුන් විසින් අපගේ ගනුදෙනුකරුවන් වෙත උසස්ම සේවා තත්ත්වයන් තහවුරු කරනු ලැබේ.

ගනුදෙනුකාර කේන්ද්‍රගත සමාගමක් වශයෙන්, අපගේ පහසුකම් කළඹ වර්ධනය වෙමින් පවතින ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම සඳහා නිරන්තරයෙන් ඉහළ නංවන ලදී. ඒ අනුව, රන් ණය, උපකරණ කල්බදු සහ තීරු වෙළඳාම් සැලසුම් හඳුන්වාදෙන ලදී. පීපල්ස් ලීසිං 2011 දී කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කරන ලද අතර විනිවිදභාවය සම්බන්ධ කීර්තිමත් ඉතිහාසයක්ද සිය වාර්ෂික වාර්තා උදෙසා වන සම්මාන රැසකින්ද සමන්විත සමාගමක් වේ. 2012 දී මූල්‍ය සමාගමක් වශයෙන් බලපත්‍රය පුලුල් කරන ලද අතර එහිදී බැංකු පහසුකම් ලබාගත නොහැකි කාණ්ඩයන්ගේ ආයෝජන සහ තැන්පතු අවශ්‍යතා සපුරාලීමේ අවස්ථාව අප වෙත උදා විය. මෙම ගනුදෙනුකාර කාණ්ඩයේ විශ්වාසය පීපල්ස් ලීසිං වෙත හිමි වූ අතර 2021 සහ 2022 බ්‍රෑන්ඩ්ස් ඇනුවල් සම්මාන උළෙලේදී මෙරට වඩාත්ම ජනාදරයට පත් කල්බදු සන්නාමය වශයෙන් සමාගම ඇගයුමට පාත්‍රවීම තුළින් එය සනාථ වේ.

අප මේ වන විට අපගේ මීළඟ වර්ධනීය යුගය වෙත සංක්‍රමණය වෙමින් පවතින අතර එහිදී උදා වන අවස්ථාවන් පිළිබඳව අපි උනන්දුවෙන් පසුවෙමු. අපගේ ආර්ථිකයේ කොඳුනාරටිය ශක්තිමත් කිරීම සහ රටේ ඵලදායීතාවය වර්ධනය කරමින් සාමූහික සෞභාග්‍යය සපිරි නව යුගයක් කරා අප දේශය රැගෙන යා හැකි නව ව්‍යවසායක පරපුරක් දිරිගැන්වීම සඳහා මූල්‍යමය අන්තර්ග්‍රහනය සහ ගනුදෙනුකාර කේන්ද්‍රීත්වය වෙත නව අරුතක් ලබාදීම අපගේ සැලසුම් වලට ඇතුළත් වේ.

## පරිවර්තනය ඔස්සේ ප්‍රගතිය කරා...

2021 අවසානය වන විට පැවති අන්තර්ජාල ග්‍රාහකයින් මිලියන 22 කට අධික සංඛ්‍යාවක් වෙත සහ වසංගතය ආශ්‍රිත රට වසාදැමීම් හේතුවෙන් සිදුවූ කඩිනම්ව ඩිජිටල් මාධ්‍යයන් වෙත යොමුවීම කෙරෙහි ප්‍රතිචාර දක්වමින්, අප විසින් පසුගිය වසරේදී අපගේ ඩිජිටල් පරිවර්තන චාරිකාව ආරම්භ කරන ලදී.

මූලික පියවර වශයෙන්, අප විසින් වඩාත් ගනුදෙනුකරුවන්ට මුහුණදෙන පරිවර්තනයන්හි සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා අපගේ අභ්‍යන්තර ඩිජිටල් පරිවර්තනය අරඹන ලදී. අපගේ අභ්‍යන්තර පාර්ශ්වකරුවන් ඩිජිටල් යුගය තුළ ඵලදායී අයුරින් කටයුතු කිරීම සඳහා සවිබලගැන්වීම එහිදී අවශ්‍ය විය. අප විසින් සාමාන්‍ය ණය අනුමත කිරීමේ ක්‍රමය වෙනුවට අන්තර්ජාලගත ණය අනුමත කිරීමේ අන්තර්ජාලගත පෝටලයක් ඔස්සේ ණය යෝජනා ඇරඹීමේ ක්‍රමයක් අපගේ අලෙවි කන්ඩායම වෙත ලබාදෙමින් ක්‍රෙඩිට් ඇප් (CAPP) එක හඳුන්වාදෙන ලදී. අප විසින් සැපයුම්කරුවන් වෙත සිදු කෙරෙන ගෙවීම් ප්‍රමාදයන් තුරන් කරමින්, මහජන බැංකුව ඔස්සේ කඩනමින් පීපල්ස් ලීසිං ගෙවීම් සැකසිය හැකි වන පරිදි නව්‍ය චෙක්පත් ගෙවීමේ ක්‍රමයක් වන DCHEQUE හඳුන්වාදෙන ලදී.

ගනුදෙනුකරුවන්ට මුහුණදෙන පරිවර්තනයන් සළකාබැලීමේදී, ගනුදෙනුකාර පහසුව ඉහළ නංවමින්, සියලුම ගනුදෙනුකාර ගෙවීම් සඳහා බහු සේවා ජාලයක් වන People's Pay Way හඳුන්වාදීම සඳහා අප විසින් අපගේ විශාලතම පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස් සහ මව් සමාගම වන මහජන බැංකුව සමග සහයෝගීතාවයන්ට එළඹෙන ලදී.

පරිපූර්ණ හා බලාත්මක ඩිජිටල් පරිවර්තනයක් සඳහා වන අපගෙ සැලසුම් මගින්, ඇති වන ප්‍රගතිය සම්බන්ධයෙන් අපගේ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් ද්විත්වයම සමපාත වන බවටද, පරිවර්තිත ක්‍රියාවලීන් මගින් අපේක්ෂිත අරමුණු ඉටු වන බවටද, එමගින් ගනුදෙනුකාර පහසුව, සවිබලකරණය සහ වේගවත් සේවා සැපයුම් කාලය යන සේවා ත්‍රිමූර්තිය සපුරාලනු ලබන බවටද තහවුරු කෙරේ. වසර තුළදී ලද කඩිනම් ජයග්‍රහන දිරිගන්වන සුලු වන අතර, එළෙඹන වසරේදිද අපගේ පරිවර්තන ක්‍රියාදාමය තවදුරටත් ඉදිරියට ගෙනයාම අපගේ අරමුණ වේ.

## අභියෝග තුළින් ඉදිරියට...

වසර ඇරඹුනේ කෝවිඩ් 19 වසංගතයේ තවත් රැල්ලක් සහ රසායනික පොහොර සහ කෘෂි රසායන මත පනවන ලද තහනම සමගිනි. ප්‍රතිශක්තිකරණ ව්‍යාපෘතිය සාර්ථක වුවද ආනයන සීමාවන් එලෙසින්ම පැවතුනු අතර විශේෂයෙන්ම නව මෝටර් රථ සඳහා අඛණ්ඩව ආනයන සීමාවන් පනවන ලද තෙවන වසර මෙය විය. වසර ගතවත්ම, මූල්‍ය වර්ෂයේ වසංගතය උග්‍ර වූ දෙවන කාර්තුවේදී අප විසින් ඍණාත්මක වර්ධනයක් වාර්ත කරන ලද අතර, තෙවන කාර්තුවේදී ආර්ථික ක්‍රියාකාරකම් යළි යථා තත්ත්වයට පත්වීමත් සමග ශ්‍රී ලංකාව 2021 කැලැන්ඩර වසර සඳහා 3.7% ක ආර්ථික වර්ධනයක් වාර්තා කලේය. මෙම තත්ත්වය

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය

හමුවේ වුවද, වෙළඳ ශේෂය වර්ධනය වෙමින් පැවති අතර 2021 ජූලි සහ 2022 ජනවාරි මාස වලදී ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් විදේශ සංචිත දැඩි පීඩනයකට ලක්ව පැවතිණි. වසර තුළදී මෙරට ස්වෛරී ශ්‍රේණිගත කිරීම තවදුරටත් අවශ්‍රේණිගත කෙරුනු අතර, එමනිසා අවදානම් ස්වභාවය සළකා බලන කල ණය ලබාගැනීම තවත් අසීරු විය. මූල්‍ය වර්ෂයේ මුල් මාස 11 තුළදී මහ බැංකුවේ මැදිහත් වීමක් ඔස්සේ විනිමය අනුපාතය පටු පරාසයක පවත්වාගෙන යන ලද නමුත්, 2022 මාර්තු මාසයේදී රුපියල සැළකිය යුතු අන්දමින් අවප්‍රමාණය විය. 2021 මාර්තු මස පැවති සාමාන්‍යය බරතබන ලද වාරික අනුපාතය (AWPR) 5.78% සිට 2022 මාර්තු වන විට 9.85% ක් වශයෙන් සංචලනය වෙමින් ඉහළයන උද්ධමන අනුපාතයට ප්‍රතිචාරයක් වශයෙන් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් වසරේ දෙවන භාගයේදී පොලී අනුපාත ඉහළ ගියේය.

වසර තුළදී සැළකිය යුතු විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රමාණයක් නියාමිත/නිල මාධ්‍යයන්ට වඩා නිල නොවන මාධ්‍යයන් ඔස්සේ සංසරණය වූ විනිමය සඳහා වූ අවිධිමත් වෙළඳපොලක වර්ධනයක් දක්නට ලැබුනි. සංචාරක කර්මාන්තයද 2021 නොවැම්බර් මස වන විට යථා තත්ත්වයට පත් වූ අතර 2022 මාර්තු මස සංචාරකයින් 106,500 ක් වාර්තා විය. 2022 මාර්තු වන විට ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් මනින ලද පරිදි උද්ධමනයද 21.5% දක්වා ප්‍රබල අයුරින් වර්ධනය විය. කෙසේවුවද, විදේශ විනිමය ගලාඒම් මාසික ආනයන බිල්පත් ගෙවීම සඳහ ප්‍රමාණවත් නොවූ පසුබිමක් තුළ එය ගෑස් සහ ඉන්ධන හිගයන් සහ 2022 වන විට විදුලි කප්පාදු කිරීම් කෙරෙහි හේතු විය. මෙකී සියලු සාධක ජනතාවගේ ක්‍රය ශක්තිය පහත හෙළීම කෙරෙහි දායක වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දිවයින පුරා සමාජ අස්ථාවරත්වය සහ විරෝධතා ඇති විය.

මේ වන විට අප දේශය ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු ගත කරන විශාලතම අර්බුධකාරී සමය තුළ පසු වන බවට විවාදයක් නොමැත. ප්‍රබල අවදානම් කළමනාකරණ පද්ධතීන් මගින්, අසීරු වසරක් තුළ අපගේ ගනුදෙනුකරුවන් හා සේවකයින් යන දෙපාර්ශ්වයම වෙත අප විසින් සකසන ලද යෝග්‍ය වූ ප්‍රතිචාරයන් සඳහා අවශ්‍ය අවබෝධයන් සහ පූර්ව දැනුම්දීම් සිදුකරන ලදී. අප විසින් සවිමත් ශේෂ පත්‍රයක් සහ දිරිගන්වන සුලු කාර්යසාධනයක් සමගින් වසර අරඹන ලද බැවින්, අපගේ පාර්ශවකරුවන් සඳහා ඉතා ඉහළ වූ ප්‍රතිචාරයන් සැකසීමේ නිදහස් අවකාශය අප සතු විය.

### ක්ෂේත්‍රයේ දෘෂ්ටිකෝණයන්

පෙර වසරේ ලාභ වර්ධනය 124.22% කින් ඉහළ නැංවීමෙන් අනතුරුව මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය, රු. බිලියන 59.82 ක් දක්වා 101.71% ක ලාභ වර්ධනයක් වාර්තා කලේය. ශුද්ධ පොලී ආදායම රු. බිලියන 128.5 ක් දක්වා 11.54% කින් ඉහළ නැංවුනු අතර එය මුලු මෙහෙයුම් ආදායමෙන් 74.68% කට දායක විය. පොලී නොවන ආදායම රු. බිලියන 43.48 ක් දක්වා 8.43% කින් වර්ධනය වූ අතර එය රු. බිලියන 171.72 ක් වූ මුලු මෙහෙයුම් ආදායමෙහි ඉතිරි 25.32% නියෝජනය කලේය. ඉහළනැංවුනු ලාභදායීත්වය කෙරෙහි දායක වෙමින්, අපහායනය සඳහා වන ගාස්තු පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 26.68 ට සාපේක්ෂව, රු. බිලියන 6.21 දක්වා 76.72% ක කැපීපෙනෙන පහළයාමක් වාර්තා කලේය. ඒ අනුව, බදු වලට පෙර ලාභය රු. බිලියන 85.12 ක් දක්වා 74.91% කින් වර්ධනය විය.

උකස් සහ ණය සේවාවන්ගේ ඉහළයාම කරණ කොට ගෙන 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසරේදී බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයෙහි සමස්ත වත්කම් රු. බිලියන 1,589.84 දක්වා 14.28% කින් ඉහළ නැංවුනි. ක්ෂේත්‍රයේ ප්‍රාග්ධනිතය 24.87% කින් ඉහලගිය අතරතුර, පෙර වසරේ වාර්තා වූ අරමුදල් සම්පාදනයෙන් 20.32%ට සාපේක්ෂව මෙම වසරේදී 22.15% ක් වූ රු. බිලියන 333.67 ක් වූ ස්කන්ධ අරමුදල් සම්පාදනය මගින් ක්ෂේත්‍රයේ මූල්‍යමය නම්‍යශීලීත්වය වර්ධනය විය. තැන්පත්කරුවන් වෙත නිරාවරනය වීම සම්බන්ධ විචක්ෂණශීලී කළමනාකරණය පිළිබිඹු කරමින්, තැන්පතු වර්ධනය පෙර වසරේ වාර්තා වූ අරමුදල් සම්පාදනයෙන් 57.59% ට සාපේක්ෂව මෙම වසරේදී 5.88% පහළයාමක් සමගින් 53.23% ක් වශයෙන් දැක්වුනු අතර එහි වටිනාකම රු. බිලියන 801.67 ක් විය. ක්ෂේත්‍රයේ ණය ලබාගැනීම් රු. බිලියන 370.83 ක් දක්වා 27.71% කින් වර්ධනය වූ අතර එය 2020/21 වසරේ වාර්තා වූ 25.83% ට සාපේක්ෂව වගකීම් වලින් 29.52% ක් සඳහා දායක විය.

ක්ෂේත්‍රයේ වර්ධනය වූ නම්‍යශීලීත්වය විදහා දක්වමින්, මූලික ප්‍රාග්ධන අනුපාතය සහ අවදානම මත පදනම් වූ වත්කම් වෙත ප්‍රාග්ධන පදනම් අනුපාතය පිළිවෙලින් 14.17% සහ 15.44% සිට 16.15% සහ 17.68% දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය ඒකාබද්ධ කිරීමේ සැලසුම ක්‍රියාවට නංවමින් වසර තුළදී ප්‍රගතියක් අත්කර ගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් හවුල්කාරීත්වයන්/අත්පත් කරගැනීම් තුනක් වසර තුළ සිදුවූ අතර ඉන් එකක් මගින් විශාලතම බැංකු නොවන මූල්‍ය ආයතනය වශයෙන් වූ අපගේ ශ්‍රේණිගත කිරීම අතික්‍රමණය කරන ලදී. පීපල්ස් ලීසිං මෙම ඒකාබද්ධකරණ වැඩසටහනට සහාය දක්වන නමුත් නිසි අවධායෙන් යුතුව සහ ප්‍රවේශම් සහගතව කවර හෝ අනාගත හවුල්කාරීත්වයක් හෝ අත්පත් කරගැනීමක් සඳහා සහභාගීවීමේ සූදානමින් පසු වේ.

### අපගේ ගනුදෙනුකරුවන් සඳහා

අප විසින් අපගේ කළඹෙන් රු. බිලියන 24.90 ක් (18.18%) පමාසහන වශයෙන් ලබාදෙමින් වසර ආරම්භ කරන ලද අතර මේ සියල්ල පිරිනැමුනේ අපගේම වියදමිනි. අප විසින් වසර තුළදී, විශේෂයෙන්ම මගී ප්‍රවාහනයේ යෙදී සිටින අපගේ ගනුදෙනුකරුවන් තවදුරටත් ණයගැතිභාවයට පත් කරමින් අසීරුතාවයට පත් නොකර රු. බිලියන 1,268.79 ක වටිනාකමින් යුතු පැහැරහරින ලද පොලී කපාහරින ලදී. වසංගතයෙන් පසුව සිය ව්‍යාපාර කටයුතු යළි ගොඩනංවා ගැනීම උදෙසා අප විසින් පුද්ගලික මගී ප්‍රවාහන ගනුදෙනුකාර කාණ්ඩය වෙත "හිත මිතුරු" නමින් අඩු පොලී සහන ණය මුදලක් ද හඳුන්වාදෙන ලදී. වසර තුළදී මෙම සැලසුම යටතේ ණය පහසුකම් 2,000 කට අධික සංඛ්‍යාවක් පිරිනමන ලද අතර එහි වටිනාකම රු. මිලියන 5,127.48 ක් විය.

### ප්‍රබල ක්‍රියාකාරීත්වයක්

#### පීපල්ස් ලීසිං - සමාගම

පීපල්ස් ලීසිං මගින් සිය ඉතිහාසයේ ඉහළම බදු වලට පසු ලාභය වන රු.බිලියන 4.66 ක මුදලක් අත්පත් කරගත් අතර එය පෙර වසරට සාපේක්ෂව 15.52% ක ඉහළයාමකි. මෙය සාක්ෂාත් කරගන්නා ලද්දේ පොලී ආදායමෙහි 4.41% ක පහළයාමක් මධ්‍යයේ වුවද පොලී වියදමෙහි 17.09% ක පහළයාම මගින් එය හිලව් කෙරිණි. එහි ප්‍රතිපලයක් වශයෙන් ශුද්ධ පොලී ආදායම 2020/21 ට සාපේක්ෂව 9.48% ක ඉහළයාමක් සමගින් රු.බිලියන 13.05% ක් වශයෙන් වාර්තා විය. මුලු මෙහෙයුම් ආදායම රු. බිලියන 15.91 දක්වා 13.32% කින් ඉහළගිය අතර අපහායන ගාස්තු රු. මිලියන 655.43 දක්වා 37.21% කින් පහත වැටිනි. එහිදී ශුද්ධ මෙහෙයුම් ආදායම රු. බිලියන 15.13 ක් වශයෙන් දැක්විනි. ප්‍රධාන වශයෙන් පුද්ගල වියදම් සහ වෙනත් මෙහෙයුම් වියදම් ඉහළයාම හේතුවෙන් මුලු මෙහෙයුම් වියදම් 17.85% කින් ඉහළ ගියේය. මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය රු. බිලියන 8.30 ක් දක්වා 16.91% කින් වර්ධනය විය. මූල්‍ය සේවා මත බදු සහ ආදායම් බදු පිළිවෙලින් රු. මිලියන 1.65 ක් සහ රු. බිලියන 1.99 ක් දක්වා 34.56% කින් සහ 8.24% කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම් ඉතිහාසයේ ඉහළම ලාභය වාර්තා කරමින් බදු වලට පසු ලාභය රු. බිලියන 4.66 ක් දක්වා15.52% කින් වර්ධනය විය. ඒ අනුව, කොටසකට ඉපැයුම් රු. 2.14 සිට රු. 2.47 දක්වා ඉහළ නැංවුනි.

#### පීපල්ස් ලීසිං - සමූහය

පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 5.60 ට සාපේක්ෂව සමූහයේ බදු වලට පසු ලාභය විමර්ශනයට ලක් වන වසර තුළ රු. බිලියන 4.82 දක්වා පහත වැටීමක් වාර්තා කලේය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මූල්‍ය වර්ෂය තුළ අත්විඳින ලද ඉහළ රක්ෂණ හිමිකම්පෑම් හේතුවෙන් සමූහයේ රක්ෂණ ව්‍යාපාරය වන

## ''අපගේ සැලසුම් වල අවධානය යොමු වන්නේ අපගේ සේවා ව්‍යාප්තිය ස්ථාවර කරමින් අපගේ ඩිජිටල් නියෝජනය ව්‍යාප්ත කිරීම තුළින් සමූහය පරිමාණාත්මකබව සහ කාර්යක්ෂමතාවය අතින් නව යුගයක් කරා රැගෙන යාම කෙරෙහිය.''

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි ලාභදායීත්වය පහළ යාමයි. සමූහය විසින් රු. බිලියන 14.72 ක ශුද්ධ පොලී ආදායමක් වාර්තා කරන ලද අතර සමස්ත වටිනාකමින් 88% ක් සඳහා පීපල්ස් ලීසිං දායක විය. පීපල්ස් ඉන්ෂුවරන්ස් හි ශුද්ධ ඉපැයුම් වාරිකය රු. බිලියන 4.94 දක්වා 1.78% කින් සුලු වශයෙන් පහත වැටුනු අතර එය රු. බිලියන 1.40 ක වටිනාකමකින් යුතු ගාස්තු හා කොමිස් ආදායමෙහි 10% ක ඉහළයාම මගින් හිලව් කෙරිනි. එහිදී මුලු මෙහෙයුම් ආදායම පෙර වසරට සාපේක්ෂව 5.70% ක වර්ධනයක් සමගින් රු. බිලියන 21.43 ක් වශයෙන් දක්විනි. අපහායන අලාභයන් රු. මිලියන 951.76 දක්වා 29.63% කින් පහත වැටුනු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සමූහය මගින් රු. බිලියන 20.35 ක ශුද්ධ මෙහෙයුම් ආදායමක් වාර්තා කරන ලදී. එය 2020/21 ට සාපේක්ෂව 8.15% ක ඉහළයාමකි. වසර තුළදී ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම්, පුද්ගල වියදම් සහ වෙනත් මෙහෙයුම් වියදම් ඉහළයාම හේතුවෙන් මුලු මෙහෙයුම් වියදම් වර්ධනය විය. එහිදී මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය රු.බිලියන 8.93 දක්වා පෙර වසරට සාපේක්ෂව 1.91% ක සුලු පහළ යාමක් වාර්තා කලේය. වසර සඳහා මූල්‍ය සේවා මත බදු 33.90% කින්ද ආදායම් බදු ගාස්තුව 7.73% කින්ද ඉහළ නැංවුනි.

වසර තුළදී සමූහයේ සෙසු පරිපාලිතයන් වන පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම සහ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම මනා කාර්යසාධනයක් අත්කරගත් අතර පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම සහ පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගම, ඒවා ස්ථාපනය කල දින පටන් ඉහළම බදු වලට පසු ලාභය වාර්තා කරමින් වාර්තාගත කාර්යසාධනයක් අත්කර ගත්තේය. බංග්ලාදේශයේ නැවත නැවතත් ඇති වූ කොවිඩ් 19 රැළි හේතුවේ උද්ගත වූ සැළකිය යුතු අභියෝගයන් හමුවේ වුවද, සමූහයේ විදේශීය පරිපාලිතය ලන්කන් එලායන්ස් ෆිනෑන්ස් සමාගම ද ප්‍රශංසනීය කාර්යසාධනයක් අත්කර ගැනීමට සමත් විය.

### අවදානම් කළමනාකරණය කිරීම

අවදානම් කළමනාකරණය අඛණ්ඩවම පීපල්ස් ලීසිංහි ප්‍රමුඛ අවධානාත්මක අංශය වන අතර අප විසින් මේ සම්බන්ධයේ විශාල වශයෙන් ආයෝජන සිදුකොට ඇත. නව ප්‍රතිපත්ති පහක් හඳුන්වාදීමත් සමග අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් විය. අප විසින් නිරන්තරයෙන් සාකච්ඡා පවත්වමින් කල්තබා අනතුරු ඇඟවීමේ ලක්ෂණ හඳුනාගැනීමේ අරමුණින් අපගේ ව්‍යාපාරය වෙත බලපෑ හැකි අනාගත තත්ත්වයන් අවබෝධ කර ගනු පිණිස ණය අවදානම පිළිබඳ දීර්ඝ වශයෙන් සංවාද පවත්වන ලදී. මෙහිදී සවිබලගන්වන ලද ප්‍රධාන අවදානම් කාණ්ඩයන් වූයේ සමූහය නිරාවරනය වන ප්‍රධානතම අවදානම වන ණය අවදානම වූ අතර මෙහෙයුම් අවදානම, තොරතුරු තාක්ෂණ අවදානම සහ සමූහ අවදානම කෙරෙහිද අවධානය යොමු කෙරිණි.

වසර තුළදී ණය අවදානම වෙත උපරිම නිරාවරනය සමාගම සඳහා රු. බිලියන 181.11 දක්වා 9.51% කින්ද සමූහය සඳහා රු.බිලියන 207.76 දක්වා 14.15% කින්ද ඉහළ ගියේය. වසර අවසානයේදී කළඹ සංකේන්ද්‍රණයන් සමාගම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් 21.79% ක් වශයෙන් කෘෂි ක්ෂේත්‍රය සම්බන්ධයෙන් 20.21% ක් වශයෙන් දක්වුනු අතර මෙකී ක්ෂේත්‍රයන් සඳහා සමූහයේ නිරාවරනය පිළිවෙලින් 20.24% ක් සහ 19.50% ක් විය. වසර දෙකක අකුමවත් රට වසාදැමීම් වලින් පසු ඇති වූ ඉන්ධන හිඟයේ බලපෑම සහ පොහොර තහනම හා ඉන්ධන හිඟය හමුවේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ප්‍රවාහනය පහත වැටීම හේතුවෙන් ප්‍රවාහන ක්ෂේත්‍රය කැපී පෙනෙන අහිතකර බලපෑමකට ලක්ව ඇත. කෙසේවුවද, මෙකී ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සමීපව නිරීක්ෂණය කෙරෙන අතර ගනුදෙනුකරුවන් හට සිය මෙහෙයුම් කටයුතු යථා තත්ත්වයට පත් කරගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදෙමින් පවතී. නව ණය පහසුකම් වල ණය ගුණාත්මකභාවය සැළකිය යුතු අයුරින් වර්ධනය වූ අතර පැවති කළඹ තවමත් ගැටලුවක්ව පවතී. පැවති කළඹ කළමනාකරණය සහ අදාළ පියවාගැනීම් සඳහා අප විසින් විශේෂිත ණය කළමනාකරණ ඒකකයක් පිහිටුවීමට කටයුතු සිදුකෙරෙමින් පවතී.

නියාමන අවශ්‍යතාවයන්ට බෙහෙවින් ඉහළ මට්ටමක පවතින විචක්ෂණශීලී ද්‍රවශීලතා අනුපාතයන් ආශ්‍රයෙන් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කෙරේ. වෙළඳපොල අවදානම පුළුල් තත්ත්වයක් සහ සංවේදීතා විශ්ලේෂණයක් ඔස්සේ කළමනාකරණය කරන ලද අතර, කල්බදු වගකීමේ කෙරෙහි අහිතකර බලපෑමක් ඇති විය හැකි වුවද, පොලී අනුපාතයන්හි ඉහළ යාමක් සමාගම සහ සමූහය වෙත වාසිදායක වනු ඇති බවට අනාවරනය විය. මධ්‍යස්ථ වටිනාකමට ණය අනුපාතයක් ඔස්සේ කළමනාකරණය කරනු ලබන රන් ණය සම්බන්ධ භාණ්ඩ මිල අවදානම හැරුනු විට වෙළඳපොල අවදානමෙහි සෙසු සංරචකයන් ඉහළ මට්ටමක නොපැවතිනි.

### අනාගතය සඳහා කණ්ඩායමක් නිර්මාණය කරමින්...

අපගේ සේවා කණ්ඩායම විසින් නැවතත් අතිවිශිෂ්ට කාර්යසාධනයක් විදහා දක්වන ලද අතර අප, පෙරළා, ඔවුන්ගේ සුබසිද්ධිය තකා කටයුතු කරන බවට තහවුරු කොට ඇත. ගෙවීමට නියමිතව පැවති වැටුප් වර්ධකයන් රැසක් ගෙවන ලද අතර පුහුණු ශ්‍රමය වෙත දැඩි ඉල්ලුමක් පවතින වෙළඳපොලක් තුළ තරගකාරී අයුරින් කටයුතු කිරීම උදෙසා වැටුප් සහ ප්‍රතිලාභ ඉහළ නංවන ලදී.

ඔවුන් වෙත පවරනු ලැබ ඇති කාර්යභාරයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය නිපුණතා සහ දැනුම අපගේ සේවකයින් සතු වන බවට තහවුරු කිරීම සඳහා සහ ඔවුන් අනාගතයට මුහුණදීම සඳහා සූදානම් කිරීම සඳහා සමාගම මගින් පුහුණු කටයුතු වෙනුවෙන් වාර්තාගත මුදලක් ආයෝජනය කරනු ලැබ ඇත. සේවකයින්ට පහසුවෙන් භාවිත කල හැකි අන්තර්ජාලගත අධ්‍යයන කටයුතු සිදුකිරීම සඳහා අප විසින් අධ්‍යයන කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදෙන ලදී. සිය භූමිකාවන් වෙත අරුතක් එක් කරමින් පරිපූර්ණ කාර්යසාධනයක් උදෙසා ඔවුන් දිරිගැන්වීම සඳහා සේවකයින් වෙත මූල්‍යමය ප්‍රමුඛ කාර්යසාධන දර්ශක මෙන්ම මූල්‍ය නොවන ප්‍රමුඛ කාර්යසාධන දර්ශකද ලබාදී ඇත. අප විසින් උසස්වීම් කඩිනම් කිරීම සඳහා කුසලතා සංචිතයන් හඳුනාගනු ලැබ ඇත. මෙහිදී හඳුනාගත් කළමනාකරුවන් පුහුණු කිරීම සඳහා බාහිර පුහුණුකරුවන්ගේ සහාය ලබාගැනුනි. ඇතැම් වැඩසටහන් පමණට වඩා අපේක්ෂා සහගත වූ අතර එමගින් වෘත්තීය ජීවිතයේ ඉහළට යාම සඳහා සේවකයින් දිරිගැන්විනි. අප විසින් ඉහළ සේවා තත්ත්වයන් පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කරමින් ගනුදෙනුකාර සේවා පුහුණුව කෙරෙහි සැළකිය යුතු අවධානයක් යොමු කෙරිණි.

### ප්‍රජාවන් සවිබලගන්වමින්...

අප විසින් දිගින් දිගටම අපගේ මෙහෙයුම් සිදුකෙරෙන්නා වූ ප්‍රජාවන් සමග සහසම්බන්ධතාවයක් පවත්වා ගනු ලැබේ. මෙම වසරේදී අපගේ අවධානය දිවයින පුරා රෝහල් වෙත සහයෝගය ලබාදීම කෙරෙහි යොමු වූ අතර එහිදී රු. මිලියන 25.92 ක් වටිනා උපකරණ සහ ඖෂධ පරිත්‍යාග කෙරිණි.

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය

## ඉදිරි දැක්ම

ඉන්ධන, ගෑස්, බලශක්තිය සහ ඖෂධ හිගය හේතුවෙන් දිගින් දිගටම ආර්ථික කටයුතු අඩපණ වී ඇති බැවින් මෙම සටහන තබන මෙහොතේදී ශ්‍රී ලංකාවේ ස්වරූපය අවිනිශ්චිතභාවයක් උසුලන බව පැවසිය හැක. ණය තිරසාරභාවය ආශ්‍රිත අභියෝගයන් තුළින් මතුවන ගැටලු අප වටා පවතින දැඩි අවදානම පිළිබිඹු කරයි. ඉදිරි මාස වලදී ආහාර සුරක්ෂිතභාවය පවත්වාගෙන යාමට පවතින අස්වනු ප්‍රමාණවත් නොවන අතර අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා පවතින විදේශ විනිමය සංචිතද ප්‍රමාණවත් නොවේ. 2022 අප්‍රියෙල් 8 වැනි දින ප්‍රතිපත්ති අනුපාතයන් ඉහළ නැංවූනු අතර එහි ප්‍රතිපලයක් වශයෙන් පොලී අනුපාතයන්හි තියුණු උඩුකුරු සංචලනයක් සිදුවිය. 2022 අප්‍රියෙල් මස උද්ධමනය ප්‍රබල අයුරින් 33.8% දක්වා ඉහළ ගිය අතර රුසියානු යුක්රේන ගැටුම හේතුවෙන් ඉහළ යන ඉන්ධන හා ආහාර මිල හමුවේ එය තවදුරටත් ඉහළ නගිනු ඇත. අපනයනයන් ස්ථාවර මට්ටමක පැවතියද රටේ පවතින දේශපාලනික අස්ථාවරත්වය හේතුවෙන් යථා තත්ත්වයට පත්වෙමින් පැවති සංචාරක කාර්මාන්තය යළි මන්දගාමී විය. විදේශ විනිමය ද්‍රවශීලතාවය මෙන්ම විනිමය අනුපාත උච්චාවචනය සහ ඉහළ යන ඉන්ධන මිල ප්‍රධාන ගැටලු වශයෙන් සැළකිය හැකි වේ. වියදම් කල හැකි ආදායම සංකෝචනය වීම හමුවේ අවශ්‍යයෙන්ම ඉල්ලුම සීමාකාරී වේ. රජයේ ආදායම් රැස්කිරීම් ඉහළ නංවමින් ආදායම් බදු කඩඉම් සීමාවන් පහත දැමීම, උපයන විට ගෙවීමේ බද්ද සහ සමාජ ආරක්ෂණ බද්ද ප්‍රතිස්ථාපනය සහ එකතු කල අගය මත බදු ඉහළ නැංවීම සිදු කෙරිණි. රටේ ආර්ථික ස්ථාවරත්වය සඳහා රජය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර පැවැත්වෙන සාකච්ඡා අතිශය තීරණාත්මක වේ. මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය මතු වන්නේ ආර්ථික විද්‍යාඥයින් විසින් ලෝක ආර්ථික අවගමනයක් සම්බන්ධයෙන් පුරෝකථනය කරනු ලබන අවස්ථාවක වන අතර එහිදී ඇතිවන ආර්ථික අස්ථාවරත්වය තුළ ඇතැම් ධනාත්මක අවස්ථාවන්ද ඇති විය හැක. තවද, අපගේ අපේක්ෂාව වනුයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයද වසර තුළදී මෙරට ආහාර සුරක්ෂිතතාවය නැවත ඇති කිරීම සඳහා පරිවර්තනීය වෙනසක් සිදු කරනු ඇති බවයි. ආනයන අත්හිටවූ අවස්ථාවේදී මෙරට කහ වගාව සාර්ථකව සිදුකරන ලද ආකාරයෙන්ම මේ වන විට දියත් කොට ඇති කෘෂි ව්‍යාපෘති මගින් නැවත ශ්‍රී ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත රටක් බවට පත් කල හැකි බව අපගේ විශ්වාසයයි.

අපගේ සැලසුම් වල අවධානය යොමු වන්නේ අපගේ සේවා ව්‍යාප්තිය ස්ථාවර කරමින් අපගේ ඩිජිටල් නියෝජනය ව්‍යාප්ත කිරීම තුළින් සමූහය පරිමාණාත්මකබව සහ කාර්යක්ෂමතාවය අතින් නව යුගයක් කරා රැගෙන යාම කෙරෙහිය. සමූහයේ අවදානම් රුචිය අනුව රටේ පවතින තත්ත්වයන්ට අදාළ සැලසුම් ප්‍රවර්ධනය කිරීම සඳහා අප විසින් අපගේ සැලසුම් කළඹ සමාලෝචනයට ලක් කෙරේ. මෙම වසරේ ලාභය සඳහා අයකර ගැනීම් ප්‍රබල දායකත්වයක් දැක්වූ අතර අප විසින් ලාභදායීත්වය සහ වත්කම් ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සඳහා මෙම වැදගත් අංශය වෙත අඛණ්ඩව අවධානය යොමු කරනු ලැබේ. තවද, අප විසින් ණය ක්‍රියාවලිය සවිබලගැන්වීම කෙරෙහිද අවධානය යොමු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව මගින්, ණය අවදානම් පිළිගැනීම සවිමත් කරමින්, පූර්ව නිශ්චිත කඩඉම් සීමාවන්ට ඉහළින් ණය පහසුකම් සමාලෝචනයද සිදුකෙරෙනු ඇත. උසස් තත්ත්වයේ ණය වත්කම් වර්ධනය කෙරෙහි ඉඩකඩ සලසමින් පැවති කළඹ කළමනාකරණය වෙන් කොට සිදු කෙරෙනු ඇත. කෙසේවුවද, අප විසින් මෙරට ආර්ථිකයේ කශේරුකාව වෙත මුදල් සම්පාදනය කරනු ලබන බව වටහා ගනිමින් අපි ගනුදෙනුකරුවාගේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කෙරෙන ආකෘතිකරාමුවක් තුළ කටයුතු කිරීමට අපේක්ෂා කරමු. ද්‍රවශීලතාවය ප්‍රධාන ප්‍රමුඛතාවක් වන අතර අප විසින් අවශ්‍ය ද්‍රවශීලතා මට්ටම් පවත්වාගෙන යාම සඳහා ආර්ථික ලාභය සමබර කරගැනේ. අපගේ කල්පිරීමේ ස්වරූපයන් විචක්ෂණශීලීව ගලපනු ලබන අතර ද්‍රවශීලතා මට්ටම් නියාමනමය මටටම් වලට බෙහෙවින් ඉහළ තත්ත්වයක පවත්වාගැනේ. මේ සම්බන්ධයෙන් වසර පුරා අඛණ්ඩව නිරීක්ෂණයක් සිදු කෙරේ.

ක්ෂේත්‍රය ඒකාබද්ධකරණය තුළින් හවුල්කාරීත්වයන් සහ අත්පත් කරගැනීම් සඳහා අවස්ථාවන් උදා වන අතරතුර, මේ සම්බන්ධ නිසි අවස්ථාවන් කෙරෙහි අප අවදියෙන් පසුවෙමු. සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව ඇතුලුව ණය අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම් සහ තොරතුරු තාක්ෂණ අවදානම් එළඹෙන වසරේදී ඉහළ මට්ටමක පවතිනු ඇති අතර අප විසින් අපගේ වාර්තාකරණ වසරේ අත්දැකීම් උපයෝගී කරගනිමින් මෙකී අවදානම් කළමනාකරණය සඳහා අදාළ ක්‍රියාවලීන් සවිමත් කරනු ලැබ ඇත.

## ප්‍රණාමය

අප වෙත සපයන ලද මාර්ගෝපදේශනය වෙනුවෙන් අපගේ මව් සමාගම වන මහජන බැංකුව මෙන්ම, සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කෘතඥතාවය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කොට ගනිමි. මෙම වෘත්තික කණ්ඩායම මෙහෙයවීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් කොට සළකන අතර ඔවුන්ගේ සහයෝගය සහ කැපවීම නිසාවෙන්ම අප හට පසුගිය වසරේදී අති විශිෂ්ට ප්‍රතිපල අත්කර ගැනීමට හැකි විය. අප සමාගම මෙරට වඩාත්ම ජනාදරයට පත් කල්බදු සන්නාමය බවට පත් කල ගනුදෙනුකරුවන් වෙත මාගේ ප්‍රණාමය හිමි වන අතර ඉදිරි වසරේදීද ඔවුන් වෙත අපගේ අඛණ්ඩ සහයෝගය හිමි වන බව මම සහතික කරමි. පීපල්ස් ලීසිං සමූහයෙහි අභිවෘද්ධිය පිළිබඳව තබන ලද අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් අපගේ ව්‍යාපාරික සහකරුවන් සහ ආයෝජකයින් වෙත මාගේ ප්‍රණාමය පුද කෙරේ. අප වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අංශයේ නිලධාරීන් වෙත ස්තුතිය පුද කර සිටිමි.

නිසැකවම එළඹෙන වසර පෙර වසරට වඩා අභියෝගාත්මක වනු ඇත. අප එළඹෙන වසර වෙත පියනගනුයේ සවිමත් කාර්යසාධනයක්, ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සහ පෙර වසර තුනේදී ලද ප්‍රඥාපූර්ණ අත්දැකීම් රැසක් සමගිනි. තවද, අපගේ ක්‍රමවේදයන් මගින් අප වෙත ක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරු අවබෝධයන් ලබාදෙමින් මෙහෙයුම් සහ කළමනාකාරීත්ව මට්ටම් වලදී වඩාත් කාර්යක්ෂමව කටයුතු කිරීම සඳහා අපගේ හැකියාවන් වැඩිදියුණු කරයි. අපගේ වටිනාකම් හෝ ස්ථාවරත්වය රැක ගනිමින් එළඹෙන වසරේදී තරගකාරීව කටයුතු කිරීමට අවශ්‍ය මෙවලම් අප සතු වේ. එළඹෙන මාස කිහිපය තුළ පවතින අවිනිශ්චිතතායවන්ගෙන් උච්චාවචනයන්ගෙන් ඔබ්බට යාම සඳහා අප සමග අත්වැල් බැඳගන්නා මෙන් මම අපගේ සියලුම පාර්ශ්වකරුවන් හට ආරාධනා කරමි.



**ශමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී*

2022 ජූලි 26
කොළඹ

# වටිනාකම් නිර්මාණ ආකෘතිය

වටිනාකම් නිර්මාණ ආකෘතිය 26
පාර්ශ්වකාර සහභාගීත්වය 28
මෙහෙයුම් වටපිටාව 31
ප්‍රාමාණිකත්වය 34
අපගේ ක්‍රමෝපාය 40



අපගේ පහසු සේවා සැපයුම හා සම්බන්ධ වෙමින්



# වටිනාකම් ගොඩනැංවීමේ ආකෘතිය

තිරසාර වටිනාකම් නිර්මාණය

අපගේ මෙහෙයුම් වෙත අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක

ත්‍රිත්ව ආදායම් මාර්ග

## ආදානයන්

**මූල්‍ය ප්‍රාග්ධනය**

- මුලු වත්කම්: රු. බිලියන 164.55
- මුලු වගකීම්: රු. බිලියන 130.21
- ස්කන්ධ: රු. බිලියන 34.34
- මුලු ණය ලබාගැනීම්: රු. බිලියන 20.26

**මානව ප්‍රාග්ධනය**

- සේවකයින් 2,343 කින් සමන්විත ශ්‍රම බලකායක් සවිබලගන්වන ලදී.

**සමාජ හා සබඳතා ප්‍රාග්ධනය**

- ගනුදෙනුකරුවන් 353,414 ක්
- ව්‍යාපාරික සහකරුවන් 38,890 ක්
- ප්‍රජා සබඳතා

**බුද්ධිමය ප්‍රාග්ධනය**

- අපගේ මව් සමාගමෙහි සවිබලය
- රු. බිලියන 8.13 ක සන්නාම වටිනාකම
- රු. මිලියන 36.76 ක් වටිනා මෘදුකාංග
- සහතිකත්වයන් සහ සම්මාන
- ආයතනික ව්‍යංගිත දැනුම
- දැනුම බෙදාහදා ගන්නා වටපිටාව

**නිෂ්පාදිත ප්‍රාග්ධනය**

- 104 ක් වූ අපගේ ශාඛා ජාලය මගින් රු. මිලියන 1,049.25 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ නියෝජනය වේ.

**ස්වභාවික ප්‍රාග්ධනය**

- අපගේ ව්‍යාපාරික කටයුතු සිදුකිරීමේදී පරිභෝජනය කරන ලද ස්වභාවික සම්පත්
- සමාගමෙහි කාබන් පියසටහන **3,810.88 $tCO_2e$**

## වටිනාකම් නිර්මාණය

දැක්ම | මෙහෙවර | වටිනාකම්

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ හැකියාවන්

ගනුදෙනුකරුවන් හට පොලී උපයාගත හැකි සැලසුම් රැසක් ඔස්සේ තැන්පතු උපයෝජනය

ගනුදෙනුකරුවන් හට පොලිය හෝ සමාන ගාස්තුවක් ගෙවිය හැකි වන පරිදි නිශ්චිත කාලසීමාවකට ආයෝජන, කාර්ය ප්‍රාග්ධනය සහ පරිභෝජන අවශ්‍යතා සඳහා මූල්‍ය ප්‍රාග්ධනය සැපයීම




ප්‍රතිලාභ සේවාවන් සපයනු ලබන ආයතන තුළ ආයෝජනය ඔස්සේ ගනුදෙනුකාර වටිනාකම් සමුදාය පුලුල් කිරීම

වර්ධනය සඳහා පහසුකම් සැලසීම උදෙසා විවිධ මූලයන්ගෙන් සහනදායී ණය ධාරාවන් වෙත පිවිසීම සඳහා ගනුදෙනුකරුවන් වෙත සහායවීම

මෙහෙයුම් වටපිටාවෙන් බලපෑම

| | | | |
|---|---|---|---|
| ආර්ථික අවගමනය සහ අවිනිශ්චිතතාව | වසංගත තත්වයන් | රාජ්‍ය ප්‍රතිපත්තිය | ස්වයංක්‍රියකරණය ඉහළ නැංවීම |

## ප්‍රතිදාන

**අපේක්ෂිත සැලසුම්**

- කල්බදු
- ණය
- තැන්පතු
- ආන්තික වෙළදාම
- රන් ණය
- ඉස්ලාමීය සැලසුම්

**අපේක්ෂා නොකරන අතුරුඵල**

- විමෝචනයන්
- ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය
- කඩදාසි අපද්‍රව්‍ය
- වෙනත් අපද්‍රව්‍ය

සමාගම මගින් ගොඩනංවන වටිනාකම සහ අපගේ ප්‍රතිදානයන්හි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය සහ සුරැකීම කෙරෙහි වන අපගේ ප්‍රතිචාරය.

## ප්‍රතිඵල

### මූල්‍ය ප්‍රාග්ධනය

- සවිමත් ශේෂ පත්‍රය
- කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු ලාභය රු. මිලියන 4,659.01
- රු. මිලියන 38,818.31 දක්වා ඉහළ නංවන ලද ස්කන්ධ

### මානව ප්‍රාග්ධනය

- සේවකයින් වෙත ගෙවීම් රු. මිලියන 4,002.41
- පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 14.77
- වෘත්තීය ප්‍රගතිය සඳහා අවස්ථා
- සේවක තෘප්තිය
- ඵලදායීතාවය

### සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

- කල්පිරීමේ පරිවර්තනය
- ඉහළ නැංවුනු විශ්වාසය
- ප්‍රතිලාභී ප්‍රජාවන්

### බුද්ධිමය ප්‍රාග්ධනය

- රු. බිලියන 6.51 ක සන්නාම වටිනාකම
- සරල හා කාර්යක්ෂම ක්‍රමවේදයන්
- ඉහළ නංවන ලද ව්‍යංගිත දැනුම

### නිෂ්පාදිත ප්‍රාග්ධනය

- නිෂ්පාදිත ප්‍රාග්ධන ක්ෂයවීම ආයෝජන ඉක්මවා යයි

### ස්වභාවික ප්‍රාග්ධනය

- සමාගමෙහි කාබන් පියසටහන **870.84 $tCO_2e$** කින් ඉහළ යන ලදී.
- ඉහළ නංවන ලද ඩිජිටල් ගනුදෙනු
- ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි කිලෝග්‍රෑම් 13,146

## බලපෑම්

### ගනුදෙනුකරුවන් වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| නැවත පැමිණෙන ගනුදෙනුකරුවන් | 39.66% | 36.93% |
| මුලු තැන්පතු ගනුදෙනුකරුවන් | 309,977 | 291,319 |
| මුලු ණය ලබාගැනීමේ ගනුදෙනුකරුවන් | 125,789 | 117,773 |
| අක්‍රිය ණය අනුපාතය | 8.78% | 9.21% |
| පිරිනමන ලද පමාසහන සංඛ්‍යාව | 32,975 | 59,952 |
| බස්රථ සහන සංඛ්‍යාව | 2,004 | - |

- ඉහළ නංවන ලද ගනුදෙනුකාර පහසුව
- ඉහළ නංවන ලද නව සැලසුම් හඳුන්වාදීම සහ ගනුදෙනුකාර කේන්ද්‍රීයභාවය
- ගනුදෙනුකරුවන් හට අනන්‍ය සැලසුම් සහ සේවාවන්
- මිත්‍රශීලී සහ සත්කාරකත්වය සහිත ගනුදෙනුකාර සබඳතා
- ඩිජිටල් සේවා පහසුව සමගින් ගනුදෙනුකරුවන් හට අනන්‍ය වූ, අගය එකතු කල, තිරසාර මූල්‍ය සේවාවන් සැපයීම

### සේවකයින් වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| සේවක රඳවාගැනීම | 90.16% | 93.80% |
| සේවකයකුට වත්කම් (රු.) | 80.52 (රුපියල්) | 70.23 (රුපියල්) |
| සේවකයකුට ලාභය (රු.) | 2.08 (රුපියල්) | 1.72 (රුපියල්) |
| සේවක පිරිවැටුම | 9.84% | 6.20% |

- වෘත්තීය ප්‍රගතිය
- සමාගමෙහි ස්වරය
- රඳාපැවති හැකි සහ වගකීම් සහගත ශ්‍රම බලකායක්
- සේවා ජීවන සමතුලනය
- සමාන අවස්ථා පිරිනමලු ලබන සේව්‍යයෙක්
- හැකියාවන්ගෙන් පරිපූර්ණ ශ්‍රම බලකායක්

### ආයෝජකයින් හා අරමුදල් සම්පාදකයින් වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| කොටසකට ලාභාංශ (රු.) | 1.25 | 0.60 |
| බදු වලට පසු ලාභය (රු.) | 4,659.01 (රුපියල්) | 4,033.02 (රුපියල්) |

- ප්‍රශස්ත අවදානම් ප්‍රතිලාභ සබඳතාව
- ඉහළ නංවන ලද ලාභදායීත්වය
- විනිවිදභාවය
- යහ පාලනය
- ප්‍රබල අභ්‍යන්තර පාලන පද්ධතියක්

### ව්‍යාපාරික සහකරුවන් වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| ක්‍රියාකාරී ව්‍යාපාරික සහකරුවන් (සංඛ්‍යාව) | 46,560 | 38,890 |
| රථවාහන සැපයුම්කරුවන් (සංඛ්‍යාව) | 40,118 | 31,665 |
| ප්‍රසම්පාදන වියදම (රු.) | 131,515.92 (රුපියල්) | 82,880.45 (රුපියල්) |

- දිගු කාලීන දෙපාර්ශ්වයටම ප්‍රතිලාභ ගෙන දෙන සබඳතා
- සිය ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා සැපයුම්කරුවන් සමග එක්ව කටයුතු කිරීම
- අපගේ විනිවිදභාවය පිළිබඳ නවතම තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා වැඩිදියුනු කල තාක්ෂණය යොදාගැනීම කෙරෙහි සැළකිල්ලක් දක්වීම

### රජය වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| ගෙවන ලද බදු (රු.) | 2,791.99 (රුපියල්) | 4,203.03 (රුපියල්) |

- මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය
- කාර්යක්ෂම ප්‍රාග්ධන නිර්මාණය
- දිළිඳුබව පහත හෙළීම

### දේශීය ප්‍රජාව වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| අඛණ්ඩ සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 2,245 | 2,343 |
| ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන්හි ආයෝජන (රු.) | 29.40 (රුපියල්) | 20.37 (රුපියල්) |

- තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි කැපවීම
- දේශීය ප්‍රජාවන් සවිබලගැන්වීම
- වගකීම් සහගත ණය ලබාදීම
- ඉහළ නංවන ලද නිපුණතා හැකියාව
- ජාතික ප්‍රමුඛතා ඉටු කරන ලදී

### පරිසරය වෙත නිර්මාණය කරන ලද වටිනාකම

| ප්‍රමාණාත්මක දර්ශක | 2021/22 | 2020/21 |
|---|---|---|
| ඩිජිටල් ගනුදෙනු (සංඛ්‍යාව) | 472,782 | 466,877 |
| සමූහයේ කාබන් පියසටහන ($tCO_2e$) | 5,182.58 | 4,381.67 |

- පාරිසරික නීති/සම්මතයන් වෙත අනුකූලතාවය
- පාරිසරික සංරක්ෂණ ව්‍යාපෘතීන් වෙත සේවක සහභාගීත්වය
- කඩදාසි රහිත සේවා වටපිටාවක් වෙත සංස්කෘතිකමය පරිවර්තනය
- ඉහළ නංවන ලද කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය

# පාර්ශ්වකාර සහභාගීත්වය

GRI | 102-40, 102-42, 102-43, 102-44

සේවා කේන්ද්‍රීය සමාගමක් වශයෙන්, පුලුල් පරාසයක පැතිරුනු පාර්ශ්වකරුවන් රැසක් සමග සම්බන්ධතා පවත්වාගැනීමේ වැදගත්කම අප විසින් අවබෝධ කොට ගෙන ඇති අතර, ඔවුන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි අපගේ ක්‍රමෝපායික අවධානය යොමු වේ. අප විසින් ස්ථාපිත ක්‍රියාවලීන් සහ ඵලදායී පාර්ශ්වකාර සහභාගීත්වය තුළින් වටිනාකම් නිර්මාණය කෙරෙහි වඩාත් බලපාන්නා වූ සහ අපගේ ක්‍රියාකාරකම් වල වැඩිම බලපෑමට ලක් වන්නා වූ පාර්ශ්වකරුවන් හඳුනාගනිමින් ප්‍රමුඛතාගත කෙරේ. වසර තුළදී සිදුවූ සැළකිය යුතු පරිවර්තනයන්හිදී, පාර්ශ්වකාර අපේක්ෂාවන් පිළිබඳ ක්‍රියාකාරී අවබෝධයක් ලබාගැනීම අවශ්‍ය වූ අතර එහිදී සමාගම සිය සහභාගීත්ව ක්‍රියාවලිය තවදුරටත් සවිබලගැන්වීමට කටයුතු කලේය.

## ආයෝජකයින්

අප විසින්, සමාන්‍ය කොටස් හිමිකරුවන්, ආයතනික කොටස් හිමිකරුවන්, බැදුම්කර හිමිකරුවන්, මූල්‍ය විශ්ලේෂකයින් සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන වෙත භාරගත් අවදානමට සමගාමීව ආදායම් හිමි වන අයුරින් අපගේ ව්‍යාපාරය කළමනාකරණය කෙරේ.

### විශේෂ සහභාගීත්ව ක්‍රමවේදයන්

- වාර්ෂික වාර්තා
- වාර්ෂික මහා සභා රැස්වීම්
- අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශ
- කොළඹ කොටස් වෙළඳපොල වෙත හෙළිදරව් කිරීම් සහ දැනුම්දීම්
- රැස්වීම්

### අවශ්‍යතා සහ අපේක්ෂා

- වගකීම් සහගත හා සමතුලිත ව්‍යාපාරික චර්යාව සහ විදිමත් පාරිසරික, සමාජීය ආයතනික පාලන (ESG) ක්‍රියාකාරකම
- සංගත ආදායම් මාර්ග
- තෘප්තිමත් කොටස් හිමිකාර ආදායම්
- මිල සංවේදී තොරතුරු පිළිබඳ කාලීන හෙළිදරව් කිරීම්
- විනිවිදභාවය
- තිරසාර වර්ධන ක්‍රමෝපාය සමගින් අනුප්‍රාප්තික සැලසුම
- ප්‍රබල අවදානම් කළමනාකරණ පද්ධතිය

### අපගේ ප්‍රතිචාරය

- වගකීම් සහගගත ලාභාංශ ප්‍රතිපත්තිය සහ ප්‍රමාණවත් කොටස් හිමිකාර ආදායම්
- සවිමත් ශේෂ පත්‍රය
- සමෝධානික කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශිත තොරතුරු
- තිරසාර වටිනාකම් ලබාදීම සඳහා ක්‍රමෝපායන් දියුණු කිරීම
- තිරසාර මූල්‍ය සහ සදාචාර සම්පන්න ණය ලබාදීම
- විදිමත් මූල්‍ය කාර්යසාධනය
- විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ පද්ධතිය

### කෝවිඩ් ප්‍රතිචාරය

- අභියෝගාත්මක ව්‍යාපාරික වටපිටාව මධ්‍යයේ මිල සංවේදී තොරතුරු කාලීනව හෙළිදරව් කිරීම
- ද්‍රවශීලතාවය, ණය අවදානම කළමනාකරණය සහ මූල්‍යමය නම්‍යශීලීත්වය පවත්වාගෙන යාම.

## ගනුදෙනුකරුවන්

ව්‍යාපාරික වර්ධනය සඳහා තනිපුද්ගල ගනුදෙනුකරුවන් සහ ආයතනික ගනුදෙනුකරුවන් ප්‍රධාන වේ.

### විශේෂ සහභාගීත්ව ක්‍රමවේදයන්

- මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය
- ලිඛිත සන්නිවේදනය
- ඇමතුම් මධ්‍යස්ථානය
- ශාඛා ජාලය
- තාක්ෂණය මත පදනම් වූ සේවා
- ගනුදෙනුකරුවන් හමුවීම
- දෛනික ව්‍යාපාරික අන්තර්ක්‍රියාකාරකම්
- ප්‍රජා සත්කාරක ව්‍යාපෘති
- එකිනෙකා සමඟ සංවාද
- ගනුදෙනුකාර පැමිණිලි

### අවශ්‍යතා සහ අපේක්ෂා

- නවතාවයෙන් යුතු මූල්‍ය සැලසුම් සහ සේවාවන්
- ගනුදෙනුකරුගේ අභිමත සේවා පදනම් සඳහා සේවා සැපයීමේ හැකියාව
- සේවා ලබාගැනීමේ හැකියාව සහ පහසුව
- විනිවිදභාවයෙන් යුතු මිලකරණය සමගින් සුරක්ෂිත ගනුදෙනු
- පහසුකම් පිළිබඳ පැහැදිලි හා ඍජු තොරතුරු සහ උපදෙස් ලබාගැනීමේ හැකියාව
- සේවා කාර්යක්ෂමතාව
- සහානුකම්පිත හා මිත්‍රශීලී සේවාව

### අපගේ ප්‍රතිචාරය

- වසංගතය මධ්‍යයේ වුවද සුරක්ෂිත සේවා අත්දැකීමක් සපයන ලදී.
- වඩාත් උසස් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදෙනු පිණිස ඩිජිටල් සේවා පදනම් වෙත විගමනය (PLC Touch/ CAPP/ QR කේතය/ DCHEQUE
- “PLC Online” ඇතුලුව පවතින හමුවීම් වලින් තොර පහසුකම් වැඩිදියුණු කරන ලදී.
- ගනුදෙනුකරුවන් වෙත ළඟා වීම සඳහා වඩාත්ම පහසු ක්‍රමය සමාජ මාධ්‍ය බව හඳුනාගනිමින් එකී මාධ්‍ය තුළ ඉහළ නියෝජනයක් සිදුකිරීම.
- මව් සමාගම සමග ක්‍රමෝපායික එකමුතුව වර්ධනය කරගනිමින් පුලුල් සේවා අත්දැකීමක් සඳහා අවස්ථාවන් නිර්මාණය කරන ලදී.

### කෝවිඩ් ප්‍රතිචාරය

- නව සාමාන්‍ය තත්ත්වය වෙත අනුගත වෙමින් සේවා ගුණාත්මකභාවය සාර්ථකව තහවුරු කරන ලදී.
- අපගේ ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතතාව සහ යහ පැවැත්ම කෙරෙහි ප්‍රමුඛතාවය දෙන ලදී.
- කෝවිඩ් 19 බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් වෙත සහන ලබාදීමේ රජයේ ව්‍යාපෘතීන් වෙත සහාය දක්වන ලදී.
- මෙම අභියෝගාත්මක කාලසමයේදී අපගේ ගනුදෙනුකරුවන්ගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අතහිත දෙන ලදී.

### සියලුම පාර්ශ්වකරුවන්ගේ පොදු අපේක්ෂාවන්

- සාධාරණ ගනුදෙනු
- තිරසාර ඉපැයුම් වර්ධනය
- මූල්‍යමය ස්ථාවරත්වය
- කාර්යක්ෂමතාව
- අනුකූලතාවය

### පොදු සහභාගීත්ව මාධ්‍යයන්

- වෙබ් අඩවිය
- වාර්ෂික වාර්තාව
- භෞතික හා අන්තර්ජාලගත රැස්වීම්
- පුවත්පත් නිවේදන
- සමාජ මාධ්‍ය
- මාධ්‍ය නිවේදන
- ප්‍රතිචාර
- විද්‍යුත් මාධ්‍ය

## සේවකයින්

2,245 ක් වන අපගේ සේවා කණ්ඩායම අපගේ කාර්යසාධනයෙහි ප්‍රමුඛ දායකයින් වේ.

### විශේෂ සහභාගීත්ව ක්‍රමවේදයන්

- කළමනාකරණ කමිටු රැස්වීම්
- ක්‍රමෝපායික සැලසුම්කරණ සැසි
- සමාජ මාධ්‍ය කණ්ඩායම් සහ ආයතනික සන්නිවේදන
- තාක්‍ෂණය මත පදනම් වූ ක්‍රමවේදයන්
- පීපල්ස් ලීසිං සේවක වෘත්තීය සමිතිය
- මෙහෙයුම් මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති
- සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

### අවශ්‍යතා සහ අපේක්ෂා

- ව්‍යාපාර අඛණ්ඩත්වය සහ තිරසාර වර්ධනය
- සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව ඇතුලු සාධාරණ පාරිශ්‍රමික හා ප්‍රතිලාභ
- ඵලදායී කාර්යසාධන කළමනාකරණය සහ ඇගයුම
- වෘත්තීය ප්‍රගතිය උදෙසා සහාය දක්වන්නා වූ සුරක්ෂිත සහ සහභාගීත්ව සේවා වටපිටාවක්
- සේවක නිපුණතා වර්ධනය
- රැකියා සුරක්ෂිතතාව
- ස්වයංක්‍රීය කාර්යප්‍රවාහ, නම්‍යශීලී සේවා පැය සහ සේවා පරිශ්‍රයන් වෙත විගමනය වීම
- රහස්‍යභාවය සහ විවෘත අවස්ථා ප්‍රතිපත්තිය

### අපගේ ප්‍රතිචාරය

- වසංගතය මධ්‍යයේ වුවද රැකියා සුරක්ෂිතතාව තහවුරු කිරීම
- දැඩි සෞඛ්‍ය හා සුරක්ෂිතතා ක්‍රියාමාර්ග ස්ථාපනය කොට ඇත.
- නිවසේ සිට වැඩකිරීම ඔස්සේ ස්වයංක්‍රීය කාර්යප්‍රවාහ සහ නම්‍යශීලී සේවා වටපිටාව
- ඩිජිටල් පදනම් ඔස්සේ පුහුණුව හා දැනුම හුවමාරුව
- සේවක සහභාගීත්වය
- සේවක සුරක්ෂිතතාව, යහ පැවැත්ම සහ කැපවීම තහවුරු කිරීම උදෙසා නව ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් ක්‍රියාවට නැංවීම
- සවිමත කරන ලද ආයතනික පාලනය

### කෝවිඩ් ප්‍රතිචාරය

- තිරසාර දුරස්ථ සේවාවක් වෙත පරිවර්තනය කළමනාකරනය සහ අවශ්‍ය සහාය ලබාදෙන අතරතුර ඩිජිටල්කරණ ක්‍රියාවලිය ඔස්සේ ක්‍රියාකාරී පියවර ගනු ලැබිය.
- කෝවිඩ් කාර්ය බලකාය පිහිටුවන ලද අතර අවශ්‍යතාවය අනුව තත්ත්වය අධීක්ෂණය සහ යාවත්කාලීන කිරීම සිදු කෙරිණි.
- සේවක චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් පදනම් ඔස්සේ අඛණ්ඩවම සේවක සහභාගීත්වය වර්ධනය කරන ලදී.
- දිගින් දිගටම සේවක සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පවත්වාගෙන යන ලදී.
- බලපෑමට ලක් වූ පවුල් වෙත පොලී රහිත ණය පහසුකම් සහ වියළි ආහාර පැකේජ පිරිනැමිනි.

## සැපයුම්කරුවන් සහ ව්‍යාපාරික සහකරුවන්

තැරැව්කරුවන්, නියෝජිතයින් සහ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ඇතුලුව බැංකු සහ වෙනත් මූල්‍ය අතරමැදියන් සමග තිරසාර සම්බන්ධතා පවත්වාගෙන යාම.

### විශේෂ සහභාගීත්ව ක්‍රමවේදයන්

- ඩිජිටල් සංවාද
- සැපයුම්කාර ඇගයුම්
- සැපයුම්කාර ලියාපදිංචිය
- ක්ෂේත්‍ර චාරික
- අවබෝධතා ගිවිසුම්
- සේවා ගිවිසුම්

### අවශ්‍යතා සහ අපේක්ෂා

- නිසි කලට පියවීම් සිදුකරමින් වගකීම් සහගත ප්‍රසම්පාදනය
- තරගකාරී මිලකරණ හා ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය
- සාධාරණ වෙළඳාම සහ විනිවිදභාවය
- සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ව්‍යාපාරික අවස්ථා
- නිසි ප්‍රතිචාරය

### අපගේ ප්‍රතිචාරය

- විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තහවුරු කිරීම.
- විධිමත් කරන ලද ගෙවීමේ ක්‍රියාවලිය.
- කාර්යසාධනය අධීක්ෂණය කිරීම සඳහා සැපයුම්කරුවන් සමග නිරන්තරයෙන් සම්බන්ධ වීම.
- වගකීම් සහගත ව්‍යාපාරික ක්‍රියාකාරකම් තහවුරු කිරීම උදෙසා සැපයුම්කරුවන් පිළිබඳ සමීප සොයාබැලීම.
- සදාචාර සම්පන්න සැපයුම්කරුවන් තෝරාගැනීම උදෙසා ඔවුන්ගේ ලක්ෂණ සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී.
- උපදේශන සේවා සහ සේවා ලබාදීමේ ප්‍රතිචාර රැස්වීම් ඇතුලු සැපයුම්කාර වර්ධනය සහ සහාය ලබාදීම.
- අඛණ්ඩවම සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගෙන් සේවා ලබාගැනීම.
- සාධාරණ සේවා ලබාගැනීමේ ක්‍රියාකාරකම්
- ක්‍රියාවලිය විධිමත්කරණය සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්

### කෝවිඩ් ප්‍රතිචාරය

- ඩිජිටල් පදනම් ඔස්සේ නිසි කලට ගෙවීම් සිදුකරන ලදී.

# පාර්ශ්වකාර සහභාගීත්වය

## රජය සහ නියාමකයින්

අප විසින් ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළඳපොල සහ ජාතික හා ජාත්‍යන්තර ආයතන ඇතුලුව අදාළ නියාමකයන් සමග මනා සබඳතාවක් පවත්වාගෙන යනු ලැබේ.

### විශේෂ සහභාගීත්ව ක්‍රමවේදයන්

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිශ්‍ර තුළ විමර්ශනය
- ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නියාමකයින් සමග සංවාදය
- නියෝග සහ චක්‍රලේඛ
- සමාලෝචන රැස්වීම්
- අනුකූලතා වාර්තා
- පරිශ්‍රයෙන් පිටත විමර්ශන

### අවශ්‍යතා සහ අපේක්ෂා

- ව්‍යාපාරික අඛණ්ඩත්වය
- නීතිරීති හා රෙගුලාසි වෙත අනුකූලතාවය
- නියාමනමය සංශෝධන වෙත නිසි ප්‍රතිචාර දැක්වීම
- බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය ප්‍රතිශෝධනය සඳහා නියාමක සහ එක්ව කටයුතු කිරීම
- ක්ෂේත්‍රයේ සෙසු සමාගම් සමග සවිමත් දායකත්වය සහ ක්‍රියාකාරී සහයෝගීතිවය
- ගනුදෙනුකරුවන් වෙත සාධාරණ සැළකීම
- සදාචාර සම්පන්න ව්‍යාපාර කටයුතු සහ සේවා වටපිටාවන්

### අපගේ ප්‍රතිචාරය

- නියාමන අවශ්‍යතා සහ වෙනස්වීම් වෙත විනිවිදභාවයෙන් යුතු සහ බලාත්මක අනුගතවීම.
- ඍජු හා වක්‍ර බදු මාර්ගයෙන් ජාතික ආර්ථිකය වෙත දායක වීම.
- විනිවිදභාවය ඉහළනැංවීම සඳහා ව්‍යාප්ත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු.
- ක්‍රියාවලිය විධිමත්කරණය සඳහා සකසන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි.

### කෝවිඩ් ප්‍රතිචාරය

- කෝවිඩ් 19 බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් වෙත සහන ලබාදීමේ රජයේ ව්‍යාපෘතීන් වෙත සහාය දක්වන ලදී.
- වගකීම් සහගත ආයතනික සමාගමක් වශයෙන් බදු ගෙවීම් සහ වෙනත් ආධාර ඔස්සේ ප්‍රජා සංවර්ධනය සඳහා රජයට සහාය දක්වන ලදී.
- ආර්ථිකය වෙත අඛණ්ඩව සහාය දක්වමින් මෙහෙයුම් ස්ථාවරත්වය තහවුරු කිරීම සහ ව්‍යාපාරික නම්‍යශීලීත්වය පවත්වාගෙන යාම සිදුකෙරිණි.
- ශ්‍රී ලංකා මහ බැංකු නියෝග වලින් ඔබ්බට ගොස් සහන පිරිනමන ලදී.

## පරිසරය සහ ප්‍රජාව

අප විසින් අප වටා සිටින ප්‍රජාවන් සමග සහ රට පුරා සමස්ත සමාජය සමග මනා සබඳතා පවත්වාගෙන යනු ලැබේ.

### විශේෂ සහභාගීත්ව ක්‍රමවේදයන්

- ප්‍රජා සත්කාරක ව්‍යාපෘති
- කාබන් පියසටහන් දත්ත නිරීක්ෂණ ක්‍රියාමාර්ග
- ආයතන, ප්‍රජා නියමුවන් සහ ප්‍රජාව මත පදනම් වූ සංවිධාන සමග සංවාදය
- අනුග්‍රහයන්

### අවශ්‍යතා සහ අපේක්ෂා

- තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය කිරීම.
- ජාතික සංවර්ධන ඉලක්ක වෙත අනුගතවීම.
- ප්‍රජා සවිබලගැන්වීම සහ පරිමා වර්ධනය.
- කාලගුණ විපර්යාස වෙත ප්‍රතිචාර දැක්වීම.
- අපගේ මෙහෙයුම් තුලින් අවම අහයපත් සමාජ හා පාරිසරික බලපෑමක් පවත්වා ගැනීම
- පිරිනමනු ලබන පහසුකම් සහ සේවාවන් සම්බන්ධ කාලීන හා අදාළ තොරතුරු ලබාදීම

### අපගේ ප්‍රතිචාරය

- අපගේ මෙහෙයුම් තුලින් අවම අහයපත් සමාජ හා පාරිසරික බලපෑමක් ඇති වන බවට තහවුරු කරන ලදී.
- ප්‍රජාව පදනම් කරගත් ජාතික ප්‍රමුඛතා කෙරෙහි සහාය දක්වන ලදී.
- පරිසර හිතකාමී ව්‍යාපාරික ක්‍රියාකාරකම් පිළිබඳව අඛණ්ඩවම සේවකයින් සහ ගනුදෙනුකරුවන් දැනුවත් කරන ලදී.
- රාජ්‍ය සේවය වර්ධනය කිරීම සඳහා ආයෝජන සිදුකරන ලදී.
- තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රවර්ධනය සඳහා දායක විය.

### කෝවිඩ් ප්‍රතිචාරය

- කෝවිඩ් ප්‍රතිකාර සහ සත්කාර ඉහළ නැංවීම සඳහා රජයේ රෝහල් සහ අතරමැදි සත්කාරක මධ්‍යස්ථාන වෙත අත්‍යාවශ්‍ය උපකරණ පරිත්‍යාග කරන ලදී.

# මෙහෙයුම් වටපිටාව

## ආර්ථික වර්ධනය

ලොව පුරා ආර්ථිකයන් 2020 දී වසංගතය මගින් එල්ල කරන ලද බාධාවන්ගෙන් අනතුරුව, යථා තත්ත්වයට පත්වීම සම්බන්ධ විවිධ මාර්ගයන්හි ගමන් කරමින් පවතී. සවිමත් ප්‍රතිපත්ති සහ නව සාමාන්‍ය තුළ ආර්ථික කටයුතු වෙත අනුගතවීම නිසාවෙන් 2021 දී ලෝක ආර්ථික වර්ධනය 6.1% ක් වශයෙන් සටහන් විය. කෙසේවුවද, 2021 අවසාන භාගයේදී ඇති වූ අයහපත් තත්ත්වයන් හේතුවෙන්, ලෝක ආර්ථිකයේ ස්වරූපය අඳුරු ස්වභාවයක් ඉසිලූ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් 2022 දී ආර්ථික වර්ධනය 3.6% කින් මන්දගාමී වනු ඇති බවට පුරෝකථනය කරන ලදී.

2020 දී 3.6% කින් සංකෝචනය වෙමින්, ශ්‍රී ලංකා ආර්ථිකය 2021 දී 3.6% ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා කලේය. කෙසේවුවද, 2021 දී ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු මන්දගාමී ස්වභාවයක් ගත් අතර, එහිදී විදේශ විනිමය සංචිත හිඟය, ආනයන සීමා සහ ඉහළ යන උද්ධමනය දක්නට ලැබිණි. 2022 දී විදේශ විනිමය අර්බුදය උග්‍ර වීමත් සමග, දිවයිනේ දිගු කාලීන විදේශ විනිමය නිකුත් කිරීම පැහැර හැරීමේ ශ්‍රේණිය ෆිච් රේටින්ග්ස් මගින් "C" දක්වා අවශ්‍රේණිගත කරන ලදී.

## දළ දේශීය නිෂ්පාදිතය




- ලෝක
- දියුණු ආර්ථිකයන්
- නැගී එන වෙළඳපොල සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්
- ශ්‍රී ලංකාව

## දිගින් දිගටම පැවති වසංගතය

වසංගතය හේතුවෙන් ඇති වූ දේශසීමා වසාදැමීම්, රටවල් වසාදැමීම්, ලෝක සැපයුම් දාම කෙරෙහි වූ බාධාවන් සහ පාරිභෝගික ජීවන රටාවන් දැඩි ලෙස වෙනස්වීම හේතුවෙන් ව්‍යාපාරයන්ට එල්ල වූ පීඩනය ආදියෙන් අනතුරුව ව්‍යාපාරික වපසරිය දිගින් දිගටම වර්ධනය වෙමින් පැවතිණි. සෞඛ්‍ය හා සුරක්ෂිතතාව මූලික ගැටලුවක් බවට පත් වූ බැවින්, භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා ජනතාව අන්තර්ජාලගත සේවාවන් වෙත යොමු වන්නට විය.

2021 අග භාගයේදී ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීමත් සමග කෝවිඩ් 19 රෝගීන්ගේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුනද, ව්‍යාපාරයන් මගින් දිගු කාලීනව වඩාත් යහපත් සේවා ජීවන සමතුලනයක් ඇති කිරීම සඳහා කිසියම් ආකාරයක දුරස්ථ සේවා ආදේශ කොටගත් අතර එහිදී ස්වයංක්‍රියකරණ සහ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සඳහා විශාල වශයෙන් ආයෝජන සිදුකෙරිනි.

| |
|---|
| 1 වන මාත්‍රාවෙන් ප්‍රතිශක්තිය ලද මුලු ගණන (වයස අවුරුදු 12 ට වැඩි ප්‍රජාවගෙන්)<br>**97%** |
| 2 වන මාත්‍රාවෙන් ප්‍රතිශක්තිය ලද මුලු ගණන (වයස අවුරුදු 12 ට වැඩි ප්‍රජාවගෙන්)<br>**82%** |
| බූස්ටර් මාත්‍රාවෙන් ප්‍රතිශක්තිය ලද මුලු ගණන (පූර්ණ ප්‍රතිශක්තිය ලද ප්‍රජාවගෙන්)<br>**55%** |

## උද්ධමනය

ඉහළ ආහාර උද්ධමනය සහ ආහාරමය නොවන උද්ධමනයෙහි එක්තරා වැඩිවීමක් හේතුවෙන් වසර තුළදී උද්ධමනය ඉහළ ගියේය. ආර්ථිකය වෙත උද්ධමනකාරී පීඩනයක් එල්ල වීම කෙරෙහි සැපයුම් දාම බාධාවන්, ලෝක භාණ්ඩ මිල ඉහළයාම, විනිමය අනුපාත අවප්‍රමාණය වීම සහ ආනයන සීමාවන් බෙහෙවින් බලපෑවේය.

## උද්ධමනය




- කොළඹ පාරිභෝගික මිල දර්ශකය
- වසරින් වසර % වෙනස
- ආහාර උද්ධමනය
- ආහාරමය නොවන උද්ධමනය

## පොලී අනුපාත

රට මුහුණ පෑ විදේශ විනිමය අර්බුදය මධ්‍යයේ ඉහළ උද්ධමනය පාලනය කරනු පිණිස, 2021 අගෝස්තු මස මහ බැංකුව මගින් මුදල් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද සහනදායී ස්ථාවරය ආපසු හරවමින්, ප්‍රධාන පොලී අනුපාත ඉහළ දමන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR), නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR), ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ බැංකු අනුපාතය ඉහළ නංවන ලද අතර එහි ප්‍රතිපලයක් වශයෙන් වෙළඳපොල පොලී අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කලේය.

## පොලී අනුපාතය




- දින 365 භාණ්ඩාගාර බිල්පත්
- බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය
- බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය

## බාහිර ක්ෂේත්‍රය සහ විනිමය අනුපාතය

සැලකිය යුතු විදේශ විනිමය ණය සේවාකරණ බැඳීම් තත්ත්වයක් යටතේ සංචාරක ඉපැයුම් සහ ශ්‍රමික ප්‍රේශන වල තියුණු පහළයාමක් හමුවේ බාහිර ක්ෂේත්‍රය දැඩි පීඩාවකට පත් විය. විදේශ විනිමය රැකගැනීම උදෙසා නියාමක විසින් ආනයන සීමා, අපනයන ආදායම් සම්බන්ධ අනිවාර්ය පරිවර්තන හා තෝරාගත් ආනයන මත 100% මුදල් ආන්තික අවශ්‍යතාවය වැනි බහුවිධ සීමාවන් පනවන ලදී. 2022 මාර්තු මස, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පහත වැටෙන සංචිත අසීරු තත්ත්වයකට පැමිණි පසු රුපියලේ අගය ආරක්ෂා කිරීම සඳහා ස්ථාවර විනිමය අනුපාතය අතහැර දමන ලදී. මේ හේතුවෙන් රුපියලේ අගය තවදුරටත් අවප්‍රමාණය වූ අතර 2022 මැයි අවසානය වන විට එය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රු. 369.91 ක වාර්තාගත පහළ අගයක් පෙන්නුම් කලේය.

## විනිමය අනුපාත



# මෙහෙයුම් වටපිටාව

## ක්ෂේත්‍ර විශ්ලේෂණය

වසර තුළදී ව්‍යාපාර සහ පුද්ගලයින් වෙත සහාය දක්වමින් කෝවිඩ් 19 වසංගතයෙහි සහ සෙසු සාර්ව ආර්ථික තත්ත්වයන්හි බලපෑම නිසා උද්ගත වූ අභියෝගයන් මධ්‍යයේ වුවද බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය නම්‍යශීලී ආකාරයෙන් මෙහෙයුම් සිදු කලේය. කේවල මට්ටමකදී ඇතම් ආයතන නියාමන අවශ්‍යතා සපුරාලීමේ අසීරුතාවන්ට මුහුණ දුන්නද, සමස්ත ක්ෂේත්‍රය ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් අවම නියාමනමය මට්ටම් වලට ඉහලින් පවත්වාගෙන යාමට සමත් විය.

ක්ෂේත්‍රයේ කාර්යසාධනය ණය වර්ධනය සහ ලාභදායීත්වය අතින් ගත් කල සැළකිය යුතු වර්ධනයක් විදහා දැක්වීය. මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය ඉහළ නංවන අතරතුර නව ව්‍යාපාරික මාදිලි වෙත අනුගතවීමේ, ඩිජිටල් සේවා සම්පාදනය, ප්‍රබල අවදානම් කළමනාකරණය සහ වෙළඳපොල ගතිකයන් වෙත ප්‍රතිචාර දක්වීමේ ක්ෂේත්‍රයේ හැකියාව, අඛණ්ඩ වාණිජමය හා සමාජයීය තිරසාරත්වය තහවුරු කිරීම සඳහ ප්‍රධාන සාධකයන් වේ. තවද, රට තුළ බැංකු නොවන මූල්‍ය ආයතන වල තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමේ අරමුණින් යුතුව, මධ්‍ය කාලීනව සවිමත් හා ස්ථාවර බලපත්‍රලාභී මූල්‍ය සමාගම් බිහිකිරීම සඳහා වන මූල්‍ය ක්ෂේත්‍ර ඒකාබද්ධකරණ සැලසුම ක්‍රියාවට නැංවීම මේ වන විට සිදුවෙමින් පවතී.

| | මාර්තු-20 | මාර්තු-21 | මාර්තු- 22 |
|---|---|---|---|
| මුලු අත්තිකාරම් වෙත දළ අක්‍රීය අත්තිකාරම් (%) | 11.37 | 11.29 | 9.11 |
| මුලු අත්තිකාරම් වෙත දළ ශුද්ධ අක්‍රීය අත්තිකාරම් (%) | 3.79 | 2.81 | 1.90 |
| මුලු වත්කම් වෙත මුලු ශුද්ධ අත්තිකාරම් (%) | 77.25 | 76.26 | 76.29 |
| ප්‍රතිපාදන ආවරන අනුපාතය (%) | 54.72 | 64.21 | 69.36 |

## වත්කම්

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී ක්ෂේත්‍රයේ වත්කම් පදනම රු.බිලියන 1,589.84 දක්වා 14.28% කින් ඉහළ නැංවුනි. මෙම ව්‍යාප්තිය කෙරෙහි උකස් හා ණය කළඹෙහි ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු විය.

## අරමුදල් සම්පාදනය

වසර තුළදී තැන්පත්කරුවන් වෙත නිරාවරනය විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම ක්ෂේත්‍රයේ මූල්‍යමය නම්‍යශීලීත්වය ඉහළ නැංවීය. පෙර වසරේ වාර්තා වූ 20.32% සමග සැසඳීමේදී, ස්කන්ධ අරමුදල් සම්පාදනය සමස්ත අරමුද් සම්පාදනයෙන් 22.15% දක්වා ඉහළ ගිය අතර, ක්ෂේත්‍රයේ අරමුදල් සම්පාදනයෙන් 53.23% ක් සඳහා තැන්පතු දායක විය.

## ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය

අවම නියාමනමය අවශ්‍යතාවන්ට ඉහළින් ප්‍රාග්ධනය පවත්වාගෙන යමින්, ක්ෂේත්‍රය වසර තුළදී අඛණ්ඩවම නම්‍යශීලී ස්වභාවයක් විදහා දැක්වීය. වසර තුළදී නියාමනම අවශ්‍යතා සපුරාලීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය ආයතන කිහිපයක් නව ප්‍රාග්ධනය අන්තර්ග්‍රහනය කල අතර ක්ෂේත්‍රයේ මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතකතා අනුපාතය සහ අවදානම් බරතබන ලද වත්කම් වෙත ප්‍රාග්ධන පදනම පිළිවෙලින් 14.17% සහ 15.44% සිට 16.15% සහ 17.68% දක්වා ඉහළ නැංවුනි.

## ලාභදායීත්වය

ලාභය රු. බිලියන 59.82 දක්වා 101.71% ක වර්ධනයක් අත්කර ගනිමින්, මූල්‍ය වර්ෂය තුළදී බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය සවිමත් කාර්යසාධනයක් වාර්තා කලේය. මුලු මෙහෙයුම් ආදායමෙන් 74.68% ක් සඳහා දායක වන ශුද්ධ පොලී ආදායම රු. බිලියන 128.25 දක්වා 11.54% කින් වර්ධනය වූ අතර රු. බිලියන 172.72 ක් වන මුලු මෙහෙයුම් ආදායමෙහි අවශේෂය නිර්මාණය කරන්නා වූ පොලී නොවන ආදායම රු. බිලියන 43.48 දක්වා 8.43% කින් වර්ධනය විය. පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 26.68 ට සාපේක්ෂව, අපහායනය සඳහා ගාස්තු රු. බිලියන 6.21 දක්වා 76.72% ක පහළයාම ලාභදායීත්වය කෙරෙහි සහාය හිමි විය. ඒ අනුව, බදු වලට පෙර ලාභය රු. බිලියන 85.12 දක්වා 74.91% ක වර්ධනයක් වාර්තා කලේය.

### වත්කම්




### අරමුදල් සම්පාදනය




### ඉපැයුම්



## PESTEL විශ්ලේෂණය

### දේශපාලනික

- දේශපාලනික ස්ථාවරත්වය මගින් රටට අතිශයින්ම අවශ්‍ය වන ආයෝජක විශ්වාසය දිනාගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ස්ථාවර මූල්‍ය පද්ධතියක් වෙත සහාය දැක්වීම සඳහා සවිමත් ප්‍රතිපත්ති ව්‍යාපෘතීන් දියත් කරනු ලැබ ඇත.
- රසායනික පොහොර සහ වල්නාශක තහනම් කිරීම කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙත බලපෑමක් ඇති කලේය.

### ආර්ථික

- විදේශ විනිමය හිඟය තුලින් සංචාරක කර්මාන්තය බිඳවැටීම, ශ්‍රමික ප්‍රේෂණ පහළයාම, පුලුල් වන වෙළඳ හිඟය සහ ණය ආපසු ගෙවීමේ දුෂ්කරතා රටේ ආර්ථිකය වෙත ප්‍රබල බලපෑමක් එල්ල කලේය.
- සෙසු දර්ශකයන් වෙතද බලපෑමක් එල්ල කරමින්, විදේශ විනිමය අර්බුදය කෙටි කාලීන සිට මධ්‍ය කාලීන දක්වා රටේ ආර්ථිකය වෙත සැලකිය යුතු බලපෑමක් එල්ල කරන්නා වූ වඩාත්ම කැපීපෙනෙන අවදානම වශයෙන් පවතී.
- ආර්ථික වටපිටාවේ අවිනිශ්චිතතාව මූල්‍ය ක්ෂේත්‍රයේ ලාභදායිත්වය කෙරෙහි ද බලපෑ හැක.

### සමාජයීය

- අධික උද්ධමනය හේතුවෙන ප්‍රජාවගේ වියදම් කල හැකි ආදායම පහළයාම
- 2022 අප්‍රියෙල් මස 700 bps වලින් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නැංවීමත් සමග මූල්‍යකරණයේ දරාගැනීමේ හැකියාව තියුණු ලෙස පහත වැටිනි.
- ඉන්ධන, ආහාර, ගෑස් සහ බලශක්ති හිඟය ජනතාවට ප්‍රබල අසීරුතා පමුණුවන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රට තුළ සමාජ නොසන්සුන්තාව හා දේශපාලනික අස්ථාවරත්වය ඇති විය.
- පොහොර තහනම හේතුවෙන් ගොවීන් හට දුර්වල අස්වැන්නක් ලැබුනු අතර එමගින් සැළකිය යුතු අසීරුතාවන් උද්ගත විය.

### තාක්ෂණික

- නවතම තාක්ෂණය වෙත අඛණ්ඩ ආයෝජනයන් මගින් ක්ෂේත්‍රය පුරා මෙහෙයුම් සහ සේවාවන්හි තත්ත්වය ඉහළ නංවන ලදී.
- පශ්චාත් වසංගත කාලය තුළ ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය සහ අන්තර්ජාලගත මාධ්‍යන්හි කැපී පෙනෙන වෙනසක් සිදු විය.
- වඩාත් යහපත් සම්පත් වෙන්කිරීමක් සඳහා ඉඩ සලසමින්, සඵල දත්ත හා ව්‍යාපාර බුද්ධි විශ්ලේෂණයන් මගින් සමාගම් වෙත ගනුදෙනුකාර ප්‍රවණතා සහ චර්යා රටාවන් පුරෝකථනය කිරීමේ අවස්ථාව උදා වී ඇත.

### පාරිසරික

- කාලගුණ විපර්යාසයන්හි බලපෑම් දිගින් දිගටම ප්‍රබල වන්නා වූ තත්ත්වයක් තුළ, වැදගත් පාරිසරික ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දායක වීමේ දැඩි පීඩනයක් සමාගම් වෙත එල්ල වී ඇත.
- ප්‍රමුඛ අවධානාත්මක ක්ෂේත්‍රයන් අතරට මෙහෙයුම් ඇතුළත බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළනැංවීම, සෘජු හා ගනුදෙනුකාර කාබන් පියසටහන් අවම කිරීම සහ වර්ධනය කරන ලද ස්වයංක්‍රීය කාර්යප්‍රවාහයන් සමගින් කඩදාසි රහිත සේවා වටපිටාවක් නිර්මාණය කිරීම ඇතුළත් වේ.

### නෛතික

- අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ මහ බැංකු රෙගුලාසි සහ මූල්‍ය ක්ෂේත්‍ර ඒකාබද්ධකරණය වෙත යොමු විය හැකි නීතිරීති.
- අවදානම සැළකිය යුතු අයුරින් අවම කරමින්, සමූහය මගින් සහතිකත්වයන් හා සෙසු සක්‍රීය නෛතික ගිවිසුම් ආශ්‍රිත නීතිරීති හා කොන්දේසි වෙත අනුකූලතාවය දක්වනු ලැබේ.

# ප්‍රාමාණිකත්වය

GRI | 102-46

## ප්‍රාමාණිකත්වය නිර්ණය කිරීමේ ක්‍රියාවලිය

වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා වන අප සතු හැකියාව කෙරෙහි පාර්ශ්වකාර ප්‍රමුඛතා, මෙහෙයුම් වටපිටාව, අවදානම් හා අවස්ථා කෙරෙහි වන අපගේ ප්‍රතිචාරය සහ අප විසින් තෝරාගන්නා ලද ක්‍රමෝපාය වැනි බහුවිධ සාධක රැසක් බලපායි. ප්‍රාමාණික කරුණු යනු කෙටි, මධ්‍ය හා දිගු කාලීනව වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා වන අප සතු හැකියාව කෙරෙහි බලපාන්නා වූ කරුණු වන අතර ඒවා විධිමත් ප්‍රාමාණිකත්ව නිර්ණය කිරීමේ ක්‍රියාවලියක් ඔස්සේ හඳුනාගැනේ. එය අපගේ ව්‍යාපාරය වෙත සමෝධානික චින්තනය ඇතුළත් කිරීම සඳහා වන අපගේ ප්‍රයත්නයෙහි වැදගත් කොටසකි.

අපගේ ප්‍රාමාණිකත්ව ක්‍රියාවලිය ප්‍රත්‍යාලෝකනමය සහ ඉදිරි දැකුම් යන අංශ දෙකෙන්ම සමන්විත වන අතර, එමගින් සමාලෝචනයට ලක් වන වසර තුළ ව්‍යාපාරය වෙත එකතු කරන ලද අගය පිළිබඳ ඇගයුමක් සහ ඉදිරි වසරේදී අගය එකතු කිරීම සඳහා කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳ දිශානතියක් සපයනු ලබයි.

**දිගු ලැයිස්තුව පිළියෙල කිරීම**
පීපල්ස් ලීසිං හි පාරිසරික සමාජයීය හා පාලන ආකෘතිය මත පදනම්ව

**කෙටි ලැයිස්තුව පිළියෙල කිරීම**
දිගු ලැයිස්තුව ඇගයීම සහ ප්‍රමුඛතාකරණය මගින්

**කෙටි ලැයිස්තුව තහවුරු කිරීම**
ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා ඔස්සේ

**ප්‍රතිචාර දැක්වීම හා නිරීක්ෂණය**
ක්‍රමෝපායික සැලසුම්කරණ ක්‍රියාවලිය සමග ඒකාබද්ධකරණය ඔස්සේ

### Review Frameworks

- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක
- තිරසාරත්වය සන්නිවේදනය පිළිබඳ කොළඹ කොටස් වෙළඳපොලේ නිර්දේශ
- GRI සම්මතයන්
- ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය
- තිරසාර ගිණුම්කරණ සම්මත මණ්ඩලය (SASB)

### පහත දැක්වෙන කරුණු සැළකිල්ලට ගනිමින් හඳුනාගත් අනාගතමය කරුණු

- මෙහෙයුම් සන්දර්භය (පිටු 31 සිට 33)
- ක්‍රමෝපායික අවධානාත්මක අංශ/අත්‍යාවශ්‍ය දේ (පිටු 40 සිට 41)
- පාර්ශ්වකාර අවශ්‍යතා (පිටු 28 සිට 30)
- තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය (පිටු 60 සිට 113)
- විශේෂිත ඇගයුම්

### පහත දැක්වෙන කරුණු ඔස්සේ ලැයිස්තුව වලංගුකරණ ක්‍රියාවලිය

- ලෝක සහ දේශීය ප්‍රවණතා, සහ ක්ෂේත්‍රයේ සෙසු සමාගම් සමාලෝචනය
- ක්‍රමෝපාය, අවදානම, ආයෝජක සබඳතා, පාලනය, තිරසාරත්වය සහ අභ්‍යන්තර පාලනය වැනි විවිධ අභ්‍යන්තර ක්‍රියාකාරකම් වෙත සහභාගීත්වය

### පිරික්සුම

- අවදානම් සහ අවස්ථාවන් සමගින් විස්තරාත්මක ව්‍යාපාරික වටපිටාව ඇගයුම
- ගැඹුරු ක්‍රමෝපාය සමාලෝචන ක්‍රියාවලිය (පිටු 40 සිට 41)
- වෙනස් වන සුලු ගනුදෙනුකාර අවශ්‍යතා සහ ගතිකයන් වෙත ප්‍රතිචාරය
- සම්පත් අවශ්‍යතාවය සහ සම්පත් පැවතීම වෙත පිරික්සුම
- සිදුවිය හැකි ප්‍රතිචාර අතර එකිනෙක සම්බන්ධතා
- කාල රාමුව සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම

### ප්‍රමුඛතාකරණය

- ක්‍රියාවලිය පුරා, පීපල්ස් ලීසිං වෙත වඩාත් වැදගත් වන්නේ කුමක්ද යන්න සඳහා අප විසින් පිළිතුර සොයාගන්නා ලදී. අපගේ දර්ශනය අත්පත්කරගැනීමට සහ අපගේ පාර්ශ්වකරුවන් වෙත තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වඩාත්ම වැදගත් වන කරුණු එහිදී හඳුනාගැනුනි.

### තහවුරු කිරීම

- ප්‍රාමාණික කරණු ප්‍රමුඛතාකරණය තුලින් ආයතනික සාමාජිකයින් ගේ අභිමතය සහිතව අපගේ ක්‍රමෝපාය වෙත නිසි පරිදි ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව අප වෙත උදා වේ.

### ක්‍රමෝපායික සැලසුම්කරණ ක්‍රියාවලිය ඒකාබද්ධකරණය

- ප්‍රාමාණික කරුණු ක්‍රමෝපායික සැලසුම්කරණ ක්‍රියාවලිය වෙත ප්‍රමුඛ ආදානයක් වන අතර එමගින් අනාගතයේ ඇතිවිය හැකි අවදානම් හා අවස්ථා ඒවා උද්ගත වන විටම හඳුනාගැනීමේ අවස්ථාව අප වෙත උදා වේ.
- ප්‍රාමාණික කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අදාළ ක්‍රමෝපායික ස්ථම්භයන් තුළ සුදුසු ප්‍රතිචාර සකසනු ලැබේ.
- පහත දැක්වෙන ප්‍රමුඛ ප්‍රාමාණික කරුණු ක්‍රමෝපායික සැලසුම්කරණ ක්‍රියාවලිය වෙත ප්‍රමුඛ ආදානයක් වේ.

  - ඩිජිටල්කරණය
  - ගනුදෙනුකාර අත්දැකීම
  - තිරසාර මූල්‍ය ඔස්සේ තිරසාර වර්ධනය
  - සෞඛ්‍ය හා සුරක්ෂිතතාව
  - සම්පත් ප්‍රශස්තීකරණය
  - මූල්‍ය අන්තර්ග්‍රහනය සහ අවම අසමානතා
  - මානව කුසලතා සංවර්ධනය
  - ආචාරධර්ම, සුපිළිපන්බව සහ අනුකූලතාවය
  - මූල්‍යමය ස්ථාවරත්වය
  - ගනුදෙනුකාර මූල්‍යමය නම්‍යශීලීත්වය
  - ව්‍යාපාර අඛණ්ඩත්වය
  - කාලගුණ ක්‍රියාකාරකම්

වෙනස්කම් වෙත පිවිසීම සඳහා ප්‍රමුඛතාගත කෙටි ලැයිස්තුව ආවර්තිතව සමාලෝචනය කෙරේ.




| | | | |
|---|---|---|---|
| | ඩිජිටල්කරණය | | මානව කුසලතා සංවර්ධනය |
| | ගනුදෙනුකාර අත්දැකීම | | ආචාරධර්ම, සුපිළිපන්බව සහ අනුකූලතාවය |
| | තිරසාර මූල්‍ය ඔස්සේ තිරසාර වර්ධනය | | මූල්‍යමය ස්ථාවරත්වය |
| | සෞඛ්‍ය හා සුරක්ෂිතතාව | | ගනුදෙනුකාර මූල්‍යමය නම්‍යශීලීත්වය |
| | සම්පත් ප්‍රශස්තීකරණය | | ව්‍යාපාර අඛණ්ඩත්වය |
| | මූල්‍ය අන්තර්ග්‍රහනය සහ අවම අසමානතා | | කාලගුණ ක්‍රියාකාරකම් |

# ප්‍රාමාණිකත්වය

GRI | 102-47, 103-1, 207-3, 416-1

## අපගේ ප්‍රාමාණික කරුණු

| ශ්‍රේණිය | ප්‍රාමාණික කරුණු | වටිනාකම් නිර්මාණය කෙරෙහි බලපෑම | බලපෑමට ලක්වූ ප්‍රාග්ධනයන් | වැඩිම බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන් |
|---|---|---|---|---|
| 1 | ඩිජිටල්කරණය | ඩිජිටල්කරණය මගින් සේවක කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් ඔවුන්ගේ ඵලදායීත්වය වර්ධනය කෙරේ. එමගින් ගනුදෙනුකරුවන් හට ශාඛාවන්ට පැමිණීමෙන් තොරව ගනුදෙනු රැසක් සිදුකිරීමේ අවස්ථාව උදා වන අතර, එහිදී පීපල්ස් ලීසිං මගින් සපයනු ලබන සැලසුම් සහ සේවාවන් හි සැකසුම් කාලයද කඩිනම් වේ. | | |
| 2 | ගනුදෙනුකාර අත්දැකීම | ගනුදෙනුකාර අත්දැකීම පීපල්ස් ලීසිංහි තැන්පතු හා ණය ලබාදීමේ කළඹ වල තිරසාර සංවර්ධනය කෙරෙහි උපකාරී වන ප්‍රධාන තරගකාරී වාසියක් වන අතර එමගින් සන්නාම කීර්තිනාමයද වර්ධනය වේ. | | |
| 3 | තිරසාර මූල්‍ය ඔස්සේ තිරසාර වර්ධනය | තිරසාර මූල්‍ය සැලසුම් මගින්, සමාජ හා පාරිසරික ක්‍රියාපටිපාටිය වෙත ගනුදෙනුකරුවන්ගේ අනුකූලතාවය තහවුරු කෙරෙන අතර, එමගින් ඔවුන් විසින් සිදුකරනු ලබන කටයුතු සම්බන්ධ වගකීම භාරගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ ගනුදෙනුකරුවන් දැනුවත් කෙරේ. | | |
| 4 | මූල්‍යමය ස්ථාවරත්වය | පීපල්ස් ලීසිං රටේ ආර්ථික අර්බුදය තුළ මූල්‍යමය ස්ථාවරත්වය රැකගනිමින්, සියලු පාර්ශ්වකරුවන්ගේ අභිමතයන් සුරකින බවට තහවුරු කෙරේ. | | |
| 5 | සෞඛ්‍ය හා සුරක්ෂිතතාව | 2020 මාර්තු මස සිට, රට කෝවිඩ් 19 වසංගතයේ ග්‍රහනයට හසුවූ අතර එමගින් ව්‍යාපාර වෙත දැඩි බාධා ඇති විය. අපගේ සේවකයින් හට ආරක්ෂිත සේවා වටපිටාවක් නිර්මාණය කිරීම හා ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම වසර තුළ ප්‍රධාන ප්‍රමුඛතාවක් විය. | | |
| 6 | සම්පත් ප්‍රශස්තීකරණය | සම්පත් ප්‍රශස්තීකරණය, කාර්යක්ෂමතාව සහ ලාභ තීරු පවත්වාගෙන යාම සහ පාර්ශ්වකරුවන් වෙත ලබාදෙන වටිනාකම උපරිම තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රධාන සාධකය වන අතර එය සමෝධානික චින්තනයේ මූලික හරය වේ. | | |

● ඉහළ ● පහළ

| අවස්ථා හ අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගත් පියවර | බලපෑම - ආයතනික අපේක්ෂාවන් | බලපෑම - පාර්ශ්වකාර අපේක්ෂාවන් | GRI ප්‍රාමාණික දර්ශක අංකය සහ තේමා නාමය | තිරසාර සංවර්ධන ඉලක්ක |
|---|---|---|---|---|
| • අභ්‍යන්තර ක්‍රියාවලි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා CAPP සහ DCHEQUE හඳුන්වාදෙන ලදී.<br>• ණය හා කල්බදු වාරික ගෙවීමේ පහසුකම් සැලසීමේ සමූහ ව්‍යාපෘතියක් වශයෙන් People's Payway හඳුන්වාදෙන ලදී. | ඉහළ | ඉහළ | | 8 DECENT WORK AND ECONOMIC GROWTH<br>9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE<br>11 SUSTAINABLE CITIES AND COMMUNITIES |
| • භාවිත කරන්නන් හට පහසු සේවා අත්දැකීමක් ලබාදීම සඳහා පීපල්ස් ලීසිං මගින් මෑතකදී සිය ජංගම යෙදවුම වන PLC Touch හඳුන්වාදෙන ලදී. | ඉහළ | ඉහළ | • GRI 417 - අලෙවිකරණය සහ ලේබල්කරණය | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| • පීපල්ස් ලීසිං මගින් අඛණ්ඩවම හරිත ණයලබාදීම ප්‍රවර්ධනය කරනු ලබන අතර, එය සතුව තිරසාර මූල්‍යකරණ ප්‍රතිපත්ති වලට අනුකූල සුදු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ ක්ෂුද්‍ර ව්‍යසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සලසන්නා වූ සැලසුම් රැසක් පවතී. තවද, පසුගිය වසර තුන තුළ පිරිනමන ලද පමාසහන සහ සෙසු සහන මගින් තිරසාර මූල්‍ය වෙත සහාය දැක්වීම සඳහා වන සමාගමෙහි කැපවීම පිළිබිඹු කෙරේ. | ඉහළ | ඉහළ | • GRI 201 - ආර්ථික කාර්යසාධනය | 8 DECENT WORK AND ECONOMIC GROWTH<br>9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE |
| • ගාස්තු හා කොමිස් මත පදනම් වූ ආදායම ඉහළ නංවන ලදී.<br>• නව රථවාහන වෙත කල්බදු ලබාදීමෙන් ඔබ්බට සැලසුම් කළඹ විවිධාංගීකරණය<br>• නව සැලසුම් ආශ්‍රිත අවදානම් කළමනාකරණය | ඉහළ | ඉහළ | | 1 NO POVERTY<br>8 DECENT WORK AND ECONOMIC GROWTH<br>9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE<br>10 REDUCED INEQUALITIES<br>11 SUSTAINABLE CITIES AND COMMUNITIES<br>12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION |
| • සියලුම සේවකයින් වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් සියලු ව්‍යාපාරික පරිශ්‍රයන්හි දැඩි කෝවිඩ් 19 ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කරන ලදී.<br>• කෝවිඩ් වැළඳී ඇති බවට තහවුරු වුවහොත් සේවකයින් වෙත වියළි ආහාර පැකේජ සහ සෞඛ්‍ය රක්ෂණය පිරිනමන ලදී<br>• අවදානම් කළමනාකරණ ව්‍යාපෘතීන්හි කොටසක් වශයෙන් කෝවිඩ් 19 තත්ත්වයන් නිරීක්ෂණය කරන ලද අතර අනාගත වසංගතයන්හි බලපෑම අවම කිරීම සඳහා සැලසුම් සකසන ලදී. | පහළ | පහළ | • GRI 403 - වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව<br>• GRI 410 - ආරක්ෂණ<br>• ක්‍රියාකාරකම්<br>• GRI 416 - ගනුදෙනුකාර සෞඛ්‍ය හා සුරක්ෂිතතාව<br>• GRI 418 - ගනුදෙනුකාර රහස්‍යභාවය | 3 GOOD HEALTH AND WELL-BEING<br>8 DECENT WORK AND ECONOMIC GROWTH<br>16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| • ඩිජිටල්කරණය ඇතුලු කඩදාසි රහිත කාර්යාලයක් සඳහා වන ව්‍යාපෘතීන්<br>• පිරිවැය අරපිරිමැසුම් වැඩසටහන්<br>• සමූහ ව්‍යාප්ත ඵලදායීතා ව්‍යාපෘතීන් | පහළ | පහළ | • GRI 302 - බලශක්තිය<br>• GRI 305 - විමෝචනයන්<br>• GRI 306 - අපද්‍රව්‍ය | 3 GOOD HEALTH AND WELL-BEING<br>6 CLEAN WATER AND SANITATION<br>7 AFFORDABLE AND CLEAN ENERGY<br>8 DECENT WORK AND ECONOMIC GROWTH<br>11 SUSTAINABLE CITIES AND COMMUNITIES<br>12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION<br>13 CLIMATE ACTION<br>14 LIFE BELOW WATER<br>15 LIFE ON LAND<br>16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |

# ප්‍රාමාණිකත්වය

| ශ්‍රේණිය | ප්‍රාමාණික කරුණු | වටිනාකම් නිර්මාණය කෙරෙහි බලපෑම | බලපෑමට ලක්වූ ප්‍රාග්ධනයන් | වැඩිම බලපෑමට ලක් වූ පාර්ශ්වකරුවන් |
|---|---|---|---|---|
| 7 | මූල්‍ය අන්තර්ග්‍රහනය සහ අවම අසමානතා | අප විසින් මූල්‍ය පහසුකම් වෙත පිවිසුමක් ලබාදෙමින් අසමානතා අවම කිරීමේ පසුබිමක් තුළ අන්තර්ග්‍රහන මූල්‍යකරණය කෙරෙහි පහසුකම් සලසන සැලසුම් කළඹක් අපගේ වර්ධනය කෙරෙහි අතිශය වැදගත් වේ. | | |
| 8 | මානව කුසලතා සංවර්ධනය | විශේෂයෙන්ම මූල්‍ය සේවා සමාගමක් වශයෙන් ඩිජිටල් මෙහෙයුම් යුගයක් වෙත පරිවර්තනය වීමේදී ප්‍රශස්ත කාර්යසාධනයක් අත්කර ගැනීම සඳහ අමතර කුසලතා අවශ්‍ය කරන පසුබිමක් තුළ, කුසලතා සංවර්ධනය සමාගමෙහි සංවර්ධනය කෙරෙහි අතිශය වැදගත් වේ. | | |
| 9 | ආචාරධර්ම, සුපිළිපන්බව සහ අනුකූලතාවය | නියාමනය කරන ලද ක්ෂේත්‍රයක් තුළ කටයුතු කිරීමේදී ආචාරධර්ම, සුපිළිපන්බව සහ අනුකූලතාවය අපගේ මෙහෙයුම් වල සෑම පැතිකඩකටම පාහේ බලපායි. | | |
| 10 | ගනුදෙනුකාර මූල්‍යමය නම්‍යශීලීත්වය | වර්තමාන බලශක්ති අර්බුදය හේතුවෙන් මගී ප්‍රවාහන ක්ෂේත්‍රය කෙරෙහි වන සමාග මෙහි නිරාවරනය සැළකිය යුතු බලපෑමකට ලක් වූ අතර ක්‍රියාකාරී එළඹුම් තුළින් මෙකී ගනුදෙනුකරුවන් හට යථා තත්ත්වයට පත්වීමට සහාය වීම ණය අවදානම කළමනාකරණයේදී ප්‍රමුඛතාවකි. | | |
| 11 | ව්‍යාපාර අඛණ්ඩත්වය | බැංකු නොවන මූල්‍ය ආයතන සාමාන්‍යයෙන් අත්‍යාවශ්‍ය සේවාවන් වශයෙන් සැළකෙන බැවින්, ව්‍යාපාරික පරිශ්‍රයන් අඛණ්ඩවම විවෘතව පැවතිය යුතු වේ. අඛණ්ඩ බලශක්ති අර්බුදය හමුවේ ප්‍රවාහන හා බලශක්ති සැපයුම් වෙත බාධා ඇති වන බැවින් සමාගමෙහි මෙහෙයුම් කෙරෙහි බලපෑම් ඇති විය හැකි පසුබිමක් තුළ ව්‍යාපාර අඛණ්ඩත්වය ප්‍රධාන ප්‍රමුඛතාවක් බවට පත් වේ. | | |
| 12 | කාලගුණ ක්‍රියාකාරකම් | සිය ක්‍රියාවලීන් වෙත සිදුකෙරෙන වෙනස්කම් ඔස්සේ පහළ කාබන් ආර්ථිකයක් වෙත පරිවර්තනය වීම කෙරෙහි පීපල්ස් ලීසිං කැපවීමෙන් කටයුතු කරන අතර එහිදී සිය මූල්‍ය සැලසුම් වෙත පිවිසුම ඔස්සේ වෙනසක අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීම් සිදු කෙරේ. | | |

| | අවස්ථා හා අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගත් පියවර | බලපෑම | | GRI ප්‍රමාණික දර්ශක අංකය සහ තේමා නාමය | තිරසාර සංවර්ධන ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | ආයතනික අපේක්ෂාවන් | පාර්ශ්වකාර අපේක්ෂාවන් | | |
| | • අපගේ සැලසුම් රැසක් අන්තර්ග්‍රහන මූල්‍යකරණය සහ ගනුදෙනු පහසුව වෙත සහාය දක්වයි. | ○ | ○ | | 1 NO POVERTY, 8 DECENT WORK AND ECONOMIC GROWTH, 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE, 10 REDUCED INEQUALITIES |
| | • පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය වාර්ෂිකව සිදුකොට පුහුණු සැලසුම් සකසනු ලබන අතර එමගින් පුහුණුව හා කුසලතා සංවර්ධනය සඳහා ව්‍යුහගත එළඹුමක් නිර්මාණය වේ. | ○ | ○ | • GRI 401 - සේවා නියුක්තිය<br>• GRI 404 - පුහුණුව හා අධ්‍යාපනය<br>• GRI 405 - විවිධත්වය හා සමාන අවස්ථා<br>• GRI 406 - වෙනස්කොට නොසැළකීම<br>• GRI 407 - එකරැස්වීමේ නිදහස සහ සාමූහික කේවල්කරණය | 4 QUALITY EDUCATION, 5 GENDER EQUALITY, 8 DECENT WORK AND ECONOMIC GROWTH, 10 REDUCED INEQUALITIES |
| | • ප්‍රබල සංගමික පාලනය, අවදානම් කළමනාකරණය සහ ආචාරධර්ම සංග්‍රහය පීපල්ස් ලීසිං හි අනුකූලතා වටපිටාව සවිමත් කරයි.<br>• සමාගම, ආයතනක වාර්තාකරණයේ විනිවිදභාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පොදු ලැයිස්තුගත සමාගම් 75 ක් අතුරින් විශිෂ්ටතම 20 අතරට එක් වේ. | ○ | ○ | • GRI 205 - දූෂණ විරෝධීත්වය<br>• GRI 207 - බදු<br>• GRI 307 - පාරිසරික අනුකූලතාවය<br>• GRI 308 - සැපයුම්කාර පාරිසරික ඇගයුම<br>• GRI 413 - දේශීය ප්‍රජාවන්<br>• GRI 414 - සැපයුම්කාර සමාජ ඇගයුම<br>• GRI 419 - සමාජ ආර්ථික අනුකූතාවය | 1 NO POVERTY, 5 GENDER EQUALITY, 8 DECENT WORK AND ECONOMIC GROWTH, 10 REDUCED INEQUALITIES, 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS, 17 PARTNERSHIPS FOR THE GOALS |
| | • මගී ප්‍රවාහන රථ නැවත අත්පත් කරගනීමක් නොමැත.<br>• ප්‍රතිව්‍යුහගත කිරීම් සමගින් බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් වෙත හිතමිතුරු වැඩසටහන හඳුන්වාදීම. | ○ | ○ | | 1 NO POVERTY, 8 DECENT WORK AND ECONOMIC GROWTH, 10 REDUCED INEQUALITIES, 11 SUSTAINABLE CITIES AND COMMUNITIES |
| | • පීපල්ස් ලීසිං මගින් සිය ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම් නැවත විමසා බලමින් වර්තමාන අභියෝග යන් පිළිබිඹු වන පරිදි ඒවා සංශෝධනය කරන ලදී. | ○ | ○ | | 8 DECENT WORK AND ECONOMIC GROWTH, 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE, 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION |
| | • අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් වෙත සහන<br>• කාබන් පියසටහන මැනීම සහ කළමනාකරණය<br>• කාලගුණය ආශ්‍රිත මූල්‍යකරරණ අවස්ථා සමාලෝචනය | ○ | ○ | • GRI 302 - බලශක්තිය<br>• GRI 305 - විමෝචනයන්<br>• GRI 306 - අපද්‍රව්‍ය | 8 DECENT WORK AND ECONOMIC GROWTH, 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE, 11 SUSTAINABLE CITIES AND COMMUNITIES, 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION, 13 CLIMATE ACTION |

# අපගේ ක්‍රමෝපාය

අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම් වටපිටාව සම්බන්ධ දැඩි විශ්ලේෂණයකින් අනතුරුව පීපල්ස් ලීසිං මගින් 2021 දී සිය පස් අවුරුදු ක්‍රමෝපායික සැලසුම එළිදක්වන ලදී. වසංගතය සහ ව්‍යාපාර කටයුතු වෙත එහි බලපෑම හමුවේ ව්‍යාපාරික වටපිටාව එක් රැයක් තුළ බහුවිධ වෙනස්කම් වලට භාජනය විය. අපගේ ප්‍රමුඛ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන අතරතුර විශිෂ්ටත්වය අත්පත් කරගැනීම සඳහා කැප වී කටයුතු කරන පසුබිමක් තුළ, මෙම ගාමික මෙහෙයුම් වටපිටාව ඇතුළත සමාගමෙහි ක්‍රමෝපායික අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා නව ක්‍රමෝපායික සැලසුම මගින් ස්ථාවර පදනමක් සැකසේ. අපගේ දිගු කාලීන ක්‍රමෝපායික සැලසුම නොවෙනස්ව පවතින අතර, වර්තමාන ආර්ථික සහ වෙළඳපොල තත්ත්වයන් හමුවේ සමාගම මගින් සිය කෙටි කාලීන ක්‍රියාකාරී සැලසුම කාර්තුමය පදනමක් මත සමාලෝචනයට ලක් කරන ලදී.

**අපගේ දැක්ම**
ගනුදෙනුකරුවන් සඳහා හිතකාමී, නිර්මාණාත්මක සහ පූර්ණ නව්‍යකරණ විසඳුම් සපයන්නකු ලෙස මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම

**අපගේ මෙහෙවර**
තිරසර තරඟකාරී ප්‍රතිලාභ පවත්වා ගනිමින් ආයතනික සේවා විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීම උදෙසා අගය එක් කළ තරඟකාරී සේවා සැපයුමකට කැපවීම

**අපගේ වටිනාකම්**

ආර්ථික ශක්‍යතාව

සමාජයීය වගවීම

පාරිසරික වගකීම

## උපායමාර්ගික අරමුණු

- තිරසාර වර්ධනය අත්කර ගැනීම
- ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම
- අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය තුළින් ක්‍රියාත්මක කිරීමේ විශිෂ්ටත්වය අත්පත් කරගැනීම
- පාරිසරික හා සමාජයීය සාධක ඒකාබද්ධකරණය
- සදාචාර සම්පන්න, විවෘත සහ විනිවිදභාවයෙන් යුතු ව්‍යාපාරික වටපිටාවක් පවත්වාගෙන යාම ඔස්සේ වගකීම් සහගත නායකත්වය ආදේශනය

## 2022-2026 ක්‍රියාකාරී සැලසුම්

### ව්‍යාපාරික ක්‍රමෝපාය

**ක්‍රමෝපාය අනාගත වර්ධන අවස්ථා සහිත ක්ෂේත්‍ර ඉලක්ක කරගනිමින් ණය ලබාදීමේ පහසුකම් සැකසුම**

**වගකීම් පහසුකම් වර්ධනය**
- නව්‍ය මාධ්‍යයන් ඔස්සේ සාමාන්‍ය තැන්පතු පදනම ගොඩනැංවීම
- රක්ෂණ/වරප්‍රසාද පහසුකම් සමගින් ජ්‍යෙෂ්ට තැන්පතු හඳුන්වාදීම

**හවුල්කාරිත්වයන් සහ අත්පත් කරගැනීම්/පිරිවැය කාර්යක්ෂමතාව**
- ශාඛා නිසි පරිමානයට පත් කිරීම
- බිම් ඉඩකඩ ප්‍රශස්තීකරණය
- පසු කාර්යාලඃ ඉදිරි කාර්යාල අනුපාතය නැවත සැකසීම

**ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය**
- ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණය
- ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය

**අලෙවිකරණය**
- ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන්
- සහයෝගීතාවයන් ඔස්සේ පහසුකම් ප්‍රවර්ධනයන්
- අන්තර්ජාලගත මෝටර් රථ අලෙවි පදනම

**ස්වයංක්‍රීයකරණය**
- භෞතික ක්‍රියාවලීන් ඩිජිටල්කරණය
- ඉලෙක්ට්‍රොනික ලේඛණගත කිරීම්

**අනුබද්ධ ක්‍රමෝපායන්**



## අනුකූලතා සහ අවදානම් ක්‍රමෝපාය

**ප්‍රති අවදානම**
- අයකර ගැනීමේ ක්‍රමෝපායන් නැවත සැකසීම - මෝටර් රථ වෙන්දේසි ක්‍රියාවලිය/අන්තර්ජාලගත මෝටර් රථ වෙන්දේසි ක්‍රියාවලිය ස්ථාපනය

**ණය**
- ණය කමිටුවක් පිහිටුවීම
- Worry Watch නිරීක්ෂණය
- මෙහෙයුම් අවදානම් සමාලෝචන රැස්වීම්
- ණය මාර්ග සන්දර්ශන

**අනුකූලතාවය**
- ඔබගේ ගනුදෙනුකරු හඳුනාග න්න/ගනුදෙනුකරු වෙත නිසි අවධානයෙන් යුතුව සැළකීම
- ප්‍රති මුදල් විශුද්ධිකරණය

## මානව ක්‍රමෝපාය

**අදහස් ප්‍රකාශ කිරීමේ වටපිටාව**
- දුක්ගැනවිලි සම්බන්ධයේ කටයුතු කිරීම
- මානව සම්පත් බ්ලොග් එක
- ස්ථර මඟ හැරීමේ රැස්වීම්

**ප්‍රතිලාභ, ඇගයුම් සහ ආයතනික සංවර්ධන මුලපිරීම**
- සේවක ගෙවීම් පැකේජ සමාලෝචනය සහ රැකියා ඇගයුම
- කාර්යසාධන ඇගයුම් ක්‍රියාවලිය සමාලෝචනය
- සේවා විස්තර (JDs)
- ගනුදෙනුකාර සේවා සැපයිම ආශ්‍රිත සේවක ඇගයුම් සැලසුම් හඳුන්වාදීම සහ ප්‍රායෝගික ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ යෝජනා/මුලපිරීම්

**වෘත්තීය සංවර්ධනය**
- පුහුණුව හා පුද්ගල සංවර්ධනය - ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය, කළමනාකරණ සංවර්ධන වැඩසටහන, සේවා චාරිත්‍ර පුහුණුව, විශේෂ තාක්ෂණික පුහුණුව. අධ්‍යයන කළමනාකරණ පද්ධතිය, තාක්ෂණික/මෘදු කුසලතා වැඩසටහන්/අනුකූලතා සහ වෙනත් අවශ්‍යතා, අධීක්ෂණ ප්‍රධානීන් සමග කුසලතා සාකච්ඡා අරඹා අවශ්‍ය සංවර්ධන මැදිහතවීම් හඳුනාගැනීම (කළමනාකාර ශ්‍රේණිය සහ ඉහළ) සහ උපදේශන වැඩසටහන්

**සේවක සහභාගීත්වය සහ යහපැවැත්ම**
- අන්තර් ප්‍රාදේශීය අන්තර්ක්‍රියාවන් දිරිගැන්වීම
- ක්‍රීඩා සහ යහ පැවැත්ම ක්‍රියාකාරකම්
- දිවා සුරැකුම් පහසුකම්

**ක්‍රියාවලි වැඩිදියුණු කිරීම**
- HRIS ස්වයංක්‍රීයකරණය
- මානව සම්පත් පෝටලය නවීකරණය
- පවතින මානව සම්පත් ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කරමින් අවශ්‍ය තැන් වලදී යාවත්කාලීන කිරීම

## කෙටි කාලීනව වර්තමාන අර්බුද කළමනාකරණ ක්‍රමෝපාය

**ද්‍රවශීලතාවය**
පවතින අරමුදල් සම්පාදන ධාරාවන් සුරක්ෂිත කරමින් සහ විකල්ප අරමුදල් සම්පාදන වරණයන් ඔස්සේ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය සඳහා ඉහළම ප්‍රමුඛතාව

**තැන්පතු**
ශ්‍රී ලංකා මහ බැංකු නියෝග අනුව පොලී අනුපාත පවත්වාගෙන යමින් තැන්පතු පදනම ඉහළ නංවන ලදී.

**ණය ලබාදීම්**
නව ණය ලබාදීම් සීමා කිරීම
අරමුදල් වල පිරිවැය සහ ද්‍රවශීලතා ස්ථාවරයන් සැළකිල්ලට ගනිමින් ණය ලබාදීමේ අනුපාත ඉහළ නැංවීම

**එක්රැස් කිරීම්**
මාසික හිඟ එක්රැස් කිරීම් සමීපව නිරීක්ෂණය

**නිරාවරන කළමනාකරණය**
කෙටි කාලීන කල්පිරීම් සහිත පහසුකම් කෙරෙහි අවධානය

**නියෝජනය හා දැනුවත්භාවය**
සේවක/ගනුදෙනුකාර දැනුවත් කිරීම්

**අර්බුද කළමනාකරණය**
අර්බුද කළමනාකරණ කණ්ඩායම ඔස්සේ වෙළඳපොල අනුපාත සංචලනය, ද්‍රවශීලතාවය සහ ව්‍යාපාරික සංජානනයන් සමීපව නිරීක්ෂණය

**මානව සම්පත් ක්‍රමෝපාය**
ප්‍රවේශම් සහගත සමාලෝචනයකින් අනතුරුව බඳවාගැනීමේ පුරප්පාඩු පිරවීම

සේවක බහු කුසලතාකරණය නැවත ක්‍රියාවට නැංවීම



අපගේ ඩිජිටල් වශයෙන් සවිබල ගැන්වුනු සමාගම සමග සම්බන්ධ වෙමින්



# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය

ඉදිරියේ දැක්වෙන කොටස මගින්, සමූහ සංජානනය අනුව එක් එක් කාණ්ඩයේ ප්‍රතිපල පිළිබිඹු කෙරෙන්නා වූ සමූහ ව්‍යාපාර ධාරාවන් සහ සංඛ්‍යාලේඛණ ආශ්‍රිත තොරතුරු වලින් සමන්විත වේ. කෙසේවුවද, තැන්පතු, විදේශීය මෙහෙයුම් සහ ක්ෂුද්‍ර මූල්‍ය වැනි ව්‍යාපාර ධාරාවන් සමූහය වෙත ඒවායේ වැදගත්කම සැළකිල්ලට ගනිමින් වෙන වෙනම විස්තරාත්මකව ඉදිරිපත් කොට ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශයන්හි සමූහ ආංශික විශ්ලේෂණයේ වෙනම අනාවරනය කොට නොමැත.

ණය සහ කල්බදු 46
තැන්පතු 48
ඉස්ලාමීය මූල්‍ය 50
රක්ෂණ 52
විදේශීය මෙහෙයුම් 54
ක්ෂුද්‍ර මූල්‍ය 56
වෙනත් ව්‍යාපාර කාණ්ඩයන් 58

## ප්‍රාග්ධන වාර්තාව

මූල්‍ය ප්‍රාග්ධනය 60
නිෂ්පාදිත ප්‍රාග්ධනය 76
බුද්ධිමය ප්‍රාග්ධනය 80
මානව ප්‍රාග්ධනය 88
සමාජ හා සබදතා ප්‍රාග්ධනය 96
ස්වභාවික ප්‍රාග්ධනය 106

# සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය



# සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය

## ණය සහ කල්බදු

**අපගේ පුලුල් ව්‍යාප්තියක් සහිත ණය සහ කල්බදු සැලසුම් කළඹ මගින් දිවයින පුරා පුද්ගලයින්, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ පුත්කලයන් 100,000 කට අධික සංඛ්‍යාවකගේ අවශ්‍යතා සපුරාලනු ලබයි. අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වයන් මධ්‍යයේ වුවද, මෙම කාණ්ඩය මගින් වසර තුළදී ප්‍රශංසනීය කාර්යසාධනයක් අත්පත් කරගන්නා ලදී.**

**2021/22 කාර්යසාධන විශේෂතා**

**ශුද්ධ පොලී ආදායම**
රු. මිලියන 12,211.08
(2020/21 රු. මිලියන 11,115.47)

**කාණ්ඩ ප්‍රතිපල/බදු පෙර ලාභය**
රු. මිලියන 7,393.00
(2020/21 - රු. මිලියන 6,565.53)

**ණය සහ කල්බදු අනුපාතය**
රු. මිලියන 143,526.77
(2020/21 - රු. මිලියන 134,656.13)

**අක්‍රීය වත්කම්**
8.84%
(2020/21 - 9.22%)




| වටිනාකම් නිර්මාණය | |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | • ණය ගුණාත්මකභාවය කෙරෙහි අවධානය<br>• නියෝජිත ජාලය ව්‍යාප්ත කිරීම<br>• තෝරාගත් වත්කම් කාණ්ඩයන්හි වර්ධනය |
| බුද්ධිමය ප්‍රාග්ධනය | • පූර්ණ ඩිජිටල්ගත පදනමක් වෙත පරිවර්තනය<br>• 'PLC touch' සහ 'People's Pay Way' හඳුන්වාදීම |
| මානව ප්‍රාග්ධනය | • මානව සම්පත් ඵලදායී අයුරින් කළමකරණය හා සංවර්ධනය උදෙසා පරිපූර්ණ මානව සම්පත් ප්‍රතිපත්තියක් සකසනු ලැබ ඇත. |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | • ප්‍රාදේශීය සංකල්පය එළිදැක්වීම<br>• ශාඛා ඒකාබද්ධ කිරීම<br>• පිරිවැය අරපිරිමැසුම් වැඩසටහන් |
| සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | • මගී ප්‍රවාහන රථවාහන සම්බන්ධ කිසිදු නැවත අත්පත් කරගැනීමක් සිදු නොකෙරිනි.<br>• හිතමිතුරු වැඩසටහන හඳුන්වාදීම<br>• ණය පහසුකම් 31,725 ක් වෙත පමාසහන සහ සෙසු සහන පියවර |

**ඉදිරි දැක්ම**

කල්බදු හා ණය කළඹෙහි ණය ගුණාත්මකභාවය ඉහළනැංවීම ප්‍රධාන ප්‍රමුඛතාවක් වශයෙන් තවදුරටත් පවතින අතර, මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා අප විසින් අඛණ්ඩවම අපගේ ණය ඇගයුම් හා අධීක්ෂණ ක්‍රියාවලිය සවිමත් කරනු ලැබේ. මේ අතර, අප විසින් පහළ අවදානම් හා ඉහළ වර්ධන වත්කම් කාණ්ඩයන් ඇතුළත් කිරීම සඳහා අපගේ සැලසුම් මිශ්‍රය ප්‍රතිඅනුකූලනය ඔස්සේ දිගින් දිගටම ක්‍රමෝපායික වශයෙන් ව්‍යාප්ත කරනු ලැබේ. කෙසේවුවද, රටේ දැනට පවතින ආර්ථික තත්ත්වයය සැළකිල්ලට ගනිමින්, සමාගම මගින් නව ණය ලබාදීම් සීමා කරමින් කාර්තුමය පදනමක් මත ක්‍රමෝපාය හා ආශ්‍රිත ප්‍රමුඛ කාර්යසාධන දර්ශක සමාලෝචනය කිරීමට අපේක්ෂා කෙරේ.

## 2021/22 තුළ වර්ධනයන්

වසර තුළ පැවති අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වයන් හමුවේ වුවද, අප විසින් රන් ණය වැනි සුරක්ෂිත වත්කම් කාණ්ඩයන් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉහළ පංතියේ වත්කම් සිල්ලර කාණ්ඩය වෙත මූල්‍යකරණයෙන් විතැන් වීමට කටයුතු කරන ලදී. අප විසින් ත්‍රී රෝද රථ කාණ්ඩය වැනි අඩු අවදානමක් සහිත ඉහළ වර්ධන කාණ්ඩයන් ආශ්‍රිතව අපගේ කළඹ වර්ධනය කරගැනීම අඛණ්ඩවම සිදුකරන ලදී. කෙසේවුවද, අප විසින් මෙකී වඩාත් අවදානම් සහගත කාණ්ඩයන් වෙත අපගේ නිරාවරනය පහත හෙළීම උදෙසා, මහ බැංකුව මගින් නිර්දේශිත 80% වටිනාකාමට ණය අනුපාතයට (LTV) පහළින් වටිනාකමට ණය අනුපාතයක් (LTV) ආදේශ කරගනුනි. ප්‍රාදේශීය කළමනාකරුවන් හට වැඩි බලතල ලබාදෙන්නා වූ ප්‍රාදේශීය වශයෙන් ශාඛාවන් පර්ෂදකරණය කෙරෙන ප්‍රාදේශීය සංකල්පය මගින් ප්‍රදේශීය වශයෙන් වැඩි අවධානාත්මක වර්ධනයක් කෙරෙහි දායකත්වය හිමි විය.

කළඹ ආශ්‍රිත ගුණාත්මකභාවය පවත්වා ගැනීම වසර තුළදී ප්‍රධාන අවධානාත්මක කරුණක් විය. කළඹ ආශ්‍රිත ගුණාත්මකභාවය මැනීම සඳහා ප්‍රමුඛ පරිපූර්ණ කාර්යසාධන දර්ශක හඳුන්වාදෙන ලද අතර අවශ්‍ය නම් ක්‍රියාකාරී පියවර ගැනීම සඳහා අප විසින් අඛණ්ඩවම අයකර ගැනීම් අධීක්ෂණය කරන ලදී.

වසර තුළදී අප විසින් අපගේ රථවාහන නියෝජිත ජාලය වර්ධනය කරමින් අපගේ නියෝජනය ව්‍යාප්ත කිරීමද සිදුකෙරිණි. දිවයින පුරා අපගේ නියෝජන ගනුදෙනුකාර සේවා ස්ථාන 2000 කට අධික සංඛ්‍යාවක් බවට පත් කරමින් නව නියෝජිතයින් 224 ක් බඳවා ගන්නා ලදී. මේ අතර, විශේෂයෙන්ම බිම් මට්ටමේ අපගේ සැලසුම් ප්‍රවර්ධනය කරමින් සන්නාම ප්‍රචාරණය ඉහළ නැංවීම උදෙසා දීප ව්‍යාප්ත ප්‍රවර්ධන ව්‍යාපෘතියක්ද දියත් කෙරිණි.

මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමෙහිලා ද අපගේ අවධානය යොමු විය. ශාඛාවන් පර්ෂදකරණය කිරීමේ ප්‍රාදේශීය සංකල්පයට අමතරව, ක්‍රමෝපායිකව හඳුනාගත් ශාඛාවන් වඩාත් ඵලදායී සහයෝගීතාවයන් ඇති වන පරිදි ඒකාබද්ධ කරන ලදී. අපගේ ජංගම යෙදුම වන 'PLC touch' සහ සියලු ගනුදෙනුකාර ගෙවීම් සඳහා වන බහුවිධ සේවා ජාලයක් වන 'People's Pay Way' හඳුන්වාදෙමින් වසර තුළදී ඩිජිටල්කරණ ප්‍රයත්නයන්ද ඉදිරියට ගෙන යන ලදී. සැළකිය යුතු ආකාරයකින් ඵලදායීතාවය ඉහළ නංවා ගනිමින් නිලධාරීන් හට දුරස්ථව ලිපිගොනු සැකිසීමේ හැකියාව සලසන්නා වූ පූර්ණ ඩිජිටල්ගත පදනමක් වෙත පරිවර්තනය වීමද අප විසින් අඛණ්ඩවම සිදුකරන ලදී. වසර තුළදී ආදායමට පිරිවැය ප්‍රමුඛ කාර්යසාධන දර්ශක ඇතුලු දූඩි පිරිවැය පාලන පියවරයන්ද හඳුන්වාදෙන ලදී. අප විසින් ව්‍යාපාර වර්ධනය උදෙසා ආකර්ශනීය දීමනා සමගින් සේවකයින් අතර විකිණුම් ගාමක වටපිටාවක් නිර්මාණය කරනු ලබන අතරතුර, විකිණුම් හා අලෙවි කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය අඛණ්ඩ පුහුණුව ලබාදෙන ලදී.

වසර තුළදී අඛණ්ඩවම කෝවිඩ් 19 වසංගතයේ බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් වෙත සහන සලසන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු උපදෙස් අනුව වසර තුළදී ණය පහසුකම් 31,000 කට අධික සංඛ්‍යාවක් වෙත පමාසහන පිරිනමන ලදී. මේ අතර පශ්චාත් කෝවිඩ් සමයේදී සිය ව්‍යාපාර යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා සහාය දක්වමින් පුද්ගලික මගී ප්‍රවාහන ගනුදෙනුකාර කාණ්ඩය වෙත අඩු පොලී සහන ණය යෝජනා ක්‍රමයක් වශයෙන් හිතමිතුරු ණය ක්‍රමය හඳුන්වාදෙන ලදී.

### කාර්යසාධනය

වසර පුරා පැවති පහළ පොලී අනුපාතයන් හේතුවෙන් ලාභ තීරු වෙත පීඩනයක් එල්ල වූ තත්ත්වයක් මධ්‍යයේ වුවද, සැලසුම් මිශ්‍රය කළමනාකරණය සඳහා වූ තිරසාර ප්‍රයත්නයන් කරණ කොට ගෙන තීරු මත බලපෑම පහත හෙළීමට අංශයට හැකි විය.

කල්බදු හා ණය කළඹ 6.59% ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා කලේය. වසර තුළදී වාණිජ රථවාහන සහ සුඛෝපභෝගී වාහන සඳහා වන ඉල්ලුම තවදුරටත් පහළ මට්ටමක පවතිද්දී ත්‍රී රෝද රථ වැනි ඉහළ ඉල්ලුමක් සහිත සාමාන්‍ය රථවාහන කාණ්ඩයන් තුළ අපගේ කළඹ ව්‍යාප්ත කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු විය.

2022 මාර්තු 31 දිනට රු.මිලියන 2,658.47 ක් දක්වා 33.36% කින් වර්ධනය වූ රන් ණය වර්ධනයද කළඹ වර්ධනය කෙරෙහි දායක විය. මෙම කාණ්ඩයෙන් පොලී ආදායම වසර තුළදී රු.මිලියන 292.02 ක් දක්වා 20.16% කින් වර්ධනය විය.

වසර ඇතුළත කොළඹ කොටස් ළෙදපොලේ ධනාත්මක සංචලනයන් වලට සමගාමීව, සමාගමෙහි ආන්තික වෙළඳාම් කළඹ 2022 මාර්තු 31 වන විට රු.මිලියන 8,387.79 ක් කරා ළඟා වෙමින් 73.56% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කලේය. සැලසුම මගින් වසර 2021/22 සඳහා උත්පාදනය කරන ලද පොලී ආදායම රු.මිලියන 782.39 ක් විය.

මේ ආකාරයේ සැලසුම් සඳහා වර්තමාන වෙළඳපොල තත්ත්වයන් ආකර්ශනීය නොවන පසුබිමක් තුළ සාධකකරණ සැලසුම ප්‍රති අවදානම්ගත කොට මෙහෙයුම් පරිමාව පහත හෙළන ලදී. එමනිසා, අදාළ කළඹ නව ව්‍යාපාර පිරිනැමීමකින් තොරව අයකරගැනීම් ඔස්සේ පහත හෙළන ලදී. 2021/22 මූල්‍ය වර්ෂය තුළ, සාධකකරණ සැලසුම මගින් 57.05% ක පහත වැටීමක් සමගින් රු.මිලියන 136.54 ක පොලී ආදායමක් උපයන ලදී.

දූඩි අයකරගැනීමේ ප්‍රයත්නයන්හ ප්‍රතිපලයක් වශයෙන් ණය හා කල්බදු කාණ්ඩයේ අක්‍රීය අත්තිකාරම් අනුපාතය 2021 මාර්තු මස වාර්තා වූ 9.22% ට සාපේක්ෂව 8.84% දක්වා පහත හෙළීමට හැකි විය.

### කල්බදු සහ ණය ලබාදීම




### කල්බදු සහ ණය කළඹ




### පොලී ආදායම සහ කාණ්ඩ ප්‍රතිපල



# සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය

## තැන්පතු

**බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ වෙළඳපොළ ප්‍රමුඛයකු වශයෙන්, අපගේ සවිමත් වූ සන්නාම ප්‍රතිරූපය කරණ කොට ගෙන වසර තුළදී අපගේ තැන්පතු පදනම අඛණ්ඩවම වර්ධනය විය. වසර තුළදී තිරස් අලෙවිය කෙරෙහි අවධානය යොමු කරමින් තැන්පතු පදනම වර්ධනය කරගැනීමෙහිලා අපගේ සිල්ලර ගනුදෙනුකාර පදනම ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.**

**2021/22 කාර්යසාධන විශේෂතා**

තැන්පතු පදනම
රු. මිලියන 103,367.90
(2020/21 - රු. මිලියන 101,502.93)

තැන්පතු වර්ධනය/(පහත වැටීම)
1.84%
(2020/21 - (4.87%)




| වටිනාකම් නිර්මාණය | |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | • 2.31% ක ස්ථාවර තැන්පතු වර්ධනය |
| මානව ප්‍රාග්ධනය | • සැලසුම් පිළිබඳ දැනුම හා මෘදු කුසලතා සම්බන්ධයෙන් සේවකයින් වෙත අඛණ්ඩ පුහුණුව<br>• සේවය අතරතුර පුහුණුව<br>• රැකියා විවර්ධනය/රැකියා සුපෝෂණය |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | • දුරස්ථ ගනුදෙනු කෙරෙහි පහසුකම් සැලසීම සඳහා ඩිජිටල් පදනම වෙත ආයෝජන |
| සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | • ඩිජිටල් සේවා සැපයුම ඔස්සේ ඉහළ නංවන ලද ගනුදෙනුකාර පහසුව (PLC touch, PLC online) |
| බුද්ධිමය ප්‍රාග්ධනය | • ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රියකරණය ඔස්සේ ක්‍රියාවලි වර්ධනයන් කිහිපයක් හඳුන්වාදෙන ලදී |
| ස්වභාවික ප්‍රාග්ධනය | • ඩිජිටල්කරණ හා තිරසාර ප්‍රයත්නයන් හේතුවෙන් කඩදාසි භාවිතය පහත හෙළන ලදී |

**ඉදිරි දැක්ම**

අපගේ අවධානය තවදුරටත් තැන්පතු වර්ධනය සහ ණය වර්ධනය අනුකූලනය කෙරෙහි යොමු වේ. වෙළඳපොළ තුළ පොලී අනුපාතයන් ශීඝ්‍රයෙන් ඉහළ යන පසුබිමක් තුළ, ඉතුරුම් වර්ධනය සිදුකරමින් ශ්‍රී ලාංකිකයින් අතර ඉතුරුම් පුරුදු ප්‍රවර්ධනය කරන අතරතුර අපගේ සිල්ලර ගනුදෙනුකාර පදනම ඉහළනැංවීම මගින් අප විසින් තවදුරටත් අඩු පිරිවැය අරමුදල් පදනමක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

## 2021/22 වර්ධනයන්

ආවර්තිත රට වසාදැමීම් සහ සංචරන සීමාවන් හේතුවෙන් අඛණ්ඩවම මෙහෙයුම් වෙත බලපෑමක් ඇති වන පසුබිමක් හමුවේ, අප විසින් අවම බාධාකාරී තත්ත්වයන් යටතේ ගනුදෙනුකරුවන් වෙත දිගින් දිගටම සේවා ලබාදීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. අපගේ සාමාන්‍ය සේවාවන් බාධාවකින් තොරව සිදුකිරීමේ අවස්ථාව උදා කරන ලද නිවසේ සිට වැඩ කිරීමේ ඩිජිටල් පදනම වෙත පරිවර්තනය වීමට අමතරව, අප විසින් ගනුදෙනුකාර පහසුව ඉහළ නැංවීම උදෙසා අපගේ ඩිජිටල් සේවා සැපයුමද වැඩිදියුණු කරන ලදී. වසර තුළදී අප විසින් PLC touch, PLC online වැනි ඩිජිටල් සේවා පදනම් ඔස්සේ දුරස්ථ ගනුදෙනු සඳහා පහසුකම් සලසමින් ගනුදෙනුකරුවන් වෙත සහාය වීම සඳහා ඊ මේල් ඔස්සේ සිදුකරන ලද ගනුදෙනු ඉල්ලීම්ද සපුරාලන ලදී.

කාර්යක්ෂමතා මට්ටම් සහ සමස්ත ගනුදෙනුකාර පහසු මට්ටම් ඉහළ නැංවීම සඳහා ක්‍රියාවලි වර්ධනයක් කිහිපයක්ද සිදුකරන ලදී. එලෙස හඳුන්වාදෙන ලද ප්‍රධාන පෙළේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් පහත දක්වේ. ක්‍රියාවලි අනුකූලනය සඳහා දරන ලද මෙකී ප්‍රයත්නයන් හේතුවෙන් පිරිවැය හා කාලය ඉතිරිවීම පමණක් නොව අපගේ කඩදාසි රහිත සේවා ස්ථානයක් බිහිකිරීමේ උත්සාහයටද දායකත්වයක් හිමි විය.

| ගනුදෙනුකාර පහසුව ඉහළ නැංවීම |
|---|
| PLC Online |
| PLC Touch |
| අවහිරතා වලින් තොර අරමුදල් මාරුකිරීම් |
| මුදල් තැන්පතු යන්ත්‍ර ඔස්සේ ස්වයං ඊ කෑෂ් සේවාවන් |
| QR පහසුකම් |
| භෞතික හමුවීම් වලින් තොර ගනුදෙනු |

**ගනුදෙනුකරුවන් වෙත වටිනාකම් වපසරිය වර්ධනය කරන ලද වසර තුළ සිදු කරන ලද ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්**

- ස්ථාවර තැන්පතු සහතික නිකුත් කිරීමේ කාලය අවම කිරීම සඳහා නව ස්කෑනින් ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම
- ගනුදෙනුකරුවන් හට අයදුම්පත් පිරවීමේ කාලය අවම කිරීම සඳහා ගනුදෙනුකාර තොරතුරු ඩිජිටල්කරණය
- කාලය ඉතිරි කරගැනීම සඳහා මුද්‍රිත නාමයෝජිත තහවුරු කිරීමේ ලිපි
- ගනුදෙනුකරුවන් වෙත ස්වයංක්‍රීය නැවත අලුත් කිරීමේ උපදෙස්
- අනවශ්‍ය කඩදාසි අපතේ යාම වළක්වාගැනීම සඳහා ඊ මෙමෝ ක්‍රමය හඳුන්වාදීම
- ස්ථාවර තැන්පතු හා ඉතුරුම් සඳහා ඉලෙක්ට්‍රොනික රෙජිස්ටර් පවත්වාගෙන යාම
- කඩදාසි භාවිතය සීමා කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික අත්සන් ක්‍රමය හඳුන්වාදීම

වසරේ ප්‍රමුඛ අවධානය යොමුවූයේ අපගේ පවතින ශාඛා ජාලය ඔස්සේ සිල්ලර ගනුදෙනුකාර පදනම ඉහළ නංවා ගැනීම කෙරෙහිය. මෙලෙසින් බලන කල, අපගේ ඉතුරුම් හා තෝරාගත් තැන්පතු සැලසුම් සහ ඩිජිටල් සේවා සපයුම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ප්‍රවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් දියත් කරන ලදී. මේ අතර අපගේ ණය ලබාගැනීමේ ගනුදෙනුකරුවන් අතර ඉතුරුම් සැලසුම් ප්‍රවර්ධනය කරමින් තිරස් අලෙවිය කෙරෙහිද අපගේ අඛණ්ඩ අවධානය යොමු විය. මෙකී වැඩසටහන් වෙත සහාය දක්වනු වස් සැලසුම් පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම උදෙසා සියලු ශාඛා සේවකයින් වෙත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

## කාර්යසාධනය

සමාගම සඳහා අඩු පිරිවැය තිරසාර අරමුදල් පදනමක් සුරක්ෂිත කෙරෙන බැවින් අප විසින් අඛණ්ඩවම වසර තුළදී තැන්පතු වර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. අපගේ තැන්පතු පදනම වර්ධනය කිරීමෙහිලා දරන ලද අනවරත ප්‍රයත්නයෙහි ප්‍රතිපලයක් වශයෙන් මෙම වසරේදී අපේක්ෂිත වර්ධනය අත්පත් කරගන්නා ලදී. පොදු ජනතාව විසින් අප කෙරෙහි තබන ලද විශ්වාසය මෙයින් මනාව සනාථ වේ. අපගේ කීර්තිනාමය පිළිබඳ ප්‍රතිරූපය සහ සවිමත් සිල්ලර නියෝජනය මගින් අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන් හමුවේ වුවද තැන්පතු ආකර්ශනය කරගැනීමේ අවස්ථාව අප වෙත උදා විය. කෙසේවුවද' වෙළඳපොළේ දිගු කාලීන ආදායම් හේතුවෙන් මාස 12 ට අඩු කල්පිරීම් සම්බන්ධයෙන් තැන්පතු පදනම තවදුරටත් අස්ථාවර තත්ත්වයක් පවතී.

### තැන්පතු පදනම




### 2021/22 කල්පිරීම මත පදනම් වූ තැන්පතු




< මාස 3 | වසර 1 - 3
මාස 3 සිට වසර 1 | වසර 3 - 5

### 2020/21 කල්පිරීම මත පදනම් වූ තැන්පතු




< මාස 3 | වසර 1 - 3
මාස 3 සිට වසර 1 | වසර 3 - 5



*පීපල්ස් ලීසිං මගින් හඳුන්වාදෙන ලද නව මූල්‍ය සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා - පැහැබර අනාගතයක නිවැරදි තේරීම - යන තේමාවෙන් යුතු දීප ව්‍යාප්ත ප්‍රචාරණ ව්‍යාපෘතිය දියත් කරන ලදී*

# සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය

## ඉස්ලාමීය මූල්‍ය

**ඉස්ලාමීය මූල්‍ය ඒකකය, අල් සෆා ( AIF ඒකකය) 2005 ඔක්තෝබර් මස මෙහෙයුම් අරඹන ලද අතර, මේ වන විට ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉස්ලාමීය මූල්‍ය සේවා සම්පාදයකු බවට පත්ව ඇත. අපගේ සැලසුම් කළඹ සමානාත්මතාවය සහ සාධාරණත්වය මුල්කොට ගත් ශරියා මූලධර්ම වලට අනුව සකසා ඇති අතර අපගේ ගනුදෙනුකාර පදනම සමාගම්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, අධික පුද්ගල ධනයක් සහිත වූවන් සහ රටේ විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන් නියෝජනය කරන්නා වූ වෘත්තිකයින්ගෙන් සමන්විත වේ.**

### 2021/22 කාර්යසාධන විශේෂතා

**මූල්‍යකරණ ආදායම**
රු. මිලියන 1,035.74
(2020/21 - රු.මිලියන 1,180.18)

**කාණ්ඩ ප්‍රතිපල**
රු. මිලියන 353.38
(2020/21 - රු.මිලියන 338.49)

**කාණ්ඩ වත්කම්**
රු. මිලියන 8,524.80
(2020/21 - රු.මිලියන 5,156.38)

**අක්‍රීය වත්කම්**
7.64%
(2020/21 - 9.07%)




### වටිනාකම් නිර්මාණය

| | |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | • රු. මිලියන 353.38 ක කාණ්ඩයේ ප්‍රතිපලයක් |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | • අප විසින් සිදුකරන ලද ක්‍රමවේදී වැඩිදියුණු කිරීම් වල ප්‍රතිපලයක් වශයෙන් මුදාරබා ස්ථාවර තැන්පතු හා ඉතුරුම් වෙත ඉහළම ලාභ පිරිනමන ලදී |
| සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | • ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ සහ ගනුකරුවන් වෙත ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා අවස්ථාවක් පවතින ශාඛාවන් හඳුනාගනිමින් විශේෂිත ශාඛාවන් සවිබලගන්වන ලදී.<br>• ණය පහසුකම් 1,250 ක් සඳහා පමාසහන පිරිනමන ලදී. |
| මානව ප්‍රාග්ධනය | • පමාසහන දීර්ඝ කිරීම |

### ඉදිරි දැක්ම

- නව සැලසුම් සැකසීම (වාඩියාහ් - රන් ණය සැලසුම/පහළ යන මුෂාරකා/පීඑල්සී ආයෝජන සැලසුම සහ වකාලා ආයෝජන සැලසුමද හඳුන්වාදෙන ලදී.
- ප්‍රමුඛ ව්‍යාපාරික අවස්ථාවන් උදෙසා ඉස්ලාමීය මූල්‍ය ඒකකයන් ප්‍රතිස්ථාපනය කරන ලදී.
- ව්‍යාපාර මෙහෙයුම් පරිශ්‍රයන් ව්‍යාප්ත කරමින් ඉලක්ක සපුරාගැනීම උදෙසා අවශ්‍ය පහසුකම් පිරිනමන ලදී.
- නව පාර්ක්ලන්ඩ් ශාඛාව ඒකාබද්ධ ආයතනික මධ්‍යස්ථානයක් බවට පත් කරන ලදී.
- ඉස්ලාමීය මූල්‍ය සේවාවන් ව්‍යාප්ත කරනු වස්, අනාගත අවස්ථා සහිත පීපල්ස් ලීසිං ශාඛාවන්හි අලෙවි නිලධාරීන් ස්ථානගත කෙරෙනු ඇත.

## 2021/22 වර්ධනයන්

විවිධ වූ මෙහෙයුම් අභියෝගයන්ගත් පිරි වරසක් මධ්‍යයේ වුවද, පීපල්ස් ලීසිං හි සාමාන්‍ය ශාඛා ජාලය හා ඉස්ලාමීය මූල්‍ය සේවාවන් සඳහා විශේෂිත වූ ශාඛාවන් හත ඔස්සේ විශාල වශයෙන් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගෙන් සමන්විත වූ සිය ගනුදෙනුකරුවන් වෙත අඛණ්ඩ සේවාවක් ලබාදීමට AIF ඒකකය සමත් විය. මේ අතර, පාර්ක්ලන්ඩ් ශාඛාව නව සංකල්පීය අවධානයකින් යුතුව සංවර්ධනය කරමින් ගනුදෙනුකරුවන්ගේ කඩිනම් අවශ්‍යතා සපුරාලීම සඳහා හොට් සීට් සංකල්පය අනුව මෙහෙයවන ලදී.

වසර තුළදී, AIF ඒකකය මගින් වසංගතයේ 1 වැනි සහ 2 වැනි රැළි වලදී සිය ගනුදෙනුකරුවන් වෙත ශ්‍රී ලංකා මහ බැංකු පමාසහන පහසුකම් ලබාදෙන ලද අතර, වෛරසයේ අඛණ්ඩ පැවැත්ම හේතුවෙන් බොහෝ ගනුදෙනුකරුවන් තවමත් දුෂ්කරතා වලට මුහුණ දෙමින්න සිටිති. සැළකිය යුතු වර්ධන ප්‍රවණතාවක් සහිත රන් සුරකුම් සැලසුමක් වන පීඑල්සී වාඩියාහ්, සකසනු ලැබ ශරීයා අධීක්ෂණ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කෙටි කාලීනව අපගේ ගෞරවනීය ගනුදෙනුකරුවන් වෙත මෙම සැලසුම පිරිනැමීම අපගේ අපේක්ෂාව වේ.

**ක්‍රමවේද වැඩිදියුණු කිරීම්**

- මුෂාරකා සහ මුදාරබා සැලසුම් ආශ්‍රිත භෞතික ලේඛණ මුද්‍රණය විධිමත් කරන ලදී.
- ලේඛණ භෞතික වශයෙන් සංරක්ෂණය

**ප්‍රධාන අල් සෆා ශාඛාව ප්‍රතිස්ථාපනය**

- වසර තුළදී යූනියන් පෙදෙසේ පිහිටි ප්‍රධාන ශාඛාව පාක් වීදිය වෙත රැගෙන යන ලදී. නවීන තාක්ෂණය සමගින් නව ශාඛාව ගනුදෙනුකරුවන් වෙත සේවා සපයයි.

**ප්‍රවර්ධන ව්‍යාපෘතීන්**

- ඩිජිටල් අලෙවි ව්‍යාපෘති සහ ප්‍රවර්ධනයන්
- ඉජාරා කල්බදු ත්‍රීරෝද රථ ව්‍යාපෘතීන්
- QR ව්‍යාපෘති හා ප්‍රවර්ධනයන්
- ඉතුරුම් ව්‍යාපෘති හා ප්‍රවර්ධනයන්

## අපගේ කාර්යසාධනය

රු. මිලියන 353.38 ක් දක්වා වූ 4.40% ක ලාභ වර්ධනයක් සමගින් AIF ඒකකය මගින් වසර තුළදී ප්‍රශංසනීය කාර්යසාධනයක් අත්කර ගන්නා ලදී. මූල්‍යකරණ ආදායම පහළයාම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව දළ ආදායම 11.14% ක පහළ යාමක් වාර්තා කලේය.

ණය පහසුකම් වලින් මූල්‍යකරණ ආදායමට සාපේක්ෂව මූල්‍යකරණ වියදම් ඉහළ අනුපාතයකින් පහළගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් පෙර වසරේ වාර්තා වූ රු. මිලියන 583.71 ට සාපේක්ෂව ශුද්ධ මූල්‍යරණ වියදම් රු. මිලියන 589.77 ක් වශයෙන් දක්වුනි. වසර තුළදී ඉහළ නංවන ලද අයකරගැනීම් හේතුවෙන්, රු. මිලියන 23.07 ක ණය අලාභ අපහානය ප්‍රතිවර්තනයක් සිදුවූ අතර, එය ඉස්ලාමීය මූල්‍ය අංශයේ ලාභ වර්ධනය කෙරෙහි දායක විය.

අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාවක් හමුවේ වුවද, ඒකකය මගින් 15.09% ක කළඹ වර්ධනයක් සමගින් රු. මිලියන 5,366.27 ක වටිනාකමකින් යුතු නව ව්‍යාපාර කටයුතු උත්පාදනය කරන ලදී. අයකරගැනීම් නිසි කලට සිදුකිරීමේ අපගේ අවධානය නිසාවෙන් අක්‍රීය වත්කම් අනුපාතය 7.64% කට සීමා කරගැනීමට හැකි විය.



## මූල්‍යකරණ ආදායම සහ ආංශික ප්‍රතිපල




## කළඹ සහ අක්‍රීය වත්කම් අනුපාතය




## නව ණය ලබාදීම්



## රක්ෂණ

**අපගේ පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී පූර්ණ සාමාන්‍ය රක්ෂණ සේවා සම්පාදන සමාගමකි. සමාගම මගින් මෝටර්,ගිනි සහ ඉංජිනේරුමය, නාවික හා විවිධ රක්ෂණ සැලසුම් පුද්ගල හා ආයතනික සේවාලාභීන් වෙත පිරිනමනු ලැබේ. වසර ගණනාවක් තිස්සේ, සමාගම මගින් සිය සවිමත් සන්නාමය, සුවිශේෂී බෙදාහැරීමේ ක්‍රමෝපාය සහ අඩු වියදම් සේවා සම්පාදන ආකෘතිය උපයෝගී කරගනිමින් තමන් විසින් ඉහළ මට්ටමේ ප්‍රතිරූපයක් ගොඩනංවා ගන්නා ලද අතර, එය මෙරට වඩාත්ම ලාභ ලබන සාමාන්‍ය රක්ෂණ සමාගමක් බවටද පත් විය.**

### 2021/22 කාර්යසාධන විශේෂතා

**ශුද්ධ ඉපැයුම් වාරික**
රු. මිලියන 5,123.00
(2020/21 - රු. මිලියන 5,198.69)

**කාණ්ඩ ප්‍රතිපල/බදු පෙර ලාභය**
රු. මිලියන 995.84
(2020/21 - රු. මිලියන 1,507.22)

**කාණ්ඩ වත්කම්**
රු. මිලියන 12,102.54
(2020/21 - රු. මිලියන 11,133.86)

**කාණ්ඩ වගකීම්**
රු. මිලියන 7,353.49
(2020/21 - රු. මිලියන 6,266.78)

**හිමිකම්පෑම් අනුපාතය**
58.50%
(2020/21 - 50.91)




### වටිනාකම් නිර්මාණය

| | |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | • වසර තුළදී කාණ්ඩ ප්‍රතිපල රු. මිලියන 995.84 ක් වූ අතර මව් සමාගම වෙත ලාභාංශ බෙදාහැරීම රු. මිලියන 675 ක් විය. |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | • ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය සමගින් ක්‍රියාවලි සංවර්ධනය. |
| සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | • ගනුදෙනුකාර කේන්ද්‍රීය සේවා වටපිටාවක් නිර්මාණය කිරීම ඔසසේ සේවා විශිෂ්ටත්වය අත්පත් කරගැනීමකෙරෙහි අවධානය යොමු කරන ලදී. |
| මානව ප්‍රාග්ධනය | • සූර්ය කෝෂ වෙත රක්ෂණාවරන ලබාදෙමින් කඩදාසි රහිත සේවා වටපිටාවක් හඳුන්වාදීම ඔස්සේ පාරිසරික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන ලදී. |

**ඉදිරි දැක්ම**

දේශීය ආර්ථිකය තුළ දුර්වල වෙමින් පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් ගනුදෙනුකරුවන්ගේ ක්‍රය ශක්තිය කෙරෙහි බලපායි. එමනිසා, පීපල්ස් ඉන්ෂුවරන්ස් මගින් අඩු වියදම් රක්ෂණ සැලසුම් කෙරෙහි අවධානය යොමු කෙරේ. තාක්ෂණික නිපුණතා සහ සේවාලාභී සබඳතා කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරමින් සේවක නිපුණතා වර්ධනය කරනු ලබන අතරතුර, සමාගම මගින් සේවාලාභීන් සඳහා වන වටිනාකම් වපසරිය ඉහළ නැංවීමෙහිලා සිය ඩිජිටල් ශක්‍යතාවයන් වර්ධනය කරගැනීමට අපේක්ෂා කෙරේ.

## 2021/22 වර්ධනයන්

වසංගතය හේතුවෙන් උද්ගත වූ අවිනිශ්චිත මෙහෙයුම් තත්ත්වයන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවූ ආර්ථික අවගමනය හමුවේ වුවද, වසර තුළදී රක්ෂණ අංශය නම්‍යශීලී ස්වභාවයක් විදහා දැක්වීය. මෙහිදී මෝටර් රථ ආනයන තහනම හේතුවෙන් මොටර් රක්ෂණ අංශය කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් ඇති වූ අතර, මෙරට ගිනි, නාවික සහ විවිධ යන සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය දළ ලිඛිත වාරිකය වර්ධනය වීම කෙරෙහි දායක විය. මේ අතර, පසුගිය වසරේ වැඩි කලක් පැවති අඩු පොලී අනුපාත වටපිටාව ආයෝජන ආදායම කෙරෙහි බලපෑම් ඇති කලේය.

**සාමාන්‍ය දළ ලිඛිත වාරිකයේ +4% වර්ධනයක්**

- මෝටර් රක්ෂණ -0.03%
- ගිනි රක්ෂණ +39%
- නාවික රක්ෂණ +37%

**හිමිකම්පෑම් වල වර්ධනය +14%**

- මෝටර් රක්ෂණ + 1%
- ගිනි රක්ෂණ +10%
- නාවික රක්ෂණ +108%

පීපල්ස් ඉන්ෂුවරන්ස් හි අපි, අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය උදෙසා පරිපූර්ණ ආරක්ෂණ ක්‍රියාමාර්ගන් ගනු ලබන අතරතුර, අපගේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සමත් වීමු. වසංගතය හමුවේ කිසියම් ආකාරයට දුරස්ථ සේවා සම්ප්‍රදායක් වෙත අනුගත වෙමින්, ඩිජිටල් මාධ්‍යයන් සවිමත් කිරීම සම්බන්ධ නිරන්තර අවධානය ඔස්සේ මෙම අංශයේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය කඩිනම් කිරීමට අපි කටයුතු කලෙමු.

වසර තුළදී, අප විසින් සියලුම අභ්‍යන්තර සංචාරකයින් හට අනිවාර්ය කෝවිඩ් 19 ආවරනය ලබාදෙමින් සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීමේ රජයේ ප්‍රයත්නය වෙත අපගේ සහාය හිමි විය. අපගේ අවධානය පවතින සැලසුම් කළඹ ඒකාබද්ධකරණය සහ ප්‍රතිසැකසුම කෙරෙහි යොමු වූ බැවින් සෙසු කිසිදු නව සැලසුමක් හඳුන්වාදීම සිදු නොකෙරිනි. අප විසින් සමාජ ජාල ව්‍යාපෘතීන් හා පුවත්පත් ඔස්සේ සන්නාම ස්කන්ධය සම්බන්ධයෙන් විශාල වශයෙන් ආයෝජන සිදුකරන ලදී. අපගේ සන්නාම දැනුවත් කිරීමේ ආයතනික තේමාව වන ආදරණීය සත්කාරය යන්න පදනම් කරගනිමින් බහුවිධ මාධ්‍ය වැනල භාවිත කරමින් සන්නාම දැනුවත්භාවය ගොඩනැංවීම සඳහා වැඩිදුර ආයෝජන සිදුකරන ලදී.

**2021/22 ප්‍රතිසැකසුම්ගත සැලසුම්**

- වෛද්‍යමය රක්ෂණය
- සූර්ය කෝෂ රක්ෂණය

සමාගම ගනුදෙනුකාර කේන්ද්‍රීය සේවා වටපිටාවක් නිර්මාණය කිරීම තුළින් විශිෂ්ටත්වය අත්පත් කරගැනීම සඳහා කටයුතු කරයි. වසර තුළදී, අප විසින් ගනුදෙනුකරුවන්ගේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාවලීන් සැකසීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෝටර් සැලසුම වෙත ඇතුළත් කරන ලද කෝල් ඇන්ඩ් ගෝ සේවාව අපගේ ගනුදෙනුකරුවන් වෙත ප්‍රමුඛ වටිනාකම් වපසරියක් ලෙස සැලකිය හැක.

## අපගේ කාර්යසාධනය

4% ක් වූ ක්ෂේත්‍රයේ දළ ලිඛිත වාරිකය හා සැසඳීමේදී, 2021 දී දළ ලිඛිත වාරිකය 0.7% ක සුලු පහළ යාමක් වාර්තා කලේය. දිගින් දිගටම පැවති මෝටර් රථ ආනයන තහනම සහ අමතර කොටස් වල මිළ ඉහළයාම මෝටර් රක්ෂණ අංශය වෙත අහිතකර බලපෑමක් එල්ල කලේය. මේ අතර, ගිනි, නාවික සහ විවිධ රක්ෂණ අංශයන් විසින් වර්ධන ගාමකය පවත්වාගෙන යන ලදී.

වසර තුළදී මෝටර් රක්ෂණ ක්ෂේත්‍රයේ දුර්වල කාර්යසාධනය හේතුවෙන්, පීපල්ස් ලීසිං වැනලයෙන් ආකර්ශිත ව්‍යාපාර කටයුතු වෙත අහිතකර බලපෑම් ඇති විය. කෙසේවුවද, ආකර්ශිත නොවන ව්‍යාපාර කටයුතු වල 5% ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා විය.

වසංගතයේ තර්ජනය යම්තාක් දුරකට පහවයාමත් සමග ඇති වූ ඉහළ සංචරණ ප්‍රවණතාව හේතුවෙන් වසර තුළදී හිමිකම්පෑම් වල 11% ක වර්ධනයක් වාර්තා විය. වසර තුළදී අපගේ හිමිකම්පෑම් අනුපාතය 58.50% ක් විය. වසර තුළ පැවති අසීරු මෙහෙයුම් තත්ත්වයන් හේතුවෙන් ආංශික ප්‍රතිපල වල 36.58% ක පහළ යාමක් සිදුවිය.

සමාගමෙහි වත්කම් පදනම ප්‍රධාන වශයෙන් ආයෝජන වලින් සැදුම්ලත් වේ. 2021 වැඩි කලක් පැවති අඩු පොලී අනුපාත කරණ කොට ගෙන පොලී ආදායමෙහි සුලු පහළ යාමක් වාර්තා විය.

### ශුද්ධ ඉපැයුම් වාරිකය




### ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම්




### ආංශික බදු පෙර ලාභය



# සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය

## විදේශීය මෙහෙයුම්

**බංග්ලාදේශයේ පිහිටි පරිපාලිතය වන ලංකන් එලායන්ස් ෆිනෑන්ස් සමාගම අපගේ කළාපීය වර්ධන අපේක්ෂාවන් පිළිබිඹු කරන්නා වූ පීපල්ස් ලීසිං හි ක්‍රමෝපායික මෙහෙයුමකි. ලංකන් එලායන්ස් ෆිනෑන්ස් සමාගම සුරක්ෂිත හා පහසු මුදල් කළමනාකරණය සඳහා නව තාක්ෂණයන් ඔස්සේ ගනුදෙනුකරුවන් වෙත භාවිතය පහසු මූල්‍ය සේවාවන් ලබාදීමට කටයුතු කරයි. ලංකන් එලායන්ස් ෆිනෑන්ස් සමාගම මගින්, අවිනිශ්චිත ආර්ථික වටපිටාවක් තුළ වුවද අරමුදල් මත පදනම් වූ සහ ගාස්තු මත පදනම් වූ ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා සිය සේවාවන් ව්‍යාප්ත කරන ලදී.**

### 2021/22 කාර්යසාධන විශේෂතා

ශුද්ධ පොලී ආදායම
රු. මිලියන 428.25
(2020/21 - රු.මිලියන 366.42)

ආංශික ප්‍රතිපල/බදු පෙර ආදායම
රු. මිලියන 190.30
(2020/21 - රු.මිලියන 222.60)

ආංශික වත්කම්
රු. මිලියන 14,544.08
(2020/21 - රු. මිලියන 6,327.94)

ආංශික වගකීම්
රු. මිලියන 10,088.01
(2020/21 - රු. මිලියන 3,420.76)




| වටිනාකම් නිර්මාණය | |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | • තැන්පතු, ණය සහ අත්තිකාරම් වල කැපී පෙනෙන වර්ධනයක්. |
| සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | • රෙගුලාසි සහ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් වලට අනුකූලවීම මගින් නියාමකයින් සමග මනා සබඳතාවයක් පවත්වාගෙන යන ලදී. |
| ස්වභාවික ප්‍රාග්ධනය | • ආයෝජන ප්‍රවර්ධන මූල්‍යකරණ පහසුකම 11 (IPFF II) හි සහභාගීත්ව මූල්‍ය සමාගම බවට පත් විය. |

**ඉදිරි දැක්ම**

- හඳුන්වාදීමට නියමිත් ඩිජිටල් ණය සැලසුම
- කර්මාන්ත පුරවරය අසළ උත්තර හි නව ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ශාඛාව මගින් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපාරයන් වෙත අරමුදල් සම්පාදනය කිරීමට අපේක්ෂිතය.
- 2022 අවසානය වන විට ණය සහ ආයෝජන ශේෂය බිලියන BDT 6.2 කරා ළඟා වීම.
- පළමු වරට මිලියන BDT 500 ක සම්පූර්ණයෙන් මුදල් බවට හරවා ගත හැකි ශූන්‍ය කූපන් බැඳුම්කරයක් නිකුත් කිරීම.
- තැරැව්කාර ව්‍යාපාරය වෙත පිවිසීම සඳහා පාවෙන පරිපාලිතයක් වශයෙන් කටයුතු කිරීම.

## මෙහෙයුම් වටපිටාව

කෝවිඩ් 19 වසංගත රැළි මධ්‍යයේ වුවද, නිසි ප්‍රතිපත්තීන් සහ දීමනා පැකේජයන් ඔස්සේ යථා තත්ත්වයට පත්වීමේ අදියර වෙත ළඟාවීමට බංග්ලාදේශ ආර්ථිකය සමත් විය. බංග්ලාදේශය සවිමත් ආර්ථික වර්ධන වපසරියක් සහිත රටක් වන අතර 2020 වාර්තා වූ 3.45% ක වර්ධනයට සාපේක්ෂව 2021 දී 6.94% වර්ධනයක් අත්කර ගනිමින් දකුණු ආසියාවේ වඩාත් ශීඝ්‍රයෙන් වර්ධනය වන්නා වූ ආර්ථිකයන් අතරට එක් වීමට එරට සමත් විය. වසංගතය හමුවේ ආර්ථිකය වෙත ප්‍රතිපත්ති මාලාවක සහ විචක්ෂණශීලී පියවරයන්හි සහාය හිමි විය.

ක්‍රියාකාරී කොටස් වෙළඳපොල දෙකක් සහ ලැයිස්තුගත සමාගම් 700 ක් ඔස්සේ බංග්ලාදේශය නව තැන්පතු සහ ණය සැලසුම් හඳුන්වාදීම සඳහා අවස්ථා රැසක් සපයයි. මෙහිදී, සේවා උපදේශනය, දූවැන්ත ව්‍යාපෘති මූල්‍යකරණය, රාජ්‍ය පුද්ගලික සහයෝගීතා සහ හවුල්කාරීත්ව හා අත්පත් කරගැනීම් සම්බන්ධ අවස්ථා රැසක්ද පවතී.

## ලංකන් එලායන්ස් ෆිනෑන්ස් 2021/22 වර්ධනයන්

වෙළඳපොලේ විශාල තරගකරුවන් සමග තරගවැදීමට සූදානම් වන සාපේක්ෂව නව සමාගමක් වශයෙන්, සන්නාම ගොඩනැංවීම මූලික ප්‍රමුඛතාවයක් වේ. වසර තුළදී ලංකන් එලායන්ස් ෆිනෑන්ස් මගින් වෙනත් සමාගම් වෙතින් ස්වයං ලෙස වෙනස්වීමේ සිය ගමන්මග අනුව යමින්, ආයෝජන ප්‍රවර්ධන මූල්‍යකරණ පහසුකම 11 (IPFF II) හි සහභාගීත්ව මූල්‍ය සමාගම බවට පත් විය. IPFF II යනු, දේශීය මූල්‍යකරණ වරණයන්ට වඩා අඩුවෙන් දිගු කාලසීමාවන් සඳහා පහළ පිරිවැය මූල්‍යකරණ ව්‍යාපෘතීන් ඔස්සේ යටිතල පහසුකම් ව්‍යාපෘතීන් වෙත අරමුදල් සම්පාදනය කරමින් ගනුදෙනුකරුවන් වෙත සහාය දක්වන අතර, පෞද්ගලික අරමුදල් සම්පාදන ව්‍යාපෘතීන් මගින් උප ව්‍යාපෘතීන් වෙත අරමුදල් සම්පාදනය කරන්නා වූ, ලෝක බැංකු සහ බංග්ලාදේශ මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘතියකි.

### ප්‍රමුඛ සන්ධිස්ථාන

- වාර්තාකරණ කාලසීමාව තුළ සමාගමෙහි ශ්‍රේණිගත කිරීම A සිට A+ දක්වා අධිශ්‍රේණිගත කෙරිනි.
- රජය විසින් හඳුනාගන්නා ලද ප්‍රමුඛතා ව්‍යාපෘතීන් සඳහා පුද්ගලික ආයෝජකයින් යොදාගැනීම උදෙසා රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා අධිකාරිය සමග ගිවිසුමකට එළඹිනි.
- ආයෝජන ප්‍රවර්ධන මූල්‍යකරණ 11 පහසුකමෙහි (IPFF II) සහභාගීත්ව මූල්‍ය සමාගමක් බවට පත් විය. (IPFF II) යනු ලෝක බැංකුව සහ බංග්ලාදේශ මුදල් අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ව්‍යාපෘතියකි.
- අපගේ මෙහෙයුම් වල පසුගිය වසර 4 පුරා ශුන්‍ය අක්‍රීය ණය තත්ත්වයක් පැවතිනි.

කෝවිඩ් 19 වසංගතයෙහි ක්‍රමික යථා තත්ත්වයට පත්වීම සැලකිල්ලට ගනු ලබන කල, සහ පුද්ගලික අංශයේ ණය වර්ධනයේ උඩුකුරු ප්‍රවණතාවක් හමුවේ, අප විසින් අපගේ ප්‍රවේශම් සහගත වර්ධන ක්‍රමෝපාය ඔස්සේ වසර තුළදී අපගේම ණය පොත වර්ධනය කර ගැනිනි. අපගේ ණය පොල සම්බන්ධ ඉහළ නංවන ලද විදහා දැක්වීමක් සහ වර්ධනයක් අත්කර ගැනීම උදෙසා අප විසින් අපගේ ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කෙරේ.

අපගේ වඩාත් විශාල ගනුදෙනුකරුවන් සඳහා අප විසින් නව්‍ය හා දෙමුහුන් මූල්‍ය විසඳුම් ඔස්සේ ගාස්තු මත පදනම් වූ ඉපැයුම් කෙරෙහි අවධානය යොමු කෙරේ. බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයෙහි සෙසු සමාගම් සමග සසඳන කල අපගේ ගනුදෙනුකාර පදනම සුවිශේෂී වේ. සමාගම සතුව ස්ථර 1 සහ ස්ථර 2 කාණ්ඩයේ 60% ක ආයතනික ගනුදෙනුකරුවන් සහ සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කාණ්ඩය බෙහෙවින්ම 32% ක් (ඒ) ශ්‍රේණිගත ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වලින් සැදුම්ලත් වෙමින් සහ පිළිවෙලින් නිවාස ණය/මෝටර් ණය කාණ්ඩයන් පිළිවෙලින් 5% ක් සහ 3% නියෝජනය කරයි. අපගේ සේවක මණ්ඩලය සියලුම ගනුදෙනුකරුවන් සමග මිත්‍රශීලී සහ වෘත්තීයමය ආකාරයකින් කටයුතු කරන බවට අප විසින් තහවුරු කෙරේ. ලංකන් එලායන්ස් ෆිනෑන්ස් සමාගම සිය ව්‍යාපාර කටයුතු සිදුකිරීම සහ එහි ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වයේ ප්‍රතිරූපය සම්බන්ධයෙන් බැංකු සහ මූල්‍ය ආයතන අතර කීර්තියට පත්ව ඇත.

පුහුණුව හා සංවර්ධනයට අමතරව, අප විසින් අපගේ සේවකයින් වෙත පරිපූර්ණ වටිනාකම් වපසරියක් පිරිනමනු ලැබේ. සේවා ක්ෂේත්‍රයේ කටයුතු කරන බැවින් සේවා කුසලතාවය අතිශය වැදගත් තැනක් ගන්නා අතර, නිසි පුද්ගලයින් තෝරා ගෙන මනා පුහුණුවක් ලබාදෙන බවට අප විසින් තහවුරු කෙරේ.

## තිරසාරත්වය

තිරසාර මූල්‍ය සම්පාදනය කිරීමේ අපගේ ඉලක්කය සපුරා ගැනීමෙහිලා දරනු ලබන ප්‍රයත්නය තුළ අප හරිත මූල්‍යකරණ කටයුතු වෙත යොමු විය. මෙහිදී ක්ෂේත්‍රයෙන් පරිසරයට වන හානිය අවම කරමින් පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කිරීම කෙරෙහි සමාගම් දිරිමත් කරන ලදී. අප විසින් අපගේ මෙහෙයුම් වලින් පරිසරයට වන හානිය අවබෝධ කරගනිමින් විදුලිය, ජලය සහ කඩදාසි පරිහරණය අවම කිරීම සඳහා විවිධ ව්‍යාපෘතීන් දියත් කරන ලදී.

## කාර්යසාධනය

සමස්තයක් වශයෙන්, සමාගම වසර තුළදී, සැළකිය යුතු අභියෝග හමුවේ වුවද රු. මිලියන 190.30 ක ආංශික ප්‍රතිපලයක් සමගින් ප්‍රශංසනීය කාර්යසාධනයක් අත්කර ගැනීමට සමත් විය.

### පොලී ආදායම සහ කාණ්ඩ ප්‍රතිඵල




### ණය සහ අත්තිකාරම් කළඹ



## ක්ෂුද්‍ර මූල්‍ය

**අපගේ පරිපාලිතය වන පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගම, සිය අරමුදල් සම්පාදන අවශ්‍යතා සදහා සම්ප්‍රදායික බැංකු සේවාවන් ලබාගත නොහැකි නාගරික හා ග්‍රාමීය ප්‍රජාවන් වෙත මූල්‍ය සහාය සහ කුලී පිට ගැනුම් සේවාවන් සපයන්නා වූ මෙරට ප්‍රමුඛතම සමාගමකි.**

### 2021/22 කාර්යසාධන විශේෂතා

**පොලී ආදායම**
රු. මිලියන 793.17
(2020/21 - රු. මිලියන 818.52)

**ආංශික ප්‍රතිපල/බදු පෙර ලාභය**
රු. මිලියන 267.17
(2020/21 - රු. මිලියන 201.31)

**ආංශික වත්කම්**
රු. මිලියන 3,070.80
(2020/21 - රු. මිලියන 2,684.03)

**ආංශික වගකීම්**
රු. මිලියන 2,566.10
(2020/21 - රු. මිලියන 2,316.59)

**අක්‍රීය වත්කම්**
4.67%
(2020/21 - 5.54%)




| වටිනාකම් නිර්මාණය | |
|---|---|
| මූල්‍ය ප්‍රාග්ධනය | • රු. මිලියන 181.58 ක බදු පසු ලාභය |
| නිෂ්පාදිත ප්‍රාග්ධනය | • පීපල්ස් ලීසිං ශාඛා 32 ක් සහ කේවල ශාඛා 2 ක් සමගින් දීපව්‍යාප්ත නියෝජනය |
| සමාජ හා සබදතා ප්‍රාග්ධනය | • ගනුදෙනුකරුවන් සමග සවිමත් සබදතා ගොඩනංවා ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා අනුව සැලසුම් සැකසීම.<br>• ක්ෂුද්‍ර මූල්‍ය ණය සංකල්පය වඩාත් අවධානාත්මක සහ තිරසාර ආකාරයකින් ඉදිරියට ඇදී යයි. |
| ස්වභාවික ප්‍රාග්ධනය | • කඩදාසි භාවිතය අවම කිරීම |

**ඉදිරි දැක්ම**

දේශීය ආර්ථිකයේ අවිනිශ්චිතතා හේතුවෙන් වර්ධන අවස්ථාවන් සීමා වූ පසුබිමක වුව, දේශය යථා තත්ත්වයට පත් වනු ඇතැයි යන සුබවාදී මතය අපි දරන්නෙමු. මෙම අසීරු කාලසීමාව තුළ බිම් මට්ටමේ ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම දහා අපගේ ඩිජිටල්කරණ මෙහෙයුම් වර්ධනය කරමින් ඔවුන් වෙත සමීප වෙමින් අපගේ ගනුදෙනුකරුවන් වෙත වඩාත් ඵලදායී සේවාවක් ලබාදීම අපගේ අරමුණ වේ.

### 2021/22 වර්ධනයන්

පසුගිය වසරේ බලාත්මක කෙරෙනු මෝටර් රථ ආනයන තහනම අඛණ්ඩව ක්‍රියාත්මක වීමත් සමග, පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගම ප්‍රධාන ව්‍යාපාරික ධාරාවෙන් විතැන්ව ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි වෙළඳපොල වෙත පිවිසුනි. පසුගිය වසරේදී සිව් බල ත්‍රී රෝද රථ සහ විවිධ මෙවලම් හා උපකරණ සඳහා ණය පහසුකම් හඳුන්වාදෙමින්, අප විසින් වසර තුළදී ලියාපදිංචි යතුරුපැදි සඳහාද මෙම සේවාව ව්‍යාප්ත කරන ලදී. පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගම මගින් වසර තුළදී ලියාපදිංචි ත්‍රී රෝද රථ සහ යතුරුපැදි ආශ්‍රිතව ප්‍රශංසනීය කාර්යසාධනයක් වාර්තා කරන ලදී.

**හඳුන්වාදෙන ලද නව සැලසුම්**

- ලියාපදිංචි යතුරුපැදි
- ක්ෂුද්‍ර ණය

වසර ගණනාවක් තිස්සේ අප හට ගනුදෙනුකරුවන් සමග සවිමත් සබඳතා ගොඩනංවා ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව ඒවා සපුරාලීමට හැකි විය. වසර තුළදී අප විසින් නව ක්ෂුද්‍ර ණය සැලසුමක් හඳුන්වාදෙන ලද අතර ඒ යටතේ රු.මිලියන 15 ක පමණ ක්ෂුද්‍ර ණය පහසුකම් පිරිනමන ලදී.

පශ්චාත් වසංගත සමයේ පනවන ලද සමාජ දුරස්ථීකරණ පියවර හේතුවෙන් නිවසේ සිට වැඩ කිරීමේ සහ ඉලෙක්ට්‍රොනික අධ්‍යයන ක්‍රියාමාර්ග යන් සමගින්, ලැප්ටොප් පරිගනක සඳහා ඉහළ යන ඉල්ලුමක් අපගේ අවධානයට ලක් විය. මෙම අවස්ථාව හඳුනාගනිමින්, අප විසින් ක්ෂේත්‍රයේ ප්‍රධාන සැපයුම්කරුවන් තිදෙනෙකු සමග සහයෝගීතාවයෙන් යුතුව පසුගිය වසරේදී ලැප්ටොප් ණය සැලසුමක් හඳුන්වාදෙන ලදී. අප විසින් සුලු ව්‍යවසායකයින් වෙත කෘෂි උපකරණ සහ සෙසු මෙවලම් සඳහාද ණය ලබා දෙනු ලැබේ.

සමාජමය වගකීමක් සහිත සමාගමක් වශයෙන්, පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගම මගින්, අධිකාරීන් විසින් නියම නොකලද දිගු කාලීන වසංගතයේ බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් වෙත පමාසහන පිරිනමන ලදී. ඒ අනුව, කුලී පිට ගැනුම් ගනුදෙනුකරුවන් 2,358 ක් වෙත පමාසහන පිරිනැමුනි.

මෙකී තරගකාරී ක්ෂේත්‍රය තුළ අපගේ මූල්‍ය ශක්තිය සනාථ කරමින් අප විසින් කේවල ශාඛා දෙකක් ඇතුලුව පීපල්ස් ලීසිං ශාඛාවන් 32 ක් ඔස්සේ දිවයින පුරා මෙහෙයුම් සිදුකරනු ලැබේ. වසර තුළදී පාරිසරික තිරසාරත්වය උදෙසා දැන්වීම් ඇතුලු කඩදාසි ආශ්‍රිත ප්‍රවර්ධනයන් සීමා කෙරුනු අතර, අපගේ ගනුදෙනුකරුවන් අතර සැලසුම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා දොරින් දොර ප්‍රවර්ධනයන් සහ සමාජ මාධ්‍ය අලෙවි ව්‍යාපෘතීන් දියත් කෙරිණි.

### කාර්යසාධනය

රටේ පවතින අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාව මධ්‍යයේ වුවද, මෙම අංශය මගින් වසර 2021/22 සඳහා රු.මිලියන 267.17 ක ආංශික ප්‍රතිපලයක් වාර්තා කිරීමට සමත් විය. රු. මිලියන 2885.27 ක ශුද්ධ කුලී පිට ගැනුම් හා ණය කළඹ ඇතුලුව සමස්ත ආංශික වත්කම් රු.මිලියන 3,070.80 ක් වශයෙන් වාර්තා විය.

2021 වර්ෂයේ වැඩි කලක් පැවති පහළ පොලී අනුපාත වටපිටාව ලාභ තීරු කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කලේය. කෙසේවුවද, 2021 අගෝස්තු මස මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කිරීමත් සමග, අවසාන මාස කිහිපය තුළ ලාභ තීරු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරමින් ප්‍රතිපත්ති පොලී අනුපාතයන් විශාල වශයෙන් ඉහළ ගියේය.

වර්ධිත ලාභදායීත්වය අත්පත් කරගැනීම උදෙසා සමාගම මගින්, ක්‍රියාවලි සංවර්ධනය සහ අපතේ යාම් අවම කරගැනීම ඔස්සේ පිරිවැය අරපිරිමැසුම් බව සහ කාර්යසාධන ඉහළ නැංවීම් කෙරෙහි සමාගම මගින් අවධානාත්මක ප්‍රයත්නයක් දරන ලදී.

වසංගතය සමගින්, අපගේ අවධානය ණය ලබාදීම් වලින් අයකර ගැනීමේ කෙරෙහි යොමු විය. අප විසින් කේවල සහ ව්‍යාපාර ඒකකයන් වෙත සඵල අයකර ගැනීමේ ඉලක්කයක් සකසන ලද අතර එමගින් වසර අවසානයේදී අක්‍රීය වත්කම් අනුපාතය ක්ෂේත්‍රයේ අනුපාතයට බොහෝ පහළින් 4.66% ක් වශයෙන් පවත්වා ගැනීමට හැකි විය.

### පොලී ආදායම සහ ආංශික ප්‍රතිපල




### ණය සහ අත්තිකාරම්



# සමූහ ව්‍යාපාර ධාරා සමාලෝචනය

## වෙනත් ව්‍යාපාර කාණ්ඩයන්

**මෙම කොටස මගින් අපගේ පරිපාලිතයන් වන පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම සහ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගමෙහි මෙහෙයුම් ආවරනය කෙරේ. වසර තුළදී මෙකී සමාගම් මගින් පැවති ගාමක වෙනස්කම් වලට අනුගත වෙමින් සිය මෙහෙයුම් සිදුකරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් අවසානයේදී ආදායම් වර්ධනය කෙරෙහි දායක වූ වර්ධිත ආදායම් හා ද්‍රවශීලතාවන් අත්කර ගැනීමට හැකි විය.**

**පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම**
රථවාහන සමූහ කළමනාකරණය, රථවාහන තක්සේරුකරණය, රක්ෂණ තක්සේරු සහ රථවාහන අලුත්වැඩියාව

**පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම**
මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම

**පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම**
කාර්යාල සංකීර්ණයක් මෙහෙයවීම

### පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම

#### කාර්යසාධනය

සමාගම මගින් පසුගිය වසරේදී පවතින ව්‍යාපාරික අවස්ථාවන්ට ගැළපෙන පරිදි හා ද්‍රවශීලතාවය සහ ලාභදායීත්වය වර්ධනය කරගැනීම උදෙසා මෙහෙයුම් ප්‍රශස්තීකරණය සඳහා ක්‍රමෝපායික තීරණයකට එළඹෙන ලදී. 2021/22 දී මෝටර් රථ ආනයන තහනම අඛණ්ඩව පැවතීම හේතුවෙන්, ක්‍රමෝපායික සැලසුමක් ලෙස රථවාහන කුලියට දීමේ ව්‍යාපාර කටයුතු වලින් විතැන් වීමට සිදුවූ අතර ඒ තුලින් සැලකිය යුතු බැහැර කිරීමේ ලාභයක් ලගා කර ගත හැකි විය. මෙකී අසීරු මෙහෙයුම් තත්ත්වයන් මධ්‍යයේ වුවද, මෙම ක්‍රියාමාර්ගයන් මගින් සිය දාහතර අවුරුදු ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභය වන රු. මිලියන 152.37 වාර්තා කිරීමට සමාගම සමත් විය.

වසර තුළදී, අපගේ ක්‍රමෝපායික අවධානය රථවාහන තක්සේරුකරණ ව්‍යාපාරය කෙරෙහි යොමු විය. මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් ඉල්ලුම පහළයාම කරණ කොට ගෙන ආදායම 13.73% කින් පහත වැටිනි. කෙසේවුවද, රථවාහන අලෙවිය හේතුවෙන් වෙනත් ආදායම් 2020/21 දී වාර්තා වූ රු.මිලියන 52.72 ට සාපේක්ෂව 2021/22 දී රු.මිලියන 174.06 ක් දක්වා වර්ධනය විය. දැඩි මෙහෙයුම් පිරිවැය පාලනය හේතුවෙන් වසර තුළදී මෙහෙයුම් ලාභ වල 325.50% ක වර්ධනයක් අත්කර ගත හැකි විය. සමාගම මගින් 818.89% ක හිතකර මූල්‍ය ආදායම් සංචලනයක් සමගින් රු.මිලියන 200.28 ක බදු පෙර ලාභයක් වාර්තා කරන ලදී.

වසර තුළදී ව්‍යාපාරයේ ද්‍රවශීලතාවය සහ ස්ථාවරත්වය ඵලදායී අයුරින් කළමනාකරණය කරන ලදී. ප්‍රවර්තන අනුපාතය වාර ගණන 4.35 සිට වාර ගණන 8.13 දක්වා ඉහළ ගිය අතර ස්කන්ධයට ණය අනුපාතය වාර ගණන 10.84 සිට ශූන්‍ය තත්ත්වයක් කරා ළගා විය. වසර තුළදී ශුද්ධ වත්කම්ද රු.මිලියන 385.56 ක් දක්වා 15.59% ක වර්ධනයක් වාර්තා කලේය.

**වසර තුළ සිදුවූ වෙනත් වර්ධනයන්**

- සමාගම මගින් ගනුදෙනුකරුවන් වෙත උසස් තත්ත්වයේ, නිරවද්‍ය හා කඩිනම් සේවාවන් සැපයීම කෙරෙහි අවධානය යොමුකරන ලදී.
- ඉහත සේවාවන් ලබාදීමේදී ඇති වන බාධාකාරී තත්ත්වයන් හඳුනාගනිමින් අදාළ පරිදි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.
- උසස් මට්ටමේ ආචාරධර්ම වෙත අනුගත වෙමින් ක්ෂේත්‍රය තුළ සහජීවනය පවත්වාගන්නා ලදී.
- මව් සමාගමෙහි පාරිසරික ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කරන ලදී.
- පීඑල්සී අන්තර්ජාලගත ව්‍යාපාර පද්නම යොදා ගනිමින් සැකසුම් කාලය පහත හෙළන ලදී.

#### ඉදිරි දැක්ම

ආනයන සීමාවන් හේතුවෙන් රථවාහන මිළ අතිශය ඉහළ මට්ටමක පැවති අතර, එය සමාගම මගින් සිදුකරන ලද තක්සේරු වලින් පිළිබිඹු විය. කාර්යක්ෂමතාවන් ඉහළ නැංවීම සඳහා අදාළ මෙහෙයුම් අනුකූලනයන් සිදුකරනු ලබන අතරතුර අප විසින් අපගේ තක්සේරුකරණ ව්‍යාපාරය තවදුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කෙරේ.

**2021/22 කාර්යසාධන විශේෂතා**

**ආදායම**
රු. මිලියන 166.46
(2020/21 - රු. මිලියන 192.95)

**පොලී සහ බදු වලට පෙර ලාභය**
රු. මිලියන 203.22
(2020/21 - රු.මිලියන 57.92)

**බදු වලට පෙර ලාභය**
රු. මිලියන 200.28
(2020/21 - රු. මිලියන 56.08)

**බදු වලට පසු ලාභය**
රු. මිලියන 152.99
(2020/21 - රු. මිලියන 46.05)

**වත්කම්**
රු. මිලියන 444.79
(2020/21 - රු. මිලියන 443.77)

**වගකීම්**
රු. මිලියන 59.24
(2020/21 - රු. මිලියන 110.75)

**ස්කන්ධ මත ආදායම**
39.52%
(2020/21 - 13.82%)

** කාර්යසාධන විශේෂතා යටතේ දක්වන ලද ආදායම් අගයයන්හි බැහැර කිරීමේ ලාභය ඇතුළත් කොට නොමැති නමුත් සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්හි වෙනත් ආදායම් වශයෙන් හඳුනාගනු ලැබ ඇත.*

## පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම

පසුගිය වසරේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි ඇති වූ සංකෝචනය, නව වැඩ කිරීමේ ක්‍රම සහ සංචරන සීමා ලිහිල්වීමත් සමග වසර තුළදී යම් මට්ටමකින් යථා තත්ත්වයට පත් විය. කෙසේවවද, ක්ෂේත්‍රය වෙත එල්ල වූ අඛණ්ඩ අභියෝගයන් හමුවේ ලාභ තීරු පීඩාවට පත් විය.

### කාර්යසාධනය

වසර තුළදී, 2021 අග භාගය වන විට විශාල වශයෙන් පොලී අනුපාත ඉහළයාම හමුවේ ණය ලබාගැනීමේ මට්ටම පහත හෙළමින් සමාගම සිය මූල්‍යමය කාර්යසාධනය ඉහළ නංවා ගැනීම කෙරෙහි අවධානය යොමු කලේය. පසුගිය වසරේ වාර්තා වූ රු. මිලියන 50 ට සාපේක්ෂව ආයෝජන දේපළ මත සාධාරණ අගය රු. මිලියන 150 දක්වා ඉහළ නැංවුනි.

සමාගම මගින් වසර තුළදී රු. මිලියන 240.76 ක බදු පසු ලාභයක් වාර්තා කරන ලද අතර එය පසුගිය වසරට සාපේක්ෂව 31.93% ක ඉහළයාමකි. වසර තුළදී සමස්ත වත්කම්ද රු. මිලියන 141 ක ඉහළයාමක් සමගින් රු.මිලියන 2,738.09 කරා ළඟා විය. පසුගිය වසරේ වාර්තා වූ 0.38 ක වාර ගණනට සාපේක්ෂව ස්කන්ධයට ණය අනුපාතය 0.32 වාර ගණනක් වශයෙන් දක්වුනු අතර, මූල්‍ය වර්ෂය අවසානයේදී ප්‍රවර්තන අනුපාතය 3.01 වාර ගණනක සිට 1.38 ක වාර ගණනක් දක්වා අවප්‍රමාණය විය.

මව් සමාගමෙහි ජෛවවිවිධත්ව සහ පාරිසරික ප්‍රතිපත්තියට සමගාමීව සමාගම මගින් බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කිරීමෙහිලා කටයුතු යොදන ලදී

### ඉදිරි දැක්ම

ආනයන සඳහා අරමුදල් සම්පාදනය කිරීමට විදේශ විනිමය නොමැති වීම හේතුවෙන් ඇති වූ අමුද්‍රව්‍ය හිගය මෙන්ම ඉහළ යන පොලී පිරිවැයද ඉදිරි ගමන තුළ ප්‍රධාන ගැටලුවක් වේ. ජනතාවගේ ක්‍රය ශක්තිය පහළ යාම මගින්ද සැළකිය යුතු අයුරින් වර්ධන අවස්ථා අවුරා දමන ලදී.

**2021/22 කාර්යසාධන විශේෂතා**

| | |
|---|---|
| ආදායම | රු. මිලියන 278.14 (2020/21 - රු. මිලියන 282.26) |
| බදු පෙර ලාභය | රු.මිලියන 304.28 (2020/21 - රු. මිලියන 218.03) |
| බදු පසු ලාභය | රු. මිලියන 240.76 (2020/21 - රු. මිලියන 182.50) |
| වත්කම් | රු. මිලියන 2,738.09 (2020/21 - රු. මිලියන 2,596.64) |
| ස්කන්ධ මත ආදායම | 13.38% (2020/21 - 10.95%) |

** කාර්යසාධන විශේෂතා අතරට ආයෝජන දේපල වල සාධාරණ අගය ඇතුළත් වන අතර සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්හි එය බැහැර කරන ලදී.*

## පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම

සමාගම මගින් වසර තුළදී රු.මිලියන 102.22 ක බදු පසු ලාභයක් වාර්තා කරන ලද අතර එය පසුගිය වසර සාපේක්ෂව 26.41% ක ඉහළයාමකි. පසුගිය වසර හා සැසඳීමේදී සමාගමෙහි ආදායමද වර්ධනය වූ අතර, ඒ සඳහා අයකරන ලද කුලී ඉහළ දැමීම සහ නිල උත්සව සඳහා හිස්ව පැවති පියස මහල කුලී පදනම මත ලබාදීම සඳහා අප විසින් ගනු ලැබූ තීරණයද දායක විය. මේ සඳහා වෙළඳපොලේ යහපත් ප්‍රතිචාරයක් හිමි වූ අතර එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් ලාභදායීත්වය වර්ධනය විය.

අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සඳහා වැය වන කාලය අවම කරමින් ගනුදෙනුකාර තෘප්තිමත්භාවය වර්ධනය කිරීම සඳහා ද පියවර ගන්නා ලදී. වගකීම් සහගත සමාගමක් වශයෙන්, අප විසින් සමූහයේ ජෛවවිවිධත්ව සහ පාරිසරික ප්‍රතිපත්තියට සමගාමීව බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කිරීමෙහිලා කටයුතු යොදන ලදී

### ඉදිරි දැක්ම

දේශීය ආර්ථික වටපිටාවෙහි අස්ථාවරත්ව සියලුම ව්‍යාපාරයන් කෙරෙහි බලපෑම් ඇති කලේය. කෙසේවුවද, අප තවමත් සුබවාදී ආකල්පයක පසුවන අතර ප්‍රමාණවත් ආකාරයෙන් වෙළඳපොල වර්ධනය වූ කල නව කුලීවැසියන් දිරිගන්වනු ලැබේ. අවිනිශ්චිත වෙළඳපොල පොලී අනුපාතයක් වෙත අපගේ නිරාවරණය පහත හෙළීම උදෙසා අප විසින් ක්‍රමිකව අපගේ ණය ලබාගැනීම් පහත දැමීමට කටයුතු කරන ලදී.

**2021/22 කාර්යසාධන විශේෂතා**

| | |
|---|---|
| ආදායම | රු. මිලියන 218.50 (2020/21 - රු. මිලියන 205.38) |
| පොලී සහ බදු පෙර ලාභය | රු. මිලියන 199.04 (2020/21 - රු. මිලියන 189.84) |
| බදු පෙර ලාභය | රු. මිලියන 102.22 (2020/21 - රු. මිලියන 80.87) |
| බදු පසු ලාභය | රු. මිලියන 102.22 (2020/21 - රු. මිලියන 80.87) |
| වත්කම් | රු. මිලියන 2,655.37 (2020/21 - රු. මිලියන 2,659.96) |
| ස්කන්ධ මත ආදායම | 9.13% (2020/21 - 7.82%) |

** කාර්යසාධන විශේෂතා අතරට ආයෝජන දේපල වල සාධාරණ අගය ඇතුළත් වන අතර සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්හි එය බැහැර කරන ලදී.*



# මූල්‍ය ප්‍රාග්ධනය

**ස්වකීය ස්වයංපාලිත වර්ධනය සහ පොලී අනුපාත අවදානම හා ණය අවදානම කළමනාකරණයේ හැකියාව විදහා දක්වමින්, පීපල්ස් ලීසිං අවිනිශ්චිතතාවයෙන් පිරි වසරක් පසු කලේ රු. මිලියන 4,659.01 ක් වූ ඉහළම බදු වලට පසු ලාභය වාර්තා කරමිනි. පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගමේ ශුද්ධ ඉපැයුම් වාරික සුලු වශයෙන් පහළ යෑමත් සහ හිමිකම්පෑම් වාර්තා ඉහළ යෑමේත් හේතුවෙන් සමූහයේ බදු වලට පසු ලාභය රු. මිලියන 4,818.17 දක්වා 13.90% කින් පහත වැටිනි. මෙම ප්‍රතිඵල අත්කර ගනු ලැබූයේ ගනුදෙනුකරුවන්ගේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරගැනීමෙහිලා රු. මිලියන 1,268.79 ක පැහැර හරින ලද පොලියක් කපා හැරීමෙන් අනතුරුව වීම විශේෂත්වයකි.**

2021/22 මූල්‍ය ප්‍රාග්ධනය හැසිරවීම




තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය



| ආශ්‍රිත පාර්ශ්වකරුවන් | ක්‍රමෝපායික අවශ්‍යතා | අවදානම් |
|---|---|---|
|  | • තිරසාර වර්ධනය සඳහා වන ප්‍රයත්නය<br>• වැඩිදියුණු කරන ලද ගනුදෙනුකාර අත්දැකීම | • ණය අවදානම<br>• පොලී අනුපාත අවදානම<br>• ද්‍රවශීලතා අවදානම |

## 2021/22 ඉලක්ක සම්බන්ධයෙන් අත්කර ගත් ප්‍රගතිය

| | | |
|---|---|---|
| 15% ට ඉහළ වත්කම් වර්ධනයක් අත්කර ගැනීම | | අහිතකර ලෝක හා දේශීය ආර්ථික තත්ත්වයන් සහ COVID තෙවන රැල්ල මධ්‍යයේ උද්ගත වූ අනපේක්ෂිත අභියෝග හමුවේ වුවද 9.86% වත්කම් වර්ධනයක් අත්කර ගැනුනි. |
| ශුද්ධ පොලී ආන්තිකය 6% ට ඉහළින් පවත්වා ගැනීම | | ශුද්ධ පොලී ආන්තිකය 8.10% දක්වා ඉහළ නැංවුනි. |
| ආදායමට පිරිවැය අනුපාතය 40% ට පහළ මට්ටමකට අඩු කිරීම | | අසාමාන්‍ය ලෙස අසීරු කාලසමයකදී වුවද ආදායමට පිරිවැය අනුපාතය 43.74% හි පවත්වා ගන්නා ලදී. |
| ප්‍රගති මූලය | | |
| ආරම්භ කරන ලදී  ක්‍රියාත්මක වෙමින් පවතී  සම්පූර්ණ කරන ලදී  අත්පත් කර නොගන්නා ලදී | | |

| | | | |
|---|---|---|---|
| **රු. බිලියන 151.27**<br>**ණය සහ අත්තිකාරම්**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයෙන් 12.47%)<br>⬆ 6.99% | **රු. බිලියන 180.76**<br>**සමස්ත වත්කම්**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයෙන් 11.37%)<br>⬆ 9.86% | **රු. බිලියන 103.37**<br>**ගනුදෙනුකාර තැන්පතු**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයෙන් 12.89%)<br>⬆ 1.84% | **රු. බිලියන 38.82**<br>**ස්කන්ධ**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයෙන් 11.63%)<br>⬆ 13.04% |
| **72.99%**<br>**වෙන් කිරීම් ආවරණ අනුපාතය**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය 69.36%)<br>⬆ 2020/21 දී 64.16% සිට | **8.78%**<br>**දළ අක්‍රීය ණය අනුපාතය**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය 9.11%)<br>⬇ 2020/21 දී 9.21% සිට | **18.76%**<br>**මූලික ප්‍රාග්ධනය**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය 16.15%)<br>⬆ 2020/21 දී 17.72% සිට | **19.67%**<br>**සමස්ත ප්‍රාග්ධන අනුපාතය**<br>(බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රය 17.68%)<br>⬆ 2020/21 දී 18.58% සිට |

## සාර්ථකත්වය මැනීම

### ශුද්ධ පොලී ආදායම - සමාගම




### ණය සහ ලැබිය යුතු දේ - සමාගම




### ලාභදායීත්වය - සමාගම



# මූල්‍ය ප්‍රාග්ධනය

## විග්‍රහය

### සමාගම

පීපල්ස් ලීසිං විසින් අවිනිශ්චිත හා අවදානම් වටපිටාවක් තුළ ප්‍රවේශම් සහගත වර්ධන ක්‍රමෝපායක් අනුගමනය කරමින්, පෙර වසරට සාපේක්ෂව 15.52% ක වර්ධනයක් සමගින් රු. බිලියන 4.66 ක බදු වලට පසු ලාභයක් වාර්තා කරන ලදී. දිගින් දිගටම පැවති වසංගතය හේතුවෙන් සිදු කරන ලද රට වසා දැමීම් සහ අහිතකර ආර්ථික තත්ත්වයන් හමුවේ පාර්ශ්වකාර අභිමතයන් හා අවදානම් අතර ප්‍රවේශම් සහගත සමතුලනයක් සිදුකිරීම අවශ්‍ය විය. ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය ස්ථාවරත්වය උදෙසා ප්‍රමුඛතාවය ලබාදෙමින් අප විසින් ණය සහ අත්තිකාරම් වලින් 18.18% ක් සඳහා පමාසහන ලබාදෙමින් වසර ආරම්භ කරන ලදී. වසර තුළදී, සවිබලගන්වන ලද අයකිරීමේ ක්‍රියාවලියක් ඔස්සේ මෙම අගය 9.44% බවට අඩු කර ගැනීමට අප හට හැකි වූ අතර ඇතැම් ව්‍යාපාරයන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග අපගේ කළඹ වල ණය ගුණාත්මකභාවය ඉහළ නැංවෙමින් සමාගමෙහි මූල්‍යමය ස්ථාවරත්වය ශක්තිමත් විය.

### සමූහය

පෙර වසරට සාපේක්ෂව 13.90% ක පහළ යාමක් විදහා දක්වමින් සමූහය මගින් රු. බිලියන 4.82 ක ලාභයක් වාර්තා කරන ලදී. පීපල්ස් ලීසිං මගින් සිය ඉහළම ලාභය වාර්තා කරනු ලබන අතරතුර, සමූහය අපගේ විශාලතම පරිපාලිතය වන පීපල්ස් ඉන්ෂුවරන්ස් හි ඉහළ ගිය හිමිකම්පෑම් අනුපාතයෙහි බලපෑමට ලක් විය. පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම සහ පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගමද සිය ඉතිහාසයේ ඉහළම ලාභ වාර්තා කලේය. ස්ථර 1 සහ ස්ථර 11 අනුපාතයන් ඉහළ නැංවෙන අතරතුර සමස්ත වත්කම් හා ස්කන්ධ 14% කින් ඉහළ ගිය පසුබිමක් තුළ සමෝධානික ශේෂ පත්‍රය තවදුරටත් සවිමත්ව පැවතිනි.

### මූල්‍යමය කාර්යසාධනය

| රු. මිලියන | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | 31.03.22 අවසන් වූ වසර | 31.03.21 අවසන් වූ වසර | වෙනස % | 31.03.22 අවසන් වූ වසර | 31.03.21 අවසන් වූ වසර | වෙනස % |
| **ශුද්ධ පොලී ආදායම** | 13,049.34 | 11,919.14 | 9.48 | 14,722.67 | 13,446.64 | 9.48 |
| ගාස්තු හා කොමිස් ආදායම | 1,876.52 | 1,818.68 | 3.18 | 1,321.51 | 1,198.05 | 10.30 |
| ශුද්ධ ඉපයුම් වාරික | | | | 4,939.07 | 5,028.55 | (1.78) |
| වෙනත් මෙහෙයුම් ආදායම | 956.55 | 139.06 | 587.86 | 357.09 | 368.57 | 3.12 |
| **මුලු මෙහෙයුම් ආදායම** | 15,909.19 | 14,039.49 | 13.32 | 21,425.86 | 20,270.07 | 5.70 |
| අපහායන ගාස්තු | 777.04 | 1,143.05 | (32.02) | 1,073.37 | 1,451.70 | (26.06) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | 15,132.16 | 12,896.44 | 17.34 | 20,352.49 | 18,818.37 | 8.15 |
| මෙහෙයුම් වියදම් | 6,836.96 | 5,801.23 | 17.85 | 8,192.89 | 7,050.39 | 16.20 |
| ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | | | | 3,228.48 | 2,663.35 | 21.22 |
| **බදු පෙර ලාභය** | 8,295.20 | 7,095.22 | 16.91 | 8,931.13 | 9,104.64 | (1.91) |
| මූල්‍ය සේවා මත බදු | 1,645.11 | 1,222.63 | 34.56 | 1,705.80 | 1,273.97 | 33.90 |
| අදායම් බදු | 1,991.08 | 1,839.57 | 8.24 | 2,407.16 | 2,234.34 | 7.73 |
| **වසර සඳහා ලාභය** | 4,659.01 | 4,033.02 | 15.52 | 4,818.17 | 5,596.33 | (13.90) |

### ව්‍යාපාර කාණ්ඩයන්

*චක්‍රයෙහි විශාලත්වය මගින් කාණ්ඩ ප්‍රතිපල නියෝජනය වේ.*




කල්බදු මගින් ලාභ සඳහා ඉහළම දායකත්වය දක්වන ලද අතර, සවිමත් වත්කම් හා වගකීම් පොත් සමගින් ණය ඒ ආසන්නයෙන්ම දෙවැනි ස්ථානයට පත් විය. වත්කම් හා වගකීම් වල සාපේක්ෂ විශාලත්වයක් සමගින් සෙසු කාණ්ඩයන්හි ලාභ රුපියල් බිලියනයකට වඩා අඩු මට්ටමක පැවතිනි.

## ශුද්ධ පොලී ආදායම

**සමූහය:** රුපියල් මිලියන 14,721.67 ⬆ 9.48%
**සමාගම:** රුපියල් මිලියන 13,049.34 ⬆ 9.48%

ශුද්ධ පොලී ආදායම සමූහය සඳහා ප්‍රධාන ආදායම් මූලය වශයෙන් මුලු මෙහෙයුම් ආදායමෙන් 68.71% ක් සඳහා දායක විය. වසරේ වැඩි කලක් තැන්පතු සඳහා වෙළඳපොල පොලී අනුපාත පහළ මට්ටමක පවතිද්දී සහ ණය වර්ධනය 11.10% ට සීමා වෙද්දී පීපල්ස් ලීසිං මගින් රු. මිලියන 1,268.79 ක පැහැර හරින ලද පොලී කපා හරින ලද පසුබිමක වුවද, ශුද්ධ පොලී ආදායම රු.මිලියන 14,721.67 දක්වා 9.48% කින් ඉහළ ගියේය. පොලී ආදායම සහ පොලී වියදම පිළිවෙලින් 3.34% කින් සහ 16.22% කින් පහත වැටුනු අතර එහි ප්‍රතිපලයක් වශයෙන් සමූහයේ ශුද්ධ පොලී ආන්තිකය පෙර වසරේ වාර්තා වූ 7.95% ට සාපේක්ෂව 2021/22 දී 8.22% දක්වා වර්ධනය විය. සමාගමෙහි ශුද්ධ පොලී ආන්තිකයද පෙර වසරේ වාර්තා වූ 7.58% ට සාපේක්ෂව 8.10% දක්වා වර්ධනය විය.

### කාණ්ඩ අනුව ශුද්ධ පොලී ආදායම 2021/22




### කාණ්ඩ අනුව ශුද්ධ පොලී ආදායම 2020/21




■ කල්බදු ■ ණය ■ ඉස්ලාමීය ■ රක්ෂණ ■ වෙනත්

### ශුද්ධ පොලී ආදායම - සමූහය




---

## පොලී නොවන ආදායම

**සමූහය:** රුපියල් මිලියන 6,704.19 ⬇ (1.75)%
**සමාගම:** රුපියල් මිලියන 2,859.85 ⬆ 34.88%

පොලී නොවන ආදායම ශුද්ධ ඉපැයුම් වාරිකය, ගාස්තු හා කොමිස් ආදායම, ශුද්ධ වෙළඳාම් ආදායම සහ වෙනත් ආදායම් වලින් සමන්විත වූ අතර ශුද්ධ වාරික ආදායම 73.67% ක් සහ ගාස්තු හා කොමිස් ආදායම 19.71% ක් නියෝජනය කලේය. ශුද්ධ පොලී ආදායමෙහි පහළයාමක් හමුවේ වුවද, ගාස්තු හා කොමිස් ආදායම 10.30% ක ඉහළයාමක් වාර්තා කලේය. අවප්‍රමාණය වූ ඉල්ලුම හේතුවෙන් ශුද්ධ වාරික ආදායම රු.මිලියන 4,939.07 දක්වා 1.78% කින් පහළ ගියේය.

### කාණ්ඩ අනුව පොලී නොවන ආදායම 2021/22




### කාණ්ඩ අනුව පොලී නොවන ආදායම 2020/21




■ කල්බදු ■ ණය ■ ඉස්ලාමීය ■ රක්ෂණ ■ වෙනත්

### පොලී නොවන ආදායම



# මූල්‍ය ප්‍රාග්ධනය

## අපහායන ගාස්තු

**සමූහය:** රුපියල් මිලියන 1,073.37 ⬇ (26.06)%
**සමාගම:** රුපියල් මිලියන 777.04 ⬇ (32.02)%

අපහායන ගාස්තු යටතේ ණය සහ ලැබිය යුතු දෑ, කීර්තිනාමය සහ භාවිතයට අයිතිය ඇති වත්කම් ඇතුලත් වේ. අප විසින් ණය ක්‍රියාවලිය ශක්තිමත් කරමින් අයකරගැනීම් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම හේතුවෙන් එය වසර තුළදී රු. මිලියන 1,073.37 දක්වා 26.06% කින් පහළ ගියේය. වෙන්කිරීම් වල්දී ආදේශ කොට ගත් විචක්ෂණශීලී එළඹුම පිළිබිඹු කරමින් වසර තුළදී වෙන් කිරීම් ආවරණ අනුපාතය 64.16% සිට 72.99% දක්වා වර්ධනය විය. ක්‍රියාවට නංවන ලද නව ණය අනුමැති ක්‍රියාවලීන් මගින් නව ණය වත්කම් වල ණය ගුණාත්මකභාවය සවිමත් කරන ලද බැවින් පැරණි ණය වල ගුණාත්මකභාවය වෙනම සමාලෝචනය කෙරෙමින් පවතී. සමාගමෙහි දළ අක්‍රිය ණය අනුපාතය 2022 මාර්තු 31 වන විට ක්ෂේත්‍රයේ පැවති 9.11% අනුපාතයට සාපේක්ෂව 8.78% ක් වශයෙන් පාලනය කරන ලදී. ණය සහ ලැබිය යුතු දේ සම්බන්ධ අපහානය ගාස්තුව 88.67% ක් වූ අතර ඉතිරිය කීර්තිනාමය සඳහා අපහායන ගාස්තු වලින් සමන්විත විය.

### ණය සහ ලැබිය යුතු දේ මත අපහායනය




## ශුද්ධ මෙහෙයුම් ආදායම

**සමූහය:** රුපියල් මිලියන 20,352.49 ⬆ 8.15%
**සමාගම:** රුපියල් මිලියන 15,132.16 ⬆ 17.34%

වසර තුළදී ශුද්ධ පොලී ආදායම ඉහළයාම සහ ණය හා ලැබිය යුතු දේ සම්බන්ධ අපහායන ගාස්තු පහළයාම හේතුවෙන් ශුද්ධ මෙහෙයුම් ආදායම ඉහළ නැංවිනි. මෙම කාණ්ඩය වෙත වර්ගීකරණය කොට ඇති පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම සහ පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගමෙහි සවිමත් වූ කාර්යසාධනය පිළිබිඹු කරමින් සෙසු ව්‍යාපාර කාණ්ඩය 116.78% ක වර්ධනයක් වාර්තා කලේය. ණය ව්‍යාපාර කාණ්ඩයද, ශුද්ධ පොලී ආදායම් වර්ධනය සහ අපහායන ගාස්තු වල 71.96% ක ප්‍රශංසනීය පහළයාම ආධාරයෙන් 31.29% ක වර්ධනයක් වාර්තා කලේය. 1.93% ක ශුද්ධ පොලී ආදායම් වර්ධනය 17.14% ක් වූ ණය අලාභ වියදම් මගින් අහිතකර බලපෑමට ලක්වීම හේතුවෙන් කල්බදු සහ කුලී පිට ගැනුම් කාණ්ඩය ශුද්ධ මෙහෙයුම් ආදායමෙහි 0.64% ක වර්ධනයක් වාර්තා කලේය. ඉස්ලාමීය මූල්‍ය තුළ, ශුද්ධ පොලී ආදායමෙහි සුලු වර්ධනය පහළ ගිය ණය අලාභ ප්‍රතිවර්තනයන් මගින් හිලව් කෙරිණි. පහළගිය ශුද්ධ පොලී ආදායම සහ ශුද්ධ ඉපැයුම් වාරිකය හේතුවෙන්, රක්ෂණ කාණ්ඩයද ශුද්ධ මෙහෙයුම් ආදායම සම්බන්ධ 1.51% ක සුලු පහළයාමක් වාර්තා කලේය.

### කාණ්ඩ අනුව ශුද්ධ මෙහෙයුම් ආදායම 2021/22




### කාණ්ඩ අනුව ශුද්ධ මෙහෙයුම් ආදායම 2020/21




### ශුද්ධ මෙහෙයුම් ආදායම - සමූහය



### මෙහෙයුම් වියදම්

**සමූහය:** රුපියල් මිලියන 11,421.37 ⬆ 17.58%
**සමාගම:** රුපියල් මිලියන 6,836.95 ⬆ 17.85%

සමූහයේ මෙහෙයුම් වියදම් ඉහළයාම කෙරෙහි වෙනත් මෙහෙයුම් වියදම්, ප්‍රතිලාභ, හිමිකම්පෑම් හා ප්‍රාරක්ෂණ වියදම් සහ පුද්ගල වියදම් වල ඉහළයාම හේතු විය. සමූහයේ වෙනත් මෙහෙයුම් වියදම් ඉහළයාම කෙරෙහි ප්‍රධාන වශයෙන් පරිපාලන සහ ආයතනික වියදම් ඉහළයාම දායක් වූ අතර වසර තුළදී ඉහළ ගිය ජංගමකරණය හේතුවෙන් සමූහයේ රක්ෂණ කාණ්ඩයේ ප්‍රතිලාභ, හිමිකම්පෑම් හා ප්‍රාරක්ෂණ වියදම ඉහළ ගියේය. වෙනත් මෙහෙයුම් වියදම් සහ පුද්ගල වියදම් ඉහළයාම හමුවේ සමාගමෙහිද මෙහෙයුම් වියදම් 17.85% කින් ඉහළ නැංවුනි.

සමාගම මගින් අතපසු වූ වැටුප් වර්ධක යථා තත්ත්වයට පත් කිරීමේදී පුද්ගල වියදම් ඉහළගිය අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගමෙහි ආදායමට පිරිවැය අනුපාතය 42.97% දක්වා (2020/21:41.32%) ඉහළ නැංවුනි. වෙනත් වියදම් ද 32.34% ක ඉහළයාමක් වාර්තා කලේය. මෙකී ඉහළයාම් මගින් ශුද්ධ පොලී ආදායම සහ ගාස්තු හා කොමිස් ආදායම ඉක්මවා යන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළගිය ආදායමට පිරිවැය අනුපාතයක් වාර්තා විය.

### මෙහෙයුම් වියදම්




### මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය

**සමූහය:** රුපියල් මිලියන 8,931.13 ⬆ 1.91%
**සමාගම:** රුපියල් මිලියන 8,295.20 ⬆ 16.91%

ශුද්ධ මෙහෙයුම් ආදායම වර්ධනය වීම සහ මෙහෙයුම් වියදම් වල සීමා කරන ලද වර්ධනය හේතුවෙන් සමාගමෙහි මෙහෙයුම් ලාභය ඉහළ ගියේය. වසර තුළදී ජංගමකරණය සාමාන්‍ය අතට හැරීමත් සමග ඉහළ හදිසි අනතුරු සහ හිමිකම්පෑම් උද්ගතවීම හමුවේ ඉහළ ප්‍රතිලාභ, හිමිකම්පෑම් හා ප්‍රාරක්ෂණ වියදම් සමූහයේ මෙහෙයුම් ලාභය කෙරෙහි බලපෑම් එල්ල කලේය.

2021/22 දී පහත දක්වෙන සමාගම් ඉහළම ඓතිහාසික ලාභ වාර්තා කරන ලදී:

- පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
- පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ්

### කාණ්ඩ ප්‍රතිපල




### බදුකරණය

| රු. මිලියන | මූල්‍ය සේවා මත බදු | ආදායම් බදු | මුලු බදුකරණය |
|---|---|---|---|
| සමූහය | 1,705.80 ⬆ 33.90% | 2,407.16 ⬆ 7.73% | 4,112.96 ⬆ 17.24% |
| සමාගම | 1,645.11 ⬆ 34.56% | 1,991.08 ⬆ 8.24% | 3,636.19 ⬆ 18.74% |

මූල්‍ය සේවා මත බදු, විමර්ශනයට ලක් වන වසර තුළදී 15% සිට 18% දක්වා ඉහළ නංවන ලද මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු වලින් සමන්විත වේ.

වර්ධනය වූ ලාභදායීත්වයට සමගාමීව වසර තුළදී සමාගමෙහි ආදායම් බදු අයකිරීමද ඉහළ ගියේය.

පෙර වසරේ 17.31% ට සාපේක්ෂව 2021/22 දී සමූහයේ මුලු බදුකරණය මුලු මෙහෙයුම් ආදායමෙන් 19.20% ක් වශයෙන් වාර්තා විය. පෙර වසරේ 21.81% ට සාපේක්ෂව 2021/22 දී සමාගමෙහි මුලු බදුකරණය 22.86% ක් වශයෙන් වාර්තා විය.

### බදුකරණය - සමූහය



# මූල්‍ය ප්‍රාග්ධනය

GRI 207-1

### බදු වලට පසු ලාභය

**සමූහය:** රුපියල් මිලියන 4,818.17 ⬇ 13.90%
**සමාගම:** රුපියල් මිලියන 4,659.01 ⬆ 15.52%

ඉහළගිය ශුද්ධ පොලී ආදායම, පහළගිය අපහායනය සහ කළමනාකරණය කරන ලද මෙහෙයුම් වියදම් වල ආධාරයෙන් සමාගම ඉහළම බදු වලට පසු ලාභය වාර්තා කලේය. පහළ ශුද්ධ ඉපැයුම් වාරික සහ පීපල්ස් ඉන්ෂුවරන්ස් හි ප්‍රතිලාභ, හිමිකම්පෑම් හා ප්‍රාරක්ෂණ වියදම් ඉහළයාම හේතුවෙන් සමූහයේ බදු වලට පසු ලාභය පහළගිය අතර එහදී ෆ්ලීට් මැනේජ්මන්ට් සහ මයික්‍රො ෆයිනෑන්සින් පරිපාලිතයන්හි වර්ධනය වූ කාර්යසාධනය ඉස්මතු නොවන තත්ත්වයක් උදා විය.

#### සමූහය බදු වලට පසු ලාභය




#### සමාගම බදු වලට පසු ලාභය




### වර්ධනය සහ නම්‍යශීලීත්වය

වසර තුළදී ආදේශ කොට ගත් ප්‍රවේශම් සහගත වර්ධන ක්‍රමොපායන් හේතුවෙන් වර්ධනය වූ මූල්‍යමය නම්‍යශීලීත්වය සමූහයේ ශේෂ පත්‍රය තුළින් පිළිබිඹු වේ. ප්‍රාග්ධන ප්‍රමාණවත්තාව, ද්‍රවශීලතාව සහ වත්කම් ගුණාත්මකභාවය පීපල්ස් ලීසිං හි ප්‍රධාන ප්‍රමුඛතාවන් වූ අතර පහත දැක්වෙන ප්‍රතිඵල මගින් ක්ෂේත්‍රයට සාපේක්ෂව අප විසින් ඒවා කළමනාකරණය කරන ලද ආකාරය විදහා දැක්වේ.

| ප්‍රාග්ධන ප්‍රමාණත්මකතා අනුපාතයන් | සමාගම | | ක්ෂේත්‍රය | |
|---|---|---|---|---|
| | 2021/22 | 2020/21 | 2021/22 | 2020/21 |
| පළමුපෙළ ප්‍රාග්ධන/මූලික ප්‍රාග්ධන ප්‍රමාණත්මකතා අනුපාතය (%) | 18.76 | 17.72 | 16.15 | 14.17 |
| සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණත්මකතා අනුපාතය/සමස්ත අවදානම් මත බරතබන ලද ප්‍රමාණත්මකතා ප්‍රාග්ධන අනුපාතය (%) | 19.67 | 18.58 | 17.68 | 15.44 |
| ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 148.91 | 194.90 | 57.67 | 36.29 |

| වත්කම් ගුණාත්මක අනුපාත | සමාගම | | ක්ෂේත්‍රය | |
|---|---|---|---|---|
| | 2021/22 | 2020/21 | 2021/22 | 2020/21 |
| දළ අක්‍රිය අත්තිකාරම් අනුපාතය (%) | 8.78 | 9.21 | 9.11 | 11.29 |
| ශුද්ධ අක්‍රිය අත්තිකාරම් (%) | 1.06 | 1.92 | 1.90 | 2.81 |
| සමස්ත වත්කම් වෙත සමස්ත ශුද්ධ අත්තිකාරම් අනුපාතය (%) | 83.69 | 85.93 | 76.29 | 76.26 |
| ප්‍රතිපාදන ආවරන අනුපාතය (%) | 72.99 | 63.53 | 69.36 | 64.21 |

#### සමාගම සමස්ත වත්කම්




#### සමූහය සමස්ත වත්කම්




### සමස්ත වත්කම්

**සමූහය:** රුපියල් මිලියන 206,938.32 ⬆ 14.15%
**සමාගම:** රුපියල් මිලියන 180,764.58 ⬆ 9.86%

ණය සහ අත්තිකාරම් සමාගමෙහි සමස්ත වත්කම් වලින් 83.69% ක් සදහාද සමූහයේ සමස්ත වත්කම් වලින් 78.92% ක් සදහාද දායක වූ අතර පිළිවෙලින් 6.99% කින් සහ 11.10% කින් ඉහළ නංවුනු ණය වර්ධනය මගින් වසර තුළදී සිදුකරන ලද ප්‍රවේශම් සහගත ණය කළමනාකරණය පිළිබිඹු වේ. සමූහ මට්ටමෙදී, ඉහළ නංවන ලද ද්‍රවශීලතාවය විදහා දක්වමින් බැංකු වල මුදල් හා ශේෂයන් 40.52%, 15.77% කින් වර්ධනය විය. සමාගම් මට්ටමේදී, මුදල් හා මුදල් සමාන දේ රු. මිලියන 4,668.8 ක් දක්වා 72.73% වර්ධනයක් වාර්තා කලේය. මෙහෙයුම් වටපිටාවෙහි අවිනිශ්චිතාවන් හේතුවෙන් සමූහය ඇතුළත සියලුම සමාගම් වරණීය වර්ධන ක්‍රමෝපායන් අනුගනය කල අතර, එහිදී කාර්යක්මතාවන් ඔස්සේ වටිනාකම් ගොඩනැංවීම සහ කෙටි කාලීනව අයකරගැනීම් සිදුකිරීම ඔස්සේ වාර්තාකරණ වසරේදී ප්‍රශංසනීය කාර්යාධනයක් අත්පත් කරගත හැකි විය.

## සමස්ත වගකීම්

**සමූහය:** රුපියල් මිලියන 159,952.51 ⬆14.12%
**සමාගම:** රුපියල් මිලියන 141,946.27 ⬆9.02%

ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දේ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි විශාලතම වගකීම වන අතර පිළිවෙලින් එය සමාගමෙහි සහ සමූහටයහි සමස්ත වගකීම් වලින් 72.82% කට සහ 69.67% කට දායක විය. ණය වර්ධනය කෙරෙහි වූ ප්‍රවේශම් සහගත එළඹුම හේතුවෙන් සමාගමහි ගනුදෙනුකරුවන් වෙතත ගෙවිය යුතු දේ සම්බන්ධව 1.84% සුලු වර්ධනයක් වාර්තා වූ අතර, සමූහ මට්ටමේදී මෙහෙයුම් වල වර්ධනය පිළිබිඹු කරමින් එය 7.43% ක ඉහළයාමක් වාර්තා කලේය.

වෙනත් වගකීම් සමාගම් සහ සමූහ මට්ටමින් රු.මිලියන 38,578.36 සහ රු.මිලියන 48,508.76 දක්වා 34.41% කින් සහ 33.17% කින් ඉහළ ගියේය. වසර තුළදී සමූහය ප්‍රධාන වශයෙන් ව්‍යාපාර කටයුතු සඳහා අරමුදල් සම්පාදනය තැන්පතු මගින් සිදුකරන ලද බැවින්, බැංකු වෙත ගෙවිය යුතු දේ සහ ණය සුරකුම් නිකුත් කිරීම් පිළිවෙලින් 69.93% කින් සහ 24.98% කින් වර්ධනය විය.

### සමූහය සමස්ත වගකීම්




### සමාගම සමස්ත වගකීම්




## ස්කන්ධ

**සමූහය:** රුපියල් මිලියන 46,975.80 ⬆14.34%
**සමාගම:** රුපියල් මිලියන 38,818.31 ⬆13.04%

මූලික ප්‍රාග්ධනය සවිමත් කරමින්, කොටස්කර ලාභාංශ වශයෙන් 2020/21 සඳහා රු. මිලියන 1,278.45 ක අවසාන ලාභාංශයක් සහ රු. මිලියන 901.47 ක අන්තර්මධ්‍ය ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී. සමාගම සහ සමූහය සඳහා ව්‍යවස්ථාපිත සංචිත පිළිවෙලින් 9.68% කින් සහ 10.73 කින් ඉහළ ගියේය. සමාගමෙහි රඳවාගත් ඉපැයුම් රු. මිලියන 19,481.61 දක්වා 13.53% කින්ද සමූහයේ එම අගය රු.මිලියන 23,122.85 දක්වා 11.80% කින්ද ඉහළ ගියේය.

### සමූහය ස්කන්ධ




### සමාගම ස්කන්ධ




## මුදල් ප්‍රවාහ

ප්‍රධාන වශයෙන් මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් රු.මිලියන 6,154.69 ක් වීම හේතු කොට ගෙන සමූහය, මුදල් හා මුදල් සමාන දේ වල පෙර වසරේ වාර්තා වූ රු.මිලියන 4,045.26 ක් පහළයාමට සාපේක්ෂව වසර තුළදී රු. මිලියන 1,124.27 ක ශුද්ධ ඉහළයාමක් වාර්තා කලේය. ආයෝජන ක්‍රියාකාරකම් වල සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් වල යොදවන ලද ශුද්ධ මුදල් පිළිවෙලින් රු.මිලියන 188.69ක් හා රු. මිලියන 4,841.74



# මූල්‍ය ප්‍රාග්ධනය

### ක්ෂේත්‍රයට සාපේක්ෂව සමාගමහි කාර්යසාධනය

පසුගිය වසර 3 හි පැවති අවිනිශ්චිතතාව මධ්‍යයේ වුවද පීපල්ස් ලීසිං මගින් ද්‍රවශීලතාවය, වත්කම් ද්‍රවශීලතාවය පවත්වාගෙන යාම සහ සේවක ප්‍රගතිය අත්කරදීම හා ගනුදෙනුකරුවන් වෙත වර්ධනය හා ලාභදායීත්වය අත්කර දීම සඳහා කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාලීනම වර්ධනය වෙමින්, අපගේ මූල්‍යමය නම්‍යශීලීත්වය ශක්තිමත් කිරීමට පියවර ගැනීම හේතුවෙන් වත්කම් මත ආදායම සහ ස්කන්ධ මත ආදායම ක්ෂේත්‍රයට වඩා පහළ මට්ටමක පැවතිනි. අපගේ සාර්ථකත්වයට පාදක වන දිගු කාලීන සබඳතා පවත්වාගෙන යාමේදී පැහැරහරින ලද පොලී කපාහැරීම සහ පුද්ගල වියදම් ඉහළ නැංවීම අවශ්‍ය වූ අතර මෙම පියවරයන් තිරසාර වර්ධනය ඇති කරගැනීමට සහය වනු ඇති බව අපගේ විශ්වාසයයි.




### ද්‍රවශීලතා ස්ථාවරය

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වුනු ආර්ථික මන්දගාමීත්වය හමුවේ මන්දගාමී ණය වර්ධනයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය ලිහිල් කිරීමත් සමග, අපගේ ද්‍රවශීලතා ස්ථාවරය අවම නියාමනමය මට්ටම් වලට බෙහෙවින් ඉහළින් පැවතිනි. සමස්ත වෙළඳපොළේ දක්නට ලැබුනු ලක්ෂණයක් වූ, පීපල්ස් ලීසිංහිද පැවති මෙම අතිරික්ත ද්‍රවශීලතාවෙහි ප්‍රතිපලයක් වශයෙන් සෘණාත්මක ධාරණ තත්ත්වයක් උද්ගත වූ අතර, ව්‍යාපාරික පරිමාවන් වර්ධනය වූ සහ තැන්පතු පිටතට ගලායෑම් දිරිගන්වන ලද වසරේ අවසාන කාර්තුවේදී මෙම තත්ත්වය යම් තාක් දුරකට සමනය විය.

### සමාගම ද්‍රවශීලතාවය




### අයෝජකයින් සමග සහභාගීත්වය

හේතු ගණනාවක් නිසාවෙන් අපි අයෝජකයින් සමග සහභාගීත්වයෙන් කටයුතු කරමු:

- අපගේ කාර්යසාධනය සහ මූල්‍යමය නම්‍යශීලීත්වය පිළිබඳ තොරතුරු සැපයීම සඳහා
- සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ තොරතුරු සැපයීම සඳහා
- නීති, රෙගුලාසි සහ ලැයිස්තුගතවීමේ නීති පිළිබඳ විශේෂිත තොරතුරු සැපයීම සඳහා
- අමතර ප්‍රාග්ධනය ඉල්ලීම හෝ ණය ආපසු ගෙවීම සඳහා
- ආදායම් බෙදාදීම සඳහා (පොලී ගෙවීම් සහ ලාභාංශ ගෙවීම්)

| සහභාගීත්ව ක්‍රමවේදය | වාර ගණන |
|---|---|
| වාර්ෂික මහා සභා රැස්වීම | වාර්ෂිකව |
| වාර්ෂික වාර්තාව | වාර්ෂිකව |
| අන්තර්මධ්‍ය මූල්‍ය වාර්තා | කාර්තුමය |
| අන්තර්මධ්‍ය පුවත්පත් ප්‍රකාශන | ද්වි වාර්ෂිකව |
| මාධ්‍ය නිවේදන | අවශ්‍ය පරිදි |
| ආයතනික වෙබ් අඩවිය | නිරන්තර |
| කොළඹ කොටස් වෙළඳපොල වෙත ආයතනික හෙළිදරව් කිරීම් | අවශ්‍ය පරිදි |
| සමාගම් ලේකම් හරහා දැනුම්දීම් | කොටස්හිමිකරුවන් විසින් ආරම්භ කරන ලද පරිදි |
| ආයෝජක සම්බන්ධ යාවත්කාලීනයන් | අවශ්‍ය පරිදි |

සියලුම හෙළිදරව් කිරීම් පූර්ව නිර්දේශති කාලසීමාවන් සහ පූර්ව නිර්දේශිත අකෘතීන් අනුව සිදුකොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කොටස්හිමිකරුවන් හෝ ඔවුන්ගේ පෙරකලාසිකරුවන්ගේ සහභාගීත්වයෙන් යුතුව අන්තර්ජාලගත රැස්වීම් පදනමක් ඔස්සේ 2021 අගෝස්තු 05 වැනි දින වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන ලදී. සියලු කොටස් හිමිකරුවන් වෙත ඩිජිටල් මාධ්‍යයෙන් වාර්ෂික වාර්තාව ලබාදෙන ලද අතර විශේෂිත මුද්‍රිත පිටපතක් ඉල්ලා සිටි 60 දෙනෙකුට මුද්‍රිත පිටපත් ලබාදෙන ලදී.

## ආයෝජකයින් වෙත වටිනාකම

අයෝජකයින්, සමාගම විසින් නිකුත් කරන ලද ස්කන්ධ සහ ණය සුරැකුම් වල ආයෝජන සිදුකරන ලද කොටස්හිමිකරුවන් සහ ණයකර හිමිකරුවන්ගෙන් සමන්විත වේ. ආයෝජන ක්‍රමෝපාය සහ සැලසුම් අනුව මෙකී සුරැකුම් වෙළඳාමෙහි යෙදවීමට ආයෝජකයින් හට හැකි වන පරිදි, මෙම මූල්‍ය සාධනපත්‍රයන් කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කොට ඇත. ආයෝජකයින් යනු සමාගමෙහි මෙහෙයුම් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය ලබදෙන්නා වූ ප්‍රධාන සැපයුම්කරුවන් වන අතර ඔවුන් තමන් විසින් භාරගනු ලබන අවදානම් සඳහා ආදායමක් අපේක්ෂා කරයි. කොටස් මිල සංචලනයන් අනුව, කොටස් හිමිකරුවන් ඉහළම අවදානම දරමින් ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ හෝ අලාභ වලින් ආදායම උපයා ගනී. ණයකර හිමිකරුවන් කොටස් හිමිකරුවන්ට ඉහළින් ශ්‍රේණිගත වන අතර ඔවුන් පොලී උපයා ගන්නා නමුත් ලාභාංශ වෙත සහභාගී නොවේ. මෙම කොටස මගින් මෙම වාර්තාවේ අන් කිසිදු ස්ථානයක සාකච්ඡා නොකෙරෙන, සිය ආයෝජන ක්‍රමෝපායන් සහ තීරණ සකසා ගැනීමේදී අවශ්‍ය වන අමතර තොරතුරු ආයෝජකයින් වෙත ඉදිරිපත් කෙරේ.




### ඩූපොන්ට් විශ්ලේෂණය

ආයෝජකයකු හට, සමාන ආකාරයේ සමාගම් වල කාර්යක්ෂම සම්පත් භාවිතය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සන්සන්දනය කරමින්, සමාගමෙහි ශක්තීන් හා දුර්වලතාවයන් හඳුනාගැනීම සඳහා ඩූපොන්ට් විශ්ලේෂණය යොදා ගත හැක. මෙම ක්‍රමවේදය භාවිත කරමින්, ස්කන්ධ මත ආදායම සම්බන්ධ එකිනෙකට වෙනස් ගාමකයන් වෙන්කොට හඳුනාගැනීමට හැකි වේ.

2021/22 මූල්‍ය වර්ෂයේදී, සමූහය මගින් ශුද්ධ පොලී ආන්තිකය, වත්කම් මත ආදායම, සහ ස්කන්ධ ගුණාකාරයෙහි සුලු පහළයාමක් වාර්තා කරන ලද අතර එහි ප්‍රතිපලයක් වශයෙන් සමූහයේ ස්කන්ධ මත ආදායම සහ කොටස්හිමිකාර වටිනාකමෙහි සුලු අඩුවීමක් දක්නට ලැබිනි.

### සමූහය ස්කන්ධ මත ආදායම



## ආයෝජක අපේක්ෂාවන්

**සවිමත් ආයතනික පාලනය**
පිටු අංක 124 සිට 155 දක්වා බලන්න.

**මූල්‍ය ස්ථාවරත්වය**
පිටු අංක 60 සිට 68 දක්වා බලන්න.

**මූල්‍ය ආදායම්**
පිටු අංක 60 සිට 68 දක්වා බලන්න.

**මනා ආයතනික පුරවැසිභාවය**
පිටු අංක 96 සිට 105 දක්වා සහ 88 සිට 95 දක්වා සමාජ හා සබදතා ප්‍රාග්ධනය සහ මානව ප්‍රාග්ධනය බලන්න.

| | 2021/22 | 2020/21 |
|---|---|---|
| සමූහය කොටසකට ඉපැයුම් (රු.) | 2.68 | 3.11 |
| කොටසකට ලාභාංශ (රු)* | 1.25 | 0.60 |
| ලාභාංශ ගෙවීම (%)* | 46.79 | 24.22 |
| ලාභාංශ ආදායම (%)* | 15.43 | 5.08 |
| ලාභාංශ ආවරනය (වාර ගණන)* | 2.14 | 4.13 |
| කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | 20.57 | 20.15 |
| මිළ ඉපැයුම (වාර ගණන) | 3.28 | 4.99 |
| පොත් අගයට මිල | 0.39 | 0.59 |
| ස්කන්ධ මත ආදායම (%) | 12.74 | 12.49 |
| ඉපැයුම් වර්ධනය (%) | 15.52 | 37.06 |
| අග්‍රිමය ගලපන ලද වෙළඳපොල ප්‍රාග්ධනිතය (රු. බිලියන) | 3.82 | 5.02 |

** 2021/22 සදහා වන ඉහත වටිනාකමෙහි රු.0.50 ක යෝජිත ලාභාංශය ඇතුළත් කොට නොමැත. 2020/21 සදහා ගෙවන ලද අවසන් ලාභාංශය ඇතුළත් වේ.*

## 2021/22 කොටස්හිමිකරුවන් වෙත පිරිනමන ලද වටිනාකම

කෙටි,මධ්‍ය හා දිගු කාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය සදහා සමූහය සතු හැකියාව කළමනාකරණය සදහා පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් ප්‍රවේශම් සහගතව සමතුලනය කරමින්, කොටස් හිමිකරුවන් සදහා ඉපැයුම් සම්බන්ධ තිරසාර වර්ධනයක් අත්කර දීමට අප විසින් කටයුතු කෙරේ. ඒ අනුව, අප විසින්, ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ ඔස්සේ කොටස්හිමිකරුවන් වෙත ආකර්ශනීය ආයෝජන මත ආදායමක් ලබාදීම සදහා සංගත ලාභාංශ ප්‍රතිපත්තියක් ආදේශනය කරනු ලැබ ඇත. 2022 මාර්තු 31 දිනට සමාගමෙහි මහජන අග්‍රිමිය 24.36% ක් වූ අතර එය කොටස් හිමිකරුවන් 10,918 ක් විසින් රදවාගන්නා ලදී,

2022 මාර්තු 31 දිනට අග්‍රිමය ගළපන ලද වෙළදපොල ප්‍රාග්ධනිතය රු.3,815,455,367 ක් වූ අතර, සමාගම, අවම මහජන රදවා ගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධ කොළඹ කොටස් වෙළදපොලේ ලැයිස්තුගත වීමේ නීති 7.14.1. (1) (අ) හි වරණ අංක 04 ට අනුකූල විය.

පහත දක්වෙන කාර්යසාධන මිනුම් මගින් සමාගම සහ සමූහය මගින් ආයෝජකයින් වෙත නිර්මාණය කරන ලද වටිනාකම පිළිබද අවබෝධයක් හිමි වනු ඇත.

### කොටස හිමිකරුවන් වෙත වටිනාකම

| රු. 1.25 | රු. 8.10 | රු. 20.57 | 24.96% |
|---|---|---|---|
| කොටසකට ලාභාංශ | කොටසකට වෙළදපොල මිළ | කොටසකට ශුද්ධ වත්කම් | මහජන අග්‍රිමය |

## කොළඹ කොටස් වෙළදපොල සම්බන්ධයෙන් පීපල්ස් ලීසිං හි කොටස් වල කාර්යසාධනය

පීපල්ස් ලීසිං හි සාමාන්‍ය කොටස් කොළඹ කොටස් වෙළදපොලේ ලැයිස්තුගත කොට ඇති අතර PLC.N0000 හි කේතය අනුයුක්ත කොට ඇත.

### පීපල්ස් ලීසිං කොටස් ගනුදෙනු (පිරිවැටුම)




### වෙළදපොල ප්‍රාග්ධනිතය




### ශුද්ධ ලාභ කොටස




### වත්කම් මත ආදායම




### ස්කන්ධ ගුණාකාරය



# මූල්‍ය ප්‍රාග්ධනය

## කොටස් පිළිබඳ තොරතුරු

### කොටස් ප්‍රාග්ධනය

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | රු. 000 | සංඛ්‍යාව | රු. 000 |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 1,704,602,760 | 14,892,036 | 1,627,703,388 | 13,915,414 |
| කොටස්කර ලාභාංශ | 182,592,242 | 2,179,925 | 76,899,372 | 976,622 |
| මාර්තු 31 දිනට ශේෂය | 1,887,195,002 | 17,071,961 | 1,704,602,760 | 14,892,036 |

## ප්‍රකාශිත ප්‍රාග්ධනය මගින් නියෝජනයවන කොටස් වල සංචලනය පිළිබඳ තොරතුරු

| අවසාන වූ වසර | මූල්‍ය වසර ආරම්භයේදී කොටස් සංඛ්‍යාව | | මූල්‍ය වසර තුළ කොටස් එකතු කිරීම/(පිරිමුදනය) | | මූල්‍ය වසර අවසානයේදී සමුච්චිත කොටස් | | මූල්‍ය වසර අවසානයේදී නිකුත් කරන ලද ප්‍රාග්ධනය (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් | වරණීය කොටස් | සාමාන්‍ය කොටස් | වරණීය කොටස් | සාමාන්‍ය කොටස් | වරණීය කොටස් | |
| 1995/96 | 2 | - | - | - | 2 | - | 20 |
| 1996/97 | 2 | - | - | - | 2 | - | 20 |
| 1997/98 | 2 | - | 2,500,000 | - | 2,500,002 | - | 25,000,020 |
| 1998/99 | 2,500,002 | - | - | - | 2,500,002 | - | 25,000,020 |
| 1999/00 | 2,500,002 | - | 1,500,000 | - | 4,000,002 | - | 40,000,020 |
| 2000/01 | 4,000,002 | - | 2,000,006 | - | 6,000,008 | - | 60,000,080 |
| 2001/02 | 6,000,008 | - | 4,000,000 | - | 10,000,008 | - | 100,000,080 |
| 2002/03 | 10,000,008 | - | - | - | 10,000,008 | - | 100,000,080 |
| 2003/04 | 10,000,008 | - | 10,000,000 | 50,000,000 | 20,000,008 | 50,000,000 | 700,000,080 |
| 2004/05 | 20,000,008 | 50,000,000 | - | - | 20,000,008 | 50,000,000 | 700,000,080 |
| 2005/06 | 20,000,008 | 50,000,000 | 30,000,000 | - | 50,000,008 | 50,000,000 | 1,000,000,080 |
| 2006/07 | 50,000,008 | 50,000,000 | - | (5,000,000) | 50,000,008 | 45,000,000 | 950,000,080 |
| 2007/08 | 50,000,008 | 45,000,000 | - | (10,000,000) | 50,000,008 | 35,000,000 | 850,000,080 |
| 2008/09 | 50,000,008 | 35,000,000 | - | (10,000,000) | 50,000,008 | 125,000,000 | 1,850,000,080 |
| 2009/10 | 50,000,008 | 125,000,000 | - | (10,000,000) | 50,000,008 | 115,000,000 | 1,850,000,080 |
| 2010/11 | 50,000,008 | 115,000,000 | - | (10,000,000) | 50,000,008 | 105,000,000 | 1,850,000,080 |
| 2011/12 | 50,000,008 | 105,000,000 | 1,510,000,152 | (15,000,000) | 1,560,000,160 | 90,000,000 | 12,958,000,800 |
| 2012/13 | 1,560,000,160 | 90,000,000 | - | (20,000,000) | 1,560,000,160 | 70,000,000 | 12,736,073,308 |
| 2013/14 | 1,560,000,160 | 70,000,000 | 19,862,322 | (20,000,000) | 1,579,862,482 | 50,000,000 | 12,736,073,308 |
| 2014/15 | 1,579,862,482 | 50,000,000 | - | (20,000,000) | 1,579,862,482 | 30,000,000 | 12,936,073,308 |
| 2015/16 | 1,579,862,482 | 30,000,000 | - | (20,000,000) | 1,579,862,482 | 10,000,000 | 13,136,073,308 |
| 2016/17 | 1,579,862,482 | 10,000,000 | - | (10,000,000) | 1,579,862,482 | - | 13,236,073,308 |
| 2017/18 | 1,579,862,482 | - | - | - | 1,579,862,482 | - | 13,236,073,308 |
| 2018/19 | 1,579,862,482 | - | - | - | 1,579,862,482 | - | 13,236,073,308 |
| 2019/20 | 1,579,862,482 | - | 47,840,906 | - | 1,627,703,388 | - | 13,915,414,175 |
| 2020/21 | 1,627,703,388 | - | 76,899,372 | - | 1,704,602,760 | - | 14,892,036,208 |
| 2021/22 | 1,704,602,760 | - | 182,592,242 | - | 1,887,195,002 | - | 17,071,960,891 |

## කොටස් හිමිකාරීත්වය පිළිබඳ විශ්ලේෂණය

### සාමාන්‍ය කොටස් හිමිකරුවන්ගේ බෙදීයාම

| සාමාන්‍ය කොටස් හිමිකරුවන්ගේ බෙදීයාම | 22 මාර්තු 31 | | | | 21 මාර්තු 31 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කොටස් හිමිකරුවන් සංඛ්‍යාව | කොටස් හිමි % | කොටස් සංඛ්‍යාව | කොටස්% | කොටස් හිමිකරුවන් සංඛ්‍යාව | කොටස් හිමි % | කොටස් සංඛ්‍යාව | කොටස්% |
| 1000 ට අඩු හෝ සමාන | 3,263 | 29.86 | 928,802 | 0.05 | 3,049 | 30.41 | 874,598 | 0.05 |
| 1,001 - 10,000 | 5,581 | 51.08 | 16,968,884 | 0.90 | 5,201 | 51.87 | 14,722,045 | 0.86 |
| 10,001 - 100,000 | 1,761 | 16.12 | 49,438,645 | 2.62 | 1,540 | 15.36 | 41,308,690 | 2.42 |
| 100,001 - 1,000,000 | 281 | 2.57 | 74,366,187 | 3.94 | 204 | 2.03 | 54,571,331 | 3.20 |
| 1,000,000 ට වැඩි | 40 | 0.37 | 1,745,492,484 | 92.49 | 33 | 0.33 | 1,593,126,096 | 93.47 |
| එකතුව | 10,926 | 100.00 | 1,887,195,002 | 100.00 | 10,027 | 100.00 | 1,704,602,760 | 100.00 |

### සාමාන්‍ය කොටස් හිමිකරුවන්ගේ සංයුතිය

| සාමාන්‍ය කොටස් හිමිකරුවන්ගේ සංයුතිය | 22 මාර්තු 31 | | | | 21 මාර්තු 31 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කොටස් හිමිකරුවන් සංඛ්‍යාව | කොටස් හිමි % | කොටස් සංඛ්‍යාව | කොටස්% | කොටස් හිමිකරුවන් සංඛ්‍යාව | කොටස් හිමි % | කොටස් සංඛ්‍යාව | කොටස්% |
| නේවාසික - කේවල පුද්ගලයින් | 10,524 | 96.32 | 125,219,931 | 6.64 | 9,670 | 96.44 | 98,936,870 | 5.80 |
| නේවාසික - ආයතන | 349 | 3.19 | 1,750,299,666 | 92.75 | 301 | 3.00 | 1,532,638,128 | 89.91 |
| අනේවාසික - කේවල පුද්ගලයින් | 47 | 0.43 | 3,782,369 | 0.19 | 49 | 0.49 | 3,337,558 | 0.20 |
| අනේවාසික - ආයතන | 6 | 0.05 | 7,893,036 | 0.42 | 7 | 0.07 | 69,690,204 | 4.09 |
| එකතුව | 10,926 | 100.00 | 1,887,195,002 | 100.00 | 10,027 | 100.00 | 1,704,602,760 | 100.00 |

### සාමාන්‍ය කොටස් හිමිකරුවන්ගේ ස්වරූපය

| | 2021/22 | කා 4 | කා 3 | කා 2 | කා 1 | 2020/21 |
|---|---|---|---|---|---|---|
| කොටස් මිල (රු.) | | | | | | |
| ඉහළම | 13.80 | 12.30 | 11.80 | 13.80 | 13.70 | 15.40 |
| පහළම | 8.00 | 8.00 | 10.00 | 10.50 | 11.70 | 9.10 |
| අවසාන | 8.10 | 8.10 | 10.70 | 10.70 | 13.00 | 11.80 |
| ගනුදෙනු සංඛ්‍යාව | 33,020 | 9,244 | 7,832 | 10,833 | 5,111 | 33,248 |
| ගනුදෙනු කෙරුනු කොටස් සංඛ්‍යාව (මිලියන) | 178 | 35.47 | 24.46 | 67.64 | 50.37 | 181.88 |
| පීපල්ස් ලීසිං පිරිවැටුම (රු.මිලියන) | 2,127 | 375.37 | 264.99 | 834.61 | 651.55 | 2,256.03 |
| සමස්ත වෙළඳපොල පිරිවැටුමට පීපල්ස් ලීසිං පිරිවැටුම (%) | 0.18 | 0.12 | 0.07 | 0.25 | 0.48 | 0.34 |
| ගනුදෙනු කෙරුනු දින ගණන | 240 | 58 | 62 | 63 | 57 | 219 |
| සාමාන්‍යය දෛනික පිරිවැටුම (රු.මිලියන) | 8.86 | 6.47 | 4.27 | 13.25 | 11.43 | 10.30 |
| වෙළඳපොල ප්‍රාග්ධනිතය - කොළඹ කොටස් වෙළඳපොල (රු. බිලියන) | 3,826.50 | 3,826.50 | 5,489.17 | 4,215.63 | 3,470.24 | 3,111.26 |
| වෙළඳපොල ප්‍රාග්ධනිතය - පීපල්ස් ලීසිං (රු. බිලියන) | 15.29 | 15.29 | 20.19 | 19.29 | 22.16 | 20.11 |
| සමස්ත වෙළඳපොල ප්‍රාග්ධනිතය වෙත පීපල්ස් ලීසිං වෙළඳපොල ප්‍රාග්ධනිතය (%) | 0.40 | 0.40 | 0.37 | 0.46 | 0.64 | 0.65 |
| වෙළඳපොල පිරිවැටුම - රු. මිලියන | 1,151,629 | 302,926 | 380,160 | 332,050 | 136,493 | 668,812 |

# මූල්‍ය ප්‍රාග්ධනය

## කොටස් මිල සංචලනය

| | අප්‍රි-21 | මැයි-21 | ජූනි-21 | ජූලි-21 | අගෝ-21 | සැප්-21 | ඔක්-21 | නොවැ-21 | දෙසැ-21 | ජන-22 | පෙබ-22 | මාර්තු-22 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉහළ (රු.) | 12.40 | 13.50 | 13.70 | 13.80 | 13.30 | 11.50 | 11.40 | 11.80 | 11.00 | 12.30 | 11.20 | 10.70 |
| පහළ (රු.) | 11.70 | 11.70 | 12.70 | 12.70 | 10.90 | 10.50 | 10.70 | 10.60 | 10.00 | 0.50 | 9.90 | 8.00 |
| අවසාන (රු.) | 11.90 | 13.20 | 13.00 | 13.10 | 11.10 | 10.70 | 11.10 | 10.80 | 10.70 | 11.00 | 10.50 | 8.10 |

## පීපල්ස් ලීසිං කොටස් මිල සංචලනය




## විශාලතම කොටස් හිමිකරුවන් විසි දෙනා

| අංකය | කොටස් හිමිකරුගේ නම | 22 මාර්තු 31 | | සටහන් | 21 මාර්තු 31 | |
|---|---|---|---|---|---|---|
| | | කොටස් සංඛ්‍යාව | % | | කොටස් සංඛ්‍යාව | % |
| 1 | මහජන බැංකුව | 1,415,396,247 | 75.00 | වෙනසක් නැත | 1,278,452,068 | 75.00 |
| 2 | සේවක අර්ථසාධක අරමුදල | 102,429,667 | 5.43 | වෙනසක් නැත | 92,519,266 | 5.43 |
| 3 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 52,162,973 | 2.76 | 1 ස්ථානයක් ඉහළට | 47,116,037 | 2.76 |
| 4 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - ජීවිත අරමුදල | 23,251,615 | 1.23 | නව සාමාජික | - | - |
| 5 | රබර් ආයෝජන භාරය ගිණුම් අංක 01 | 22,146,695 | 1.17 | වෙනසක් නැත | 17,713,821 | 1.04 |
| 6 | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලය | 17,981,739 | 0.95 | වෙනසක් නැත | 12,482,939 | 0.73 |
| 7 | ලංකා බැංකුව අංක 1 ගිණුම | 13,681,680 | 0.72 | වෙනසක් නැත | 12,357,934 | 0.72 |
| 8 | පෙරේරා ඇන්ඩ් සන්ස් බේකර්ස් පුද්ගලික සමාගම | 11,000,000 | 0.58 | වෙනසක් නැත | 8,000,000 | 0.47 |
| 9 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - සාමාන්‍ය අරමුදල | 10,366,140 | 0.55 | වෙනසක් නැත | 7,577,469 | 0.44 |
| 10 | සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී A/C # 02 /<br>සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී A/C # 01 / | 7,210,797<br>- | 0.38 | 1 ස්ථානයක් ඉහළට | 1,581,888<br>5,161,675 | 0.40 |
| 11 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී | 7,033,570 | 0.37 | නව සාමාජික | - | - |
| 12 | AIA ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් ගිණුම් අංක 07 | 5,133,072 | 0.27 | ස්ථාන 2 ක් පහළට | 5,204,702 | 0.31 |
| 13 | සිලෝන් ගාඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පීඑල්සී ගිණුම් අංක 02 | 4,273,247 | 0.23 | වෙනසක් නැත | 3,396,923 | 0.20 |
| 14 | මෙලන් බෑන්ක් එන්. ඒ - ආකේඩියන් ෆ්‍රන්ටියර් මාර්කට්ස් ඉක්විටි ෆන්ඩ් | 3,932,508 | 0.21 | ස්ථාන 3ක් ඉහළට | 2,735,108 | 0.16 |
| 15 | ඩබ්. ඒ. එස්. පී. ද සේරම් මහතා | 3,855,488 | 0.20 | නව සාමාජික | 2,388,626 | 0.14 |
| 16 | කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී/මෙට්‍රොකෝප් පුද්ගලික සමාගම | 3,478,264 | 0.18 | ස්ථාන 2 ක් පහළට | 3,141,732 | 0.18 |
| 17 | හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී ගිණුම් අංක 04<br>(HNB විශ්‍රාම වැටුප් අරමුදල) | 3,248,816 | 0.17 | ස්ථාන 2 ක් පහළට | 2,934,483 | 0.17 |
| 18 | ජේ. බී . කොකොෂෙල් පුද්ගලික සමාගම | 3,226,807 | 0.17 | නව සාමාජික | 500,000 | 0.03 |
| 19 | එම්. ජේ. ප්‍රනාන්දු මහතා | 3,049,015 | 0.16 | ස්ථාන 2 ක් පහළට | 2,765,895 | 0.16 |
| 20 | කේ.ඩී.එච්. පෙරේරා මහතා | 2,881,010 | 0.15 | නව සාමාජික | 323,686 | 0.02 |
| | උප එකතුව | 1,715,739,350 | 90.88 | | 1,504,772,364 | 88.36 |
| | වෙනත් කොටස් හිමිකරුවන් | 171,455,652 | 9.12 | | 199,830,396 | 11.64 |
| | එකතුව | 1,887,195,002 | 100.00 | | 1,704,602,760 | 100.00 |

## අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ කොටස් හිමිකාරීත්වය

2022 මාර්තු 31 දිනට

| නම | නිලය | පත්කරන ලද දිනය/ඉල්ලා අස්වූ දිනය | කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|
| සුජීව රාජපක්ෂ මහතා | සභාපති | | 165,858 |
| රොහාන් පතිරගේ මහතා | අධ්‍යක්ෂ | | 402,628 |
| අසාම් ඒ. අහමත් මහතා | අධ්‍යක්ෂ | | - |
| රංජිත් කොඩිතුවක්කු මහතා | අධ්‍යක්ෂ | | - |
| එස්. අහංගම මහතා | අධ්‍යක්ෂ | 2021 අගෝස්තු 24 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය | - |
| කේ. සී. ජේ. සී. ෆොන්සේකා මහතා | අධ්‍යක්ෂ | | 57,932 |
| සී. ජේ. විජේතිලක මහතා | අධ්‍යක්ෂ | | 5,233 |
| යූ. එල්. ඒ. ඩබ්. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ | | - |
| එම්. සී. පීටර්ස් මිය | අධ්‍යක්ෂිකා | | - |
| එස්. ජේ. එම්. මර්සලින් මහතා | ප්‍රධාන විධායක නිලධාරී | | - |

2021 මාර්තු 31 දිනට

| නම | නිලය | පත්කරන ලද දිනය/ඉල්ලා අස්වූ දිනය | කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|
| සුජීව රාජපක්ෂ මහතා | සභාපති | | 149,812 |
| රොහාන් පතිරගේ මහතා | අධ්‍යක්ෂ | | 363,673 |
| අසාම් ඒ. අහමත් මහතා | අධ්‍යක්ෂ | | - |
| එස්. අහංගම මහතා | අධ්‍යක්ෂ | | - |
| කේ. සී. ජේ. සී. ෆොන්සේකා මහතා | අධ්‍යක්ෂ | | 52,358 |
| සී. ජේ. විජේතිලක මහතා | අධ්‍යක්ෂ | | - |
| යූ. එල්. ඒ. ඩබ්. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ | | - |
| එම්. සී. පීටර්ස් මිය | අධ්‍යක්ෂිකා | | - |
| එස්. ජේ. එම්. මර්සලින් මහතා | ප්‍රධාන විධායක නිලධාරී | 2020 නොවැම්බර් 25 සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී | - |

### ණයකර හිමියන් වෙත වටිනාකම

අරමුදල් සම්පාදන ස්ථාවරය සවිමත් කිරීම සහ කල්පිරීමේ නොගැළපීම් අවම කිරීම උදෙසා පීපල්ස් ලීසිං මගින් ණයකර නිකුත් කරනු ලැබේ. මේ වන විට නිකුත් කොට ඇති සියලුම ණයකර සුරක්ෂිත නොකරන ලද සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත වේ. වසර තුළදී, පීපල්ස් ලීසිං මගින් එක් එක් ණයකරයක සම මිල රු. 100/- ක් වූ ජ්‍යෙෂ්ට සුරක්ෂිත නොකරන ලද ලැයිස්තුගත නැවත මුදල් බවට හරවා ගත හැකි තුන් අවුරුදු (2021/2024) සහ පස් අවුරුදු (2021/2026) ණයකර නිකුතු ඔස්සේ රු.බිලියන 10 ක් සම්පාදනය කරගන්නා ලදී. අධිදායකත්වයක් සිදුවූ අවස්ථාවකදී සමාගමෙහි අභිමතය පරිදි තවත් බිලියන 6 ක් සම්පාදනය කරගැනීම සඳහා වරණයක් සමගින් මූලික නිකුතුව රු.බිලියන 4 ක් විය. සමාගමෙහි අරමුදල් සම්පාදන ස්ථාවරය සවිමත් කරමින් නිකුතුව සඳහා අධිදායකත්වයක් හිමි විය.

මූල්‍යමය ස්ථාවරත්වය පවත්වා ගෙන යාම තිරසාර වර්ධනය සඳහා අනිවාර්ය සාධකයකි. ඒ අනුව, සමූහයේ විචක්ෂණශීලී කළමනාකාරීත්වය විදහා දක්වන්නා වූ අපගේ ද්‍රවශීලතා අනුපාතයන් පහත දැක්වෙන පරිදි වේ.

### ද්‍රවශීලතාවය සහ ණය ප්‍රාග්ධනය

| | 2021/22 | 2020/21 | වෙනස % |
|---|---|---|---|
| තැන්පතු හැර ස්කන්ධයට ණය අනුපාතය (වාර ගණන) | 0.75 | 0.59 | 26.59 |
| පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 18.76 | 17.72 | 0.06 |
| සමස්ත ප්‍රාග්ධන අනුපාතය, % | 19.67 | 18.58 | 0.06 |
| පොලී ආවරනය (වාර ගණන) | 1.61 | 1.45 | 11.30 |
| ප්‍රවර්තන අනුපාතය (වාර ගණන) | 0.79 | 0.76 | 4.26 |

### ණයකර හිමිකරුවන් වෙත වටිනාකම

රු. බිලියන 1.88
ණයකර හිමියන් වෙත ගෙවන ලද පොලිය

රු. බිලියන 10
2021/22 නිකුත් කරන ලද ණයකර

රු. බිලියන 17.24
නිකුත් කෙරෙමින් පවතින ණයකර

# මූල්‍ය ප්‍රාග්ධනය

## ණයකර වෙළඳපොළ තොරතුරු

2022 මාර්තු 31 දිනට

| කාණ්ඩය | කාණ්ඩය අ | කාණ්ඩයආ | කාණ්ඩය අ | කාණ්ඩය ආ | කාණ්ඩය ඇ | කාණ්ඩය ඇ |
|---|---|---|---|---|---|---|
| කාලසීමාව (අවුරුදු) | අවුරුදු 4 | අවුරුදු 5 | අවුරුදු 3 | අවුරුදු 3 | අවුරුදු 5 | අවුරුදු 5 |
| නිකුතු දිනය | අප්‍රියෙල් 18 | අප්‍රියෙල් 18 | ජූලි 21 | ජූලි 21 | ජූලි 21 | ජූලි 21 |
| කල්පිරීමේ දිනය | අප්‍රියෙල් 22 | අප්‍රියෙල් 23 | ජූලි 24 | ජූලි 24 | ජූලි 26 | ජූලි 26 |
| පොලී අනුපාතය | ස්ථාවර | ස්ථාවර | ස්ථාවර | ශුන්‍ය කූපන් | ස්ථාවර | ශුන්‍ය කූපන් |
| කූපන් අනුපාතය (%) | 12.40 | 12.80 | 8.00 | - | 9.00 | - |
| සඵල වාර්ෂික ආදායම (%) | 12.40 | 12.80 | 8.00 | 8.00 | 9.00 | 9.00 |
| පොලී අනුපාත සන්සන්දනාත්මක රජයේ සුරැකුම් (%) | 9.25 | 9.77 | 6.25 | 6.25 | 6.93 | 6.93 |
| පොලී ගෙවන වාර ගණන | වාර්ෂික | වාර්ෂික | වාර්ෂික | - | වාර්ෂික | - |
| ශ්‍රේණිගත කිරීම | A+ | A+ | A+ | A+ | A+ | A+ |
| වටිනාකම (රු.මිලියන) | 705 | 5,295 | 2,943 | 2,420 | 4,272 | 365 |
| ISIN අංකය | LKR0399D23997 | LKR0399D23989 | LK0399D24847 | LK0399D24839 | LK0399D24821 | LK0399D24854 |
| **වෙළඳපොල වටිනාකම (රු.)** | | | | | | |
| ඉහළම | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී |
| පහළම | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී |
| අවසාන | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී |
| ප්‍රවර්තන ආදායම (%) | 12.40 | 12.80 | 8.00 | - | - | - |
| කල්පිරීමට ආදායම (%) | 12.40 | 12.80 | 8.00 | 8.00 | 9.00 | 9.00 |

2021 මාර්තු 31 දිනට

| කාණ්ඩය | කාණ්ඩය අ | කාණ්ඩය ආ |
|---|---|---|
| කාලසීමාව (අවුරුදු) | අවුරුදු 4 | අවුරුදු 5 |
| නිකුතු දිනය | අප්‍රියෙල් 18 | අප්‍රියෙල් 18 |
| කල්පිරීමේ දිනය | අප්‍රියෙල් 22 | අප්‍රියෙල් 23 |
| පොලී අනුපාතය | ස්ථාවර | ස්ථාවර |
| කූපන් අනුපාතය (%) | 12.40 | 12.80 |
| සඵල වාර්ෂික ආදායම (%) | 12.40 | 12.80 |
| පොලී අනුපාත සන්සන්දනාත්මක රජයේ සුරැකුම් (%) | 9.25 | 9.77 |
| පොලී ගෙවන වාර ගණන | වාර්ෂික | වාර්ෂික |
| ශ්‍රේණිගත කිරීම | A+ | A+ |
| වටිනාකම (රු. මිලියන) | 705 | 5,295 |
| ISIN අංකය | LKR0399D23997 | LKR0399D23989 |
| **වෙළඳපොල වටිනාකම (රු.)** | | |
| ඉහළම | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී |
| පහළම | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී |
| අවසාන | ගනුදෙනු නොකරන ලදී | ගනුදෙනු නොකරන ලදී |
| ප්‍රවර්තන ආදායම (%) | 12.40 | 12.80 |
| කල්පිරීමට ආදායම (%) | 12.40 | 12.80 |

## ඉදිරි ගමන්මග

| 2022/23 කෙටි කාලීන | මධ්‍ය කාලීන වසර 3 | දිගු කාලීන |
|---|---|---|
| • යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගෙන යාම<br>• අඩු අවදානම් පහසුකම් හා ශීඝ්‍ර වර්ධනය කෙරෙහි අවධානය | • වසරින් වසර පදනමක් මත ණය පොත් වර්ධනය අත්පත් කරගැනීම<br>• වසරින් වසර පදනමක් මත 10% තැන්පතු වර්ධනයක් පවත්වාගෙන යාම | • 2026 වන විට රු. බිලියන 10 ක බදු පසු ලාභයක් අත්පත් කරගැනීම<br>• අක්‍රීය වත්කම් අනුපාතය 5% ට පහළින් අඩු කිරීම |

## මූල්‍ය ප්‍රාග්ධ හුවමාරු

ශාඛා මට්ටමින් ඩිජිටල් හා භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන ආයෝජන ඔස්සේ නිෂ්පාදිත ප්‍රාග්ධනය සවිමත් කරනු ලැබේ.

සමාගමෙහි මූල්‍යමය ස්ථාවරත්වය හා සවිබලයෙන් මෙන්ම, සන්නාම ප්‍රවර්ධන ව්‍යාපෘතීන් ඔස්සේ බුද්ධිමය ප්‍රග්ධනය ඉහළ නංවනු ලැබේ.

සේවක පුහුණු හා සංවර්ධනය මගින් සේවක හැකියාවන් වර්ධනය කරමින් කුසලතා පූර්ණ ශ්‍රම බලකායක් ගොඩනැංවීම සඳහා දායකත්වය සපයයි.

ඩිජිටල්කරණ පියවර වෙත සිදුකෙරෙන ආයොජන තුළින් වඩාත් යහපත් ගනුදෙනුකාර සේවාවක් සැලසීමේ අවස්ථාව උදා වේ.
ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතීන් වෙත සිදුකෙරෙන ආයෝජන තුළින් සමාගමෙහි ප්‍රජා සහභාගීත්වය ඔප් නැංවේ.

බලශක්ති සංරක්ෂණ පියවර, ඩිජිටල් නියෝජනය සහ හරිත ව්‍යාපෘතීන් වෙත කෙරෙන ආයෝජන මගින් කාබන් විමෝචනයන් පහත හෙළීමෙනන් ස්වභාවික ප්‍රාග්ධනය වෙත ප්‍රතිලාභ සැලසේ.




**අපගේ ශාඛා නිසි විශාලත්වයෙන් යුතුව සැකසීමේ ව්‍යාපෘතිය වසර තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එහිදී අප විසින් ප්‍රශස්ත අවකාශ භාවිතය සහ අපගේ ඩිජිටල් සේවා ව්‍යාප්තිය කෙරෙහි අවධානය යොමු කරන ලදී.**

### නිෂ්පාදිත ප්‍රාග්ධනයේ සංරචක

**111**
ශාඛා

**62**
කවුළු කාර්යාල

**46**
රන් ණය මෙහෙයුම් ශාඛා

ඩිජිටල් යටිතල පහසුකම්

### නිෂ්පාදිත ප්‍රාග්ධනය හැසිරවීම




### සමස්ත වටිනාකම් නිර්මාණය උදෙසා නිෂ්පාදිත ප්‍රාග්ධනයේ දායකත්වය

අපගේ භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් මගින්, අපගේ පාර්ශ්වකරුවන් වෙත තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා, අපගේ සැපයුම ව්‍යාප්තිය, ගනුදෙනුකාර සේවාව ඉහළනැංවීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කරගැනීමේ අවස්ථාව උදා කෙරේ.

### ප්‍රධාන ප්‍රතිඵල

- කවුළු කාර්යාල 8 ක් අධිශ්‍රේණිගත කරන ලදී.
- 470,000 කට අධික ඩිජිටල් ගනුදෙනු
- ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ ක්‍රියාවලි කාර්යක්ෂමතාවය මගින් සමාගමට සැළකිය යුතු ඉතිරියක් සිදුකර ගත හැකි විය.

### ආශ්‍රිත පාර්ශ්වකරුවන්



### ක්‍රමෝපායික අරමුණු

- ශාඛා නිසි විශාලත්වයෙන් යුතුව සැකසීම
- ගනුදෙනුකාර අත්දැකීම ඉහළනැංවීම
- අපගේ ඩිජිටල් ස්ථාවරය සවිමත් කිරීම
- තිරසාර භෞතික ඉදිකිරීම්

### අවදානම්

- මෙහෙයුම් අවදානම
- තොරතුරු තාක්ෂණ හා තොරතුරු සුරක්ෂිතතා අවදානම

## 2021/22 ඉලක්ක සම්බන්ධයෙන් අත්කරගත් ප්‍රගතිය

| | |
|---|---|
| නිසි විශාලත්වයෙන් යුතු ශාඛා | |
| මනා අවකාශ භාවිතය ඔස්සේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළනැංවීම | |

**ප්‍රගති සූචිය**

| | | | |
|---|---|---|---|
| ආරම්භ කරන ලදී | සිදුකෙරෙමින් පවතී | සම්පූර්ණ කරන ලදී | අත්පත් කර නොගන්නා ලදී |

## තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය




## සාර්ථකත්වය මැනීම

### අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය




### දේපළ,පිරියත හා උපකරණ සංයුතිය




### දේපළ, පිරියත හා උපකරණ වෙත එකතු කිරීම්




**වසර තුළදී දේපළ, පිරියත හා උපකරණ වල 34.75% ක වර්ධනයක් වාර්තා කරන ලදී**

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය

නිෂ්පාදිත ප්‍රාග්ධනය දේපළ, පිරියත හා උපකරණ, ආයෝජන දේපළ සහ භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් ඇතුලුව අපගේ භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් වලින් සමන්විත වේ.

| ශුද්ධ පොත් අගය | | 2022 මාර්තු 31 දිනට රු.මිලියන | 2022 මාර්තු 31 දිනට රු.මිලියන | වර්ධනය |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | දේපළ, පිරියත හා උපකරණ, සින්නක්කර ඉඩම්, බදු පදනමට ගත දේපළ වැඩිදියුණු කිරීම්, මෝටර් රථ, පරිගනක දෘඩාංග, කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ උපාංග වලින් සමන්විත විය. | 1,413.78 | 1,049.25 | 34.74% |
| භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් | භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් ඉඩම් භාවිත කිරීමේ අයිතිය අත්පත් කරගැනීම සඳහා පෙරදායක වූ කල්බදු වාරික සහ ඉඩම් භාවිත කිරීමේ අයිතය සහිත බදු දේපළ වලින් සමන්විත විය. | 1,972.38 | 2,242.44 | (12.04)% |
| ආයෝජන දේපළ (සමූහය) | හැව්ලොක් පාර අංක 7 සහ 9 දරණ ස්ථායන්හි පිහිටි පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සතු ඉඩම සහ ගොඩනැගිල්ල මහජන බැංකුව, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී වෙත කුලී පදනම මත ලබාදෙන ලදී. වර්ග අඩි ප්‍රමාණය අනුව, මහජන බැංකුව වෙත කුලියට ලබාදෙන ලද කොටස, සමූහයේ ආයෝජන දේපළ වල වටිනාකම වේ. | 820,66 | 820.66 | - |

GRI 102-6

## භෞතික යටිතල පහසුකම්

අපගේ භෞතික යටිතල පහසුකම් අතරට, දිවයිනේ පළාත් නවය පුරා විසිරුනු ශාඛා 111ක් , කවුලු කාර්යාල 62ක් සහ රන් ණය මෙහෙයුම් ශාඛා 46ක් ඇතුළත් වේ.

| | මුලු ණය කළඹෙහි % | ශාඛා | කවුලු කාර්යාල | රන් ණය මෙහෙයුම් ශාඛා |
|---|---|---|---|---|
| මධ්‍යම පළාත |  | 11 | 7 | 8 |
| නැගෙනහිර පළාත |  | 8 | 8 | 3 |
| උතුරු මැද පළාත |  | 7 | 6 | 4 |
| වයඹ පළාත |  | 11 | 7 | 4 |
| උතුරු පළාත |  | 7 | 6 | 6 |
| සබරගමුව පළාත |  | 9 | 10 | 2 |
| දකුණු පළාත |  | 16 | 9 | 3 |
| ඌව පළාත |  | 6 | 5 | 1 |
| බස්නාහිර පළාත |  | 36 | 4 | 15 |
| **එකතුව** |  | **111** | **62** | **46** |

### භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

- කවුලු කාර්යාල 08 ක් අධිශ්‍රේණිගත කෙරිණි
- ශාඛා 02 ක් නිසි විශාලත්වයට පත් කරන ලදී
- රන් ණය මෙහෙයුම් ශාඛා 05 ක් පිහිටුවන ලදී
- ශාඛා ප්‍රති ස්ථානගත කිරීම් 05 ක් සිදුකරන ලදී

අවකාශ භාවිතය උපරිම මට්ටමකට ගෙනඒම සඳහා ශාඛා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම ඔස්සේ අප විසින් අපගේ ශාඛා අවකාශ ප්‍රශස්තීකරණ ව්‍යාපෘතිය අඛණ්ඩවම දියත් කරන ලදී. පහළ මට්ටමේ පැවති ශාඛා කිහිපයක් සුපිරි පරිශ්‍රයන්හි ප්‍රතිස්ථාපනය කරමින් අපගේ සේවා සැපයුම ව්‍යාප්ත කිරීමද මෙහිදී සිදුවිය.

මේ අතර, අපගේ සියලු පරිශ්‍රයන්හි ඉහළම ආරක්ෂණ ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කරමින් අප විසින් අපගේ ගනුදෙනුකරුවන්ගේ හා සේවකයින්ගේ සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව තහවුරු කිරීමටද පියවර ගන්නා ලදී.

GRI 416-1

### ඩිජිටල් යටිතල පහසුකම්

ඩිජිටල්කරණය වෙත ශීඝ්‍ර පරිවර්තනය සහ පශ්චාත් කෝවිඩ් 19 නව සේවා ආකෘතීන් වෙත ප්‍රතිචාර දක්වමින්, අප විසින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වෙත අඛණ්ඩව ආයෝජන සිදුකරමින් දිගින් දිගටම අපගේ ඩිජිටල් වටිනාකම් වපසරිය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී. වසර තුළදී අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සවිමත් කිරීම සඳහා රු.මිලියන 132.50 ක ආයෝජන සිදුකරන ලදී. අපගේ ඩිජිටල්කරණ ප්‍රයත්නයන් පිළිබඳ වැඩිදුර තොරතුරු පිටු අංක 80 සිට 87 දක්වා ඉදිරිපත් කොට ඇති බුද්ධිමය ප්‍රාග්ධන වාර්තාවේ ඇතුළත් වේ.

### ඉදිරි ගමන් මග

**2022/23 කෙටි කාලීන**

- ඇතැම් ක්‍රියාකාරී අංශයන් විමධ්‍යගත කරමින් ගනුදෙනුකරුවන් වෙත වඩාත් කඩිනම් සේවාවක් සැලසීම සඳහා ශාඛාවන් වෙත වැඩි ස්වයංතීරණ හැකියාවක් ලබාදීම.
- මනා අවකාශ භාවිතය ඔස්සේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

**මධ්‍ය කාලීන වසර 3**

- ගනුදෙනුකාර පහසුව තහවුරු කිරීම උදෙසා සමාගමෙහි සැලසුම් තාක්ෂණික විශේෂාංග සමගින් යාවත්කාලීන කිරීම
- සමාගම තුළ පරිසර හිතකාමී පියවරයන් ප්‍රවර්ධනය සහ ශාඛා ජාලය නඩත්තු කිරීම

**දිගු කාලීන**

- හරිත ශාඛාවන් ස්ථාපනය කිරීම

### නිෂ්පාදිත ප්‍රාග්ධන හුවමාරු

නිෂ්පාදිත ප්‍රාග්ධනය වෙත සිදුකෙරෙන ආයෝජනයන් කෙටි කාලීනව මූල්‍ය ප්‍රාග්ධනය වෙත අයහපත් ආකාරයෙන් බලපාන නමුත්, එමගින් අත්පත් කරගනු ලබන කාර්යක්ෂමතාවයන් දිගු කාලීනව මූල්‍ය ප්‍රාග්ධනය වෙත යහපත් බලපෑමක් ඇති කරයි.

ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය මගින් සේවක ඵලදායීතාවය සහ චිත්ත ධෛර්‍යය වර්ධනය කෙරේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය ඉහළ නැංවීම මගින් සිදුකරන ලද මෙහෙයුම් කාර්යක්ෂමතාවයන් ගනුදෙනුකාර තෘප්තිය වර්ධනය කරන අතර, එය සමාජ හා සබඳතා ප්‍රාග්ධනය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කරයි.

කාර්යක්ෂම අවකාශ භාවිතය සහ අධික ඩිජිටල්කරණය මගින් සම්පත් පරිභෝජනය පහත හෙළනු ලබන අතර එය ස්වභාවික ප්‍රාග්ධනය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කරයි.



# බුද්ධිමය ප්‍රාග්ධනය

පීපල්ස් ලීසිං වැනි දැනුම මත පදනම් වූ සේවා සමාගම් වල පාර්ශ්වකරුවන් වෙත තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා බුද්ධිමය ප්‍රාග්ධනය පාදක වේ. එය, ඉහළයමින් පවතින තරගාකාරීත්වය සහිත වටපිටාවක් තුළ විවිධාංගීකරණය වීම සහ ප්‍රමුඛ තරගකාරී වාසිය ලඟාකර ගැනීම මූලයක්ද වේ.

## බුද්ධිමය ප්‍රාග්ධනයේ සංරචක




## බුද්ධිමය ප්‍රාග්ධනය හැසිරවීම




### සමස්ත වටිනාකම් නිර්මාණය වෙත බුද්ධිමය ප්‍රාග්ධනයෙහි දායකත්වය

පීපල්ස් ලීසිං වෙත ප්‍රමුඛ ශක්තියක් සහ තරගකාරී විවිධාංගීකරණ අගංයක් වශයෙන් බුද්ධිමය ප්‍රාග්ධනය වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය කෙරෙහි අඛණ්ඩ දායකත්වයක් සපයයි. මෙහිදී ගනුදෙනුකරුවන් හට විශිෂ්ට සේවාවක් ලබාදීම සඳහා පරිපූර්ණ සැලසුම් කළඹ, සන්නාම ප්‍රතිරූපය, ආයතනික වටපිටාව, සේවකයින්ගේ දැනුම සහ පද්ධතීන් සහ ක්‍රියාවලීන් යාවත්කාලීන කිරීම සාමූහික දායකත්වයක් දක්වයි.

### ප්‍රධාන ප්‍රතිඵල

- රු. බිලියන 651 ක සන්නාම වටිනාකම
- සමුච්චිත අත්දැකීම
- ඩිජිටල් පරිවර්තනය
- කල්බදු ක්ෂේත්‍රයේ වඩාත්ම ජනාදරයට පත් සන්නාමය
- සමෝධානික වාර්ෂික වාර්තාව සඳහා අග්‍රගන්‍ය ඇගයුම් සහ සම්මාන

| පාර්ශ්වකරුවන් | ක්‍රමෝපායික අරමුණු | අවදානම් |
|---|---|---|
|  | • තිරසාර වර්ධන අත්කර ගැනීම සඳහා කටයුතු කිරීම<br>• ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>• අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය | • කීර්තිනාම අවදානම<br>• තොරතුරු තාක්ෂණ සහ තොරතුරු සුරක්ෂිතතා අවදානම |

## 2021/22 ඉලක්ක සම්බන්ධයෙන් අත්කර ගත් ප්‍රගතිය

| | |
|---|---|
| **ව්‍යාපාරික ක්‍රියාවලීන් ප්‍රති සැකසුම**<br>ප්‍රාදේශීය මෙහෙයුම් නිරීක්ෂණ ක්‍රමවේදයන් සාර්ථකව ක්‍රියාවට නංවන ලද අතර ණය අනුමැති ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා CAPP ක්‍රියාවලිය හඳුන්වාදෙන ලදී. | සිදුකෙරෙමින් පවතී |
| **කඩදාසි රහිත කාර්යාල ව්‍යාපෘතිය**<br>අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඩිජිටල් මාධ්‍යයෙන් සැකසීම සහ e-memo (විද්‍යුත් මෙමෝපත්) සහ DCHEQUE ක්‍රියාවලීන් හඳුන්වාදෙන ලදී. | සිදුකෙරෙමින් පවතී |

**ප්‍රගති සූචිය**

| ආරම්භ කරන ලදී | සිදුකෙරෙමින් පවතී | සම්පූර්ණ කරන ලදී | අත්පත් කර නොගන්නා ලදී |
|---|---|---|---|

## තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය




## සාර්ථකත්වය මැනීම

### කාර්යක්ෂමතාවය (ආදායමට පිරිවැය)




### සන්නාම වටිනාකම සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය




### ව්‍යාංගිත දැනුම




බ්‍රෑන්ඩ් ෆිනෑන්ස්, ශ්‍රී ලංකා (Brand Finance Lanka) මගින් සන්නාම වටිනාකම රු. බිලියන 6.51 ක් වශයෙන් තක්සේරු කරන ලදී.

# බුද්ධිමය ප්‍රාග්ධනය




## ඇගයුම්

- ලෝක බැංකුකරණ සහ මූල්‍ය සම්මාන උළෙලේදී බැංකු නොවන මූල්‍ය ආයතන කාණ්ඩයේ "The Next 100 Global Awards 2021" අතරට ශ්‍රේණිගත විය.
- LMD මගින් 2021 සඳහා ලංකාවේ වඩාත් ගෞරවනීය ආයතන අතර 48 වැනි ස්ථානයට ශ්‍රේණිගත කරන ලදී.
- 2021 දී Bñiness Today මගින් "විශිෂ්ටතම 40" අතර 27 වැනි ස්ථානයට ශ්‍රේණිගත කරන ලදී.
- 2021 Brands Annual මගින් ඉහළම ශ්‍රේණිගත මූල්‍ය සේවා සම්පාදකයා වශයෙන් ශ්‍රේණිගත කරන ලදී.
- 2021 Brands Annual මගින් ලීසිං ක්ෂේත්‍රයේ "ශ්‍රී ලංකාවේ වඩාත්ම ආදරණීය සන්නාමය" වශයෙන් 1 ස්ථානයට ශ්‍රේණිගත කරන ලදී.
- 2021 Transparency of Corporate Reporting (TRAC) මගින් සංවිධානය කරන ලද උළෙලේදී ශ්‍රී ලංකාවේ පොදු ලැයිස්තුගත සමාගම් 75 ක් අතුරින් විශිෂ්ටතම සමාගම් 20 අතරට තෝරාගැනුනි.



## වාර්ෂික වාර්තා සම්මාන

- සම දෙවන අනුශූරතාවය (කාණ්ඩය: මූල්‍ය සේවා) –
  පීපල්ස් ලීසිං වාර්තාව SAFA විශිෂ්ට ලෙස ඉදිරිපත්කළ වාර්ෂික වාර්තා සම්මාන, සමෝධානික වාර්තාකරණ සම්මාන සහ ආයතනික පාලනය වාර්තාකරණය ඇගයීම සඳහා SAARC සාංවත්සරික සම්මානවලදී හවුල් ජයග්‍රහකයා බවට පත්විය.
- මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් අතර රජත සම්මානය
  ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි 56 වැනි වාර්ෂික වාර්තා සම්මාන උළෙලේ (රු. බිලියන 20 ට ඉහළ සමස්ත වත්කම්) කාණ්ඩය
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, 2021 CMA සමෝධානික වාර්තාකරණ විශිෂ්ටත්ව සම්මාන උළෙලේදී ''විශිෂ්ටතම වාර්ෂික වාර්තා දහය''අතරට ශ්‍රේණිගත විය.
- 2021 CMA සමෝධානික වාර්තාකරණ විශිෂ්ටත්ව සම්මාන උළෙලේදී ''ක්‍රමෝපායික අවධානය සම්බන්ධ විශිෂ්ටතම වාර්ෂික හෙළිදරව් කිරීම'' සම්මානය



# බුද්ධිමය ප්‍රාග්ධනය

GRI 102-2

## අපගේ සන්නාමය

වසර තුළදී අප විසින් අපගේ 25 වැනි සංවත්සරය සමරන ලද අතර එය මෙම ව්‍යාපාරික චාරිකාව සිදුකිරීම සඳහා දායක වූ අපගේ ගනුදෙනුකරුවන් වෙත ප්‍රණාමය පුදකිරීමට සුදුසු අවස්ථාවක් වශයෙන් යොදාගැනුනි. ඔවුන්ගේ සහයෝගය හේතුවෙන් අප හට මෙම සන්ධිස්ථානීය වසරේදී කල්බදු කෂේත්‍රයෙහි ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනාදරයට පත් සන්නාමය බවට පත්වීමට හැකි වූ අතර, එමගින් ගනුදෙනුකරුවන් වෙත නිර්මාණය කරන ලද වටිනාකම සහ ආයතනික වටිනාකම් කෙරෙහි වූ අප්‍රතිහත කැපවීම ඔස්සේ අප විසින් ගොඩනංවා ගන්නා ලද කීර්තිනාමය පිළිබඳව තවදුරටත් තහවුරු විය. 2022 දී බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ලංකා මගින් අපගේ සන්නාම වටිනාකමද රු.බිලියන 6.51 ක් වශයෙන් තක්සේරු කරන ලදී. ඉහත පිටුවේ දැක්වෙන සම්මාන මගින්, ගනුදෙනුකරුවන් 380,000 කට අධික සංඛ්‍යාවක් වෙත මූල්‍ය පහසුකම් සලසමින්, ඔවුන්ගේ ව්‍යාපාරයන් වර්ධනය කරගැනීම සඳහා මගපෑදීම කෙරෙහි අප විසින් දරන ලද ප්‍රයත්නයෙහි සාර්ථකත්ව සනාථ වේ.

අපගේ කාර්යසාධනය වාර්තා කිරීමේදී විනිවිදභාවය කෙරෙහි වන අපගේ කැපවීම සන්නාමය ගොඩනැංවීම සඳහා දායක විය. පීපල්ස් ලීසිං GRI අනුකූලතිය සමග තිරසාර වාර්තාකරණය කල්තබා ආදේශ කරගත් සමාගමක් වන අතර, වසර ගණනාවක් තිස්සේ සමෝධානික වාර්තාකරණ ආකෘතිය වර්ධනය කිරීමෙහි නිරතව සිටී. වර්තමානයේදී වඩාත් හොඳින් දන්නා පරිදි වාර්තාකරණ විශිෂ්ටත්වය අත්පත් කරගැනීමෙහිලා වන අපගේ නිරන්තර ප්‍රයත්නය දෙස් විදෙස් සම්මාන උළෙල වලදී බෙහෙවින් ඇගයුමට ලක් විය. පසුගිය දශකය පුරා අප විසින් ආයතනික වාර්තාකරණය සම්බන්ධ බොහෝ සම්මාන දිනාගන්නා ලද අතර පසුගිය වසරේදීද එලෙසින්ම අපව ඇගයුමට ලක් විය. වාර්තාකරණ වසරේදී දිනාගන්නා ලද සම්මාන පිළිබඳව ඉහත පිටුවේ දැක්වේ. පිටු අංක 124 සිට 155 දක්වා වන ආයතනික පාලන වාර්තාව මගින් අපගේ පාලනය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සමෝධානික වාර්තාකරණය ආදේශ කරගනු ලබන ආකාරය පිළිබඳව තවදුරටත් විස්තර කෙරේ. මෙකී ශීඝ්‍රයෙන් පරිණාමය වන්නා වූ වපසරිය තුළ විශිෂ්ටත්ව කඩඉම් නිර්මාණය කිරීමෙහිලා අපි අඛණ්ඩව කැපවී ක්‍රියාකරමු.

PEOPLE'S LEASING
පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்
25
වසරක් රටම ඉදිරියට ගෙන ගිය ඔබට ස්තුතියි



## ඩිජිටල් පරිවර්තනය

පීපල්ස් ලීසිං මගින්, සිය සේවකයින් හට එදිනෙදා කාර්යභාරයන් වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා යෙදවුම් කිහිපයක් හඳුන්වාදෙමින්, සිය ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය සම්බන්ධ සැළකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදී.

පීපල්ස් ලීසිං මගින් මෑතකදී වඩාත් පහසු භාවිත අත්දැකීමක් සලසනු පිණිස සිය ජංගම යෙදවුම වන PLC Touch හඳුන්වාදෙන ලදී. මෙම නවීන යෙදවුම ශ්‍රී ලංකාවේ පළමු වරට බැංකුකරණ යෙදවුමක අන්තර්ගත රක්ෂණ විශේෂාංගයකින්ද සමන්විත වේ.

පීපල්ස් ලීසිං මෙම වර්ගයේ පහසුකමක් වෙළඳපොල වෙත හඳුන්වාදෙන ලද පළමු බැංකු නොවන මූල්‍ය ආයතනය වේ. මෙමගින් කේත පදනම් කරගත් භාවිත බිල්පත් ගෙවීම්, ඕනෑම ශාඛාවක කවර හෝ වෙනත් ගිණුමක ක්‍රියාකාරකම් හසුරුවිය හැකි අතර ඉතුරුම් කළමනාකරණය, යෙදවුම ඔස්සේ ඕනෑම බැංකුවක් හරහා පීපල්ස් ලීසිං ණය හා කල්බදු වාරික ගෙවීමේ පහසුව, හදිසි අනතුරකදී "Call & Go" විශේෂාංගය මගින් සරලව හිමිකම්පෑමේ ක්‍රියාවලිය සිදුකරගැනීමේ සහ බාධාකාරී ලේඛණගත ක්‍රියාවලින් තොරව නව රක්ෂණ සැලසුමක් ලබාගැනීමේ අවස්ථාව උදාවේ.







පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී මගින් එහි පරිපාලිතයක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස් සහ මහජන බැංකුව සමග එක්ව ගනුදෙනුකාර පහසුව ඉහළ නංවමින් සියලුම ගනුදෙනුකරුවන් සඳහා බහුවිධ සේවා පදනමක් හඳුන්වාදෙන ලදී. මෙකී නවතම සේවා පහසකම "People's Pay Way" නමින් හඳුන්වාදෙන ලද අතර මේ වන විට මහජන බැංකුවේ ස්වයං බැංකුකරණ ඒකක මගින් පීපල්ස් ලීසිං හි කල්බදු/ණය වාරික, රන් ණය ගෙවීම් සහ පීපල්ස් ඉන්ෂුවරන්ස්හි රක්ෂණ වාරික ගෙවීම් සඳහා පහසුකම් සලසනු ලැබේ. ගනුදෙනුකරුවන් හට සිය වාරික හෝ සෙසු කවර හෝ ගෙවීමක් මුදල් මාර්ගයෙන් "People's Pay Way" ඔස්සේ මුදල් තැන්පතු යන්ත්‍ර මාර්ගයෙන් හෝ ණය/හර කාඩ්පත් භාවිත කරන්නේ නම් මහජන බැංකු KIOSK මගින් සිදු කල හැකි වේ.

CAPP හඳුන්වාදීමත් සමග අපගේ විකිණුම් කණ්ඩායම් සවිබලගැන්වුනු අතර එහිදී, ගනුදෙනුකාර සේවා සැකසුම් කාලය සැළකිය යුතු අයුරින් අවම කරමින්, ණය යෝජනාපත්‍ර අන්තර්ජාලගත පෝටලයක් ඔස්සේ සිදුකිරීමේ අවස්ථාව හිමි විය.

DCHEQUE යනු පීපල්ස් ලීසිං තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින් මහජන බැංකුවේ සහයෝගීතාවයෙන් යුතුව සකසන ලද තවත් ඩිජිටල් පරිවර්තනීය ව්‍යාපෘතියක් වේ. මෙම නව ගෙවීමේ වපසරිය SLIPS, CEFT, RTGS සහ අභ්‍යන්තර අරමුදල් මාරුකිරීමේ වරණයන්ගෙන් සමන්විත වේ. මෙකී සේවා පදනම මගින් නිකුත් කරන ලද ගෙවීමේ නිශ්චය කරගැනීම සඳහා වඩාත්ම ආරක්ෂිත හා පාලිත ක්‍රමවේදයක් තහවුරු කිරීම උදෙසා මෙම විසඳුම මහජන බැංකුව සමග නිර්මාණය කොට අතුරු මුහුණත්ගත කරන ලදී. මෙමගින් සමාගමෙහි ගෙවීම් ස්වයංක්‍රීයකරණය කරමින්, සුරක්ෂිත අනුමැති ක්‍රියාවලියක් මත පදනම්ව, ඩිජිටල් අත්සන් මුද්‍රණය මගින් භෞතික අත්සන් අවශ්‍යතාවය බැහැර කෙරෙනු ඇත.

**අන්තර්ජාලගත පදනම් වල ඵලදායීත්වය**

| | |
|---|---|
| මුලු ක්‍රියාකාරී භාවිත කරන්නන් | 97 |
| ක්‍රියාකාරී මාධ්‍යයන් | 53 |
| අමුත්තන් | 1 |
| සංවිධානය කරන ලද රැස්වීම් | 512 |

# බුද්ධිමය ප්‍රාග්ධනය

## ඩිජිටල් ගනුදෙනු පරිමාවන්




## ඩිජිටල් ගනුදෙනු වටිනාකම්




අපගේ ඩිජිටල් පරිවර්තන ප්‍රයත්නයෙහි කොටසක් වශයෙන් ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් කිහිපයක්ද සිදුකෙරිණි. අපගේ මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) ඉහළනංවන ලද අතර සේවක දැනුම හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නංවනු වස් නව අධ්‍යයන කළමනාකරණ විසඳුමක් (LMS) ක්‍රියාවට නංවන ලදී. මේ අතර, කඩදාසි රහිත ව්‍යාපෘතින්හි කොටසක් වශයෙන් නව තොග කළමනාකරණ ක්‍රමවේදයක් සහ ඉලෙක්ට්‍රොනික චක්‍රලේඛ කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතියක්ද ක්‍රියාවට නැංවෙමින් පවතී.

## අපගේ සංස්කෘතිය

ආයතනික සංස්කෘතික වටපිටාව මගින් ආයතනයක් වශයෙන් අප කව්රුන්ද යන්න නිර්වචනය කෙරේ. පීපල්ස් ලීසිං මගින් අපගේ වටිනාකම් අවධාරනය කෙරෙන්නා වූ විවෘත හා සහයෝගී සේවා වටපිටාවක් නිර්මාණය කෙරේ. මෙහිදී පාර්ශ්වකාර අපේක්ෂාවන් සමතුලනය කිරීම පිළිබඳව හොඳින් හඳුනාගනිමින්, විශේෂයෙන්ම පසුගිය වසර තුනක කාලය පුරා අප අත්විඳි බරපතල ආතතිමය තත්ත්වයන් තුළ සුදුසු අයුරින් අදාළ අපේක්ෂාවන් ප්‍රතිචාර්ගීකරණය කිරීමේ අවශ්‍යතාවය අවබෝධ කරගැනුනි. ක්‍රියාවලි සහ අවදානම පිළිබඳ නිසි අවධානය සමගින් ගනුදෙනුකාර කේන්ද්‍රීයත්වය සමතුලනය කරන ලදී. අඛණ්ඩව පරිණාමය වන්නා වූ සමාගමක් තුළ වෙනස්කම් සිදුකිරීමේ හිමිකාරීත්වය දරමින් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා සෑමවිටම සේවකයින් දිරිගන්වන ලදී. සමාගම ඇතුළත සිදුවන ඩිජිටල් පරිවර්තනය අපගේ සේවකයින්ගේ ඵලදායීත්ව වෙනසකට ලක් කරන අතරම විවිධ තලයන්හි ඔවුන්ගේම ඩිජිටල් චාරිකාවන් තුළ සැරිසරන්නා වූ ගනුදෙනුකරුවන් සමග සම්බන්ධ වූ ඩිජිටල් හැකියාවන්ගෙන් පරපූර්ණ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම කෙරෙහිද දායක වේ. එය, විවිධත්වයෙන් යුතු නිපුණතා, පරිශ්‍රයන්, ස්ත්‍රී පුරුෂභාවය, ජාතිකත්වය, ආගම, වයස සහ වෙනත් ක්‍රියාපටිපාටීන්ගෙන් පෝෂණය ලබන සේවා වටපිටාවක් වන අතර එහිදී අප විසින් අපගේ දර්ශනය, මෙහෙවර සහ ඉලක්ක සාක්ෂාත් කරගැනීමෙහිලා එකාවන්ව කටයුතු කරනු ලැබේ.




## ව්‍යාංගිත දැනුම, නිපුණතා සහ පළපුරුද්ද

පීපල්ස් ලීසිං මගින්, අපගේ ව්‍යාපාර කටයුතු සිදුකෙරෙන ආකාරය කෙරෙහි පාදක වන, සමාග මෙහි ව්‍යාංගිත දැනුම හසුරවන්නා වූ අපගේ සේවකයින් පුහුණු කිරීම, උපදෙස් දීම සහ සංවර්ධනය කෙරෙහි කැපවී කටයුතු කරනු ලැබේ. විධිමත් පුහුණුවක් ඇසුරින් සිදුකෙරෙන්නා වූ, නව පරම්පරාවේ සේවකයින් වෙත විශේෂඥභාවය සහ පළපුරුද්ද ලබාදෙන්නා වූ වසර ගණනාවක් තිස්සේ සිදුකෙරෙන උපදේශන ක්‍රියාවලිය අතිශය වැදගත් වේ. ව්‍යාංගිත දැනුම වෙත සහයෝගය දක්වන සේවකයින් රඳවාගැනීම සඳහා සමාගම මගින් තරගකාරී පාරිශ්‍රමික ගෙවනු ලැබේ. දනට යළි ආරම්භ කොට ඇති වසංගතය මගින් බාධා පමුණුවන ලද පුහුණු පසුබිමක අප විසින් ව්‍යාංගිත දැනුම පිළිබඳව සැළකිය යුතු විශ්වාසයක් තබන ලද බව මෙහිදී පැවසුව මනාය.

පසුගිය වසර තුනක කාලය තුළ එල්ල වූ දැවැන්ත අභියෝගයන් ජයගැනීම සඳහා විසඳුම් සෙවීමේදී අත්පොත් වල උපදේශයන්ට වඩා සමාගම තුළ පැවති ව්‍යාංගිත දැනුම උපකාරී වූ අතර ඒ නිසාම අප ඒ පිළිබඳව තබන විශ්වාසයද වර්ධනය විය. අප විසින් අපගේ ඩිජිටල් සේවා චාරිකාව තුළ ඉදිරියට යන අතරතුර, අපගේ සේවකයින්ගේ ව්‍යාංගිත දැනුම උකහා ගනිමින් එය ඩිජිටල් යුගයට සරිලන පරිදි හැඩගස්වා ගැනීම වෙළඳපොළ තුළ අපගේ තරගකාරී අන්තය පවත්වා ගැනීමෙහිලා අතිශය වැදගත් සාර්ථකත්ව සාධකයක් වනු ඇත.

## සේවකයකුට සාමාන්‍යය පුහුණු පැය ගණන



## ඉදිරි ගමන්මග

| 2022/23 කෙටි කාලීන | මධ්‍ය කාලීන වසර 3 | දිගු කාලීන |
|---|---|---|
| • විශේෂඥයින්ගේ සහභාගීත්වය අඩු කිරීම මගින් ණය තක්සේරුව විධිමත් කිරීම සඳහා නව ණය සම්භව විසඳුම්<br>• නව අක්‍රමිකතා කළමනකරන විසදුමක් හදුන්වාදීම - සිය ඒකරාශී කිරීමේ ප්‍රයත්නයන් අනුකූලනය සදහා අයකර ගැනීමේ නියෝජිතයන් සවිබල ගන්වන්නා වූ නව ඒකරාශී කිරීමේ විසදුමක්<br>• ඩිජිටල් KYC - e KYC සහ වීඩියෝ සහභාගීත්ව KYC වශයෙන කොටස් දෙකකින් සමන්විත වේ. වඩාත්ම සුදුසු විසදුම පවතින විදසුමක් අත්පත් කරගැනීමෙන් හෝ අභ්‍යන්කරව සකසන ලද විසදුමක් ආශ්‍රයෙන් තෝරාගනු ලැබේ. | • කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS)/ව්‍යාපාර බුද්ධිමය (BI) මෙවලමක් ස්ථාපනය කිරීම - තීරණ ගැනීමේ කාර්ය මණ්ඩලය සවිබලගැන්වීමේ අරමුණින් යුතුව ක්ෂේත්‍රයේ බහුලව භාවිත කෙරෙන ව්‍යාපාර බුද්ධි මෙවලම භාවිත කරන ලදී | • සම්පූර්ණ තොරතුරු තාක්ෂණ සේවය වැඩිදියුණු කිරීම<br>• රොබෝමය ක්‍රියාවලීන් ස්වයාංක්‍රීවකරණය කෘතිම බුද්ධය වැනි නවතම තාක්ෂණයන් ආදේශ කරගැනීම මගින් සාර්ථකත්වය අත්කර ගැනීම |

## බුද්ධිමය දේපළ හුවමාරු

බුද්ධිමය ප්‍රාග්ධනය වෙත සිදුකෙරෙන ආයෝජන කෙටි කාලීනව මූලය ප්‍රාග්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපායි. සන්නාමය පිළිගැනීමෙහි ප්‍රතිපලයක් වශයෙන් වන වර්ධනය වූ සන්නාම වටිනාකම ,දිගු කාලීනව මූල්‍ය ආදායම් කෙරෙහි දායක වේ.

පුහුණු හා උපදේශන වැඩසටහන් ඔස්සේ සේවකයින්ගේ ව්‍යංගිත දැනුම හැසිරවීම මගින් සේවක තෘප්තිය සහ සේවක සහභාගීත්ව මටටම් කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කෙරේ.

ඉහළ නංවන ලද සන්නාම ප්‍රතිරූපය මගින් දිගු කාලීන ගනුදෙනුකාර විශ්වාසය සහ සබඳතා සවිමත් කරනු ලැබේ. සවිමත් සන්නාම වටිනාකමක් ව්‍යාපාර සහකරුවන් සහ ප්‍රජාව සමග සබදතා සදහා ක්‍රියාකාරී දායකත්වයක් සපයයි.

ඩිජිටර්කරණ සහ ස්වයංක්‍රීයකරණ ව්‍යපෘතීන් මගින් පරිසරය කෙරෙහි වන සෘජු බලපෑම පහත හෙළන ලදී.



# මානව ප්‍රාග්ධනය

**අපගේ සේවකයින්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා පුහුණුව හා සංවර්ධනය කෙරෙහි අවධානය යොමුකරන අතරතුර වසංගත තත්ත්වය හේතුවෙන් ඔවුන් වෙත ඇති වූ අහිතකර බලපෑම සමනය කිරීම සඳහා අපි කැප වී කටයුතු කළෙමු.**

### මානව ප්‍රාග්ධන සංරචක



අපගේ සේවකයින්ගේ විවිධත්වයෙන් නිපුණතා, සුදුසුකම් සහ අධ්‍යාපන මට්ටම්



අපගේ ජ්‍යෙෂ්ට කණ්ඩායමෙහි සේවා පළපුරුද්ද



අපගේ සේවකයින්ගේ කැපවීම සහ ප්‍රයත්නය

### මානව ප්‍රාග්ධනය හැසිරවීම




### සමස්ත වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා මානව ප්‍රාග්ධනයේ දායකත්වය

සේවා සමාගමක් වශයෙන්, 2,245 දෙනෙකුගෙන් සැදුම්ලත් අපගේ සේවා කණ්ඩායම සේවා ගුණාත්මකභාවය සහ ගනුදෙනුකාර තෘප්තිය වෙත සෘජුව දායක වෙමින්, අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

### ප්‍රමුඛ ප්‍රතිඵල

- ඉහළ මට්ටමේ ගනුදෙනුකාර තෘප්තිය
- අවම බාධා යටතේ අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යාම
- නව පහසුකම් හඳුන්වාදීම
- සේවය කිරීම සඳහා කදිම පරිශ්‍රයක් නිර්මාණය කිරීම

| ආශ්‍රිත පාර්ශ්වකරුවන් | ක්‍රමෝපායික අරමුණු | අවදානම් |
|---|---|---|
|  | • තිරසාර වර්ධනය උදෙසා කටයුතු කිරීම<br>• අපගේ සේවකයින් ඔස්සේ විවිධාංගීකරණය<br>• නායකත්ව පෙළක් නිර්මාණය කිරීම<br>• නායකත්වය | • මානව සම්පත් අවදානම |

## 2021/22 ඉලක්ක සම්බන්ධයෙන් අත්කරගත් ප්‍රගතිය

| | | | |
|---|---|---|---|
| පුහුණුව හා සංවර්ධනය ඔස්සේ සේවක දැනුම වර්ධනය කරන ලදී.<br>**අත්කර ගත් ප්‍රගතිය**<br>වසර තුළදී ඉලෙක්ට්‍රොනික අධ්‍යයන පද්නම් ඔස්සේ පුහුණු පැය 62,742.55 ක් පවත්වන ලදී. | | | සම්පූර්ණ කරන ලදී |
| **ප්‍රගති සූචිය** | | | |
| ආරම්භ කරන ලදී | සිදුකෙරෙමින් පවතී | සම්පූර්ණ කරන ලදී | අත්පත් කර නොගන්නා ලදී |

## තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි දායකත්වය




## සාර්ථකත්වය මැනීම

### සේවක ඵලදායීතාවය




■ ලාභය/සේවකයා (රු.මිලියන)
■ ආදායම/සේවකයා (රු.මිලියන)

### මුළු පුහුණු පැය




### සේවකයින් වෙත සමස්ත ගෙවීම්




**සේවකයින් අතර ඉහළ තෘප්තිමත්භාවයක් විදහා දක්වමින් පසුගිය වසර තුනක කාලය පුරා රඳවාගැනීමේ අනුපාතය 91.59% ක සාමාන්‍යය අගයක් වාර්තා කළේය.**

GRI | 102-8,405-1

## කණ්ඩායම් ස්වරූපය

### ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවක විශ්ලේෂණය *

| පුරුෂ | වයස අනුව | ස්ත්‍රී |
|---|---|---|
| 511 | 29 ට අඩු සහ සමාන | 178 |
| 825 | 30-39 | 275 |
| 282 | 40-49 | 71 |
| 61 | 50-59 | 16 |
| 22 | Over 60 | 4 |

| සේවක කාණ්ඩය | වයස විශ්ලේෂණය (අවුරුදු) | | | | |
|---|---|---|---|---|---|
| | > 60 | 50 - 59 | 40 - 49 | 30 - 39 | <= 29 |
| ජ්‍යෙෂ්ඨ නායකත්වය | 1 | 23 | 13 | 2 | - |
| මධ්‍ය කළමනාකරුවන් | - | 8 | 37 | 5 | - |
| රේඛීය කළමනාකරුවන් | | 11 | 87 | 46 | |
| විධායක නිලධාරීන් | | 21 | 153 | 390 | 10 |
| විධායක නොවන නිලධාරීන් | 25 | 5 | 40 | 631 | 656 |
| සුලු සේවකයින් | | 9 | 23 | 26 | 23 |

වයස අනුව මුලු සේවකයින්




| පුරුෂ | පළාත අනුව | ස්ත්‍රී |
|---|---|---|
| 617 | බස්නාහිර | 288 |
| 169 | මධ්‍යම | 51 |
| 102 | නැගෙනහිර | 15 |
| 67 | උතුරු | 11 |
| 269 | දකුණු | 62 |
| 128 | සබරගමුව | 33 |
| 98 | උතුරු මැද | 20 |
| 139 | වයඹ | 41 |
| 112 | ඌව | 23 |

පළාත අනුව මුලු සේවකයින්




| පුරුෂ | සේවා නියුක්ති මට්ටම අනුව | ස්ත්‍රී |
|---|---|---|
| 33 | ජ්‍යෙෂ්ඨ නායකත්වය | 6 |
| 46 | මධ්‍ය කළමනාකරුවන් | 4 |
| 121 | රේඛීය කළමනාකරුවන් | 23 |
| 455 | විධායක නිලධාරීන් | 119 |
| 966 | විධායක නොවන නිලධාරීන් | 391 |
| 80 | සුලු සේවක | 1 |

ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවකයින්




### ගිවිසුම් වර්ගය අනුව සේවක විශ්ලේෂණය

| | ස්ථිර | පරිවාස | ගිවිසුම් | තාවකාලික |
|---|---|---|---|---|
| පුරුෂ | 1594 | 83 | 24 | 10 |
| ස්ත්‍රී | 511 | 24 | 9 | 10 |
| | | | | |
| බස්නාහිර | 855 | 35 | 15 | 7 |
| මධ්‍යම | 212 | 5 | 3 | 3 |
| නැගෙනහිර | 102 | 14 | 1 | 0 |
| උතුරු | 71 | 6 | 1 | 1 |
| දකුණු | 311 | 15 | 5 | 2 |
| සබරගමුව | 152 | 9 | 0 | 3 |
| උතුරු මැද | 106 | 10 | 2 | 3 |
| වයඹ | 167 | 9 | 4 | 1 |
| ඌව | 129 | 4 | 2 | 0 |

** සමස්ත ශ්‍රම බලකාය පූර්ණ කාලීන සේවකයින්ගෙන් සැදුම්ලත් විය.*

GRI 102-16, 407-1

## මානව සම්පත් පාලනය

මානව සම්පත් ක්‍රියාකාරකමෙහි විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීම උදෙසා දෘඩ පාලන ආකෘතියක් ස්ථාපනය කොට ඇත. ප්‍රධාන විධායක සහ අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය සමගින් මානව සම්පත් ක්‍රමෝපාය සැකසීමේ සහ මෙහෙයුම්කරණයේ වගකීම මානව සම්පත් අංශය සතු වේ. මානව සම්පත් අංශය සමග සිදුකරන ලද සමාලෝචනයන් මත පදනම්ව නිර්දේශ ඉදිරිපත් කරමින් පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වයි.

මානව ප්‍රාග්ධනය ඵලදායී අයුරින් කළමනාකරණය සහ සංවර්ධනය උදෙසා පරිපූර්ණ මානව සම්පත් ප්‍රතිපත්තියක් සකසනු ලැබ ඇත. වෙනස් වන සුලු අවශ්‍යතා පිළිබිඹු වන අයුරින් මෙකී ප්‍රතිපත්තීන් අඛණ්ඩව සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී. වර්ශය තුලදී චර්යාධර්ම සංග්‍රහය සහ විනය පටිපාටිය යාවත්කාලීන කරන ලදා. අප විසින් දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම ආශ්‍රිතව විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපනය කරනු ලැබ ඇත. මේ අතර, වසර තුළදී උසස්වීම් ප්‍රතිපත්තිය, සමාජ මාධ්‍ය ප්‍රතිපත්තිය, දුරස්ථ පිවිසුම් ප්‍රතිපත්තිය, ජංගම දුරකථන භාවිත ප්‍රතිපත්තිය සහ නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය ඇතුලු ප්‍රතිපත්ති කිහිපයක් සමාලෝචනය කොට යාවත්කාලීන කරන ලදී.

අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, මානව සම්පත් ක්‍රියාකාරකමෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම උදෙසා අපගේ මානව සම්පත් තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීමටද කටයුතු කොට ඇත. නව පද්ධතිය සම්බන්ධ භාවිත කරන්නන්ගේ පිළිගැනීමේ පරීක්ෂාවන් (UAT) මේ වන විට සිදුකෙරෙමින් පවතින අතර, මෙම පද්ධතිය භාවිත කිරීම සම්බන්ධ පුහුණුව මානව සම්පත් කාර්ය මණ්ඩලය වෙත ලබාදෙමින් පවතී.

වගකීම් සහගත ආයතනික සමාගමක් වශයෙන්, අප විසින් බලහත්කාර සහ ළමා මෙහෙකාරත්වය/අනිවාර්ය මෙහෙකාරත්වය සම්බන්ධ රෙගුලාසි වලට දෘඩ ලෙස අනුකූල වන බවට තහවුරු කරනු ලැබේ. වසර තුළදී කම්කරු හෝ අන් කවර හෝ නීතියක් වෙත අනනුකූලතාවයක් සම්බන්ධ කිසිදු සිදුවීමක් වාර්තා නොවිය.




GRI 401-1

## බඳවාගැනීම සහ පිරිවැටුම

වසංගතය මගින් දිගින් දිගටම එල්ල වන බාධාවන් හමුවේ වුවද, වසර තුළදී අපගේ බඳවාගැනීමේ ක්‍රියාකාරකම් එලෙසින්ම සිදුවිය. වසර තුළදී නව සේවකයින් 144 ක් බඳවාගන්නා ලද අතර ඔවුන් අතුරින් බහුතරයක් විධායක නොවන සේවක පිරිසට අයත් වූහ.

අපගේ බඳවාගැනීමේ ප්‍රතිපත්තීන් මගින්, සාධාරණ හා විනිවිදභාවයෙන් යුතු ආකාරයකින් නිසි රැකියාව සඳහා නිසි කුසලතාවයෙන් යුතු පුද්ගලයින් බඳවාග ැනීම ඉලක්ක කෙරේ. සමාගමෙහි කාර්යභාරය සඳහා සුදුසුම කුසලතා සහිත වූවන් බඳවාගැනීම තහවුරු කිරීම උදෙසා අනාගත අයැදුම්කරුවන් ව්‍යුහගත බඳවාගැනීමේ ක්‍රියාවලියක් වෙත යොමු කෙරේ. ඒ අතරතුර, සමාන අවස්ථා පිරිමන්නා වූ සේව්‍යයකු වශයෙන් කිසිදු අයැදුම්කරුවකු ස්ත්‍රී පුරුෂභාවය, වයස, ජාතිකත්වය හෝ වෙනත් පදනමක් මත වෙනස්කොට නොසැළකේ.

| | නව බඳවාගැනීම් | ඉවත්වීම් |
|---|---:|---:|
| **ස්ත්‍රී පුරුෂභාවය** | | |
| පුරුෂ | 102 | 176 |
| ස්ත්‍රී | 42 | 45 |
| | | |
| **වයස** | | |
| 29 ට අඩු සහ සමාන | 113 | 117 |
| 30-39 | 18 | 75 |
| 40-49 | 4 | 14 |
| 50-59 | - | 7 |
| 60 ට වැඩි | 9 | 8 |
| | | |
| **පළාත** | | |
| බස්නාහිර | 50 | 120 |
| මධ්‍යම | 5 | 15 |
| නැගෙනහිර | 15 | 5 |
| උතුරු | 7 | 19 |
| දකුණු | 21 | 15 |
| සබරගමුව | 10 | 9 |
| උතුරු මැද | 14 | 7 |
| වයඹ | 14 | 27 |
| ඌව | 8 | 4 |
| එකතුව | **144** | **221** |

*2022 ජනවාරි 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මානව සම්පත්, පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව අත්හිටුවන ලද අතර මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ නාමයෝජනා කමිටුව වශයෙන් වෙන වෙනම ස්වාධීන අනු කමිටු දෙකක් වෙත වගකීම් අනුයුක්ත කරන ලදී.

# මානව ප්‍රාග්ධනය

## අපගේ සේවකයින් සවිබලගැන්වීම

අප නිරන්තරයේ සංකීර්ණ වන්නා වූ මෙහෙයුම් වටපිටාවක් තුළ ඉදිරියට යාමේදී හැකියාවන්ගෙන් පරිපූර්ණ වූ සහ වෙනස දරාගැනීමට සූදානම් සවිමත් සේවා කණ්ඩායමක් නිර්මාණය කිරීම අතිශය වැදගත් වේ.




සවිබලගන්වන ලද සේවා කණ්ඩායමක්

GRI | 404-1

## පුහුණුව හා සංවර්ධනය

නිරන්තර පදනමක් මත සිය තාක්ෂණික හා මෘදු කුසලතා වර්ධනය කරගැනීම සඳහා සේවකයින් හට පුලුල් පරාසයක පැතිරුනු පුහුණු අවස්ථා රැසක් සපයනු ලැබ ඇත. සේවකයින් වෙත අති පුලුල් පුහුණු අත්දැකීමක් ලබාදෙනු පිණිස අභ්‍යන්තර සම්පත් දායකයින් මෙන්ම බාහිර සම්පත් දායකයින්ද සහභාගී කරගනිමින් පුහුණු වැඩසටහන් දියත් කෙරේ.

කාර්යසාධන ඇගයුම් ක්‍රියාවලිය ඔස්සේ පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින්, ආවර්තිත පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයන් මගින් සමාගමෙහි ක්‍රමෝපායික අවශ්‍යතා සමග ඒවා සම්බන්ධ කෙරේ. ප්‍රතිඵල ඇගයීම සඳහා පශ්චාත් පුහුණු තක්සේරුකරණයන් සිදුකෙරේ.

වසංගතය හේතුවෙන් භෞතික පුහුණු ක්‍රියාකාරකම් වෙත බලපෑම් ඇතිවීමත් සමග, අප විසින් අපගේ පුහුණු කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ඉලෙක්ට්‍රොනික පදනම් ඔස්සේ පුහුණු අවස්ථා ඉහළ නංවන ලදී. වසර තුළදී අප විසින් ඉලෙක්ට්‍රොනික අධ්‍යයන පැය ගණන ඉහළ නංවමින් සහ සේවකයින් වෙත නව පුහුණු කරණයන් රැසක් ලබාදෙමින් අධ්‍යයන කළමනාකරණ විසඳුමක් හඳුන්වාදෙන ලදී.

### සේවා නියුක්ති කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව පුහුණු පැය සාමාන්‍යය




| පුහුණු අවධානාත්මක ක්ෂේත්‍රය | පුහුණු පැය |
|---|---:|
| ශාඛාමය මෙහෙයුම් | 1,067 |
| අනුකූලතා | 2,149.1 |
| නියාමනමය | 41 |
| අලෙවි | 1,137 |
| ණය | 1,168 |
| නායකත්ව | 2,086 |
| මෘදු කුසලතා | 39,128 |
| වෙනත් | 1,245.5 |
| **එකතුව** | **48,021.60** |

ඉහත දැක්වෙන පැය වලට අමතරව, වසර තුළදී අධ්‍යයන කළමනාකරණ පද්ධතිය ඔස්සේ පුහුණු පැය 62,742.55 ක් පවත්වන ලදී.

## කාර්යසාධන කළමනාකරණය

වසර ආරම්භයේදී දන්වනු ලබන මූලික කාර්යසාධන දර්ශක අනුව සේවකයින් ඇගයුමට ලක් කෙරේ. වසංගතය මගින් එල්ල කරන ලද බාධාවන් හමුවේ වුවද, වසර තුළදී සමස්ත සේවකයින් වෙත කාර්යසාධන තක්සේරුකරණ සමාලෝචනයන් හිමි විය. ප්‍රධාන කාර්යාලය වෙත අභ්‍යන්තර අන්තර්ජාලගත ඇගයුම් පද්ධතියක් හඳුන්වාදෙන ලද අතර, මීළග ඇගයුම් චක්‍රයේදී එය සමාගම පුරා ව්‍යාප්ත කිරීමට නියමිතය. වසර තුළදී වර්ධනය වන්නා වූ වෙළඳපොල තත්ත්වයන් පදනම් කරගනිමින් අප විසින් ප්‍රධාන කාර්යාලය සඳහා වන මූලික කාර්යසාධන දර්ශක යාවත්කාලීන කරන ලදී. කාර්යසාධනය සහ ඇගයුම අතර මනා අනුකූලනයක් ගොඩනැංවීම උදෙසා අප ජ්‍යෙෂ්ට සහ ප්‍රධාන කළමනාකරුවන් සඳහා නව කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් සැකසීමේ නිරතව සිටී.

## වෘත්තීය ප්‍රගතිය සහ නායකත්ව සංවර්ධනය

අභ්‍යන්තර සේවකයින් හට වෘත්තීය ප්‍රගති අවස්ථා පිරිනැමීම තහවුරු කිරීම උදෙසා, නායකත්ව ධූරයන් අතුළු සියලු නිලයන් අභ්‍යන්තරව ප්‍රචාරණය කරනු ලැබේ. මේ අතර, රැකියාවේ යෙදෙමින් පුහුණුව ලැබීම ඇතුලුව සමාගම ඇතුලත කළනාකාරීත්ව ධූරයන් සඳහා සේවකයින් හඳුනාගැනීම හා සංවර්ධනය කරනු පිණිස ව්‍යුහගත ක්‍රියාවලියක් ස්ථාපනය කොට ඇත. වසර තුළ සිදුකරන ලද ප්‍රමුඛ ව්‍යපෘතියක් වූයේ, කාර්යභාරය පිළිබඳ මනා පැහැදිලි කිරීමක් උදෙසා ආයතනික කළමනාකාරීත්වයේ සේවා නියුක්ති විස්තර සැකසීම හා අපගේ සේවා ඇගයුම් සිදුකිරීමයි. සමාගම ඇතුලත අපගේ උසස්වීම් ක්‍රියාවලිය සවිමත් කිරීම සඳහා වසර තුලදී නව උසස්වීම් ප්‍රතිපත්තියක් අනුමත කිරීමද සිදු කෙරිණි.

අප විසින් වසර තුළදී, අපගේ නායකත්ව පෙළ සවිමත් කිරීමේ අරමුණින් යුතුව නායකත්ව පරිවර්තනීය ව්‍යාපෘතියක්ද අරඹන ලදී. මෙම වැඩසටහනේදී හඳුනාගත් සේවකයින් වෙත පුහුණු හා සංවර්ධන අවස්ථා පිරිනමන ලදී.

## සේවක සහභාගීත්වය

නිරන්තර සේවක සහභාගීත්වය තුළින් සේවක අදහස් වලට සවන්දීම තහවුරු කරමින් ඔවුන් සමාගමෙහි වර්ධන චාරිකාවේ සැබෑ සහකරුවන් වන බවට විදහා දක්වේ. එමගින් ශක්තිමත් කණ්ඩායම් හැඟීමක් ඇති කරමින් සේවකයින් අතර සහයෝගයද වර්ධනය කෙරේ. සෞඛ්‍ය සීමාවන් හේතුවෙන් සැලසුම් කරන ලද බොහොමයක් සේවක සහභාගීත්ව ක්‍රියාකාරකම් සිදුකල නොහැකි වූ අතර, අප විසින් ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ ප්‍රමුඛත්වයෙන් යුතු ටවුන්හෝල් රැස්වීම් යළි අරඹමින් ඉදිරි ගමන්මග සහ ප්‍රධාන ප්‍රමුඛතා ආශ්‍රයෙන් සේවකයින් ඇගයුමට ලක් කරන ලදී. අප විසින්, ගායන තරගය, පීඑල්සී සම්මාන උළෙල - 2020/2021 (අන්තර්ජාලගත සහභාගීත්ව ක්‍රියාකාරකම්) සහ ස්කිප් මට්ටමේ

රැස්වීම් (භෞතික සහභාගීත්ව ක්‍රියාකාරකම්) වැනි වැඩසටහන් කිහිපයක්ද සංවිධානය කරන ලදී. මේ අතර, අන්තර්ජාලගත ක්‍රමෝපායික කවයක් ඔස්සේ මෙහෙයුම් විශිෂ්ටත්වයය ඉහළ නැංවීම සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කරනු පිණිස සෑම මට්ටමකම සේවකයින් දිරිගන්වන ලදී.

සේවක සහභාගීත්වය ඉහළනැංවීමේ අපගේ ප්‍රයත්නයන්හි කොටසක් වශයෙන්, වසර තුළදී අප විසින් අපගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ යාන්ත්‍රණයද සවිමත් කරන ලදී. ඒ අනුව, අගතියට පත් පාර්ශවයෙහි රහස්‍යභාවය තහවුරු කිරීම සහ වර්ධිත යාන්ත්‍රණයක් උදෙසා අදාළ මාර්ගෝපදේශයන් සකසන ලදී.

**සේවක සහභාගීත්ව යාන්ත්‍රණයන්**

- අභ්‍යන්තර ජාලය
- ඊ මේල් සහ දැන්වීම්
- නව සැලසුම් සහ සැලසුම් ප්‍රතිශෝධන
- ශාඛා වෙත යාම
- පීපල්ස් නොලේජ් හබ්
- සේවක වෘත්තීය සමිතිය
- දුක්ගැනවිලි යාන්ත්‍රණය
- ටෝස්ට්මාස්ටර්ස් සමාජය
- කාර්යසාධන ඇගයුම්
- අතථ්‍ය මාර්ග ඔස්සේ පවත්වනු ලබන රැස්වීම් හරහා ක්‍රමෝපායික සැලසුම් සැසිවාර
- මානව සම්පත් පිවිසුම

GRI | 102-41, 407-1

### කම්කරු සබඳතා

සමාගම සතුව වෘත්තීය සමිතිය සමග කිසිදු සාමූහික ගිවිසුමක් නොමැති වුවද, අපගේ සේවක පිරිසෙන් 65.12% ක් අපගේ වෘත්තීය සමිතයට අයත් වේ. වෘත්තීය සමිතිය විසින් ඉස්මතු කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ වෘත්තීය සමිතිය සමග නිරන්තර සංවාදයක් පවත්වාගෙන යාම සඳහා ආයතනික කණ්ඩායමේ සාමාජිකයන් තිදෙනෙකු පත්කරනු ලැබ ඇත. එක්රැස්වීමේ නිදහස කෙරෙහි අප ගෞරව කරන අතර අඛණ්ඩවම වෘත්තීය සමිති සමග නිරන්තර හා මිත්‍රශීලී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට අපි කටයුතු කරමු.

### අපගේ සේවකයින් වෙත සත්කාරකත්වය

අපගේ සේවකයින් යනු අපගේ වැදගත්ම වත්කම වන අතර ඔවුන්ගේ සුරක්ෂිතතාවය සහ යහපැවැත්ම උදෙසා අපි කැප වී කටයුතු කරමු.

GRI | 403-1, 403-2, 403-3, 403-4, 403-5, 403-6, 403-7, 403-9

### සේවක සෞඛ්‍ය හා සුරක්ෂිතතාව

සේවක සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම කෙරෙහි වසර තුළදී තවදුරටත් අවධානය යොමු කෙරිණි. අපගේ සියලු පරිශ්‍රයන්හි ඉහළම ආරක්ෂණ ක්‍රියාමාර්ග වෙත අනුගත වීමට අමතරව, වසර තුළදී අපගේ සේවකයින්ගේ අවදානම අවම කිරීම උදෙසා නිවසේ සිට වැඩකිරීම, ගර්භනී සහ අවදානම් සහගත සේවකයින් සඳහා කාර්යභාර/ලිහිල් සේවා තත්ත්වයන්, පිට පළාත් සේවකයින් හට ඔවුනට ආසන්නතම ශාඛාවේ සේවය කිරීමේ අවස්ථා, අහඹු ඇන්ටිජන් පරීක්ෂාවන් ආදිය සිදුකෙරිණි. මේ අතර අප විසින් සේවකයකු හට වෛරසය ආසාධනය වුවහොත් ප්‍රදානයක් සහ සේවකයකුගේ පවුලේ සාමාජිකයකු ආසාධිත වුවහොත් පොලී රහිත ණයක්ද පිරිනැමීමට කටයුතු කෙරිණි. නිරෝධායනයෙහි යෙදී සිටි සේවකයින් හට වියළි ආහාර පැකේජ පිරිනමන ලදී.

කෝවිඩ් 19 මගින් ඇති කරන ලද සෞඛ්‍ය තර්ජනය මැඩලීම සඳහා ගනු ලැබූ මෙකී විශේෂ පියවරයන්ට අමතරව, නිරන්තර ගිනි ආශ්‍රිත පුහුණුවීම්, ගිනි ආරක්ෂණ උපකරණ සහ ගිනි ආශ්‍රිත පුහුණු නියමුවන් පත්කිරීම වැනි පොදු සෞඛ්‍ය හා සුරක්ෂිතතා පියවර අපගේ සියලු පරිශ්‍රයන්හි ක්‍රියාත්මක කරන ලදී. සේවකයින් හට අදාළ සේවා නියුක්ති ශ්‍රේණිය මත පදනම්ව, බාහිර වෛද්‍යමය වියදම් සඳහා කාර්තුමය වෛද්‍ය දීමනාවක් සහ රෝහල්ගත වීමේදී සෞඛ්‍ය රක්ෂණයක් පිරිනමන ලදී. අපගේ සේවකයින්ගේ සාමාන්‍ය යහපැවැත්ම උදෙසා අඛණ්ඩවම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර, සෞඛ්‍ය හා සුරක්ෂිතතාව සම්බන්ධ කවර හෝ ගැටලු හෝ සිදුවිය හැකි අවදානම් සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා සේවකයින් දිරිමත් කෙරේ.

**කෝවිඩ් 19 සෞඛ්‍ය හා සුරක්ෂිතතා ප්‍රතිචාරය**

- අදාළ වර්ධනයන් නිරීක්ෂණය කරමින් අවශ්‍ය පූර්වෝපාය පියවර ගැනීම සඳහා කෝවිඩ් 19 විශේෂ කාර්ය බලකාය ස්ථාපනය කරන ලදී.
- ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම ක්‍රියාවට නැංවීම
- නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය සහ අත්‍යාවශ්‍ය සේවකයින් හට සේවා මුර ක්‍රමය හඳුන්වාදීම
- අවදානම් සහගත කණ්ඩායම් වෙත නම්‍යශීලී සේවා අවස්ථා
- මූල්‍යමය සහාය
- අහඹු ඇන්ටිජන් පරීක්ෂාවන් ඇතුලු දැඩි ආරක්ෂණ ක්‍රියාමාර්ග



**සේවා ආශ්‍රිත ව්‍යාධි**

| | |
|---|---|
| සමස්ත සේවා ආශ්‍රිත ව්‍යාධි තත්ත්වයන් සංඛ්‍යාව (සිදුවීම් සංඛ්‍යාව) | 03 |
| මෙකී හදිසි අනතුරු හේතුවෙන් වාර්තාගත අහිමි වූ දින ගණන | 78.5 |

GRI | 401-2

### පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ

වසර තුළදී සේවකයින් වෙත සිදුකරන ලද මුළු ගෙවීම් රු. මිලියන 4,002.41 ක් විය. ස්ථාවර ගෙවීම් සහ සමාගමෙහි සහ කේවල කාර්යසාධනය මත ගෙවනු ලබන විචල්‍ය ගෙවීමට අමතරව සේවකයින් හට තවත් ප්‍රතිලාභ රැසක් පිරිනැමේ. පීපල්ස් ලීසිං හි සමාන අවස්ථා ප්‍රතිපත්තිය මගින්, එහි පාරිශ්‍රමික, ඇගයුම් සහ ප්‍රතිලාභ සැලසුම් හා ව්‍යුහයන් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂභාවය, ජාතිකත්වය හෝ අන් කවර හෝ හේතුවක් මත කිසිවකුට වෙනස් කොට සැළකීමක් සිදුනොවන බවට තහවුරු කෙරේ. පීපල්ස් ලීසිං මගින් 2016 අංක 03 දරණ සේවකයන්ගේ ජාතික අවම වැටුප් පනතෙහි දක්වෙන පරිදි අවම වැටුප් සම්මතයක් සකසනු ලැබ ඇති අතර සමාගම 2016 අංක 03 දරණ ප්‍රතිපාදන සහන දීමනා පනතටද අනුකූලව කටයුතු කරයි.

**ස්ථිර සේවකයින් වෙත පිරිනැමෙන ප්‍රතිලාභ**

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත දායකත්වය, අතිකාල දීමනා නිවාඩු මුදල් බවට හරවා ගැනීම, පාරිතෝෂික, වෛද්‍ය, හදිසි අනතුරු, සහ ජීවිත රක්ෂණ, වෛද්‍යමය රක්ෂණය මගින් ආවරනය නොවන රෝග ාබාධ සඳහා බරපතල රෝග අරමුදල, සහන මෝටර් රථ ණය සැලසුමක්, නිවාස ණය පොලී ප්‍රතිපූර්ණ සැලසුම, නම් කරන ලද සේවකයින් වෙත ජංගම දුරකථන පිරිවැය ප්‍රතිපූර්ණය, මෘත්‍යතා ප්‍රදාන ප්‍රතිලාභ, වෘත්තීය විභාග සඳහා විභාග ගාස්තු ප්‍රතිපූර්ණය, සංචාරයෙහි යෙදෙන පිටපළාත් සේවකයින් සඳහා සහන මිලට බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය සහ මරදාන හා මහරගම නේවාසික පහසුකම්, ප්‍රධාන කාර්යාලයේ අංග සම්පූර්ණ ව්‍යායාම මධ්‍යස්ථානය.

# මානව ප්‍රාග්ධනය

| ප්‍රධාන ප්‍රතිලාභ | 2021/22 රු. මිලියන | 2020/21 රු. මිලියන |
|---|---|---|
| වැටුප් සහ දීරිදීමනා | 2,526.68 | 2,190.18 |
| සේවක අර්ථසාධක අරමුදල | 195.50 | 188.76 |
| සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල | 48.89 | 47.46 |
| අතිකාල දීමනා | 33.16 | 29.02 |
| නිවාඩු මුදල් බවට හරවා ගැනීම | 76.62 | 1.80 |
| දීමනා සහ වැටුප් වර්ධක | 873.71 | 731.06 |
| තාවකාලික වේතන | 0.82 | 1.17 |
| සෞඛ්‍ය රක්ෂණය | 164.14 | 164.18 |
| පාරිතෝෂික | 82.89 | 111.74 |
| **එකතුව** | **4,002.41** | **3,465.37** |

GRI | 406-1

## විවිධත්වය කෙරෙහි වන ගෞරවය

සියලු ආකාරයේ විවිධත්වයන් පිළිගන්නා වූ සහ සමරන්නා වූ විවිධ හා අන්තර්ග්‍රහනය කරන ලද ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමෙහිලා අපි කැප වී කටයුතු කරමු. අප විසින් ස්ත්‍රී පුරුෂභාවය, ජාතිකත්වය, ආගම හෝ අන් කවර හේතුවක් මත හෝ වෙනස් කොට සැළකීමක් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර වසර තුළදී වෙනස් කොට සැළකීම ආශ්‍රිත කිසිදු සිදුවීමක් වාර්තා නොවූ බව වගකීම් සහගතව පවසනු ලැබේ.

ස්ත්‍රී පුරුෂ සමානත්වය කෙරෙහි අඛණ්ඩවම ප්‍රමුඛ අවධානයක් යොමු වූ අතර මෙකී ප්‍රයත්නයන්හි කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගැනීමට අප හට හැකි විය. මෙලෙස අත්කර ගන්නා ලද ප්‍රගතිය පිළිබඳව ස්ත්‍රී පුරුෂභාව සමානාත්මතා තහවුරු කිරීමේ වාර්තාවෙහි දක්වේ. මෙම වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි ස්ත්‍රී පුරුෂභාව වාර්තාකරණ ආකෘතිය අනුව සකසන ලදී.

### ස්ත්‍රී පුරුෂ සමානත්ව වාර්තාව

ස්ත්‍රී පුරුෂ සමානත්වය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කරමින් ස්ත්‍රී සේවිකාවන් සවිබලගැන්වීම සඳහා කටයුතු කොට ඇත.

**ගාමකයන්**

**ප්‍රතිපත්ති**

- සමාන අවස්ථා සේවා
- ලිංගික හිංසනයට එරෙහි ප්‍රතිපත්තිය
- ගෙවීමේදී කිසිදු ස්ත්‍රී පුරුෂභාව වෙනස් කොට සැළකීමක් නොමැති වීම
- දුක්ගැනවිලි ප්‍රතිපත්තිය

**ස්ත්‍රී පුරුෂභාව සමානාත්මතාවය ප්‍රවර්ධනය කෙරෙන්නා වූ කාර්ය පරිශ්‍ර ප්‍රතිපත්ති**

- කඩසාප්පු හා කාර්යාල පනතට අනුව ප්‍රසූත නිවාඩු
- කෝවිඩ් 19 වසංගත සමයේදී ගර්භනී මාතාවන් හට නම්‍යශීලී සේවා කටයුතු

**සංයුතිය**

| | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|
| බඳවාගැනීම් | 102<br>70.83% | 42<br>29.17% |
| උසස්වීම් | 837<br>77,07% | 249<br>22.93% |
| ඉවත්වීම් | 176<br>79.64% | 45<br>20.36% |

** සේවා නියුක්ති කාණ්ඩය සහ භූගෝලීය පදනම මත ස්ත්‍රී ප්රුෂ බෙදීයාම සඳහා ඉහත පිටු අංක 90 පරිශීලනය කරන්න.*

**ස්ත්‍රී පුරුෂභාව පරතර දර්ශක**

| | 2021 |
|---|---|
| කාර්යසාධන දිරිදීමනාව ලද ස්ත්‍රී කොටස | 24.23% |
| පුහුණුව ලද ස්ත්‍රී කොටස | 30.68% |
| දෙමාපිය නිවාඩු වලින් අනතුරුව නැවත සේවයට පැමිණි සහ එසේ පැමිණීමෙන් අනතුරුව මාස 12 ක් තවමත් සේවයේ යෙදෙන ස්ත්‍රී සේවික ප්‍රතිශතය | 75.00% |

**වගකීම් සහගත සන්නාමය**

වගකීම් සහගත සන්නාමයක් වශයෙන් අපගේ සමාගම තුළ සහ බාහිර සමාජය තුළ ස්ත්‍රී සවිබලගැන්වීම උදෙසා ධනාත්මක චර්යාවක් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අපි කැපවී කටයුතු කරන්නෙමු.

## ස්ත්‍රී පුරුෂ සමානත්ව වාර්තාව

| සේවා නියුක්ති කාණ්ඩය | ස්ත්‍රී පුරුෂභාවය | මූලික වැටුප් අනුපාතය |
|---|---|---|
| ජ්‍යෙෂ්ට නායකත්වය | M | 1.00 |
| | F | 0.72 |
| මධ්‍ය කළමනාකරුවන් | M | 1.00 |
| | F | 0.86 |
| රේඛීය කළමනාකරුවන් | M | 1.00 |
| | F | 1.06 |
| විධායක | M | 1.00 |
| | F | 1.11 |
| විධායක නොවන | M | 1.00 |
| | F | 1.03 |
| සුලු සේවක | M | 1.00 |
| | F | 1.06 |

## ඉදිරි ගමන් මග

### 2022/23 කෙටි කාලීන

- ස්වයං අධ්‍යයනය සදහා පහසුකම් සලසන්නා වූ අධ්‍යයන කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සහ අන්තර්ජාලගත පදනම් ඔස්සේ පුහුණුව ලබාදීමේ ප්‍රයත්නයන් ඉදිරියට ගෙනයාම
- සේවකයින් නව වගකීම් භාරගැනීම සදහා දිරිගන්වමින් වර්තමාන ව්‍යාපාරික හදිසි අවස්ථා වෙත ගැළපෙන පරිදි කාර්ය මණ්ඩලය වෙත ව්‍යුහාත්මක වෙනස්කම්/ ප්‍රතිව්‍යුහගතකරණයන් සිදු කිරීම

### මධ්‍ය කාලීන වසර 3

- මානව සම්පත් ක්‍රියාකාරකම් සම්බන්ධ ඩිජිටල්කරණ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාම
- වෙළඳපොල තත්ත්වයන් පිළිබිඹු වන පරිදි කාර්යසාධන ඇගයුම ප්‍රතිශෝධනය
- ප්‍රතිලාභ ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය
- සවිමත් නායකත්ව පෙළක් කෙරෙහි අවධානයෙන් යුතුව කුසලතා සංචිතය අඛණ්ඩව වර්ධනය කිරීම

### දිගු කාලීන

- බදවාගැනීම්, මාරුකිරීම් සහ සේවා දිගු කිරීම් ඇතුලුව සමස්ත මානව සම්පත් ක්‍රියාවලීන් ප්‍රතිසැකසුම
- විනිවිදභාවයෙන් යුතු ඇගයුම් හා ප්‍රතිලාභ සැළසුමක් සැකසීම
- අනුප්‍රාප්තික සැලසුම්කරණය
- අවශ්‍යතා මත පදනම් වූ පුහුණුව හා සංවර්ධනය

## ප්‍රාග්ධන හුවමාරු

මානව ප්‍රාග්ධනය වෙත සිදුකරනු ලබන ආයෝජන කෙටි කාලීනව මූල්‍ය ප්‍රාග්ධනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කල හැක. නමුත්, සේවා කණ්ඩායමේ සහ සේවකයින්ගේ ගුණාත්මකභාවය වර්ධනය වීම කෙටි, මධ්‍ය හා දිගු කාලීන වශයෙන් මූල්‍ය ප්‍රාග්ධනය කෙරෙහි හිතකර බලපෑමක් ඇති කරයි.

නිරන්තර පුහුණුව සහ සංවර්ධනය මගින් බුද්ධිමය ප්‍රාග්ධනය වර්ධනය වේ.

දිරිගන්වන ලද සහ සහභාගීත්ව සේවක පිරිසක් විසින් මනා ගනුදෙනුකාර සබදතා කෙරෙහි ඉවහල් වන ඵලදායී ගනුදෙනුකාර සේවාවක් සපයනු ලැබේ.

පාරිසරික හා සමාජයීය සවිඥාණිකත්වය ප්‍රවර්ධනය කරන්නා වූ සේවක සහභාගීත්ව ක්‍රියාකාරකම් මගින් ස්වභාවික ප්‍රාග්ධනය කෙරෙහි හිතකර බලපෑමක් ඇති කෙරේ.



# සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

අප විසින් අපගේ ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහකරුවන් සහ ප්‍රජාව සමග අඛණ්ඩවම සබඳතා සවිමත් කර ගනු ලැබුවේ ඔවුන්ගේ වර්ධනය වන්නා වූ අවශ්‍යතා ක්‍රියාකාරීව අපේක්ෂා කරමින් ඒ අනුව කටයුතු කිරීමෙනි.

### සමාජ හා සබඳතා ප්‍රාග්ධනයෙහි සංරචක



ගනුදෙනුකාර සබඳතා



ක්‍රමෝපායික ව්‍යාපාරික සහකරුවන් සමග සබඳතා



දේශීය ප්‍රජාවන් සමග සබඳතා

### සමාජ හා සබඳතා ප්‍රාග්ධනය හැසිරවීම



ප්‍රජා සත්කාරක ක්‍රියාකාරකම් වෙනුවෙන් රු.මිලියන 27.53 ක් ලබාදීම

ගනුදෙනුකාර පහසුව ඉහළ නැංවීම උදෙසා CAPP, DCHEQUE, PLC Touch, People's Pay Way to ඇතුලු ඩිජිටල් යෙදවුම් කිහිපයක් හඳුන්වාදීම.

ව්‍යාපාරික සහකරුවන් සමග සහභාගීත්වය සවිමත් කරගැනීම

හිතමිතුරු - බස් රථ සහන ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම

පසුගිය වසර දෙකක කාලය තුල ණය පහසුකම් 105,950 ක් සඳහා පමාසහන පිරිනැමීම

### සමස්ත වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා සමාජ හා සබඳතා ප්‍රාග්ධනයෙහි දායකත්වය

ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහකරුවන් සහ ප්‍රජාව සමග වන සවිමත් සබඳතාවයන් අපගේ සන්නාම ප්‍රතිරූපය හා දිගු කාලීන තිරසාරත්වය කෙරෙහි සෘජුව දායක වේ.

### ප්‍රමුඛ ප්‍රතිපල

- නව ගනුදෙනුරුවන් 29,499 ක්
- වඩාත් සවිමත් ව්‍යාපාරික සහයෝගිතාවයන්
- ප්‍රජා සවිබලගැන්වීම ඔස්සේ ධනාත්මක වෙනසක් ඇති කරන ලද ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන්

| ආශ්‍රිත පාර්ශ්වකරුවන් | ක්‍රමෝපායික අරමුණු | අවදානම් |
|---|---|---|
|  | • තිරසාර වර්ධනය උදෙසා කටයුතු කිරීම<br>• ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම<br>• පාරිසරික හා සමාජයීය සාධක සමෝධානය | • කීර්තිනාම අවදානම<br>• මෙහෙයුම් අවදානම |

## තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි දායකත්වය

| | | | |
|---|---|---|---|
| සැලසුම් හා සේවාවන් ඩිජිටල්කරණය | | | |
| සැපයුම්කරුවන් තෝරාගැනීමේ ක්‍රියාවලියෙහි අනුකූලනය | | | |
| කෝවිඩ් 19 වෙත ජාතික සූදානම කෙරෙහි සහයෝගය දැක්වීම | | | |
| **ප්‍රගති සූචිය** | | | |
| ආරම්භ කරන ලදී | සිදුකෙරෙමින් පවතී | සම්පූර්ණ කරන ලදී | අත්පත් කර නොගන්නා ලදී |

## තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි දායකත්වය




## සාර්ථකත්වය මැනීම

### ගනුදෙනුකරුවන් වෙත වටිනාකම




### සැපයුම්කරුවන් වෙත ගෙවීම්




### ප්‍රජාව වෙත වටිනාකම




■ ගනුදෙනුකරුවන් වෙත පොලී ගෙවීම
■ ණය ලබාදීම

**ඩිජිටල් සේවා පදනම් හරහා 470,000 කට අධික ගනුදෙනු**

# සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

GRI 102-6

## ගනුදෙනුකාර සබඳතා

ණයලබාදීමේ සහ තැන්පතු ගනුදෙනුකරුවන් ඇතුලු අපගේ 380,000 ක් වන ගනුදෙනුකාර පදනම දිවයිනේ සියලු පළාත් නවය පුරා විසිරී පවතී. ගෙවුනු වසරේදී නව ගනුදෙනුකාර සබඳතා 29,499 ක් සමගින් අපගේ ගනුදෙනුකාර පදනම වර්ධනය විය.




| ගනුදෙනුකරුවන්ගේ භූගෝලීය බෙදීයාම | | | |
|---|---|---|---|
| පළාත | තැන්පතුකරුවන් | ණයගැතියන් | එකතුව % |
| මධ්‍යම පළාත | 35,573 | 16,367 | |
| නැගෙනහිර පළාත | 17,375 | 5,701 | |
| උතුරු මැද පළාත | 20,072 | 6,824 | |
| වයඹ පළාත | 28,307 | 11,453 | |
| උතුරු පළාත | 10,608 | 4,142 | |
| සබරගමුව පළාත | 23,507 | 8,750 | |
| දකුණු පළාත | 38,012 | 17,893 | |
| ඌව පළාත | 27,857 | 8,945 | |
| බස්නාහිර පළාත | 108,666 | 45,714 | |
| එකතුව | **309,977** | **125,789** | |

*හරස් අලෙවිය පවතී

GRI 418-1

## අපගේ ඩිජිටල් සේවා සැපයුම සවිමත් කිරීම

වසර තුළදී ඩිජිටල් යෙදවුම් කිහිපයක් හඳුන්වාදෙමින් අප විසින් අපගේ ඩිජිටල් වටිනාකම් වපසරිය වර්ධනය කිරීමට කටයුතු යොදන ලදී. කල්බදු සේවාවන් වෙත අන්තර්ජාලගත අනුමැති හැකියාවන් ලබාදෙමින් අපගේ අන්තර්ජාලගත කල්බදු යෙදවුම වන CAPP වසර තුළදී හඳුන්වාදෙන ලදී. DCHEQUE යනු වසර තුළදී ව්‍යාප්ත කරන ලද තවත් විප්ලවීය ඩිජිටල් පරිවර්තනීය සේවාවකි.

අප විසින් අපගේ ත්‍රෛභාෂික ජංගම යෙදවුම වන 'PLC touch' හඳුන්වාදෙන අතර අපගේ අන්තර්ජාල පෝටලය වන "PLC online" නව විශේෂාංග සමගින් යළි එළිදක්වන ලදී. මේ අතරතුර, ගනුදෙනුකාර අත්දැකීම තවදුරටත් ඉහළ නංවමින් "People's Pay Way" යන ගෙවීම් සඳහා වන බහුවිධ සේවා ජාලය පීපල්ස් ඉන්ෂුවරන්ස් හා මහජන බැංකුව සමග එක්ව හඳුන්වාදෙන ලදී. (අපගේ ඩිජිටල්කරණය පිළිබඳ වැඩිදුර තොරතුරු පිටු අංක 80 සිට 87 දක්වා වන බුද්ධිමය ප්‍රාග්ධන වාර්තාවේ ඉදිරිපත් කෙරේ.)

ඩිජිටල් මාධ්‍යයන්හි වර්ධනයත් සමග දත්ත සුරක්ෂිතතාව සහ ගනුදෙනුකාර තොරතුරු වල රහස්‍යභාවය පිළිබඳව වැඩි අවධානක් යොමුකිරීම අවශ්‍ය වූ අතර ඒ සඳහා අප විසින් අඛණ්ඩවම ආයෝජන සිදුකරන ලදී. වසර තුළදී දත්ත සුරක්ෂිතතාව සහ ගනුදෙනුකාර තොරතුරු වල රහස්‍යභාවය පිළිබඳව කිසිදු සැළකිය යුතු උල්ලංඝනය කිරීමේ සිදුවීමක් වාර්තා නොවීය.

### මූල්‍යමය අන්තර්ග්‍රහනය

සිය දීප ව්‍යාප්ත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය සහ මුදල් තැන්පතු යන්ත්‍ර ජාලය ඔස්සේ අපගේ මව් සමාගම වන මහජන බැංකුව සමග වන සහයෝගීතාවය ඇතුලුව අපගේ දිවයින පුරා විසිරුනු ශාඛා ජාලය, මෙන්ම පීඑල්සී ඔන්ලයින් ඔස්සේ වන ඩිජිටල් සේවා සැපයුම පීපල්ස් ලීසිං වෙත මූල්‍යමය අන්තර්ග්‍රහන හැකියාව ලබාදෙයි.

| මූල්‍ය වර්ෂය | ශාඛාමය ව්‍යාප්තිය ඔස්සේ ණය ලබාදීම | ඩිජිටල් පදනම ඔස්සේ ගනුදෙනු | මහජන බැංකුවේ මුදල් තැන්පතු යන්ත්‍ර ජාලය ඔස්සේ ගනුදෙනු පරිමාව |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2020/21 | 50,881.00 | 19,788.04 | 598.51 |
| 2021/22 | 71,703.20 | 51,755.45 | 3,428.87 |

### කෝවිඩ් 19 වසංගත සමයේදී අපගේ ගනුදෙනුකරුවන් වෙත පිරිනමන ලද සහයෝගය

අප විසින් මහ බැංකුව මගින් නියම කරන ලද පරිදි, පසුගිය වසර දෙකක කාලය පුරා ගනුදෙනුකරුවන් 105,950 කට අධික සංඛ්‍යාවක් වෙත මුල් මුදල සහ පොලී සදහා පමාසහන පිරිනමන ලදී. කෝවිඩ් 19 වසංගතයෙන් අනතුරුව, පෞද්ගලික මගී ප්‍රවාහන ගනුදෙනුකාර කාණ්ඩය වෙත ඔවුන්ගේ ව්‍යාපාර යළි ගොඩනංවා ගැනීම සදහා හිතමිතුරු බස් රථ සහන ණය ක්‍රමය හදුන්වාදෙන ලදී. මෙම මූල්‍ය සහන සැලසුම මගින් සහන පොලී අනුපාත යටතේ ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් හදුන්වාදෙනු ලැබේ. හිතමිතුරු සැලසුම යටතේ ණය පහසුකම් 2,000 කට අධික සංඛ්‍යාවක් පිරිනමන ලදී.

### පරිපූර්ණ පහසුකම් පරාසයක්...

අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ වූ අවශ්‍යතා සපුරාලීම සදහා පරිපූර්ණ සැලසුම් පරාසයක් අප විසින් ඉදිරිපත් කෙරේ. අප විසින් නිරන්තරයෙන් අපගේ සැලසුම් පරාසය සමාලෝචනය කරමින් ගනුදෙනුකරුවන්ගේ වෙනස් වන සුලු අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ඒවා සකසනු ලැබේ. අපගේ සැලසුම් පිළිබද වැඩිදුර තොරතුරු අපගේ වෙබ් අඩවිය වන www.plc.lk හි දක්වේ.

## කල්බදු සැලසුම්

- පීපල්ස් ෆ්‍රෙන්ඩ්ලි ලීස්
- ඔටෝ ලෝන්
- ශක්ති ව්‍යාපාර ණය
- ශාස්ත්‍ර අධ්‍යාපනික ණය
- සැනසුම් පියස නිවාස ණය
- රන් ණය ගෝල්ඩ් ලෝන්
- Margin Trading — ආන්තික වෙළදාම
- Factoring — සාධකකරණය
- සෙල්ෆ් ඊ කෑෂ්
- ක්වික් කෑෂ් පුද්ගලික ණය
- ෆාස්ට් ට්‍රැක්
- ඉරාජා
- වෙළද මුරාබා
- මුෂාකරා
- වකාලා

# සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

## තැන්පතු හා ඉතුරුම් සැලසුම්

සුපර් සේවින්ස්

සීනියර් සිටිසන් සේවින්ස්

සෙනෙහස ළමා ඉතුරුම් ගිණුම

පීපල්ස් ලීසිං ස්ථාවර තැන්පතු

ප්‍රීමියර් රිවෝර්ඩ් ප්ලෑන්

ජ්‍යෙෂ්ට පුරවැසි ස්ථාවර තැන්පතු

මුදාරබා ඉතුරුම් ගිණුම

උස්ෆූර් ළමා ඉතුරුම් ගිණුම

කෙටි කාලීන මුදාරබා ආයෝජන ගිණුම

මාස 12 මුදාරබා ඉතුරුම් ගිණුම

අප විසින් කීර්තිමත් සහකරුවන් සමග එක්ව අපගේ පහසුකම් පෙල වැඩිදියුණු කිරීමටද කටයුතු යොදන ලදී. වසර තුළදී පීපල්ස් ලීසිං සහ මහජන බැංකුව එක්ව සිය ගනුදෙනුකරුවන් වෙත සම-සන්නාමීය ක්‍රෙඩිට් කාඩ්පතක් පිරිනමන ලදී. එමගින් සමූහ හවුල්කාරීත්වය වර්ධනය කරමින් තරගකරුවන් අතර ප්‍රමුඛස්ථානය ලබාගත හැකි පසුබිමක් නිර්මාණය වේ. තවත් හවුල්කාරීත්වයන්හි කොටසක් වශයෙන්. දෙපාර්ශවයටම විවිධ වූ ප්‍රතිලාභ හිමිවන ආකාරයේ සම-සන්නාමීය ක්‍රෙඩිට් කාඩ්පතක් හඳුන්වාදීමට කටයුතු යොදා ඇත. මෙකී ක්‍රෙඩිට් කාඩ්පත් සහයෝගිතාවයන්, වඩාත් පුලුල් වූ ගනුදෙනුකාර පදනමක් ආකර්ශනය කරගැනීමෙහිලා වන සිල්ලර මූල්‍යකරණයෙහි වැදගත් කොටසක් වශයෙන් සැළකිය හැකි වේ. එය වෙනත් ඕනෑම ක්‍රෙඩිට් කාඩ්පතක් මෙන් ඕනෑම ස්ථානයකදී ඕනෑම මිළදී ගැනීමක් සඳහා භාවිත කල හැකි වන අතර මහජන බැංකුව වෙතින් පිරිනැමෙන සියලු වාණිජමය දීමනාවන් සඳහාද එය සුදුසකම් ලබයි. මෙම කාඩ්පත පීපල්ස් ලීසිං සහ මහජන බැංකුව යන සන්නාමයන් දෙකම නියෝජනය කරයි.

අප විසින් විශේෂ ව්‍යාපාර ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සඳහා, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රථවාහන ආනයන, බෙදාහැරීම් සහ අමතර කොටස් නියෝජිතයකු වන ඉන්ද්‍රා ට්‍රේඩර්ස් පුද්ගලික සමාගම සමග අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. මෙම වැඩසටහන ඔස්සේ ප්‍රවර්ධන කාලසීමාව තුළ ගනුදෙනුකරුවන් වෙත පුලුල් පරාසයක පැතිරුනු ප්‍රතිලාභ පිරිනමන ලදී.

### ඉහළ නංවන ලද ගනුදෙනුකාර සහභාගීත්ව මට්ටම්

අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ගනුදෙනුකරුවන් සමග නිරන්තර සහභාගීත්වය වැදගත් වේ. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සිදුකෙරෙන නිල සහභාගීත්වයන්ට අමතරව ගනුදෙනුකාර පැමිණිලි හා දුක්ගැනවිලි සම්බන්ධයෙන් අප විසින් විශේෂිත ඒකකයක් ස්ථාපනය කරනු ලැබ ඇත. අදාළ ඒකකය මගින් සියලුම පැමිණිලි මධ්‍යගත පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරීමේ පද්ධතියක් තුළ වාර්තා කොට අපක්ෂපාතීව විමර්ශනය කරනු ලැබේ. මෙමගින් ගනුදෙනුකාර පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රමානුකූලව කටයුතු කොට විසඳාගනු ලැබේ. කෝවිඩ් 19 සීමා හේතුවෙන් ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති වුවද අප විසින් අපගේ සැලසුම් සම්බන්ධ දැනුවත් කිරීම් උදෙසා දීපව්‍යාප්ත එක් දින වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

| ගනුදෙනුකාර තෘප්තිය |
|---|
| සෘජු පැමිණිලි - 56 |
| ශ්‍රී ලංකා මහ බැංකුව ඔස්සේ පැමිණිලි - 89 |
| ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා ඔස්සේ පැමිණිලි - 41 |
| * වසර තුළදී ඉස්මතු වූ සියලුම පැමිණිලි මිත්‍රශීලීව විසඳාලන ලදී. |

GRI | 417-1, 417-2, 417-3

### සැලසුම්වල වගකීම් සහගත බව තහවුරු කිරීම

සැලසුම් විශේෂාංග, මිල ගණන්, නීතිරීති හා කොන්දේසි ඇතුලුව යාවත්කාලීන කරන ලද සැලසුම් තොරතුරු අපගේ ආයතනික වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැක. මේ අතර ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් ප්‍රකාශිත දැන්වීම් ඔස්සේ සැලසුම් තොරතුරු ලබාදෙනු ලබන අතර ශාඛාවන්හි සේවය කර බහුභාෂිත සේවකයින් විසින් ගනුදෙනුකරුවන් වෙත අදාළ තොරතුරු අවබෝධ කරදෙනු ලැබේ. වසර තුළදී, සැලසුම් හා සේවාවන් පිළිබඳ තොරතුරු, ලේබල්කරණය හෝ අලෙවි සන්නිවේදනයන් සම්බන්ධ කිසිදු අනනුකූලතාවයක් වාර්තා නොවීය.

GRI | 102-9

## ව්‍යාපාරික සහකරුවන් සමග සබඳතාවය

අපගේ ව්‍යාපාරික සහකරුවන් අතරට, ආශ්‍රිත බැංකු, දෙස් විදෙස් මූල්‍ය ආයතන සහ දිවයින පුරා විසිරුනු රථවාහන නියෝජිතයින් රැසක් ඇතුළත් වේ. මෙයට අමතරව අපගේ ව්‍යාපාරික කටුයුතු නිසි පරිදි සිදුකරගෙන යාම සඳහා භාණ්ඩ හා සේවා සපයනු ලබන සැපයුම්කාර ජාලයක්ද සමාගම සතු වේ. අප විසින් සාමූහිකව ක්ෂේත්‍රයේ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ යහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය උදෙසා ක්ෂේත්‍ර සංගම් ඇතුලු ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමග ක්‍රියාකාරී සබඳතාවන් පවත්වාගෙන යනු ලැබේ. අප විසින්, මෙහෙයුම් හවුල්කාරීත්වයන්. වෙළඳපොල පිවිසුම සහ නව ව්‍යාපාරික අවස්ථා සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වටිනාකම් නිර්මාණය කිරිමෙහිලා මෙකී සබඳතාවයන් සවිමත් කරගැනීමට අඛණ්ඩවම කටයුතු කරනු ලැබේ.




| | 2021/22 | 2020/21 | වෙනස % |
|---|---|---|---|
| ක්‍රියාකාරී ව්‍යාපාරික සහකරුවන් (සංඛ්‍යාව) | 46,560 | 38,890 | 19.72 |
| රථවාහන සැපයුම්කරුවන් (සංඛ්‍යාව) | 40,118 | 31,665 | 26.70 |
| ප්‍රසම්පාදන වියදම (රු.මිලියන) | 131,515.92 | 82,880.45 | 58.68 |

GRI | 102-13

## විශ්වසනීය සහකරුවන්

විශ්වසනීයබව සහ සුපිළිපන් බව අපගේ සියලු සබඳතාවයන්ගේ පදනම වන අතර එහිදී අපගේ ව්‍යාපාරික සහකරුවන් සමග වන සියලු ගනුදෙනු විනිවිදභාවයෙන් යුතු සාධාරණ ආකාරයෙන් සිදුකෙරෙන වට අප විසින් තහවුරු කෙරේ. ක්ෂේත්‍රයේ රෙගුලාසි වෙත දැඩිව අනුකූලවීම සහ ව්‍යාපාරික සහකරුවන් සමග නිරන්තර සහභාගීත්වය මගින්, සෙසු ව්‍යාපාරික ආවයතන ඇතුලු ව්‍යාපාරික සහකරුවව් තුළ විශ්වාසය සහ වගකීම තහවුරු වේ. එකගතාවයට පත් නීතිරීති හා කොන්දේසි වලට අනුගත වු ගෙවීම් ඇතුලු සියලු බැදීම් තහවුරු කරනු පිණිස සෑම කොන්ත්‍රාත්තුවක් සහ ගිවිසුමක්ම විධිමක් අයුරිව් විමර්ශනයට ලක් කෙරේ.

| සංගම් වල සාමාජිකත්වය |
|---|
| • ශ්‍රී ලංකා කල්බදු සංගමය |
| • ශ්‍රී ලංකා මූල්‍ය නිවාස සංගමය |
| • ශ්‍රී ලංකා මූල්‍යමය ඔම්බුඩ්ස්මන් වරයා |
| • ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය |
| • ආන්තික සැපයුම්කරුවන්ගේ සංගමය |
| • ශ්‍රී ලංකා ජෛව විවිධත්වය (සහභාගීත්ව සාමාජින) |

## දේශීය ප්‍රසම්පාදනය කෙරෙහි අවධානය

දේශීය කර්මාන්ත වෙත සහාය දක්වීමේ අපගේ ප්‍රයත්නයෙහි ප්‍රතිපලයක් වශයෙන් භාණ්ඩ හා සේවාවන් ප්‍රසම්පාදනයේදී අප විසින් දේශීය සැපයුම්කරුවන් වෙත ප්‍රමුඛත්වය ලබාදීමෙහිලා කටයුතු කරනු ලැබේ. විශේෂිත අන්තර්මුහුණත තොරතුරු තාක්ෂණ නිපැයුම් සහ ඇතැම් මෘදුකාංග මෙවලම් හරුනුකොට, සමාගම මගින් බහුතර සැපයුම් ප්‍රමාණයක් දේශීය සැපයුම්කරුවන්ගේන ලබා ගැනේ. වසර තුළදී දේශීය සැපයුම්කරුවන් වෙත සිදුකරන ලද සමස්ත ගෙවීම් වලින්, ආසස්න වශයෙන් බහුතරය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ලබාගැනුනි.

GRI | 308-1, 410-1, 414-1

## වගකිම් සහගත සම්පාදනය

පීපල්ස් ලීසිංහි ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටීන් අපගේ ප්‍රස්මපාදන අත්පොතෙහි පැහැදිලිව දක්වෙන අතර ඒවා කාලෝචිත වූද කාර්යක්ෂම වූද ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් තහවුරු කිරීම උදෙසා සකසනු ලැබ ඇත. වසර තුළදී අප විසින් බාහිර සේවා ලබාගැනීමේ ක්‍රියාවලිය අනුකූලනය කිරීම සඳහා නව බාහිර සේවා ලබාගැනීමේ ප්‍රතිපත්තියක් හඳුන්වාදෙන ලදී.

උපකරණ, තොරතුරු තාක්ෂණ දෘඩාංග සහ තොග අයිතම වැනි ප්‍රධාන පෙළේ ප්‍රසම්පාදනයන් භාණ්ඩ ලබාගැනීමේ අංශයේ වගකීම වේ. ශාඛාමය පරිභෝජන භාණ්ඩ වැනි සුලු ප්‍රසම්පාදනයන් සම්බන්ධ වගකීම අදාළ ශාඛාව/අංශය මගින් භාරගැනේ. ස්වාධීන තාක්ෂණික තක්සේරුකරණ කමිටුවක් මගින් ඉහක දක්වන ලද ක්‍රියාපටිපාටිය අනුව සැපයුම්කරුවන් තෝරාගැනීම සිදු කෙරේ.

සේවකයින්ගේ සහ සෙසු පාර්ශ්වකරුවන්ගේ ගරුත්වය සුරැකෙන බවට තහවුරු කරමින් කීර්තිත් පිටතින් සේවා ලබාගන්නා වූ සේවා සම්පාදකයින් විසින් ප්‍රධාන ශාඛාවේ සහ ශාඛාවන්හි ආරක්ෂාව සපයනු ලැබේ. අපගේ ප්‍රධාන ශාඛාවෙහි සහ සෙසු ශාඛාවන්හි, විශේෂිත වැඩසටහනක් ක්‍රියාවේ නොයෙදුවද, වගකීම් සහගත අමුත්තන්/ගනුදෙනුකාර කළමානරණය ඇතුලුව පොදුවේ මානව හිමිකම් සුරැකීම සම්බන්ධ පුහුණුවක් ආරක්ෂක අංශ වෙත ලබාදෙනු ලැබේ.

# සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

අපගේ සැපයුම්කාර තේරාගැනීමේ ක්‍රියාවලිය තුළ පාරිසරික සහ සමාජයීය අවදානම් සැලකිල්ලට ගැනේ. ලියාපදිංචිය සිදු සිදු කරනු ලබන අවස්ථාවේදී, සැපයුම්කරුවන් බැහැර කිරීමේ ලැයිස්තුවක් යටතේ ඇගයීමට ලක් කෙරේ. පාරිසරික හා සමාජයීය තත්ත්වයන් ඇතුළුව අවශ්‍ය සම්මතයන්ට අනනුකූල වීම, අදාල සැපයුම්කරුවා සමාගමෙහි සැපයුම්කාර ලැයිස්තුවෙන් ඉවත් කිරීම කෙරෙහි හේතු වන අතර එයට පාරිසරික හා සමාජයීය ප්‍රතිශ්ඨාවන් ඇතුළත් වේ. ඉහත දක්වන ලද ක්‍රියාපායිට යටත් වසර තුළදී සැපයුම්කරුවන් 13,362 ක් පිළිබඳව සොයාබලන ලදී. විමර්ශනයට ලක් වන වසර තුළ අපගේ සැපයුම් දාමය තුල පාරිසරික සහ සාමාජීය ගැටලු පිළිබඳ අනනුකූලතාවයන් කිසිවක් නොවීය.

### ප්‍රසම්පාදන ක්‍රියාවලිය




### රජය

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් ආර්ථිකය කෙරෙහි ඇතිවූ අහිතකර බලපෑ සමගින්, පීපල්ස් ලීසිං, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව සිය ගනුදෙනුකරුවන් වෙත ණය සහ කල්බදු මත පමාසහනයන් ලබාදෙමින් සහ දිගු කරමින්, සහන පොලී අනුපාත යටතේ ණය ලබා දෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද උපදෙස් අනුව වසර පුරා අඛණ්ඩව මෙහෙයුම් සිදු කරමින් රජයේ ආර්ථිකය යළි නගා සිටුවීමේ වැඩ පිළිවෙළට දායක විය. එයට අමතරව අප විසින් වසර තුළදී අප විසින් බදු වශයෙන් රජයට රුපියල් මිලියන 2,791ක් ගෙවන ලද අතර එය පිටු අංක 207 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 17.9 හි ඉදිරිපත් කෙරේ.

### රජය වෙත නිර්මාණය කරන ලද වටිනාකම්

- 2022 මාර්තු 31 දිනට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වැනි රජයේ සුරැකුම් වල රුපියල් මිලියන 9,827.22 ක් ආයෝජනය
- කෝවිඩ් 19 බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාරයන් වෙත සහන ලබාදෙමින් රජයේ ව්‍යාපෘතීන් වෙත සහාය දැක්වීම.
- රජේ රෝහල් සහ කෝවිඩ් අතරමැදි සත්කාරක මධ්‍යස්ථාන වෙත අත්‍යාවශ්‍ය වෛද්‍යමය හා වෛද්‍යමය නොවන උපකරණ පරිත්‍යාග කිරීම්
- වසර තුළදී රුපියල් මිලියන 2,791.99 ක් බදු වශයෙන් ගෙවා ඇත.

GRI 413-1, 419-1

## ප්‍රජාව සමග සබඳතාවය

ව්‍යාපාරයක් වශයෙන් අපගේ දිගුකාලීන තිරසාරත්වය අපගේ ප්‍රජාව වෙත දක්වන්නා වූ සුබදායී බලපෑම මත රඳා පවතින බව අපගේ විශ්වාසයයි. මූල්‍ය සේවා සම්පාදකයකු වශයෙන් අප විසින් මූල්‍යමය අන්තර්ග්‍රහනය සහ මූල්‍ය පහසුකම් ලබාදීම ඔස්සේ ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි ඍජු දායකත්වයක් සපයනු ලැබේ. අප විසින් මහ බැංකුවේ නියෝග අනුව වසංගතයේ බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් හට ණය පහසුකම් 105,000 කට අධික සංඛ්‍යාවක් සහ රු. මිලියන 29,000 කට අධික සහන අරමුදල් පිරිනමමින් පශ්චාත් කෝවිඩ් සමයේදී සාධනීය කාර්යභාරයක් ඉටු කරන ලදී. අප විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග එක්ව ග්‍රාමීය ප්‍රදේශයන්හි ඩිජිටල් ගෙවීමේ මාධ්‍යයන් ප්‍රචලිත කිරීම සඳහා වූ 'රට පුරාම LANKAQR' නම් වූ රජයේ ප්‍රයත්නයටද සහයෝගය දක්වන ලදී.

අප විසින්, පාරිසරික සංරක්ෂණය, දේශීය ප්‍රජාවන් සවිබලගැන්වීම, අධ්‍යාපනය හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සහ මූල්‍ය සාක්ෂරතාවය ගොඩනැගීම වැනි මූලික ක්ෂේත්‍රයන් හරහා අපගේ ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් දියත් කරමින් සුබවාදී වෙනසක් සඳහා නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීමේ ප්‍රයත්නයක්ද දරනු ලැබේ. අප විසින් රටේ කඩිනම් අවශ්‍යතාවයන් කෙරෙහි ප්‍රතිචාර දක්වමින්. දිවයින පුරා රෝහල් සහ අතරමැදි සත්කාරක මධ්‍යස්ථාන වෙත කෝවිඩ් 19 වසංගතය කෙරෙහි සවිමත්ව මුහුණුදීම උදෙසා අරමුදල් සහ උපකරණ ලබාදෙමින් පොදු සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීමටද කටයුතු කරන ලදී.

අප විසින් මෙරට සියලු රෙගුලාසි හා නීති වලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කරන ලදී. විමර්ශනයට ලක් වන වසර තුළ සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයන්හි නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලතාවයක් සම්බන්ධ කිසිදු සිදුවීමක් වාර්තා නොවීය. තවද අපගේ ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන්, දේශීය ප්‍රජාවන් සවිබලගැන්වීම, අධ්‍යාපනය හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සහ මූල්‍යමය සාක්ෂරතාවය වැනි අවධානාත්මක ක්ෂේත්‍රයන් කෙරෙහි යොමු විය.

2021/22 මූල්‍ය වර්ෂය තුළ ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය
රු. මිලියන 27.53

## ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන්



*මැදිරිගිරිය මූලික රෝහල වෙත වෛද්‍යමය උපකරණ පරිත්‍යාග කිරීම*

**කෝවිඩ් 19 ප්‍රතිකාර සහ සත්කාර ශක්තිමත් කිරීම සඳහා වෛද්‍යමය සහ වෛද්‍යමය නොවන උපකරණ පරිත්‍යාග කිරීම**

වසර තුළදී පේරාදෙණිය ශික්ෂණ රෝහල, තංගල්ල මූලික රෝහල, බෙලිඅත්ත ප්‍රාදේශීය රෝහල, කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහල, ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල. දික්ඔය මූලික රෝහල. තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහල, මැදිරිගිරිය මූලික රෝහල, මාරවිල මූලික රෝහල, හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල යන රෝහල්වලට සහ දික්ඔය, කුණ්ඩසාලේ, කෝරලේ සහ මහමෙව්නා අසපුව යන කොවිඩ් අතරමැදි සත්කාරක මධ්‍යස්ථාන වෙත රු.මිලියන 25.93 ක වෛද්‍යමය සහ වෛද්‍යමය නොවන උපකරණ පරිත්‍යාග කරන ලදී.



**ප්‍රණාමය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල වෙත කෝවිඩ්-19 රෝගීන් හඳුනාගැනීම සඳහා 2021 ජූනි 06 වැනි දින පීපල්ස් ලීසිං මගින් සිදුකරන ලද තත්කාලීන ක්ෂුද්‍ර විශ්ලේෂක PCR යන්ත්‍රය පරිත්‍යාග කිරීම පිළිබඳ මාගේ අවංක වූ ඇගයුමට පාත්‍රවේ. එය කෝවිඩ් 19 රොගීන් හඳුනාගැනීම සඳහා වූ තත්කාලීන අවශ්‍යතාවයක් විය. මේ වන විට මෙම ඇනලයිසරය භාවිත කරමින් පරීක්ෂාවන් 576 ක් පමණ සිදු කොට ඇත. මෙකී කල්තබා හඳුනාගැනීම මගින් රෝගය පැතිරීම අවම කරගැනීමටත් ආසාධිත රෝගීන් හට කල්තබා නිසි සත්කාර සිදුකිරීමටත් හැකි විය. නැවත වරක් මෙම කෝවිඩ් 19 ලෝක වසංගත සමය තුල සිදුකරන ලද මානව හිතවාදී කාර්යභාරය වෙනුවෙන් පීපල්ස් ලීසිං වෙත මාගේ ප්‍රණාමය පුද කරමි.

**වෛද්‍ය අයි. ඩබ්. එම්. ජේ. වික්‍රමරත්න මහතා**
*අධ්‍යක්ෂක*
දිස්ත්‍රික් මහ රෝහල - ත්‍රිකුණාමලය



**ප්‍රණාමය**

කෝවිඩ් 19 වසංගතයේ උච්චතම අවස්ථාවේදී අප වෙත ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් පීපල්ස් ලීසිං සමාගම වෙත මාගේ ප්‍රණාමය පුද කෙරේ. කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහල වානාහී බිම් මට්ටමේ අතරමැදි සත්කාරයන්හි සිට දැඩි සත්කාර ඒකකය දක්වා කෝවිඩ් 19 රෝගීන් වෙත ප්‍රතිකාර කරන ලද රෝහල් වලින් එකකි. රොහලේ අතරමැදි සත්කාරක මධ්‍යස්ථාන, අභ්‍යන්තර හා බාහිර රෝගී සත්කාරකත්වය යටතේ ආසන්න වශයෙන් රෝගීන් 10,000 ක් වෙත සාර්ථකව ප්‍රතිකාර සිදුකරන ලදී.

පීපල්ස් ලීසිං මගින් රු. මිලියන 4.35 ක් වටිනා මල්ටිපැරා මොනිටර් දෙකක්, C-PAP/ Bi- PAP යන්ත්‍ර දෙකක් සහ එක් හයි ඔක්සිජන් නේසල් තෙරපි ඒකකයක් කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහල වෙත පරිත්‍යාග කරන ලද අතර එමගින් අප හට දැඩි අවදානම් තත්ත්වයක පසු වූ රෝගීන් රැසක් වෙත ප්‍රතිකාර ලබාදීමට හැකි විය. මේ වන විට අප හට කෝවිඩ් 19 රෝගීන් එතරම් හමුනොවුවද අදාළ පරිත්‍යාග කරන ලද උපකරණ නියෝනේටල් දැඩි සත්කාර ඒකකය, වෛද්‍යමය දැඩි සත්කාර ඒකකය සහ ඉහළ රුදාපැවතුම් සත්කාරක ඒකකයන්හි රෝගීන් සුවපත් කිරීම සඳහා භාවිත කෙරේ. මානව හිතවාදය වෙනුවෙන් සිය වගකීම ඉටුකිරීමෙහිලා නව මාවත් සොයා ගනිමින්, මෙරට අති සාර්ථක මූල්‍ය සමාගමක් බවට පත්වීමට පීපල්ස් ලීසිං සමාගමට හැකිවේවා යන්න මාගේ අවංක වූ ප්‍රාර්ථනය වේ.

**වෛද්‍ය වයි.එම්. මිහිරි ප්‍රියංගනී මිය**
*වැඩබලන අධ්‍යක්ෂිකා*
දිස්ත්‍රික් මහ රෝහල - කෑගල්ල

# සමාජ හා සබඳතා ප්‍රාග්ධනය



*පින්නවල අලි අනාථාගාරයේ ස්ථාපනය කරන ලද අධ්‍යාපනික දැනුවත් කිරීමේ පුවරු නිරාවරණය කිරීම*

**පින්නවල අලි අනාථාගාරයේ අධ්‍යාපනික දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශන ඒකකය ස්ථාපිත කිරීම**

පින්නවල අලි අනාථාගාරය දෙස් විදෙස් සංචාරකයින් රැසක් ආකර්ශනය කරගන්නා වූ ස්ථානයකි. පෙර හඳුනාගත් අවශ්‍යතාවයක් අනුව, පීපල්ස් ලීසිං මගින් එහි දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම සඳහා මූල්‍යමය දායකත්වය දක්වන ලදී. මෙසේ සවිකරන ලද දැනුවත් කිරීමේ පුවරු පින්නවල අලි අනාථාගාරයේ 47 වන සංවත්සර සැමරුමට සමගාමීව සිදුවීමද විශේෂත්වයක් විය. මෙම පුවරු මගින් එහි පැමිණෙන සංචාරකයින් වෙත අලි ඇතුන් පිළබඳ දැනුවත්භාවය වර්ධනය කෙරේ.



**ප්‍රණාමය**

පින්නවල අලි අනාථාගාරය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අතර එය ශ්‍රී ලංකාවේ දෙස් විදෙස් සංචාරකයින් අතර ජනප්‍රිය ගමනාන්තයකි. ආසියානු අලි ඇතුන් පිළිබඳ දැනුම ලබාදීම පින්නවල අලි අනාථාගාරයේ කඩිනම් අවශ්‍යතාවයක් විය. පින්නවල අලි අනාථාගාරය වෙනුවෙන්, මෙකී පුවරු ඔස්සේ ආසියානු අලි ඇතුන් පිළිබඳ සංචාරකයින් දැනුවත් කිරිමෙහිලා දක්වන ලද අනුග්‍රහය සම්බන්ධයෙන් පීපල්ස් ලීසිං වෙත මාගේ ප්‍රණාමය පුද කරමි. අවදානමට ලක් වූ විශේෂයක් වශයෙන්, මෙම දැවැන්ත සත්ව ගහනය පිළිබඳ දැනුම සමාජගත කිරීම අතිශය වැදගත් වන අතර එමගින් ඔවුන්ගේ පැවැත්ම තහවුරු වී ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සුරකෙනු ඇත. අපගේ සංරක්ෂණ ප්‍රයත්නයන් කෙරෙහි දක්වන ලද දායකත්වය වෙනුවෙන් නැවතත් පීපල්ස් ලීසිං සමාගම වෙත මාගේ ප්‍රණාමය හිමි වේ.

**මිහිරාන් මැදවෙල මහතා**
*නියෝජ්‍ය අධ්‍යක්ෂක*
පින්නවල අලි අනාථාගාරය



*නැවත අලුත්වැඩියා කරන ලද මහියංගනයේ පිහිටි ළමා උද්‍යානය විවෘත කිරීමේ අවස්ථාව*

**මහියංගනය ළමා උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීම**

මහියංගනය ප්‍රාදේශීය සභාවේ ඉල්ලීමක් පරිදි පීපල්ස් ලීසිං සමාගම මගින් ළමා හිතකාමී ලෙස මහියංගන ළමා උද්‍යානය අලුත්වැඩියා කරන ලදී. ළමුන් තුළ සුබවාදී ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් උද්‍යානය ඇතුළත සහ පිටත ප්‍රචාරණ පුවරු නැවත සවිකරන ලදී. පීපල්ස් ලීසිං මගින් 2015 දී මෙම උද්‍යානය ඉදිකරන ලදී. මෙය මහියංගන ප්‍රදේශයේ ළමුන් හට විනෝදාශ්වාදය සඳහා කදිම තෝතැන්නක් වේ.



*තංගල්ල මූලික රෝහල වෙත රෝද පුටු පරිත්‍යාග කිරීමේ අවස්ථාව*

**තංගල්ල මූලික රෝහලෙහි ඉදිරිපස පරිශ්‍රය අලුත්වැඩියා කිරීම**

පීපල්ස් ලිසිං මගින් තංගල්ල මූලික රෝහලෙහි ඉදිරිපස පරිශ්‍රය අලුත්වැඩියා කිරීම සිදුකරන ලද අතර දැඩි අවශ්‍යතාවයක්ව පැවති රෝද පුටුද මෙහිදී පරිත්‍යාග කරන ලදී.

**රිජ්වේ ආර්යා ළමා රෝහලෙහි සහ මහරගම අපේක්ෂා රෝහලෙහි මින් මැදුර අඛණ්ඩව නඩත්තු කිරීම**
පීපල්ස් ලීසිං මගින් රිජ්වේ ආර්යා ළමා රෝහලෙහි අංක 07 ළමා වාට්ටුවේ සහ මහරගම අපේක්ෂා රෝහලෙහි මින් මැදුරු නඩත්තු කරන ලදී. මෙකී මින් මැදුරු අභ්‍යන්තර සහ බාහිර රෝගීන් හට ප්‍රසන්න වටපිටාවක් නිර්මාණය කිරීමෙහිලා දායක විය.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ (AAT) පරිත්‍යාග අරමුදල වෙත අඛණ්ඩ දායකත්වය**
පීපල්ස් ලීසිං මගින් 2013 සිට 2020 දක්වා ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණවේදීන්ගේ සංගමය (AAT) මගින් පවත්වන ලද පදනම් සහ අන්තර්මධ්‍ය විභාගයන්හි දෙවන කුසලතා සම්මාන ත්‍යාගය සඳහා අනුග්‍රහය දක්වන ලදී.

## ඉදිරි ගමන්මග

**කෙටි කාලීන 2022/23**

- නිෂ්පාදන නවෝත්පාදනය සහ ඩිජිටල්කරණය
- ව්‍යාපාරික සහකරුවන් සමග වඩාත් සවිමත් සබඳතා
- ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා යහපත් දායකත්වයක් සපයන්නා වූ ජාතික මට්ටමේ ව්‍යාපෘතීන් වෙත සහභාගීත්වය

**මධ්‍ය කාලීන - වසර 3**

- වර්ධනය වන්නා වූ ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම උදෙසා අඛණ්ඩවම නව නිෂ්පාදන හඳුන්වාදීම
- වඩාත් තිරසාර වූ සැපයුම් දාමයක් නිර්මාණය කිරීමෙහිලා සැපයුම්කාර චර්යාධර්ම පද්ධතියක් ඇතුලු පරිපූර්ණ සැපයුම්කාර කළමනාකරණ ආකෘතික රාමුවක් හඳුන්වාදීම
- පාර්ශ්වකරුවන් හට තිරසාර විසඳුම් සැකසීමෙහිලා රජය, අධ්‍යයන සහ ප්‍රජා සංවිධාන සමග අර්ථාන්විත සහයෝගීතාවයන් ගොඩ නංවා ගැනීම

**දිගු කාලීන**

- සේවා ව්‍යාප්තිය සහ කාර්යක්ෂමතා වර්ධනය උදෙසා ඩිජිටල් මාධ්‍යයන් ව්‍යාප්ත කිරීම
- සියලුම සැපයුම්කරුවන් වෙත දැඩි පාරිසරික හා සමාජයීය ක්‍රියාපටිපාටියක් හඳුන්වාදීම
- අර්ථාන්විත මැදිහත්වීම් ඔස්සේ සදාචාරාත්මක හා වගකීම් සහගත වටපිටාවක් නිර්මාණය කිරීම

## සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

ප්‍රවර්ධන හා සෙසු සන්නාම ගොඩනැංවීමේ ව්‍යාපෘතීන් කෙටි කාලීනව මූල්‍ය ප්‍රාග්ධනය වෙත බලපෑමක් ඇති කරයි. කෙසේවුවද, දිගු කාලීනව ඉහළ සන්නාම වටිනාකමක ප්‍රතිලාභ මූල්‍ය ආදායම් කෙරෙහි ඉවහල් වේ.

ඉහළ සන්නාම කීර්තිනාමය මගින් සේව්‍ය සන්නාමය වර්ධනය වන අතර, එමගින් සේවයේ යෙදෙන්නා වූ සේවකයින්ගේ යහ පැවැත්ම ඉහළ නංවමින් උසස් තත්ත්වයේ සේවකයන් ආකර්ශනය කරගැනීමේ අවස්ථාව සමාගම වෙත උදා වේ.

ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහකරුවන් සහ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමග වන මනා සහභාගීත්වය බුද්ධිමය ප්‍රාග්ධනය කෙරෙහි සුබවාදී බලපෑමක් ඇති කරන්නා වූ ව්‍යාපාරික අවබෝධයන් සඳහා හේතු වේ.

සමාගම මගින් සිදුකරන ලද ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් තුලින් පරිසරය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කිරීම අරමුණු කරන ලදී.



# ස්වභාවික ප්‍රාග්ධනය

පාරිසරික තිරසාරත්වය අපගේ ව්‍යාපාරික ආචාරධර්මයන්හි කොටසක් වන අතර, අප විසින් වගකීම් සහගත සම්පත් භාවිතය පිළිබඳ නිරන්තර අවධානයකින් යුතුව අපගේ පාරිසරික පියසටහන අවම කිරීමෙහිලා කැප වී කටයුතු කරනු ලැබේ.

## ස්වභාවික ප්‍රාග්ධන සංරචක



පරිභෝජනය කරන ලද බලශක්තිය



නිකුත් කරන ලද විමෝචනයන්



උත්පාදිත අපද්‍රව්‍ය

## ස්වභාවික ප්‍රාග්ධනය හැසිරවීම




### සමස්ත වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා ස්වභාවික ප්‍රාග්ධනයෙහි දායකත්වය

සේවා සමාගමක් වශයෙන් පීපල්ස් ලීසිං ස්වභාවික සම්පත් භාවිතය මත විශාල රඳාපැවැත්මක් නොපතතින නමුත්, සම්පත් කාර්යක්ෂමව පරිභෝජනය කිරීම සහ වගකීම් සහගත හැසිරීම සමස්ත වටිනාකම් නිර්මාණයට දායක වන සැලකිය යුතු පිරිවැය සහ කාර්යක්ෂම ඉතිරියක් ඇති කරයි.

### ප්‍රධාන ප්‍රතිඵල

- මෙහෙයුම් කාර්යක්ෂමතාවයන්
- පිරිවැය ඉතුරුම්
- සුබවාදී ආයතනික ප්‍රතිරූපය

| ආශ්‍රිත පාර්ශවකරුවන් | ක්‍රමෝපායික අවශ්‍යතා | අවදානම් |
|---|---|---|
|  | • පරිසරය කෙරෙහි අහිතකර බලපෑම පහත හෙළීම<br>• සමාගම තුළ සහ ඉන් පිටත පාරිසරික තිරසාරත්වය පිළිබඳ දැනුවත් කිරීම | • මෙහෙයුම් අවදානම |

## 2021/22 ඉලක්ක මත අත්කර ගත් ප්‍රගතිය

| | | | |
|---|---|---|---|
| අපගේ සේවකයින් තුළ ඩිජිටල් නිපුණතා ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගම මගින් චෙක්පත් මුද්‍රණ ක්‍රියාවලිය ඩිජිටල්කරණය හා විමධ්‍යගත කිරීම සඳහා සහ අන්තර්ජාලගත කල්බදු සේවාවන් ලබාදීම සඳහා DCHEQUE සහ CAPP යන ඩිජිටල් යෙදවුම් හඳුන්වාදෙන ලදී. | | | |
| අපගේ සක්‍රීය ගනුදෙනුකරුවන් හට QR කේත පදනම් කරගත් ගෙවීම් කිරීමේ හැකියාව ඇතුළුව ඩිජිටල් සේවාවන් බොහොමයක් භාවිත කිරීමේ අවස්ථා සලසමින්, සමාගම මගින් මෑතකදී PLC Touch ජංගම යෙවුම හඳුන්වාදෙන ලදී. | | | |
| නව සහ වැඩිදියුණු කරන ලද පීපල්ස් ලීසිං වෙබ් අඩවිය මගින්, ගනුදෙනුකරුවන් හට භාෂා තුනෙන්ම එකම ස්ථානයකදී සේවා ලබා ගැනීමේ අවස්ථාව උදා වේ. | | | |
| සමාගම මගින්, ශාඛා පරිශ්‍රයන්හි සහ ප්‍රධාන කාර්යාලයේ සූර්ය පැනල සවිකිරීම පිළිබඳ අවශ්‍යතා/ආයෝජනය හඳුනාගැනීම සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී. | | | |
| **ප්‍රගති සූචිය** | | | |
| ආරම්භ කරන ලදී | සිදුකෙරෙමින් පවතී | සම්පූර්ණ කරන ලදී | අත්පත් කර නොගන්නා ලදී |

## තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය




## සාර්ථකත්වය මැනීම

### සමාගමෙහි කාබන් පියසටහන




### පාරිසරික සංරක්ෂණ ව්‍යාපෘතීන් කෙරෙහි ආයෝජනය




### හරිත මූල්‍ය පහසුකම් ලබාදීම



# ස්වභාවික ප්‍රාග්ධනය

GRI 102-11, 307-1

**පාරිසරික කළමනාකරණ රාමුව**

පරිපූර්ණ පාරිසරික ප්‍රතිපත්තියෙහි හා තිරසාරත්ව ප්‍රතිපත්තියේ මාර්ගෝපදේශකත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවෙන සමූහයෙහි පාරිසරික න්‍යාය පත්‍රය, හරිත දැනුවත්භාවය, හරිත මෙහෙයුම්, වගකීම් සහගත මූල්‍ය සහ හරිත ව්‍යාප්ති ප්‍රජා සත්කාරයන් යන ක්‍රමෝපායික ස්ථම්භ හතර මත පදනම් වේ.

අභ්‍යන්තරව සකසන ලද පාරිසරික කළමනාකරණ පද්ධතියක් මගින් ප්‍රධාන පාරිසරික දර්ශක තත්කාලීනව හඳුනාගැනෙන අතර එමගින් මේ සම්බන්ධ අපගේ ප්‍රගතිය පිළිබඳව සමීපව නිරීක්ෂණය කළ හැකි වේ. මෙම දත්ත ISO 14064:2018 අනුව හරිතාගාර වායු විමෝචනයන් ප්‍රමාණීකරණය සඳහාද සහාය වනු ඇත.

අප විසින් සියලු පාරිසරික නීතිරීති හා රෙගුලාසි වලට පූර්ණ අනුකූලතාවය දක්වන ලද අතර වසර තුළදී පාරිසරික නීතිරීති හා රෙගුලාසි වෙත අනුකූල නොවන කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැති බව වගකීමෙන් ප්‍රකාශ කරමු.

**පාරිසරික පාලනය**

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමෙහි පාරිසරික ක්‍රමෝපාය සැකසීමෙහිලා පෙරමුණ ගනු ලබන අතර තිරසාරත්ව ව්‍යාපෘතීන් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය තිරසාරත්ව පාලන නියමු කමිටුව වෙත පවරා ඇත.



**හරිත මෙහෙයුම්**

**අපගේ කැපවීම**

පරිසරය වෙත අපගේ සෘජු සුබවාදී බලපෑම කළමනාකරණය සහ ප්‍රශස්තීකරණය

**අප විසින් මෙකී ඉලක්ක අත්පත් කරගන්නා ලද ආකාරය**

- බලශක්ති කාර්යක්ෂමතා පියවර
- වගකීම් සහගත අපද්‍රව්‍ය කළමනාකරණය
- හරිත තාක්ෂණය කෙරෙහි ආයෝජනය
- වගකීම් සහගත ප්‍රසම්පාදනය

**තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය**

7 AFFORDABLE AND CLEAN ENERGY | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION



**වගකීම් සහගත මූල්‍ය**

**අපගේ කැපවීම**

අපගේ නිෂ්පාදන හා සේවාවන්හි හරිත බලපෑම ප්‍රශස්තීකරණය සහ වක්‍ර අයහපත් බලපෑම පහත හෙළීම

**අප විසින් මෙකී ඉලක්ක අත්පත් කරගන්නා ලද ආකාරය**

- වගවීම් සහගත, සදාචාර සම්පන්න සහ විනිවිදභාවයෙන් යුතු මූල්‍ය සේවා සම්පාදනය
- හරිත මූල්‍යකරණය
- ණය ආශ්‍රිත සොයාබැලීම් වලදී පාරිසරික සමාජීය හා පාලන (ESG) පිළිබඳ සැලකිල්ලට ගැනීම්

**තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය**

11 SUSTAINABLE CITIES AND COMMUNITIES



**හරිත දැනුවත්භාවය**

**අපගේ කැපවීම**

අපගේ සැපයුම් දාමය පුරා හරිත සවිඥාණකත්වය ප්‍රවර්ධනය කිරීම

**අප විසින් මෙකී ඉලක්ක අත්පත් කරගන්නා ලද ආකාරය**

- නිරන්තර පුහුණු හා දැනුවත් කිරීමේ සැසි ඔස්සේ පාරිසරික සවිඥාණකත්වය සහිත ශ්‍රම බලකායක් ගොඩනැංවීම
- සැපයුම්කරුවන් අතර තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම

**තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය**

4 QUALITY EDUCATION | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES



**හරිත ව්‍යාප්ති ප්‍රජා සත්කාරයන්**

**වගකීම් සහගත මූල්‍ය**

පරිසර සංරක්ෂණය

**අප විසින් මෙකී ඉලක්ක අත්පත් කරගන්නා ලද ආකාරය**

- නිරන්තර පුහුණු හා දැනුවත් කිරීමේ සැසි ඔස්සේ පාරිසරික සවිඥාණකත්වය සහිත ශ්‍රම බලකායක් ගොඩනැංවීම
- සැපයුම්කරුවන් අතර තිරසාරත්ව ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම

**තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය**

4 QUALITY EDUCATION | 13 CLIMATE ACTION | 15 LIFE ON LAND

### හරිත මෙහෙයුම්

අප විසින් සම්පත් කාර්යක්ෂමව සහ වගකීම් සහගතව භාවිතය සහතික කිරීම සහ අපගේ මෙහෙයුම් වලින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම අවම කිරීමේ පියවර ඔස්සේ අපගේ පාරිසරික පියසටහන පහත හෙළීම සඳහා කැප වී ක්‍රියා කරනු ලැබේ. එම නිසා බලශක්ති කාර්යක්ෂමතාවය, විමෝචන පාලනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය, හරිත මෙහෙයුම්වල දැඩි අවධානයට ලක් වන කරුණු වේ. අපගේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය වෙත පාරිසරික ගැටලු සම්බන්ධ කරගැනීම උදෙසා අප විසින් සමාගමෙහි කාර්යසාධන දර්ශකයන් වෙත පාරිසරික ප්‍රමුඛ කාර්යසාධන දර්ශකයන් ඇතුලත් කරනු ලැබ ඇත.

GRI | 302-1

### බලශක්ති කාර්යක්ෂමතාවය

අපගේ ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය (BMS) මඟින් බලශක්ති පරිභෝජනය සහ කාර්යක්ෂමතාවය නිරන්තරයෙන් අධීක්ෂණය කෙරේ. මෙමගින් බලශක්තිය අපතේ යන හෝ අකාර්යක්ෂම අංශ හඳුනාගනිමින් නිසි පියවර ගැනීමේ අවස්ථාව අප හට උදා වේ. මේ අතර වසර තුළ ක්‍රියාත්මක වූ නිවසේ සිට වැඩකිරීමේ තත්ත්වය තුළ ප්‍රධාන කාර්යාලයේ හා ශාඛාවන්හි සමස්ත බලශක්ති පරිභෝජනය පහත වැටිනි.

2021/22 මූල්‍ය වර්ෂය තුළ පීපල්ස් ලීසිං සමූහයේ ආනයනික බලශක්ති (පද්ධති විදුලිය) පරිභෝජනය කිලෝවොට් පැය 5,056,470.70 ක් විය.

| වසර තුළ ක්‍රියාවට නංවන ලද බලශක්ති ඉතිරිකිරීමේ ව්‍යාපෘතීන් |
|---|
| බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ශාඛා අවකාශ භාවිතය |

GRI | 305-1, 305-2, 305-3

### විමෝචන කළමනාකරණය

සමාගම මගින් 2014/15 මූල්‍ය වර්ෂයේ සිට විමෝචන මට්ටම් මනිනු ලැබේ. ලොව පිළිගත් විමෝචන ගිණුම්කරණ සම්මතය වන ISO 14064:2018 සහ දේශගුණික විපර්යාස සම්බන්ධ එක්සත් ජාතීන්ගේ අන්තර්රාජ්‍ය මණ්ඩලයට (IPCC) අනුව ප්‍රධාන පෙලේ පරිශ්‍රගත හා පරිශ්‍රගත නොවන ක්‍රියාකාරකම් ඔස්සේ හරිතාගාර වායු විමෝචනයන් නිරීක්ෂණය කෙරේ. විදුලි ජනන යන්ත්‍ර සඳහා ඉහළ ඩීසල් භාවිතය, පද්ධති විදුලියේ විමෝචන සාධකය ඉහළ යාම සහ සම්ප්‍රේශන හා බෙදාහැරීම් අලාභ සහ කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පුද්ගලික රථවාහන භාවිතය හේතු කොට ගෙන වසර තුළදී සමස්ත විමෝචනයන් 800.91 $tCO_2e$ (සමූහය) කින් ඉහළ ගියේය.

| සෘජු විමෝචන | වක්‍ර විමෝචන |
|---|---|
| සමාගම සතු වාහන | ආනයනික විදුලිය (පද්ධති විදුලිය) |
| ලිපි ද්‍රව්‍ය දහනය (හදිසි අවස්ථා විදුලි ජනන යන්ත්‍ර) | සම්ප්‍රේශන හා බෙදාහැරීම් අලාභ |
| ගිනි නිවීම් යන්ත්‍ර නැවත පිරවීම/ප්‍රතිස්ථාපනය | සේවක ගමනාගමනය (සමාගම මගින් නොගෙවන ලද) |
| ශීතකරණ කාන්දුවීම් | අපද්‍රව්‍ය බැහැර කිරීම |
| සේවක ගමනාගමනය (සමාගම මගින් ගෙවන ලද) | නාගරික ජල පරිභෝජනය |
| කුලියට ගත් වාහන (සමාගම මගින් ගෙවන ලද) | ව්‍යාපාරික ගුවන් ගමන් |
| ව්‍යාපාරික ගමනාගමන | කුලියට ගත් වාහන (සමාගම මගින් නොගෙවන ලද) |
| | කුලියට ගත් වාහන |
| | අපද්‍රව්‍ය ප්‍රවාහනය |
| | දේශීය වශයෙන් මිලට ගත් අයිතම ප්‍රවාහනය |

| 2021/22 මූල්‍ය වර්ෂය තුළ හරිතාගාර වායු විමෝචන | සමූහය ($tCO_2e$) |
|---|---|
| සෘජු විමෝචන | 1,050.15 |
| වක්‍ර විමෝචන | 4,132.43 |
| මුලු විමෝචන | 5,182.58 |
| හරිතාගාර වායු විමෝචන ඉහළයාම | 800.91 |

2021/22 තුළදී, පීපල්ස් ලීසිං හි සමස්ත කාබන් පියසටහන 4,681.72 tCO2e (සමාගම) වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 870.84 tCO2e ක ඉහළයාමකි. සමූහයෙහි ඒක පුද්ගල විමෝචන සහ විමෝචන තීව්‍රතාවය පිළිවෙළින් 2.31 tCO2e (සේවකයකුට) සහ 1.11 tCO2e (රු. මිලියනයකට) වශයෙන් වාර්තා විය.

#### මූල්‍ය වර්ෂ පුරා හරිතාගාර වායු විමෝචන සැසඳුම (සමූහය) $tCO_2e$




#### 2021/22 මූල්‍ය වර්ෂය සඳහා හරිතාගාර වායු විමෝචන (සමූහය) $tCO_2e$




GRI | 306-1, 306-2, 306-3

### අපද්‍රව්‍ය කළමනාකරණය

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඇතුලු සියලුම අපද්‍රව්‍ය වෙන් කරන ලද අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ වගකීම් සහගතව බැහැර කෙරෙන බවට තහවුරු කරමින් අපගේ ජාලය පුරා ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය සිදු කෙරෙන අතර, අදාළ වෙන් කරන ලද අපද්‍රව්‍ය වගකීම් සහගතව බැහැර කෙරෙන බවට මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි අපද්‍රව්‍ය එකතු කිරීමේ සේවා සම්පාදකයින් විසින් අවධාරනය කෙරේ. මේ අතර අඛණ්ඩ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය සහ කඩදාසි රහිත සේවා පදනමක් හඳුන්වාදීම ඔස්සේ අපගේ කඩදාසි රහිත ක්‍රියාවලිය වසර තුළ දිගටම පැවතුනි.

# ස්වභාවික ප්‍රාග්ධනය

2021/22 වසර තුළදී, පීපල්ස් ලීසිං ප්‍රධාන කාර්යාලයෙහි බැහැර කිරීමේ ක්‍රමය අනුව අපද්‍රව්‍ය කාණ්ඩයන් පහත දැක්වෙන පරිදි වේ:

| අපද්‍රව්‍ය කාණ්ඩය | ප්‍රමාණය (කිලෝග්‍රෑම්) |
|---|---|
| ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි | 13,146 |
| සත්ව ආහාර වශයෙන් නැවත භාවිත කරන ලද ආහාර අපද්‍රව්‍ය | 3,180 |

## වගකීම් සහගත මූල්‍ය

අපගේ ණය ලබාදීමේ ක්‍රියාකාරකම් ඔස්සේ පාරිසරිකව තිරසාර ආර්ථිකයක් ගොඩනැංවීම සඳහා අප විසින් කැප වී කටයුතු කරනු ලැබේ. අපගේ ණය ලබාදීමේ තීරණ වෙත පාරිසරික සමාජයීය පාලන (ESG) සලකාබැලීම් ඇතුළත් කොට ඇති අතර අප විසින් අපගේ ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාර සහකරුවන් අතර පාරිසරික හා සමාජයීය පැතිකඩ පිළිබඳ දැනුවත්භාවය ව්‍යාප්ත කරනු ලැබේ. මේ අතර පීපල්ස් ලීසිං මගින් ලබාදෙන නිෂ්පාදන හා සේවාවන්හි හරිත බලපෑම ප්‍රශස්තීකරණය ඔස්සේ අප විසින් හරිතමූල්‍යකරණය සඳහා කටයුතු කරනු ලැබේ.

විද්‍යුත් රථවාහන සඳහා ලීසිං/ණය පහසුකම්

**රු. මිලියන 3,030.99**

## හරිත දැනුවත්භාවය

අපගේ ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික සහකරුවන්/සැපයුම්කරුවන් සහ ප්‍රජාවන් අතර පාරිසරික ස්ථාවරත්වයෙහි වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම අපගේ පාරිසරික න්‍යායපත්‍රයෙහි ප්‍රධාන තැනක් ගනී. එයට අමතරව තිරසාරත්ව ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ දැනුවත්භාවය ප්‍රචලිත කිරීම උදෙසා ශාඛා ජාලය පුරා සිටින තිරසාරත්වයේ මුලපිරීම් මෙහෙයවීම සඳහා දැනුවත් කිරීම සිදුකරයි.

**සේවකයින්**

- සේවකයින් සඳහා පුහුණු හා දැනුවත්කිරීමේ සැසි
- දැනුවත්භාවය ප්‍රවර්ධනය සහ තිරසාරත්ව ව්‍යාපෘතීන් සංවිධානය කිරීම උදෙසා ශාඛා ජාලය පුරා තිරසාරත්ව ශූරයින් ගොඩනැංවීම

**ගනුදෙනුකරුවන්**

පරිසර හිතකාමී වරණයන් ප්‍රවර්ධනය සඳහා ගනුදෙනුකරුවන් සමග සම්බන්ධ වීම




**සැපයුම්කරුවන්**

ප්‍රසම්පාදන තීරණ වලදී පාරිසරික හා සමාජයීය ප්‍රතිශ්ඨාවන් ඇතුළත් කරගැනීම

**ප්‍රජාව**

ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් ඔස්සේ අපද්‍රව්‍ය කළමනාකරණය සහ පාරිසරික සංරක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම

## හරිත ව්‍යාප්ති ප්‍රජා සත්කාර ව්‍යාපෘති

ජෛව විවිධත්ව සංරක්ෂණය අපගේ හරිත ව්‍යාප්ති ප්‍රජා සත්කාරයන්හි ප්‍රධාන කොටසක් වන අතර අප විසින් අඛණ්ඩවම පාරිසරික සංරක්ෂණය ප්‍රවර්ධනය කෙරෙන්නා වූ ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් කෙරෙහි ආයෝජන සිදුකරනු ලැබේ. වසර තුළදී, පරිසර සංරක්ෂණය ආශ්‍රිත ව්‍යාපෘතීන් කෙරෙහි අපගේ ආයෝජනය රු.මිලියන 1.87 ක් විය.



*2022 පෙබරවාරි 03 වැනි දින Life ව්‍යාපෘතියේ 4 වැනි වසර සහකාර සංචාරය*

### Life - කන්නෙලිය රක්ෂිතයේ ප්‍රතිවනවගා ව්‍යාපෘතිය

පීපල්ස් ලීසිං සමාගම 2018 වසරේ සිට, ඕපාත, හල්ගහවල, කන්නෙලිය රක්ෂිත වනාන්තරයට යාබදව පිහිටි හෙක්ටයාර 10 ක අත්හැර දමන ලද මීවන ඉඩම යථා තත්ත්වයට පත් කිරීම සඳහා අරමුණු කොටගත් මෙම දිගුකාලීන බහුපාර්ශවීය වන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට දායක විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදේශකත්වයෙන් යුතුව ශ්‍රී ලංකා ජෛව විවිධත්ව සංගමය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ. එහිදී සොබාදහම සංරක්ෂණය සඳහා වන ජාත්‍යන්තර එකමුතුව (IUCN) මගින් තාක්ෂණික දායකත්වය සපයන අතර ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ අත්හැර දමන ලද වනාන්තර යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන ආකෘතියක් නිර්මාණයය කිරීම උදෙසා සමාගම් දහයක් සහභාගී කර ගැනේ. 2022 මාර්තු මස අවසානය වන විට සිදුකරන ලද පැළ අධීක්ෂණ කටයුතු පදනම් කරගනිමින්, ප්‍රතිසංස්කරණ පරිශ්‍රය තුළ පැළ 18,500 කට අධික සංඛ්‍යාවක් මේ වන විට වර්ධනය වෙමින් පවතී. මෙයට ස්වභාවිකව වනාන්තරය තුළ වැවෙන විශාල රුක්ෂ ඇතුළත් නොවේ. පීපල්ස් ලීසිං වෙත හෙක්ටයාර 01 ක බිම් කොටසක් වෙන් කොට ඇත. වාර්තාකරණ වසරේදී සමාගම විසින් මෙම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 0.41 ක් ආයෝජන සිදුකරන ලදී.

**සීගිරිය බලකොටු පරිශ්‍රයේ සහ පොළොන්නරුව ගල් විහාර භූමිය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක ස්ථාපනය කිරීම**

ලෝක උරුමයක් වන සීගිරිය පරිශ්‍රයේ කසල බඳුන් 45 ක් සහ පොළොන්නරුව ගල් විහාරයේ කසල බඳුන් 20 ක් ස්ථාපනය කරමින් අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීමට සහ එක්සත් ජාතීන්ගේ තිරසාරත්වය සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට දායකත්වය දක්වන ලදී, දෙස් විදෙස් සංචාරකයින් රැසක් පැමිණෙන මෙම පරිශ්‍රයන්හි ක්‍රියාත්මක ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මගින්, කාබනික, කඩදාසි, පොලිතීන් සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය වෙන් වෙන්ව බැහැර කෙරේ. ව්‍යාපෘතිය සඳහා මුළු ආයෝජනය රු. මිලියන 1.29 කි.



*පොළොන්නරුව ගල් විහාරයේ අපද්‍රව්‍ය වෙන් කිරීමේ බඳුන් භාරදීමේ අවස්ථාව*



*සීගිරිය පරිශ්‍රයේ අපද්‍රව්‍ය වෙන් කිරීමේ බඳුන් භාරදීමේ අවස්ථාව*

---



**ප්‍රණාමය**

පොළොන්නරුව ගල් විහාරය ශ්‍රී ලාංකේය බෞද්ධ උරුමය තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් වේ. එය පුරාණ ඓතිහාසික කලාශිල්ප හැකියාවන් පිළිබඳ සංස්කෘතිකමය සංකේතයක් වන අතර සුවහසක් දෙස් විදෙස් බැතිමතුන්ගේ ගෞරව බහුමානයට පාත්‍ර වේ.

මෙම උරුමයේ පාරිසරික සහ ඓතිහාසික වටිනාකම අවබෝධ කරගනිමින් පීපල්ස් ලීසිං මගින් කසල කළමණාකරණය නිසි ලෙස විධිමත් කිරීම සඳහා අප වෙත ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ බඳුන් 20 ක් පරිත්‍යාග කරන ලදී. අප විහාරය වෙත සිදුකරන ලද මෙම පුණ්‍යකර්මය මම ඉතා අගය කොට සළකමි.

**පූජ්‍ය කන්දකැටිය අත්තදස්සි හිමි**
*විහාරාධිපති - පොළොන්නරුව ගල් විහාරය*



ප්‍රණාමය

සීගිරිය ශ්‍රී ලංකාවේ පවතින යුනෙස්කෝ ලෝක උරුම පරිශ්‍රයක් වන අතර. එය අතීත ගෘහ නිර්මාණ හා භූමි අලංකරණය පිළිබඳ අති විශිෂ්ට වූ සංකේතයකි. ශ්‍රී ලාංකික පුරවැසියන් වශයෙන්, මෙවැනි උරුමයන් සංරක්ෂණය කිරීමෙහිලා වගකීමක් අප සතු වේ. පීපල්ස් ලීසිං මගින් සීගිරිය හා ඒ අවට අලංකාරය පවත්වාගැනීම සඳහා ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ බඳුන් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙහිදී කාබනික, කඩදාසි සහ පොලිතීන්/ ප්ලාස්ටික් වශයෙන් නම් කරන ලද කසල බඳුන් 45 ක් පූර්ව නිශ්චිත ස්ථානයන්හි ස්ථාපනය කරන ලදී. ආයතනික පුරවැසියකු විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සහ ජාතික මට්ටමේ ප්‍රමුඛතාවන් කෙරෙහි දායක වෙමින් සිදු කෙරෙන්නා වූ මෙවැනි ප්‍රජා සත්කාරයන් සැබවින්ම ප්‍රශංසනීය වේ. පීපල්ස් ලීසිං සමාගමට අනාගතයේදීද මෙවැනි අර්ථවත් සමාජ සත්කාර ව්‍යාපෘති සිදුකිරීමට හැකිවේවා යන්න අපගේ ප්‍රාර්ථනය වේ.

ආර්. උපුල් නිශාන්ත මහතා
ව්‍යාපෘති කළමනාකරු
මධ්‍යම සංස්කෘතික අරමුදල - සීගිරිය ව්‍යාපෘතිය

**ශ්‍රී ලංකා ජෛවවිවිධත්ව සංගමයෙහි සහභාගීත්ව සාමාජිකයකු වශයෙන්**

BIODIVERSITY SRI LANKA

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ශ්‍රී ලංකා ජෛව විවිධත්ව සංගමයෙහි සහභාගීත්ව සාමාජිකයකු වන අතර එය 2013 සිට ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සහ පරිසර සංරක්ෂණය සඳහා සමාගම් ක්‍රියාකාරීව සහභාගී කරගනු ලබන පුද්ගලික අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික පදනමක් වේ. ශ්‍රී ලංකා ජෛවවිවිධත්ව සංගමය මගින් ජෛවවිවිධත්වය සහ පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් සවිමත් නායකත්වයක් ප්‍රවර්ධනය කෙරෙන අතර, එමගින් තාක්ෂණික සහාය ලබාදීම, තොරතුරු, දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීම, ක්‍රියාකාරී අධ්‍යයන හා අවබෝධතා යාන්ත්‍රණයන් ඔස්සේ යහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ රාජ්‍ය හා සිවිල් සමාජය හා පුද්ගලික අංශය තුළ සංවාදයක් සඳහා පහසුකම් සැලසීම සිදුකරමින් ශ්‍රී ලංකාවේ බිඳවැටෙමින් පවතින පරිසර පද්ධතිය සංරක්ෂණය සඳහා කටයුතු කරනු ලැබේ.

# ස්වභාවික ප්‍රාග්ධනය



බැද්දගාන තෙත් බිම් උද්‍යානයේ පාරිසරික දැනුවත් කිරීමේ
පුවරු නිරාවරණය කිරීමේ අවස්ථාව

**පරිසර සංරක්‍ෂණ වැඩසටහනක් ලෙස බැද්දගාන තෙත් බිම් උද්‍යානයේ පාරිසරික දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම**

පාරිසරික සංරක්ෂණ ව්‍යාපෘතියක් වශයෙන් උද්‍යානය පුරා ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති පිළිබද දැනුවත් කිරීමේ පුවරු සවිකිරීම සඳහා පීපල්ස් ලීසිං බැද්දගාන තෙත් බිම් උද්‍යානය සමග එක් විය. මෙම පුවරු මගින් උද්‍යානය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් නරඹන්නන් ජෛව විවිධත්වයේ වටිනාකම පිළිබඳ දැනුවත් කෙරේ. ව්‍යාපෘතියේ සමස්ත ආයෝජන රු.මිලියන 0.24 කි.



**ප්‍රණාමය**

ස්වභාවික පරිසරය පිළිබද අධ්‍යාපනවේදීන් සහ පරිසරවේදීන් වශයෙන්, පරිසර සංරක්ෂණය සඳහා ප්‍රජාව සම්බන්ධ කරගැනීම අපගේ වගකීම වේ. මෙම ක්‍රියාවලියේදී දැනුවත්භාවය ඉහළ නැංවීම අතිශය වැදගත් වේ. කොළඹ නගරයේ පිහිටි තෙත් බිම් අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන්, බැද්දගාන තෙත් බිම් උද්‍යානය පාසැල් දරුවන්,ගුරුවරුන්, සරසවි සිසුන් සහ පරිසර සංරක්ෂණය පිළිබද උනන්දුවක් දක්වන පුද්ගලයින් වෙත උපදේශිත සංචාරයන් සහ වැඩමුලු සංවිධානය කෙරේ. මෙයට අමතරව, අධ්‍යාපනික පුවරු මගින් සාමාන්‍ය ජනතාව වෙත ප්‍රතිලාභ අත්වන අතර මෙකී අර්ථදක්වීමේ පුවරු සවිකිරීම අප හට දැඩි අවශ්‍යතාවයක්ව පැවතිනි. අප විසින් මේ සඳහා අනුග්‍රාහකයින් සොයමින් සිටි අතර පීපල්ස් ලීසිං මගින් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් හිමි විය. මෙකී අධ්‍යාපනික පුවරු සවිකිරීම ඔස්සේ, ස්වභාවික මාවත්වල උද්‍යානයේ සැරිසරන්නන් හට නාගරික තෙත් බිම් පරිසර පද්ධති පිළිබද මනා අවබෝධයක් ලබාගත හැකි වේ. මේ සම්බන්ධයෙන් පීපල්ස් ලීසිං සමාගම වෙත මාගේ හදපිරි ප්‍රණාමය පුද කරන අතර ඔබ කළ මෙහෙවර ඉදිර පරම්පරාවල පවතිනු ඇත.

**නර්මදා දන්ගම්පොළ මෙනවිය**
*උද්‍යාන කළමණාකරු*
බැද්දගාන තෙත් බිම් උද්‍යානය

### ඉදිරි දැක්ම

**කෙටි කාලීන 2022/23**

- සමාගමට එහි පරිසරය වෙත සෘජු හා වක්‍ර බලපෑම තක්සේරු කල හැකි වන පරිදි, ජාත්‍යන්තර ආකෘතික රාමුවක් මත පදනම්ව ස්වභාවික ප්‍රාග්ධන ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීම
- ඉහළ ක්‍රියාවලි කාර්යක්ෂමතාවයක් උදෙසා ස්වයංක්‍රියකරණය සිදුකිරීම
- ගනුදෙනුකාරු කාබන් පියසටහන අවම කිරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
- සමාජ සත්කාර ව්‍යාපෘති හරහා ජෛව විවිධත්ව සංරක්‍ෂණය පිළිබඳ දැනුවත්කිරීම ප්‍රවර්ධනය කිරීම
- ප්‍රති වන වගා සහ කාලගුණ ක්‍රියාකාරකම් ව්‍යාපෘතීන් වෙත අඛණ්ඩව සහයෝගය දැක්වීම

**මධ්‍ය කාලීන - වසර 3**

- ශාඛා යටිතල පහසුකම් පහත හෙළීම සඳහා ඩිජිටල් සේවාවන් ඉහළ නැංවීම
- විදුලි අවශ්‍යතා සඳහා ජාතික පද්ධතිය මත රදාපැවතීම පහත හෙළීම
- පාරිසරික අවදානම් කළමනාකරණය සවිබලගැන්වීම

**දිගු කාලීන**

- සරල හා නම්‍යශීලී මෙහෙයුම් ආකෘතියක් වෙත පියනැගීම
- බලශක්ති අවශ්‍යතාවයෙන් 75% ක් පුනර්ජනනීය මූලයන්ගෙන් ලබාගැනීමට ඉලක්ක කිරීම
- සැපයුම්කරුවන් සඳහා සමාජයීය හා පාරිසරික චර්යාධර්ම සංග්‍රහයක් ස්ථාපනය කිරීම

## ස්වභාවික ප්‍රාග්ධන වෙළඳාම් කටයුතු

ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ පරිසර හිතකාමී තාක්ෂණය වෙනුවෙන් කෙටිකාලීනව සැළකිය යුතු මට්ටමේ ආයෝජන සිදුකල යුතු වුවද දිගු කාලීනව එමගින් පිරිවැය ඉතිරි කෙරෙනු ඇත.

බලශක්ති කාර්යක්ෂම තාක්ෂණය, විමෝචන අවම කිරීම සහ හරිත ගොඩනැගිලි වෙනුවෙන් සිදුකෙරෙන ආයෝජන මගින් වඩාත් යහපත් ආකාරයේ භෞතික පරිසරයක් නිර්මාණය කෙරේ.

පාරිසරික වශයෙන් සවිඥාණික වූ සමාගමක් වශයෙන් වන කීර්තිනාමය සන්නාම වටිනාකම තවදුරටත් ඉහළ නංවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස බුද්ධිමය ප්‍රාග්ධනය වැඩි දියුණු වේ.

පාරිසරික වශයෙන් වගකීම් සහගත ආයතනික සංස්කෘතියක්, පුද්ගලයින් වශයෙන් වඩාත් සමාජයීය හා පාරිසරික වශයෙන් වගකීම් සහගත වූවන් බවට පත්වීම සඳහා සේවකයින් දිරිගැන්වේ.

ඉහළ සහභාගීත්ව මට්ටම් ඔස්සේ සිය පාර්ශ්වකරුවන් අතර හරිත දැනුවත්භාවය වර්ධන කිරීමෙහිලා වන සමාගමෙහි ප්‍රයත්නයන් මගින් ගනුදෙනකරුවන්, ව්‍යාපාර සහකරුවන් සහ ප්‍රජාව සමග වන සබඳතා සවිමත් කෙරේ.



අපගේ ස්ථාවර වූ නොසැලෙන සේවා ආචාරධර්ම හා සම්බන්ධ වෙමින්



# නායකත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය **117**
ආයතනික කළමනාකාරීත්වය **121**
ආයතනික පාලනය **124**
සමාගමෙහි කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව **156**
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව **162**
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව **164**
සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු විමර්ශන කමිටු වාර්තාව **166**
නාමයෝජනා කමිටු වාර්තාව **168**
අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව **170**
අනුකූලතා අවදානම් කළමනාකරණය **173**
අවදානම් කළමනාකරණ සමාලෝචනය **176**

# අධ්‍යක්ෂ මණ්ඩලය



**සුජීව රාජපක්ෂ මහතා**
*සභාපති/ විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*



**මීරියම් කොරලි පීටර්ස් මහත්මිය**
*විධායක නොවන ජ්‍යෙෂ්ට ස්වාධීන අධ්‍යක්ෂ*



**රොහාන් පතිරගේ මහතා**
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*



**රංජිත් කොඩිතුවක්කු මහතා**
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*



**චතුර විජේතිලක මහතා**
*විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ*



**අශෝක බණ්ඩාර මහතා**
*විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ*



**ක්ලයිව් ෆොන්සේකා මහතා**
*සභාපති/ විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*



**අසාම් ඒ. අහමත් මහතා**
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*



**මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා**
*විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ*



**ෂාලිනි ද සිල්වා මිය**
*සමාගම් ලේකම්*

# අධ්‍යක්ෂ මණ්ඩලය

### 1. සුජීව රාජපක්ෂ මහතා
*සභාපති/ විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින සුජීව රාජපක්ෂ මහතා සමාගමෙහි සභාපතිවරයා වශයෙන් පත් කෙරිණි.

#### සුදුසුකම්
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි සහ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයකු වන රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
දශක හතරකට අධික කාලයක් පුරා දිවෙන සිය වෘත්තීය ජීවිතයේදී ඒ මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සභාපති, උප සභාපති, මණ්ඩල සභික, එම ආයතනයෙහි විගණන ප්‍රමිති කමිටුවේ හිටපු සභාපති, ශ්‍රී ලංකා ක්‍රිකට් (භාණ්ඩාගාරික, 2011 ක්‍රිකට් ලෝක කුසලාන භාණ්ඩාගාරික, දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ තාක්ෂණික උපදේශක, ආසියා-ශාන්තිකර ගණකාධිකාරිවරුන්ගෙ සම්මේලනයේ තාක්ෂණික උපදේශක ආදී ගෞරවනීය තනතුරු රැසක් හෙබවීය. තවද හෙතෙම නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පීඑල්සී, එන්බී කැපිටල් ලිමිටඩ් - බංග්ලාදේශය, ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී, යුනිඩිල් පැකේජින් ලිමිටඩ්, යුනිඩිල් පැකේජින් ඇන්ඩ් සොලියුෂන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ ධූරයන් දැරීය.

#### වර්තමාන තනතුරු
ලොව පස්වැනි විශාලතම ගිණුම්කරණ ජාලය වන BDO හි දේශීය නියෝජිතයා වන BDO පාර්ට්නර්ස් හි කළමනාකරණ සහකරුවෙකු වශයෙන් රාජපක්ෂ මහතා කටයුතු කරයි. මේ වන විට ඒ මහතා මහජන බැංකුවේ සභාපති, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුරන්ස් පීඑල්සී හි නියෝජ්‍ය සභාපති වසයෙන් තනතුරු හොබවයි. ඒ මහතා හේකාර්බ් පීඑල්සී, ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් පීඑල්සී, හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩින්ග්ස් හි විධායක නොවන අධ්‍යක්ෂකවරයකු වශයෙන් සහ බංග්ලාදේශයේ ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි. රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකි.

ඔහුගේ විශේෂඥ භාවය සියලුම ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සහ ක්‍රියාකාරකම්, මූල්‍ය ක්ෂේත්‍රයන සහ ආචාරධර්ම ආශ්‍රිත රජයේ රෙගුලාසි, රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේම සමස්ත කළමණාකරණ ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්ති වලින් සමන්විත වේ.

### 2. මිරියම් කොරලි පීටර්ස් මහත්මිය
*විධායක නොවන ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ*

2020 මාර්තු 01 වැනි දින කොරලි පීටර්ස් මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කෙරිණි.

#### සුදුසුකම්
එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකාවක වන පීටර්ස් මහත්මිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි අධි සාමාජිකාවකි. සසෙක්ස් විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිධාරිනියක වන ඇය එඩින්බර්ග්හි Heriot-Watt විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන පරිපාලනවේදී උපාධිධාරිණියකි.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
කොරලි පීටර්ස් මහත්මිය රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතනික මූල්‍ය, ගිණුම්කරණය සහ විගණනය සම්බන්ධ වසර 25 කට අධික ජ්‍යෙෂ්ට මට්ටමේ පළපුරුද්දක් සහිත වෘත්තියවේදිනයකි. වසර 2010 දී පීටර්ස් මහත්මිය මූල්‍ය අධ්‍යක්ෂිකාව වශයෙන් ෆින්ලේස් ආයතනය සමඟ එක්වූ අතර 2016දී ඒ මහත්මිය හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පීඑල්සී සහ උඩුපුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් පීඑල්සී හි මූල්‍ය අධ්‍යක්ෂිකාව වශයෙන් පත් කරන ලදුව 2020 දක්වා අදාල තනතුරු දරන ලදී. එයට පෙර ඒ මහත්මිය රිචඩ් පීරිස් සමාගමේ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය වශයෙන් කටයුතු කරමින් පොදු ලැයිස්තුගත සමාගම් පහකින් සමන්විත එම ව්‍යාපාර සමූහයේ කැපී පෙනෙන මූල්‍ය කාර්යභාරයක් ඉටු කළාය.

#### වර්තමාන තනතුරු
පීටර්ස් මහත්මිය සෙලාන් බෑන්ක් පීඑල්සී, බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී හි ස්වාධීන අධ්‍යක්ෂිකා හා සභාපතිවරය වශයෙන්ද සෙලාන් බැංකුව පීඑල්සී හි ස්වාධීන අධ්‍යක්ෂිකා සහ විගණන කමිටු සභාපතිනිය වශයෙන්ද R I L ප්‍රොපර්ටි පීඑල්සී, යුනයිටඩ් මෝටර්ස් ලංකා පීඑල්සී සහ හේමාස් ෆාමසූටිකල් ලිමිටඩ් සහ යුනයිටඩ් මෝටර්ස් ලංකා පීඑල්සී හි විධායක නොවන අධ්‍යක්ෂිකාවක සහ විගණන කමිටු සභාපතිනිය වශයෙන්ද කටයුතු කරයි.

ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි කවුන්සිල සාමාජිකාවකි.

### 3. රොහාන් පතිරගේ මහතා
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 ජූලි 07 වැනි දින රොහාන් පතිරගේ මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

#### සුදුසුකම්
වෘත්තියෙන් නීතිඥයකු වන පතිරගේ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිධරයකු සහ නවසීලන්තයේ මැසේ විශ්ව විද්‍යාලයේ බැංකු කළමණාකරණය පිළිබඳ උපාධිධරයෙකි. ඒ මහතා බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභියෙකි.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
පතිරගේ මහතා මහජන බැංකුවේ මානව සම්පත්, නීති සහ පරිපාලන අංශ සම්බන්ධ 27 වසරක පළපුරුද්දක් සහිත වෘත්තිකයෙකි. මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි - මානව සම්පත් සහ නීති, වශයෙන් ඒ මහතා දහසකට අධික බැංකුවේ දැවැන්ත සේවක මණ්ඩලය කළමනාකරණය කරමින් මානව සම්පත් අවශ්‍යතා අනුව ජ්‍යෙෂ්ඨ විධායක බඳවාගැනීම් සම්බන්ධයෙන් ද කටයුතු කළේය.එයට අමතරව, ඔහු බැංකුවේ සාමාජිකයින් 70 කින් සමන්විත නීති අංශය මෙහෙයවයි. හෙතෙම 2010 අගෝස්තු සිට 2019 මාර්තු දක්වා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වශයෙන් කටයුතු කළේය. ඒ මහතා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ විවිධ අනුකමිටු වෙත පරිපාලන සහාය ද ලබා දෙන ලදී. මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වශයෙන් සිය ධූර කාලය තුළ හෙතෙම පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීම සඳහා දැවැන්ත කාර්ය කාර්යභාරයක් ඉටු කළේය.

#### වර්තමාන තනතුරු
පතිරගේ මහතා මහජන බැංකුවේ විදේශ ගනුදෙනුකාර සේවාවන් සම්බන්ධ ජ්‍යෙෂ්ට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වේ. හෙතෙම බැංකුවේ විදේශ ප්‍රේෂණ ව්‍යාපාරය සහ විදේශ මුදල් ගිණුම් අධීක්ෂණය කරයි. ඒ මහතා පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සභාපති, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් මැක්‍රො කොමර්ස් ලිමිටඩ්, ලංකන් එලයින්ස් ෆිනෑන්ස් ලිමිටඩ් - බංග්ලාදේශය, පීපල්ස් ට්‍රැවල්ස් ලිමිටඩ් යන සමාගම් වල අධ්‍යක්ෂවරයකුවශයෙන් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි විකල්ප අධ්‍යක්ෂ වරයකු වශයෙන් කටයුතු කරයි.

### 4. රංජිත් කොඩිතුවක්කු මහතා
*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 අගෝස්තු 13 වැනි දින කොඩිතුවක්කු මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

#### සුදුසුකම්
කොඩිතුවක්කු මහතා කොළඹ විශ්ව විශ්ව විද්‍යාලයේ මූල්‍ය විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියධරයෙකු, එක්සත් රාජධානියේ නිව් බකිංහැම්ෂයර් විශ්වවිද්‍යාලයේ නීති ගෞරව උපාධිධාරියෙකු, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ට අධි සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකු වේ.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
පරිණත බැංකුකරුවකු වන කොඩිතුවක්කු මහතා, මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සේවය කරයි. දේශීය විදේශය මූල්‍ය මෙහෙයුම් සම්බන්ධ දශක හතරකට ආසන්න බහුවිධ පළපුරුද්දක් ඒ මහතා සතු වේ.

හෙතෙම ශාඛා බැංකුකරණය, ගණුදෙනුදෙනුකාර බැංකුකරණය, ආයතනික බැංකුකරණය, විදේශ බැංකු කරණය, ජාත්‍යන්තර බැංකුකරණය, ව්‍යාපෘති මූල්‍යකරණය අයකර ගැනීම් සහ ඩිජිටල්කරණ ක්ෂේත්‍රයන්හි විශේෂඥයෙකි.

ඒ මහතා බැංකුවේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළ දැවැන්ත කාර්යභාරයක් ඉටු කරන ලද අතර එහිදී ඩිජිටල් පදනම වෙත යහ ක්‍රියාකාරකම් ආදේශ කිරීම වෙනුවෙන් බැංකුව දෙස් විදෙස් සම්මාන සම්මාන හා ඇගයුම් රැසකින් පුද ලද අතර එහි ගෞරවය කොඩිතුවක්කු මහතා වෙත හිමිවේ.

#### වර්තමාන තනතුරු
ෆිනෑන්ෂියල් ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා සමාගමෙහි සභාපතිවරයා වන ඒ මහතා පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ට්‍රැවල්ස් ලිමිටඩ්, ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්, බංග්ලාදේශය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය, ලංකා ක්ලියර් සමාගම, ජාතික ගෙවීම් කවුන්සිලය, සීමාසහිත ශ්‍රී ලංකා බැංකු සංගමය, ලංකා මූල්‍ය සේවා කාර්යාංශය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධ්‍යක්ෂ ධූරයන් හෙබවයි. හෙතෙම ශ්‍රී ලංකා බැංකු සංගමයෙහි (ඇපකර) උප සභාපතිවරයාද වේ.

### 5. චතුර විජේතිලක මහතා
*විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින චතුර විජයතිලක මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

#### සුදුසුකම්
විජේතිලක මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ එක්සත් රාජධානි රාජධානියේ ජාත්‍යන්තර වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයෙකි. ඒ මහතා ඉන්දියාවේ ICFAI විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලබා ගත්තේය.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
බැංකුකරණ ක්ෂේත්‍රයේ වසර තිස් පහකට අධික පළපුරුද්දක් සහිත විජේතිලක මහතා ඉන් වසර දාහතරක් කොමර්ෂල් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ ආයතනික කළමනාකාරිත්වය තුළ ධූරයන් හෙබවීය. එහිදී ඒ මහතා ණය ලබාදීම, අනුකූලතාව සහ ශාඛා පරිපාලනය යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කළේය. හෙතෙම බැංකුවේ අවදානම් මත පදනම් වූ අනුකූලතා ආකෘතිය සහ අවදානම් මත පදනම් වූ අනුකූලතා විගණන පද්ධතිය ස්ථාපනය කිරීම කෙරෙහි පුරෝගාමීව ක්‍රියා කළේය.

ඔහු විසින් වසර පහක කාලයක් පුරා බැංකුවේ විශාල කලාප දෙකක විකිණුම් සහ ලාභ වර්ධනය උපරිම තත්වයකට ගෙන ඒම සඳහා ක්‍රමෝපාය සැකසීම සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් කටයුතු කළේය. ඒ මහතා බැංකුවේ ශාඛා කළමනාකරුවන් සහ ණය නිලධාරීන් වෙත ණය ලබාදීම පිළිබඳ පුහුණු සිදුකරන බැංකු අභ්‍යන්තර සම්පත් පියයේ සාමාජිකයෙකුද විය.

කොමර්ෂල් බැංකුවේ දිගු සේවා කාලය තුළ ඒ මහතා බැංකුව නියෝජනය කරමින් සිංගප්පූරුව, බංග්ලාදේශය, චීනය සහ ජර්මනිය යන රටවල් පුහුණු වැඩසටහන් කිහිපයකට සහභාගි විය. හෙතෙම කොමර්ෂල් බැංකුවෙන් විශ්‍රාම ලැබීමෙන් පසු කෙටි කලක් සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී හි අනුකූලතා සහකාර සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සේවය කළේය.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
විජේතිලක මහතා මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකුකරණ අධ්‍යයන මධ්‍යස්ථානයේ පවත්වන පුහුණු වැඩ වැඩසටහන් සඳහා සම්පත් දායකයකු වශයෙන් සහභාගී වේ.

### 6. අශෝක බණ්ඩාර මහතා
*විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19 වැනි දින අශෝක බණ්ඩාර මහතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

#### සුදුසුකම්
එක්සත් රාජධානියේ චරත් අලෙවිකරුවන්ගේ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය ඒ මහතා සතු වේ.

#### දරන ලද තනතුරු/පළපුරුද්ද
අශෝක බණ්ඩාර මහතා සතුව බහුජාතික සමාගම් සහ ප්‍රකට දේශීය සමාගම් වල ඉල්ලුම් උත්පාදන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාර ප්‍රවර්ධනය සම්බන්ධ වසර තිහකට අධික අත්දැකීම් පවතී. මේ මහතා නෙස්ලේ ලංකා සමාගමේ මැන්කොම් සාමාජිකයෙකු සහ වෙල්මේජ් ෆෝසයිත් සමූහ සමාගමේ සමූහ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් සේවය කළේය. ඒ මහතාගේ මූලික හැකියාවන් අතරට ලාංඡන ගත ව්‍යාපාරයන් ගොඩ නැංවීම සහ වාණිජ කණ්ඩායම් නිර්මාණය කිරීම ඇතුළත් වේ.

#### වර්තමාන තනතුරු
ඒ මහතා ලිට්රෝ ගෑස් ලංකා සමාගම, ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම සහ බිල්ඩ්මාර්ට් ලංකා හි අධ්‍යක්ෂක ධූරයන් හොබවයි. මේ වන විට බණ්ඩාර මහතා ප්‍රධාන පෙළේ දේශීය සමූහ සමාගම් වෙත කළමනාකරණ උපදේශන සේවා සපයයි. පුහුණුකරුවෙකු වශයෙන් ඒ මහතා විදේශීය පුහුණු කටයුතු ද ඇතුළුව කණ්ඩායම් නායකත්වය ගොඩනැංවීම සහ පෞරුෂ ගොඩනැංවීම සම්බන්ධව විශේෂඥභාවයක් උසුලන අතර ව්‍යාපාර පරිපාලනවේදී ඉගැන්වීම්වලදී නායකත්වය, ක්‍රමෝපායික කළමනාකරණය සහ විකිණුම් කළමනාකරණය වැනි විෂයයන් පිළිබඳ පුළුල් දැනුමක් ඒ මහතා සතු වේ.

ඔහුගේ ගැටළු කළමනාකරණ නිපුණතාවයන් උපයෝගී කරගනිමින් ඒ මහතා ක්ෂේත්‍රයේ නියාමන ආයතනයන් සහ ප්‍රධාන පෙළේ පාර්ශවකරුවන් අතර මැදිහත්කරුවෙකු වශයෙන්ද කටයුතු කරයි. ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සංගමයේ හි උප සභාපතිවරයා වන හෙතෙම ලංකා රසකවිලි නිෂ්පාදකයින්ගේ සංගමය සහ ලංකා වාණිජ මණ්ඩලයේ විධායක ආහාර පාන කමිටු සාමාජිකයකු වශයෙන් කටයුතු කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය

### 7. ක්ලයිව් ෆොන්සේකා මහතා

*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

2020 පෙබරවාරි 19වැනි දින ෆොන්සේකා මහතා සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු වන ෆොන්සේකා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි. ඒසීඅයි ඩීලිං සහතිකය වෙනුවෙන් ඒ මහතා වෙත විශිෂ්ට සාමාර්ථයක් හිමිවුණු අතර භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ 28 වසරකට අධික අද්දැකීම් ඒ මහතා සතු වේ. හෙතෙම ඕස්ට්‍රේලියාවේ සහ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි සහතිකලත් සාමාජිකයෙකුද වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

ෆොන්සේකා මහතා ඇමරිකන් එක්ස්ප්‍රස් බැංකුවේ සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ සේවය කළේය. ඒ මහතා 2018 සිට 2020 දක්වා ප්‍රාථමික නියෝජිතයින්ගේ සංගමයෙහි සභාපතිවරයා වශයෙන් කටයුතු කළේය. හෙතෙම ජාතික ගෙවීමේ කවුන්සිලය, මූල්‍ය පද්ධති ස්ථාවරත්ව උපදේශන කමිටුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නව විකල්ප කඩඉම් පොලී අනුපාත අධ්‍යයන හා නිර්මාණ කාර්යසාධන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය. තවද ඉහත දී ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි IABF/DABF විභාග වල ප්‍රධාන විභාග පරීක්ෂක වශයෙන් කටයුතු කළේය.

**වර්තමාන තන්තුරු**

2002 දී මහජන බැංකුවේ සේවයට එක් වූ ෆොන්සේකා මහතා 2011 නොවැම්බර් මස සිට බැංකුවේ ජ්‍යෙෂ්ට ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායමෙහි කටයුතු කළේය. මේ වන විට ඒ මහතා, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් සහ ලංකන් එලායන්ස් ෆිනෑන්ස් බංග්ලාදේශ සමාගමෙහි අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් ද කටයුතු කරයි.

### 8. අසාම් ඒ. අහමත් මහතා

*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ*

අසාම් ඒ අහමත් මහතා 2019 දෙසැම්බර් 30 වැනි දින සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

ඒ මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණකාර ගණකාධිකාරි ආයතනයේ, එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ අය ආයතනයෙන් සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි. හෙතෙම එක්සත් රාජධානියේ අවදානම් කළමනාකරණ ආයතනයේ තාක්ෂණික විශේෂඥයෙකු, ඕස්ට්‍රේලියාවේ සහතිකලත් කාර්යයේ නියුතු ගණකාධිකාරිවරයෙකු සහ එක්සත් රාජධානියේ වරලත් සුරැකුම් සහ ආයෝජන ආයතනයේ සාමාජිකයෙකු වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

අහමත් මහතා සතුව ක්‍රමෝපායක මූල්‍ය කළමනාකරණය, විකල්ප ආයෝජන සහ අවදානම් සම්බන්ධයෙන් දේශීය හා විදේශීය වශයෙන් වසර දහඅටකට වැඩි අත්දැකීම් පවතී. ඔහුගේ පෙර සේව්‍යයන් අතරට අදාල වෙළඳපල වල දැවැන්ත බහුජාතික වෘත්තීය සේවා ආයතන ඇතුළත් වේ.

**වර්තමාන තනතුරු**

අහමත් මහතා 2017 ජනවාරි 3 වෙනි දින සිට මහජන බැංකුවේ මූල්‍ය ප්‍රධානි වශයෙන් කටයුතු කරයි. ඒ මහතා ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් බංග්ලාදේශ සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වේ.

### 9. මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා

*විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ*

අමිර්තනායගම් මහතා 2022 ජූලි 15 වැනි දින සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

**සුදුසුකම්**

අමිර්තනායගම් මහතා වරලත් අලෙවිකරුවන්ගේ ආයතනයෙහි (එක්සත් රාජධානිය) අධි සාමාජිකයකු සහ එක්සත් රාජධානියේ ට්‍රිනිටි සංගීත විද්‍යාලයේ කථනය සහ නාට්‍යකරණය පිළිබඳ ආශ්‍රිත සාමාජිකයකු වේ.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

අමිර්තනායගම් මහතා ශ්‍රී ලංකාවේ ප්‍රචාරණ ක්ෂේත්‍රයෙහි 35 වසරක අධික පළපුරුද්දක් සහිත කීර්තිමත් ප්‍රචාරණ හා මාධ්‍ය වෘත්තිකයෙකි. හෙතෙම මේ වන විට හෝම්ස් පොලාර්ඩ් ඇන්ඩ් ස්කොට් ආයතනයෙහි සභාපති සහ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් කටයුතු කරන අතර, 30 වසරකට පෙර එම ආයතනය බිහි කිරීම සඳහා පුරෝගාමී දායකත්වයක් සපයන ලදී.

ඒ මහතා ප්‍රකට මාධ්‍යවේදියකුද වේ. ජාතික රූපවාහිනී, ස්වාධීන රූපවාහිනී සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ පුවත් නිවේදකයකුද වූ හෙතෙම සම්මුඛ සාකච්ඡා මෙහෙයවන්නකු හා ක්‍රිකට් විස්තර විචාරකයකු වශයෙන්ද කටයුතු කලේය. අමිර්තනායගම් මහතා බටහිර කොළඹ රොටරි සමාජයේ 50 වැනි සභාපතිවරයා වූ අතර වසර 2012 දී වසරේ රොටරි සාමාජික සම්මානයෙන්ද පිදුම් ලැබිය.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් සමාගමෙහි හිටපු සභාපතිවරයා වූ ඒ මහතා, ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් බංග්ලාදේශ සමාගමෙහි සහ පීපල්ස් මර්චන්ට් පීඑල්සී හි අධ්‍යක්ෂවරයකු වේ.

**වර්තමාන තනතුරු**

ළාදුරු බලපෑමට ලක් වූ පුද්ගලයින් නගාසිටුවීම සහ පුනරුත්ථාපන සංගමයෙහි උප සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ඒ මහතා අනුර බණ්ඩාරනායක පදනමේ අධ්‍යක්ෂවරයකුද වේ.

### 10. ශාලනි ද සිල්වා මිය

*සමාගම් ලේකම්*

ශාලනි ද සිල්වා මිය 2021 ජූලි 15 වැනි දින සමාගමෙහි ලේකම්වරිය වශයෙන් පත් කරන ලදී.

**සුදුසුකම්**

ඇය එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනයෙහි සහයෝගී සාමාජිකාවකි. (මේ වන විට එක්සත් රාජධානියේ වරලත් පාලන ආයතනයෙහි වරලත් පාලන වෘත්තිකයකු වශයෙන් හැඳින්වේ). ඒ මහත්මිය ශ්‍රී ලංකා වරලත් ආයතනික ලේකම්වරුන්ගේ ආයතනයෙහි උපාධිධාරිනියක වන අතර කොළඹ විශ්ව විද්‍යාලයේ කලා උපාධිධාරිනියකි.

**දරන ලද තනතුරු/පළපුරුද්ද**

පෞද්ගලික, පොදු ලැයිස්තුගත, සහතිකත්ව සමාගම් සහ සංගම් වල ආයතනික ලේකම් ක්‍රියාකාරකම් සම්බන්ධ වසර 18 කට වැඩි පළපුරුද්දක් සිල්වා මහත්මිය සතු වේ.

**වර්තමාන තනතුරු**

ඒ මහත්මිය පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම සහ පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගමෙහිද සමාගම් ලේකම්වරිය වශයෙන්ද කටයුතු කරයි.

# ආයතනික කළමනාකාරීත්වය



**ෂමීන්ද්‍ර මර්සලින් මහතා**
*ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී*



**ලයනල් ප්‍රනාන්දු මහතා**
*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී*



**රොහාන් තෙන්නකෝන් මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන*



**දමිත් මලවිතන්තිල මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රතිසාධන සහ පරිපාලන*



**ලක්සඳ ගුණවර්ධන මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්*



**ප්‍රභාත් ගුණසේන මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු සන්නිවේදන තාක්ෂණ (සමූහ)*



**උදේශ් ගුණවර්ධන මහතා**
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන*



**රනිල් පෙරේරා මහතා**
*සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රතිසාධනය*



**සුජීවා රණසිංහ මහත්මිය**
*සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් (සමූහ)*



**ෂෙරීන් දාබරේරා මිය**
*සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති*

# ආයතනික කළමනාකාරීත්වය

## 1. ෂමීන්ද්‍ර මර්සලින් මහතා

*(ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී)*

2020 නොවැම්බර් මාසයේ දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමග සම්බන්ධ විය.

### සුදුසුකම්

විද්‍යාවේදී (ගෞරව) සිටි විශ්ව විද්‍යාලය, ලන්ඩන්, එක්සත් රාජධානිය 1996 මූල්‍ය උපදේශකවරුන්ගේ ජාත්‍යන්තර සුදුසුකම (FAIQ), වරලත් රක්ෂණ ආයතනය, එක්සත් රාජධානිය 2008.

### දරන ලද තනතුරු

DFCC බැංකුවේ ජ්‍යෙෂ්ඨ උප සභාපති / ආයතනික බැංකු කටයුතු ප්‍රධානී. DFCC බැංකුවේ විධායක කළමනාකරණ කමිටුවේ (EXCO) සාමාජික.

මාලදිවයිනේ HSBC නේවාසික කළමනාකරු, HSBC ශ්‍රී ලංකාහි සමූහ මූල්‍ය ආයතන සහ රාජ්‍ය අංශයේ ප්‍රධානී සහ HSBC ශ්‍රී ලංකා වෙල්ත් මැනේජ්මන්ට් ඇන්ඩ් ඉන්ෂුවරන්ස් කළමනාකරු.

### අත්දැකීම්

ආයතනික හා ගෝලීය බැංකුකරණය, ආයෝජන බැංකුකරණය, සාමාන්‍ය බැංකුකරණය, ණය පරිපාලනය සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ වසර 24 ක පළපුරුද්ද.

HSBC සමූහය තුළ ශාඛා හා විදෙස් ව්‍යාපාරවලට අදාළ නිෂ්පාදන සංවර්ධනය, උපදේශනය, ව්‍යුහගතකරණය හා මූල්‍යකරණය, ණය පරිපාලනය සහ මෙහෙයුම් පිළිබඳ පළපුරුද්ද.

ආයතනික ව්‍යාපාරික අරමුණු වලට අනුකූලව සංවිධානයේ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව ව්‍යාපාරික වැඩසටහන්, පද්ධති/ ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥ දැනුම.

### වර්තමාන තනතුරු

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ්, පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හා සහ ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් - බංග්ලාදේශයහි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි.

### ඇගයුම්

සියලුම සෘණාත්මක තත්ත්වයන් හමුවේ අර්ථික වර්ධනය වෙත සුවිශේෂී දායකත්වයක් දක්වන ලද වෘත්තිකයින් ඇගයුමට ලක්කෙරෙන CHRO Asia හි නිර්දේශය මත සහ ලෝක මානව සම්පත් වෘත්තිකයින්ගේ සම්මේලනයේ සහතිකත්වයෙන් යුතුව, 2022 විශිෂ්ටතම සේව්‍ය සන්නාම සම්මාන උළෙලේදී 2022 වසරේ ප්‍රධාන විධායක නිලධාරී සම්මානයෙන් පිදුම් ලැබිය.

## 2. ලයනල් ප්‍රනාන්දු මහතා

*ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 1995 වසරේ දී සම්බන්ධ විය.

### සුදුසුකම්

ACA , IBSL හි සම සාමාජික, ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (CA Sri Lanka). ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ (ACMA) සම සාමාජික.

### අත්දැකීම්

මහජන බැංකුව ඇතුළුව බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රවල වසර 33 කට වැඩි පළපුරුද්ද.

### වර්තමාන තනතුරු

පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී, අල්-සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකයේ ප්‍රධානී සහ රන් ණය මෙහෙයුම් භාර නිලධාරී. සීමාසහිත ජාතික දුම්රිය කෞතුකාගාර (ගැරන්ටි) සමාගමෙහි අධ්‍යක්ෂ.

## 3. රොහාන් තෙන්නකෝන් මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 1998 වසරේ දී සම්බන්ධ විය.

### සුදුසුකම්

MBA (කොළඹ), MSc (කළමනාකරණ) - (ශ්‍රී ජයවර්ධනපුර), BSc - ව්‍යාපාර පරිපාලක (දෙවන පන්තියේ ඉහළ/ශ්‍රී ජයවර්ධනපුර), AIB (ශ්‍රී ලංකාව) සහ APBSL බලපත්‍රලාභී CA Sri Lanka.

### දරන ලද තනතුරු

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ (FHA) උප සභාපති සහ 2015 සහ 2017 වර්ෂ සඳහා ක්‍රීඩා උප කමිටුවේ ව්‍යාපෘති ප්‍රධානී. වාණිජ මණ්ඩලය තුළ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සංගමයේ නියෝජිත. අල්-සෆා ඉස්ලාමීය මූල්‍ය සේවා ඒකකයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය.

### අත්දැකීම්

ලීසිං ක්ෂේත්‍රයට බැඳීමට පෙර ගිණුම්කරණය, නිෂ්පාදනය, අපනයනය සහ බැංකුකරණය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි වසර 32 ක පළපුරුද්දක් ඇති අතර අලෙවිකරණය සහ ව්‍යාපාර සංවර්ධනය, ශාඛා මෙහෙයුම්, ණය සම්බන්ධයෙන් අත්දැකීම් බහුල වේ.

### වත්මන් තනතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් හි අවදානම් ප්‍රධානී, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ, මූල්‍ය නේවාසික සංගමයෙහි සභාපති, ශ්‍රී ලංකා කල්බදු සංගමයෙහි අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයෙහි අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අනුකූලතා නිලධාරී, SLIM - NASCO හි ජූරි මණ්ඩල සභික.

## 4. දමිත් මලවිතන්තිල මහතා

*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රතිසාධන සහ පරිපාලන*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 1996 වසරේ දී සම්බන්ධ විය.

### සුදුසුකම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසන් අදියර සහ IBSL අන්තර් මධ්‍ය අදියර සපුරා ඇත.

### අත්දැකීම්

බැංකු හා මූල්‍ය පිළිබඳ වසර 37 කට වැඩි පළපුරුද්ද මෙන් ම විගණනය සහ ගිණුම්කරණය පිළිබඳ වසර ගණනාවක පළපුරුද්ද. වසර නවයකට වැඩි කාලයක් පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරීවරයා ලෙස සේවය කර ඇත. තවද, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි වසර 10 ක පමණ කාලයක් ප්‍රතිසාධන අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ අතර පසුව 2007 වසරේ දී ශාඛා මෙහෙයුම් වලට සම්බන්ධ වී මුළු දිවයිනම ආවරණය වන පරිදි ශාඛා මෙහෙයවිය. දැනට ප්‍රතිසාධන හා පරිපාලන ප්‍රධානී ලෙස කටයුතු කරයි. තවද, ගනුදෙනුකාර සත්කාරක සහ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ඒකකයෙහි කටයුතුද ඔහුගේ අධීක්ෂණයට ලක් වේ.

### වත්මන් තනතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධ ආයතනයක් වන පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ.

### 5. ලක්සඳ ගුණවර්ධන මහතා
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්*

2002 වසරේ දී පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ සම්බන්ධ විය.

**සුදුසුකම්**
MBA, MSc උපායමාර්ගික අලෙවිකරණය, AICM – SL, ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා - SLICM, CMA (Australia), CPM (Asia), SLIMහි සහතිකලත් සාමාජික, SLID සාමාජික , CPM Sri Lanka සාමාජික.

**දරන ලද තනතුරු**
වසර 10 ක කාලයක් ආයතනික කල්බදු අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

**අත්දැකීම්**
ණය, අලෙවිකරණය, අයකර ගැනීම්, ශාඛා සංවර්ධන හා මෙහෙයුම් යන අංශයන්හි ආයතනික හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍යකරණයේ වසර 27 කට වැඩි පළපුරුද්දක් ඇත.

**වත්මන් තනතුරු**
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන පීපල්ස් මයික්‍රෝ-කොමර්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ.

### 6. ප්‍රභාත් ගුණසේන මහතා
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු සන්නිවේදන තාක්ෂණ (සමූහ)*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 1999 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**
MBA (බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලය), පරිගණක පද්ධති සැලසුම් කිරීම පිළිබඳ ඩිප්ලෝමාව - NIBM Sri Lanka. ව්‍යාපෘති කළමනාකරණය තොරතුරු පද්ධති, තොරතුරු විද්‍යාව පිළිබඳ ආයතනය, සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලය

**අත්දැකීම්**
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි වසර 23 ක පළපුරුද්ද.

**වත්මන් තනතුරු**
බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජික, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ප්‍රධානී.

### 7. උදේෂ් ගුණවර්ධන මහතා
*නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 1999 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**
ACA, ACMA (Sri Lanka), භාණ්ඩාගාර කටයුතු, ආයෝජන හා අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (IBSL), ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ ලෝක ත්‍යාගලාභී.

**දරන ලද තනතුරු**
බංග්ලාදේශයේ ලංකා එලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ සමාගම් ලේකම් ලෙස අනුයුක්ත පදනමින් සේවය කර ඇත.

**අත්දැකීම්**
ගිණුම්කරණය, විගණනය, මූල්‍ය කළමනාකරණය සහ භාණ්ඩාගාර කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මූල්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 22 ක පළපුරුද්ද.

**වත්මන් තනතුරු**
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (ඊක) ලේකම්. ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් - බංග්ලාදේශ සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂ.

### 8. රනිල් පෙරේරා මහතා
*සහකාර සාමාන්‍යාධිකාරී - ප්‍රතිසාධනය*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 1999 වසරේ දී සම්බන්ධ විය.

**සුදුසුකම්**
ප්‍රාදේශීය සංවර්ධන හා සැළසුම් (කොළඹ), MBA (මනිපාල්), ආර්ථික සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ), වාණිජවේදී (විශේෂ) ජාත්‍යන්තර වෙළඳාම (ශ්‍රී ජයවර්ධනපුර), CIM (එක්සත් රාජධානිය) සහ වරලත් ගණකාධිකාරී ආයතනය හි අර්ධ සුදුසුකම්.

**අත්දැකීම්**
පීපල්ස් ලීසිං සමූහයේ වසර 22 කට වැඩි පළපුරුද්ද.

### 10. සුජීවා රණසිංහ මහත්මිය
*සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් (සමූහ)*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 2021 පෙබරවාරි මාසයේදී සම්බන්ධ විය.

**සුදුසුකම්**
LL.B - කොළඹ විශ්ව විද්‍යාලය.

**දරන ලද තනතුරු**
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි මානව සම්පත් අංශයේ ප්‍රධානී ලෙසින් කටයුතු කිරීම.

**අත්දැකීම්**
පෞද්ගලික වාණිජ බැංකුවක වසර 26 කට වැඩි පළපුරුද්දක් ඇති අතර වසර 23 කට වැඩි කාලයක් මානව සම්පත් කළමනාකරණයේ යෙදී සිටී.

### 10. ෂෙරීන් දාබරේරා මිය
*සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති*

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමඟ 2022 ජනවරි මාසයේදී සම්බන්ධ විය.

**සුදුසුකම්**
LL. M ජාත්‍යන්තර ව්‍යාපාර නීතිය (විශිෂ්ට සාමර්ථ) ස්ටැෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය 2021, LL. B කොළඹ විශ්ව විද්‍යාලය 2001, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක් වන අතර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරියක හා ලියාපදිංචි සමාගම් ලේකම්වරියකි.

**අත්දැකීම්**
විදුලි සංදේශ සහ බැංකුකරණ ක්ෂේත්‍රයන්හි විවිධාංගීකෘත හා බහු නෛතික ව්‍යාපෘතීන්හි නෛතික, නියාමනමය සහ ආයතනික කටයුතු සම්බන්ධ වසර 18 කට වැඩි පළපුරුද්ද. තොරතුරු තාක්ෂණ නීතිය වෙත අවධානය සමගින් ජාත්‍යන්තර ව්‍යාපාර නීතිය, බුද්ධිමය දේපළ නීතිය, ආයතනික මූල්‍ය නීතිය, බහුජාතික ආයතනික පාලනය සහ ජාත්‍යන්තර කම්කරු නීතිය පිළිබඳ විශේෂඥභාවය.

# ආයතනික පාලනය

දිගින් දිගටම අභියෝගාත්මක වූ වටපිටාවක් තුළ සවිමත් ආයතනික පාලනයක අවශ්‍යතාවය අන් කවරදාටත් වඩා ඉස්මතු විය. පීපල්ස් ලීසිං සමූහය තුළ සුපිළිපන්බව, විනිවිදභාවය සහ වගවීම සම්බන්ධ ප්‍රශස්ත ප්‍රමිතීන් කෙරෙහි අපි කැපවී සිටිමු. යහපාලනය යනු අපගේ තිරසාර වර්ධනයෙහි පදනම වන අතර මෙමෙහෙයුම් සඳහා වන අපගේ සමාජයීය අවසරය ඒ මත රඳා පවතී.

### මූල්‍ය වර්ෂය 2021/22 - විශේෂතා

- COVID-19 වසංගතයෙන් සහ ආර්ථික උච්ඡාවචනයන් මගින් සමාගමට ඇතිවිය හැකි බලපෑම සහ අවදානම් නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.
- දිගු කාලීන දැක්මට සමගාමීව සමූහයේ පරිවර්තනීය ක්‍රමෝපාය නිරීක්ෂණය කිරීම. ව්‍යාපාරික ආකෘතිය වෙත සමෝධානික වටපිටාව, සමාජ හා පාලන ආංශිකයන් ආදේශනය.
- පද්ධති සුරක්ෂිතතාව සහ සයිබර් ආරක්ෂණය ඉහළ නංවන අතරතුර සමූහයේ තාක්ෂණික අංශය සහ ඩිජිටල් සුරක්ෂතාව අධීක්ෂණය කරන ලදී.
- පාලන ව්‍යුහය සවිබලගැන්වීම. මූල්‍ය සමාගම් සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිධාන (ආයතනික පාලන) 2021 නියෝග අංක 5 හි තෝරාගත් විධිවිධාන කල්තබා ආදේශනය. මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු වෙනම මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවක් සහ නාමයෝජනා කමිටුවක් වශයෙන් ප්‍රතිස්ථාපනය.
- අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව සහ ආයෝජන කමිටුව වශයෙන් නව අනු කමිටු දෙකක් ස්ථාපනය කිරීම.
- ශේෂපත්‍ර ස්ථාවරත්වය සහ ආයතනික වර්ධනය සඳහා 2021 ජූලි මස රු. බිලියන 10 ක ණයකර නිකුතුව අනුමත කිරීම.
- සියලු රෙගුලාසි සහ වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුගත වීම.
- 2021 අගෝස්තු 24 සිට බලපැවැත්වෙන පරිදි විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ එස්. අභංගම මහතාගේ ඉල්ලා අස්වීම.
- කොටස්කර ලාභාංශයක් වශයෙන් රු. 0.50 ක අවසන් ලාභාංශයක් අනුමත කිරීම සහ නිර්දේශ කිරීම.

### 1.1 අපගේ පාලන ක්‍රියාවලිය සඳහා ඇති ප්‍රවේශය

ආයතනික පාලනයේ පෙරගමන්කරුවන් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය සිය ආයතනික උපායමාර්ගික අරමුණු ශක්තිමත් ආයතනික පාලන මූලධර්මයන්ට අනුකූලව, එහි කීර්තිනාමය, සාරධර්ම සහ වත්කම් ආරක්ෂා කරමින් පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සමතුලිත කර ගැනීමට හැකි වන පරිදි පවත්වා ගෙන යයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලික සාරධර්මවලට ගැලපෙන ශක්තිමත් පාලන රාමුවක් ස්ථාපිත කර ඇති අතර පුළුල් වගවීම, ශක්තිමත් අවදානම් සහ කාර්ය සාධනය කළමනාකරණය, විනිවිදභාවය සහ ඵලදායී හා ආචාර ධාර්මික නායකත්වය යන ගුණාංග තුළින් එය මෙහෙයවයි. සමෝධානික ප්‍රවේශයක් ආදේශ කොට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම සහ ප්‍රමුඛ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා තීරණ ගැනීමේ ක්‍රියාවලිය වෙත පාරිසරික, සමාජයීය සහ පාලන සිද්ධාන්ත අනුගත කොට ඇත.

### පාලන ආකෘතිය සහ ව්‍යුහය

පාලන ආකෘතිය, ක්ෂේත්‍ර නීතිරීති, ආචාරධර්ම සංග්‍රහයන් සහ සම්මතයන් හා අභ්‍යන්තර පාලන පද්ධති වැනි නියමු සාධනපත්‍ර කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ. නිශ්චිතවම, එය 2017 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ආයතනික පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික පාලනය සම්බන්ධ මූල්‍ය සමාගම් 2008 නියෝග අංක 3 හි මූලධර්ම වලට අනුකූල වේ. සම්පූර්ණ අනුකූලතාවය පිළිබඳ විස්තර පිළිවෙලින් පිටු අංක 143 සිට 155 දක්වා සහ 140 සිට 142 දක්වා ඉදිරිපත් කොට ඇත.

### ආයතනික පාලන අනුකූලතා සාරාංශය

| රෙගුලාසිය/කේතය | ආදේශනය | අනුකූලතාවය | හෙළිදරව් කිරීමේ වගුව |
|---|---|---|---|
| සමාගම් පනත 2007 අංක 07 (සමාගම් පනත) | අනිවාර්ය | පූර්ණ අනුකූලතාවය | |
| කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති | අනිවාර්ය | පූර්ණ අනුකූලතාවය | පිටු අංක 139 සිට 140 |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පිළිබඳ නියෝග 2008 අංක 3 සහ 2008 අංක 04, 2013 අංක 6 සහ 2020 අංක 05 වශයෙන් එය වෙත සිදුකරන ලද සංශෝධන | අනිවාර්ය | පූර්ණ අනුකූලතාවය | පිටු අංක 143 සිට 155 |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පිළිබඳ නියෝග 2021 අංක 05 | ස්වේච්ඡාවෙන් අනුගත විය. (2022 අප්‍රියෙල් 01 සිට බලපැවැත්වෙන පරිදි අනිවාර්ය විය) | වරණීය අනුකූලතාවය | |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද විශිෂ්ට ආයතනික පාලනය පිළිබඳ (2017) පිළිවෙත් සංග්‍රහය | ස්වේච්ඡා | පූර්ණ අනුකූලතාවය | පිටු අංක 140 සිට 142<br>පිටු අංක 140 සිට 142 |

* ආයතනික පාලන නියෝගය වෙත අනුගතවීමේ අවශ්‍යතාවය සපුරාලනු වස් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද 4752 (SLRSPS 4752) දරණ ශ්‍රී ලංකා ආශ්‍රිත සේවා ක්‍රියාකාරකම් ප්‍රකාශනයෙහි දක්වා ඇති ක්‍රියාපටිපාටීන් බාහිර විගණකවරුන් වන මෙසර්ස් අර්න්ස්ට් ඇන්ඩ් යංග් විසින් අනුගමනය කරන ලදී.

**අධ්‍යක්ෂ මණ්ඩලය සතු මූලික වගකීම්**

- උපායමාර්ගික දිශානතිය සකස් කිරීම.
- උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- ආයතනික වටිනාකම් සැකසීම හා ආචාර ධාර්මික හැසිරීම් ප්‍රවර්ධනය කිරීම.
- අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අනුකූලතා පද්ධති ස්ථාපනය කිරීම.
- සමාජයේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම.
- කොටස් හිමියන්, සේවකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ වගකීම් සපුරාලීම, ඔවුන්ගේ අවශ්‍යතා සාධාරණ ලෙස සමබර කිරීම.
- සමාගමේ තත්ත්වය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර හා තේරුම්ගත හැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීම.
- වත්කම් ආරක්ෂා කිරීම සහ නීත්‍යානුකූල භාවිතය සහතික කිරීම.
- අනුප්‍රාප්තික සැලසුම් සකස් කිරීම සහ සමාගමට කිසිදු බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට ඇති හැකියාව සහතික කිරීම.

## සමූහයේ ව්‍යාපාර චර්යාධර්ම සංග්‍රහය සහ ආචාරධර්ම මගින් සියලුම සේවකයින් සහ අධ්‍යක්ෂවරුන් සදාචාරය සම්බන්ධ ප්‍රශස්ත චර්යාවක් අනුගමනය කල යුතු බවට තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික පාලන ප්‍රඥප්තියෙහි නිර්දේශ කොට ඇති පරිදි සමූහයෙහි කාර්යසාධනය සහ කටයුතු පිළිබඳ සාමූහික වගකීම දරනු ලැබේ. මූලික වගකීම් පහත ලැයිස්තුගත කොට ඇත.

සමූහයේ දෛනික කළමනාකරණය සහ පීපල්ස් ලීසිං ක්‍රමෝපායික සැලසුම ක්‍රියාවට නැංවීම ප්‍රධාන විධායක/සාමාන්‍යාධිකාරීවරයාගේ නායකත්වයෙන් යුතු විධායක කළමනාකාරීත්වය වෙත පවරනු ලැබ ඇති අතර, වැඩි අවධානයක් අවශ්‍ය වන ආකාරයේ ක්‍රියාකාරකම් මූල්‍ය වර්ෂය අවසානය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකමිටු හතක් (7) වෙත විමධ්‍යගත කොට ඇත. ප්‍රධාන කරුණු සම්බන්ධ නිරන්තර වාර්තාකරණය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඵලදායී අධීක්ෂණයක් සිදුකිරීමේ අවස්ථාව සැලසෙන අතර, ක්‍රමෝපායිකව අනුකූලනය කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක මගින් කාර්යසාධනය සහ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මග පෑදේ. ව්‍යවස්ථාපිත කමිටු පහේ වාර්තාවන් පිටු අංක 162 සිට 172 දක්වා ඉදිරිපත් කෙරේ.

වෙනස් වන සුලු ව්‍යාපාරික වටපිටාවට අනුගතවීම සහ ව්‍යාපාරික අරමුණ උදෙසා ඒවායේ අදාළත්වය තහවුරු කරනු පිණිස පාලන ආකෘතිය නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ.

**ප්‍රධාන පාලන නියමු සාධනපත්‍ර**

පාලන ආකෘතිය බාහිර සහ අභ්‍යන්තර නියමු සාධනපත්‍ර කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.

- සමාගම් ව්‍යවස්ථාව
- ආයතනික පාලන ප්‍රඥප්තිය
- ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතිය.
- මෙහෙයුම් ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ අත්පොත්
- තොරතුරු දැනගැනීම පිළිබඳ ආරක්ෂණ ප්‍රතිපත්තිය
- අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි
- අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලි
- මුදල් විශුද්ධිකරණ විරෝධී ප්‍රතිපත්තිය
- ආයතනික සන්නිවේදන ප්‍රතිපත්තිය




- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත
- 2007 අංක 07 දරණ සමාගම් පනත
- 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත)
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද විශිෂ්ට ආයතනික පාලනය පිළිබඳ පිළිවෙත් සංග්‍රහය
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පිළිබඳ උපදෙස්.
- තිරසාරභාවය පිළිබඳ GRI මාර්ගෝපදේශ

# ආයතනික පාලනය

GRI 102-18

ආයතනික ව්‍යුහය




## අධිකාරීත්වය පැවරීමේ (DLA) ආකෘතිය

පැවරීමේ ව්‍යුහයන් මගින්, අධ්‍යක්ෂ මණ්ඩල හට ඵලදායී පාලනයක් සඳහා අවස්ථාව සැලසෙන අතරම අධිකාරීත්වය අනුයුක්ත කිරීමද සිදුකෙරේ. අධිකාරීත්වය පැවරීම මගින් සිය සාමාන්‍ය නෛතික වගකීමේ කාර්යභාරයන් අවප්‍රමාණය නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගැනේ. ප්‍රධාන කරුණු සම්බන්ධ නිරන්තර වාර්තාකරණය ඵලදායී අධීක්ෂණය සඳහා මග පාදයි.

## ප්‍රධාන විශේෂතා

- ප්‍රධාන කරුණු සම්බන්ධ නිරන්තර වාර්තාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඵලදායී අධීක්ෂණය සඳහා මග පාදයි.
- කළමනාකාරීත්වය අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි විවෘතව සහ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන අතර සුදුසු පරිදි සහ කාලෝචිත අයුරින් අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවයි.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එහි අධීක්ෂණ වගකීම් සහ කළමනාකාරීත්වයට මෙහෙයුම් සිදුකළ හැකි ආකාරයේ ව්‍යවසායික වටපිටාවක් පවත්වාගෙන යාම අතර සමතුලනයක් ඇති කිරීම සඳහා ප්‍රයත්න දරනු ලැබේ.
- කාර්යභාරයන් පැහැදිලිව දක්වා ඇති අතර (විධිවිධාන සහ සේවා නියුක්ති විස්තර මගින්) අධිකාරීත්වය සහ වගකීම් බලාත්මක අයුරින් ක්‍රියාවට නංවා ඇත.
- ක්‍රමෝපායිකව අනුකූලනය කරන ලද මූල්‍යමය සහ මූල්‍ය නොවන ප්‍රමුඛ කාර්යසාධන දර්ශක මගින් කාර්යසාධනය සහ අරමුණු සාක්ෂාත් කරගැනීම සිදුකෙරේ.
- සියලුම ක්‍රියාකාරී අංශයන් හැකියාවන්ගෙන් පරිපූර්ණ වෘත්තිකයන්ගෙන් සමන්විත වන අතර ප්‍රමාණවත් සම්පත් දායකත්වයක් ඒවාට ලබාදී ඇත.
- අදාළ අංශයන්හි ස්වාධීනත්වය තහවුරු කරමින් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා විගණන කමිටුව වෙත වාර්තා කරන අතර ප්‍රධාන අවදානම් නිලධාරීවරයා සහ අනුකූලතා නිලධාරීවරයා සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි.
- සමූහයේ පරිණාමය වන්නා වූ අවශ්‍යතා සහ ව්‍යාපාරික සන්දර්භය වෙත අදාළ සීමාවන් අනුකූලනය වන බවට තහවුරු කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරීත්වය පැවරීමේ ආකෘතිය ආවර්තිතව සමාලෝචනයට ලක් කෙරේ.

### 1.2 2021/22 මූල්‍ය වර්ෂය තුළ පාලනය

ආයතනික පාලන ආකෘතිය වැඩිදියුණු කිරීම උදෙසා, සමාගම මගින් ක්‍රියාකාරීව 2021 අංක 05 දරණ නව ආයතනික පාලන නියෝගය අදේශ කරගැනීමට කටයුතු කරන ලදී. මූල්‍ය වර්ෂය අවසානය වන විට, නව නියෝගයෙහි තෝරාගත් විධිවිධානයන් ස්වේච්ඡාවෙන් සමාගම තුළට ආදේශනය කරන ලදී.

#### අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වන ප්‍රධාන ක්ෂේත්‍ර - 2021/22

**ක්‍රමෝපාය සහ ව්‍යාපාර**

- සමූහයේ ක්‍රමෝපායික සැලසුම සහ අවදානම් හා අවස්ථාවන්හි බලපෑම නිරීක්ෂණය
- සැළකිය යුතු ආයෝජන, ණයකර නිකුතුව අනුමත කිරීම
- ඩිජිටල් පරිවර්තනීය ක්‍රමෝපාය වෙත සහාය දක්වමින් තොරතුරු තාක්ෂණ පද්ධතින් ඩිජිටල්කරණය සහ අධිශ්‍රේණිගත කිරීම
- නවතාවයෙන් යුතු සැලසුම් හඳුන්වාදීම සහ නව සැලසුම් එළිදැක්වීම සඳහා අඛණ්ඩ සහයෝගය
- අයවැය අනුමත කිරීම

**අවදානම සහ අධීක්ෂණය**

- පීපල්ස් ලීසිං සමූහයේ කාර්යසාධන සමාලෝචනය
- අවදානම් කළඹ සහ අවදානම් කළමනාකරණය නිරීක්ෂණය
- අනුකූලතාවය නිරීක්ෂණය
- මෙහෙයුම් පරිසරයෙන් සිදුවන බලපෑම් සමාලෝචනය
- වත්කම් වල ගුණාත්මකභාවය සමාලෝචනය

**පාලනය**

- 2021 අංක 05 දරණ නව ආයතනික පාලන නියෝගයෙහි විධිවිධානයන් ක්‍රියාකාරීව ආදේශනය කරන ලදී. නව අනුකමිටු දෙකක් ස්ථාපනය කරන ලදී.
- ණය කමිටුව සහ ආයෝජන කමිටුව ස්වේච්ඡාවෙන් ස්ථාපනය කරන ලදී.
- ප්‍රතිපත්ති රාමු සමාලෝචනය
- නීතිරීති හා කොන්දේසි වෙත අනුකූලතාවය තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වයේ අනුප්‍රාප්තික සැලසුම් කිරීම.
- නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයුම සහ ක්‍රියාකාරී සැලසුම.

**පාර්ශවකාර සහභාගීත්වය**

- පාර්ශ්වකරුවන් වෙත වෙනස් වන සුදු ව්‍යාපාරික වටපිටාවෙහි සහ වසංගතයේ බලපෑම. තිරසාරත්වය කෙරෙහි සහාය දක්වීම උදෙසා නිර්මාණය කරන ලද ව්‍යාපෘතීන් සංවර්ධනය සහ ක්‍රියාවට නැංවීම
- ඩිජිටල් මාධ්‍යයෙන් සිදුකරනු ලබන වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීම
- වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමිකාර තොරතුරු සමාලෝචනය
- ශ්‍රී ලංකා මහ බැංකුව සමග කටයුතු කිරීම

**මූල්‍ය ක්‍රියාකාරීත්වය**

- කෝවිඩ් 19 සහ සාර්ව ආර්ථික වටපිටාවේ උච්ඡාවචනයන්ගේ මූල්‍යමය බලපෑම.
- යෝජිත ලාභාංශ ගෙවීම්, කොටස්කර ලාභාංශ නිකුත් සහ ණයකර නිකුතු.
- ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධ නියාමන වෙනස්වීම් වල මූල්‍ය බලපෑම
- මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව අනුමත කිරීම

අපගේ දිගු කාලීන තිරසාරත්වය සහ සාර්ථකත්වය අප විසින් අපගේ පාර්ශ්වකරුවන් වෙත ලබාදෙන වටිනාකම මත රඳාපවතින බව අපගේ අවබෝධයයි. සමාජයීය අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිෂ්ඨාගත සංවර්ධනය සහ සැලසුම් හා සේවාවන් ලබාදීමෙන් මෙන්ම අපගේ මෙහෙයුම් තුළින්, ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම සඳහා වන අපගේ කාර්යභාරය ඉටු කරමින්, දිගු කාලීන වටිනාකම් නිර්මාණය කරනු ලබන අතරතුර පාර්ශ්වකාර විශ්වාසය පවත්වාගෙන යාම අපගේ අරමුණ වේ.

2021/22 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂණය සහ අධීක්ෂණය ඉහළ නැංවුනු අතර, එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික කළමනාකාරීත්වය සමගින් සමූහය වෙත වසංගතයේ සහ වර්ධනය වෙමින් පවතින ජාතික ආර්ථික අර්බුදයේ බලපෑම සමාලෝචනය කෙරිණි. මෙහිදී සේවකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය මූලික

සමාගමෙහි පරිපූර්ණ ප්‍රතිපත්තිමය ආකෘතිය ආයතනයෙහි සියලුම මට්ටම් වල චර්යාව සහ තීරණ ගැනීම සඳහා මාර්ගෝපදේශයන් සපයයි. සමූහයේ වර්ධනය වෙමින් පවතින අවශ්‍යතා සපුරාලීම උදෙසා මෙම ආකෘතිය නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ.

**2021/22 කාලසීමාවේදී සකස් කරන ලද නව ප්‍රතිපත්ති**

- පරිපූර්ණ ආයතනික සන්නිවේදන ප්‍රතිපත්තිය
- ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය තෝරාගැනීම සහ පත්කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය
- ප්‍රති මුදල් විශුද්ධිකරණ ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටිය
- අනුප්‍රාප්තික සැලසුම් ප්‍රතිපත්තිය
- මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ නාමයෝජනා කමිටුව වෙත ආදේශනය කරන ලද නව යොමු කොන්දේසි
- අධ්‍යක්ෂවරුන් තෝරාගැනීම/පත්කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය

**2021/22 කාලසීමාවේදී සමාලෝචනය සහ යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්ති**

- කොටස් වෙළඳාම් ප්‍රතිපත්තිය
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය සහ අත්පොත

# ආයතනික පාලනය

තැනක් ගත් අතර, ඔවුන්ගේ සුරක්ෂිතතාව උදෙසා අවශ්‍ය සියලුම පියවර ගන්නා ලදී. අවදානම් කළමනාකරණය, අයකර ගැනීම් සහ අභ්‍යන්තර පාලනය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමුඛ අවධානය යොමු විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඍජුව සහ අනුකමිටු ඔස්සේ, මෙම අභියෝග යන් වෙත සාර්ථකව මුහුණදෙමින්, අර්බුදය කළමනාකරණය කරගනිමින් සමූහය සහ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම සඳහා කටයුතු කෙරිණි.

කඩිනම් ෆිස්කල් සහ මුදල් පියවර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහළ නංවන ලද වාර්තාකරණ අවශ්‍යතා අනුගමනය කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නෛතික හා නියාමනමය වාර්තාකරණය සම්බන්ධයෙන් බලාත්මක අනුකූලතාවයක් දක්වන ලදී. වසර තුළදී පීපල්ස් ලීසිං සමූහය සියලුම රෙගුලාසි කෙරෙහි කැපවීමෙන් යුතුව අනුකූලතාවය දැක්විය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩවම, ගනුදෙනුකරුවන් හා සේවකයින් වෙත වඩාත් උසස් සේවාවක් ලබාදීම අරමුණු කරගත් සමූහයේ සමස්ත පරිවර්තනීය වැඩ පිළිවෙල සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වෙත සහාය දක්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමූහයේ ඩිජිටල් පරිවර්තනය සහ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය විස්තරාත්මකව සමාලෝචනය කරමින්, ඩිජිටල් සේවා පදනම් සහ සයිබර් සුරක්ෂිතතා කළමනාකරණය සඳහා වන ආයෝජන ඉහළ නංවන ලද අතර, ඩිජිටල් සේවාවන් ව්‍යාප්ත කිරීම සහ ගනුදෙනුකරුවන් ඉලෙක්ට්‍රොනික සේවා මාධ්‍යයන් වෙත යොමු කිරීම සඳහා කටයුතු කරන ලදී.

සමාගමෙහි පරිවර්තනීය ක්‍රමෝපාය, පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති හා අභ්‍යන්තර පාලනයන් වෙත සහාය දක්වනු වස් ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන් සවිබලගන්වන ලදී.

මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව වෙන් වෙන් වූ අනුකමිටු දෙකක් වශයෙන් නැවත අනුයුක්ත කරන ලදී.

1. මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව
2. නාමයෝජනා කමිටුව

මෙය 2021 දෙසැම්බර් 31 දිනැති 2021 අංක 05 දරණ ආයතනික යහපාලන විධානයන්හි අවශ්‍යතාවයක් වන අතර, සමූහය 2022 ජනවාරි මස එය වෙත ක්‍රියාකාරීව අනුගත විය. තවද, ණය කමිටුව සහ ආයෝජන කමිටුව යනුවෙන් නව අනුකමිටු දෙකක් ස්ථාපනය කරන ලද අතර, සමූහයෙහි වර්ධනය වෙමින් පවතින අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිපත්තිමය ආකෘතිය සමාලෝචනයට ලක් කරන ලදී. වසර තුළදී නව ප්‍රතිපත්ති 06 ක් හඳුන්වාදෙන ලද අතර දෙකක් සංශෝධනය කෙරිණි.

GRI | 405-1

### 1.3 අධ්‍යක්ෂ මණ්ඩල පාලනය

ප්‍රබල හා ඵලදායී ආකෘතියක් තුළ පාර්ශ්වකාර වටිනාකම් නිර්මාණය සුරැකීම උදෙසා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිගින් දිගටම සදාචාර සම්පන්න සහ බලාත්මක නායකත්වයක් සපයනු ලබයි. පෙර මූල්‍ය වර්ෂයේදී සිය කාර්යභාරයන් සපුරාලන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

#### 1.3.1 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් සියලුදෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් හැරුනුවිට, සෙසු අධ්‍යක්ෂවරුන් මව් සමාගම වන මහජන බැංකුව විසින් නිර්දේශ කෙරෙන

**8**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණය**
නියාමනමය අවශ්‍යතා සපුරාලනු ලබන අතරතුර, වගවීම ප්‍රවර්ධනය කරමින් යහපත් වූද ඵලදායී වූද විවාදයන් හා තීරණ ගැනීම් දිරිගැන්වෙන අයුරින් අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රමාණය සුදුසු පරිදි සකසනු ලැබ ඇත.

**ස්ත්‍රී පුරුෂභාව විවිධත්වය**
7 | 1

**වයස් විවිධත්වය**
පළපුරුද්ද සහ විශේෂඥභාවය අතින් සමතුලිත වේ.

වයස අවුරුදු 60 ට අඩු
50%

**සමතුලිත සහ විවිධත්වයෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලයක්**



| මණ්ඩල සංයුතිය | |
|---|---|
| ස්වාධීන අධ්‍යක්ෂවරුන් | 3 |
| විධායක නොවන අධ්‍යක්ෂවරුන් (සභාපතිවරයා ඇතුලුව) | 5 |

**ස්වාධීනත්වය**
අධ්‍යක්ෂ මණ්ඩලයෙන්
**>38%**
ස්වාධීන වේ

**විශේෂඥභාවය**
පළපුරුදු අධ්‍යක්ෂ මණ්ඩලයකි: සමූහයට අදාළ දැනුම සහ නිපුණතා ඒකරාශී කෙරේ.



අතර සමාගම් ව්‍යවස්ථාව ප්‍රකාරව මීළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන් විසින් නැවත පත්කිරීමට යටත් වේ. ස්වාධීන අධ්‍යක්ෂවරුන් ස්වකීය ක්ෂේත්‍රයන්හි පරිණත වෘත්තිකයින් වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල විවාදයන්හිදී වටිනා අවබෝධයන් සහ විවිධ වූ දර්ශනයන් ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමූහික පසුබිම මගින් මණ්ඩලයේ කාර්යභාරයන් සහ වගකීම් වෛෂයිකව හා ඵලදායී ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි කුසලතා හා අත්දැකීම් අතර සමබර සම්මිශ්‍රණයක් සපයයි. සියළුම අධ්‍යක්ෂවරුන් ඵලදායී ලෙස රාජකාරි ඉටු කිරීම, ඵලදායී ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවල නිරත වීම සහ ඔවුන් ඉදිරියේ තබා ඇති කරුණු විෂයමූලික වශයෙන් ඇගයීම සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, නාමයෝජනා කමිටුව ඔස්සේ අඛණ්ඩවම සංයුතිය සමාලෝචනයට ලක් කෙරේ. සභාපතිවරයා ඇතුලු අධ්‍යක්ෂවරුන්, මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් විචක්ෂණශීලී අවබෝධයන් සපයයි.

### 1.3.2 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

අධීක්ෂණ වගකීම් සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වෙත යම් යම් වගකීම් පැවරීම මගින්. ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබෙන අතර එසේ පවරන ලද කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමුවන බව සහතික කෙරේ. එසේම මෙමගින් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ සුවිශේෂී වූ විශේෂඥභාවය නිසි පරිදි යොදාගැනීමේ අවස්ථාවද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උදා වේ.

### 1.1.1 සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා සමාගම් ලේකම් කාර්යාලය අතිශය වැදගත් වේ. සමාගම් ලේකම්වරිය විසින් ආයතනික පාලනය පිළිබඳ යහ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරමින්, සිය කාර්යභාරයන් සහ වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය උපදෙස් සපයනු ලැබේ.

සියලුම අධ්‍යක්ෂවරුන් හට, සුදුසුකම් ලත් වරලත් ලේකම්වරියක වන ෂාලිනි සිල්වා මහත්මියගේ උපදෙස් සහ සේවාවන් ලබාගත හැක. සමාගම් ලේකම් පත්කිරීම සහ ඉවත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයක් වේ.

අදාළ කමිටු අධ්‍යක්ෂ මණ්ඩල අනුමත විධිවිධානයන් සහ යොමු කොන්දේසි මගින් පාලනය වේ. කමිටු වල ඵලදායී ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අදාළ කමිටු සභාපතිවරුන් වගකිව යුතු වන අතර, ඔවුන් නිරන්තරයෙන් කමිටු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කල යුතු වේ.

**ස්වාධීනත්වය**

සමූහයේ සියලුම අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීනත්වය සඳහා වන ක්‍රියාපටිපාටිය සපුරාලන ලදී.

**අර්ථ දැක්වීම** → **තක්සේරුව** → **ප්‍රතිඵලය**

**අර්ථ දැක්වීම:** 2008 අංක 03 දරණ ශ්‍රී ලංකා මූල්‍ය සමාගම් (ආයතනික යහපාලන) සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකුවේ, කොළඹ කොටස් වෙළෙපොළ නියෝග යෙහි දක්වා ඇති නිර්ණායක සහ එහි කිසියම් සංශෝධනයක් ඇතුළුව දක්වා ඇති නියාමනයට අනුකූල ව ස්වාධීනත්වය තීරණය වේ.

**තක්සේරුව:** විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ප්‍රකාශනය සහ වෙනත් තොරතුරු මත පදනම්ව අධ්‍යක්ෂවරුන් සම්බන්ධ ස්වාධීන තක්සේරුව මණ්ඩලය විසින් වාර්ෂිකව සිදු කරනු ලැබේ.

**ප්‍රතිඵලය:** සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට බලපාන හෝ බලපාන බවක් පෙනෙන්නට ඇති සම්බන්ධතා හෝ තත්ත්වයන් නොමැති බව මණ්ඩලය සෑහීමකට පත් වේ.

# ආයතනික පාලනය

| | අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව | අධීක්ෂණ අංශ | සංයුතිය | වැඩි විස්තර |
|---|---|---|---|---|
| ව්‍යවස්ථාපිත කමිටු | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) | • මූල්‍ය වාර්තාකරණයේ සහ අනාවරණය කිරීමේ අඛණ්ඩතාව<br>• අභ්‍යන්තර පාලනයන් සහ අභ්‍යන්තර විගණනය<br>• බාහිර විගණනය<br>• අනුකූලතාව | • කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>• එක් විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් | 162 සිට 163 දක්වා පිටුවල දැක්වෙන විගණන කමිටු වාර්තාවයි (BAC) |
| | අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) | • විස්තීරණ අවදානම් කළමනාකරණ රාමුව<br>• අවදානම් මැනීම, අධීක්ෂණය සහ කළමනාකරණය<br>• නියාමන හා අභ්‍යන්තර විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූල වීම | • කමිටුවේ සභාපති ඇතුළු එක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක්<br>• විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>• ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී<br>• ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් දෙදෙනෙක් - මෙහෙයුම්<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන | 170 සිට 172 දක්වා පිටුවල දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව |
| | මානව සම්පත්, පාරිතෝෂිත සහ නාමයෝජනා කමිටුව (NRHRC)<br>(2022 ජනවාරි 27 සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලදී) | • අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම හා පත් කිරීම<br>• විශේෂඥයන්ගේ හිගය පියැවීම, අනුප්‍රාප්තිය සහ නැවත තෝරා පත් කර ගැනීම<br>• අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික පාලනය<br>• පාරිතෝෂිත ඇතුළු මානව සම්පත් ප්‍රතිපත්ති.<br>• සංවිධාන වටිනාකම් සහ චර්යාධර්ම පද්ධතිය<br>• කම්කරු නීතිවලට අනුකූල වීම<br>• කාර්ය සාධනය ඇගයීම, කුසලතා කළමනාකරණය, අනුප්‍රාප්තිය ඇතුළු මානව සම්පත් පද්ධති | • කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>• එක් විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් | |
| | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව<br>(2022 ජනවාරි 27 සිට බලපැවැත්වෙන පරිදි) | • පාරිතෝෂිත ඇතුළු මානව සම්පත් ප්‍රතිපත්ති.<br>• සමාගම් වටිනාකම් සහ චර්යාධර්ම පද්ධතිය<br>• කම්කරු නීතිවලට අනුකූල වීම<br>• කාර්ය සාධනය ඇගයීම, කුසලතා කළමනාකරණය, අනුප්‍රාප්තිය ඇතුළු මානව සම්පත් පද්ධති | • කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>• එක් විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් | 164 සිට 165 දක්වා පිටුවල වාර්තාව |
| | නාමයෝජනා කමිටුව<br>(2022 ජනවාරි 27 සිට බලපැවැත්වෙන පරිදි) | • අධ්‍යක්ෂවරුන්, ප්‍රවීනි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් තෝරාගැනීම හා පත්කිරීම<br>• විශේෂඥභාව පරතරයන්, අනුප්‍රාප්තිකත්වය සහ නැවත තෝරා පත්කර ගැනීම<br>• අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික පාලනය | • කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>• එක් විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් | 168 සිට 199 දක්වා පිටුවල වාර්තාව |

| | අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව | අධීක්ෂණ අංශ | සංයුතිය | වැඩි විස්තර |
|---|---|---|---|---|
| | සම්බන්ධිත පාර්ශ්වයන්හි ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) | • සම්බන්ධිත පාර්ශවයන්හි ගනුදෙනු සමාලෝචනය | • කමිටුවේ සභාපති ඇතුළු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්<br>• එක් විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් | 166 සිට 167 දක්වා පිටුවල වාර්තාව |
| ස්වේච්ඡා කමිටු | අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව | • ණය ක්‍රියාකාරකම් සමාලෝචනය | • විධායක නොවන ස්වාධීන නොවන එක් අධ්‍යක්ෂවරයකු (සභාපති)<br>• ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු | අනිවාර්ය නොවේ |
| | ආයෝජන කමිටුව | • ආයෝජන අවස්ථා සමාලෝචනය සහ නිර්දේශ කිරීම | • සභාපති ඇතුලුව විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු<br>• ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එක් අයෙකු | අනිවාර්ය නොවේ |

### 1.3.3 පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම්

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ ප්‍රධාන කාර්යභාරයන් වන්නේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ, සභාපතිවරයාගේ, ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂකවරයාගේ මූලධර්ම රාජකාරී සහ වගකීම්, සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ ලේඛනගත කර ඇත.

මහජන බැංකුවේ (මව් සමාගමේ) සභාපතිවරයා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් හි සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.

| සභාපති | ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ | ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී |
|---|---|---|
| කාර්යභාරය | කාර්යභාරය | කාර්යභාරය |
| අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම, නිවැරදි ආයතනික පාලනය ආරක්ෂා කිරීම සහ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීම. | අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය තවදුරටත් සවිමත් කිරීම. | උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ආයතනය ඉදිරියට රැගෙන යෑම සම්බන්ධයෙන් වගකිව යුතුය. |
| වගකීම් | වගකීම් | වගකීම් |
| • සමාගමේ වාර්ෂික කාර්ය සැලැස්ම සහ න්‍යායපත්‍රයන් සමාගම් ලේකම් සමඟ සාකච්ඡා කර සකස් කිරීම<br>• පාර්ශවකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම හා පවත්වාගෙන යාම.<br>• අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සියලුම මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය සහතික කිරීම.<br>• අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීතාවය අධීක්ෂණය කිරීම. | • සභාපතිවරයා වෙත ප්‍රබල අධ්‍යක්ෂ මණ්ඩලයක් වශයෙන් කටයුතු කරන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී සෙසු අධ්‍යක්ෂවරුන් හට අතරමැදියකු වශයෙන් කටයුතු කිරීම.<br>• සභාපතිවරයා සම්බන්ධයෙන් බැදියා පිළිගැටීමක් පවතින අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් වල සභාපතිත්වය ඉසිලීම. | • ආයතනික කළමනාකරණ කණ්ඩායමේ නිසි අනුප්‍රාප්තිකත්වයන් සැලසුම් කිරීම සහ ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම.<br>• අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සහ අනුමත කිරීම සඳහා සමාගමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම.<br>• සමාගමේ දිගුකාලීන උපාය මාර්ගයට වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අයවැය සකස් කිරීම සහ නිර්දේශ කිරීම.<br>• සමාගමේ කාර්යසාධනය සහ අදාළ නීති මෙන්ම ආයතනික පාලන මූලධර්මවලට අනුකූල වීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරීක්ෂණයන් දැනුම් දීම සහ වාර්තා කිරීම.<br>• උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීම.<br>• සමාගමේ වටිනාකම් මත පදනම් වූ වටපිටාවක් සහතික කිරීම.<br>• අනුමත කරන ලද අවදානම් අභිරුචියක් තුළ සමාගම ක්‍රියාත්මක වන බවට සහතික වීම. |

# ආයතනික පාලනය

### 1.3.4 අධ්‍යක්ෂ මණ්ඩලය නැවත අලුත් කිරීම

නව පත්වීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම් සහ නැවත තේරී පත්වීම් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර අලුත් වේ. ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම රඳවා තබා ගනිමින් අඛණ්ඩතාව පවත්වා ගෙන යන අතරම නව නිපුණතා, පර්යාවලෝකයන් සහිත සාමාජිකයින් හඳුන්වා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අලුත් කිරීමේ දී අවස්ථාව ලැබේ.

**පත්කිරීම්**

- සමාගමේ ක්‍රමෝපායික සැලසුම් හා එහි ඇති අඩු පාඩු සලකා බැලීමෙන් මෙන් ම අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකාබද්ධ දැනුම, පළපුරුද්ද සහ විවිධත්වය සලකා බලා අධ්‍යක්ෂවරුන් ලෙස පත් කළ හැකි අපේක්ෂකයින්ගේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නාමයෝජනා කමිටුව නිර්දේශ කරයි. මණ්ඩලයේ අනුමැතිය මත "සුදුසු සහ ගැළපෙන" පුද්ගලයෙකු වශයෙන් ඉදිරි අනුමැතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරනු ලැබේ. ඉන්පසු වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් පත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබේ.
- පත්වීම් කොළඹ කොටස් වෙළඳපොල සහ කොටස් හිමියන් වෙත පුවත්පත් නිවේදන මගින් දැනුම් දෙන අතර අධ්‍යක්ෂවරයාගේ තොරතුරු පිළිබඳ කෙටි සාරාංශයක් ඇතුළත් වේ.

**නැවත තෝරාගැනීම/නැවත පත්කිරීම**

- වසර තුළදී පත්කරන ලද අධ්‍යක්ෂවරුන් මීළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් නැවත තේරී පත් කිරීමට ඉදිරිපත් වීමේ සුදුසුකම් ලබයි.
- නාමයෝජනා කමිටුව මගින් නැවත පත්කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කෙරේ.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පෙර වාර්ෂික මහා සභා රැස්වීමේදී ඇති වූ තාවකාලික පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද අධ්‍යක්ෂවරයකු හට ඔහු හෝ ඇය විසින්ම ඊළග වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත පත්වීම සඳහා ඉදිරිපත් විය හැක.

**අධ්‍යක්ෂ ධුර කාලයෙන් විශ්‍රාම ගැනීම/ඉල්ලා අස්වීම**

- අධ්‍යක්ෂ ධුර කාලය උපරිම අවුරුදු නවය (9)කට සහ වයස් සීමාව අවුරුදු හැත්තෑ (70) දක්වා සීමා වේ. 2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනතෙහි හා එහි සංශෝධනවල දැක්වෙන උපදෙස්වලට අනුකූලව පළමුවෙන්ම පැමිණෙන කොන්දේසිය අනුව ධුර කාලය දැරීමේ හැකියාව සීමා වේ. වර්තමාන වසංගත තත්ත්වය යටතේ සුවිශේෂී පදනමක් මත, ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතිය මත වයස් සීමාව දීර්ඝ කළ හැකිය.
- අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම්, ඉල්ලා අස්වීම් හෝ ඉවත් කිරීම් තිබේ නම්, වහාම නිසි පදිරි කොළඹ කොටස් වෙළඳපොල (CSE) වෙත දැනුම් දීම සිදු කළ යුතු වේ.

### 1.3.5 රැස්වීම් සහ සහභාගීත්වය

රැස්වීම් මාසිකව පවත්වනු ලබන්නේ අවශ්‍ය විටෙක ඒවාට අතිරේකව තාවකාලික රැස්වීම් සංවිධානය කිරීමේ නම්‍යතාවක් සහිතවයි. වර්ෂය තුළ රැස්වීම් දොළහක් පවත්වන ලදී. වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් භාවිතා කරමින් දෙමුහුන් ආකෘතියක් අනුගමනය කරන ලදී.

> ක්‍රියාකාරී සහභාගීත්වය විදහාදක්වමින් අධ්‍යක්ෂ මණ්ඩල පැමිණීම ආසන්න වශයෙන් 100% ක් විය.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පරිපාලනය

### රැස්වීමට පෙර

**දිනය තීරණය කිරීම**

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දිනයන් වසර ආරම්භයේදී තීරණය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ න්‍යායපත්‍රය ඊළග කැලැන්ඩර වසර ආරම්භයට පෙර සියලුම සාමාජිකයින්ට සන්නිවේදනය කරනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල න්‍යාය පත්‍රය**

- සමාගමේ ලේකම්ගේ සහාය ඇතිව සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල න්‍යාය පත්‍රය සකස් කරනු ලැබේ.
- සියලුම අයිතමයන් ප්‍රමාණවත් අයුරින් සාකච්ඡාවට භාජනය වන බවට තහවුරු කිරීම උදෙසා න්‍යායපත්‍රය ප්‍රමුඛතාකරණයට ලක් කෙරේ.
- රැස්වීම් න්‍යායපත්‍ර හා ලිපි ලේඛන අධ්‍යක්ෂවරුන්ට අවම වශයෙන් දින හතකට පෙර යවනු ලැබේ. මෙමඟින් සාමාජිකයින්ට ලිපි ලේඛන සමාලෝචනය කිරීමට, නිරීක්ෂණ සිදු කිරීමට සහ ඉදිරි රැස්වීමට සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙනු ඇත.

### රැස්වීමේදී

**තොරතුරු වල ගුණාත්මකභාවය**

- සිය තීරණ පදනම් කරගැනීම සඳහා අධ්‍යක්ෂවරුන් වෙත නිවැරදි, අදාළ සහ කාලීන තොරතුරු සපයනු ලැබේ.
- ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරීවරයා විසින් ව්‍යාපාරික මෙහෙයුම්, මූල්‍යමය කාර්යසාධනය, ක්ෂේත්‍රයේ ප්‍රවණතා සහ වර්ධනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කෙරේ.
- ව්‍යාපාරයෙහි අදාළ වන අංශ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අංශ ප්‍රධානීන්/ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් වෙත ඇරයුම් කෙරේ.

**විනිවිදභාවය**

- කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය සමග විවෘතව හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන අතර කවර හෝ ගැටලුකාරී තත්ත්වයක් පිළිබඳව කාලෝචිතව අවධානය යොමු කරවනු ලැබේ.

**යෝජනා සහ සංසරණයන්**

- ව්‍යාපාරික කරුණු සම්බන්ධ යෝජනා රෙගුලාසි ඇතුළත සංසරණයන් මාර්ග යෙන් බෙදාහැරේ.
- කෙසේවුවද, කිසියම් තනි අධ්‍යක්ෂවරයකු අදාළ කරුණු සංසරණය මගින් නොව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී තීරණය කල යුතු බවට අදහස් කළහොත්, සභාපතිවරයා විසින් අදාළ යෝජනාව රැස්වීමකදී තීරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරේ.

### රැස්වීමට පසු

**වාර්තා**

- ඒකමතිකව සම්මත කොට නොගත් කරුණු සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ අදහස් වාර්තාවල සටහන් කෙරේ.
- සංග්‍රහයට අනුකූලව, රැස්වීම පැවැත්වීමට සාධාරණ කාලයකට පෙර අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සාමාජිකයින් වෙත යවනු ලැබේ.

**ක්‍රියාකාරකම් නිරීක්ෂණය**

- සියලුම අවශ්‍ය පසුවිපරම් ක්‍රියාකාරකම් සමාගම් ලේකම්වරයා විසින් සහාගත කොට ක්‍රියාත්මක වීම සඳහා අදාළ අංශ/කමිටු වෙත යවනු ලැබේ.
- 
- ක්‍රියාකාරකම් නිරීක්ෂනය කොට නිල යාවත්කාලීනයක් සම්පාදනය කිරීමෙන් අනතුරුව ඊළග රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පැකේජයෙහි ඇතුළත් කෙරේ.

# ආයතනික පාලනය

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධූරයේ ස්වභාවය | රැස්වීම් සඳහා සහභාගී වීම - සහභාගීවීම / සුදුසුකම | | | | | නාමයෝජනා කමිටුව** | සම්බන්ධිත පාර්ශ්වවල ගනුදෙනු සමාලෝචන කමිටුව | ආයෝජන කමිටුව **** | ණය කමිටුව ***** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂ මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව | මානව සම්පත් පාරිතෝෂික සහ නාමයෝජනා කමිටුව* | මානව සම්පත් සහ පාරිතෝෂික කමිටුව** | | | | |
| සුජීව රාජපක්ෂ (සභාපති) | NED | 12/12 | | | | | | | | |
| මිරයම් කොරලි පීටර්ස් (ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ) | INED | 12/12 | 12/12 | | 4/4 | 2/2 | 2/2 | | | |
| රොහාන් පතිරගේ | NED | 11/12 | | | 4/4 | 2/2 | 2/2 | 2/2*** | | |
| අසාම් අහමත් | INED | 12/12 | 10/12 | 6/7 | | | | | 2/2 | |
| සුදර්ශන අහංගම (2021 අගෝස්තු 24 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය.) | INED | 04/04 | | | | | | 0/1 | | |
| ක්ලයිව් ෆොන්සේකා | NED | 12/12 | | 7/7 | | | | | C-1/2 | |
| චතුර විජේතිලක | INED | 12/12 | | C-7/7 | | | | C - 4/4 | 2/2 | සාමාජික |
| යූ. එල්. අශෝක බණ්ඩාර | INED | 12/12 | 12/12 | | C - 4/4 | C - 2/2 | C - 2/2 | 4/4 | | සාමාජික |
| රංජිත් කොඩිතුවක්කු | NED | 11/12 | | | | | | | | C |

INED - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
NED- විධායක නොවන අධ්‍යක්ෂ
ED - විධායක අධ්‍යක්ෂ
C- සභාපති

* 2022 ජනවාරි 27 සිට බලපැවැත්වෙන පරිදි ධූර කාලය අවසන් විය.
** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගය ප්‍රකාරව 2022 ජනවාරි 27 පිහිටුවන ලදී.
*** 2021 සැප්තැම්බර් 24 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී.
**** 2021 නොවැම්බර් 26 පිහිටුවන ලදී.
***** 2022 අප්‍රියෙල් 01 දින සිට බලපැවැත්වේ.

**ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂගේ සභාපතිත්වයෙන් යුත් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම**

මණ්ඩලයේ ස්වාධීනත්වය හා ඵලදායීතාවය ශක්තිමත් කිරීම සඳහා සමාගම විසින් අනුග මනය කරන ලද යහපාලන භාවිතයන් තවදුරටත් ඉදිරියට ගෙන යාමේ දී, ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ විසින් ස්වාධීන අධ්‍යක්ෂවරුන් හමුවී පාලනය හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන ලදී. මණ්ඩලය දැනුවත් කිරීම සඳහා සභාපතිවරයා කැඳවූ රැස්වීමේ දී ඔහු වෙත අදාළ ප්‍රතිචාර ලබා දෙන ලදී.

### 1.3.6 අධ්‍යක්ෂවරුන්ගේ අභිමතයන් හා සම්බන්ධිත පාර්ශවයන්හි ගනුදෙනු

අධ්‍යක්ෂවරු තම ව්‍යාපාරික අභිමතයන් පත්වීම්වලදී සහ ඉන් පසුව කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතුය. සමාගමේ ලේකම් විසින් අදාළ විස්තර ලේඛනයක ඇතුළත් කර පවත්වා ගෙන යෑම සිදු වන අතර කාර්තුමය පදනමින් සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව ඉදිරියේ විමසීමට ලක් වේ. එසේම සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ද ඉදිරිපත් කරනු ලැබේ. සමාගම් පනත ප්‍රකාරව ලේඛනය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. සමෝධානික වාර්තාවේ 308 සිට 314 දක්වා පිටුවල අනාවරණය කර ඇති කරුණු හැරුණු විට අධ්‍යක්ෂවරුන්ට සමාගම සමඟ කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් පිළිබඳව සෘජු හෝ වක්‍ර සම්බන්ධයක් ගොඩනගා ගැනීමට නොහැකිය.

සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු ප්‍රතිපත්තියට අනුකූලව සහ රෙගුලාසිවලට අනුකූලව, අනුමැතිය අවශ්‍ය සියලුම ගනුදෙනු, සාධාරණ සහ පීපල්ස් ලීසිං හි යහපත සඳහා සිදු වන්නේ ද යන්න සලකා බැලීම සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව විසින් සිදු කෙරේ. සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු 308 සිට 314 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවල සටහන 55 හි දක්වා ඇත.

2022 දෙසැම්බර් 31 දිනට එක් එක් අධ්‍යක්ෂවරයා විසින් රඳවාගෙන ඇති මුලු අධ්‍යක්ෂ මණ්ඩල ආසන සංඛ්‍යාව (පීපල්ස් ලීසිං සමූහයේ අධ්‍යක්ෂ ධූරය හැර) පහත දක්වේ. ස්වකීය කාර්යභාරයන් හා වගකීම් සපුරාලීම උදෙසා ප්‍රමාණවත් කාලයක් වෙන් කරන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

### 1.3.7 බැඳියා පිළිගැටුම

අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් ඔහුගේ හෝ ඇයගේ තනතුර හෝ රහස්‍ය තොරතුරු හෝ සංවේදී තොරතුරු මූල්‍යමය වශයෙන් හෝ වෙනත් ආකාරයකින් තමන්ගේ ප්‍රයෝජනයට හෝ ඕනෑම තෙවන පාර්ශවයක ප්‍රයෝජනය සඳහා හෝ කිසිදු ආකාරයකින් භාවිතා කිරීම ව්‍යාපාර ආචාර ධර්ම පිළිබඳ පීපල්ස් ලීසිං සමාගම විසින් සකස් කර ඇති සංග්‍රහය මඟින් තහනම් කර තිබේ. ව්‍යාපාරික අයිතම හෝ වෙනත් අධ්‍යක්ෂක තනතුරු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට ඇතිවිය හැකි යම් රුචිකත්වයන් පිළිබඳ ගැටුම් පිළිබඳව වහාම අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දිය යුතු වේ. ගැටුමක් ඇතිවිය හැකි කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන විට අධ්‍යක්ෂවරු අදාළ රැස්වීමට සහභාගී නොවෙති.

### 1.3.8 දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීම

නිවැරදි තීරණ ගැනීම සඳහා නිවැරදි දැනුම තිබිය යුතුය. පීපල්ස් ලීසිං වාර්තාකරණය සහ තොරතුරු පද්ධතිය මගින් අදාළ හා විෂයමූලික තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට නිසි කලට ලැබීම සහතික කරයි.

**1.1.1.1 තොරතුරු සැපයීම**

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට දින හතකට (7) පෙර සංසරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල ලේඛන පැකේජය තුළින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු කළ යුතු කරුණු පිළිබඳ පුළුල් ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සැපයේ.

තවද, සමාගමේ ව්‍යාපාරික පරිසරය, උපායමාර්ග සහ මෙහෙයුම් පිළිබඳව නිරන්තරයෙන් ඉදිරිපත් කිරීමටත්, සමාගමට බලපාන වර්ධනයන් පිළිබඳව මණ්ඩලය දැනගත් බවට සහතික කිරීමටත් ආයතනික කළමනාකරණයට සහ බාහිර විශේෂඥයින්ට ආරාධනා කරනු ලැබේ.

**1.1.1.2 තොරතුරු ලබාගැනීමේ හැකියාව**

අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය අවකාශය සලසා ගැනීම සඳහා කළමනාකාරීත්වය, සංවිධානය පිළිබඳ තොරතුරු සහ සම්පත් වෙත අසීමිත ප්‍රවේශයක් ඇත. සමාගමේ වියදමින්, සමාගම් ලේකම් හරහා සම්බන්ධීකරණයෙන්, ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අයිතිය තිබේ. ලබාගත් එවැනි උපදෙස්වල පිටපත් එය ඉල්ලා සිටින අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරිනු ලැබේ.

**1.1.1.3 දැනුම වර්ධනය කිරීම**

අදාළ වන නීති සම්පාදනය සහ නියාමනය, අදාළ අංශවල වර්ධනයන් සහ අවදානම් සහ සාමාන්‍ය ව්‍යාපාරික පරිසරයෙහි වෙනස්වීම් අධ්‍යක්ෂවරුන් විසින් අඛණ්ඩව සොයා බැලීම සිදු කරනු ඇත. සමාගම් ලේකම් හරහා සම්බන්ධීකරණය කිරීමෙන් අනතුරුව අවශ්‍යතා ඇති අධ්‍යක්ෂවරුන් වෙත පුහුණු හා වෘත්තීය සංවර්ධනය ලබා දීම සිදු වේ.

### 1.3.9 අධ්‍යක්ෂ මණ්ඩල සහ අනු කමිටු ඇගයීම

**ආවරණය වූ අංශ**

- අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය හා ගුණාත්මකභාවය
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ ක්‍රියාපටිපාටීන්
- අධ්‍යක්ෂ මණ්ඩල සංවර්ධනය
- අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපාය සහ අවදානම් කළමනාකරණය
- ආචාරධර්ම, අනුකූලතා සහ නෛතික ආකෘතිය
- අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්ව සබඳතා අනුප්‍රාප්තික සැලසුම්කරණය

සමස්තයක් ලෙස මණ්ඩලයේ සහ එහි අනු කමිටුවල ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා වාර්ෂික ඇගයීමක් සිදු කරනු ලබන අතර, එම ක්‍රියා පටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. මණ්ඩලයේ සභාපතිගේ නායකත්වයෙන් සහ සමාගම් ලේකම් විසින් පරිපාලනය කරනු ලබන වැඩපිළිවෙළක් යටතේ අධ්‍යක්ෂවරුවන් විසින් මෙහි දී ඵලදායිතාවයේ ප්‍රධාන සාධකවලට අනුකූලව ඔවුන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වය තක්සේරු කෙරේ. වැඩිදියුණු කළ යුතු අංශ පිළිබඳව සමස්ත ප්‍රතිඵලය ලබා දීම සිදු කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශයන් ඉදිරිපත් කෙරේ.

2021/22 ඇගයීම් 2022 මාර්තු මාසයේදී සිදු කරන ලද අතර එහි දී ලබා ගත් ප්‍රතිඵල 2022 ජූනි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ඇගයීමේ ප්‍රතිඵලයෙන් පෙන්නුම් කළේ සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු ඔවුන්ගේ කාර්යභාරය ඉටුකිරීම ඵලදායී ආකාරයෙන් සිදු කර ඇති බවයි.

### 1.3.10 ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ඇගයීම

පීපල්ස් ලීසිං හි කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීන අරමුණු වලට අනුකූලව සකස් කර ගත් නිර්ණායක භාවිතා කරමින් වාර්ෂිකව ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරීගේ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරනු ලැබේ. මෙහෙයුම් පරිසරය හා කාර්ය සාධනය මත පදනම්ව සංශෝධනය කරන ලද පාරිතෝෂිතයන්ට අනුකූල ව සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ කාර්ය සාධනය සමාලෝචනය කෙරේ.

# ආයතනික පාලනය

### 1.3.11 අනුප්‍රාප්තික සැලැස්ම

නායකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම මෙන්ම සමාගමේ උපායමාර්ගික සැලැස්ම ඉදිරියට ගෙන යෑමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය තුළ නිපුණතා පූර්ණ සහ අත්දැකීම් බහුල පුද්ගලයන් ඇතුලත් වීම සහතික කිරීම සඳහා සුදුසු අපේක්ෂකයින් හඳුනා ගැනීම සහ ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී සඳහා අනුප්‍රාප්තිකයන් පත් කිරීම සැලසුම් සකස් කිරීම සඳහා මානව සම්පත්, පාරිතෝෂික හා නාමයෝජනා කමිටුව (මේ වන විට නාමයෝජනා කමිටුව) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය වේ. ප්‍රධාන තනතුරු වල වර්තමාන හා අනාගත වගකීම් භාර ගැනීම සඳහා කුසලතා සංචිතයක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පවත්නා අනුප්‍රාප්තික සැලැස්ම මත පදනම්ව ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පුළුල් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීමට කමිටුව කටයුතු කරමින් සිටී. මෙම වෘත්තීය සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව වගකීමෙන් බැඳී සිටී.

### 1.4 වගකීම් සහගත සහ සාධාරණ පාරිතෝෂික

පාරිතෝෂිත සාධාරණ, වගකිවයුතු සහ විනිවිද පෙනෙන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සිය පූර්ණ අවධානය යොමු කර ඇත. එකඟ වූ යොමු කොන්දේසි යටතේ සහ පීපල්ස් ලීසිං පාරිතෝෂිත ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රධාන කළමනාකරණ පිරිස්වල වේතනය පිළිබඳව මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම මානව සම්පත් පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව (මේවනවිට මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව). ඔවුන් සඳහා පාරිතෝෂික පැකේජ සැලසුම් කර ඇත්තේ අවශ්‍ය නිපුණතා සහ පළපුරුද්ද ඇති ප්‍රවීණ වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ය. පාරිතෝෂිත ව්‍යුහයන් සකස් කෙරෙන්නේ ඉටු කරන කාර්යයේ කාර්ය සාධනය සහ අවදානම් සාධක සැලකිල්ලට ගනිමින් වන අතර ආයතනික හා පුද්ගල කාර්ය සාධනය සමඟ එය පෙළ ගැස්වීමෙනි. නාමයෝජනා, පාරිතෝෂිත හා මානව සම්පත් කමිටු වාර්තාවේ පිටු 164 සිට 165 දක්වා බලන්න.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනු කමිටු රැස්වීම්වලට සහභාගී වීම සඳහා මාසික දීමනාවක් ලබා ගන්නා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂිත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වන පාරිතෝෂිත සකස් කිරීමේ දී වෙළඳපල භාවිතයන් සැලකිල්ලට ගැනීම හා ඔවුන්ගේ කාර්යභාරය සඳහා කරන කාලය කැප කිරීම සහ වගකීම් කෙරෙහි අවධානය යොමු කෙරේ. කාර්ය සාධනය හා සම්බන්ධ දිරි දීමනා ඔවුන්ට නොලැබේ.

2021/22 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද සමස්ත පාරිතෝෂික රු.මිලියන 4.94 ක් වේ.

> සේවා ස්ථානය තුළ සමාන අවස්ථා සහ සුරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීම ඔස්සේ අපගේ සියලුම සේවකයින්ගේ සම්පූර්ණ හැකියාව උද්දීපනය කිරීම අපගේ ප්‍රතිපත්ති වල අරමුණ වේ.
>
> - සමානාත්මතා සහ විවිධත්ව ප්‍රතිපත්තිය
> - සේවක ඇගයුම් හා ප්‍රතිලාභ ප්‍රතිපත්තිය
> - ප්‍රති හිංසන ප්‍රතිපත්තිය
> - දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය
> - පැමිණිලි කළමනාකරණ සහ විසඳීමේ ප්‍රතිපත්තිය
> - මානව හිමිකම් ප්‍රතිපත්තිය
> - සෞඛ්‍ය හා සුරක්ෂිතතා ප්‍රතිපත්තිය
> - ව්‍යාපාරික චර්යාව සහ ආචාරධර්ම සංග්‍රහය

### 1.5 ස්ත්‍රී පුරුෂ විවිධත්වය

ස්ත්‍රී පුරුෂ භාවය අනුව විවිධත්වයක් ශ්‍රම බලකාය තුළ තහවුරු කිරීම තුළින් ඵලදායිතාව සහ තරඟකාරීත්වයට ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි බව අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරයි. පීපල්ස් ලීසිං හි සේවය කරන කාන්තාවන් සඳහා සමාන අවස්ථා, ආරක්ෂිත සේවා ස්ථානයක් සහ නම්‍යශීලී වැඩ කිරීමේ විධිවිධාන ඇති කර තිබෙන අතර ඔවුන්ගේ වෘත්තීය අභිලාෂයන් ඉටු කර ගැනීමට අවශ්‍ය සහාය හිමි වේ.

### 1.6 තොරතුරු තාක්ෂණය සහ සයිබර් සුරක්ෂිතතා පාලනය

ඉහළ යන ඩිජිටල් ගනුදෙනු සහ වසංගත තත්වයන් හමුවේ දුරස්ථ ප්‍රවේශය තුලින් ඇතිවූ අවධානම නිසා මූල්‍ය ක්ෂේත්‍රය තුල තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවධානම් නිතැතින්ම ඉහල තත්වයක පවතී. එවන් තත්වයක් හමුවේ සමාගමේ තොරතුරු වත්කම් සහ මෙහෙයුම් පද්ධති ආරක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටින අතර සයිබර් අවදානම් කළමනාකරණ පද්ධති සඳහා පුළුල් ලෙස ආයෝජනය කිරීමට යොමු වී ඇත.

තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති අනුගමනය කිරීම සහ සයිබර් තර්ජන වලින් ආරක්ෂා වීම ඇතුළු ඩිජිටල් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම පීපල්ස් ලීසිංහි තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම වේ. සයිබර් සුරක්ෂිතතා අරමුණු සහ සමූහයේ ඉලක්ක සපුරාලීමේදී, පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති ආකෘතීන් සහ සේවා කණ්ඩායම් වල හැකියාවන් ශක්තමත් කරන ලද අතර සොයාබැලීමේ සහ අධීක්ෂණ මෙවලම් වසර තුළදී ඉහළ නංවන ලදී.

තොරතුරු ආරක්ෂණ නිලධාරී (ISO) ලෙස ඒ සඳහා ම නිලධාරියෙකු පත් කර ඇත. අදාළ වර්ෂය තුළදී, සමාගමේ පද්ධති, පීපල්ස් ලීසිං දුරස්ථ ප්‍රවේශ උපාය මාර්ගයට සම්බන්ධ තාක්ෂණය සහ තොරතුරු ආශ්‍රිත අවදානම්වල තත්ත්වය කණ්ඩායම විසින් තක්සේරු කරන ලදී. තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ පාලනය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවෙහි පුනරාවර්තන අයිතමයක් වන අතර අවදානම, බලපෑම සහ වෙනත් දුරදර්ශී පියවරයන් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය යැයි සලකනු ලබන කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

### 1.7 අධ්‍යක්ෂ මණ්ඩල පාලනය

### 1.7.1 අනුකූලතාවය

අදාළ සියලුම ව්‍යවස්ථාපිත හා නියාමනමය නීති හා රෙගුලාසිවලට පීපල්ස් ලීසිං අනුකූල වී තිබේ. පාලනයන් ස්ථාපනය කිරීම මගින් අනුකූලතාව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා වැඩපිළිවෙළක් නිර්මාණය කර ඇත. සැලැස්ම මෙහෙයවනු ලබන්නේ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කිරීම සඳහා යොදවනු ලැබූ අනුකූලතා නිලධාරියෙකු විසිනි. අදාළ අනුකූලතා නිලධාරියා විසින් කාරක සභාවේ කාර්තුමය රැස්වීම් වලදී අනුකූලතාවය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන අතර ඉස්මතු වන විශේෂ අවස්ථාවල දී අවශ්‍ය පියවර ගැනීම සඳහා මණ්ඩලය වෙත කරුණු වාර්තා කිරීම ද සිදු කරයි.

සමූහය සතුව සියලු සේවකයින් වෙත පැහැදිලිව සන්නිවේදනය කරන ලද විස්ල් බ්ලෝවර් (තොරතුරු දැනුම්දීමේ) ප්‍රතිපත්තියක් පවතින අතර මේ සම්බන්ධ තොරතුරු විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. සමාලෝචනයට ලක් වන වසර තුළ විස්ල් බ්ලෝවර් ක්‍රියාවලිය ඔස්සේ කිසිදු සිදුවීමක් වාර්තා නොවීය.

සමාලෝචනයට ලක් වන වසර තුළ, කිසිදු ප්‍රාමාණික නීතිරීති හෝ කොන්දේසි උල්ලංඝනය කිරීමක් නොපැවති අතර නීතිරීති හෝ කොන්දේසි උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් සමාගම හෝ එහි අධ්‍යක්ෂවරුන් වෙත කිසිදු ප්‍රාමාණික දඬුවමක් හෝ දඩ මුදලක් නොපැවරිණි.

### 1.7.1 අවදානම් කළමනාකරණය

සමාලෝචනයට ලක් වන වසර තුළ, පිටු අංක 31 සිට 33 දක්වා මෙහෙයුම් වටපිටාවෙහි ඉදිරිපත් කොට ඇති පරිදි සමූහයේ සමස්ත අවදානම ඉහළ නැංවුනි. පිටු අංක 176 සිට 195 දක්වා ඉදිරිපත් කොට ඇති පරිදි, පීපල්ස් ලීසිං සමූහය මගින් අවදානම් කෙරෙහි නිරාවරනය පහත හෙළීම උදෙසා සිය අවදානම් කළමනාකරණ හැකියාවන් සවිබලගන්වන ලදී.

අපගේ අවදානම් කළමනාකරණ පද්ධතිය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ නිසි සුදුසුකම් ලත් කළමනාකාරීත්ව කණ්ඩායම් විසින් පාලනය කෙරේ. අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව හරහා අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය නිරන්තරයෙන් සමාලෝචනය කර තක්සේරු කරයි. අවදානම් හඳුනා ගැනීම, අවදානම් උපාය මාර්ග සංවර්ධනය කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියා පටිපාටි සැකසීම, සීමාවන් ස්ථාපිත කිරීම සහ නිරාවරණ කළමනාකරණය කිරීම අවදානම් කළමනාකරණ රාමුවට ඇතුළත් වේ. අපගේ මනා සේ සකසන ලද ආකෘතිය අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි වන සංගත එළඹුමක් සඳහා සහාය දක්වයි. වගකීම් ක්‍රියාවට නැංවීමේදී අවදානම් කළමනාකරණ කමිටුව වෙත අවදානම් අංශයේ සහාය හිමි වේ.

වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය සහ අවදානම් කළමනාකරණ කමිටුව බලාත්මකව සහ ක්‍රියාකාරීව අවදානම කළමනාකරණය උදෙසා සිය අධීක්ෂණ ක්‍රියාකාරකම් ඉහළ නැංවීය. සිය සවිමත අවදානම් වටපිටාව තහවුරු කරමින් සමූහය වසංගත සමය තුළ නොසැලී කටයුතු කිරීමට සමත් විය.

### 1.7.2 අභ්‍යන්තර පාලනයන්

අවදානම් කළමනාකරණය සමඟ ඒකාබද්ධව, අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික අරමුණු සපුරාලීමේදී කොටස් හිමියන්ගේ අවශ්‍යතා සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධති සකස් කර ක්‍රියාත්මක කරයි. මෙම පද්ධති මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ඇතුළුව සියලු පාලනයන් ආවරණය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඵලදායීතාවය සඳහා අධීක්ෂණය හා නිතිපතා සමාලෝචනය කරනු ලැබේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් සිය රාජකාරි ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහාය වේ. 162 සිට 163 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ විස්තර කෙරේ. මූල්‍ය තොරතුරුවල අඛණ්ඩතාව සහ සමූහයේ අභ්‍යන්තර පාපන සහ පද්ධතිවල ශක්තිමත් බව පිළිබඳ මණ්ඩලය සෑහීමකට පත්වේ

### 1.7.3 මූල්‍යමය සහ ව්‍යාපාරික වාර්තාකරණය

ප්‍රකාශිත සහ දෘෂ්‍ය සංචරකයන් ඔස්සේ, කියවීමේ හැකියාව සහ අවබෝධය ලබාගැනීම කෙරෙහි පහසුකම් සලසමින් මෙම වාර්ෂික වාර්තාව ඔස්සේ සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර හා අවබෝධාත්මක තක්සේරුවක් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කොට ඇත. අන්තර්මධ්‍ය කාර්තුමය වාර්තා ද ප්‍රකාශයට පත් කොට ඇත. මෙහිදී සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කොට ඇති අතර, ප්‍රකාශනයට පෙර අදාළ වාර්තාවන් විගණන කමිටුව මගින් සමාලෝචනය හා නිර්දේශ කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සමෝධානික වාර්තාවට අමතරව, පහත දක්වෙන වාර්තා මගින් වාර්තාකරණ සංග්‍රහයේ අවශ්‍යතාවය පරිදි වැඩිදුර තොරතුරු ඉදිරිපත් කෙරේ.

- 156 සිට 161 දක්වා පිටුවල සමාගමෙහි කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
- 200 සිට 201 දක්වා පිටුවල දැක්වෙන මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය
- 205 සිට 207 දක්වා පිටුවල ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

### 1.7.4 සහතිකත්වය

සහතිකත්ව සේවාවන් සහ ක්‍රියාකාරකම් ඵලදායී පාලනය වටපිටාවක් කෙරෙහි දායක වන බවටත්, ඒවා අභ්‍යන්තර තීරණ ගැනීම සහ පීපල්ස් ලීසිං සමූහයේ බාහිර වාර්තා වල සුපිළිපන්බව කෙරෙහි උපකාරී වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් විගණන කමිටුව බාහිර හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය ප්‍රතිදානයන් සමාලෝචනය කොට සැලසුම් කරයි.

GRI | 102-16

## 1.8 සදාචාර සම්පන්න සේවා වටපිටාවක් ප්‍රවර්ධනය කිරීම

### 1.8.1 චර්යාධර්ම හා ආචාරධර්ධ සංග්‍රහය

පීපල්ස් ලීසිං සිය ව්‍යාපාර කටයුතුවල සුපිළිබන්බව, වෘත්තීයභාවය සහ සියලු පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා ආරක්ෂා කිරීම වෙනුවෙන් කැපවී සිටී. ආයතනික පාලන ප්‍රඥප්තියේ ලේඛනගත කර ඇති ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහයෙන් සමාගම බැඳී සිටී. ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලුම සේවකයින්ට එය අදාළ වේ. සියලුම සේවකයින්ට අදාළ ආචාර ධර්ම මාලාව සමාගමේ අභ්‍යන්තර පරිගණක පද්ධතිය ඔස්සේ ලබා ගත හැකි අතර ව්‍යුහාත්මක සන්නිවේදනය තුළින් සෑම මට්ටමකින්ම එම අඩංගු කරුණු ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබේ.

පීපල්ස් ලීසිං හි කිසිදු අධ්‍යක්ෂවරයකු හෝ සේවකයෙකු විසින් මෙම ආචාර ධර්ම මාලාවේ කිසිදු විධිවිධානයක් ප්‍රාමාණිකව උල්ලංඝනය කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නොවේ.



# ආයතනික පාලනය

GRI 102-17

### 1.8.2 අභ්‍යන්තර තොරතුරු හෙළිදරව් කිරීම (විස්ල් බ්ලෝවින්ග්)/ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණය

අසාධාරණ, ආචාර ධර්ම විරෝධී හෝ නීති විරෝධී හැසිරීම් පිළිබඳ සේවකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට උපදෙස් ලබා ගැනීමට හෝ වාර්තා කිරීමට යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වේ.

නුසුදුසු මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන් හෝ අභ්‍යන්තර විමර්ශනයක් අවශ්‍ය විය හැකි වෙනත් කාරණා සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ නිර්නාමිකව වාර්තා කිරීමට පීපල්ස් ලීසිං අභ්‍යන්තර තොරතුරු ප්‍රතිපත්තිය විවෘත වේ. මෙම වාර්තා කිරීමේ දී සේවකයින්ට ප්‍රධාන පුද්ගලයින් සිව් දෙනෙකුගෙන් එක් අයෙකු තෝරා ගත හැකි වන අතර ඔවුන් වන්නේ විගණන කමිටු සභාපති, ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී, අභ්‍යන්තර විගණන අංශ ප්‍රධානී සහ මානව සම්පත් ප්‍රධානීන් වේ. ඔවුන් ගෙන් එක් අයෙකුට එම තොරතුරු ලබා දීම සිදු කළ හැකිය. ප්‍රවේශවීමේ හැකියාව, නිර්නාමිකභාවය, ක්‍රියාවලි සහ අභ්‍යන්තර තොරතුරු හෙළි කිරීමට අදාළ ප්‍රතිපත්තිය සමාගමේ අභ්‍යන්තර පරිගණක ජාලයෙන් ලබා ගත හැකි අතර සියලු සේවකයින්ට ලැබීමට කටයුතු කෙරේ.

GRI 207-3

### 1.9 කොටස් හිමිකරුවන් සමඟ සබඳතා

අධ්‍යක්ෂ මණ්ඩලය, පාර්ශවකරුවන් කෙරෙහි ඇති තමන්ගේ වගකීම පිළිබඳව දැනුවත්ව සිටින අතර සපයන ලද තොරතුරුවල සුපිළිපන්බව, කාලෝචිත බව සහ අදාළත්වය අවධාරණය කරමින් සාධාරණ අනාවරණය කිරීමකට කැපවී සිටී. සාවද්‍ය වෙළඳපලක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා තොරතුරු නිවැරදිව සන්නිවේදනය කරනු ලැබේ.

### 1.10 තිරසාරත්ව පාලනය

පීපල්ස් ලීසිං ආයතනයට සහ එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට වටිනාකමක් ඇති කිරීම සහතික කරමින් තිරසාර සංවර්ධනය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිය යුතු අවධානයක් යොමු කරයි. පාරිසරික, සමාජ හා පාලන (ESG) ප්‍රමිති ව්‍යාපාර ආකෘතියට ඇතුළත් කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වන අතර, වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන කොටස් වලින් හෙළි වන පරිදි වටිනාකම නිර්මාණය කිරීම පිළිබඳව ද මණ්ඩලය සෑහීමකට පත්වේ.

| | | |
|---|---|---|
| ආර්ථික තිරසාර බව | මූල්‍ය ප්‍රාග්ධනය | පිටු අංක 60 සිට 75 දක්වා |
| පරිසරය | ස්වාභාවික ප්‍රාග්ධනය | පිටු අංක 106 සිට 113 දක්වා |
| කම්කරු පිළිවෙත් | මානව ප්‍රාග්ධනය | පිටු අංක 88 සිට 95 දක්වා |
| සමාජය | සමාජ හා සබඳතා ප්‍රාග්ධනය | පිටු 96 සිට 105 දක්වා |
| පාරිභෝගික තෘප්තිය | සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය | පිටු 96 සිට 105 දක්වා |
| කොටස් හිමියන් හඳුනාගැනීම, සහභාගීත්වය සහ ඵලදායී සන්නිවේදනය | ආයෝජකයින් වෙත වටිනාකම් | පිටු 68 සිට 75 දක්වා |

### 1.1 කොටස් හිමියන් සමඟ සන්නිවේදනය

වාර්ෂික මහා සභා රැස්වීම (පහත දැක්වේ), වාර්ෂික වාර්තාව, අතුරු මූල්‍ය ප්‍රකාශන, සමාගමේ වෙබ් අඩවියේ වෙන් කර ඇති ආයෝජක සබඳතා පිටුව සහ කොළඹ කොටස් හුවමාරුවේ නිවේදන මගින් ප්‍රධාන සිදුවීම් දැනුම් දීම ඇතුළු විවිධ සන්නිවේදන මාර්ග ඔස්සේ කොටස් හිමියන් සමඟ සන්නිවේදනය සිදු කෙරේ.

වාර්ෂික වාර්තාව මඟින් පීපල්ස් ලීසිං හි මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය සහ අනාගත වැඩපිළිවෙළ පහසුවෙන් කියවීමට හැකි සහ අවබෝධ කර ගැනීමට හැකි වන ආකාරයෙන් ආඛ්‍යානාත්මක හා දෘශ්‍ය අංග ඒකාබද්ධ කර සාධාරණ හා සමබර සමාලෝචනයක් ලෙසින් ඉදිරිපත් කෙරේ. වාර්ෂික වාර්තාව සහ අතුරු මූල්‍ය කටයුතු ප්‍රකාශයට පත් කිරීමට පෙර විගණන කමිටුව විසින් සමාලෝචනය කර නිර්දේශ කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

කොටස් හිමිකරුවන් හටද සමාගම් ලේකම්වරයා ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත් කිරීමේ, අදහස් දැක්වීමේ සහ ප්‍රශ්න විමසීමේ අවස්ථාව ඇත. කොටස් හිමියන්ගේ සියලු ප්‍රධාන ගැටළු සහ අවශ්‍යතාවන් කලමණාකරුවන්ගේ දැක්ම තුලින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ.

### 1.2 වාර්ෂික මහා සභා රැස්වීම ඵලදායී අයුරින් භාවිත කිරීම (AGM)

සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීම්වලට සහභාගී වීම ඇතුළුව කොටස් හිමියන්ගේ ක්‍රියාශීලී දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය අගය කරයි. කොටස් හිමියන් විසින් මතු කරනු ලබන ඕනෑම ගැටලුවකට පිළිතුරු දීම සඳහා මණ්ඩලයේ අනු කමිටු සභාපතිවරුන්, අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වන අතර මතු විය හැකි ගැටලු සඳහා පිළිතුරු දීමට බාහිර විගණකයන් ද සහභාගී වනු ඇත.

ලේඛන අධ්‍යයනය කර මහා සභා රැස්වීම සඳහා සහභාවීම සඳහා මහා සභා රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් දින 15 කට පෙර මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම, වාර්ෂික වාර්තාව මෙන් ම ගිණුම් සහ වෙනත් ඕනෑම යෝජනාවක් සහ සම්මේලනයේ කොටස් හිමියන් ඉදිරියේ ඉදිරිපත් කෙරෙන අනුරූප තොරතුරු, කොටස් හිමියන් වෙත බෙදා හරිනු ලැබේ. පීපල්ස් ලීසිං විසින් ව්‍යාපාරයේ සෑම අයිතමයක් සඳහාම වෙන වෙනම යෝජනා ඉදිරිපත් කරන අතර කොටස් හිමියන්ට එවැනි එක් එක් කාරණය සම්බන්ධයෙන් වෙන වෙනම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දේ. මහා සභා රැස්වීමේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියා පටිපාටිය කොටස්කරුවන්ට කල්තබා බෙදා හරිනු ලැබේ.

සියළුම කොටස් හිමියන් ඔවුන්ගේ ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා දිරිගන්වනු ලැබේ. එක් එක් යෝජනාව සඳහා ඉදිරිපත් කර ඇති සියලුම ප්‍රොක්සි ඡන්ද වාර්තා කිරීමට සහ ගණන් කිරීමට සමාගමට ඵලදායී යාන්ත්‍රණයක් තිබේ. එක් එක් යෝජනාවේ ඡන්ද ප්‍රතිඵල මහා සභා රැස්වීම අවසන් වූ විගස කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට දැනුම් දෙනු ලැබේ.

රජය මගින් කෝවිඩ් වසංගතයට ප්‍රතිචාරයක් වශයෙන් පනවන ලද සීමාවන්ට අනුකූලව 2020/21 වාර්ෂික මහා සභා රැස්වීම ටෙලි සම්මන්ත්‍රණ පහසුකම් සහිතව අන්තර්ජාලය ඔස්සේ පවත්වන ලදී. එහිදී කොටස් හිමිකරුවන් හට තත් කාලීනව ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සහ ඒවාට පිළිතුරු ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරන ලදී.

සපයනු ලබන තොරතුරු වල සුපිළිපන්බව, කාලෝචිත බව සහ අදාළත්වය පිළිබඳ අවධානයෙන් යුතුව සාධාරණව හෙළදරව් කිරීම සඳහා කැපවෙමින් පාර්ශ්වකරුවන් කෙරෙහි වන වගකීම පිළිබඳ අවබෝධය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සාවද්‍ය වෙළඳපොලක් නිර්මාණය වීම වැළකෙන ආකාරයෙන් තොරතුරු නිවැරදිව සන්නිවේදනය කෙරේ.

1.10 ඇමුණුම 1- කොළඹ කොටස් වෙළඳපොල විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත සමාගම් සඳහා ආයතනික පාලන රීති පිළිබඳ අඛණ්ඩ ලැයිස්තුගත අවශ්‍යතා පිළිබඳ 7.10 වගන්තියට අනුකූල වීම.

| රීති අංකය. | විෂය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමුව | පිටුව/පිටු |
|---|---|---|---|---|---|
| 7.10.1 (අ) | විධායක නොවන අධ්‍යක්ෂවරුන් (NED) | මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් අවම වශයෙන් 2ක් හෝ සමස්ත සංඛ්‍යාවෙන් 1/3 ක් හෝ වන පරිදි කවර හෝ ඉහළ සංඛ්‍යාවට අනුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 128 |
| 7.10.2 (අ) | ස්වාධීන අධ්‍යක්ෂවරුන් (ID) | විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් 1/3 ක් හෝ 2ක්, යන සංඛ්‍යාවෙන් වැඩි සංඛ්‍යාව අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 128 |
| 7.10.2 (ආ) | ස්වාධීන අධ්‍යක්ෂවරුන් (ID) | සෑම විධායක නොවන අධ්‍යක්ෂවරුයෙකු ම ඔහුගේ / ඇයගේ ස්වාධීනත්වය හෝ ස්වාධීන නොවන බවට දින වකවානු යොදා අත්සන් කළ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 129 |
| 7.10.3 (අ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධ අනාවරණය | • මණ්ඩලය වාර්ෂිකව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය හෝ එසේ නොවීම තීරණය කළ යුතුය<br>• එක් එක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නම් වාර්ෂික වාර්තාවේ (AR) හෙළි කළ යුතුය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විස්තර | 129<br><br>117 සිට 120 දක්වා |
| 7.10.3 (ආ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධය අනාවරණය | ස්වාධීනත්වය සඳහා නිශ්චිතව දක්වා ඇති නිර්ණායක සපුරා නොමැති නම් මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීමේ පදනම | ✓ | අදාළ නොවේ. | |
| 7.10.3 (ඇ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධය අනාවරණය | එක් එක් අධ්‍යක්ෂවරයාගේ කෙටි සාරාංශයක් අධ්‍යක්ෂකවරයාගේ විශේෂඥතාව ඇති ක්ෂේත්‍ර ඇතුළුව වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විස්තර | 117 to 120 |
| 7.10.3 (ඈ) | අධ්‍යක්ෂවරුන් සම්බන්ධ අනාවරණය | 7.10.3 (අ), (ආ) සහ (ඇ) හි දක්වා ඇති විස්තර සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලද නව අධ්‍යක්ෂවරුන්ගේ කෙටි සාරාංශයක් කොළඹ කොටස් වෙළඳපොල වෙත ලබා දිය යුතුය. | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල අලුත් කිරීම | 120 |
| 7.10.4 (අ-ඌ) | ස්වාධීනත්වය නිර්වචනය කිරීමේ නිර්ණායක | ස්වාධීන අධ්‍යක්ෂවරයකු වීමට අවශ්‍ය නිර්ණායක සපුරාලීම | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 129 |
| 7.10.5 | පාරිශ්‍රමික කමිටුව | ලැයිස්තුගත සමාගමක් සඳහා පාරිශ්‍රමික කමිටුවක් අවශ්‍ය වේ. | ✓ | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව | 164 සිට 165 දක්වා |
| 7.10.5 (අ) | පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය | පාරිශ්‍රමික කමිටුව තුළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතු වන අතර අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන වනු ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවේ සභාපතිවරයා ලෙස එක් විධායක නොවන අධ්‍යක්ෂවරුයෙකු පත් කරනු ලැබේ | ✓ | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව | 164 සිට 165 දක්වා |
| 7.10.5 (ආ) | පාරිශ්‍රමික කමිටුවේ කාර්යයන් | පාරිශ්‍රමික කමිටුව මගින් විධායක අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික නිර්දේශ කරනු ලැබේ | ✓ | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව<br><br>2021/22 මූල්‍ය වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු විධායක අධ්‍යක්ෂවරයෙක් නොවීය. | 164 සිට 165 දක්වා |
| 7.10.5 (ඇ) | පාරිශ්‍රමික කමිටුවට අදාළ කරුණු වාර්ෂික වාර්තාවේ අනාවරණය කිරීම | • පාරිශ්‍රමික කමිටුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම්<br>• පාරිශ්‍රමික ප්‍රතිපත්ති ප්‍රකාශය<br>• විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන සමස්ත වැටුප<br>• වාර්ෂික වාර්තාවට ඇතුළත් කළ යුතුය | ✓ | මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වගකිවයුතු සහ සාධාරණ පාරිතෝෂික | 164 සිට 165 දක්වා |

# ආයතනික පාලනය

| රීති අංකය. | විෂය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමුව | පිටුව/පිටු |
|---|---|---|---|---|---|
| 7.10.6 | විගණන කමිටුව | සමාගමට විගණන කමිටුවක් තිබිය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 162 සිට 163 දක්වා |
| 7.10.6 (අ) | විගණන කමිටුවේ සංයුතිය | විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීනය.<br><br>විගණන කමිටු රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරියා සහභාගී විය යුතුය.<br><br>විගණන කමිටුවේ සභාපති හෝ එක් සාමාජිකයෙකු වෘත්තීය ගිණුම්කරණ ආයතනයක සාමාජිකයෙකු විය යුතුය. | ✓<br><br>✓<br><br>✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 162 සිට 163 දක්වා |
| 7.10.6 (ආ) | විගණන කමිටුවේ කාර්යයන් | • ලැයිස්තුගත කිරීමේ රීතිවල 7.10 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 162 සිට 163 දක්වා |
| 7.10.6 (ඇ) | විගණන කමිටුවට අදාළ වාර්ෂික වාර්තාවේ අනාවරණය කිරීම | අ) විගණන කමිටුවට ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ නම්<br>ආ) විගණන කමිටුව විගණකවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කොට ඒ සඳහා පදනම හෙළි කළ යුතුය<br>ඇ) වාර්ෂික වාර්තාව තුළ විගණන කමිටුවේ වාර්තාවක් නියමිත ආකාරයට අඩංගු වේ. | ✓<br>✓<br>✓ | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 162 සිට 163 දක්වා |
| 9.3.2 | සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව | අ) පුනරාවර්තනය නොවන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ විස්තර<br>ආ) පුනරාවර්තනය වන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ විස්තර<br>ඇ) සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව<br>ඈ) සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ තහවුරු කිරීමේ ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කිරීමේ හෝ වෙනත් අයුරකින් සෘණාත්මක ප්‍රකාශයක් | ✓<br>✓<br>✓<br>✓ | 2021/22 මූල්‍ය වර්ෂය තුළ කඩඉම් සීමාව ඉක්මවා ගිය කිසිදු පුනරාවර්තනය නොවන ගනුදෙනුවක් නොවීය<br><br>මූල්‍ය ප්‍රකශ සඳහා සටහන 55.5<br><br>සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව<br><br>සමාගමෙහි කටයුතු සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 314<br><br>166 සිට 167 දක්වා<br>161 |

### 1.11 ඇමුණුම 2: ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් 2017 දී නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ විශිෂ්ට පරිචයන් පිළිබඳ සංග්‍රහයට අනුකූල වේ.

ආයතනික පාලන වාර්තාව තුළ සංග්‍රහයේ අවශ්‍යතා සාකච්ඡා කර ඇත. වාර්තාවට අදාළ යොමු අපි මෙහි සපයා ඇත්තෙමු.

| යොමු කේතය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමු කිරීම | පිටුව/පිටු |
|---|---|---|---|---|
| අ) | අධ්‍යක්ෂවරු | | | |
| අ.1 | බලාත්මක අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සමාගම මෙහෙයවීම, නායකත්වය ලබා දීම සහ පාලනය කළ යුතුය | | | |
| අ.1.1 | නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වන අතර, ව්‍යුහාත්මක ලෙසින් හා නිතිපතා මණ්ඩලයට තොරතුරු සැපයීම සිදු කළ යුතුය. | ✓ | රැස්වීම් සහ පැමිණීම | 134 |
| අ.1.2 | අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම් | ✓ | පාලන ආකෘතිය | 125 |
| අ.1.3 | මෙරට පවතින නීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගත යුතුය. | ✓ | අනුකූලතාව<br>දැනුම්වත් තීරණ ගැනීම | 124 සිට 155 |
| අ.1.4 | සමාගම් ලේකම් වෙත උපදෙස් හා සේවාවන් සඳහා ප්‍රවේශය | ✓ | සමාගම් ලේකම් | 129 |
| අ.1.5 | ස්වාධීන විනිශ්චය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 128 |
| අ.1.6 | මණ්ඩලයේ සහ සමාගමේ කාරණා සඳහා ප්‍රමාණවත් කාලයක් හා ශ්‍රමයක් කැප කළ යුතුය. | ✓ | රැස්වීම් සහ පැමිණීම | 134 |
| අ.1.7 | අඩුම තරමින් අධ්‍යක්ෂවරුන් 1/3ක් මගින් යෝජනා සඳහා යොමු විය යුතුය. | ✓ | රැස්වීම් සහ පැමිණීම | 133 |

| යොමු ක්ෂේත්‍රය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමු කිරීම | පිටුව/පිටු |
|---|---|---|---|---|
| අ1.8 | අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය හා පුහුණුව | ✓ | දැනුම්වත් තීරණ ගැනීම | 135 |
| අ.2 | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | ✓ | පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම් | 131 |
| අ.3 | විශිෂ්ට ආයතනික පාලනයක් සුරැකීම සඳහා සභාපතිගේ කාර්යභාරය | ✓ | පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම් | 131 |
| අ.4 | මූල්‍ය සවිඥානය ලබා ගැනීමේ හැකියාව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 128 |
| අ. 5 | අධ්‍යක්ෂ මණ්ඩල සමතුලිත බව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 128 |
| අ.5.1 | මණ්ඩලයට ප්‍රමාණවත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණයක් ඇතුළත් විය යුතුය | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය | 128 |
| අ.5.2 | අධ්‍යක්ෂ මණ්ඩලයට විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු පමණක් නම් ඔවුන් ස්වාධීන විය යුතුය | අදාළ නොවේ | | |
| අ.5.3 | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 128 |
| අ.5.4 | අධ්‍යක්ෂවරුන්ගේ සිය ස්වාධීනත්වය සම්බන්ධ වාර්ෂික ප්‍රකාශය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 129 |
| අ.5.5 | විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීනත්වය පිළිබඳ සිදු කෙරෙන වාර්ෂික නිර්ණය | ✓ | අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය | 129 |
| අ.5.6 | විකල්ප අධ්‍යක්ෂවරු | අදාළ නොවේ | | |
| අ.5.7 සහ අ.5.8 | ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරු | ✓ | පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම් | 131 |
| අ.5.9 | විධායක නොවන අධ්‍යක්ෂවරුන් සමඟ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයාගේ වාර්ෂික රැස්වීම | ✓ | රැස්වීම් සහ පැමිණීම | 134 |
| අ. 5.10 | විශේෂ කරුණු කිහිපයකින් විසම්මුතිය සටහන් කිරීම | ✓ | රැස්වීම් සහ පැමිණීම | 133 |
| අ. 6 | තොරතුරු සැපයීම | ✓ | දැනුවත් තීරණ ගැනීම | 135 |
| අ.7 | අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම් හා නැවත තේරී පත්වීම | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය අලුත් කිරීම | 132 |
| අ.7.1 | නාමයෝජනා කමිටුවක්, සභාපති සහ විමර්ශන කොන්දේසි පිහිටුවීම | ✓ | නාමයෝජනා කමිටු වාර්තාව | 168-169 |
| අ.7.2 | මණ්ඩල සංයුතිය පිළිබඳ වාර්ෂික තක්සේරුව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල අලුත් කිරීම/ඇගයුම | 132, 135 |
| අ.7.3 | නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ අනාවරණය කිරීම් | ✓ | සමාගමෙහි කටයුතු පිළිබද අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 158 |
| අ 8 | නැවත තේරී පත්වීම සඳහා ඔවුන් විසින්ම ඉදිරිපත් වන අධ්‍යක්ෂවරු | ✓ | සමාගමෙහි කටයුතු පිළිබද අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 158 |
| අ.9 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනු කමිටු කාර්ය සාධනය ඇගයීම | ✓ | අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු ඇගයීම | 135 |
| අ.10 | අධ්‍යක්ෂවරුන් පිළිබඳ නිශ්චිත තොරතුරු අනාවරණය කිරීම සඳහා වාර්ෂික වාර්තාව | ✓ | අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු<br>රැස්වීම් සහ පැමිණීම්<br>වෙනත් සමාගම්වල අධ්‍යක්ෂක තනතුරු<br>අනු කමිටුවල සාමාජිකත්වය | 117-120<br>134<br>117-120<br>134 |
| අ.11 | ප්‍රධාන විධායක නිලධාරී ඇගයීම | ✓ | ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී ඇගයීම | 135 |
| ආ | අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික | | | |
| ආ.1 | විධායක සහ අධ්‍යක්ෂක පාරිශ්‍රමික පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම. | | වගකිවයුතු සහ සාධාරණ පාරිශ්‍රමික<br><br>2021/22 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොසිටි අතර, එබැවින් ඔවුන්ගේ පාරිතෝෂික පිළිබඳව සභාපතිවරයා සහ/හෝ ප්‍රධාන විධායක නිලධාරියාගෙන් උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාවය මතු නොවීය. | 136 |
| ආ. 2 | පාරිශ්‍රමික මට්ටම සහ එය සකස් කරන ආකාරය | ✓ | වගකිවයුතු සහ සාධාරණ වේතනයක් | 136 |

# ආයතනික පාලනය

| යොමු කේතය | අවශ්‍යතාවය | අනුකූලයි | වාර්තාව තුළ යොමු කිරීම | පිටුව/පිටු |
|---|---|---|---|---|
| ආ.3 | වාර්ෂික වාර්තාවේ පාරිතෝෂිකයට අදාළ අනාවරණය කිරීම.<br>• පාරිතෝෂික ප්‍රතිපත්ති ප්‍රකාශය<br>• ගෙවූ සමස්ථ මණ්ඩල පාරිතෝෂික | ✓ | <br>• මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව<br>• වගකිවයුතු සහ සාධාරණ පාරිශ්‍රමික | <br>164 - 165<br>136 |
| ඇ | කොටස් හිමියන් සමග සබඳතා | | | |
| ඇ.1 | මහා සභා රැස්වීම සහ වෙනත් පොදු රැස්වීම්වල ඵලදායී භාවිතය | ✓ | වාර්ෂික මහා සභා රැස්වීමේ ඵලදායී භාවිතය | 138 |
| ඇ .2 | කොටස් හිමියන් සමග සන්නිවේදනය | ✓ | ආයතනික පාලනය - කොටස් හිමියන් සමග සන්නිවේදනය | 138 |
| ඇ .3 | ප්‍රධාන හා ප්‍රාමාණික ගනුදෙනු අනාවරණය කිරීම | ✓ | වර්ෂය තුළ, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 185 වන වගන්තිය මගින් අර්ථ දක්වා ඇති පරිදි ප්‍රධාන හෝ ප්‍රාමාණික ගනුදෙනු සිදු නොවූ අතර එය සමාගමේ ශුද්ධ වත්කම් පදනමට ද්‍රව්‍යමය වශයෙන් බලපායි. | |
| ඈ | වගවීම සහ විගණනය | | | |
| ඈ .1 | සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර හා තේරුම්ගත හැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීම | ✓ | ආයතනික පාලනය - කොටස් හිමියන් සමග සන්නිවේදනය | 138 |
| ඈ.1.1 | සමබර වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ✓ | ආයතනික පාලනය - කොටස් හිමියන් සමග සන්නිවේදනය | 138 |
| ඈ.1.2 | සමබර හා තේරුම්ගත හැකි සන්නිවේදනය | ✓ | කොටස් හිමියන් සමග සබඳතා | 138 |
| ඈ.1.3 | ප්‍රධාන විධායක නිලධාරී / ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ ප්‍රකාශය | ✓ | ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය | 204 |
| ඈ.1.4 | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා ප්‍රකාශයට පත් කිරීම | ✓ | සමූහයේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 156 -161 |
| ඈ.1.5 | මූල්‍ය වාර්තාකරණය - අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් පිළිබඳ ප්‍රකාශය අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය | ✓ | මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම<br>අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය | 200-201<br>203 |
| ඈ.1.6 | කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය | ✓ | ප්‍රාග්ධන වාර්තා | 44-113 |
| ඈ .1.7 | ශුද්ධ වත්කම් < 50% | ✓ | සමාගමේ ශුද්ධ වත්කම් කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 50% ට වඩා පහත වැටීමට ඉඩක් නොමැති අවස්ථාවක දී, මණ්ඩලය විසින් එම තනතුරේ කොටස් හිමියන්ට දැනුම් දීම සහ ගනු ලබන පියවර පිළිබඳව පැහැදිලි කිරීම සඳහා අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ඇත. | |
| ඈ .1.8 | සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු වාර්තාව | ✓ | සමාගම සමග ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය | 159,<br>166-167 |
| ඈ.2 | කොටස් හිමියන්ගේ ආයෝජන සහ සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ අභ්‍යන්තර පාලන ක්‍රමයක් | ✓ | අවදානම් කළමනාකරණ සහ විගණන කමිටුවේ අභ්‍යන්තර පාලන වාර්තාව<br>අධ්‍යක්ෂවරුන්ගේ අභ්‍යන්තර පාලන ප්‍රකාශය<br>අවදානම් සමාලෝචනය | 162-163<br><br>203<br>176 -195 |
| ඈ .3 | විගණන කමිටුව | ✓ | විගණන කමිටු වාර්තාව | 162 -163 |
| ඈ .4 | සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව | ✓ | සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටු | 166-167 |
| ඈ .5 | ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතිය | ✓ | චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය | 137 |
| ඈ .6 | ආයතනික පාලන අනාවරණය කිරීම් | ✓ | ආයතනික පාලන වාර්තාව | 124 -155 |
| ඉ/ඊ | ආයතනික සහ වෙනත් ආයෝජකයින් | | | |
| | ආයතනික සහ වෙනත් ආයෝජකයින් | ✓ | කොටස් හිමියන් සමග සබඳතා | 138 |
| උ. | අන්තර්ජාලය හා සම්බන්ධ කටයුතු සහ සයිබර් ආරක්ෂණ | ✓ | තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව | 136 |
| ඌ | තිරසාර වාර්තාකරණයේ මූලධර්ම | ✓ | පාර්ශ්වකාර වටිනාකම් නිර්මාණය | 138 |

## මූල්‍ය ව්‍යාපාර පනතෙහි නියෝග සමග අනුකූලතාවය

ශ්‍රී ලංකාවේ මහ බැංකුව නිකුත් කර ඇති 2008 අංක 3 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) පනතෙහි කරුණු සමගින් සහ මූල්‍ය සමාගම් (ආයතනික පාලනය - සංශෝධන) 2008 අංක 4, 2013 අංක 06 සහ 2020 අංක 5 දරණ පනතෙහි සංශෝධන සමගින් අනුකූල වීම. සමාගම 2021.12.31. දිනැති අංක 5 දරණ ආයතනික පාලන නියෝගය සහ 2021 අංක 05 දරණ නියෝගයෙහි නිශ්චිත විධිවිධාන වෙත ස්වේච්ඡාවෙන් අනුගත වී ඇත.

| රීති යොමුව | | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|---|
| A | | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් | |
| 2 (1) | | සමාගමේ ආරක්ෂාව සහ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම | |
| | | අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. කටයුතු කළමනාකරණය කිරීම සහ සමාගමේ ආරක්ෂාව සහ නිරවද්‍යතාවය සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතුය. | |
| | අ) | උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම | ✓ |
| | | සමාගමේ උපායමාර්ගික අරමුණු සමාගමේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශයන් මත පුරෝකථනය කර ඇති අතර ආයතනික වටිනාකම් ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියට ඇතුළත් කර ඇත. ඒවා සියලු මට්ටම්වල සේවකයින්ට සන්නිවේදනය කර තිබේ.<br><br>ව්‍යාපාර චර්යාධර්ම සංග්‍රහය සම්බන්ධයෙන් ගත් කල, සමාගම මගින් සිය මෙහෙයුම් සහ පරිපාලන වටපිටාව වෙත විනිවිදභාවන, ගුණාත්මකභාවය සහ සුපිළිපන්බව වැනි වටිනාකම් අන්තර්ගත කොට ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්ති අනුව එබඳු සුපිළිපන් බව සුරැකීමට කටයුතු කොට ඇත.<br><br>සමාගමේ උපායමාර්ගික අරමුණු සැකසීමේදී මණ්ඩලය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන අතර සමාගමේ මෙහෙවර සහ දැක්ම ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන බව සහතික කරයි.<br><br>කළමණාකාරීත්වය වෙත නියමිත අරමුණු / අභිලාෂයන් ක්‍රියාවට නැංවීමේ කාර්යය, අධයක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති අතර, මණ්ඩලය විසින් සමාගමේ ක්‍රියාකාරිත්වය, ඉලක්ක වලට ළංවීම තරයෙන් අධීක්ෂණය හා සමාලෝචනය කරනු ලැබේ. | |
| | ආ) | අවදානම් ප්‍රතිපත්ති සහ කළමනාකරණ ක්‍රියාපටිපාටි ඇතුළු සමස්ත ව්‍යාපාර උපාය මාර්ග අනුමත කිරීම | ✓ |
| | | 2021-2026, පස් අවුරුදු ව්‍යාපාර උපායමාර්ගය (ආයතනික උපායමාර්ගික සැලැස්ම) 2021 මාර්තු මාසයේදී මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එහි උපායමාර්ගය සහ ක්‍රියාත්මක කිරීම මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ. ව්‍යාපාර උපාය මාර්ගයෙන් ලබාගත් වාර්ෂික අයවැය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර මාසිකව අධීක්ෂණය කරනු ලැබේ.<br><br>අවදානම් අභිරුචිය, ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණයන් තීරණය කරමින් සමාගමේ සමස්ත අවදානම් උපාය මාර්ගය ද මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ආයතනික උපායමාර්ගික සැලැස්ම සමාගමේ සමස්ත අවදානම් උපාය මාර්ගයට අනුකූල වන අතර එහිදී ප්‍රාග්ධනය වෙන් කිරීම වැනි අවදානම් සහ අවදානම් මට්ටම් මැනීම සඳහා අවදානම් ආකෘතිය භාවිතා කිරීමේදී අවදානම් රුචිය සැලකේ. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති පාලනය සහ අනුකූලතාවය ද උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත. තවද, කාලානුරූපීව ක්‍රියාත්මක කළ යුතු අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණයන් අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සහ අනුමැතියට යටත් කිරීම සිදු වේ. | |
| | ඇ) | අවදානම් කළමනාකරණය | ✓ |
| | | සමාගමේ සමස්ත අවදානම් රාමුව කෙරෙහි සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වශයෙන් වගකිව යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවදානම් හඳුනාගෙන දූරදර්ශීව කළමනාකරණය කිරීම සඳහා සුදුසු පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කරන අතර ත්‍රෛමාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.<br><br>සමාගමේ අවදානම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත වගකීම දරයි.<br><br>පහත සඳහන් වාර්තා මගින් මේ සම්බන්ධයෙන් වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමට හැකිය:<br><br>176 සිට 195 දක්වා පිටුවල අවදානම් කළමනාකරණය.<br>170 සිට 172 දක්වා වූ පිටුවල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව ඇතුළත් වේ. | |
| | ඈ) | පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය | ✓ |
| | | පාර්ශවකරුවන් සමඟ ද්වි-මාර්ග සන්නිවේදනයක් සිදු කිරීමේ වැදගත්කම වටහා ගත් මණ්ඩලය, කොටස් හිමියන් සහ තැන්පත්කරුවන්, ණයහිමියන්, ණයගැතියන්, සැපයුම්කරුවන් සහ වෙනත් අදාළ පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය සඳහා පුළුල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. | |
| | ඉ) | අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධති සමාලෝචනය කිරීම (MIS) | |

# ආයතනික පාලනය

| රීති යොමුව | | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|---|
| | | සමාගම ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගෙන යන බවට සහතික වීම සහ එහි කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේ වගකීම මණ්ඩලය සතුය.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් සවිස්තරාත්මකව අධීක්ෂණය කිරීම හා සමාලෝචනය කිරීම සිදු කරන අතර කාර්තුමය පදනමක් මත සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරයි.<br><br>කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) සම්බන්ධයෙන් සමාලෝචනය කෙරෙන්නේ සමාගමේ MIS ක්‍රියාපටිපාටියේ අත්පොත ලුහු සටහන් / මාර්ගෝපදේශවල නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කිරීමෙනි. | |
| | ඊ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) | ✓ |
| | | සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන්, මූල්‍ය ප්‍රධානියා සහ අනුකූලතා නිලධාරියා හඳුනා ගැනේ. | |
| | උ) | අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ඇති අධිකාරිත්වය සහ වගකීම | ✓ |
| | | අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රතිපත්ති, රාජකාරි සහ වගකීම් සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ විස්තරාත්මකව දක්වා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගේ (KMPs) ප්‍රධාන කාර්යයන් / වගකීම් මණ්ඩලය විසින් නිර්වචනය කර අනුමත කර ඇති අතර ඔවුන්ගේ රැකියා විස්තර වලට ඒවා ඇතුළත් කර ඇත.<br><br>ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගේ බලතල ක්‍රියාත්මක වන සීමාවන් මණ්ඩලය විසින් අර්ථ දක්වා ඇත. | |
| | ඌ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් සමාගමේ කටයුතු අධීක්ෂණය | ✓ |
| | | සමාගමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය රැස්වීම්වලදී මාසිකව සමාලෝචනය කර සාකච්ඡා කරනු ලැබේ.මෙම රැස්වීම් වලදී, ප්‍රධාන කළමනාකරණ පිරිස් නියෝජනය කිරීම ප්‍රධාන විධායක නිලධාරියා සිදු කරන අතර ඇතිකරගත් ඉලක්ක වලට සාපේක්ෂව සමාගමේ මෙහෙයුම් හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ඔහු/ඇය විසින් මණ්ඩලය දැනුවත් කෙරේ.<br><br>කළමනාකරණ මට්ටමේ දී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමාගමේ කටයුතු සමාලෝචනය කර සාකච්ඡා කරනු ලැබේ. | |
| | එ) | පාලන ක්‍රියාකාරකම් වල ඵලදායීතාවය තක්සේරු කිරීම. | ✓ |
| | | සමාගමේ අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම හා පත් කිරීම සඳහා අදාළ වන පොදු ක්‍රියා පටිපාටිය කෙරෙහි සමාගමේ විධි විධාන සහ ආයතනික පාලන ප්‍රඥප්තිය පාදක වෙයි. වර්තමානයේදී, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් හැරුණු විට සමාගමේ අධ්‍යක්ෂවරුන් මව් සමාගම වන මහජන බැංකුව විසින් නිර්දේශ කරනු ලබන අතර සමාගමේ විධි විධාන අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශය මත ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලැබේ.<br><br>බැදියාවන් සම්බන්ධයෙන් ඇති වන ගැටුම් කළමනාකරණය කිරීම කාලෝචිත ආකාරයකින් විසඳනු ලැබේ. සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම සංග්‍රහය සහ ආචාර ධර්ම ප්‍රකාරව, පුද්ගලික සම්බන්ධතා, බාහිර ආයතන සහ ද්‍රව්‍යමය කාරණා කෙරෙහි ඇති උනන්දුව නිසා පැන නගින, විය හැකි හෝ සැබෑ බැදියාවන් පිළිබඳ ගැටුමක් ඔහුට / ඇයට තිබේද යන්න තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු වෙත ම ඇත. සාකච්ඡාවට භාජනය වී ඇති කාරණයක් පිළිබඳව බැදියාවක් දක්වන අධ්‍යක්ෂවරුන් ඔහුගේ / ඇයගේ බැදියාව හෙළි කළ යුතු අතර එම කාරණය පිළිබඳ දායකත්වයක් දැක්වීම හා ඒ සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටියි.<br><br>බැදියාවක් දැක්විය හැකි තත්ත්වයන් පිළිබඳ ස්වයං ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් සිදු කෙරෙන අවස්ථාවේ දී සහ පසුව වාර්ෂිකව ලබා ගනී. මෙම ප්‍රකාශයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනාවරණය කරන ලද අභිලාෂයන්, බැදියාවන් පිළිබඳ ගැටුම් (අදාළ වන්නේ නම්) ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සමාගමට උපකාරී වේ.<br><br>වාර්ෂික ස්වයං ඇගයීම් වල සාරාංශයක් භාරදීමෙන් අනතුරුව වසර අවසානයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය පාලන ක්‍රියාකාරකම් වල බලාත්මකභාවය, එහි දුර්වලතා නිර්ණය කිරීම, ගැටලු සහ වෙනස්කම් සිදුකිරීම් පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ. 2021/22 මූල්‍ය වර්ෂය සඳහා 2021 මාර්තු මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද ස්වයං ඇගයීමක් සිදු කරන ලදී. | |
| | ඒ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්තික සැලැස්ම | ✓ |
| | | ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පුළුල් අනුප්‍රාප්තික සැලැස්මක් ප්‍රතිනිර්මාණය කිරීමට සහ පවත්නා අනුප්‍රාප්තික සැලැස්ම මත පදනම්ව කුසලතා සංචිතයක් හඳුනා ගැනීමට මණ්ඩලය කටයුතු කරමින් සිටී. | |

| රීති යොමුව | | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|---|
| | ඔ) | ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග පැවැත්වෙන නිතිපතා රැස්වීම් | ✓ |
| | | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති, උපායමාර්ග, ක්‍රියාවලීන් සහ භාවිතයන් සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක ආයතනික කළමනාකරණ කණ්ඩායම/ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ මණ්ඩලය හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. කළමනාකාරීත්වය මණ්ඩලය සමඟ විවෘත හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන අතර සියලු වැදගත් කරුණු එහි අවධානයට යොමු කරයි.<br><br>තවද, අදාළ අවස්ථාවන්හිදී, ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා යන ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා මණ්ඩල හා මණ්ඩල අනුකමිටු රැස්වීම්වලට සහභාගී වන ලෙස ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට ආරාධනා කරනු ලැබේ.<br><br>තවද සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ජ්‍යෙෂ්ට කළමනාකාරීත්ව රැස්වීම් සහ ක්‍රමෝපායික රැස්වීම් වලදී ප්‍රධාන කළමනාකරණ පිරිස් හමුවේ. | |
| | ඕ) | නියාමන පරිසරය අවබෝධ කර ගැනීම | ✓ |
| | | සමූහයේ වටිනාකම්, ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම්, මූල්‍ය කටයුතු, පාලන රාමුව සහ සමාගමේ උපායමාර්ගික තත්ත්වය පිළිබඳව මණ්ඩලය සතුව මනා දැනුමක් ඇත.<br><br>අදාළ නීති, රෙගුලාසි සහ ආයතනික පාලනයන්හි වෙනස්වීම් පිළිබඳ නිරන්තර යාවත්කාලීන කිරීම් මෙන්ම ආර්ථික, සමාජීය හා පාරිසරික අංශ ඇතුළු පුළුල් පරාසයක මාතෘකා ආවරණය වන පරිදි සමූහයට සහ එහි මෙහෙයුම් වලට බලපෑම් කළ හැකි අංශවල වර්ධනයන් සම්බන්ධයෙන් සෑම රැස්වීමකදීම මණ්ඩල කමිටුවලට හා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම් සිදු කෙරේ.<br><br>නියාමන පරිසරය සම්බන්ධයෙන් සමාගමේ ස්ථාවරය පිළිබඳ දැනුවත් කිරීම සඳහා නියාමන අවශ්‍යතා සහ අදාළ අනුපාතවල සාරාංශයක් නිරන්තරයෙන් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | |
| | ඖ) | බාහිර විගණකවරුන් බඳවා ගැනීම සහ අධීක්ෂණය කිරීම | ✓ |
| | | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 55 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ බාහිර විගණකවරයා විගණකාධිපතිවරයා වේ. අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණනය සිදුකිරීමට සහාය වීම සඳහා විගණකාධිපති විසින් 2021 මාර්තු 31, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (අ) වගන්තිය යටතේ වරලත් ගණකාධිකාරීවරුන් වන "අර්නස්ට් ඇන්ඩ් යන්ග්" ආයතනය පත් කර ඇත. | |
| 2(2) | | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් නිර්වචනය කිරීම හා අනුමත කිරීම | ✓ |
| | | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා පත් කර ඇති අතර ඔවුන්ගේ කාර්යභාරයන් වෙන් ව පවතී. එය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ අර්ථ දක්වා ඇත. | |
| 2 (3) | | අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම | ✓ |
| | | අධ්‍යක්ෂවරුන්ට සමාගමේ වියදමින් ඔවුන්ගේ රාජකාරි හා වගකීම් ඉටුකිරීමට අදාළ කරුණු පිළිබඳව සමාගම් ලේකම්ගේ උපදෙස් සහ වෙනත් වෘත්තීය ස්වාධීන උපදෙස් ලබා ගැනීමට ආයතනික පාලන ප්‍රඥප්තිය මගින් අවකාශ සලසා තිබේ. කෙසේ වෙතත්, 2021/22 මුදල් වර්ෂය තුළ කිසිදු අධ්‍යක්ෂවරයකු විසින් එවැනි උපදෙස් ලබාගෙන නොමැත. | |
| 2 (4) | | බැඳියාවන් පිළිගැටුම් කළමනාකරණය කිරීම | ✓ |
| | | සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම සංග්‍රහය සහ ආචාරධර්ම ප්‍රකාරව, මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම පුද්ගලික සම්බන්ධතා, බාහිර ආයතන සහ ද්‍රව්‍යමය කාරණා කෙරෙහි ඇති බැඳියාව නිසා ඔහුගේ / ඇයගේ ස්වාධීන විනිශ්චය කෙරෙහි බලපෑමක් ඇති කරන අභිලාෂයන් නිසා විය හැකි හෝ සත්‍ය වශයෙන් ම පවතින ගැටුමක් තිබේද යන්න තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම ඇත. සාකච්ඡාවට භාජනය වී ඇති කාරණයක් පිළිබඳවව බැඳියාවක් දක්වන අධ්‍යක්ෂවරුන් ඔහුගේ / ඇයගේ උනන්දුව හෙළි කළ යුතු වන අතර එම කාරණය පිළිබඳ සාකච්ඡාවට සම්බන්ධ වීම හා ඒ සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටීම කළ යුතුය. තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් එලෙස වැළකී සිටින අවස්ථාවක දී සමාගම් ලේකම් විසින් රැස්වීම් වාර්ථාවන්හි විශේෂ කරුණු යටතේ සටහන් කරනු ලැබේ. | |
| 2 (5) | | අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂයෙන් වෙන් කර ඇති කරුණු ඇතුළත් විධිමත් සටහනක් ලබා දීම. | ✓ |
| | | සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය ගන්නා තීරණය සම්බන්ධ විශේෂයෙන් වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් තොරතුරු අඩංගු වේ. | |
| 2 (6) | | නුබුන්වත්කම් පිළිබඳ ගැටළු අනාවරණය කිරීම | ✓ |
| | | 2021/22 වර්ෂය තුළ එවැනි තත්වයක් මතු වී නොමැත. තවද, සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සතිපතා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කරනු ලැබේ. | |
| 2 (7) | | උපදෙස්වලට අනුකූල වීම පිළිබඳ ආයතනික පාලන වාර්තාව වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කිරීම. | ✓ |
| | | සමාගමේ වාර්ෂික වාර්තාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ ඇතුළත් වන අතර, අදාල උපදෙස් වලට දක්වා ඇති අනුකූලතාව ආයතනික පාලන වාර්ථා දක්වා ඇත. | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 2 (8) | අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං තක්සේරුව | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම අධ්‍යක්ෂවරයකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං තක්සේරුකරණ ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, එම ක්‍රියා පටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. ඊට අනුකූලව මණ්ඩලය විසින් එහි ක්‍රියාකාරිත්වය සහ කමිටු පිළිබඳ පුළුල් ඇගයීමක් 2022 මාර්තු මාසයේදී සිදු කරන ලදී.<br><br>මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම ඔහුගේ / ඇයගේ කාර්යක්ෂමතාව පිළිබඳ ස්වයං තක්සේරුවක් සිදු කළ අතර එමෙන්ම මණ්ඩල කමිටු ද තක්සේරුවක් සිදු කරන ලදී.<br><br>මණ්ඩලයේ ඇගයීම්වල සම්පූර්ණ ප්‍රතිඵල සමාගම් ලේකම් විසින් විශ්ලේෂණය කරන ලද අතර එහිදී කළ සොයා ගැනීම් 2022 ජූනි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. | |
| ආ) | අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් | |
| 3 (1) | නිතිපතා පැවැත්වෙන මණ්ඩල රැස්වීම් | ✓ |
| | ව්‍යාපාරික රැස්වීම් සාමාන්‍යයෙන් මාසික පදනමින් පවත්වනු ලැබේ.<br><br>2021/22 මුදල් වර්ෂය සඳහා මණ්ඩලය 12 වතාවක් රැස්වූ අතර සංසරණය හරහා මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම අවම වශයෙන් අවස්ථා හතක දී සිදු කරන ලදී. | |
| 3 (2) | අධ්‍යක්ෂවරුන් විසින් කරුණු සහ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම | ✓ |
| | නිතිපතා රැස්වීම්වල දී ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාන අවස්ථාවක් ලබා දී ඇත. මේ සඳහා අදාළ වන ක්‍රියා පටිපාටිය සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇත. | |
| 3 (3) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැන්වීම | ✓ |
| | මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දිනය පෙර පැවති මණ්ඩල රැස්වීමේදී පැමිණ සිටි සාමාජිකයින් විසින් සාමූහිකව එකඟ වී පසුව සියලුම සාමාජිකයින්ට සන්නිවේදනය කරනු ලැබේ.<br><br>රැස්වීම් සඳහා විධිමත් දැන්වීම, න්‍යාය පත්‍රය සහ රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සාමාන්‍යයෙන් රැස්වීමට දින හතකට (7) පෙර යවනු ලබන අතර, සාමාජිකයින්ට රැස්වීම් සඳහා සහභාගී වීමට හා ලේඛන අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දේ. සභාපතිගේ කැමැත්ත ඇතිව හදිසි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සුවිශේෂී පදනමක් මත ඇතුළත් කර ඇත.<br>වෙනත් විශේෂ මණ්ඩල රැස්වීමක් පිළිබඳව සාධාරණ දැනුම් දීමක් සිදු කිරීමට පියවර ගනු ලැබේ. | |
| 3 (4) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය | ✓ |
| | 2020/21 වර්ෂය තුළ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය ආසන්න වශයෙන් සියයට 100 ක් වූ අතර කිසිදු අධ්‍යක්ෂවරයෙකු අඛණ්ඩව රැස්වීම් තුනක් මග හැර නොමැත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳව පිටු අංක 134 හි දක්වා ඇත. | |
| 3 (5) | සමාගම් ලේකම්වරයෙකු පත් කිරීම | ✓ |
| | ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති වරලත් ලේකම්වරියක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ලේකම් ලෙස පත් කර ඇත.<br><br>සමාගම් ලේකම් විසින් මණ්ඩලයට උපදෙස් දෙන අතර සමාගම් පනත, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි සහ අදාළ වෙනත් නීති රීති අනුගමනය කරන බවට සහතික වේ. | |
| 3 (6) | න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සඳහා සමාගම් ලේකම් වෙත වගකීම පැවරීම | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සභාපති විසින් සමාගම් ලේකම් වෙත පවරා ඇති අතර ඒ අනුව සමාගම් ලේකම් ද ඒ සම්බන්ධයෙන් වගකීමෙන් බැඳේ. | |
| 3 (7) | සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීම සඳහා ප්‍රවේශය වීම | ✓ |
| | සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තිය මගින් ප්‍රතිපාදන සපයා ඇති පරිදි, සියලුම අධ්‍යක්ෂවරුන්ට වෘත්තියෙන් නීතිඥයෙකු වන සමාගම් ලේකම් වෙත උපදෙස් ලබා ගැනීම සඳහා ප්‍රවේශය ඇත. | |
| 3(8) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ විශේෂ කරුණු සටහන් කිරීම | ✓ |
| | සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල විශේෂ කරුණු ප්‍රමාණවත් තොරතුරු සහිතව පවත්වා ගෙන යන අතර සමාගමේ ආයතනික පාලන ප්‍රඥප්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව ඕනෑම අධ්‍යක්ෂවරයකුට පරීක්ෂා කිරීම සඳහා එය ලබා ගත හැකිය. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 3 (9) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල විශේෂිත කරුණු ප්‍රමාණවත් හා විස්තරාත්මකව වාර්තා කිරීම | ✓ |
| | මෙම රීතියේ නිශ්චිතව දක්වා ඇති සියලුම අවශ්‍යතා සපුරාලන ආකාරයෙන් සමාගම් ලේකම් විසින් රැස්වීම්වල කටයුතු සහ ගනු ලැබූ තීරණ ප්‍රමාණවත් ලෙස සටහන් කරයි. | |
| (ඇ) | අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය | |
| 4 (1) | අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව | ✓ |
| | වසර ආරම්භයේදී අධ්‍යක්ෂවරුන් නවයක් (9) අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළහ. 2021 අගෝස්තු 24 සිට බලපැවැත්වෙන පරිදි එස්. අහංගම මහතා ඉල්ලා අස්විය. 2021/22 අවසානයේ දී අධ්‍යක්ෂවරුන් 9 දෙනෙකු මණ්ඩලයේ සිටි අතර එය අවශ්‍ය මට්ටමට අනුකූල විය. | |
| 4 (2) | අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය | ✓ |
| | 2021/22 කාලය තුළ සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සේවා කාලය වසර නවයකට වඩා අඩු විය. | |
| 4 (3) | කිසියම් සේවකයෙකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම | ✓ |
| | සමාගම සඳහා විධායක අධ්‍යක්ෂවරුන් නොමැත. | |
| 4 (4) | අධ්‍යක්ෂ මණ්ඩල සමබර බව සහ ස්වාධීනත්වය සඳහා වන නිර්ණායක | ✓ |
| | මෙම රීතියේ දක්වා ඇති පරිදි ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා තුනෙන් එකෙහි නිර්ණායක සපුරාලන පරිදි 2021/22 මූල්‍ය වර්ෂය තුළ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත විය.<br><br>අධ්‍යක්ෂවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන ස්වයං ප්‍රකාශන ආකෘති පත්‍ර මත පදනම්ව මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන ස්වාධීනත්වය තීරණය කිරීමේ නිර්ණායකයන් අධ්‍යක්ෂවරුන් විසින් සපුරා තිබිණ. | |
| 4 (5) | විකල්ප අධ්‍යක්ෂ | ✓ |
| | මෙම වර්ෂය තුළ විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කර නොමැත. | |
| 4 (6) | වෛෂයික විනිශ්චයක් ගෙන ඒම සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ කුසලතා සහ පළපුරුද්ද | ✓ |
| | විවිධ ක්ෂේත්‍රයන්හි අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් ඇති මුළුමනින් ම විධායක නොවන අධ්‍යක්ෂවරුන් මෙම මණ්ඩලයට ඇතුළත් විය. අධ්‍යක්ෂ මණ්ඩලයේ කුසලතා සහ ව්‍යාපාරික අත්දැකීම් සම්මිශ්‍රණය කිරීම මණ්ඩලයේ සහ එහි කමිටුවල නිසි ක්‍රියාකාරිත්වයට විශාල දායකත්වයක් සපයයි. | |
| 4 (7) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ගණපූරණය | ✓ |
| | 2021/22 වර්ෂය තුළ සමාගමේ සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වූ බැවින්, වර්ෂය සඳහා රැස්වූ මණ්ඩලයේ සියලුම රැස්වීම්වලදී අවශ්‍ය ගණපූරණය (අධ්‍යක්ෂවරුන්ගෙන් අඩක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වීම) සපුරා ගන්නා ලදී. | |
| 4 (8) | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් අනාවරණය කිරීම, ආයතනික පාලන සන්නිවේදනයන් හා වාර්ෂික වාර්තාව තුල අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය. | ✓ |
| | සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් අඩංගු සියලුම ආයතනික සන්නිවේදනයන්හි දැක්වෙන ආකාරයෙන්ම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් ද හඳුන්වනු ලැබේ. | |
| 4 (9) | නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා ඇති විධිමත් හා විනිවිද පෙනෙන ක්‍රියාපටිපාටිය | ✓ |
| | සමාගමේ අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම හා පත් කිරීම සඳහා අදාළ වන පොදු ක්‍රියා පටිපාටිය සඳහා සමාගමේ ව්‍යවස්ථාවලිය සහ ආයතනික පාලන ප්‍රඥප්තිය බල පැවැත්වේ. සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස පත් කිරීම සඳහා නම් කරන ලද පුද්ගලයන් යෝග්‍ය සහ සුදුසු යැයි පෙනී ගිය පසු, ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතියට යොමු කෙරේ.<br><br>වර්ෂය තුළ නව පත්වීම් කිසිවක් සිදුනොවීය. | |
| 4 (10) | අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත්වීම | ✓ |
| | සමාගමේ විධි විධානවල 27 (2) වගන්තියට අනුව අනියම් පුරප්පාඩු පිරවීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලුම අධ්‍යක්ෂවරුන් කොටස්කරුවන් විසින් පත් කිරීමෙන් පසු ඊළග වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත තේරී පත්වීමට යටත් වේ. | |
| 4 (11) | අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම් /ඉවත් කිරීම් අනාවරණය කිරීම | ✓ |
| | අදාළ රෙගුලාසි වලට අනුව ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධීක්ෂණ දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සියළුම ඉල්ලා අස්වීම් / ඉවත් කිරීම් සහ අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් ප්‍රමාණවත් තොරතුරු සහිතව කොළඹ කොටස් වෙළඳපොලට වහාම දැනුම් දීම ඔස්සේ කොටස්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.<br><br>වසර තුළදී එක් (1) ඉල්ලා අස්වීමක් සිදුවිය. | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ඇ) | අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ අනුකූලතාව | |
| 5 :1* | මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව හැර අධ්‍යක්ෂවරුන්ගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය (2023/06/18 දිනෙන් අවසන් වන වසර තුනක කාලයක් සඳහා අදාළ වේ) | ✓ |
| | වයස අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂවරුන් නොමැත. | |
| 5 (2) | සමාගම් 20 කට වැඩි ගණනක නිලතල දැරීම | ✓ |
| | සමාගම් 20 කට වැඩි ගණනක අධ්‍යක්ෂක ධුරය දරන අධ්‍යක්ෂවරුන් නොමැත. | |
| ඉ) | කාර්යයන් පැවරීම | |
| 6 (1) | අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු පැවරීම | ✓ |
| | අදාල වන නීතිරීතිවලට අනුකූල ව සමාගමේ විධි විධානවල 29 (2) වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂක කමිටුවකට හෝ සුදුසු යැයි හැගෙන ඕනෑම පුද්ගලයෙකුට පැවරීමට මණ්ඩලයට බලය ඇත.<br><br>ඒ අනුව, මණ්ඩලය විසින් සිය වගවීම ආරක්ෂා කරමින්, පැහැදිලිව අර්ථ දක්වා ඇති බලතල හා බලධාරීන් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු සහ කළමනාකාරිත්වයට බලය පවරා ඇත. | |
| 6 (2) | අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් පැවරීම වරින් වර සමාලෝචනය කිරීම | ✓ |
| | වගකීම පැවරීමේ පරාසය සහ එහි නිශ්චිත මෙහෙයුම් සන්දර්භය සැලකිල්ලට ගනිමින් සීමාවන් සුදුසු පරිදි පවතින්නේ ද යන්න සහතික කිරීම සඳහා අධිකාරී රාමුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර සමාලෝචනය කරනු ලැබේ. | |
| ඊ) | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | |
| 7 (1) | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකාවන් වෙන් වශයෙන් දැක්වීම | ✓ |
| | සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් බලය සහ අධිකාරීත්වය බෙදී යාම සමතුලිතතාවය සහතික කරයි | |
| 7 (2) | සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු නොවන විට ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකවරයෙකු ලෙස ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු නම් කිරීම | |
| | සභාපතිවරයා මව් සමාගමේ මහජන බැංකුවේ සභාපති ධුරය ද දරන බැවින් නියත ආකාරයෙන් ම ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු ලෙස සලකනු ලබයි.<br><br>එබැවින් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක වන කොරලි පීටර්ස් මහත්මිය සමාගමේ වර්තමාන ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරයි. | |
| 7 (3) | අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ සාමාජිකයන් අතර සම්බන්ධතාවය අනාවරණය කිරීම | ✓ |
| | ඔවුන් විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි, සභාපති / ප්‍රධාන විධායක නිලධාරී සහ / හෝ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් අතර මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් ද්‍රව්‍යමය ඇතුළුව කිසිදු සම්බන්ධතාවයක් නොමැත. | |
| 7 (4) | සභාපතිගේ කාර්යභාරය | ✓ |
| | සමාගමේ සංගමික පාලන ප්‍රඥප්තිය මගින් සභාපතිවරයාගේ වගකීම් දක්වා ඇති අතර එය අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම සහ එහි ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම සහභාපතිවරයා වෙතින් අපේක්ෂා කෙරේ. | |
| 7 (5) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේදී සභාපතිවරයාගේ කාර්යභාරය | ✓ |
| | න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සභාපති විසින් සමාගම් ලේකම් වෙත පවරා ඇත. | |
| 7 (6) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැන නගින ගැටළු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් හා කාලෝචිත ලෙස දැනුම් දීම් සිදු වී ඇති බවට සහතික වීම | ✓ |
| | රැස්වීමකට පෙර පැනනැගී ඇති ගැටළු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කිරීම සහතික කිරීම සභාපතිවරයාගේ වගකීම වේ. න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සෑම රැස්වීමකට ම පෙර ඔවුන්ගේ විමර්ශනය සඳහා ප්‍රමාණවත් කාලයක් සහිතව ඉදිරිපත් කෙරේ. | |
| 7 (7) | මණ්ඩලයේ කටයුතු සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීම | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු කරන සාකච්ඡාවල න්‍යාය පත්‍රය, ශෛලිය හා ස්වරය සකසා තීරණ ගැනීමේදී සියළුම අධ්‍යක්ෂවරුන්ගේ අදහස් නිසි ලෙස සලකා බැලීමට සභාපතිවරයා වගබලා ගනී. එමගින් මණ්ඩලයේ කටයුතු සඳහා තනි අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ප්‍රවර්ධනය කෙරේ. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 7 (8) | විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහ විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර සම්බන්ධතාවය දිරිමත් කිරීම | ✓ |
| | සමාගමට විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.<br><br>එසේ වුවද, මණ්ඩලයේ කටයුතුවල සහා සක්‍රියව සහභාගී වීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාන අවස්ථාවක් ලබා දීමෙන් සමස්තයක් ලෙස මණ්ඩලයේ සාමාජිකයන් අතර ඵලදායී සම්බන්ධතාවයක් පවතින බව සභාපතිවරයා සහතික කරයි.<br><br>මණ්ඩලයේ සමස්ත හා එහි කමිටුවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් සියළුම අධ්‍යක්ෂවරුන්ගේ අදහස් විමසා බැලෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික ස්වයං ඇගයීම් තුළින් මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් වේ. | |
| 7 (9) | සභාපතිවරයා විසින් ප්‍රධාන කළමනාකරණ පිරිස් සෘජුවම අධීක්ෂණය කිරීම හෝ විධායක රාජකාරි සම්බන්ධ කටයුතුවල නිරත වීමෙන් වැළැක්වීම | ✓ |
| | සභාපතිවරයා යනු විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර ඔහු සමාගමේ කිසිදු විධායක රාජකාරියකට හෝ ප්‍රධාන කළමනාකරණ පිරිස්වල සෘජු අධීක්ෂණයට සම්බන්ධ නොවේ. | |
| 7 (10) | කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන් සමඟ ඵලදායී සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දෙන අතර සමාගම සහ කොටස් හිමියන් අතර සන්නිවේදනය සඳහා යොදා ගත හැකි විධිමත් අවස්ථාවන් ලෙස වාර්ෂික මහා සභා රැස්වීම සහ අනෙකුත් මහා සභා රැස්වීම් සලකයි. ඒ අනුව, මෙම රැස්වීම් මගින් මණ්ඩලයට කොටස් හිමියන් හමුවීමට සහ සභාපතිවරයාට සමාගමේ ප්‍රගතිය පැහැදිලි කිරීමට මෙන් ම කොටස්කරුවන් මණ්ඩලය සහ කළමනාකරණය වෙත යොමු කරන කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමට අවස්ථාවක් හිමි වේ. | |
| 7 (11) | ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ කාර්යභාරය | ✓ |
| | සමාගමේ ඉහළම නිලධාරියා ලෙස ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී සැලකෙන අතර සමාගමේ උපායමාර්ගික අරමුණු හා ප්‍රතිපත්ති සවිස්තරාත්මකව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන් ම සුදුසු අවදානම් පරාමිතීන්ට අනුකූලව සමාගමේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහු/ඇය වෙත පවරනු ලැබේ. සමාග මේ ආයතනික පාලන ප්‍රඥප්තියේ ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරිගේ කාර්යභාරය සවිස්තරව දක්වා ඇත. | |
| උ) | අධ්‍යක්ෂ මණ්ඩලය පත් කළ කමිටු | |
| 8 (1) | අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිහිටුවීම, එහි කාර්යයන් සහ වාර්තාකරණය | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වාර්තා කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු හතරක් ඇති අතර මෙම අනිවාර්ය අනු කමිටු අදාළ නීති රීතිවලට අනුකූලව පිහිටුවා ඇත.<br><br>• අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව,<br>• අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව,<br>• මානව සම්පත්, පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුව, 2021 අංක 5 දරණ ආයතනික පාලන නියෝගයට ස්වේච්ඡාවෙන් අනුගත වෙමින් 2022.01.27 සිට බලපැවැත්වෙන පරිදි විසිරුවා හරින ලද අතර, අදාළ කමිටුවෙහි කාර්යභාරයන් පහත දැක්වෙන පරිදි වෙන වෙනම අනුකමිටු දෙකක් වෙත අනුයුක්ත කරන ලදී.<br>- මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (2022.01.27. සිට බලපැවැත්වෙන පරිදි)<br>- නාමයෝජනා කමිටුව (2022.01.27. සිට බලපැවැත්වෙන පරිදි)<br><br>• සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව<br><br>මෙකී අනිවාර්ය අනුකමිටු අදාළ නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව පිහිටුවා ඇත. තවද සමාගම විසින් වඩාත් යහපත් මෙහෙයුම්/අධීක්ෂණ කාර්යක්ෂමතාවයක් උදෙසා පහත දැක්වෙන අනුකමිටු ස්ථාපනය කරන ලදී.<br><br>• ආයෝජන කමිටුව<br>• ණය කමිටුව<br><br>සෑම කමිටුවකටම රැස්වීම් සංවිධානය, විශේෂ සටහන් තැබීම, වාර්තා පවත්වා ගෙන යෑම අදාළ කමිටුවල සභාපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ ඒවාට වෙන් වූ ලේකම්වරුන් යටතේ සිදු වෙයි. | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| 8 (2) | විගණන කමිටුව | |
| අ) | විගණන කමිටු සභාපති | ✓ |
| | විගණන කමිටුවේ සභාපති කොරලි පීටර්ස් මහත්මිය විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරියක් ලෙස 2020 මාර්තු 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඇය එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහකාර සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකාවක් ද වේ.<br><br>පෞද්ගලික හා රාජ්‍ය යන අංශවල කර්මාන්ත කිහිපයක විගණනය, මූල්‍ය හා ගිණුම්කරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇය සතුය. | |
| ආ) | ආ) විගණන කමිටුවේ සංයුතිය | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයින් තිදෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් ස්වාධීන ය. | |
| ඇ) | බාහිර විගණකවරුන් පත් කිරීම | ✓ |
| | විගණකාධිපතිවරයා සමාගම වෙත දැනුම් දී ඇති පරිදි 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුව විගණනය සිදු කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ ඕනෑම පාර්ශවයක් විසිනි. සමාගමේ විගණන කටයුතු සිදු කිරීම සඳහා විගණකාධිපති විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරිවරුන් පත් කර ඇති අතර 2022 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තුව තීරණය කර ඇත.<br><br>එබැවින් බාහිර විගණකවරයා සම්බන්ධ කර ගැනීමේ දී කමිටුවට කිසිදු කාර්යභාරයක් නොමැත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සිය රැස්වීම්වලදී අදාළ ගිණුම්කරණ මූලධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරයි. | |
| ඈ) | බාහිර විගණකගේ ස්වාධීනත්වය සහ වාස්තවිකතාව සහ විගණන ක්‍රියාවලීන්ගේ ඵලදායීතාවය සමාලෝචනය කර අධීක්ෂණය කිරීම | ✓ |
| | සමාගමේ විගණක යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විගණකාධිපතිවරයා වන බැවින් එවැනි අවශ්‍යතාවයක් පැන නගින්නේ නැත. | |
| ඉ) | බාහිර විගණක විසින් විගණන නොවන සේවා සැපයීම | ✓ |
| | සමාගමේ විගණක විගණකාධිපති වන බැවින් මෙය අදාළ නොවේ. කෙසේ වෙතත්, විගණන නොවන සේවාවක් විගණන සමාගමක් (සමාගමේ විගණනයට සහාය වීම සඳහා විගණකාධිපති විසින් පත් කරන ලද) විසින් සපයනු ලබන අවස්ථාවන් සම්බන්ධයෙන් කමිටුව විසින් ප්‍රතිපත්තියක් සකස් කර ඇති අතර එවැනි සේවාවක් සැපයීමෙන් එම සමාගමේ ස්වාධීනත්වය හෝ වාස්තවිකතාව කෙරෙහි හානියක් නොවන බව එයින් පිළිගැනේ. | |
| ඊ) | බාහිර විගණනයේ විෂයපථය තීරණය කිරීම | ✓ |
| | විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ විගණකාධිපති විසිනි. කෙසේ වෙතත්, කමිටුව මේ සඳහා බාහිර විගණකවරුන් හමුවිය. | |
| උ) | විගණන කමිටුව විසින් සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම | ✓ |
| | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ වෙනත් මූල්‍ය අනාවරණයන් නිරීක්ෂණය කිරීම සඳහා මණ්ඩලයේ විගණන කමිටුව සමාගමේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි.<br><br>අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර, කමිටුව විසින් අනාවරණය සම්බන්ධයෙන් සකස් කරන ලද සමාගමේ වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඇත. | |
| ඌ) | බාහිර විගණක සමඟ අන්තර් හා අවසාන විගණනයන්ගෙන් පැන නගින ගැටළු, එකඟතාවන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | ✓ |
| | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරුන් හමු වූ අතර ප්‍රධාන කළමනාකරණ පිරිස් නොමැතිව විගණනයෙන් පැන නගින ද්‍රව්‍යමය ගැටළු හෝ වෙන් කිරීම් සාකච්ඡා කිරීමට ඔවුන් වෙත අවස්ථාව ලබා දුන්නේය. | |
| එ) | බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය | ✓ |
| | වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය. | |

| රීති යොමුව | | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|---|
| ඒ) | | අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය | ✓ |
| | | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් වල ප්‍රමාණවත් බව කමිටුව සමාලෝචනය කළ අතර දෙපාර්තමේන්තුවට එහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය බලතල ඇති බවට සෑහීමකට පත් විය.<br><br>අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කළ කමිටුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික විය.<br><br>අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ක්‍රියාකාරිත්වය කමිටුව විසින් තක්සේරු කරන ලදී.<br><br>සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හෝ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සේවය අවසන් කිරීමක් සිදු ව නොමැති අතර බාහිර සේවා සපයන්නන්ගේ සේවා ලබා ගැනීමක් සිදු වී නොමැත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සෘජුවම වාර්තා කිරීමක් සිදු වන බැවින් අභ්‍යන්තර විගණන කාර්යය ස්වාධීන වේ. වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සමාලෝචනය කිරීමේ දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය පිළිබඳව ද අවධානය යොමු කෙරිණ. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය තුළින් අපක්ෂපාතීත්වය, ප්‍රවීණතාවය සහ නිසි වෘත්තීය සැලකිල්ලෙන් සිදු කෙරෙන විගණන කාර්යයක් සහතික කෙරෙයි. | |
| ඔ) | | අභ්‍යන්තර විමර්ශනයේ සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය තුළ අඩංගු මූලික කරුණු | ✓ |
| | | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මූලික විගණන කරුණු සහ කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනය කර සලකා බලයි. | |
| ඕ) | | විගණන කමිටු රැස්වීම්වලට සහභාගී වූවන් | ✓ |
| | | කමිටු රැස්වීම්වලට ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී සහභාගී වේ. කමිටුවේ ආරාධනය මත ප්‍රධාන විධායක නිලධාරී, අනුකූලතා නිලධාරී සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයින් සහ අනෙකුත් පිරිස් ද රැස්වීම්වලට සහභාගී වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට කිසිදු විධායක අධ්‍යක්ෂවරයකු ඇතුළත් නොවේ. | |
| ඖ) | | විගණන කමිටුවේ අධිකාරිය සහ සම්පත් | ✓ |
| | | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විමර්ශන කොන්දේසි යටතේ අදාළ කොන්දේසි යටතේ ඕනෑම කාරණයක් විමර්ශනය කිරීමට පැහැදිලි බලයක්, එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත්, තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය සහ බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමේ බලය හිමි වේ. | |
| අං) | | විගණන කමිටු රැස්වීම් | ✓ |
| | | සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ මණ්ඩල විගණන කමිටුව 12 වතාවක් රැස්විය. | |
| ක) | | වාර්ෂික වාර්තාවේ අනාවරණය කෙරෙන කරුණු | ✓ |
| | | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු තොරතුරු<br>• වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ක්‍රියාකාරකම්<br>• වර්ෂය තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් ගණන<br>• කාරක සභා රැස්වීම්වලට සාමාජිකයින්ගේ පැමිණීම<br><br>කමිටුව පිළිබඳ වැඩිදුර තොරතුරු සහ කාර්යයන් සඳහා 162 සිට 163 දක්වා පිටුවල ඇති "අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව" බලන්න. | |
| ග) | | රැස්වීම්වල විශේෂිත කරුණු සටහන් කිරීම හා පවත්වා ගෙන යෑම | ✓ |
| | | විමර්ශන නියමයන්ට අනුකූලව, අභ්‍යන්තර විගණන ප්‍රධානියා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර සියලුම කමිටු රැස්වීම්වල විශේෂිත කරුණු ප්‍රමාණවත් විස්තරාත්මකව සටහන් කර ගෙන පවත්වාගෙන යයි. | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ච) | අභ්‍යන්තර තොරතුරු (තොරතුරු දැනුම් දීම) ප්‍රතිපත්තිය සහ බාහිර විගණකවරුන් සමග සම්බන්ධතාවය | ✓ |
| | සමාගම අභ්‍යන්තරව සිදු විය හැකි වැරදි සහගත ක්‍රියා සම්බන්ධයෙන් විශ්වාසයෙන් යුතුව සේවකයන්ට දැනුම් දිය හැකි යන්ත්‍රණයක් සම්බන්ධයෙන් කමිටුව සැලකිලිමත් විය.<br><br>නීති, රීති, රෙගුලාසි හෝ සදාචාර විරෝධී හැසිරීම් විශ්වාසයෙන් යුතුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කිරීමට සේවකයින්ට හැකි අභ්‍යන්තර තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇත. මෙලෙස වාර්තා කරන අයගේ රහස්‍යභාවය සහතික කෙරෙන අතර එවැනි හෙළිදරව්වක් නිසා ඔවුන් කිසිදු වෙනස් කොට සැලකීමකට යටත් නොවේ. සියලුම සේවකයින්ගේ දැන ගැනීම සඳහා මෙම ප්‍රතිපත්තිය සමාගමේ අභ්‍යන්තර පරිගණක ජාලයෙහි ප්‍රකාශයට පත් කර ඇත.<br><br>විගණන කමිටුව බාහිර විගණක සමග සමාගමේ සබඳතා අධීක්ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිත ආයතනය ලෙස කටයුතු කරන අතර මෙම කාර්යය ඉටු කිරීම සඳහා බාහිර විගණකවරුන් හමුවිය. | |
| 8 (3) | **ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව** | |
| අ) | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය | ✓ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී මෙහෙයුම් (කළාප 1) සහ ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන සාමාන්‍යාධිකාරිවරයෙකුගෙන් සමන්විත විය.<br><br>2022 අප්‍රියෙල් මාසයේදී, 2021 අංක 05 දරණ මූල්‍ය ව්‍යාපාර පනත (ආයතනික පාලනය) ට අනුව කමිටුවෙහි යොමු කොන්දේසි සංශෝධනය කරන ලදී. එහිදී විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙන කමිටු සාමාජිකයින් වශයෙන් සහ ප්‍රවිනි/සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අවදානම් සහ පාලන යන නිලධාරීන් ආරාධනා මත සහභාගී වන්නන් වශයෙන් නිර්වචනය කෙරිණි.<br><br>ආරාධනය මත අභ්‍යන්තර විගණන ප්‍රධානී, අනුබද්ධ සමාගම්වල ප්‍රධාන අවදානම් දරන්නන් සහ අනුකූලතා නිලධාරියා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගී වූහ.<br><br>කමිටුවේ වැඩිදුර තොරතුරු සහ කාර්යයන් සඳහා 170 සිට 172 දක්වා පිටුවල ඇති "අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව" බලන්න. | |
| ආ) | අවදානම් තක්සේරුව | ✓ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සියළුම අවදානම් තක්සේරු කරන අතර එහි දී සමාගම සහ අනුබද්ධ සමාගම් සඳහා නිර්මාණය කර ඇති යෝග්‍ය අවදානම් දර්ශක හරහා ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් ආදිය සම්බන්ධයෙන් තක්සේරු කෙරේ. අවදානම් තක්සේරු කිරීම සමාගම් පදනමක් මත සහ හැකි සෑම අවස්ථාවකදීම කණ්ඩායම් පදනම මත සිදු කරනු ලැබේ.<br><br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමාගමේ සහ එහි සියලුම අනුබද්ධ සමාගම්වල අවදානම් උපකරණ වාර්තා / අවදානම් දර්ශක වාර්තා සමාලෝචනය කරන අතර නිශ්චිත අවදානම් වල සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| ඇ) | සියලුම විධායක මට්ටමේ කමිටුවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීම | ✓ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් පිහිටුවන ලද අවදානම් දරා ගැනීමේ මට්ටම් (අවදානම් සීමාවන්) මත පදනම්ව ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපල අවදානම සමාගමේ වත්කම් හා වගකීම් කමිටුව (ALCO) සමාලෝචනය කර අධීක්ෂණය කරයි.<br><br>ණය පහසුකම්, ණය පරිපාලනය සහ ණය ක්‍රියාවලිය ආශ්‍රිත සමාලෝචනය සහ නිර්දේශ කිරීම්/අනුමත කිරීම් සඳහා ණය කමිටුව ස්ථාපිත කර ඇත. | |
| ඈ) | කාරක සභාව විසින් තීරණය කරනු ලබන පුරෝකථන මට්ටම් ඉක්මවා යන අවදානම් අවම කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම | ✓ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවදානම් දරා ගැනීමේ මට්ටම් තීරණය කර ඇති අතර සමාගමේ අවදානම් විග්‍රහයේ ඇති එක් එක් අවදානම් කාණ්ඩය එම රැස්වීම්වලදී කමිටුව විසින් අවදානම් දරා ගැනීමේ මට්ටම්වලට සාපේක්ෂව සමාලෝචනය කර ඇත. අවදානම් මට්ටම් ස්ථාපිත අවදානම් සීමාවන් ඉක්මවා ගොස් ඇති බව තහවුරු කර ගැනීම සඳහා කමිටුව අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | |

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ඉ) | රැස්වීම් වාර ගණන | ✓ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව 2021/22 මූල්‍ය වර්ෂය තුළ හත් (7) වරක් රැස්විය.<br><br>COVID තත්ත්වය හේතුවෙන් සියලු දෙනාගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී කමිටු රැස්වීම් වීඩියෝ සම්මන්ත්‍රණ මගින් විද්‍යුත් වශයෙන් පවත්වන ලදී. | |
| ඊ) | නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සහ වහාම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම | ✓ |
| | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව (ALCO) විසින් සාමූහිකව අවදානම් හඳුනා ගැනීම සිදු කරන අතර එවැනි තීරණ සාමූහිකව ගනු ලැබේ. | |
| එ) | අවදානම් තක්සේරු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමෙන් සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබේ. | |
| ඒ) | අනුකූලතා කාර්යයන් ස්ථාපිත කිරීම | ✓ |
| | සමාගම නීති, රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයන් ස්ථාපිත කර ඇත.<br><br>අනුකූලතා කාර්යය මෙහෙයවනු ලබන්නේ පළපුරුදු ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු විසිනි. ඔහු නීති, රෙගුලාසි, උපදෙස්, රීති, නියාමන මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූල වීම පිළිබඳව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කළේය. | |
| උ) | සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු | |
| 9 (2) | බැඳියා පිළිගැටුමෙන් වැළකීම | ✓ |
| | සමාගම විසින් සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇති අතර එමගින් " සම්බන්ධිත පාර්ශවයන්" ලෙස සලකනු ලබන පුද්ගලයින්ගේ කාණ්ඩ හඳුනාගෙන ඇත. සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු ප්‍රතිපත්තියට අනුකූලව එක් එක් අධ්‍යක්ෂක සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් ස්වයං ප්‍රකාශ ලබා ගන්නේ ඔවුන් වෙත අදාළ වන පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා ය. මෙම ප්‍රකාශයන්හි දක්වා ඇති තොරතුරු මත පදනම්ව, සමාගම විසින් ජාලය පුරා අදාළ පාර්ශවීය ගනුදෙනු පිළිබඳ දත්ත ලබා ගැනීමට හැකි වන පරිදි පද්ධතියක් සකස් කර ඇත.<br><br>සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය තුළින් අපේක්ෂා කෙරෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුගේම පුද්ගලික සම්බන්ධතා, බාහිර සමාගම් සහ ද්‍රව්‍යමය කාරණා කෙරෙහි ඇති ලැදියාව නිසා පැන නගින අභිලාෂයන්ගේ විභව හෝ සැබෑ වශයෙන් ගැටුමක් තිබේද යන්න තීරණය කිරීම හා ඔහුගේ / ඇයගේ ස්වාධීන විනිශ්චය කෙරෙහි ඉන් බලපෑමක් ඇති කරන්නේ ද යන්න සොයා බැලීමටයි. එවැනි විභවයක් හෝ සැබෑ බැඳියාවන් ගැටුමක් ඇති අධ්‍යක්ෂවරුන් ඔහු / ඇය ඒ පිළිබඳව දැනගත් විගසම එය අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළි කළ යුතුය.<br><br>සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව අදාළ පාර්ශවීය ගනුදෙනු වල ඵලදායී කළමනාකරණය සහ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරයි.<br><br>කමිටුව පිළිබඳ වැඩිදුර තොරතුරු සහ කාර්යයන් සඳහා 166 සිට 167 දක්වා පිටුවල සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව බලන්න. | |
| 9 (3) | සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සම්බන්ධයෙන් උපදෙස් තුළ කරුණු දැක්වෙයි. | ✓ |
| | සමාගමේ සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් අදාළ පාර්ශවයන් කෙරෙහි ඇති සියළුම ගනුදෙනු ඔවුන්ගේ ස්වභාවය සහ වටිනාකම නොසලකා ආවරණය කෙරෙයි. | |
| 9 (4) | කිසියම් සම්බන්ධිත පාර්ශවයකට "වඩාත් හිතකර ප්‍රතිඵල" ලබා දෙන අයුරින් සිදු කෙරෙන ගනුදෙනු තහනම් වේ. | ✓ |
| | මෙම රීතියෙහි අර්ථ දක්වා ඇති පරිදි සම්බන්ධිත පාර්ශවයන්ට "වඩාත් හිතකර ප්‍රතිඵල" ලබා දෙන අයුරින් සමාගම අදාළ පාර්ශවයන් සමඟ ගනුදෙනු නොකරන බවට වග බලා ගැනීම සඳහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් ක්‍රියා පටිපාටිය සපයයි.<br><br>දැනටමත් ක්‍රියාත්මක අන්තර් ජාලය පාදක වැළැක්වීමේ පද්ධතිය මගින් මෙය තවදුරටත් ශක්තිමත් වන අතර එමගින් සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු අධීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට සහ සමාගමේ ජාලය පුරා පවතින දත්ත ලබා ගැනීමට හැකි වේ. | |

# ආයතනික පාලනය

| රීති යොමුව | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|
| ඌ) | අනාවරණය කිරීම | |
| 10 (1) | **මූල්‍ය ප්‍රකාශන අනාවරණය කිරීම** | ✓ |
| | නියාමන හා අධීක්ෂණ බලධාරීන් විසින් නියම කරන ලද ආකෘතීන් හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2021/22 වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වරින් වර සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලය සහතික විය.<br><br>ඉහත 10 (1) (අ) රීතියේ සඳහන් මූල්‍ය ප්‍රකාශන සංක්ෂිප්ත ස්වරූපයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත් කිරීමට මණ්ඩලය සහතික විය. | |
| 10 (2) | **වාර්ෂික වාර්තාව තුළ සුදුසු හෙළිදරව්වක් සහතික කිරීම සඳහා මණ්ඩලයේ වගකීම** | ✓ |
| අ) | නිශ්චිත අනාවරණය කිරීම් ඇතුළුව අදාළ විගණිත මූල්‍ය ප්‍රකාශන අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කර ඇති බවට ප්‍රකාශයක් | |
| | නිශ්චිත අනාවරණය කිරීම් ද ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මණ්ඩලය විසින් සනාථ කරයි.<br><br>යොමු ව- මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂකගේ වගකීම<br>වැඩි විස්තර සඳහා 205 සිට 207 දක්වා පිටුවල ස්වාධීන විගණක වාර්තාව | |
| ආ) | සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ වාර්තාව | ✓ |
| | මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳව සාධාරණ විශ්වසනීයත්වයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සනාථ කරන අතර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතා අනුව සිදු කර ඇත.<br><br>යොමුව- වැඩි විස්තර සඳහා 166 වන පිටුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය බලන්න. | |
| ඇ) | අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායීතාවය පිළිබඳ බාහිර විගණකගේ සහතිකය | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ බාහිර විගණකවරයාගෙන් සනාථ කිරීමේ වාර්තාව ලබාගෙන ඇත. | |
| ඈ) | සමාගම සමඟ සිදු කරන ගනුදෙනු හා නම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ විස්තර | ✓ |
| | සමාගම සමඟ සිදු කරන ගනුදෙනු හා නම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ විස්තර ප්‍රමාණවත් ලෙස අනාවරණය වී ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පිළිබඳ තොරතුරු 117 සිට 120 දක්වා පිටුවල දක්වා ඇත.<br><br>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 58.2 බලන්න - ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සමඟ සිදු කළ ගනුදෙනු සම්බන්ධයෙන්. | |
| ඉ) | සමස්තයක් ලෙස සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ට ගෙවන ගාස්තු / වේතනය | ✓ |
| | අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන පාරිතෝෂික පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය කර තිබේ.<br><br>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 55.2.1 බලන්න - ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත පාරිතෝෂික. | |
| ඊ) | සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස අදාළ එක් එක් කාණ්ඩයට අනුව අදාළ පාර්ශ්වයන් වෙත ශුද්ධ අනුග්‍රහයන් ගෙවනු ලැබේ. | ✓ |
| | සමාගමේ ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස අදාළ එක් එක් කාණ්ඩයට අනුව අදාළ පාර්ශ්වයන් වෙත ශුද්ධ අනුග්‍රහයන් ගෙවීම පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය වේ.<br><br>මූල්‍ය ප්‍රකාශනවල සටහන 58.3 බලන්න - ප්‍රාග්ධන අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ අනුග්‍රහ ගෙවීම | |
| උ) | ගෙවන ලද පාරිතෝෂිකයන්ගේ සමස්ත වටිනාකම සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු කිරීම. | ✓ |
| | 2021/22 මූල්‍ය වර්ෂය තුළ සමාගම විසින් එහි ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවන ලද සමස්ත පාරිතෝෂිකවල වටිනාකම සහ සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු වල සමස්ත වටිනාකම් පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය කර ඇත. | |

| රීති යොමුව | | මූලධර්ම හා අනුකූලතාව | අනුකූලතාවයේ තත්වය |
|---|---|---|---|
| ඌ) | | අනුකූලතාවය සහතික කිරීම | ✓ |
| | | 2021/22 වර්ෂය තුළ සමාගම පුරෝකථන අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූල වීම පිළිබඳ විස්තර වාර්තාවේ දක්වා ඇත.<br><br>මෙම වාර්තාවේ අනාවරණය වී ඇති ප්‍රමාණයට අමතරව සහ ඉහත සඳහන් කළ සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවට අමතරව 2021/22 කාලය තුළ සමාගමට බලපාන පුරෝකථන අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සඳහා ප්‍රාමාණික අනනුකූලතාවයන් නොමැත.<br><br>වැඩිදුර තොරතුරු සඳහා 156 සිට 161 දක්වා සහ 124 සිට 155 පිටුවල සමාගමෙහි කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තව සහ ආයතනික පාලන වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව බලන්න. | |
| එ) | | අනුකූල නොවන වාර්තා | |
| | | සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතියේ අඩුපාඩුකම් හෝ මූල්‍ය ව්‍යාපාර පනතට අනුකූල නොවීම සහ ඒ පිළිබඳ නීති රීති හා මඟ පෙන්වීම් යටතේ මුදල් මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කිරීම කළ යුතු බවට වන කරුණු සම්බන්ධයෙක් කිසිදු ගැටලුවක් හෝ නොතිබුණි. | |
| ඒ) | | බාහිර විගණකගේ අනුකූලතාවය සහතික කිරීම | ✓ |
| | | මෙම රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුකූල වන මට්ටම පිළිබඳව බාහිර විගණකවරුන් විසින් කරුණු විමර්ශන වාර්තාව නිකුත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද ඔවුන්ගේ වාර්තාවේ ඉදිරිපත් කර ඇති සොයාගැනීම් මගින් ඉහත වාර්තා කළ කරුණු සම්බන්ධයෙන් කිසිදු නොගැලපීමක් හඳුනාගෙන නොමැත. | |
| ඔ) | | සංක්‍රාන්ති ප්‍රතිපාදන | |
| 11 | | සංක්‍රාන්ති සහ වෙනත් විධිවිධාන | ✓ |

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 වන වගන්තියට අනුව ඉදිරිපත් කර ඇත. 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත හා ඒ අනුව නිකුත් කරන ලද උපදෙස්, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (සී.ඒ. ශ්‍රී ලංකා) විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ ප්‍රශස්ත ක්‍රියාකාරකම් සංග්‍රහය සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ නීතිරීති මගින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ද එමගින් සැපයේ.

## 1. පොදු කරුණු

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශ සහ සමූහයේ විගණිත සමෝධානික මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධව වාර්ෂික වාර්තාව කොටස් හිමියන්ට ඉදිරිපත් කිරීමට ලැබීම පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සතුටට කරුණක් වන අතර සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව සකස් වී ඇත. මෙම වාර්තාව 2022 ජූලි 26 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 2. ව්‍යාපාරයේ ස්වභාවය

*(168 (1) (අ) වගන්තිය) - 2007 අංක 07 දරණ සමාගම් පනත*

> ගිණුම්කරණ කාල සීමාව තුළ සමාගමේ සහ එහි පරිපාලිතයන්හි ව්‍යාපාර ස්වභාවය සහ එහි කවර හෝ වෙනසක් සිදු වීම.

### 2.1 දැක්ම, මෙහෙවර සහ ආයතනික චර්යාව

සමාගමේ දැක්ම සහ මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවේ 3 වන පිටුවේ දක්වා ඇත. දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී, සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහයේ දක්වා ඇති පරිදි සියලුම අධ්‍යක්ෂවරුන් සහ සේවකයින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් ප්‍රශස්ත ආචාර ධර්ම ප්‍රමිතීන්ට අනුකූලව සුපිළිපන් බව සහිතව ඉටු කළ යුතු වේ.

### 2.2 ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම්

මූල්‍ය කල්බදු, කාලීන ණය, ඉස්ලාමීය මූල්‍ය, ආන්තික වෙළඳාම, සාධකකරණය, රන් ණය හා ණය සාධනපත්‍ර නිකුත් කිරීම සහ රාජ්‍ය තැන්පතු උපයෝජන ආදිය සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු අතරට ඇතුළත් වේ. 2022 මාර්තු 31 දින වන විට සමාගම සතුව උප සමාගම් හයක් තිබූ අතර මෙම උප සමාගම්වල ව්‍යාපාර කටයුතුවල ස්වභාවය 3 සිට 9 දක්වා පිටුවල 'අප පිළිබඳව' කොටසේ සහ 215 වන පිටුවේ 'ගිණුම්කරණ ප්‍රමිතීන්' කොටසේ විස්තරාත්මක වශයෙන් දක්වා ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කිසියම් නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක සමාගම සහ එහි පරිපාලිත සමාගම් කිසිදු ආකාරයකින් නිරත වී නොමැත.

### 2.3 සමූහ ව්‍යුහයේ වෙනස්කම්

සලකා බලනු ලබන මූල්‍ය වර්ෂය තුළ සමූහ ව්‍යුහයේ කිසිදු වෙනසක් සිදුවී නොමැත.

### 2.4 ශාඛා ජාලය

2022 මාර්තු 31 වන විට සමාගමේ සමස්ත ශාඛා ජාලය අංගසම්පූර්ණ ශාඛා 111 කින් සහ කවුළු කාර්යාල 62 කින් සමන්විත විය.

### 2.5 මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය

2021/22 වර්ෂය තුළ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳ සමස්ත තක්සේරුවක්, මූල්‍ය ප්‍රතිඵල සහ විශේෂ සිදුවීම් පිළිබඳ අදහස් දැක්වීම් 14 සිට 17 දක්වා පිටුවල සභාපතිවරයාගේ පණිවුඩයේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ පණිවුඩය පිටු අංක 18 සිට 22 දක්වා පිටු වල සහ මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 44 සිට 113 දක්වා කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණයෙහි ඇතුළත් වේ. මෙම වාර්තා සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ වැදගත් කොටසක් පිළිබිඹු කරයි. සමූහ ආදායම, ප්‍රතිඵල, වත්කම් සහ වගකීම් සඳහා අංශ අනුව දායකත්වය මෙම වාර්ෂික වාර්තාවේ 306 සිට 307 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 53 හි දක්වා ඇත.

### 2.6 අනාගත දැක්ම

ගෝලීය ශ්‍රී ලංකා වෙළෙඳපොළෙහි ඇති අභියෝග, අවස්ථාවන් සහ වර්ධනයන් මත පදනම් වූ සමාගමේ දැක්ම 40 සිට 41 දක්වා පිටු වල 'ක්‍රමෝපාය' කොටසෙහි සහ මෙම වාර්ෂික වාර්තාවේ එක් එක් ප්‍රාග්ධන වාර්තාව අවසානයේ දක්වා ඇත.

## 3. මූල්‍ය ප්‍රකාශ

*(168 (1) (ආ) සහ (2) වගන්තිය)*

> ගිණුම්කරණ කාලසීමාව සඳහා සමාගම සහ සමූහය වෙනුවෙන් සම්පාදනය කරන ලද සහ අත්සන් කරන ලද මූල්‍ය ප්‍රකාශ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ මෙම වාර්ෂික වාර්තාවේ 198 සිට 339 දක්වා පිටුවල සඳහන් වන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂවරයකුගේ අනුමැතිය ඇතිව ප්‍රධාන මූල්‍ය කළමනාකරු සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් නිසි පරිදි සහතික කිරීම මත සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත

### 3.1 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1), 151,152 සහ 153 (1) සහ (2) වගන්ති ප්‍රකාරව, සමූහයේ සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමූහය වගකිව යුතුය. මේ අනුව, ලාභ හෝ අලාභ ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ආදිය 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත, 2007 අංක 07 දරණ සමාගම් පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත සහ ඒ අනුව නිකුත් කරන ලද උපදෙස් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ ප්‍රශස්ත පිළිවෙත් සංග්‍රහයට අනුව සකස් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කෙරේ.

'අධ්‍යක්ෂවරුන්ගේ මූල්‍ය වාර්තාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය' පිටු අංක 200 සිට 201 වන පිටුවේ දක්වා ඇති අතර එය මෙම වාර්තාවේ අනිවාර්ය අංගයකි.

### 3.2 මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනය

**පොලී ආදායම**

2022 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ සමස්ත පොලී ආදායම පිළිවෙළින් රුපියල් මිලියන 23,881.53 ක් (2020/21 දී රුපියල් මිලියන 24,983.45) සහ රුපියල් මිලියන 25,926.79 ක් (2020/21 දී රුපියල් මිලියන 26,821.84 ක්) විය. පොලී ආදායම පිළිබඳ වඩාත් විස්තරාත්මක විශ්ලේෂණයක් 225 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් 6.1 සහ 6.1.1 හි දක්වා ඇත.

**කාර්ය සාධනය සහ විසර්ජනය**

2021/22 මූල්‍ය වර්ෂය සඳහා සමාගම සහ සමූහය පිළිවෙළින් රුපියල් මිලියන 4,659.17 ක් සහ රුපියල් මිලියන 4,818.17 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත (2019/20 දී රුපියල් මිලියන 4,033.02 සහ රුපියල් මිලියන 5,596.33). මෙය පෙර වසරට සාපේක්ෂව සමාගමේ සහ සමූහයේ ශුද්ධ ලාභය 15.52% කින් ඉහළයාමක් සහ සමූහයේ ශුද්ධ ලාභය 13.90% කින් පහළයාමකි.

සමාගමේ කාර්යසාධනය සහ ලාභ විසර්ජනය පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි ලැයිස්තුගත කර ඇත.

| සමාගම | 2021/22 රු.මි. | 2020/21 රු.මි. |
|---|---|---|
| ආදායම් බදු වලට පෙර ලාභය | 6,650.09 | 5,872.59 |
| ආදායම් බදු වියදම | 1,991.08 | (1,839.57) |
| වර්ෂය සඳහා ලාභය | 4,659.01 | 4,033.02 |
| පෙර වර්ෂය තුළින් ලාභය ඉදිරියට ගෙන ආ අලාභය | 17,159.78 | 14,227.99 |
| විසර්ජනය සඳහා ඇති ලාභය | 21,818.79 | 18,261.01 |
| **විසර්ජනයන්** | | |
| පෙර/වර්තමාන වසර සඳහා ගෙවන ලද ලාභාංශ | (2,179.93) | (976.62) |
| වෙනත් විස්තීර්ණ ආදායම | 25.70 | 77.04 |
| සංචිත වලට මාරු කිරීම | (182.95) | (201.65) |
| සම්පූර්ණ විසර්ජනය | (2,337.17) | (1,101.23) |
| අවිසර්ජන ලාභය ඉදිරියට ගෙන යෑම | 19,481.61 | 17,159.78 |

GRI | 207-1, 207-2, 207-4

**බදුකරණ ප්‍රතිපාදන**

වර්ෂය තුළ උපයන ලද ලාභ මත අදාළ වන ආදායම් බදු අනුපාතය 24% කි. මූල්‍ය සේවාවන් මත එකතු කල අගය මත බදු අනුපාතය 2021/22 අවසාන මාස තුනේදී 18% දක්වා ඉහළ නැංවුනු අතර 15% අනුපාතය වර්තමාන වසරේ මුල් මාස නවයක කාලසීමාව සඳහා බලපැවැත්විනි.

ඒ අනුව, සමාගමේ වර්තමාන වසරේ ආදායම් බදු වියදම රුපියල් මිලියන 1991.08 ක් වන අතර ආදායම් බදු වියදම සහ සමාගමේ සහ සමූහයේ විලම්බිත බදු වත්කම්/වගකීම් පිළිබඳ සවිස්තරාත්මක සටහනක් පිළිවෙලින් 17 සහ 44 යන සටහන් මගින් මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කෙරේ.

**දේපළ, පිරියත සහ උපකරණ, භාවිත හිමිකම් ඇති වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම්**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා (නොනිමි කාර්ය ප්‍රාග්ධනයද ඇතුලුව) දැරූ මුළු ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රුපියල් මිලියන 535.42 ක් සහ රුපියල් මිලියන 457.16 ක් වේ. (2020/21 දී රුපියල් මිලියන 104.69 සහ රුපියල් මිලියන 152.32).

2022 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය තුළ, සමාගමේ සහ සමූහයේ භාවිත හිමිකම් ඇති වත්කම් සඳහා වූ මුළු එකතු කිරීම් පිළිවෙලින් රුපියල් මිලියන 239.44 ක් සහ රුපියල් මිලියන 238.11 ක් විය. (2020/21 දී සමාගම සහ සමූහය සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 858.51 ක් සහ 239.05).

2022 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය තුළ සමාගම සහ සමූහය අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 10.32 ක් සහ රුපියල් මිලියන 12.84 ක් ආයෝජනය කලේය. (2020/21 දී සමාගම සහ සමූහය විසින් අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 0.36 ක් සහ රුපියල් මිලියන 11.66 ක් ආයෝජනය කරන ලදී).

279 වන පිටුවේ සටහන 32.4 හි දක්වා ඇති පරිදි පොත් අගයන්හි පැහැදිලි වෙනසක් පැවතිය ද සමාගමේ හෝ එහි පරිපාලිත සමාගම්වල ස්ථාවර වත්කම් සහ ඉඩම්වල වෙළඳපල වටිනාකමෙහි සැලකිය යුතු ලෙස වෙනසක් වී නොමැති බව අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ, භාවිතා හිමිකම් ඇති වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර 32, 33 සහ 34 යන සටහන් ඔස්සේ මූල්‍ය ප්‍රකාශනයන්හි 275 සිට 283 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇත.

**සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි**

2022 මාර්තු 31 වන විට සමාගම සහ සමූහයට අයත් සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල විශාලත්වයන්, ස්ථාන, වටිනාකම් තක්සේරු කිරීම් සහ ඇති ගොඩනැගිලි සංඛ්‍යාව වාර්ෂික වාර්තාවේ 279 වන පිටුවේ සටහන 32.4 හි දක්වා ඇති අතර, ඒවායේ ශුද්ධ පොත් වටිනාකම් ද විස්තර කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති පරිදි මෙම අගයන් පිළිවෙලින් රුපියල් මිලියන 519.84 ක් සහ රුපියල් මිලියන 3,241.57 ක් විය.

'නිශ්චල දේපල තක්සේරු කිරීම' සහ අනුශාංගික සංශෝධන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 04 දරණ නියෝග මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි සමාගම සිය සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි නැවත ඇගයීම සඳහා ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදා ගනී.

'නිශ්චල දේපල තක්සේරු කිරීම' සහ අනුශාංගික සංශෝධන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 04 දරණ උපදෙස් මගින් ලබා දී ඇති ප්‍රතිපාදන අනුව ඕනෑම දේපළක් සම්බන්ධයෙන් නැවත ඇගයීම ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් විසින් තක්සේරු කරනු ලැබේ.

නිශ්චල දේපලවල තක්සේරු කළ සාධාරණ අගය ශ්‍රී ලංකා මහ බැංකු විසින් නිකුත් කරන ලද 2006 අංක 03 දරණ නියෝගයට හා ඊට අනුශාංගික සංශෝධන අනුව බොල් ණය හා අවිනිශ්චිත ණය මත පදනම් ව පවතින්නේ නම් නියාමන ප්‍රතිපාදන මැනීම සඳහා සලකා බලනු නොලැබේ.

**ආයෝජන**

සමාගම සතු ආයෝජන පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 248 සිට 251 දක්වා සහ 268 සිට 272 දක්වා පිටුවල දක්වා ඇති 22, 23, 24, 27, 28 සහ 29 යන සටහන් මගින් අනාවරණය කෙරේ.

**ස්කන්ධ**

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමේ සහ සමූහයේ ස්ථාවර ප්‍රාග්ධනය 2022 මාර්තු 31 වන විට රුපියල් මිලියන 17,071.96 ක් වූ අතර 2021 මාර්තු 31 වන විට එය රුපියල් මිලියන 14,892.04 ක් විය. 2020/21 මූල්‍ය වර්ෂය සඳහා කොටස්කර ලාභාංශ මගින් ගෙවන අවසන් ලාභාංශයේ ප්‍රතිපලයක් ලෙස ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 2,179.93 කින් වැඩි විය.

**සංචිත**

2022 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ මුළු සංචිත ප්‍රමාණය පිළිවෙලින් රුපියල් මිලියන 21,746.35 ක් සහ රුපියල් මිලියන 26,749.31 ක් විය. සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ රුපියල් මිලියන 182.95 ක් රඳවාගත් ඉපැයීම් වලින් ව්‍යවස්ථාපිත සංචිත වෙත මාරු කරන ලදී. සංචිත සංචලනය පිළිබඳ තොරතුරු 212 සිට 213 දක්වා පිටුවල ඇති 'ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශයේ' සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් 46 සිට 48 දක්වා සඳහන් ඇත.

**නිකුත් කරන ලද ණය සුරැකුම්පත්**

නිකුත් කරන ලද ණය සුරැකුම්පත් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන 37 හි දක්වා ඇති අතර සමාගමේ ණයකර පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විශ්ලේෂණයක් සටහන 37.2 හි දක්වා ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

**ප්‍රාග්ධන ප්‍රමාණවත්තාව**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්තාව පිළිබඳ 2018 අංක 03 දරණ මුල්‍ය ව්‍යාපාර පනතේ උපදෙස් අනුව සිදු කළ ගණනය අනුව ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය සහ සමාගමේ මුළු ප්‍රාග්ධන අනුපාතය 2022 මාර්තු 31 වන විට පිළිවෙලින් 18.76% සහ 19.67% ක් විය. අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවන් පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 300 වන පිටුවේ දක්වා ඇත.

## 4. බාහිර විගණකවරුන්

*(168 (1) (ජ) (ස) සහ (ව) වගන්තිය)*

ඉහත අංශ මඟින් සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණක වාර්තාව නිර්වචනය කෙරෙන අතර සමාගම සහ එහි උප සමාගම් විසින් විගණන නිලධාරීන්ට ගෙවිය යුත ගාස්තු සහ ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද වෙනත් සේවාවන් සඳහා වූ ගාස්තු මෙන් ම සමාගම සහ එහි උප සමාගම් සමග විගණකවරුන්ගේ සම්බන්ධතාවය හෝ වෙනත් බැඳියාවන් පිළිබඳ දැක්වේ.

### 4.1 විගණකවරුන් සහ ඔවුන්ගේ ස්වාධීනත්වය

2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූලව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී 'විගණනය ලබන ආයතනය' යන අර්ථ දැක්වීම යටතට ගැනෙන අතර විගණකාධිපති හෝ විගණකාධිපති විසින් බලය පවරන ලද ඕනෑම අයෙකු සමාගමේ විගණනය සහ ඔවුන්ගේ වගකීම් විසින් විගණනය කිරීම මූල්‍ය ප්‍රකාශනවලට 205 සිට 207 දක්වා පිටුවල දක්වා ඇති ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇති ආකාරයට සිදු වේ.

### 4.2 විගණක වාර්තාව

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ වාර්තාව 205 සිට 207 දක්වා පිටුවල දක්වා ඇත.

### 4.3 විගණකවරුන්ගේ පාරිශ්‍රමික

විගණන හා අදාළ සේවාවන් සඳහා මෙන්ම බදු සම්බන්ධ සේවා ඇතුළු විගණන නොවන සේවාවන් සඳහා සමාගම සහ කණ්ඩායම විසින් විගණකවරුන්ට පහත සඳහන් ආකාරයට මුදල් ගෙවන ලදී.

| ගාස්තු | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22 රු. මිලියන | 2020/21 රු. මිලියන | 2021/22 රු. මිලියන | 2020/21 රු. මිලියන |
| විගණන සහ ආශ්‍රිත සේවා | 7.38 | 7.38 | 14.44 | 13.32 |
| විගණන නොවන සේවා | 1.32 | 1.89 | 1.32 | 2.22 |

### 4.4 විගණකවරුන් පත් කිරීම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 55 වන වගන්තියට අනුව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී 'විගණන ලබන ආයතනය' ලෙසින් අර්ථ දැක්වීම යටතට ගැනෙන අතර විගණකාධිපති හෝ විගණකාධිපති විසින් බලය පවරන ලද ඕනෑම අයෙකු ඊළඟ මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණනය සිදු කළ යුතුය.

## 5. වර්ෂයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම් (168 (1) (ඈ) වගන්තිය

ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් පමණ ඉක්මවා යෑම සහ අවුල් සහගත වීම අවම කිරීම සඳහා විකල්ප ආකෘතියක් භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -LKAS 1 හි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 (1) (ඈ) වගන්තියට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 215 සිට 339 දක්වා පිටුවල දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකිය යුතු වෙනස්කම් පිටු අංක 219 හි සටහන 3.4 හි දක්වා ඇත.

## 6. අධ්‍යක්ෂ මණ්ඩලය

*(168 වගන්තිය (1) (ඉ), (ඊ), (උ))*

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ හා එහි අවසානය වන විට සමාගමේ සහ එහි උප සමාගම්වලට අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද පාරිතෝෂික සහ වෙනත් ප්‍රතිලාභ සමග ගිණුම්කරණ කාල සීමාව තුළ සමාගමේ සහ එහි උප සමාගම්වල ලැදියාවන් පිළිබඳ ලේඛනයේ ඇතුළත් කිරීම් ඉහත වගන්තිය මගින් අර්ථ නිරූපණය වන අතර සමාගමේ සහ උප සමාගම්වල අධ්‍යක්ෂ කාර්යාලයේ තොරතුරු ද ඇතුළත් වේ.

### 6.1 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් සහ කුසලතා සහ පළපුරුද්ද ඇතුළු ඔවුන් පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 117 සිට120 දක්වා පිටුවල ඉදිරිපත් කොට ඇත.

### 6.2 අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සාධනය ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය තක්සේරු කිරීමට භාවිතා කරන ක්‍රමවේදය 135 වන පිටුවේ 'ආයතනික පාලනය' කොටසේ ඉදිරිපත් කෙරේ.

### 6.3 වෙනත් අධ්‍යක්ෂකවරුන් / අධ්‍යක්ෂවරුන්ගේ විශේෂිත තනතුරු

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂවරුන්ගේ අනෙකුත් අධ්‍යක්ෂකවරුන්ගේ / සැලකිය යුතු තනතුරු පිළිබඳ තොරතුරු 117 සිට 120 දක්වා පිටුවල දක්වා ඇත.

### 6.4 ඉල්ලා අස්වීම් සහ පත්වීම්

සුදර්ශන් අහංගම මහතා 2021 අගෝස්තු 24 දින සිට බලපැවැත්වෙන පරිදි විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස් වූ අතර 2021 ජූලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගම් ලේකම් තනතුරට ෂාලිනි සිල්වා මහත්මිය පත් කරන ලදී. මයිකල් ප්‍රදීප් අමිර්තනායගම් මහතා 2022 ජූලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරන ලදී.

### 6.5 අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සහ සමූහය විසින් ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු හා දීමනා පිළිවෙලින් රුපියල් මිලියන 4.94 ක් සහ රුපියල් මිලියන 11.77 ක් විය. මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 55.2.1 හි සංසන්දනාත්මක සංඛ්‍යාවන් දක්වා ඇත.

### 6.6 බැඳියාවන් ලේඛනය/ අධ්‍යක්ෂවරුන්ගේ ගනුදෙනු පිළිබඳ බැඳියාවන්

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සමාගම විසින් බැඳියාවන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර එය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 192 (2) වගන්තිය ප්‍රකාරව සමාග මේ අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ ගනුදෙනු පිළිබඳ ඔවුන්ගේ සාමාන්‍ය ප්‍රකාශයන් කර ඇත. එහි අනාවරණය වූ ගනුදෙනු පිළිබඳ විස්තර අදාළ පාර්ශ්වයන්ගේ ගනුදෙනු යටතේ 275 සිට 276 දක්වා පිටුවල දක්වා ඇත. තවද, මූල්‍ය සමාගම් (ආයතනික පාලනය) උපදෙස් 2008 අංක 03 දරණ නියෝග අනුව සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් තමන් මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් ද්‍රව්‍යමය සම්බන්ධතාවක් හෝ සම්බන්ධතා ව්‍යාපාරය සමගින් පවත්වා ගෙන නොයන බවට පොදු ප්‍රකාශනයක් සිදු කර තිබේ.

### 6.7 කොටස් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

2007 අංක 07 දරණ සමාගම් පනතේ 200 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරුන් විසින් සමාග මේ කොටස් හිමිකාරිත්වය සහ ඒවා අත්පත් කර ගැනීම් හෝ බැහැර කිරීම් පිළිබඳව අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගල කොටස් හිමිකම සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ පුද්ගල කොටස් හිමිකම මෙම වාර්ෂික වාර්තාවේ 73 පිටුවෙහි 'ආයෝජකයින් සඳහා වටිනාකම් ' යන කොටසේ අනාවරණය කර ඇත.

### 6.8 රැස්වීම්

මණ්ඩල රැස්වීම් සහ මණ්ඩල අනුකමිටු රැස්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 132 සිට 134 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.

### 7. තොරතුරු බෙදා හැරීම

මෙම වාර්ෂික වාර්තාවේ 68 සිට 74 දක්වා පිටුවල 'ආයෝජකයින් සඳහා වටිනාකම් ' යන මාතෘකාව යටතේ කොටස් හිමියන් සම්බන්ධයෙන් සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් සහ අනෙකුත් කොටස් ආශ්‍රිත තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

### 7.1 කොටස් හිමියන්ට සාධාරණ ලෙස සැලකීම

සියළුම කොටස් හිමියන්ට සමාන ආකාරයෙන් සලකන බවට සමාගම සෑම විටම සහතික කර ඇත.

### 7.2 සාමාන්‍ය කොටස් මත ලාභාංශ

2021/22 මූල්‍ය වර්ෂය සඳහා සමාගම විසින් අතුරු ලාභාංශයක් ලෙස 2021 දෙසැම්බර් 21 දින කොටස්කර ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අදාළව, සමාගමේ සාමාන්‍ය ඡන්ද බලය හිමි කොටස් 84,249,776 ක් කොටස්කර ලාභාංශ 1: 21.4000002326 අනුපාතයට 2022 ජනවාරි 13 දින සිට බලපැවැත්වෙන පරිදි ලැයිස්තුගත කර ඇත.

2022 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා එක් කොටසකට රුපියල් 0.50 ක අවසාන ලාභාංශයක් අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශ කරන ලදී. මෙය ගෙවනු ලබන්නේ කොටස්කර ලාභාංශයක් ලෙසයි. තවද, සමාගමේ ව්‍යවස්ථාවලට අනුකූලව, මෙම ලාභාංශ මීළගට පැවැත්වීමට නියමිත වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් අනුමත කළ යුතුය.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 56 (3) වගන්තිය සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව එම අන්තර්වාර ලාභාංශය මෙන්ම 56 (2) වගන්තියට අනුව යෝජිත අවසාන ලාභාංශයෙන් සහ ඉහත කී අන්තර්වාර ලාභාංශයෙන් පසු නුබුන්වත්කම පරීක්ෂාවේ අවශ්‍ය කොන්දේසි සපුරා ගැනීමට සමාගම කටයුතු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු අතර ඉහත ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලව ලාභාංශ ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විගණකාධිපතිවරයාගෙන් නුබුන්වත්කම් පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් සහතිකයක් ලබා ගෙන තිබිය යුතු ය.

### 8. පරිත්‍යාග

*(168 (1) (උ) වගන්තිය)*

> ගිණුම්කරණ කාලය තුළ සමාගම විසින් කරන ලද මුළු පරිත්‍යාග ප්‍රමාණය.

පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවට අනුව 2021/22 මූල්‍ය වර්ෂය තුළදී සමාගම විසින් රුපියල් මිලියන 29.40 ක් (2020/21 දී රුපියල් මිලියන 20.37 ක්) පරිත්‍යාග වශයෙන් ලබා දෙන ලදී. සමාගමේ ආයතනික සමාජ වගකීම් දෙපාර්තමේන්තුව ආයතනික සමාජ වගකීම් (CSR) මූලපිරීම් සහ ක්‍රියාකාරකම් හසුරුවයි. සමාගමේ ආයතනික සමාජ වගකීම් මූලාරම්භයන් පිළිවෙලින් 'සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය' අංශයේ 96 සිට 106 දක්වා පිටුවල සහ 'ස්වාභාවික ප්‍රාග්ධනය' යන අංශයේ පිටු 96 සිට 105 දක්වා ඉදිරිපත් කොට ඇත.

### 9. ආයතනික පාලනය

*(මනා පරිචයන් පිළිබඳ කේතය ඇ.6, ඇ.6.1, ඇ.2, ඇ.1.4)*

සමාගමේ ආයතනික පාලන මූලධර්ම දියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී කටයුතු කරන අතර සමාගම, කළමනාකරුවන්, කොටස් හිමියන් සහ අනෙකුත් පාර්ශවකරුවන් වැනි සමාග මේ විවිධ සහභාගීවන්නන් පාලනය කරන ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් ඇතුළුව ආයතනික පාලන ප්‍රඥප්තියක් සම්මත කරගෙන ඇත. ආයතනික පාලනයේ ඉහළම මූලධර්ම සංවිධානය පුරා පවත්වාගෙන යනු ලැබේ.

ඉහත ආයතනික පාලන ප්‍රඥප්තිය සම්මත කර ගැනීමේදී, CA Sri Lanka විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ නිර්දේශයන්, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති සහ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) උපදෙස් 2008 අංක 03, 2008 අංක 4 සහ 2013 අංක 6 යන කරුණු වලට අනුකූලව කටයුතු කරන බව මණ්ඩලය සහතික කර තිබේ.

**ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පිළිබඳ සභාපතිවරයාගේ සහතිකත්වය**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී විසින් ව්‍යාපාරික චර්යා ධර්ම හා ආචාරධර්ම සමාගම පුරා පුළුල්ව හඳුන්වා දී ඇති බවත් ව්‍යාපාරික චර්යා ධර්ම විසර්ජනය කිරීම, අධීක්ෂණය කිරීම හා අනුකූල වීම සඳහා ක්‍රියා පටිපාටියක් සකස් කර ඇති බවට ද සභාපතිවරයා තහවුරු කරයි.

**අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයන්:**

1. නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන කිසිදු ක්‍රියාකාරකමක සමාගම නිරත වී නොමැත.
2. කොටස් හිමියන්ට සාධාරණ ලෙස සැලකීම සහතික කිරීම සඳහා සමාගම සියලු උත්සාහයන් ගෙන ඇත.
3. ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවතී.
4. අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය කාර්යක්ෂමව හා සාර්ථකව පිළිපැදීම සඳහා සමාගම ක්‍රියාමාර්ග ගනී. මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ 124 සිට 155 දක්වා පිටුවල ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.
5. අධ්‍යක්ෂවරුන්ගේ දැනුමට අනුව, සමාග මේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය වී නොමැත.

**ව්‍යාපාර චර්යාධර්ම හා ආචාර ධර්ම පද්ධතියට අනුකූල වීම පිළිබඳ ප්‍රධාන කළමනාකරණ පිරිස්හි ප්‍රකාශය**

ඔවුන්ගේ දැනුමට අනුව, සමාගමේ ව්‍යාපාරික චර්යාධර්ම හා ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය වී නොමැත.

### 9.1 අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව හා නාමයෝජනා කමිටුව සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සමාලෝචන කමිටුව යන කමිටු අවශ්‍ය අනුරූප සුදුසුකම් හා පළපුරුද්ද ඇති අධ්‍යක්ෂවරුන් ඇතුළත් ව අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වශයෙන් කටයුතු කරයි. මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇති අදාළ කමිටු වාර්තාවල එකී කමිටුවල සංයුතිය දක්වා ඇත.

# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

### 9.2 නීති හා රෙගුලාසි වලට අනුකූල වීම
අධ්‍යක්ෂවරුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, සමාගම සහ කණ්ඩායම කිසිදු ආකාරයකින් නීති හා රෙගුලාසිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

### 9.3 ව්‍යවස්ථාපිත ගෙවීම්
රජය, අනෙකුත් නියාමන ආයතන සහ සේවකයින් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසයේ උපරිමයෙන් තහවුරු කර ඇත.

### 9.4 පාරිසරික ආරක්ෂාව
අධ්‍යක්ෂවරුන් තහවුරු කරන්නේ තම දැනුමේ පමනට සමාගම සහ සමූහය පරිසරයට අහිතකර කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නැති බවයි.

### 9.5 ESG වාර්තා කිරීම
පාරිසරික, සමාජීය හා පාලන කරුණු ඔස්සේ සමාගමකට තම ව්‍යාපාරික උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට සහ වටිනාකමක් ඇති කර ගත හැකිය. සමාගමේ වාර්ෂික වාර්තාවේ ESG (පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන) අවදානම් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු අඩංගු විය යුතු අතර 138 වන පිටුවේ දක්වා ඇති පරිදි අවස්ථාවන් හඳුනාගෙන, කළමනාකරණය කර, මැන බලා වාර්තා කරනු ලැබේ.

### 10. පිළිගැනීම
*(168 (1) (ඔ) වගන්තිය)*

මෙම වාර්තාවේ අඩංගු කරුණු/අත්සන් අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු සහ සමාගමේ ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් හඳුනාගැනීම සිදු කරයි.

160 වන පිටුවේ සඳහන් කර ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම සිදු කර ඇත.

### 11. පාර්ශවකරුවන් කළමනාකරණය සහ සමෝධානික වාර්තාකරණය
පාරිභෝගිකයින්, සේවකයින්, ආයෝජකයින්, සැපයුම්කරුවන් සහ ප්‍රජාව ඇතුළු සිය වටිනා පාර්ශ්වකරුවන් කළමනාකරණය කිරීම සඳහා සමාගම සිය වටිනාකම් උත්පාදන ක්‍රියාවලිය තුළ පියවර ගෙන ඇත. වාර්තාකරණ ක්‍රියාවලියේදී ආර්ථික, පරිසර සහ සමාජ බලපෑම් පිළිබඳ අංශ ද ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර ඇත. මෙම ප්‍රාග්ධන කළමනාකරණ වාර්තා වාර්ෂික වාර්තාවේ 44 සිට 113 දක්වා පිටුවල කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය යටතේ ඉදිරිපත් කෙරේ.

### 12. අවසන් වී නොමැති අධිකරණ කටයුතු
සමාගමේ නීතීඥවරුන් සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂවරුන් විසින් එළැඹී ඇති මතයට අනුව, සමාගමට එරෙහිව දැනට පවතින අධිකරණ කටයුතු මගින් වාර්තා කර ඇති මූල්‍ය ප්‍රතිඵල හෝ සමාගමේ අනාගත කටයුතු කෙරෙහි කිසිදු බලපෑමක් සිදු නොවේ. සමාගමට එරෙහිව පවතින නඩු පිළිබඳ විස්තර 50.1.1. සටහනෙහි 303 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

### 13. මානව සම්පත්
සමාගම විසින් ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ ආගම කුමක් වුවත් පුද්ගලයින්ට ගෞරව කරන සහ රැකියා අවස්ථා සුරක්ෂිත කරන පරම වශයෙන් වෙනස් කොට සැලකීමකින් තොර වූ රැකියා ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත.

2022 මාර්තු 31 වන විට සමාගම සමඟ පුද්ගලයින් 2,245 ක් (2021 මාර්තු 31 වන විට පුද්ගලයින් 2,343 ක්) රැකියා වල නියුක්ත වූහ.

### 14. අන්තර්ජාලය භාවිතය සම්බන්ධ කටයුතු සහ සයිබර් ආරක්ෂණය
*(මනා පරිචයන් පිළිබඳ කේතය උ.1, උ.2, උ.3)*

සයිබර් අවදානම් කළමනාකරණය පිළිබඳ කටයුතු සඳහා සමාගම ප්‍රමාණවත් පළපුරුද්දක් සහ බලයක් සහිතව තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (අයිඑස්ඕ) පත් කර ඇති අතර ඒ සඳහා මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයේ නිතිපතා හා ප්‍රමාණවත් කාලයක් වෙන් කර ඇති බව මණ්ඩලය තහවුරු කරයි. අදාළ තොරතුරු 121 වන පිටුවේ ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.

### 15. වාර්තා කිරීමේ කාලයෙන් පසු සිදුවීම්
වාර්තා කිරීමේ කාලයෙන් පසු සිදුවීම් පිළිබඳ විස්තර සටහන 58 යටතේ 339 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට හෙළිදරව් කර ඇත.

### 16. ලැයිස්තුගත කිරීමේ නීති වල 7.6 වගන්තියෙහි දැක්වෙන වාර්ෂික වාර්තාවේ අඩංගු කරුණු වලට අනුකූල වීම.

| නීති යොමුව | හෙළිදරව් කිරීමට අවශ්‍ය තොරතුරු | අනුකූලතාවයේ තත්වය | යොමු පිටුව |
|---|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් වූ අයගේ නම් | ✓ | 117 - 120 |
| 7.6 (ii) | වර්ෂය තුළ සමාගමේ සහ එහි පරිපාලිතයන්හි ප්‍රධාන කටයුතු | ✓ | 4, 215 |
| 7.6 (iii) | වර්ෂය අවසානයේ විශාලතම කොටස් හිමියන් 20 දෙනා පිළිබඳ තොරතුරු | ✓ | 72 |
| 7.6 (iv) | මහජන රඳවා ගැනීමේ ප්‍රතිශතය | ✓ | 69 |
| 7.6 (v) | අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් දරන කොටස් ගණන | ✓ | 73 |
| 7.6 (vi) | අපේක්ෂිත ප්‍රාමාණික අවදානම් සාධක වලට අදාළ තොරතුරු | ✓ | 176 - 195 |
| 7.6 (vii) | සේවකයින්ට හා කාර්මික සබඳතාවලට අදාළ ප්‍රාමාණික ගැටළු පිළිබඳ විස්තර | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සේවකයින් හා කාර්මික සම්බන්ධතාවලට අදාළ ප්‍රාමාණික ගැටළු නොමැතග | |
| 7.6 (viii) | වර්ෂය අවසානයේදී ගොඩනැගිලි/ඉඩම් සහ ආයෝජන දේපල පිළිබඳ තොරතුරු | ✓ | 279 - 280 |

| නීති යොමුව | හෙළිදරව් කිරීමට අවශ්‍ය තොරතුරු | අනුකූලතාවයේ තත්වය | යොමු පිටුව |
|---|---|---|---|
| 7.6 (ix) | වර්ෂය අවසානයේදී ප්‍රකාශිත ප්‍රාග්ධනය නියෝජනය කරන කොටස් ගණන | ✓ | 70 |
| 7.6 (x) | එක් එක් පන්තියේ කොටස් සුරැකුම්පත් වල හිමියන්ගේ සංඛ්‍යාව හා අදාළ තොරතුරු බෙදාහැරීම | ✓ | 71 |
| 7.6 (xi) | කොටස්, ණය, ණය ශ්‍රේණිගත කිරීම්වල වෙනස්වීම් පිළිබඳ අනුපාත සහ වෙළඳපල මිල තොරතුරු | ✓ | 69, 71, 72, 73, 74 |
| 7.6 (xii) | සමාගමේ හෝ උප සමාගම්වල ස්ථාවර වත්කම්වල සැලකිය යුතු වෙනස්කම් | ✓ | 276-277 |
| 7.6 (xiii) | වර්ෂය තුළ මහජන නිකුතුවක්, හිමිකම් නිකුතුවක් සහ පෞද්ගලික ස්ථාපනයක් කිරීමක් හරහා රැස් කරන ලද අරමුදල් පිළිබඳ විස්තර | වර්ෂය තුළ මහජන නිකුතුවක්, හිමිකම් නිකුතුවක් හෝ පෞද්ගලික ස්ථාපනයක් කිරීමක් හරහා අපි අරමුදල් රැස් කළේ නැත. | |
| 7.6 (xiv) | සේවක කොටස් හිමිකාරිත්වය හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රම සම්බන්ධව තොරතුරු | මේ වන විට සමාගමට කිසිදු සේවක කොටස් හිමිකමක් හෝ කොටස් විකල්ප යෝජනා ක්‍රමයක් නොමැත | |
| 7.6 (xv) | රීති 7.10.0, 7.10.5 ඇ සහ ලැයිස්තුගත කිරීමේ රීති වල 7 වන වගන්තියේ 7.10.6 ඇ ප්‍රකාරව ආයතනික පාලන භාවිතයන්ට අදාළ අනාවරණය. | ✓ | 139-140 |
| 7.6 (xvi) | සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනුව කොටස් වලින් 10% හෝ ආයතනයේ මුළු වත්කම් වලින් 5% ඉක්මවීම. | ✓ | 308-314 |

## 17. සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු

*(කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති 9 වන කොටස)*

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතිවල 9 වන වගන්තියේ අදාළ පාර්ශවයන්ගේ ගනුදෙනු පිළිබඳ නීති රීතිවලට අනුකූල බවට අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි.

## 18. අඛණ්ඩ පැවැත්ම

*(මනා පරිචයන් පිළිබඳ කේතය ඇ1.4)*

සමූහයේ කළමනාකරණය අඛණ්ඩව කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අනාගතයේ දී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට එයට සම්පත් ඇති බවට සෑහීමකට පත් වේ. තවද, අඛණ්ඩව කටයුතු කරගෙන යාමට සමූහයට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් ගැන කළමනාකරණය හඳුනා ගෙන නොමැත. එම නිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යෑම පිළිබඳ කරුණුව සැලකිල්ලට ගනිමින් කටයුතු කෙරී ඇත.

2022 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම නිර්ණය කිරීමේ දී, ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව, සමාගම් සමූහය සඳහා කොවිඩ් -19 මගින් ඇති විය හැකි අපේක්ෂිත බලපෑම් සහ අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ පදනම භාවිතයේ යෝග්‍යතාවය කළමනාකරණය විසින් තක්සේරු කර ඇත.

අපේක්ෂිත ආදායම, පිරිවැය කළමනාකරණය, ලාභදායිතාවය, අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් කල් දැමීමට ඇති හැකියාව, භාවිතයට නොගත් ණය සහ අඛණ්ඩව සේවාව සැපයීමේ හැකියාව ආදිය ඔස්සේ බහුවිධ ආතති පරීක්ෂා යටතේ පුළුල් පරාසයක සාධක සැලකිල්ලට ගනිමින් සමූහය සිය ව්‍යාපාරවල ප්‍රත්‍යස්ථභාවය ඇගයීමට ලක් කළ අතර අවම බලපෑමක් ඇතිව ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව ඒ ඔස්සේ සමාලෝචනය කෙරිණ. සමූහයේ එක් එක් ක්ෂේත්‍රය පිළිබඳ සවිස්තර වාර්තාවක් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සහ කළමනාකාරිත්වය විසින් ඉහත කරුණු ඇගයීමෙන් පසු, ප්‍රතිඵලවල පරාසය හා සම්භාවිතාව පිළිබඳව නිසි ලෙස සලකා බැලීමෙන් අනතුරුව, සමාගමට ඉදිරියට යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව කළමනාකාරිත්වය සෑහීමකට පත් වූ අතර අපේක්ෂිත අනාගත මෙහෙයුම් අඛණ්ඩ පවත්වාගෙන යාමේ පදනම මත ක්‍රියාත්මක කළ හැකි බව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී තහවුරු කෙරිණ.

## 19. වාර්ෂික මහා සභා රැස්වීම

26 වන වාර්ෂික මහා සභා රැස්වීම 2022 සැප්තැම්බර් 08 වැනි දින ප.ව. 2.30 ට කොළඹ මරදාන පාරේ අංක 1161 දරණ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ප්‍රධාන කාර්යාලයේ 10 වන මහලේ දී පැවැත්වේ. 26 වන වාර්ෂික මහා සභා රැස්වීමට අදාළ රැස්වීම පිළිබඳ දැන්වීම මෙම වාර්ෂික වාර්තාවේ 356 වන පිටුවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**කොරලි පීටර්ස්**
*අධ්‍යක්ෂිකා*

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

**ශාලිනි සිල්වා**
*සමාගම් ලේකම්*

**2022 ජූලි 26**
**කොළඹ**

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව



"කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, සමාගම් පනත යටතේ වන තොරතුරු අවශ්‍යතා, මූල්‍ය ව්‍යාපාර පනත සහ (SLAS/IFRS) වැනි සෙසු වාර්තාකරණ රෙගුලාසි කෙරෙහි සමාගමෙහි අනුකූලතාවය ඇගයුමට ලක් කරන ලදී."

සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (විගණන කමිටුව හෝ කමිටුව) 2022.03.31 දිනෙන් අවසන් වූ වසර සඳහා සිය වාර්තාව මෙසේ ඉදිරිපත් කරයි. මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### කමිටුවේ සංයුතිය සහ රැස්වීම්

වසර තුළදී, නියාමනයන් මගින් විශේෂිතව දක්වන ලද අවශ්‍යතා සපුරාලමින් විගණන කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ එක් විධායක නොවන අධ්‍යක්ෂවරයකුගෙන් සමන්විත විය. කමිටුවේ වර්තමාන සාමාජිකයින් මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් හැකියාවන්ගෙන් පරිපූර්ණ බවට සහ මෑත කාලීන හා අදාළ පළපුරුද්දෙන් යුක්ත වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

| විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගීත්වය (අවශ්‍ය පරිදි කාර්තුමය වශයෙන් පවත්වන ලද) | | | | | | |
|---|---|---|---|---|---|---|
| අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
| 1 | මීරියම් කොරලි පීටර්ස් මිය - කමිටු සභාපතිනී | | ✓ | ✓ | | 12/12 |
| 2. | යූ එල් ආලෝක ඩබ්ලිව් බණ්ඩාර මයා | | ✓ | ✓ | | 12/12 |
| 3 | අසාම් ඒ අහමත් මයා | | ✓ | | ✓ | 10/12 |

කමිටු සාමාජිකයින් පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 117 සිට 120 දක්වා ඉදිරිපත් කෙරේ.

උදේශ් ගුණවර්ධන මහතා, අභ්‍යන්තර විගණන ප්‍රධානී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

2022 මාර්තු 31වැනි දින අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී කමිටුව රැස්වීම් දොළහක් (12) පවත්වන ලදී. සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සමගින් මෙකී රැස්වීම් වල කටයුතු පිළිබඳව නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. වසර තුළදී බාහිර විගණකවරුන් වන, විගණකාධිපතිවරයා සහ අර්න්ස්ට් ඇන්ඩ් යංග්හි නියෝජිතයින් රැස්වීම් දෙකක් (2) සඳහා සහභාගි වූහ. අවශ්‍යතාවය පරිදි වරින්වර ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාමාජිකයින් ආරාධනා මත රැස්වීම් වලට සහභාගි වේ.

වසර තුළදී රැස්වීම් සඳහා පැමිණීම සතුටුදායක තත්ත්වයක පැවතිණි.

**2010/22 මූල්‍ය වර්ෂය තුල කමිටුවෙහි ක්‍රියාකාරකම්**

### කමිටුවෙහි යොමු කොන්දේසි

මූල්‍ය වාර්තාකරණයේ සුපිළිපන්බව, අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්බව, නෛතික හා නියාමනමය අවශ්‍යතා වෙත සමාගමෙහි අනුකූලතාවය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහායවීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත් කෙරේ.

කමිටුවේ සංයුතිය, විෂයපථය, වගකීම් සහ අධිකාරීත්වය එහි යොමු කොන්දේසි මගින් දක්වෙන අතර, කමිටුවේ කවර හෝ ක්‍රියාකාරකම් හෝ ගැටලු සම්බන්ධ වර්ධනයන් නිරාකරණය කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ. කමිටුවේ යොමු කොන්දේසි, 2022 මාර්තු මස අවසන් වරට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කොට අනුමත කරන ලදී.

සිය කාර්යභාරයන් ඉටුකිරීමේදී අවශ්‍ය යැයි හැගෙන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ, වාර්තා, දත්ත සහ කළමනාකාරිත්වය හා සේවකයින් වෙත කිසිදු බාධාවකින් තොර පිවිසුමක් සඳහා වන නිත්‍ය අධිකාරිත්වයක් කමිටුව සතු වේ. සමාගමේ වියදමින් බාහිර වෘත්තීය වූ උපදෙස් ලබා ගැනීම සහ අනුකමිටු වෙත බලය පැවරීමේ පූර්ණ අධිකාරිත්වය කමිටුව සතු වේ.

### මූල්‍ය වාර්තාකරණය

සමාගමේ ගිණුම්කරණ වාර්තා අනුව, සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නිරීක්ෂණ මණ්ඩල පනත, කොළඹ කොටස් හුවමාරුවේ සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නියමයන් සහ රෙගුලාසිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයන්ට අනුකූලව සමාගමේ කටයුතු පිළිබඳව සාධාරණ සහ පැහැදිලි අදහසක් පිළිබිඹුවීමට කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල වගකීම් මුදාහැරීමේදී මෙම කමිටුව සහය වේ.

කමිටුව සමාගමේ අතුරු සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර සමාලෝචනය කරයි. එමෙන්ම විගණන කමිටුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන්, සහ LKAS/SLFRS මත පදනම් වූ ලාභ සැසඳීම සහ ලාභාංශ ප්‍රකාශ කිරීමෙන් විචක්ෂණ අනුපාතවලට වන බලපෑම අදාළ රෙගුලාසිවලට අනුකූලව සමාලෝචනය කරයි.

කමිටුව මගින්, කෝවිඩ් 19 වසංගතයේ බලපෑම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය විසින් හඳුන්වාදෙන ලද පමාසහන සැලසුම් සාධකකරණය ඔස්සේ, මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගත් අපේක්ෂිත ණය අලාභ සඳහා වන ප්‍රතිපාදනයෙහි ප්‍රමාණවත්බව සම්බන්ධ ඇගයුමක් ද ඇතුලුව ප්‍රතිපත්ති අත්පොත ක්‍රියාවට නැංවීම සමාලෝචනයට ලක් කරන ලදී.

### බාහිර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතට අනුව, විගණකාධිපති විසින් හෝ විගණකාධිපති විසින් පත්කරනු ලබන යම් පුද්ගලයෙක් විසින් විගණනය සිදුකරනු ලබන බව විගණකාධිපති විසින් දන්වා ඇත. 2021/22 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණනය ඉටුකිරීම සඳහා විගණකාධිපති වෙත සහාය වීම සඳහා අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් විගණකවරුන් පත් කර ඇත. ව්‍යවස්ථාව මගින් පත්කරනු ලැබ ඇති පරිදි විගණකාධිපතිවරයා සමාගමෙහි බාහිර විගණකවරයා වන බැවින්, කමිටුව මගින් බාහිර විගණකගේ සහභාගීත්වය සම්බන්ධයෙන් කිසිදු කාර්යභාරයක් ඉටු කිරීම අවශ්‍ය නොවේ.

මූල්‍ය වර්ෂය තුළදී කමිටුව දෙවරක් බාහිර විගණකවරුන් හමුවූ අතර එහිදී වාර්ෂික විගණනය ඇරඹීමට පෙර විගණන සැලසුම, විගණනය සිදු කිරීමේදී ආදේශ කර ගැනීමට යෝජිත ක්‍රමවේදය සහ විෂයපථය පිළිබඳව විගණකවරුන් සමග සාකච්ඡා කරන ලදී. මෙහිදී ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්ගේ සහභාගීත්වයකින් තොරව විගණන කමිටුව සමඟ තවදුරටත් සාකච්ඡා කළ යුතු ප්‍රමාණාත්මක කරුණු, ගැටලු හෝ සීමාවන් සම්බන්ධයෙන් විමසීම් සිදු කිරීමට බාහිර විගණකවරුන් හට අවස්ථාව ලබා දෙන ලදී.

කමිටුව මගින් විගණකවරුන් විසින් සපයනු ලබන විගණන නොවන සේවාවන් පිළිබඳ සමාලෝචනය කරමින් අදාල සේවාවන් අත්හිටුවන ලද සේවාවන් ගණයට අයත් නොවන බවට සහ එවැනි සේවාවන් මගින් විගණකාධිපතිවරයා වෙත සහාය ලබාදීම සඳහා පත්කරන ලද බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය හානියට පත් නොවන බවට තහවුරු කරන ලදී.

කමිටුව මගින් ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාරව බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපිය සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ එයට අදාළ කළමානාරීත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී. කළමනාකරණ ලිපිය තුළ ඇති නිර්දේශ කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරන ලද බවට සහතික කිරීමට කමිටුව පියවර ගනු ලැබීය.

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය සිදුකිරීම සඳහා සහ විගණන කමිටුව වෙත වාර්තා කිරීම සඳහා විශේෂිත අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් පවතී. කමිටුව මගින් අභ්‍යන්තර විගණන අංශය එහි විගණනයට ලක් වන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන බවට තහවුරු කරන ලද අතර සිය කාර්යයන් ස්වාධීනව සිදු කිරීමට අවශ්‍ය අධිකාරිත්වය මෙම අංශය සතු බවට තහවුරු කරන ලදී.

කමිටුව මගින් මූල්‍ය වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැසුම සහ ක්‍රමෝපාය සමාලෝචනය කර අනුමත කරන ලදී. සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය මගින් පරිපාලිතයන් ඇතුළුව ව්‍යාපාරික ඒකකයන්හි අන්තර්ජාලගත සහ ස්ථානීය පරීක්ෂාවන් සිදුකර කරන ලදී. මෙහිදී සැලකිය යුතු සොයාගැනීම් කමිටුවේ අවධානයට ලක් වූ අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටුව වෙත වාර්තා කරන ලදී. කමිටුව මගින් අදාළ නිර්දේශ ඇගයුමට ලක් කොට ඒවා ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකරන ලදී. කමිටුව විධායක කළමනාකාරිත්වයෙහි සහභාගිත්වයකින් තොරව අභ්‍යන්තර විගනකවරුන්ද හමුවිය.

### නියාමන අනුකූලතාවය

කමිටුව මගින් සමාගම් පනත, මූල්‍ය ව්‍යාපාර පනත සහ වෙනත් අදාළ මූල්‍ය වාර්තාකරණය ආශ්‍රිත රෙගුලාසි (SLAS/IFRS වැනි) සහ අවශ්‍යතා කෙරෙහි සමාගමෙහි අනුකූලතාවය ඇගයීමට ලක් කරන ලදී. එබඳු නීතිමය සහ නියාමනමය අවශ්‍යතා සමඟ අනුකූලතාවය නිරීක්ෂණය කිරීම සඳහා කමිටුව මගින් අනුකූලතා නිලධාරිවරයා විසින් භාරදෙන ලද වාර්තා පරීක්ෂාවට ලක් කෙරුණි.

කමිටුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂා වාර්තා වල නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඒ කෙරෙහි කළමණාකාරිත්වයෙහි ප්‍රතිචාරය නිරීක්ෂණය කෙරුණි.

### අභ්‍යන්තර පාලනයන්

සමාගමෙහි අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීත්වය ඇගයීම සඳහා කමිටුව වෙත අභ්‍යන්තර විගණන අංශයේ සහාය හිමි වේ. කමිටුව මගින් බාහිර විගණකවරුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සහ ඒ සඳහා වන කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනයද සිදු කෙරිණි.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පිළිබඳ වාර්තාව කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කිරීමෙන් අනතුරුව වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරන ලදී.

### තොරතුරු දැනුම්දීම (විස්ල් බ්ලෝවින්ග්)

සමාගමේ තොරතුරු දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය මගින් ආයතනික වංචා අවදානම් කළමනාකරණය සඳහා පුළුල්ව පැතිරුණු මාර්ගයක් ලෙස සේවය කිරීම අපේක්ෂා කරයි. මෙම ප්‍රතිපත්තිය සමාගමේ අභ්‍යන්තර ජාලයේ ප්‍රකාශයට පත්කර ඇති අතර තොරතුරු දැනුම් දෙන්නන්ගේ දැඩි රහස්‍යතාව පවත්වා ගැනීම සහතික කරයි.

සමාගම තුළ යම් අවිධිමත් හෝ නීති විරෝධී ක්‍රියාවක් හෝ සදාචාර විරෝධී ව්‍යවහාරයක් දකින හෝ එවැනි දෙයන් පිළිබඳ විශ්වාසී තොරතුරු ලැබෙන යම් සේවකයෙක් තොරතුරු දැනුම්දීම ක්‍රියාවේ යෙදවීම සඳහා දිරිගන්වනු ලබයි.

කමිටුව මගින් සේවකයන් හට මූල්‍ය වාර්තාකරණයේ, අභ්‍යන්තර පාලන වල හෝ වෙනත් කරුණු ආශ්‍රිතව අක්‍රමිකතා පිළිබඳව සිය අදහස් රහස්‍යභාවයෙන් යුතුව පළ කිරීමට හැකි වන පරිදි අදාළ විධිවිධාන තව තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

මේ ඔස්සේ වාර්තා කෙරෙන සහ වෙනත් ක්‍රම වලින් හඳුනාගැනෙන සිදුවීම් සම්බන්ධ ස්වාධීන විමර්ශන සිදුකිරීම සඳහා සියලු අදාළ ක්‍රියා පටිපාටීන් ස්ථාපනය කොට ඇත.

### කමිටුවෙහි ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් යොමු නිර්දේශ වලින් ප්‍රකාශ කෙරෙන සිය අධිකාරිත්ව විෂයපථය තුළ ස්වකීය වගකීම් මුදාහරින ලදී. කමිටුව මගින් මෙකී වගකීම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ඇගයුමක් සිදුකරන ලද අතර මූල්‍ය වර්ෂය තුල කමිටුව මගින් සිය වගකීම් සෑහීමකට පත්විය හැකි පරිදි ඉටු කරන ලද බවට නිගමනය කෙරුණි.



**මිරියම් කොරලි පීටර්ස්**
*ස්වාධීන අධ්‍යක්ෂ/සභාපති*
*අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව*

2022 ජූලි 26
කොළඹ

# මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව



"කමිටුව, සමූහයේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සාධාරණ, විනිවිදභාවයෙන් යුතු සහ තරගකාරී වන බවට සහ පාරිශ්‍රමික තිරසාර කාර්යසාධනය ඉලක්ක කොට ගත් ව්‍යාපාරික ක්‍රමෝපායට සම්බන්ධිත බවට තහවුරු කිරීම සඳහා කටයුතු කළේය."

### 2021/22 අවධානාත්මක අංශ

- ප්‍රතිපත්ති සමාලෝචනය
- ප්‍රතිලාභ හා පාරිශ්‍රමික
- අනුප්‍රාප්තික සැලසුම්කරණය

සමාගම මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 31 දිනැති 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගය ස්වේච්ඡාවෙන් ආදේශ කරගනු ලැබීය.

නව ආයතනික පාලන නියෝගය මගින් නාමයෝජනා කමිටුවෙහි සහ පාරිශ්‍රමික කමිටුවෙහි වගකීම් වෙන් වෙන් වූ අනුකමිටු දෙකක් යටතට පත් කිරීම අවශ්‍ය වූ අතර, එහිදී පවතින මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව 2022 ජනවාරි 27 සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද අතර අදාළ වගකීම් ස්වාධීන අනුකමිටු දෙකක් යටතේ ප්‍රති අනුයුක්ත කරන ලදී. එනම්:

1. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව
2. නාමයෝජනා කමිටුව

කමිටුව මගින් 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගයට අනුකූලව යොමු කොන්දේසි ආදේශ කරගැනිනි.

**පාරිශ්‍රමික ප්‍රතිපත්තිය**
කමිටුව මගින්, සමාගමෙහි ක්‍රමෝපාය ක්‍රියාවට නැංවිය හැකි සේවකයින් රඳවාගැනීමට හැකි වන පරිදි, ඔවුන්ගේ කාර්යසාධනය, නිපුණත්වය, පළපුරුද්ද සහ වගකීම් මට්ටම අනුව අදාළ සේවකයින් වෙත නිසි ප්‍රතිලාභ හිමිවන ආකාරයේ ප්‍රතිලාභ ක්‍රමෝපායක් සමාගමෙහි ක්‍රියාත්මක වන බවට අධීක්ෂණය කරනු ලැබේ.

යහපාලන මූලධර්ම වලට සමගාමීව, අපගේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය අපගේ අපේක්ෂිත සේවා වටපිටාව අවධාරණය කරමින් අපගේ වටිනාකම් සමග අනුගත වන චර්යාවන් දිරිගන්වන අතර එහිදී අපගේ ක්‍රමෝපායික ප්‍රමුඛතාවන් අත්පත් කරගැනීම උදෙසා උසස් මට්ටමේ කාර්යසාධනයක් පවත්වාගැනීමට සේවකයින් දිරිගන්වනු ලැබේ.

### කමිටුවෙහි අරමුණු

කමිටුවෙහි අරමුණ වනුයේ, සමූහය මගින් සමානාත්මතාවයෙන් යුතු මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් ආදේශනය කොට ඇති බවට තහවුරු කිරීම සහ සමාගමෙහි ක්‍රමෝපායික ඉලක්ක සපුරාගැනීම උදෙසා දායක වන ඉහළ මට්ටමේ ප්‍රමුඛ කළමනාකරණ පිරිස්/සේවකයින් ආකර්ශනය, රඳවාගැනීම හා දිරිගැන්වීම සඳහා වන සවිමත් පාරිශ්‍රමික ආකෘතියක් නිර්මාණය කිරීමයි. එයට ප්‍රමුඛ කළමනාකරණ පිරිස්, ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය වෙත කාර්යසාධනය මත පදනම් වූ දීමනා සැලසුමක් ඇතුළත් වන අතර එහිදී පාර්ශ්වකාර වටිනාකම් ඉහළ නැංවීම සඳහා අදාළ වන සහ නිර්මාණය කරන ලද කාර්යසාධනය ආශ්‍රිත ඇගයීම් ක්‍රමයක් සකසනු ලැබේ.

**සංයුතිය සහ පැමිණීම**
කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂකවරුන් වේ. විමර්ශනයට ලක් වන වසර තුළදී, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකත්වයේ වෙනසක් සිදු නොවිය.කමිටු සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු වේ.

මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුවෙහි රැස්වීම වෙත පැමිණීම (2022.01.27. සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලදී) (කාර්තුමය වශයෙන් හෝ අවශ්‍ය පරිදි පවත්වන ලදී.)

| අංකය | අධ්‍යක්ෂකවරයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | යූ. එල්. අශෝක ඩබ්. බණ්ඩාර මයා (සභාපති) | | ✓ | ✓ | | 4/4 |
| 2 | මීරියම් කොරලි පීටර්ස් මිය | | ✓ | ✓ | | 4/4 |
| 3. | රොහාන් පතිරගේ මයා | | ✓ | | ✓ | 4/4 |

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත පැමිණීම (ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගය ප්‍රකාරය 2022 ජනවාරි 27 ස්ථාපනය කරන ලදී.) (කාර්තුමය වශයෙන් හෝ අවශ්‍ය පරිදි පවත්වන ලදී.)

| අංකය | අධ්‍යක්ෂකවරයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | යූ. එල්. අශෝක ඩබ්. බණ්ඩාර මයා (සභාපති) | | ✓ | ✓ | | 2/2 |
| 2 | මීරියම් කොරලි පීටර්ස් මිය | | ✓ | ✓ | | 2/2 |
| 3. | රොහාන් පතිරගේ මයා | | ✓ | | ✓ | 2/2 |

**ආරාධනයෙන් පැමිණි රැස්වීම් සංඛ්‍යාව**
ප්‍රධාන විධායක නිලධාරී, සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත්

**කමිටු ලේකම්**
සමාගම් ලේකම්වරිය කමිටු ලේකම්වරිය වශයෙන් කටයුතු කරයි.

සාමාජිකයින් පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 117 සිට 120 දක්වා ඉදිරිපත් කෙරේ.

**ප්‍රධාන වගකීම්**

අධ්‍යක්ෂ මණ්ඩල අනුමත යොමු කොන්දේසි මගින් කළමනාකාරීත්ව මට්ටමින් ඉහළ විවාදයට ගත යුතු මානව සම්පත් ආශ්‍රිත කරුණු ඉස්මතු කිරීම සඳහා කළමනාකාරීත්වය වෙත පදනමක් සැපයෙන අතර එයට පහත දැක්වෙන කරුණු සමලෝචනය සහ නිර්දේශනය ඇතුළත් වේ:

- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සංවර්ධනය සහ දිරි ගැන්වීම පිළිබඳ පුද්ගල ප්‍රතිපත්ති/ක්‍රියාපටිපාටීන්
- ප්‍රධාන කළමණාකරණ පුද්ගලයින් සම්බන්ධ බඳවා ගැනීමේ අවශ්‍යතා සහ ආශ්‍රිත පත්කිරීම්
- ප්‍රධාන කළමනාකාර පුද්ගලයින්ට අදාළ වැටුප්, දීමනා ප්‍රතිලාභ සහ අනෙකුත් සේවක පාරිශ්‍රමික
- ප්‍රධාන කළ කළමණාකරන පුද්ගලයින් සම්බන්ධ අනුප්‍රාප්තික ක්‍රමෝපාය
- ව්‍යාපාරික හේතූන් මත සේවකයින්ගේ පෙර හඳුනාගත් නිලය/තත්ත්වය/කාර්යභාරය සම්බන්ධ වෙනස් වීම්
- ආයතනික කළමනාකාරිත්වය සම්බන්ධ වැටුප් සහ ප්‍රතිලාභ ව්‍යුහගතකරණය සහ නිර්ණය කිරීම; ඉහත නිලයන්ට අදාලව විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වන ආකාරය
- ආයතනික කළමනාකාරීත්වයේ සහ උපදේශකයින්ගේ ස්ථාවර සේවක ගිවිසුම්
- ආයතනික කළමනාකාරිත්වය සඳහා සේවා දිගු කිරීම්
- පෙර හඳුනාගත් ශ්‍රේණි වලට අයත් සේවකයින්ගේ වාර්ෂික උසස්වීම්
- මූල්‍ය නොවන ප්‍රතිලාභ ඇතුළු පාරිශ්‍රමික වෙත වාර්ෂික වැටුප් වර්ධක සහ ප්‍රතිලාභ
- දිරිදීමනා සහ වැටුප් සංශෝධන. සේවක ණය සහ ප්‍රතිලාභ අනුමත කිරීමේ සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් වෙත ඉලක්ක සැකසීමේ වරයද කමිටුව සතු වේ.

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු**

පාරිශ්‍රමික හා නාමයෝජනා කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හට ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන ගාස්තුව කාර්යසාධනය ආශ්‍රිත හෝ විශ්‍රාම වැටුප් සහිත නොවේ.අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද ගාස්තු පිළිබඳව මෙම වාර්ෂිකව වාර්තාවේ පිටු අංක 136 හි දැක්වේ.

## 2021/22 ක්‍රියාකාරකම්

### ප්‍රතිපත්ති සමාලෝචනය

වසර තුළදී කමිටුව මගින්, විශ්‍රාම ලැබීමෙන් පසු සේවා නියුක්තිය ආශ්‍රිතව (අවුරුදු 60 ට පෙර විශ්‍රාම ලබන) සමාගමෙහි ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය (ප්‍රමුඛ වගකිව යුතු නිලධාරීන්) සම්බන්ධ හානිපූර්ණය, උසස්වීම් සහ පත්කිරීම් පිළිබඳ ප්‍රතිපත්ති සමාලෝචනය කරන ලදී. මෙකී ප්‍රතිපත්ති සමාලෝචනය සැළකිල්ලට ගැනීමේදී කමිටුව අදාළ පුද්ගලයින්ගේ ව්‍යංගිත දැනුම රඳවාගැනීමේ අවශ්‍යතාවය සහ එම දැනුම නිසි ලෙස ඉදිරියට ගෙනයාම සහ මනා අනුප්‍රාප්තිකත්වය පිළිබඳ අවධායෙන් පසුවිය. තවද අදාළ ප්‍රතිපත්ති මගින්, හැකියාව සහිත සේවකයින් දිරිගන්වමින් අනාගත අනුප්‍රාප්තික අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ වෘත්තීය ප්‍රගතිය තහවුරු කිරීමද අවශ්‍ය විය.

### අනුප්‍රාප්තික සැලසුම්කරණය

සමාගම මේ වන විට ප්‍රවේශම් සහගතව සැලසුම් කරන ලද අනුප්‍රාප්තිකත්වයක් අවශ්‍ය වන ආකාරයේ පරිවර්තනීය ගමන් මගක නිරත වේ. කමිටුව මගින් අවශ්‍ය දිශානතිය සපයමින් අනුප්‍රාප්තික සැලසුම සමාලෝචනය කරන ලද අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කමිටුව විසින් සමාග මෙහි අනුප්‍රාප්තික අවශ්‍යතා සපුරාලීම සඳහා වන, ප්‍රතිපත්තියෙහි ඇතුළත් යෝජනා වෙත අඛණ්ඩවම සහාය දක්වන ලදී.

### ප්‍රතිලාභ සහ පාරිශ්‍රමික

2019 සිට වැටුප් වර්ධක පිළිබඳව සැළකිල්ලට නොගත් පසුබිමක් තුළ වැටුප් වර්ධක සිදුකිරීමේ අවශ්‍යතාවය කෙරෙහි කමිටුවෙහි සහාය පළ විය. ස්වාධීන හානිපූර්ණ හා ප්‍රතිලාභ සමීක්ෂණයක් ඔස්සේ වෙළඳපොල ස්ථානය මත පදනම්ව අදාළ යෝජිත වැටුප් වර්ධක සමාලෝචනය කරන ලදී. එබඳු සමීක්ෂණයන්ගේ ප්‍රතිපලයක් වශයෙන් කමිටුව විසින්ද සංශෝධිත සේවක ප්‍රතිලාභ සමාලෝචනය කරන ලදී.

### නිගමනය

කමිටුව මගින් අඛණ්ඩවම, සිය වෘත්තීය ප්‍රගතිය උදෙසා සමූහය තුළ නව නිපුණතා සහ දැනුම ලබාගැනීම සඳහා සේවකයින් වෙත අවස්ථාවන් ලබාදෙමින් මානව ප්‍රාග්ධනය ඉහළ නංවන ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් සහ ක්‍රමවේදයන් හඳුන්වාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වනු ලැබේ. පාරිශ්‍රමික ආශ්‍රිත වැඩසටහන් මගින් සමූහයේ ව්‍යාපාර ක්‍රමෝපාය වෙත දායකත්වයක් හිමි වන බවටත් පාර්ශ්වකාර අභිමතයන් සමග සමීප සබඳතාවයක් පවතින බවටත් තහවුරු කිරීම සඳහා අඛණ්ඩවම කටයුතු කෙරේ.



**යූ. එල්. අශෝක ඩබ්. බණ්ඩාර**
කමිටු සභාපති
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2022 ජූලි 26
කොළඹ

# සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව



"අපගේ ප්‍රමුඛ අවධානය යොමුවූයේ සියලුම සමූහය ආශ්‍රිත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නිසි පරිදි හදුනාගනිමින් අදාළ රෙගුලාසි වලට අනුකූල බවට තහවුරු කිරීම කෙරෙහිය."

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත යොමු නිර්දේශ ඇතුළත කටයුතු කරන අතර එමගින් ලැයිස්තුගත සමාගම් සඳහා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පාලනය කෙරෙන නීති රීති හා කොන්දේසි කෙරෙහි අනුකූලතාවය තහවුරු කෙරේ.

### සංයුතිය සහ කමිටු රැස්වීම්

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර සභාපතිවරයාද ඇතුළුව ඉන් දෙදෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ.

සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, අනුකූලතා නිලධාරී සහ ප්‍රධාන කළමනාකරු - මූල්‍ය ආරාධනා මත රැස්වීම් වලට සහභාගි වේ. කමිටුව එහි කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල විවාදයට ගත යුතු සැලකිය යුතු කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරයි.

වසර තුළදී කමිටුව සිව් වරක් රැස්වූ අතර එහිදී අදාල කාලසීමාව තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව සමාලෝචනය කරන ලදී. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පාලනය කෙරෙන නීති රීති හා රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය තහවුරු කරනු පිණිස සාමාජිකයන් විසින් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව දීර්ඝ වූ විවාදයන් පවත්වන ලදී. අදහස් සහ නිරීක්ෂණ සමගින් කමිටු රැස්වීම් පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

මූල්‍ය වර්ෂය තුළ කමිටුව වෙත පැමිණීම

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව වෙත පැමිණීම (කාර්තුමය වශයෙන් හෝ අවශ්‍ය පරිදි පවත්වන ලදී.)

| අංකය | සාමාජිකයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | චතුර ජේ. විජේතිලක (සභාපති) | | ✓ | ✓ | | 4/4 |
| 2. | යූ.එල්. අශෝක ඩබ්. බණ්ඩාර - සාමාජික | | ✓ | ✓ | | 4/4 |
| 3 | සුදර්ශන අහංගම (2021 අගෝස්තු 24 සිට බලපැවැත්වෙන පරිදි සේවය අවසන් කරන ලදී) | | ✓ | | ✓ | 0/1 |
| 4. | රොහාන් පතිරගේ - සාමාජික (2021 සැප්තැම්බර් 24 දින පත් කරන ලදී) | | ✓ | | ✓ | 2/2 |

### කමිටු ලේකම්

සමාගම් ලේකම්වරිය කමිටු ලේකම්වරිය වශයෙන් කටයුතු කරයි.

2022 මාර්තු 31 දිනට සම්බන්ධිත පාර්ශව ගනු ගනුදෙනු සමාලෝචන කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 117 සිට 120 දක්වා ඉදිරිපත් කෙරේ.

**2021/22 විශේෂතා**

සමාගම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 31 දිනැති ආයතනික පාලන 2021 නියෝග අංක 05 ස්වේච්ඡාවෙන් ආදේශ කරගැනුනි.

- සමාගමෙහි සුරකුම් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සහ සියලුම සේවකයින් වෙත උපදෙස් ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා කොටස් වෙළඳ ප්‍රතිපත්තිය නිර්දේශ කරන ලදී.
- සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය සහ අත්පොත සමාලෝචනය කරන ලදී.
- විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ සමාගමෙහි සියලුම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචනය කරන ලදී.

### කමිටුවේ විෂයපථය

### විධි නියෝගය

කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත වීමේ නීති රීති වලට අනුකූලව යොමු නිර්දේශ වලින් පැහැදිලිව නිදහස් කරන ගනුදෙනු හැර කමිටුව මගින් සියලුම යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කල්තබා සමාලෝචනය කෙරේ.

කමිටුවෙහි ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ;

- කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත වීමේ නීති රීති වලට අනුකූලව යොමු නිර්දේශ වලින් පැහැදිලිව නිදහස් කරන ගනුදෙනු හැර කමිටුව මගින් සියලුම යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කල්තබා සමාලෝචනය කිරීම.
- සමාගමෙහි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචනය සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටින් ආදේශනය සහ පවතින ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් අධීක්ෂණය.

- අවශ්‍ය අවස්ථාවන්හිදී ලැයිස්තුගත වීමේ නීති රීති වගන්ති 9.1 සහ 9.4 හි විශේෂිතව දක්වා ඇති පරිදි අදාල ගනුදෙනුවට එළඹීමට පෙර විශේෂ යෝජනාවක් මාර්ගයෙන් සමාගමෙහි කොටස් හිමිකරුවන්ගේ අනුමැතිය ලබා ලබාගැනීම සඳහා සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- දැනට සිදුකෙරමින් පවතින සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ආශ්‍රිතව සමාගමේ සේවකයින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ ස්ථාපනය කිරීම.
- අදාළ කරුණු පිළිබඳ බලපෑම් කිරීමක් හෝ ඡන්දය ප්‍රකාශ කිරීමකින් තොරව තොරතුරු ලබාදීමේ අරමුණින් පමණක් කිසියම් අධ්‍යක්ෂවරයකු හට සහභාගි වන මෙන් කමිටුව මගින් ඉල්ලා සිටින්නේ නම් හැර, ඔහු හෝ ඇය සම්බන්ධිත පාර්ශවයක් වන යෝජිත සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක් පිළිබඳ කවර හෝ සාකච්ඡාවකට සමාගමෙහි කිසිදු අධ්‍යක්ෂවරයෙකු සහභාගී නොවන බවට තහවුරු කිරීම.
- අදාල නීතිරීති හා කොන්දේසි මගින් ඉල්ලා සිටින පරිදි ආසන්නතම වෙළෙඳපොළ හෙළිදරව් කිරීම් සහ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම් කාලීන සහ ප්‍රමාණවත් ලෙස විස්තරාත්මක ආකාරයකින් ඉදිරිපත් කෙරෙන බවට තහවුරු කිරීම.
- සමාගම සහ එහි සම්බන්ධිත පාර්ශවයන් අතර බැඳියා පිළිගැටුමක් ඇති විය හැකි ආකාරයේ බලපෑම් වළකාලන හෝ අවම කරන ආකාරයෙන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සිදුවන බවට තහවුරු කිරීම සඳහා ඒවා නිරීක්ෂණය කිරීම.
- සෑම කල්හිම ක්ෂේත්‍රයේ ප්‍රශස්ත ක්‍රියාකාරකම් පිළිබිඹු වන බවට තහවුරු කිරීම සඳහා කමිටුවෙහි යොමු නිර්දේශ ආවර්තිතව සමාලෝචනය කිරීම.
- සිය කාර්යභාරය ඉටුකිරීම සඳහා සුදුසු හා අවශ්‍ය යැයි හැඟෙන වෙනත් ක්‍රියාකාරකම් සිදු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට පවරනු ලබන වෙනත් වගකීම් භාර ගැනීම.

### අධිකාරිත්වය

අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ කරුණු සම්බන්ධයෙන්යෙන් අවසන් තීරණ ගැනීම සඳහා කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. අවශ්‍ය අවස්ථාවන් වලදී සමාගමෙහි වියදමින් වෘත්තීය උපදෙස් ලබා ගැනීමට කමිටුවට හැකි වන අතර මෙය සමාගම් ලේකම්වරයා විසින් සම්බන්ධීකරණය කෙරේ.

## සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි

### ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 24 සහ ලැයිස්තුගතවීමේ නීතිරීති වලට අනුකූලව ''සම්බන්ධිත පාර්ශවයක්''වශයෙන් කිසියම් පුද්ගලයෙකු සැලකීම සඳහා වන කාණ්ඩයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තියෙහි නිර්වචනය කෙරේ.

ඔවුන් වෙත සම්බන්ධිත පාර්ශ්වයන් හඳුනාගැනීම සඳහා සමාගමෙහි එක් එක් අධ්‍යක්ෂවරයා සහ ප්‍රධාන කළමණාකරණ පුද්ගලයා වෙතින් ස්වයං ප්‍රකාශ ලබාගත යුතු බවට සම්බන්ධිත පාර්ශව ප්‍රතිපත්තිය මගින් නියම කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජිකයා විසින්, ඔහුගේ/ ඇයගේ ස්වාධීන විනිශ්චයට බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ පුද්ගලික සබඳතා, බාහිර සබඳතා සහ ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධ අභිමතයන් තුළින් අනාගතයේ සිදුවිය හැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුමක් ඔහු/ ඇය සතුව පවතින්නේ දැයි නිර්ණය කිරීම සමාගමෙහි ව්‍යාපාර චර්යා සහ ආචාර්යධර්ම සංග්‍රහය අනුව අවශ්‍ය වේ. එබඳු අනාගතයේ සිදුවිය හැකි හෝ සැබෑ බැඳියා පිළිගැටුම් සහිත අධ්‍යක්ෂවරුන් ඒත් පිළිබඳව ඔහු/ ඇය දැනුවත්භාවයට පැමිණි වහාම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අදාල බැඳියා පිළිගැටුම පිළිබඳ හෙළිදරව් කළ යුතු වේ.

### ක්‍රියාපටිපාටි

සම්බන්ධිත පාර්ශවයන් වෙත කිසිදු හිතවාදී සැලකිල්ලක් නොදක්වන බවට තහවුරු කිරීම සඳහා සමාගම මගින් අන්තර්ජාලගත වළකාලීමේ පද්ධතියක් ක්‍රියාවට නංවා ඇත. මෙම පද්ධතිය මගින් සමාගමට සම්බන්ධිත පාර්ශව ගනුදෙනු නිරීක්ෂණය සහ වාර්තා කිරීමට මෙන්ම සමාගමෙහි ජාලය පුරා ඒ සම්බන්ධ දත්ත උකහා ගැනීමට හැකි වේ.

### 2021/22 සිදුවුනු සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

කමිටුව මගින් 2021 අප්‍රියෙල් 1 සිට 2022 මාර්තු 31 දක්වා සමාගමෙහි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳව සමාලෝචනයට කරන ලද අතර, ඒ අනුව කොළඹ කොටස් වෛළඳ පොළේ ලැයිස්තුගතවීමේ නීතිරීති වගන්ති 9 හි දැක්වෙන පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු වලට අදාළ නීති රීති වලට අනුකූල බවට තහවුරු කරන ලදී.

කොළඹ කොටස් වෙළඳ වෙළඳ පොළේ ලැයිස්තුගත වීමේ නීතිරීති වගන්ති 9.1.1., 9.1.2. සහ 9.3.2. (අ) මගින් අරමුණු කෙරෙන පරිදි සමාගම කිසිදු ගණුදෙනුවකට එළඹ නැත. ලැයිස්තුගතවීමේ නීති රීති වගන්ති 9.3.2. (ආ) යටතට ගැනෙන සමාගම විසින් එළඹෙන ලද සියළුම ගණුදෙනු පිටු අංක 314 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 55.5 හි ඉදිරිපත් කෙරේ.

### ප්‍රකාශය

2021/22 දී සමාගම මගින් ලැයිස්තුගතවීමේ නීතිරීති වල පරාසය තුළට අයත් වන කිසිදු සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවකට නොඑළඹුනු බවට වන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශය, පිටු අංක 161 හි සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ දැක්වේ.



**චතුර විජේතිලක**
*සභාපති*
සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුව

2022 ජූලි 26
කොළඹ

# නාමයෝජනා කමිටු වාර්තාව



"සමූහයෙහි ක්‍රමෝපාය සහ සිය කාර්යභාරයන් ක්‍රියාවට නැංවීමේදී ඵලදායී ලෙස මෙහෙයුම් සිදුකිරීමට අවශ්‍ය සාමූහික නිපුණත්වය සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන බවට කමිටුව තහවුරු කරයි."

### 2021/22 අවධානාත්මක ක්ෂේත්‍රයන්

- අධ්‍යක්ෂ මණ්ඩල ඇගයුම
- අධ්‍යක්ෂ මණ්ඩල අනුප්‍රාප්තිකත්වය
- අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම

සමාගම මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 31 දිනැති 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගය ස්වේච්ඡාවෙන් ආදේශ කරගනු ලැබිය.

නව ආයතනික පාලන නියෝගය මගින් නාමයෝජනා කමිටුවෙහි සහ පාරිශ්‍රමික කමිටුවෙහි වගකීම් වෙන් වෙන් වූ අනුකමිටු දෙකක් යටතට පත් කිරීම අවශ්‍ය වූ අතර, එහිදී පවතින මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටුව 2022 ජනවාරි 27 සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද අතර අදාළ වගකීම් ස්වාධීන අනුකමිටු දෙකක් යටතේ ප්‍රති අනුයුක්ත කරන ලදී. එනම්:

1. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව
2. නාමයෝජනා කමිටුව

කමිටුව මගින් 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගයට අනුකූලව යොමු කොන්දේසි ආදේශ කරගැනිනි.

### කමිටුවෙහි අරමුණ

කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යුහය, ප්‍රමාණය සහ සංයුතිය සමාලෝචනය කෙරෙන අතර හඳුන්වාදිය යුතු කවර හෝ වෙනස්කමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තෝරාගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් දෙනු ලැබේ. ඔහුගේ/ඇයගේම ස්වකීය පත්කිරීම සම්බන්ධ තීරණ ගැනීම සඳහා සාමාජිකයින් සහභාගී වීමෙන් වැළකේ.

### 2021/22 ක්‍රියාකාරකම්

වසර තුළදී කමිටුව මගින්, 2021 අංක 05 දරණ මූල්‍ය ව්‍යාපාර පනත (ආයතනික පාලන) සහ 2021 අංක 05 දරණ මූල්‍ය ව්‍යාපාර පනත (ප්‍රමුඛ කළමනාකරණ පිරිස් වල යෝග්‍යතාවය සහ ප්‍රාමාණිකත්වය) මගින් දක්වා ඇති පරිදි ප්‍රමුඛ කළමනාකරණ පිරිස් ලැයිස්තුව සමාලෝචනය කරන ලදී.

ප්‍රමුඛ කළමනාකරණ පිරිස් සහ ජ්‍යෝෂ්ට කළමනාකාරිත්වය 2021 අංක 05 දරණ මූල්‍ය ව්‍යාපාර පනත (ආයතනික පාලන) අනුව හඳුනාගෙන අනුයුක්ත කරන ලදී.

නිසි විනිවිදභාවය සහ පැහැදිලි බව තහවුරු කරමින් කමිටුව මගින් ජ්‍යෝෂ්ට කළමනාකාරිත්වය තෝරාගැනීම හා පත්කිරීම සම්බන්ධ සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නව අධ්‍යක්ෂවරුන් තෝරාගැනීම හා පත්කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති නිර්දේශ කරන ලදී.

**සංයුතිය සහ පැමිණීම**

කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂකවරුන් වේ. විමර්ශනයට ලක් වන වසර තුළදී, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකත්වයේ වෙනසක් සිදු නොවිය.කමිටු සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු වේ.

මානව සම්පත්, පාරිශ්‍රමික සහ නාමයෝජනා කමිටු රැස්වීම් සහභාගීත්වය (2022.01.27. සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලදී) (කාර්තුමය වශයෙන් හෝ අවශ්‍ය පරිදි පවත්වන ලදී.)

| අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | යූ. එල්. අශෝක ඩබ්. බණ්ඩාර මයා (සභාපති) | | ✓ | ✓ | | 4/4 |
| 2 | මීරියම් කොරලි පීටර්ස් මිය | | ✓ | ✓ | | 4/4 |
| 3. | රොහාන් පතිරගේ මයා | | ✓ | | ✓ | 4/4 |

නාමයෝජනා කමිටු රැස්වීම් සහභාගීත්වය (ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගය ප්‍රකාරය 2022 ජනවාරි 27 ස්ථාපනය කරන ලදී.) (කාර්තුමය වශයෙන් හෝ අවශ්‍ය පරිදි පවත්වන ලදී.)

| අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | යූ. එල්. අශෝක ඩබ්. බණ්ඩාර මයා (සභාපති) | | ✓ | ✓ | | 2/2 |
| 2 | මීරියම් කොරලි පීටර්ස් මිය | | ✓ | ✓ | | 2/2 |
| 3. | රොහාන් පතිරගේ මයා | | ✓ | | ✓ | 2/2 |

**කමිටු ලේකම්**

සමාගම් ලේකම්වරිය කමිටු ලේකම්වරිය වශයෙන් කටයුතු කරයි.

සාමාජිකයින් පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ පිටු අංක 117 සිට 120 දක්වා ඉදිරිපත් කෙරේ.

**ප්‍රධාන වගකීම්**

- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂවරුන් පත්කිරීම සහ නැවත පත්කිරීම සම්බන්ධ නිසි උපදෙස් යෝජනා කිරීම.
- සභාපතිවරයා විසින් ස්වාධීන සාමාජිකයින් සමග සාකච්ඡා කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රතිචාර දක්වයි.
- ආයතනික පාලන ව්‍යවස්ථාපිත මාර්ගෝපදේශ වෙත අනුකූලතාවය නිරීක්ෂනය කිරීම.
- වාර්ෂිකව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචන ක්‍රියාවලිය ස්ථාපනය කිරීම.

**අධිකාරිත්වය**

අවසන් තීරණයක් ගැනීම සඳහා කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. අවශ්‍ය අවස්ථාවන් වලදී සමාගමෙහි වියදමින් වෘත්තීය උපදෙස් ලබා ගැනීමට කමිටුවට හැකි වන අතර මෙය සමාගම් ලේකම්වරයා විසින් සම්බන්ධීකරණය කෙරේ.

## අනුප්‍රාප්තික සැලසුම්කරණය

සමාගම මේ වන විට එය ප්‍රවේශම් සහගතව සැලසුම් කරන ලද අනුප්‍රාප්තිකත්වයක් අවශ්‍ය වන ආකාරයේ පරිවර්තනීය ගමන් මගක නිරත වේ. කමිටුව මගින් අවශ්‍ය දිශානතිය සපයමින් අනුප්‍රාප්තික සැලසුම සමාලෝචනය කරන ලද අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කමිටුව විසින් සමාගමෙහි අනුප්‍රාප්තික අවශ්‍යතා සපුරාලීම සඳහා වන, ප්‍රතිපත්තියෙහි ඇතුළත් යෝජනා වෙත අඛණ්ඩවම සහාය දක්වන ලදී.

## අධ්‍යක්ෂවරුන්/ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය තෝරාගැනීම සහ පත්කිරීම

කමිටුව මගින් අධ්‍යක්ෂවරුන්/ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය තෝරාගැනීම සහ පත්කිරීම සම්බන්ධ විධිමත් හා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් අනුගමනය කෙරේ. එමගින්, සුදුසුකම්, හැකියාවන්, ස්වාධීනත්වය සහ සමාගම් පනතේ සහ/හෝ මූල්‍ය ව්‍යාපාර පනත සහ කවර හෝ සෙසු රෙගුලාසි ඇතුලුව නමුත් එයට සීමා නොවීඃ අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය පත්කිරීම සහ නැවත පත්කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කෙරේ.

## නිගමනය

කමිටුව මගින්, සමාගමෙහි ක්‍රමෝපායික අවශ්‍යතා සපුරාලීම සඳහා අභිමත විවිධත්වය තහවුරු කරමින්, නිසි නිපුණතා, දැනුම සහ පළපුරුද්ද සහිත නිසි අයදුම්කරුවන් තෝරාගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වයි.

**යූ. එල්. අශෝක ඩබ්. බණ්ඩාර**
කමිටු සභාපති

2022 ජූලි 26
කොළඹ

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව



"කමිටුවේ ප්‍රමුඛ අවධානය යොමුවූයේ කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් උද්ගත වූ සමාජ ආර්ථික අභියෝග හමුවේ ක්ෂේත්‍රයේ ණය ගුණාත්මකභාවය හානිවීම කෙරෙහිය. වසරේ අවසාන භාගයේදී, ආර්ථික අර්බුදය හේතුවෙන් වත්කම් ගුණාත්මකභාවය කෙරෙහි වූ බලපෑම කෙරෙහි එහි අවධානය යොමු විය."

2021 අංක 05 දරණ මූල්‍ය සමාගම් (ආයතනික පාලන) මාර්ගෝපදේශ 10.3 වගන්තිය ප්‍රකාරව සමාගමේ සහ සමූහයේ අවදානම් ස්වභාවයේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් සමාලෝචනය කිරීමේ සහ තක්සේරු කිරීමේ වගකීම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් මූලික වශයෙන් වගකිව යුතු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට ("BIRMC" හෝ "කමිටුව") පවරා ඇත.

### යොමු කොන්දේසි (TOR)

සමාගම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 31 දිනැති ආයතනික පාලන 2021 නියෝග අංක 05 ස්වේච්ඡාවෙන් ආදේශ කරගැනුනි.

ඉහත සඳහන් මාර්ගෝපදේශ වලට අනුකූලව, කමිටුව, සංයුතිය, වගකීම්, රැස්වීම් වාර ගණන සහ ගණපූරණය, වාර්තා කිරීම සහ කමිටුවේ අනෙකුත් ක්‍රියාපටිපාටිවලට අධිකාරිය/ නියෝජිතත්වය පවරා ඇති ආකාරය යොමු කොන්දේසිවල පැහැදිලිවම දක්වා ඇත.

### සංයුතිය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වන අතර ඔවුන් පිළිබඳ තොරතුරු 119 සිට 120 දක්වා වූ පිටුවල ඉදිරිපත් කොට ඇත:

| ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයාගේ නම | අධ්‍යක්ෂ තනතුරෙහි ස්වභාවය |
|---|---|
| චතුර ජේ. විජේතිලක මහතා | කමිටු සභාපති (විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ) |
| අසාම් ඒ. අහමත් මහතා | කමිටු සාමාජික (විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ) |
| කේ. සී. ජේ. සී ෆොන්සේකා මහතා | (විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ) |

| ආරාධනයෙන් නිතිපතා සහභාගී වන වෘත්තිකයින් |
|---|
| • ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී |
| • ජ්‍යෙෂ්ට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් |
| • නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන/ප්‍රධාන අවදානම් නිලධාරී |
| • නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් |
| • නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකරගැනීම් සහ පරිපාලන |
| • නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන |
| • අනුකූලතා නිලධාරී |
| • පීපල්ස් ලීසිං පරිපාලිතයන්හි ප්‍රමුඛ කළමනාකරණ පිරිස් |
| - ප්‍රධාන විධායක නිලධාරී - පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| - ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමටඩ් |
| - පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් භාර නිලධාරී |
| - ප්‍රධාන විධායක නිලධාරී - ලංකා එලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| - අධ්‍යක්ෂ - පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් |
| **සමාගම් ලේකම්** |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන/ප්‍රධාන අවදානම් නිලධාරී |

### රැස්වීම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කාරක සභාව කාර්තුමය රැස්වීම් හතක් (07) පවත්වා ඇත. කමිටුවේ සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි විය.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් සහභාගීත්වය (කාර්තුමය වශයෙන් හෝ අවශ්‍ය පරිදි පවත්වන ලදී)

| අංකය | අධ්‍යක්ෂකවරයාගේ නම | විධායක | විධායක නොවන | ස්වාධීන | ස්වාධීන නොවන | පැමිණි රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | චතුර ජේ. විජේතිලක මහතා කමිටු සභාපති | | ✓ | ✓ | | 7/7 |
| 2. | අසාම් ඒ. අහමත් මහතා කමිටු සාමාජික | | ✓ | | ✓ | 6/7 |
| 3 | කේ. සී. ජේ. සී ෆොන්සේකා මහතා කමිටු සාමාජික | | ✓ | | ✓ | 7/7 |

### අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම

පසුගිය කමිටුවේ විශේෂිත තීරණයන් හා නිගමනයන් ඇතුළත් ප්‍රධාන කරුණු තහවුරු කිරීම හා සම්මත කිරීම සඳහා ඊළඟ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලදී. ඉදිරිපත් කරන ලද සියළුම ප්‍රධාන කරුණු කමිටු සභාපති විසින් විධිමත් ලෙස අනුමත කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, අනුමිතීන් සහ / හෝ නිශ්චිත උපදෙස් ලබා ගැනීම සඳහා අදාළ අනුමත කිරීමේ වාර්තා යොමු කරන ලදී.

### ක්‍රියාකාරකම්

ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී සමාගම මුහුණ දෙන අභ්‍යන්තර / බාහිර අවදානම් සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු සිදුකිරීමට ඒකාබද්ධ හා අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඵලදායී ලෙස සහාය විය. කමිටුව විසින් ප්‍රධාන අවදානම් දර්ශක පදනම් කරගනිමින් හඳුනාගත් සියළුම ප්‍රධාන අවදානම් තත්ත්වයන් මාසිකව රැස්වීම්වලදී සමාලෝචනය කරනු ලැබේ.

### සාකච්ඡාවට භාජනය වූ ප්‍රධාන ක්ෂේත්‍ර සහ වෙන් කරන ලද කාලය




### ඒකාබද්ධ අවදානම් කළමනාකරණය

- කමිටුව මගින් 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගයට අනුව අවදානම් අභිරුචිය සම්බන්ධ ප්‍රකාශය සමාලෝචනය කොට වැඩිදියුණු කරන ලදී.
- කමිටුව මගින් 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගයට අනුව අවදානම් දරාගැනීමේ ප්‍රකාශය සහ මෙහෙයුම් වටපිටාවේ වෙනස්වීම් සමාලෝචනය කරන ලදී. සකසන ලද අවදානම් දරාග ැනීමේ සීමාවන්ට සාපේක්ෂව පීපල්ස් ලීසිං හි අවදානම් ස්වරූපය කාර්තුමය වශයෙන් සමාලෝචකය කරන ලදී.
- කමිටුව මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2020 අංක 06 දරණ ව්‍යාපාර ව්‍යාප්ති හා මෙහෙයුම් සම්බන්ධ මූල්‍ය ව්‍යාපාර පනත් නියෝගයෙහි දක්වා ඇති පරිදි ශාඛා මට්ටමේ අවදානම් තක්සේරු අවශ්‍යතාවය වෙත අනුගත වීම සඳහා සකසන ලද ශාඛාමය අවදානම් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කරන ලදී.
- පීපල්ස් ලීසිං සහ එහි පරිපාලිතයන්හි කාර්තුමය අවදානම් වාර්තා (අවදානම් පුවරු/ අවදානම් දර්ශක වාර්තා) සමාලෝචනය කෙරිණි. රැස්වීම් වලට සහභාගී වූ සියලුදෙනා සෑම අවදානමක්ම පරිපූර්ණ අයුරින් සමාලෝචනය කිරීම සඳහා දිරිගැන්වුනු අතර, රෙගුලාසියේ අවශ්‍යතාවයෙන් ඔබ්බට යමින් අදාළ විශ්ලේෂණයන් සිදුකිරීමට යොමු කෙරිණි.
- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ යොමු කොන්දේසි සමාලෝචනය කරන ලදී.
- සැලසුම් සැකසීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය සමාලෝචනය කොට අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

### කළමනාකරණ මට්ටමේ කමිටු ඇගයුම

- රැස්වීම්වල විශේෂිත කරුණු රැගත් වාර්තා සහ වත්කම් හා වගකීම් කමිටුවෙහි යොමු කොන්දේසි අනුව සිදුකරන ලද වාර්ෂික තක්සේරුව සමාලෝචනය කිරීමෙන් වත්කම් හා වගකීම් කමිටුව විසින් ඉටු කරනු ලබන කාර්යයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සමාලෝචනය කරන ලදී.
- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සමාලෝචනය කිරීමේ දී එහි රැස්වීම්වල විශේෂිත කරුණු දැක්වීම/ ප්‍රධාන කරුණු සටහන් කිරීම සමාලෝචනය කෙරුණු අතර ණය අවදානම් සහ මෙහෙයුම් අවදානම් පිළිබඳව ගන්නා ලද තීරණ සම්බන්ධයෙන්
- විශේෂ අවධානය යොමු විය.

### ණය අවදානම

- කෝවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් රට මුහුණ දී සිටින සමාජ-ආර්ථික අභියෝග මධ්‍යයේ කර්මාන්තයේ ණය ගුණාත්මකභාවය පිරිහීම පිළිබඳව කමිටුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. වසරේ අවසාන භාගයේදී, ආර්ථික අර්බුදය හේතුවෙන් වත්කම් ගුණාත්මකභාවය කෙරෙහි වූ බලපෑම කෙරෙහි එහි අවධානය යොමු විය.
- වත්කම් හා නිෂ්පාදන මත පදනම් වූ අක්‍රීය ණය විශ්ලේෂණයන් සහ අනෙකුත් ණය අවදානම් දර්ශක වන අංශ අනුව ණය සංකේන්ද්‍රණය සහ ඒකල ණය ගැනුම් සීමාවන්ට අනුකූල වීම වැනි ණය කළඹේ ගුණාත්මකභාවය පිළිබඳ සමාලෝචනය කෙරිණ.
- ලාභදායීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්තාව සම්බන්ධ වාස්තවික සාක්ෂි ඉහළයාමත් සමග අලාභ අනුපාත මට්ටම ඉහළයාමේ බලපෑම තක්සේරු කිරීම සඳහාකමිටුව මගින් ආතති පරීක්ෂාවන් සමාලෝචනය කරන ලදී.
- සමාගමේ වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුව සවිස්තරාත්මකව සාකච්ඡා කළේය.
- සමාගමේ ආන්තික වෙළඳ නිෂ්පාදන පිළිබඳ ණය ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටි සමාලෝචනය කෙරිණ.
- ණය අවදානම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ දී සිදු කරන ලදී. සාකච්ඡාසමාලෝචනය කරන ලදී.
- කමිටුව මගින් සංශෝධිත කපාහැරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කොට අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

### ද්‍රවශීලතාවය සහ වෙළඳපල අවදානම

- වසරේ අවසාන භාගයේදී, දැඩි කරන ලද වෙළඳපොල ද්‍රවශීලතාවය සහ ඉහළ යන පොලී අනුපාතයන්ට ප්‍රතිචාරයක් වශයෙන් ද්‍රවශීලතාවය සහ වෙළඳපල අවදානම කළමනාකරණය කෙරෙහි නිශ්චිතවම අවධානය යොමු කරන ලදී.
- පවත්වා ගෙන යන ලද ද්‍රවශීල වත්කම්වල ප්‍රමාණවත් බව සහ පරිණතභාවය නොගැලපීම, සංවේදීතා විශ්ලේෂණය සහ පොලී අනුපාත නැවතමිල නියම කිරීම පරතරය සමාලෝචනය කෙරිණ.
- ද්‍රවශීලතා ආතති පරීක්ෂණ ප්‍රතිඵල සහ අනිශ්චිත අරමුදල් මටට්ම්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කෙරිණ.
- ද්‍රවශීලතාවයේ හා වෙළඳපල අවදානම් කළමනාකරණයේ ඵලදායීතාවය තක්සේරු කිරීමේදී කමිටුවට ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් කමිටු රැස්වීම්වලින් ලබා ගත් ප්‍රධාන වාර්තා සමාලෝචනය කෙරිණ.

### මෙහෙයුම් අවදානම

- මානව සම්පත් හා වංචා ආදිය සම්බන්ධයෙන් පිහිටුවා ඇති ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර පාලන පද්ධතියේ ශක්තිය මත පදනම්ව තීරණය කරනු ලබන අසතුටුදායක ලෙසින් ශ්‍රේණිගත කරන ලද විගණනයන්හි තත්ත්වය සමාලෝචනය කරන ලදී.
- ශාඛා මට්ටමේ අවදානම් තක්සේරු වාර්තා, රන් පරීක්ෂාවන්, මෙහෙයුම් අවදානම ආශ්‍රිත අංශ පිළිබඳ විධායක අවදානම් කළමනාකරණ කමිටුවේ විවාදයන් පදනම් කරගනිමින් මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරන ලදී.

### තොරතුරු සහ සයිබර් ආරක්ෂණ අවදානම

- පරතර ඇගයුමක් සිදුකිරීම සමගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා වන තාක්ෂණික අවදානම් කළමනාකරණ හා නම්‍යශීලීත්වය සම්බන්ධ යෝජිත උපදෙස් පත්‍රිකාව පිළිබඳව විගණන කමිටුව සමග එක්ව, කමිටුව සමාලෝචනය කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ආශ්‍රිත වත්කම් කාණ්ඩ ගණනාවක් මත පදනම්ව සිදු කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවදානම් තක්සේරුව සහ ප්‍රධාන තොරතුරු නිලධාරී විසින් කාර්තුමය වශයෙන් ලබාදෙන වෙනස්වීම් කළමනාකරණය සම්බන්ධ අවදානම් තක්සේරුව සමාලෝචනය කරන ලදී.

### ව්‍යාපාර අඛණ්ඩතාව

- ව්‍යාපාරයේ අඛණ්ඩ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය සහ ආපදා ප්‍රතිසාධන සැලසුම්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කෙරිණ.

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

## නියාමන හා අනුකූලතා අවදානම

- නියාමන අවශ්‍යතා සමඟ සමාගමේ අනුකූලතාවය තක්සේරු කිරීම සහ අනුකූලතා කාර්යයේ ඵලදායීතාවය සමාලෝචනය කිරීම මෙන්ම අවදානම් දරා ගැනීමේ මට්ටම්වලට එරෙහිව අනුකූලතා තත්ත්වයන් නිරීක්ෂණය කිරීම.
- සමාගමේ මෙහෙයුම් වල සෑම අංශයකම නීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති වලට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා අනුකූලතා නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද අනුකූලතා වාර්තා සමාලෝචනය කිරීම.
- වාර්ෂික ආයතනික අනුකූලතා සැලැස්ම සහ සමූහ අනුකූලතා අවදානම් සැලැස්ම සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නව උපදෙස්,චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම.
- සමාගම මට්ටමින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණ අවදානම් තක්සේරු හා සමාලෝචනය කිරීම.
- 2021 අංක 05 දරණ ආයතනික පාලන නියෝගය අනුව සංශෝධිත ප්‍රතිපත්ති අත්පොත සමාලෝචනය කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.

## ක්‍රමෝපායික අවදානම

- ව්‍යාපාරික වටපිටාවේ වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගවල ඵලදායීතාවය සමාලෝචනය කරන ලදී.
- සකසන ලද අවදානම් දරා ගැනීමේ මට්ටම්වලට සාපේක්ෂව උපායමාර්ගික අවදානම් දර්ශක සමාලෝචනය කරන ලදී.

## පරිපාලිතයන්හි අවදානම් ස්වරූපය තක්සේරු කිරීම

එක් එක් පරිපාලිතයෙහි අවදානම් වාර්තාව සහ පීපල්ස් ලීසිං සමූහයේ සමස්ත අවදානම් වාර්තාව සමාලෝචනය කිරීමට හැකි වීම පිණිස සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, පහත සඳහන් පරිපාලිතයන්හි අවදානම් පුවරුව/ප්‍රධාන අවදානම් දර්ශක වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. උප සමාගම් සමාලෝචනයේ ප්‍රධාන අවස්ථා පහත දැක්වේ.

- **පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී**
  - කමිටුව විසින් ප්‍රතිරක්ෂණයේ ගුණාත්මකභාවය, ආයෝජන සංකේන්ද්‍රණයන් සහ ප්‍රධාන අවදානම් දර්ශක සමඟ පැහැර හැරීමේ අවදානම, මෙහෙයුම් අවදානම, ක්‍රමෝපායික අවදානම, අනුකූලතා අවදානම කාර්තුමය පදනම මත සමාලෝචනය කරන ලදී.
  - ශ්‍රී ලංකාවේ රක්ෂණ නියාමන කොමිෂන් සභාව (ඉහතදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලෙස හඳුන්වන ලද) විසින් නියාමනය කරන ලද අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධන ආකෘතියට පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී අනුකූල වීම පිළිබඳ කමිටුව සමාලෝචනය කළේය.
  - කමිටුව සමාගමේ අනාගත ක්‍රමෝපායන් සාකච්ඡා කොට සමාලෝචනය කරන ලදී.

- **පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ්**
  - වරප්‍රසාද නොලත්, ග්‍රාමීය හා නාගරික ජනගහනයේ මූල්‍යමය සම්බන්ධතාවය සහතික කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීමේ ව්‍යාපාරයට පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් සම්බන්ධ වන අතර වෙනස් අවදානම් ස්වරූපයක් සමඟ ක්‍රියාත්මක වේ.
  - සමාගමේ අවදානම් ස්වරූපය කමිටුව විසින් කාර්තුමය වශයෙන් සමාලෝචනය කරන ලද්දේ සකසන ලද අවදානම් දරගැනීමේ සීමාවන්ට එරෙහිව ය.
  - කමිටුව සමාගමේ අනාගත ක්‍රමෝපායන් සාකච්ඡා කොට සමාලෝචනය කළේය.

- **පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්**
  - විමර්ශනයට ලක් වන වසර තුළදී, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්හි මෙහෙයුම් ප්‍රධාන වශයෙන් තක්සේරු කිරීමේ සේවාවන්ට සීමා විය.
  - පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් උපකරණ වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය වශයෙන් සමාලෝචනය කළේය.
  - කමිටුව සමාගමේ අනාගත ක්‍රමෝපායන් සාකච්ඡා කොට සමාලෝචනය කළේය.

- **ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් - (පීපල්ස් ලීසිං බංග්ලාදේශ පරිපාලිතය)**
  - ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් උපකරණ පුවරු වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය වශයෙන් සමාලෝචනය කළේය.
  - සමාගමේ මෙහෙයුම් සහ අවදානම් අවම කිරීමේ උපායමාර්ග පැහැදිලි කිරීම සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ ඔස්සේ ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීම්වලට සහභාගී විය.

- **දේපළ සංවර්ධන පරිපාලිතයන්**
  - පීපල්ස් ලීසිං දේපල සංවර්ධන සමාගම සහ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටීස් ලිමිටඩ් විසින් ඉදිරිපත් කරන ලද අවදානම් දර්ශක වාර්තා කමිටුව සමාලෝචනය විසින් කළේය.
  - පදිංචිය පිළිබඳ විස්තර ඇතුළුව මෙම සමාගම්වල මෙහෙයුම් කමිටුව විසින් සමාලෝචනය කළේය.

අවදානම් සහ පාලන දෙපාර්තමේන්තුව ඉහත සඳහන් කළ පීපල්ස් ලීසිං පරිපාලිතයන් සමඟ සම්බන්ධීකරණය කර විවිධ අවදානම් දර්ශක සහ අතිරේක තොරතුරු මගින් අදාළ තොරතුරු කමිටුවට දැනුම් දුන්නේය.

## වෙනත්

- ආයතනික කළමනාකරණය, ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ සමීපව කටයුතු කළ අතර කමිටුව වෙත පැවරී ඇති අධිකාරී රාමුව හා වගකීම අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගන්නා ලදී.
- අවදානම් කළමනාකරණ උපායමාර්ග, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්ට අදාළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වගකීම් වල ක්‍රියාපටිපාටි අධීක්ෂණය කරන ලදී.
- සමාගමේ ප්‍රතිපත්ති, නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් දරාග ැනීමේ මට්ටම ඉක්මවා යන නිශ්චිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියා නිර්දේශ කෙරිණි.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී, සමාගමට සහ සමූහයට බලපෑමක් ඇති කළ හැකි උඩු යටි යොමු සහිත අවදානම් අවධාරණය කරමින් සමස්ත ව්‍යාපාර උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේදී අවදානම් රුචිය සහ දරා ගැනීමේ රාමුවට අනුකූලව කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහයෝගය ලබා දෙන ලදී.

**චනුර ජේ. විජේතිලක**
*සභාපති*
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2022 ජූලි 26
කොළඹ

# අනුකූලතා අවදානම් කළමනාකරණය

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (පීපල්ස් ලීසිං) හි අවදානම් තක්සේරුකරණ ආකෘතිය මගින්, සමාගමට අදාළ වන නීති රීති, රෙගුලාසි, ප්‍රමිති පමණක් නොව අභ්‍යන්තර ප්‍රතිපත්ති / ක්‍රියාපටිපාටි සහ චර්යාධර්ම පද්ධතියට අනුකූල වීම කෙරෙහි එලදායී නෛතික හා ප්‍රතිරූපමය තක්සේරුකරණයන් සිදු කරයි.

## අනුකූලතාවය සහ නියාමනමය අවදානම

අනුකූලතා සහ නියාමනමය අවදානම යනු, සමාගම අදාළ නීතිරීති සහ කොන්දේසි සහ චර්යාධර්ම සංග්‍රහයන් අනුකූල නොවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති විය හැකි නියාමනමය දඩ මුදල්, මූල්‍ය අලාභ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වෙත බාධා පැමිණවීම සහ කීර්තිනාමය හානිවීම ආශ්‍රිත අවදානමයි.

## අනුකූලතාවය සහ නියාමනමය අවදානම සම්බන්ධ එළඹුම

අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුව වාර්තා කරනු ලබන අනුකූලතා ක්‍රියාවලිය, නිරන්තර පදනමක් මත බාහිර හා අභ්‍යන්තර රෙගුලාසි වෙත සමාගමෙහි අනුකූලවීම තහවුරු වන පරිදි ස්ථාපනය කොට ඇත. මෙම අවදානම කළමනාකරණයේදී සමාගමෙහි සේවා වටපිටාව හා බෙදාහදාගත් වටිනාකම්ද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.




## පීපල්ස් ලීසිං හි අනුකූලතා අවදානම් කළමනාකරණ වැඩසටහන

GRI 205-1

### අනුකූලතාවය පවත්වාගෙනයාම

සමාගම මගින්, සේවකයින්ගේ අයිතීන් සහ වරප්‍රසාද මෙන්ම ඔවුන්ගේ කාර්යභාරයන් හා වගකීම් ආශ්‍රිතවද ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් රැසක් ස්ථාපනය කරනු ලැබ ඇත. ඒවා සිය දෛනික මෙහෙයුම් වලදී සහ අනපේක්ෂිත සිදුවීම් වලදී සේවකයින් හට ප්‍රයෝජනවත් වේ.

ලෝකයේ මූල්‍ය ආයතනයන් හි අනුකූලතාවයේ වැදගත්කම ඉහළ යමින් පවතී. පීපල්ස් ලීසිං මගින් අනුකූලතා අවදානම කළමනාකරණය කරනු ලබන්නේ "අදාළ නීතිරීති, රෙගුලාසි, චර්යාධර්ම සංග්‍රහ සහ යහ ක්‍රියාකාරකම් සම්මතයන් වෙත අනුකූල නොවීම හේතුවෙන් කිසියම් මූල්‍ය ආයතනයකට වෙත පැනවිය හැකි නෛතික හෝ නියාමනම සම්බාධක, මූල්‍ය අලාභයන් හෝ කීර්තිනාමය හානිවීමේ අවදානම වශයෙනි." මෙයට බැංකුකරණ හා මූල්‍ය ව්‍යාපාරික කටයුතු සිදුකිරීම (බැදියා පිළිගැටුම් ඇතුලුව), රහස්‍යභාවය හා දත්ත සුරක්ෂිතතාව සහ විශේෂයෙන්ම, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ත මූල්‍යකරණය වැළැක්වීමේ විධිවිධාන ඇතුලත් වේ.

අනුකූලතා ආකෘතිය සැකසීම හා මෙහෙයවීම සිදුකෙරෙනුයේ, ප්‍රමාණවත් විනිවිදභාවයකින් යුතුව අදාළ රෙගුලාසි නිසි පරිදි හදුනාගනිමින් කළමනාකරණය කල හැකි ආකාරයෙනි. සමාගම තුළ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, නිරීක්ෂණයේදී සහ ඒවාට අභියෝග කිරීමේදී අනුකූලතා අංශය දෙවන ආරක්ෂක වළල්ලක් මෙන් එලදායී අයුරින් සිය කාර්යභාරය ඉටු කරයි.

### අනුකූලතාවය නිරීක්ෂණය කිරීමේ ක්‍රමවේදය

තොරතුරු රැස් කිරීම, නිරීක්ෂණය, ගනුදෙනුකරුවන් පිළිබදව සොයාබැලීම, සහ අනුකූලතා පාලනයන් වර්තමාන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් වලට සමාගාමීව පවතින බවට තහවුරු කිරීම උදෙසා තාක්ෂණය යොදාගැනේ. වසර තුළදී, සමාගම මගින් සිය ගනුදෙනුකරුවන් පිළිබදව සොයාබැලීමේ පද්ධතිය තත් කාලීන විසදුමක් බවට අධිශ්‍රේණිගත කරන ලද අතර, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ත මූල්‍යකරණය වැළැක්වීමේ අරමුණින් යුතුව සැක සහිත ගනුදෙනු හදුනාගැනීම සහ වාර්තාකරණය සදහා ගනුදෙනු නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීමටද පියවර ගන්නා ලදී.

# අනුකූලතා අවදානම් කළමනාකරණය

### නායකත්වය

- අනුකූලතාවය සඳහා ප්‍රමාණවත් අරමුදල් සම්පාදනය සහ සේවකයින් ලබාදීම.
- අදාළ අංශය සමග කාර්යසාධන ඇගයුම් සිදුකිරීම තහවුරු කිරීම.

### ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සහ ආශ්‍රිත පාලනයන්

- විධිමත් නියාමනමය අනුකූලතා අවදානම් ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ ආශ්‍රිත පාලනයන් සම්බන්ධ ලේඛණ සැකසීම හා පවත්වාගෙන යාම.
- ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ ආශ්‍රිත පාලනයන් සම්බන්ධ ලේඛණ සුදුසු පරිදි නියාමනමය මාර්ගෝපදේශයන්ට අනුව සැකසීම.

### වාර්තාකරණය සහ සන්නිවේදනය

- වාර්තාකරණ අවශ්‍යතා, පුවරු නිර්මාණය සහ ප්‍රධාන අවදානම් දර්ශක හඳුනාගැනීම
- ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය, නියාමනයන් සහ අභ්‍යන්තර විගණන අංශය වෙත අඛණ්ඩ හා ආවර්තිත වාර්තාකරණය සැපයීම.
- අතිශය වැදගත් පණිවුඩ ලබාදීම සඳහා අනුකූලතා සන්නිවේදන සැලසුම සහ වාරගණන ස්ථාපනය කිරීම.
- වගකිව යුතු පාර්ශවයන් වෙත හඳුනාගත් අනුකූලතා ගැටලු ඉස්මතු කිරීම සඳහා විධිමත් සන්නිවේදන ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම.

### පාලනය

- පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම් ස්ථාපනය කිරීම
- අනුකූලතා සේවා වටපිටාවක් සැකසීම හා පවත්වාගෙනයාම
- අදාළ නියාමනමය අවශ්‍යතා සහ/හෝ පාලන හා කළමනාකරණ අනුකූලතාවය සම්බන්ධ සංරක්ෂණාගාරයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම.

### අවදානම් තක්සේරුකරණ වැඩසටහන/(න්)

- අදාළ ව්‍යාපාරික ධාරාවන් සහ පොදු සේවා ක්‍රියාකාරකම් වෙත නිර්වචනය කරන ලද නීතිරීති හා කොන්දේසි සිතියම්ගත කිරීම.
- පොදු අවදානම් භාෂාව, නිර්වචන සහ දරාගැනීමේ සීමාවන් ස්ථාපනය කිරීම.
- අවධානය යොමුවිය යුතු ඉහළ අවදානම් අනුකූලතා ක්ෂේත්‍රයන් ප්‍රමුඛතාකරණය හා හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.
- වැඩසටහනෙහි අනුකූතාවය සම්බන්ධ සෙසු සංරචකයන් සමග අවදානම් තක්සේරුකරණ වැඩසටහන අනුකූලනය.

### අභ්‍යන්තර පාලනයන්

- අභ්‍යන්තර ප්‍රතිපත්ති, අත්පොත්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ සැකසීම තහවුරු කිරීම.
- පද්ධති පාලනයන් සහ පද්ධති පරීක්ෂාවන් තහවුරු කිරීම.

### අනුකූලතා පුහුණුව

- අවදානම කෙරෙහි අවධානය යොමුකෙරෙන අනුකූලතා ඇගයුම් පැවැත්වීම.
- ව්‍යවසාය හා ව්‍යාපාරික ධාරාව/පොදු සේවා යන මට්ටම් දෙකෙහිදීම පුහුණු සැලසුම් සැකසීම.
- සුදුසු පරිදි කාර්යභාරන මත පදනම් වූ පුහුණු වැඩසටහන් සැකසීම.
- පුහුණු සැසි පැවැත්වීම.

### නියාමනමය අන්තර්ක්‍රියාකාරීත්වය සහ සම්බන්ධීකරණය

- මෑතකාලීන හා සැලසුම්ගත පරීක්ෂණ ක්‍රියාකාරකම් සහ සොයාගැනීම් සම්බන්ධ ව්‍යවසාය පුරා පැතිරුනු දැක්මක් පවත්වාගෙ නයාම.
- රෙගුලාසි සමග සන්නිවේදන ක්‍රියාපටිපාටීන් නිර්ණය කිරීම.
- නියාමනමය අවශ්‍යතා ලබාගැනීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සම්මත ක්‍රියාවලියක් ස්ථාපනය කිරීම.

### අනුකූලතා තාක්ෂණය

- විස්තරාත්මක අනුකූලතා අවශ්‍යතා සැකසීම.
- තාක්ෂණික පදනම් ඇගයුමට ලක් කිරීම සහ හැකි අවස්ථාවන්හිදී පවතින යටිතල පහසුකම් උපයෝගී කරගැනීම.
- අනුකූලතාවය මගින් උපයෝගී කරගනු ලබන වැදගත් තාක්ෂණික පදනම් හඳුනාගැනීම සහ ලේඛණගත කිරීම.

### අනුකූලතා නිරීක්ෂණය සහ පරීක්ෂාව

- අනුකූලතා අවදානම් ඇගයුම් ප්‍රතිපල මත පදනම්ව නිරීක්ෂණය හා පරීක්ෂාව සඳහා නිතර විෂයපථය ස්ථාපනය කිරීම.
- අනුකූලතා පාලනයන්හි අනුකූලතා නිරීක්ෂණ හා පරීක්ෂාවන් සැකසීම.
- අනුකූලතා පාලනයන්හි ආවර්තිත නිරීක්ෂණ හා පරීක්ෂාවන් සිදුකිරීම.

# අවදානම් කළමනාකරණ විමර්ශනය

GRI | 102-15

## සමාලෝචනය

පීපල්ස් ලීසිං මගින් අවදානම් කළමනාකරණය සම්බන්ධ පරම වගකීම දරනු ලබන අතර, අනාගත අවදානම් හඳුනාගැනීම, නිර්වචනය, මැනීම, නිරීක්ෂනය සහ කළමනාකරණය සඳහා පරිපූර්ණ අවදානම් කලමනාකාරන ආකෘතික රාමුවක් ස්ථාපනය කොට ඇත. මූල්‍ය ආයතනයක ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී ආවේණික අවදානම් සඳහා, නියාමන අවශ්‍යතා සහ සමාගමෙහි ව්‍යාපාරික අවශ්‍යතා වලට සමාගාමීව ඒවා නිරීක්ෂණය හා කළමනාකරණය උදෙසා වන පද්ධතීන්ගේ සහාය ඇතිව විශේෂඥයින් විසින් පැහැදිලිය නිර්වචනය කරන ලද ක්‍රියාවලීන් පවතී. එහි ව්‍යාපාරික ආකෘතිය උපකල්පිත අවදානම නිරූපනය වන පරිදි ප්‍රමාණාත්මක අවදානම් උපකල්පනය කිරීම මත පදනම් වන බැවින්, මූල්‍ය සමාගමකට බලාත්මක අවදානම් කළමනාකරණය අතිශය වැදගත් වේ. මූල්‍ය ආයතනයක් වශයෙන්, සමාගමෙහි ප්‍රධාන අවදානම් අතරට ණය, ද්‍රවශීලතා, වෙළඳපොල, මෙහෙයුම්, අනුකූලතා සහ ක්‍රමෝපායික අවදානම අතුළත් වන අතර ඒවා කෙරෙහි අපගේ පාලනයෙන් තොර බාහිර සාධක මෙන්ම අපගේ අභ්‍යන්තර ක්‍රමෝපායන්ද බලපායි.

ව්‍යාපාරික පරිසරයේ ගතික ස්වභාවය අපගේ දෛනික මෙහෙයුම් වලදී අප මුහුණපාන අවදානම් වල අනාගත බලපෑම ඉහළ නංවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ අරමුණු සාක්ෂාත් කරගැනීමේදී ඵලදායී අවදානම් කළමනාකරණය අතිශය වැදගත් වේ. පීපල්ස් ලීසිං මගින්, අප කෙරෙහි බලපෑ හැකි අවදානම් සහ අවස්ථාවන් හඳුනාගැනීම හා නිසි අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම උදෙසා අවදානම් කළමනාකරණ ආකෘතියක් ක්‍රියාවට නංවනු ලැබ ඇත.

## අවදානම් කළමනාකරණ එළඹුම

අවදානම් කළමනාකරණය ආශ්‍රිත සිය කාර්යභාරයන් ඉටුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය හා අනුකමිටු වෙත සහායවීම උදෙසා වන අවදානම් කළමනාකරණ අංශයක් සමාගම සතු වේ. එම අංශය මගින්, අනාගත අවදානම් හඳුනාගැනීම සඳහා අපගේ ක්‍රමෝපායික ඉලක්ක සපුරාගැනීම කෙරෙහි බලපෑ හැකි අවදානම් සම්බන්ධ පරිපූර්ණ තක්සේරුවක් සිදුකෙරෙන අතර අවශ්‍ය නම්, අප විසින් නිර්වචනය කරන ලද අවදානම් අභිරුචිය තුළ අදාළ අවදානම් පහත හෙළීම සඳහා ප්‍රතිපියවර ගනු ලැබේ.

## අවදානම් අභිරුචිය

ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී අවදානම් භාරගැනීම නොවැළැක්විය හැකි අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, හඳුනාගත් ප්‍රධාන අවදානම් සඳහා වන අවදානම් අභිරුචිය නිර්වචනය කරමින් කළමනාකාරීත්වය වෙත පැහැදිලි උපදෙස් ලබා දී ඇත. අවදානම් අභිරුචිය යනු අපගේ අරමුණු සාක්ෂාත් කරගැනීමේදී පිළිගත හැකි යැයි අප සළකන අවදානම් මට්ටම වන අතර එය නිරීක්ෂණයේ පහසුව තකා එක් එක් අවදානම් කාණ්ඩය යටතේ අවදානම් දරාගැනීමේ සීමාවන් වශයෙන් ප්‍රමාණාත්මක පරාමිතීන් අනුව ප්‍රකාශයට පත් කෙරේ.

| පරිසරය | අවදානම් කාණ්ඩය | ප්‍රවණතාවය | අවදානම් දර්ශකය | උපරිම අවදානම දරාගැනීමේ සීමාව | 31.03.2022 දිනට අවදානම් ස්ථාවරය | 31.03.2021 දිනට අවදානම් ස්ථාවරය |
|---|---|---|---|---|---|---|
| I | ණය අවදානම | ▲ | අක්‍රීය අත්තිකාරම් අනුපාතය (දළ) | <5% | 8.78 | 11.30 |
| | | | මාස තුන කල් ඉක්මවූ අනුපාතය (දළ) | <10% | 8.42 | 11.13 |
| | | | ලාභ සහ අලාභ ගාස්තු අනුපාතය (ලාභය මත) | <20% | 12.33 | 20.56 |
| | | | අක්‍රීය ණය/අපහායන ආවරණ අනුපාතය | <75% | 81.90 | 70.95 |
| I | ණය සංකේන්ද්‍රණ අවදානම | − | කේවල/සමූහ ණයගැති සීමාව | ශ්‍රීලංමබැ අනුව | අනුකූල විය | අනුකූල විය |
| | | | ලකුණු තත්වය | <0.40 | 0.23 | 0.22 |
| I | ද්‍රවශීලතා අවදානම | ▲ | ද්‍රවශීල වත්කම් අනුපාතය | >100% | 148.88 | 194.90 |
| | | | කල්පිරීමේ නොගැලපුම් අනුපාතය (වසරක් දක්වා) | >-45% | -22.84 | -31.93 |
| | | | ස්ථාවර මූලයන් වෙතින් පිරිනමන ලද පහසුකම් | <150% | 101.59 | 106.71 |
| | | | කෙටිකාලීන වගකීමට ද්‍රවශීල වත්කම් අනුපාතය | >30% | 232.33 | 155.40 |
| | | | උපරිම කේවල තැන්පත්කාර සංකේන්ද්‍රණය | <5% | 4.53 | 4.11 |
| | | | සම්භාර තැන්පතු වෙත නිරාවරණය (මිලයන 50 ට වැඩි) | <20% | 20.54 | 21.61 |
| E | වෙළඳපොල අවදානම | ▲ | පොලී අනුපාත සංවේදීතාවය | <6% | -1.92 | -0.43 |
| | | | ප්‍රතිමිලකරණ පරතර අනුපාතය (මාස 3 දක්වා) | >-20% | 4.07 | 1.72 |
| I | මෙහෙයුම් අවදානම | ▲ | හඳුනාගත් වංචා (මෙහෙයුම් වියදම් වල ප්‍රතිශතයක් වශයෙන්) - මූල්‍ය වර්ෂය 2021/22 | <0.5% | 0.16 | 0.18 |
| | | | සෑහීමකට පත්විය නොහැකි විගණන - මූල්‍ය වර්ෂය 2021/22 | <15% | 3.13 | Nil |
| | | | සේවක පිරිවැටුම් අනුපාතය | <15% | 9.84 | 6.52 |
| | | | ආදායමට පිරිවැය අනුපාතය | <50% | 43.74 | 41.32 |

| පරිසරය | අවදානම් කාණ්ඩය | ප්‍රවණතාවය | අවදානම් දර්ශකය | උපරිම අවදානම දරාගැනීමේ සීමාව | 31.03.2022 දිනට අවදානම් ස්ථාවරය | 31.03.2021 දිනට අවදානම් ස්ථාවරය |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන් | | | |
| E | නියාමන අවදානම | − | ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය | >10.0% | 18.76 | 17.72 |
| | | | මුලු ප්‍රාග්ධන අනුපාතය | >14.0% | 19.67 | 18.58 |
| | | | ප්‍රාග්ධන අරමුදල් අනුපාතය | >12.5% | 37.53 | 33.83 |
| I | ක්‍රමෝපායික අවදානම | ▲ | ස්කන්ධ මත ආදායම අනුපාතය | >15% | 12.74 | 12.49 |
| | | | වත්කම් මත ආදායම අනුපාතය | >3.5% | 3.85 | 3.49 |
| | | | ශුද්ධ පොලී තීරුව | >7.5% | 8.11 | 7.58 |
| | | | තෝලන අනුපාතය | <7 Times | 3.41 | 3.55 |
| I | තොරතුරු සුරක්ෂිතතා අවදානම | ▲ | තොරතුරු සුරක්ෂිතතා සිදුවීම් කළමනාකරණය | ISO මගින් පරීක්ෂා කරන ලදී | පරීක්ෂා කරන ලදී | පරීක්ෂා කරන ලදී |
| | | | ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය - තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | පරීක්ෂා කරන ලදී | පරීක්ෂා කරන ලදී |
| | | | පිවිසුම් කළමනාකරණය | පරිශීලක පිවිසුම් සමාලෝචනය | අනුකූල විය | අනුකූල විය |

I අභ්‍යන්තර E බාහිර

## 2021/2022 අවදානම් වපසරිය

ප්‍රතිශක්තිකරණයේ පළමු මාත්‍රාව සාර්ථකව ලබාදීම හේතුවෙන් කිසියම් ස්ථාවර ආකාරයකින් වසර ආරම්භ විය. කෙසේවුවද, නව කොවිඩ් රැළි සහ ප්‍රභේදයන් හේතුවෙන් වසර තුළදී රට වසාදැමීම් සිදුකෙරුනු අතර එමගින් ස්ථාවර වෙමින් පැවති ව්‍යාපාරික කටයුතු අඩපණ විය. වසංගතයෙහි දිගු කාලීන බලපෑම හේතුවෙන් මෙරටට විදේශ විනිමය ලැබීම කෙරෙහි ප්‍රමුඛ දායකත්වයක් දක්වන සංචාරක කර්මාන්තය බිඳවැටුනු අතර විදෙස්ගත ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ පහළයාමද තත්ත්වය තවත් අයහපත් අතට හැරවීය. මූල්‍ය වර්ෂයේ දෙවන හා තෙවන කාර්තුවල ලබාදෙන ලද දෙවන මාත්‍රාව සහ සිව්වන කාර්තුවේදී ලබාදුන් බූස්ටර් එන්නත හේතුවෙන් වසර අවසානය වන විට තත්ත්වය තරමක් සාමාන්‍ය අතට හැරුනි. මගීන් ප්‍රවාහන සේවාවන් සඳහා පවතින ඉල්ලුම පහත හෙළමින් දිගු කාලයක් පාසැල් වසා තැබීම මෙහිදී සඳහන් කල යුතු වේ.

බොර තෙල් සහ එල්පී ගෑස් වල මිල ඉහළයාම හේතුවෙන් ආනයන වියදම ඉහළගිය අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් වසර තුළදී වෙළඳ හිගය පුළුල් වී උද්ධමනය ඉහළ ගියේය. වසර තුළදී ඉහළගිය උද්ධමනය වැය කල හැකි ආදායම සහ වේතන කෙරෙහි දැඩි බලපෑමක් ඇති කලේය. වසර තුළදී ඉහළ නංවන ප්‍රතිපත්ති අනුපාත සමගින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලද අතර පුළුල් වන වෙළඳ හිගය මගහරවා ගැනීම සඳහා භාණ්ඩ රැසක් සම්බන්ධයෙන් ආනයන සීමා පනවන ලදී. මෙහිදී වසංගතය ආරම්භයේ සිට පැවති තත්ත්වය තවත් අයහපත් අතට හරවමින්, විදුලිය, ගෑස් සහ ඉන්ධන හිඟය හමුවේ ව්‍යාපාර සහ නිවාස මෙන්ම මගී ප්‍රවාහනය කෙරෙහිද සෘණාත්මක බලපෑමක් ඇති විය.

ණය ආපසු ගෙවීම් මෙරට විදේශ විනිමය සංචිත කෙරෙහි දැඩි පීඩනයක් එල්ල කරනු ඇතැයි අපේක්ෂිත තත්ත්වයක් හමුවේ රටේ ස්වෛරී ශ්‍රේණිගත කිරීම් අවශ්‍රේණිගත කෙරිණි. ආහාර පිසීම සඳහා ගෑස් හිගයට අමතරව, ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය ඉන්ධන මිළදී ගැනීම සඳහා ශ්‍රී ලංකාව අපොහොසත් වීම හේතුවෙන් 2022 මාර්තු මස සිට දීප ව්‍යාප්ත විදුලි කප්පාදුවක් සිදුකෙරිණි. මෙහිදී සමාජ නොසන්සුන්තාවක් හටගත් අතර එමගින් රජය වෙනස් කිරීමේ දැඩි උද්ඝෝෂණ නිර්මාණය විය. නව මහ බැංකු අධිපතිවරයා පත්වීමෙන් අනතුරුව, වසර තුළ ඉහළගිය උද්ධමනය ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකාව 700 bps කින් පොලී අනුපාත ඉහළ නැංවීය. ආර්ථික විද්‍යාඥයන්ගේ නිර්දේශ මගින් ශ්‍රී ලංකාව 2022 අප්‍රේල් 12 වැනි දින ණය ආපසු ගෙවීම පැහැර හැරීමට තීරණය කල අතර සහන ණය පහසුකමක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා ඇරඹීය.

ඉතා මෑතකාලීනව, ෆිච් රේටින්ස් ලංකා සමාගම මගින්, බැංකු ක්‍රමය තුළ විදේශ විනිමය අරමුදල් සම්පාදන අසීරුතා සහ එමගින් ඇති කරන ලද පීඩනය හමුවේ, වාණිජ බැංකු 13 ක් සෘණාත්මක ශ්‍රේණිගත ("Rating Watch Negative") කිරීම් යටතට පත් කරන ලදී. අදාළ වාණිජ බැංකු 13 ලැයිස්තුවට ඇතුළත් නොවූ ලංකා බැංකුවද සෘණාත්මකව ශ්‍රේණිගත ("Rating Watch Negative") කෙරෙනු අතර රජයෙන් සහාය නොලැබෙන බවට වන සහායක ශ්‍රේණිය තහවුරු කරන ලදී. 2022 අප්‍රියෙල් 1 වැනි දින, ෆිච් රේටින්ස් ලංකා සමාගම මගින්, ශ්‍රී ලංකාවේ ඉහළ ගිය ආර්ථික හා මූල්‍ය අස්ථාවරත්වය මධ්‍යයේ, බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ණය ස්වරූපයන්හි ඉහළගිය අවගමනය පිළිබිඹු කරමින් පීපල්ස් ලීසිං ද ඇතුලුව බැංකු නොවන මූල්‍ය ආයතන 12 ක් සෘණාත්මකව ශ්‍රේණිගත ("Rating Watch Negative") කරන ලදී.
මෙමගින් මූල්‍ය පද්ධතියේ අවදානම් සහගත ස්වභාවය තුළ කවර හෝ මූල්‍ය ආයතනයක් සිය ද්‍රවශීලතාවය ප්‍රවේශමෙන් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වේ. ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් යථා තත්ත්වයට පත්වීම සඳහා ප්‍රයත්න දරන පසුබිමක් තුළ, මෙය එළඹෙන වසරේදී පීපල්ස් ලීසිං හි ප්‍රමුඛතාවය වනු ඇත. ගෙවුම් ශේෂය සහ වෙළඳ හිගයන් පාලනය කිරීම සඳහා, බදු ඉහළ නැංවීම, සහනාධාර පහත හෙළීම සෙසු සැළකිය යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම් ඔස්සේ ප්‍රතිපත්ති වටපිටාව දැඩිව පවත්වා ගෙන යනු ඇති බව අපගේ අපේක්ෂාව වේ.

# අවදානම් කළමනාකරණ විමර්ශනය

## බාහිරව බලපාන අවදානම්

| අවදානම | බලපෑම | පහත හෙළීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| බලශක්ති අර්බුදය සහ ඉන්ධන මිළ ඉහළ නැංවීම | • සමාගමෙහි අත්තිකාරම් කළඹ මගී ප්‍රවාහන ක්ෂේත්‍රය වෙත නිරාවරණය වේ | • අසීරුතාවයට පත් මගී ප්‍රවාහන ක්ෂේත්‍රය වෙත සහාය දැක්වීම සඳහා හිතමිතුරු වැඩසටහන අරඹන ලදී<br>• කල්බදු මත නැවත අත්පත් කරගැනීම තාවකාලිකව නවතා දමන ලදී |
| පුළුල් පරාසයක පැතිරුනු ආනයන සීමාවන් මගින් වර්ධන හැකියාව අඩාල කරන ලදී | • කල්බදු මෙහෙයුම් වර්ධනය සඳහා ප්‍රධාන අංශයක් වූ මෝටර් රථ ආනයන තහනම ප්‍රබල අහිතකර බලපෑමක් ඇති කලේය. | • ලියාපදිංචි මෝටර් රථ සඳහා සැලසුම් සැකසීම<br>• වෙනත් පහසුකම් සම්බන්ධ වර්ධනය අත්පත් කරගැනීම |
| ආර්ථික හා සමාජ අර්බුදය | • ගෙවුම් ශේෂ ගැටලු කළමනාකරණය සඳහා බදු ඉහළ නංවනු ඇතැයි ප්‍රබල ලෙස අපේක්ෂා කෙරේ.<br>• එළඹෙන වසරේදී ප්‍රතිපත්ති වෙනස්වීම් මගින් ආර්ථිකයේ සෙසු ක්ෂේත්‍රයන්ද බලපෑමට ලක් වනු ඇත. | • රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි සහාය දක්වමින් පීපල්ස් ලීසිං මගින්ද නව රෙගුලාසි මගින් නිර්ණය කරන ලද පරිදි බදු ගෙවනු ලැබේ |
| මුදල් ප්‍රතිපත්ති පියවර දැඩි කිරීම | • ද්‍රවශීලතා තත්වයන් සවිමත් කරමින්, ගනුදෙනුකරුවන් ඉහළ නංවන ලද පොලී යටතේ තැන්පතු වෙත නැවත යොමු වනු ඇති බව අපගේ අපේක්ෂාවයි<br>• වත්කම් හා වගකීම් වල සෘණාත්මක/ධනාත්මක නොග ැළපීම් හේතුවෙන් ඉහළ පොලී අනුපාතයන් ලාභදායීත්වය මත අයහපත්/යහපත් බලපෑමක් ඇති කරනු ඇත.<br>• ඉහළ පොලී අනුපාතයන් හේතුවෙන් ආයෝජන සහ ණය කළඹ වල වර්ධනය අඩාල වනු ඇත. | • තැන්පතු කළඹ වර්ධනය සඳහා ආකර්ශනීය පොලී අනුපාත<br>• වත්කම් හා වගකීම් නොගැළපුම් සම්බන්ධ ක්‍රියාකාරී කළමනාකරණය<br>• තෝරාගත් ක්ෂේත්‍රයන් වෙත ඉලක්කගත ණය අලෙවිකරණය |
| උද්ධමනකාරී පීඩනය | • ජනතාවගේ වැය කල හැකි ආදායම අඩුවීම<br>• ඉහළ මෙහෙයුම් පිරිවැය<br>• සමාජ නොසන්සුන් බව<br>• ව්‍යාපාර මත වේතන පීඩනය | • සමාගම පුරා පිරිවැය අරපිරිමැසුම් ව්‍යාපෘතීන් දියත් කරන ලදී<br>• විශේෂයෙන්ම සිල්ලර පහසුකම්වල ණය ගුණාත්මකභාවය සම්බන්ධ දැඩි නිරීක්ෂණය |
| රුපියල අවප්‍රමාණය වීම | • ආනයන ඉහළ මිලකින් යුතු හා මිළදී ගැනීමට අසීරු වේ<br>• මෝටර් ආනයන තහනම හේතුවෙන් ලියංපදිංචි මොටර් රථ වල වටිනාකම ඉහළයාම<br>• ණය සඳහා වන ඇපවල ඉහළගිය වටිනාකම | • ලියාපදිංචි මෝටර් රථ කෙරෙහි අවධානය යොමු කෙරිණි |
| භාණ්ඩ මිල අවදානම | • රන් මිල ඉහළ යනු ඇත<br>• ලෝක වෙළඳපොල තුළ ආහාර හා ඉන්ධන මිල ඉහළයාම හමුවේ මෙකී භාණ්ඩ වල මිල තවත් ඉහළ යනු ඇත | • රන් ණය සඳහා වටිනාකමට ණය අනුපාතය කළමනාකරණය<br>• සුදුසු ප්‍රතිචාර නිර්ණය කිරීම සඳහා වෙලපොලේ භාණ්ඩ වල ඉහළ ගිය මිලෙහි බලපෑම් නිරීක්ෂණය |
| පාස්කු ප්‍රහාරය සහ වසංගතයෙන් පසු පිරිනමන ලද පමාසහන අවසන් වීම | • පමාසහන යටතේ පැවති මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම ඇරඹීම හමුවේ මුදල් ප්‍රවාහ සවිමත් වනු ඇතැයි අපේක්ෂිතය | • ආතතිය සම්බන්ධ කල්තබා අනතුරු ඇඟවීම් සඳහා ණය කළඹ නිරීක්ෂණය<br>• මූල්‍ය පහසුකම් අවශ්‍යතාවය මත නැවත ප්‍රතිව්‍යුහගත කරීම |
| සයිබර් සුරක්ෂිතතාව | • සයිබර් ප්‍රහාරයන්හි ඉහළගිය සංකීර්ණත්වය සහ වාරගණන | • ශාඛා සඳහා ඉහළ නංවන ලද සයිබර් සුරක්ෂිතතාව සහ පරීක්ෂාව |

| අවදානම | බලපෑම | පහත හෙළීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|
| කෝවිඩ් 19 වසංගතයේ නව රැල්ලක්/ප්‍රභේදයක් පැතිරීම | • ව්‍යාපාර අඩාල වීම්<br>• අපගේ ශාඛා වෙත පැමිණෙන ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ සුරක්ෂිතතාව | • සේවකයින් සඳහා නිවසේ සිට වැඩ කිරීම සහ සේවා මුර වැනි විකල්ප සේවා ක්‍රම ක්‍රියාවට නැංවීම<br>• සියලුම ව්‍යාපාරික පරිශ්‍රයන්හි කෝවිඩ් 19 සඳහා ආරක්ෂණ ක්‍රියාමාර්ග ගන්නා ලදී |

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සමාගම මුහුණදෙන විවිධ අවදානම් පිළිබඳ අවබෝධය මත පදනම් වන අතර, එහිදී සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කරන ලද පූර්ව නිශ්චිත අවදානම් අභිරුචියට සාපේක්ෂව අවදානම් පූර්ව ආකාරයෙන් ඒවා තක්සේරුව, මැනීම සහ අඛණ්ඩ නිරීක්ෂණය සිදුකෙරේ.

ක්‍රමෝපායික සහ මෙහෙයුම් යන ආයතනික අරමුණු ද්විත්වයම අත්පත් කරගැනීම, සෑමවිටම සමාගමෙහි පාලනය තුළ නොපවතින බාහිර සිදුවීම් මත රඳා පවතී. එම නිසා, ඵලදායී අවදානම් කලමනාකරණ ආකෘතියක් මගින් සිය අධීක්ෂණ ක්‍රියාවලියේදී කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සාධාරණ සහතිකත්වයක් සපයනු ලබන අතර එහිදී කාලෝචිත අයුරින්, සමාගම කෙතරම් දුරට අදාළ අරමුණ අත්පත් කරගන ඇතිද යන්න පිළිබඳ දැනුවත්භාවය සැකසේ.

පීපල්ස් ලීසිං හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, සංදර්භය ස්ථාපනය, අවදානම් තක්සේරුව, අවදානම් පාලනය, අවදානම් නිරීක්ෂණය සහ නිරන්තර පදනමක් මත සමාගමෙහි අවදානම් ස්වරූපය වාර්තා කිරීම යන පියවර වලින් සමන්විත වේ. අවදානම් තක්සේරුවට අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය සහ අවදානම් සඳහා පිළියම් යෙදීම ඇතුළත් වේ.




| ක්‍රියාවලි සංරචකය | විස්තරය |
|---|---|
| **සන්දර්භය ස්ථාපනය** | මෙය අවදානම් කලමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ විෂයපථය නිර්වචනය කිරීමේ ක්‍රියාවලිය වේ. විෂයපථය මූලිකව සමාගමෙහි ක්‍රමෝපායික අරමුණු ආශ්‍රයෙන් නිර්ණය කෙරේ. පැහැදිලිව නිර්වචනය කරන ලද අරමුණු අදාළ අරමුණු ඉටු කරගැනීමේදී බලපෑ හැකි අවදානම් හඳුනාගැනීම කෙරෙහි උපකාරී වේ. මෙම අරමුණ උදෙසා, සමාගම මගින් සාර්ව ආර්ථික සාධක සහ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන හා අදාළ අරමුණු කෙරෙහි එවායේ බලපෑම තක්සේරු කෙරේ. මේ සම්බන්ධයෙන්, සමාගමෙහි කටයුතු පිළිබඳ අභිමතය සහ බලතල සහිත අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සම්බන්ධ පැහැදිලි අවබෝධයක් සමාගම සතු වේ. |
| **අවදානම් සිදුවීම් හඳුනාගැනීම** | සමාගමෙහි අරමුණු ඉටු කරගැනීම කෙරෙහි බලපෑ හැකි අභ්‍යන්තර සහ බාහිර සිදුවීම් වලින් උද්ගත විය හැකි අනාගත අවදානම් පිළිබඳව කාලෝචියක ආකාරයකින් හඳුනාගැනේ. මානසික විශුද්ධිකරණ සැසි, සිදුවීම් වාර්තාකරණය, ශාඛා මට්ටමේ ස්වයං අවදානම් තක්සේරු, අභ්‍යන්තර විගණන වාර්තා සොයාගැනීම්, PEST විශ්ලේෂණ වැනි මෙවලම් යොදාගැනීම්, තත්ව විමර්ශනයන් ආදිය ඔස්සේ අවදානම් හඳුනාගැනීම සිදුකෙරේ. |
| **අවදානම විශ්ලේෂණය සහ ඇගයුම** | අවදානම විශ්ලේෂණය, සමස්ත ශ්‍රේණිගත කිරීමක් අනුයුක්ත කිරීම, අවදානම් සිදුවීම් වල ප්‍රතිවිපාකයන් ඇතිවීමේ හැකියාව සහ පවතින පාලනයන් ඇගයුම සහ නිර්මිතිය සහ මෙහෙයුම් අතින් මෙකී පාලනයන්ගේ ඵලදායීත්වය නිර්ණය කිරීම යන කරුණු වලින් සමන්විත වේ. රදාපැවතිම් වලට සමෝධානික ආකාරයකින් අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා හඳුනාගත් අවදානම් විශ්ලේෂණය කිරීම අවශ්‍ය වේ. අවදානම විශ්ලේෂණය සහ ඇගයුම සඳහා ප්‍රමාණාත්මක මෙවලම් සහ ගුණාත්මක තොරතුරු යොදා ගැනේ. |
| **අවදානම් තක්සේරුව** | මෙම ක්‍රියාවලියට, අවදානම් ඇතිවීමේ හැකියාව සහ කවර හෝ අනාගත අවදානමක් අවම කිරීමේදී සමාගමෙහි ඉපැයුම් සහ ප්‍රාග්ධනය වෙත සිදු වන බලපෑම අනුව අවදානම් තක්සේරු කිරීම ඇතුළත් වේ. අවදානම සිදුවූ අවස්ථාවකදී සමාගමෙහි ඉපැයුම් සහ ප්‍රාග්ධනය වෙත සිදු වන බලපෑම අවබෝධ කරගැනීම සඳහා ප්‍රධාන අවදානම් කාණ්ඩයන් සම්බන්ධයෙන් ආතති පරීක්ෂාවන් සිදුකෙරේ. |

# අවදානම් කළමනාකරණ විමර්ශනය

| ක්‍රියාවලි සංරචකය | විස්තරය |
|---|---|
| අවදානම වෙත පිළියම් යෙදීම | අවදානම වළකාගැනීම, අවදානම පහත හෙළීම, අවදානම පිළිගැනීම සහ අවදානම් හුවමාරු/මාරුකිරීම පවතින අවදානම වෙත පිළියම් යෙදීමේ වරණයන් වන අතර එහිදී අවදානම් අභිරුචිය සමග ගැළපීම සඳහා සුදුසු අවදානම් ප්‍රතිචාරයන් තෝරාගැනේ. වඩාත්ම සුදුස අවදානම් ප්‍රතිචාරය තෝරාගැනීමේදී, එක් එක් ක්‍රියාකාරකම් සිදුකිරීමේ පිරිවැය සහ ප්‍රතිලාභ සැළකිල්ලට ගැනේ. |
| අවදානම පාලනය | මෙම සංරචකයට, සීමා ව්‍යුහයන්, ප්‍රතිපාදන අවශ්‍යතා සහ වාර්තාකරණ සම්මතයන් ඇතුලුව ප්‍රධාන පාලන ක්‍රියාවලීන් සහ ක්‍රියාකාරකම් ස්ථාපනය ඇතුළත් වේ. |
| නිරීක්ෂණය සහ වාර්තාකරණය | නිරීක්ෂණ පාලනයන් සහ අවදානම දරාගැනීමේ සීමාවන්ට අනුගතවීම සහ අවදානම් අභිරුචිය පාලනය හෝ අභිරුචිය උල්ලංඝනය කිරීම සම්බන්ධ කල්තබා අනතුරු ඇඟවීම් සපයයි. අනාගතයේදී සිදුවිය හැකි අවදානම් නිරාවරනයන්, සංකේන්ද්‍රණයන් සහ අවදානම භාරගැනීමේ ප්‍රතිඵල පිළිබඳව විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, ණය කමිටුව සහ ආයතනික කළමනාකාරීත්වය වෙත වාර්තා කෙරේ. |
| ඵලදායී සන්නිවේදනය | මෙයට සමාගම පුරා ඉහළට, පහළය සහ තිරස්ව පුළුල් අවබෝධයකින් යුතුව තොරතුරු ගලායාම ඇතුළත් වේ. එමෙන්ම, ඉහත දක්වන ලද ක්‍රියාකාරකම් අතර තොරතුරු ගලායන බවට සමාගම තහවුරු කරයි. |

## අවදානම් පාලනය

සමස්ත අවදානම් අභරුචිය සැකසීම සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව හරහා එය සිදු කෙරේ.

## අවදානම් පාලන ව්‍යුහය



## අවදානම් පාලන ආකෘතිය




### පළමු ආරක්ෂණ වළල්ල

දෛනික මෙහෙයුම් ක්‍රියාකාරකම් ආශ්‍රිත අවදානම් භාරගැනීම සහ කළමනාකරණය සම්බන්ධ මූලික වගකීම කළමනාකාරීත්වය (ක්‍රියාවලි හිමිකකරුවන්) සතු වේ. එයට අමතරව, පළමු ආරක්ෂණ වළල්ල පාලනයන් නිර්මාණය, මෙහෙයවීම සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධ වගවීමෙන් බැඳේ.

### දෙවන ආරක්ෂණ වළල්ල

මෙයට අවදානම් ක්‍රියාකාරකම, අනුකූලතාවය සහ ඇතැම් මූල්‍ය කරුණු, නෛතික හා බදු, සහ තොරතුරු සුරක්ෂිතතාවය ඇතුළත් වේ. ව්‍යාපාරික පාර්ශවයෙන් ස්වාධීනව, දෙවන ආරක්ෂණ වළල්ලේ අවදානම් හා පාලන ක්‍රියාකාරකම් පීපල්ස් ලීසිං වෙත බලපාන අවදානම් සම්බන්ධයෙන් ස්වකීය අනන්‍ය වූ මතයක් සකසයි.

මෙහි ක්‍රියාකාරකම් වනුයේ, අවදානම් හඳුනාගැනීම, මැනීම සහ වාර්තාකරණය වේ. දෙවන ආරක්ෂණ වළලලේ පාලන ක්‍රියාකාරකම් සමාගම තුළ අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් ආකෘතිය ආදිය සංගත ආකාරයෙන් ක්‍රියාවට නැංවීමට සහ ඒවා යොදාගනු ලබන ආකාරය අධික්ෂණය කිරීමට උපකාරී වේ. අනුකූලතාවය යනු, පීපල්ස් ලීසිං අනුකූලතා අවදානමට නිරාවරණය වීම වැළැක්වීම සහ පවතින නීතිරීති, රෙගුලාසි හෝ අභ්‍යන්තර නීති වලට අනුකූල නොවීම හේතුවෙන් සිදුවිය හැකි හානි වළක්වාගැනීම සඳහා වන ස්වාධීන ක්‍රියාකාරකමකි.

# අවදානම් කළමනාකරණ විමර්ශනය

**අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු**

| අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව - BIRMC | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව - BAC |
|---|---|
| **සභාපති:**<br>ස්වාධීන, විධායක නොවන අධ්‍යක්‍ෂ | **සභාපති:**<br>ජ්‍යෙෂ්ඨ ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂ |
| **සාමාජිකයින්:**<br>ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්‍ෂවරු දෙදෙනෙක්,<br><br>**නිරන්තර ආරාධිතයින්**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී<br>ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලනඃ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකිරීම් සහ පරිපාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන, අනුකූලතා නිලධාරී, පීපල්ස් ලීසිං පරිපාලිත සමාගම්වල නිලධාරී නියෝජිතයන් | **සාමාජිකයින්:**<br>විධායක නොවන අධ්‍යක්‍ෂවරු දෙදෙනෙක්<br><br>**ආරාධිතයින්:**<br>ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය. බාහිර විගණකවරු |
| **ප්‍රධාන කාර්යභාරයන්:**<br>සමාගමෙහි/සමූහයෙහි සමස්ත අවදානම් ස්වරූපය සමාලෝචනය | **කාර්යභාරයඃ**<br>මූල්‍ය වාර්තාකරණ සහ අභ්‍යන්තර පාලන අධීක්ෂණය සහ විගණකගේ ස්වාධීනත්වය නිරීක්ෂණය. |
| **රැස්වීම් වාර ගණනඃ**<br>කාර්තුමය, හදිසි කරුණු සම්බන්ධයෙන් විශේෂ රැස්වීම් කැදවනු ලැබේ. | **රැස්වීම් වාර ගණනඃ**<br>කාර්තුමය, හදිසි කරුණු සම්බන්ධයෙන් විශේෂ රැස්වීම් කැදවනු ලැබේ. |
| **වාර්තාකරණයඃ**<br>අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ | **වාර්තාකරණයඃ**<br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ |
| අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිටු අංක 170 සිට 172 දක්වා ඉදිරිපත් කෙරේ. | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිටු අංක 162 සිට 163 දක්වා ඉදිරිපත් කෙරේ. |

**විධායක මට්ටමේ කමිටු**

| වත්කම් හා වගකීම් කමිටුව - ALCO | විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව - EIRMC |
|---|---|
| **සභාපති**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී | **සභාපති**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන |
| **සාමාජිකයන්**<br>ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් සහ පාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකිරීම් සහ පරිපාලන, ජ්‍යෙෂ්ඨ කළමනාකරු ස්ථාවර තැන්පතු සහ ඉතුරුම්, ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මූල්‍ය, ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආයතනික මූල්‍ය, | **සාමාජිකයින්**<br>ආයතනික කළමනාකරණයේ සාමාජිකයින්, අනුකූලතා නිලධාරී<br><br>**නිරන්තර ආරාධිතයන්**<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මෙහෙයුම් |
| **කාර්යභාරයඃ**<br>සමාගමෙහි භාණ්ඩාගාර, වත්කම් හා වගකීම් ක්‍රියාකාරකම් සමාලෝචනය | **කාර්යභාරයඃ**<br>ණය සම්බන්ධ සහ මෙහෙයුම් අවදානම් සමාලෝචනය |
| **රැස්වීම් වාර ගණන**<br>මාසික. හදිසි අවශ්‍යතා මත විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. | **රැස්වීම් වාර ගණනඃ**<br>මාසික |
| **වාර්තාකරණය**<br>රැස්වීම් වාර්තා අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත සහ රැස්වීම් වැදගත් සිදුවීම් පිළිබඳ වාර්තාවක් කාර්තුමය පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කෙරේ | **වාර්තාකරණය**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත නිර්දේශ කිරීම රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කෙරේ |

| කළමනාකරණ ණය කමිටුව - MCC | තොරතුරු තාක්ෂණ නියමු කමිටුව - ITSC |
|---|---|
| **සභාපති:**<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් (කලාප 1) | **සභාපති**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී |
| **සාමාජිකයින්**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්, සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් හා පාලන (ඡන්ද රහිත සාමාජික), ජ්‍යෙෂ්ඨ කළමනාකරු සාධකකරණය, ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආන්තික වෙළදාම , ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආයතනික මූල්‍ය | **සාමාජිකයින්**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ, තොරතුරු සුරක්ෂිතතා නිලධාරී, - (ජාල/සර්වර් කළමනාකරණ/මෘදුකාංග/දෘඩාංග/නව ව්‍යාපාර සැකසුම), කළමනාකරු - සැලසුම්කරණ හා ක්‍රමෝපාය<br><br>**ස්ථිර ආරාධිතයින්:**<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් හා පාලන, ජ්‍යෙෂ්ට කළමනාකරු - අනුකූලතා |
| **ප්‍රධාන කාර්යභාරයන්:**<br>ණය පහසුකම්, ණය පරිපාලනය ආශ්‍රිත ක්‍රියාපටිපාටීන් සහ ණය ක්‍රියාවලීන් සමාලෝචනව සහ නිර්දේශ කිරීම/අනුමත කිරීම | **ප්‍රධාන කාර්යභාරයන්:**<br>ව්‍යාපෘති ප්‍රතිදාන සිදුකිරීම තහවුරු කිරීම සඳහා සහාය, උපදෙස් ලබාදීම, සුරක්ෂිතතා වැඩසටහන් වල තොරතුරු සමාලෝචනය, සහ වෙනත් තොරතුරු තාක්ෂණ ආශ්‍රිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් |
| **රැස්වීම් වාර ගණන**<br>දෛනිකව පෙර එකගත්වයට පත් වේලාවකදී | **රැස්වීම් වාර ගණන**<br>සෑම මාස දෙකකටම වරක් සහ හදිසි අවශ්‍යතා සඳහා ඕනෑම විටකදී |
| **වාර්තාකරණය:**<br>ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ණය යෝජනා සම්බන්ධ නිර්දේශ කිරීම | **වාර්තාකරණය:**<br>අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම |

**අවදානම් සහ පාලන අංශය**

අවදානම් හඳුනාගැනීමේ, තක්සේරුකරණයේ සහ අවම කිරීමේ, අවදානම අවම කිරීමේ ක්‍රමවේද සොයාගැනීමේ, කල්තබා අනතුරු ඇඟවීමේ සංඥා නිරීක්ෂණය කිරීමේ, අනාගතයෙහි සිදුවිය හැකි අලාභයන් පුරෝකතනය කිරීමේ සහ අලාභ/පාලනය/අවදානම මාරුකිරීම සම්බන්ධ ක්‍රියාකාරී වගකීම අවදානම් හා පාලන අංශය සතු වේ. 179 සිට 181 පිටු වල දක්වා ඇති අවදානම් කළමනාකරණ ආකෘතිය මගින්, ක්‍රමෝපායික සැලසුමෙහි හා අවදානම් අභිරුචියෙහි විස්තර කොට ඇති ක්‍රමෝපායික අවධානය සැළකිල්ලට ගනිමින්, අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමෝපායයන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සැකසීම හා ක්‍රියාවට නැංවීම සිදුකෙරේ.

**අනුකූලතා අංශය**

අනුකූලතා අංශය පීපල්ස් ලීසිංහි අභ්‍යන්තර පොලිස් බලකාය වශයෙන් කටයුතු කරයි. එමගින් මූල්‍ය ආයතනය අදාළ නීතිරීති, රෙගුලාසි වලට අනුකූල වන බවට තහවුරු කරමින්, පීපල්ස් ලීසිංහි සුපිළිපන්බව සහ කීර්තිනාමය සුරකීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කෙරේ. එහි ක්‍රියාකාරීත්වය පිටු අංක 173 සිට 175 දක්වා ඉදිරිපත් කෙරේ.

**තෙවන ආරක්ෂණ වළල්ල**

තෙවන ආරක්ෂණ ස්ථරය අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් දෙපාර්ශ්වයම මගින් ක්‍රියාවට නැංවේ. ඔවුන් සමාගමෙහි කොටසක් වන බැවින් සහ නිර්මිතියෙන්ම ස්වාධීන වන බැවින් මෙම මාදිලියේදී අභ්‍යන්තර විගණකවරුනගේ භූමිකාව ප්‍රබල වේ.

අවදානම් කළමනාකරණ සැකසුම සහ ක්‍රියාවට නැංවීම සමාලෝචනය සහ ඇගයීම සිදුකරමින් පළමු හා දෙවන ආරක්ෂණ වළල්ලේ ඵලදායීත්වය තහවුරු කිරීම අභ්‍යන්තර විගණකවරුන්ගෙන් අපේක්ෂිතය.

නිවැරදිබව සහ අනුකූලතාවය සම්බන්ධයෙන්න මූල්‍ය වාර්තා විගණනය හා ඇගයුම, අභ්‍යන්තර පද්ධතීන් පරීක්ෂාව සහ අවදානම් කළමනාකරණ ශිල්පක්‍රම ඇගයුමට ලක් කිරීම බාහිර විගණකවරුන්ගේ වගකීම වේ.

**අවදානම් සංස්කෘතිය**

අවදානම් පිළිබඳව සේවකයින්ගේ දැනුවත්භාවය සහ අවදානම් ආශ්‍රිතව දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීම සවිමත් අවදානම් සංස්කෘතියක ලක්ෂණ වේ. පීපල්ස් ලීසිංහි අවදානම් සංස්කෘතියට අවදානම් පාලන ව්‍යුහය, අවදානම් රුචිය, ප්‍රතිපත්ති රාමුව, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන රාමුව මත ගොඩනැංවේ. අවදානම් පාලන දෙපාර්තමේන්තුව සියලුම සේවකයින්ට පුහුණුව/දැනුවත් කිරීම් ලබා දෙනු ලැබේ.

පීපල්ස් ලීසිං මගින්, හඳුනාගත් අවදානම් නිසි පරිදි අනාවරණය කෙරෙන සහ අනපේක්ෂිත සිදුවීම් සිදුවූ වහාම වාර්තා කෙරෙන ආකාරයේ විවෘත හා විනිවිදභාවයෙන් යුතු අවදානම් සංස්කෘතියක් නිර්මාණය කිරීම කෙරෙහි ප්‍රයත්න දරනු ලැබේ. අවදානම් කළමනාකරණ මූලධර්ම දෛනික ව්‍යාපාරික කටයුතු වලට ඇතුළත් වන බවට තහවුරු කිරීම උදෙසා අවදානම් පාලන අංශය මගින් අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සැකසීම හා ක්‍රියාවට නැංවීම සිදු කෙරේ.



# අවදානම් කළමනාකරණ විමර්ශනය

### ණය අවදානම

කෝවිඩ් 19 වසංගතය සහ පාස්කු ප්‍රහාරය හේතුවෙන් වසර තුනක් පැවති ව්‍යාපාරික බාධා වලින් පසු යථා තත්ත්වයට පත් වෙමින් සිටින විට මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ණය අවදානම කැපී පෙනෙන ගැටලුවක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ක්ෂේත්‍රය තුළ බොහෝ සමාගම් ණය අවදානම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලීන් සවිමත් කිරීම සඳහා සැළකිය යුතු සම්පත් වෙන් කලේය. මුළු අත්තිකාරම් වලට දළ අක්‍රීය අත්තිකාරම් වශයෙන් මනිනු ලබන බැංකු නොවන මූල්‍ය ක්ෂේත්‍රයේ වත්කම් ගුණාත්මකභාවය, 2021 මාර්තු පැවති 11.29% සිට 2021 දෙසැම්බර් වන විට 11% ක සුලු වර්ධනයක් වාර්තා කලේය. මෙකී සංඛ්‍යාවන් පමාසහන යටතේ පවතින ණය සක්‍රීය ණය වශයෙන් සළකන අතර, 2022 මැයි මස පමාසහන අවසන් වීමත් සමග 2022 ජූනි මස වන විට ණය ගුණාත්මකභාවය කෙරෙහි දැඩි පීඩනයක් එල්ල වනු ඇත.

### විමර්ශනය

**නිර්වචනය**

මූල්‍ය සාධනපත්‍රයක් වෙත ගනුදෙනුකරුවකු හෝ ප්‍රතිපාර්ශ්වයක් එහි ගිවිසුම්ගත වගකීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් සමාගම වෙත මූල්‍ය අලාභයෙහි අවදානම වේ.

**ණය අවදානම් සංරචක**

1. පැහැරහැරීමේ අවදානම
2. සංකේන්ද්‍රණ අවදානම
3. අයකරගැනීමේ අවදානම

| විගණනය කරන ලද | 2021/22 උපරිම නිරාවරණය රු.'000 | 2020/21 උපරිම නිරාවරණය රු.'000 |
|---|---|---|
| **උපරිම ණය නිරාවරණය** | | |
| දළ ණය සහ ලැබිය යුතු දෑ | 161,162 | 150,656 |
| **හානිකරණය සඳහා වෙන් කිරීම** | | |
| කේවල හානිකරණය | (1,655) | (1,168) |
| සාමූහික හානිකරණය | (8,233) | (8,100) |
| **ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ** | 151,274 | 141,388 |
| ණය සහ ලැබිය යුතු දෑවල සාධාරණ අගය | 161,878 | 163,635 |

### අක්‍රීය ණය අනුපාතය සහ මුළු හිග මුදල




### ප්‍රතිපාදන ආවරන අනුපාතය




පීපල්ස් ලීසිං ප්‍රතිපාදන ආවරණ අනුපාතය ණය අවදානම සඳහා වන විචක්ෂණශීලී ප්‍රතිපාදන ප්‍රතිපත්ති ඔස්සේ ක්ෂේත්‍රයේ මට්ටම් වලට ඉහළින් පවත්වා ගැනිනි.

ණය අවදානම පාලනය




ණය අවදානම කළමනාකරණ ක්‍රියාවලිය

| ක්‍රමෝපායික ව්‍යාපාර ඒකක | | | ණය අනුමැතිය | | ගෙවීමේ ඒකකය | අවදානම් හා පාලන අංශය |
|---|---|---|---|---|---|---|
| ණය අයදුම්පත සැකසීම | ණය ඇගයුම | අවදානම මිලකරණය සහ නීතිරීති හා කොන්දේසි නිර්ණය | විශේෂයෙන් ඇප ලියකියවිලි ඇතුලුව ලියකියවිලි වල සම්පූර්ණත්වය පරීක්ෂා කිරීම | අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ණය අනුමැති සීමාවන් අනුව ණය අනුමැතිය | ණය පහසුකම් පිරිනැමීම | පෙර (ණය අනුමැති ව්‍යුහයේ දක්වෙන පරිදි ස්වාධීනව) හා පසු ණය ලබාදීමේ කටයුතු සහ බැහැරකිරීමේ අලාභ සමාලෝචනයන් |

## 2021/22 ප්‍රධාන විශේෂතා

**ක්‍රියාවලිය සවිබලගන්වමින්**

- ණය පාලන දෙපාර්තමේන්තුව මගින් ඉහළ වටිනාකම සහිත ණය පහසුකම් සමාලෝචනය ඇතුළුව යෝජනා පත්‍ර සහ සක්‍රීය හා බැහැර කිරීමේ අලාභ පහසුකම් වල පශ්චාත් ණය ලබාදීමේ විමර්ශනයන් ඇගයීමට ලක් කරන ලදී. එහිදී හඳුනාගත් පරතරයන් අදාල අධිකාරීත්ව මට්ටම් වෙත දන්වන ලදී. (ශාඛා කළමනාකරුවන්, ප්‍රධාන කළමනාකරුවන්, කලාප ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරින්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන විගණන).
- විධායක අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් මසකට වරක් පවත්වන ලදී. විධායක අවදානම් කළමනාකරණ කමිටුව මගින් වත්කම් ගුණාත්මක අනුපාත වල සෘණාත්මක ප්‍රවණතා නිරීක්ෂණය කරමින් මෑතකාලීන එක් අවුරුදු ණය ලබාදීම හිඟ මුදල් වල ගණනය කිරීමක් වන ආසාදිත අනුපාතයන් ඇගයුමට ලක් කරන ලද අතර ණය මෙහෙයුම් ගැටලු පිළිබඳව සාකච්ඡා කොට ක්‍රියාමාර්ග ගනිමින් අදාළ නිරීක්ෂණයන් සිදු කරන ලදී.
- පවතින ණය අවදානම් ප්‍රතිපත්ති සඳහා සමාලෝචනයන් සිදුකරන ලදී.
- ණය අනුමැති සීමාවන් සමාලෝචනය කිරීම. අප විසින් ණය පරීක්ෂාව සහ ණය ගුණාත්මකභාවය වර්ධනය කිරීමට කැප වී ක්‍රියාකරන පසුබිමක් තුළ, වසර තුළදී ණය අනුමැති අධිකාරීත්වය මධ්‍යගතව ප්‍රධාන ශාඛාව වෙත ලබා දෙන ලදී.
- දේපල සඳහා ඇප තක්සේරු කිරීමට දේපල තක්සේරුකරුවන්ගේ මණ්ඩලයක් පවත්වා ගෙන යන ලද අතර අපගේ පද්ධතිය තුල අනුමත මෝටර් රථ තක්සේරුකරුවන්ගේ සංචිතයක් නිර්මාණය කරන ලදී.

# අවදානම් කළමනාකරණ විමර්ශනය

## ණය සංකේන්ද්‍රණය අවදානම කළමනාකරණය

### 2022 ණය පහසුකම අනුව සංකේන්ද්‍රණය




### 2021 ණය පහසුකම අනුව සංකේන්ද්‍රණය




- කල්බදු
- ණය
- ඉස්ලාමීය ණය පහසුකම අනුව

### 2022 ක්ෂේත්‍රය අනුව සංකේන්ද්‍රණය




### 2022 භූගෝලීය සංකේන්ද්‍රණය




### 2021 භූගෝලීය සංකේන්ද්‍රණය




- බස්නාහිර
- දකුණු
- මධ්‍යම
- සබරගමුව
- ඌව
- උතුරු
- උතුරු මැද
- නැගෙනහිර
- වයඹ

### 2021 ක්ෂේත්‍රය අනුව සංකේන්ද්‍රණය




- මූල්‍ය සේවා
- කෘෂිකර්ම
- නිෂ්පාදන
- සංචාරක
- ප්‍රවාහන
- ඉදිකිරීම්
- වෙළඳ
- සේවා
- කර්මාන්ත
- වෙනත්

### 2022 අත්තිකාරම් වල විශාලත්වය අනුව සංකේන්ද්‍රණය




### 2021 අත්තිකාරම් වල විශාලත්වය අනුව සංකේන්ද්‍රණය




- < රු. මිලියන 1
- රු මිලියන 1 සිට රු. මිලියන 10
- රු. මිලියන 10 සිට රු. මිලියන 100
- > රු. මිලියන 100

## ද්‍රවශීලතා අවදානම

කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් 2019දී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා අවම ද්‍රවශීල අවශ්‍යතාවය පහත හෙළන ලද බැවින් වසර තුළ දී වෙළඳපොලේ අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතුණි. එසේවුවද. 2021 දෙසැම්බර් අවසානය වන විට ක්ෂේත්‍රය මගින් පවත්වා ගෙන යන ලද ද්‍රවශීලතාව නියාමන අවම මට්ටමට වඩා ඉතා ඉහල අගයක පැවතුණි. නියාමන අවමය වන රුපියල් මිලියන 89.9 ට සාපේක්ෂව ක්ෂේත්‍රය තුළ පැවති සමස්ත ද්‍රවශීල වත්කම් රුපියල් බිලියන 155.9 ක් අතිරික්තයක් වශයෙන් වාර්තා විය. 2020 වාර්තා වූ 13% ට සාපේක්ෂව 2021 දෙසැම්බර් අවසානය වන විට ද්‍රවශීලතා අනුපාතය 14.1%දක්වා ඉහළ ගියේය. පීපල්ස් ලීසිං පහත දක්වෙන ක්‍රියාවලිය අනුගමනය කලේය.

## විමර්ශනය

**නිර්වචනය**
ගෙවිය යුතු අවස්ථාවේදී සමාගමෙහි වගකීම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් නොමැති වීමේ අවදානම හෝ එවැනි වගකීම් අතිරික්ත පිරිවැයක් දරමින් සපුරාලීමේ අවදානම් වේ. මුදල් ප්‍රවාහා ආශ්‍රිත කාල ගණනය සම්බන්ධ නොගැලපීම් හේතුවෙන් ද්‍රවශීලතා අවදානම උද්ගත වෙයි

**ද්‍රවශීලතා අවදානම් සංරචක**
- මහබැංකු ද්‍රවශීලතා අවදානම
- අරමුදල් සම්පාදන ද්‍රවශීලතා අවදානම
- වෙළදපොල ද්‍රවශීලතා අවදානම

**ණය ශ්‍රේණිගත කිරීම**
ෆිච් රේටින්ග් ලංකා වෙතින් A+(lka)

### ද්‍රවශීල වත්කම් සඳහා ආතති පරීක්ෂාව (තැන්පතු වල එක්ෂණ ආපසු ගැනීම)

| අවස්ථාව | 1 | 2 | 3 |
|---|---|---|---|
| කම්පනයේ විශාලත්වය | 10% | 15% | 20% |
| ද්‍රවශීල වත්කම් අනුපාතය* | 72.46% | 28.57% | (19.89)% |
| අසම්භාව්‍ය අරමුදල් වලට ගැලපීමෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය* | 207.83% | 170.65% | 129.59% |

** ද්‍රවශීල වත්කම් අනුපාතය: පවතින ද්‍රවශීල වත්කම්/ශ්‍රීලංමබැ නියෝගය අනුව අවශ්‍ය ද්‍රවශීල වත්කම්*

### මුළු ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීල වත්කම් අනුපාතය




** ද්‍රවශීල වත්කම් අනුපාතය: පවතින ද්‍රවශීල වත්කම්/ශ්‍රීලංමබැ නියෝගය අනුව අවශ්‍ය ද්‍රවශීල වත්කම්*

### අවදානම් බර තබන ලද වත්කම් වෙත මූලික ප්‍රාග්ධනය




### අවදානම් බර තබන ලද වත්කම් වෙත ප්‍රාග්ධන පදනම




### 2022 අරමුදල් සම්පාදන විවිධාංගීකරණය




### 2021 අරමුදල් සම්පාදන විවිධාංගීකරණය




- ස්ථාවර තැන්පතු
- කාලසීමා ණය
- සුරක්ෂිතකරණය
- ණයකර
- කෙටි කාලීන ණය
- ඉතුරුම් තැන්පතු
- මුදාරබා
- වෙනත

### ස්කන්ධ වෙත ණය ලබාගැනීම (වාර ගණන)



# අවදානම් කළමනාකරණ විමර්ශනය

## කල්පිරීමේ නොගැළපීම

2022 මාර්තු 31 දිනට වට්ටම් නොකළ මූල්‍ය වත්කම් හා වගකීම් වල කල්පිරීමේ සවිස්තරය




## ද්‍රවශීලතා අවදානම පාලනය




## ඵලදායී ක්‍රියාවලීන්

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේදී මූලු වත්කම් වලට සමානුපාතිකව ද්‍රවශීල වත්කම් හා වගකීම් කළමනාකරණය, වත්කම් හා වගකීම් වල කල්පිරීමේ සවිස්තරයන් සමීපව නිරීක්ෂනය කරමින් ව්‍යාපාරික අවශ්‍යතා පුරෝකථනය කිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් පවතින බවට තහවුරු කළ යුතු වේ. පීපල්ස් ලීසිංහි පවතින යාන්ත්‍රණයන් පහත දක්වේ.

**පවතින අඛණ්ඩ පියවර**

| භාණ්ඩාගාරය | වත්කම් හා වගකීම් කමිටුව | අවදානම් කළමනාකරණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩලය |
|---|---|---|---|
| • වත්කම් හා වගකීම් කමිටුව මගින් සකසන ලද පරාමිතීන් ඇතුළත දෛනික ද්‍රවශීලතා කළමනාකරණය<br>• නියාමන අවශ්‍යතාවයට ඉහළින් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යන ලදී<br>• සියලුම මුදල් පිටතට ගලා යාමේ බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් භාවිතයට නොගත් පහසුකම් පවත්වාගෙන යන ලදී<br>• ආතති පරීක්ෂා ප්‍රතිඵල ණය පාලන දෙපාර්තමේන්තුවට විසින් අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී<br>• වත්කම් හා වගකීම් කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරන ලදී | • කල්පිරීමේ නොගැලපීම් විශ්ලේෂණය, ද්‍රවශීල වත්කම් අනුපාතය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය වැනි ද්‍රවශීල අවදානම් දර්ශක පිළිබඳ මාසික සමාලෝචනය<br>• අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කොට ද්‍රවශීලතා අවදානම් සීමා කිරීම/පහත හෙළීම කළමනාකරණය සඳහා සුදුසු පියවර නිර්දේශ කරන ලදී<br>• නියාමනමය අවමයන් සමග අනුකූලතාවය තහවුරු කරනු පිණිස එළඹෙන වසර කීපය සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතයන් පුරෝකතනය කොට ඇත | • කාර්තුමය පදනමක් මත සිදුකෙරෙන ආතති පරීක්ෂාවන් සමාලෝචනය කරන ලදී<br>• ද්‍රවශීලතා ප්‍රමුඛ අවදානම් දර්ශක සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතයන් කාර්තුමය පදනමකින් සමාලෝචනය කරන ලදී | • පීපල්ස් ලීසිං හි ඒකාබද්ධ අවදානම් කළමනාකරණය පිළිබඳ මූලික වගකීම දරන ලදී |

## වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානමමෙහි විවිධ සංරචකයන් අතරින්, පොලී අනුපාත අවදානම කෙරෙහි නිරාවරණය වඩාත්ම සැළකිය යුතු වන අතර අනෙකුත් වෙළදපොල අවදානම් සංරචකයන් සාපේක්ෂව පහළ මට්ටමේ පවතී. කෙසේවුවද, වසර තුළදී රන් ණය ඉහළයාම කරණ කොටගෙන භාණ්ඩ මිල අවදානම ඉහළගිය අතර එය වටිනාකම් අනුපාත වෙත මධ්‍යස්ථ ණය මගින් කළමනාකරණය කෙරිණි. වසර ආම්භයේදී පහළ මට්ටමක පැවති පොලී අනුපාත, දෙවන කාර්තුව වන විට වසංගතය හේතුවෙන් ආදේශ කරගන්නා ලද ප්‍රමාණාත්මක සහන පියවර වල අවසානය සංඥා කරමින් ඉහළයාමේ ප්‍රවණතාවක් විදහා දක්වීය. ඉහළ යන උද්ධමනය ඇතුලුව ඉහළයමින් පවතින ආර්ථික අභියෝග හේතුවෙන් 2022 අප්‍රියෙල් 08 වැනි දින පොලී අනුපාත 700 bps වලින් ඉහළ නැංවුනි. ආර්ථික පුනර්ජීවනය උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සහනදායී මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. අපගේ ලාභ තීරු පවත්වා ගනු ලබන අතරතුර ව්‍යාපාර කටයුතු ආකර්ශනය කරගැනීම සඳහා තැන්පතු හා ණය ලබාදීමේ අනුපාතයන් ප්‍රතිමිලකරණය තහවුරු කිරීම උදෙසා අප විසින් වෙළද පොලී අනුපාතයන්හි සංචලනය සමීපව නිරීක්ෂණය කරන ලදී.

### විමර්ශනය

**නිර්වචනය**

විදේශ විනිමය අනුපාත, පොලී අනුපාත, කොටස් මිල සහ භාණ්ඩ මිල වැනි වෙළඳපල සාධකයන්හි සංචලනය හේතුවෙන් අපගේ වෙළදපොළ වටිනාකම හෝ ඉපැයුම් පහත වැටීමේ අවදානමයි.

**වෙළදපොළ අවදානමෙහි සංරචක**

| අවදානම් කාණ්ඩය | අවදානම් නිරාවරනය |
|---|---|
| පොලී අනුපාත අවදානම | ඉහළ |
| භාණ්ඩ මිල අවදානම | පහළ |
| ස්කන්ධ ආයෝජන අවදානම | නොසළකා හල හැකි |
| විදේශ විනිමය අවදානම | නොසළකා හල හැකි |

## පොලී අනුපාත සංවේදීතාවය

පොලී අනුපාතයන්හි ඉහළයාමක් අපේක්ෂා කරමින්, 2021/22 දී ශේෂ පත්‍රය සවිමත් කිරීම පිළිබිඹු කරමින් පීපල්ස් ලීසිං 10% කම්පන තත්ත්වයක වුවද නොසැලී අඛණ්ඩව කටයුතු කරයි. මෙමගින් අප හට 2022 අප්‍රියෙල් 8 සිදු කරන ලද 7% ක හදිසි ඉහළයාම දරාගැනීමට හැකි විය.

### ශුද්ධ පොලී ආදායම මත ආතති පරීක්ෂාව - පොලී අනුපාත කම්පන

| ශුද්ධ පොලී ආදායම මත බලපෑම<br>රු. 000 | 2021/22 | |
|---|---|---|
| | ඉහළයාම | පහළයාම |
| 5% | (77,864) | 77,864 |
| 7% | (109,010) | 109,010 |
| 10% | (155,728) | 155,728 |

### AWPLR සංචලන




### TB භාණ්ඩාගාර බිල්පත් අනුපාතයෙහි සංචලනය




### සාමාන්‍යය රන් මිල (කැරට් 24 පවුම්) සංචලනය



# අවදානම් කළමනාකරණ විමර්ශනය

### ශුද්ධ පොලී ආදායම සහ ශුද්ධ පොලී ආන්තිකයන්




### වෙළඳපොළ අවදානම පාලනය




### එළදායී ක්‍රියාවලීන්

| භාණ්ඩාගාරය | වත්කම් හා වගකීම් කමිටුව | අවදානම් කළමනාකරණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩලය |
|---|---|---|---|
| **පොලී අනුපාත අවදානම** | | | |
| • භාණ්ඩාගාරය මගින් නිරන්තරයෙන් පොලී අනුපාත වටපිටාව සහ ප්‍රමුඛ පොලී අනුපාත දර්ශක වල සංචලනය නිරීක්ෂණය කළේය. උදාහරණ; AWLPR සහ භාණ්ඩාගාර බැඳුම් බැඳුම්කර අනුපාත<br>• අපේක්ෂිත ලාභ තීරු පවත්වා ගැනීම සඳහා තැන්පතු සහ ණය ලබාදීමේ අනුපාත සම්බන්ධයෙන් තීරණ ගැනීමට වත්කම් සහ වගකීම් කමිටුව වෙත වාර්තාවක් සපයන ලදී | • පොලී අනුපාත ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණය සහ සංවේදීතා විශ්ලේෂණයක් සිදු කිරීම<br>• පොලී අනුපාත වටපිටාව සමාලෝචනය කරමින් අපේක්ෂිත ලාභ තීරු පවත්වා පවත්වාගෙන යන බවට තහවුරු කිරීම සඳහා තැන්පතු හා ණය ලබා දීමේ අනුපාතිකයන් නිර්ණය කරන ලදී | • පොලී අනුපාත සංවේදීතාවය පිළිබඳ කාර්තුමය සමාලෝචනය සහ පූර්ව නිර්වචනිත අවදානම් දරාගැනීමේ මට්ටම් වලට සාපේක්ෂව පරතර අනුපාතයන් ප්‍රතිමිලකරණය<br>• ශුද්ධ පොලී තීරුවේ පොලී අනුපාත කෙරෙහි බලපෑම සම්බන්ධයෙන් වන ආතති පරීක්ෂාව පිළිබඳ කාර්තුමය සමාලෝචනය සහ ලාභදායිතා සමාලෝචනය | • පීපල්ස් ලීසිංහි ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සම්බන්ධ මූලික වගකීම් දරන ලදී |
| **භාණ්ඩ මිල අවදානම** | | | |
| • මධ්‍යගතව ස්ථාපිත රන් අය ඒකකය මගින් ශාඛා ජාලය තුළ පවතින රන් ණය ඒකක නිරීක්ෂණය කෙරේ<br>• ණය පාලන දෙපාර්තමේන්තුව මගින් එදිනෙදා රන් මිල සංචලනයන් නිරීක්ෂණය කරමින් රන් මිල උච්චාවචනයන් ඇගයීමට ලක් කෙරේ | • රන් මිල සංචලනය, මිල උච්චාවචනය සහ සැලසුම් කාර්යසාධනය පිළිබඳ මාසික සමාලෝචනය<br>• රන් මිල සෘණාත්මක මිල සංචලනයන් වල කඩිනම් ඉහළ යාම සම්බන්ධයෙන් වහාම ක්‍රියාමාර්ග ගන්නා ලදී | | • පීපල්ස් ලීසිංහි ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සම්බන්ධ මූලික වගකීම් දරන ලදී |
| **ස්කන්ධ ආයෝජන අවදානම** | | | |
| • ආන්තික වෙළඳාම් දෙපාර්තමේන්තුව නිරන්තරයෙන්ම කොටස් වෙළඳපොළ මිල, සහ අනාගතයේ දී කොටස් මිල කෙරෙහි බලපෑමක් ඇති විය හැකි වඩාත් පුළුල් ආර්ථික තත්ත්වයන් සහ දේශපාලන වාතාවරණය පිළිබඳව නිරීක්ෂණය කරයි. | • විස්තරාත්මක ස්කන්ධ ආයෝජන වාර්තාව පිළිබඳ මාසික සමාලෝචනය<br>• අලාභ සීමාව නවතා ගැනීම සඳහා ස්කන්ධ ඉක්මවා යාම සම්බන්ධව ගත යුතු සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ තීරණය කරන ලදී | | • අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්කන්ධ ආයෝජන ප්‍රතිපත්තිය සහ කොටස් වෙළෙඳ ප්‍රතිපත්තිය අනුමත කරන ලදී<br>• පීපල්ස් ලීසිංහි ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සම්බන්ධ මූලික වගකීම් දරන ලදී |
| **විදේශ විනිමය අවදානම** | | | |
| • වසර තුළදී විවෘත ස්ථානයන්හි විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනු සිදු නොකරන ලදී | | | |

### මෙහෙයුම් අවදානම

ක්‍රියාකාරීත්වය කෙරෙහි ඇතිවූ පීඩනය හේතුවෙන් හැකි වංචා සහ දෝෂ ඇතිවීමේ හැකියාව වර්ධනය වීම ඇතුලුව, දිගු කාලීන සමාජ ආර්ථික ආතතිය හේතුවෙන් පූර්ව වසංගත අවධියට සාපේක්ෂව මෙහෙයුම් අවදානම් ඉහළ මට්ටමක පැවතිනි. පහරදීම් වල ඉහළගිය සංකීර්ණබව සහ වාර ගණන සමගින් සයිබර් තර්ජනද වර්ධනය විය. නිවසේ සිට වැඩ කිරීම, අන්තර්ජාල මාධ්‍ය ඔස්සේ ගනුදෙනු කිරීමට ගනුදෙනුකරුවන් දැක්වූ කැමැත්ත ආදිය හේතුවෙන් තත්ත්වය තවදුරටත් ඉහළ ගියේය. එහිදී ව්‍යාපාර අඛණ්ඩව සැලසුම්කරණය අතිශය වැදගත් වූ අතර අප විසින් අපගේ සැලසුම් නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම පරීක්ෂාව සිදුකෙරිණි. වසංගතය හේතුවෙන් සේවකයින්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පිළිබඳව පැවති අවධානය දූනට රටේ පවතින සමාජ නොසන්සුන්තාව හමුවේ ඔවුන්ගේ ශාරීරික ආරක්ෂාව වෙත මාරු වූ අතර මෙම තත්ත්වය තුළ මෙරට මූල්‍ය ආයතන සාපරාධී ක්‍රියාවන් සඳහා ඉලක්ක බවට පත්ව ඇත.

### විමර්ශනය

**නිර්වචනය**
ප්‍රමාණවත් නොවන සහ නොගැලපෙන අභ්‍යන්තර ක්‍රියාවලි, පද්ධති සහ පුද්ගලයින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් මෙහෙයුම් අවදානම උද්ගත වේ.

**ප්‍රධාන මෙහෙයුම් අවදානම්**
- වංචාව සහ දෝෂ
- සයිබර් තර්ජන
- ව්‍යාපාර අඛණ්ඩත්වය
- අපගේ පරිශ්‍රය තුළ ජනතාවගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාව

### මෙහෙයුම් අවදානම පාලනය




### කාන්ඩය අනුව මෙහෙයුම් අලාභ සිදුවීම්



# අවදානම් කළමනාකරණ විමර්ශනය

## මෙහෙයුම් අවදානම කළමනාකරණය

### හඳුනාගැනීම

- සිදුවීම් වාර්තාකරණ යාන්ත්‍රණය - මෙහෙයුම් අවදානම් සිදුවීම් හඳුනාගැනීමට සහ අවදානම් හා පාලන අංශය වෙත ඒවා යොමුකිරීම සඳහා මෙම යාන්ත්‍රණය ස්ථාපනය කොට ඇත.
- ශාඛාමය මෙහෙයුම් අවදානම් ස්වයං ඇගයුම - ශාඛාමය මෙහෙයුම් අවදානම් මට්ටම ඇගයීම සඳහා අවදානම් හා පාලන අංශය මගින් ශාඛාමය මෙහෙයුම් අවදානම ස්වයං ඇගයුම් ඇගයුමට ලක් කෙරේ.
- අවදානම් හා පාලන අංශය මගින් නිරන්තරයෙන් පරිශ්‍ර තුළ පරීක්ෂාවන් සිදුකෙරේ.
- අවදානම් හඳුනාගැනීම සඳහා අභ්‍යන්තර විගණන වාර්තා සොයාගැනීම්ද පාදක කරගැනේ.
- අවදානම් හා පාලන අංශය මගින් මෙකී මෙහෙයුම් අවදානම් සිදුවීම් පාදක කරගනිමින් මෙහෙයුම් අවදානම් දත්ත පදනමක් පවත්වාගෙන යනු ලබයි.

### තක්සේරු කිරීම

- ශාඛාමය මෙහෙයුම් අවදානම් ස්වයං ඇගයුම් පාදක කරගනිමින් විශ්ලේෂණ සිදු කිරීම.
- අවදානම් හා පාලන අංශය මගින් නිරන්තරයෙන් පරිශ්‍ර තුළ පරීක්ෂාවන් සිදු කරමින් ශාඛාමය මෙහෙයුම් අවදානම් ස්වයං ඇගයුම් වලංගු කිරීම සහ මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා නිසි මට්මේ දැනුවත්භාවයක් ලබාදෙන ලදී.

### නිරීක්ෂණය

- අවදානම් හා පාලන අංශය මගින් නිරන්තර නිරීක්ෂණ සිදුකරමින් ඉහළ මට්ටම් වලට අදාළ කරුණු යොමු කරන ලද අතර ක්‍රියාවට නැංවීම සඳහා සාධක පිළිබඳ පසුවිපරම් සිදුකරන ලදී. අංශය මගින් මෙහෙයුම් අලාභ සිදුවීම් සහ ආසන්න අතපසුවීම් ආශ්‍රිතව පවතින පාලනයන්හි බලාත්මක බව සමාලෝචනය කරමින් අදාළ පවතින පාලනයන් ප්‍රමාණවත් නොවන බව පෙනීයන්නේ නම් අමතර පාලනයන් යෝජනා කරන ලදී.

### පහත හෙළීම

- පහත දක්වෙන කරුණු සම්බන්ධයෙන් ඊ-දැන්වීම් පත්‍රිකා ඔස්සේ නිරන්තරයෙන් දැනුවත් කරන ලදී.
  - ව්‍යාපාර අඛණ්ඩව සැලසුම්කරණය
  - ගිනි සඳහා සූදානම
  - හදිසි අවස්ථා ප්‍රතිචාර
  - ප්‍රථමාධාර
- ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම යාවත්කාලීන කොට අභ්‍යාස පුහුණු කරන ලදී.
- සේවක සුරක්ෂිතතාවය තහවුරු කරන ලදී. උදා: නිවසේ සිට වැඩකිරීමේ කටයුතු
- මෙහෙයුම් අවදානම් කළමනාකරණය ආශ්‍රිත ප්‍රතිපත්ති සකසන ලදී
  - ශාඛා පරිශ්‍ර පිවිසුම්/දොර යතුරු සම්බන්ධ ක්‍රියාපටිපාටිය
  - ශාඛා ආරක්ෂණ ක්‍රියාමාර්ග සහ සුරක්ෂිතතා ක්‍රියාවලිය සම්මතකරණය
  - භෞතික පිවිසුම් ප්‍රතිපත්තිය

**වෙනත්**

- රක්ෂණ කටයුතු
- පිටතින් සේවා ලබාගැනීමේ ගිවිසුම්

### වාර්තාකරණය

- සමාගමෙහි සියලුම මෙහෙයුම් අවදානම් සිදුවීම් අවදානම් හා පාලන අංශය මගින් වාර්තාගත කොට මාසික රැස්වීම් වලදී විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සහ කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් අවශ්‍ය දිශානතික සපයන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් ක්‍රියාවට නංවන ලද ක්‍රියාකාරකම් වල බලාත්මකබව සමාලෝචනය කරන ලදී.

**රක්ෂණ කටයුතු**

සමාගම මගින්, ගිනි හා ස්වභාවික ආපදාවන් වැනි පාලනය කල නොහැකි සිදුවීම් සඳහා අවදානම පැවරීමේ ක්‍රමෝපායක් අනුගමන කරනු ලැබේ. සමාගම මගින් ප්‍රකට රක්ෂණ සමාගම් වලින් රක්ෂණවරයන් ලබාගැනී ඔස්සේ රක්ෂණය කල හැකි අවදානම් පවරනු ලැබ ඇත. කාලීන නැවත අලුත්කිරීම් සහ සක්‍රීය තත්ත්වය තහවුරු කිරීම සඳහා අවදානම් හා පාලන අංශය මගින් වසර තුළදී රක්ෂණවරයන් සමාලෝචනය කරන ලදී.

**පිටතින් සේවා ලබා ලබාගැනීම**

ඇතැම් ක්‍රියාකාරකම් සඳහා පිටතින් සේවා ලබාගැනෙනුයේ එබඳු සේවාවන් හි අවදානම් සාධක ප්‍රවේශමෙන් ඇගයුමට ලක් කොට පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයන් සිදුකිරීමෙන් අනතුරුවය. පිටතින් සේවා ලබාගැනීමේ ක්‍රියාකාරකම් සහ ඒ සම්බන්ධ වගකීම් සමාගමෙහි පිටතින් සේවා ලබාගැනීමේ ව්‍යාපාර මෙහෙයුම් ප්‍රතිපත්තිය මගින් පාලනය කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකු උපදෙස් හෝ ක්ෂේත්‍රයේ සහ ක්‍රියාකාරකම් වල කවර හෝ වෙනසක් පිළිබිඹු වන පරිදි අදාළ ප්‍රතිපත්තිය වාර්ෂිකව සමාලෝචනය කොට යාවත්කාලීන කෙරේ.

සේවා සපයන්නන්, සේවාවේ ස්වභාවය, සේවා පිරිවැය වැනි පිටතින් ලබාගන්නා සේවාවන් පිළිබඳ විස්තර වාර්ෂිකව නියාමනය වෙත භාරදෙනු ලැබේ.

නව ගිවිසුම් වලට එළඹීමට සහ පවතින ගිවිසුම් නැවත අලුත් කිරීමට පෙර අවදානම් හා පාලන අංශය මගින් නිසි අවබෝධාත්මක පරීක්ෂාවන් සිදු කෙරේ.

### නෛතික අවදානම

නෛතික අවදානම යනු මෙහෙයුම් අවදානමෙහි කොටසක් වන අතර එය අසමත් වූ අභ්‍යන්තර පද්ධති, පුද්ගලයින්, ක්‍රියාවලීන් හා සිදුවීම් සම්බන්ධ නීතිමය බලපෑම් මත උද්ගත වේ. සමාගම වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම නීති අංශය සතු වේ. වසර තුළදී සමාගම වෙත අවදානමක් ඇති කිරීමට තරම් පරිමාවකින් යුතු කිසිදු ප්‍රධාන පෙළේ නීති ගැටලුවක් උද්ගත නොවීය.

### තොරතුරු තාක්ෂණ හා සුරක්ෂිතතා අවදානම

කෝවිඩ් 19 වසංගතය මධ්‍යයේ සමාගමෙහි කටුයතු වැඩි වැඩියෙන් ඩිජිටල් පදනම් වෙත සංචලනය වූ පසුබිමක් තුළ, තොරතුරු සුරක්ෂිතතා අවදානම කළමනාකරණය සඳහා වන ක්‍රියාපටිපාටීන් ප්‍රබල අයුරින් සවිබලගන්වන ලදී. මෙයට සයිබර් ප්‍රහාරයන්, බිඳවැටීම්, පද්ධති අක්‍රීය කාලයක් වෙත යොමකෙරෙන අකාරයේ දෝෂ වැනි සිදුවීම් මෙන්ම දෝෂ හා මෙහෙයුම් ඔස්සේ සිදුවන වංචා සහ අක්‍රිමිකත් ඇතුලත් වන අතර එයට සීමා නොවේ.

ඵලදායී තොරතුරු සුරක්ෂිතතා පද්ධතීන් පවත්ගෙන යන අතරතුර අභ්‍යන්තර හා බාහිර ගනුදෙනුකරුවන් වෙත විශ්වසනීය හා කළමනාකරණය කරන ලද තොරතුරු සේවාවන් ලබාදීමට පීපල්ස් ලීසිං කැප වී කටයුතු කරයි. අපගේ අරමුණ වන්නේ තොරතුරු සුරක්ෂිතතා සිදුවීම් ශූන්‍ය තත්ත්වයකට ගෙන ඒම වන අතර එහිදී ව්‍යාපාරික අවශ්‍යතා සහ ශ්‍රී ලංකාවේ අදාළ නීතිරීති හා රෙගුලාසි අනුව දූනුම ප්‍රවර්ධනය, කළමනාකාරීත්ව දිශානති සැපයීම සහ තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතාව කෙරෙහි සහාය දැක්වීම සිදු කෙරේ. ගනුදෙනුකරුවන්ගේ දත්ත රහස්‍යභාවය සුරැකීමට මෙන්ම අපගේ තොරතුරු වත්කම් සහ පද්ධති වල සුපිළිපන්බව තහවුරු කිරීම සඳහා මෙකී ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

### ප්‍රතිපත්ති ආකෘතිරාමුව

සමාගම මගින් මනා සේ ස්ථාපිත තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ආකෘතිකරාමුවක් පවත්වාගෙන යනු ලැබේ. හඳුනාගත් අවදානම් සඳහා අංග සම්පූර්ණ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සකසනු ලබන අතර වාර්ෂිකව යාවත්කාලීන කෙරේ.

**ප්‍රධාන පාලන පද්ධති**

- තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණය

→

**ප්‍රධාන තොරතුරු තාක්ෂණ හා තොරතුරු සුරක්ෂිතතා ප්‍රතිපත්ති**

- තොරතුරු සුරක්ෂිතතා ප්‍රතිපත්තිය
- ප්‍රති වෛරස ප්‍රතිපත්තිය
- ඊමේල් භාවිත ප්‍රතිපත්තිය
- සයිබර් ආරක්ෂණ කළමනාකරණ ප්‍රතිපත්තිය
- තොරතුරු ගබඩා ප්‍රතිපත්තිය
- අන්තර්ජාල භාවිත ප්‍රතිපත්තිය
- පරිඝනක ගබඩා මාධ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තිය
- මුරපද ප්‍රතිපත්තිය
- මෘදුකාංග සවිකිරීමේ ප්‍රතිපත්තිය
- වරප්‍රසාද ලත් පිවිසුම් කළමනාකරණ ප්‍රතිපත්තිය
- භාවිත කරන්නන්ගේ පිවිසුම් කලමනාකරණ ප්‍රතිපත්තිය
- ගෙවීම් ආශ්‍රිත ජංගම යෙදවුම් සඳහා වන ප්‍රතිපත්තිය

**සම්මත අධීක්ෂණ ක්‍රියාදාමයන්**

- වරප්‍රසාද පත් පිවිසුම් කළමනාකරණ (PAM) පදනම සහ සියලු වැදගත් දත්ත පදනම් පුරා භාවිත ඇතුළත්වීමේ ක්‍රියා අධීක්ෂණය (අඛණ්ඩ සහ දූනට ක්‍රියාත්මක වේ)
- අවදානම් ඇගයුම් සහ ව්‍යාප්ති පරීක්ෂාවන් (VAPT) (වාර්ෂිකව)
- බාහිර ව්‍යාප්ති පරීක්ෂාව (වාර්ෂිකව)
- තොරතුරු සුරක්ෂිතතා අවදානම් ඇගයුම (කාර්තුමය)
- සිදුවීම් ප්‍රතිචාර කණ්ඩායම විසින් සකසනු ලබන සිදුවීම් වාර්තා (අවශ්‍ය පරිදි)
- තොරතුරු සුරක්ෂිතතා පද්ධති නිරීක්ෂණය (වාර්ෂිකව)

වසර තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ නම්‍යශීලීත්වය සම්බන්ධ උපදෙස් පත්‍රිකාවක් නිකුත් කරන ලදී. සමාගම මගින් පවතින තොරතුරු තාක්ෂණ මෙහෙයුම්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලි, ක්‍රියාපටිපාටි සහ තොරතුරු තාක්ෂණ හැකියාවන් සම්බන්ධයෙන් පරතර විශ්ලේෂණයක් සිදුකරන ලද අතර, බහුතර ක්ෂේත්‍රයන්හි සමාගම දූනටමත් අනුකූලව කටයුතු කරන බවට එහිදී අනාවරණය විය.

2022 ජනවාරි මස, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ නම්‍යශීලීත්ව පනතේ නියෝග අංක 01 නිකුත් කරන ලදී. ඉහත නියෝගයෙහි අවශ්‍යතා සමග පූර්ණ අනුකූලතාවය සඳහා අමතර පියවර ගැනීම උදෙසා ක්‍රියාකාරී සැලසුමක් පවතී.

### තොරතුරු තාක්ෂණ හා තොරතුරු සුරක්ෂිතතා අවදානම කළමනාකරණය

අප විසින් අපගේ තොරතුරු සුරක්ෂිතතා පද්ධතිය ස්ථාපනය, ක්‍රියාවට නැංවීම, පවත්වාගෙනයාම, සහ අඛණ්ඩව වැඩිදියුණු අවශ්‍යතා සපුරාලනු ලබන බවට තහවුරු කරමින් සමාගම වෙත ISO 27001:2013 සහතිකත්වය හිමිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනුමත අවදානම් ඇගයුම් ක්‍රමවේදයක් පවතින අතර එමගින් සියලුම දෘඩාංග, මෘදුකාංග, තොරතුරු හා මානව වත්කම් වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

### අවදානම් ඇගයුම

පීපලස් ලීසිංහි අවදානම් ඇගයුම් ක්‍රමවේදය 2010 දී ස්ථාපනය කරන ලද අතර එය වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

2021 අගෝස්තු මස, තොරතුරු සුරක්ෂිතතාව, සිදුවීම් කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම් කටයුතු, භෞතික හා පාරිසරික සුරක්ෂිතතාව ආදිය ආශ්‍රිත අවදානම් සමාලෝචනය සඳහා අවදානම් දරාගැනීමේ සීමාවන් ස්ථාපනය කෙරිණි.

සෑම කාර්තුවකම තොරතුරු ආරක්ෂණ නිලධාරී විසින් සකසනු ලබන අවදානම දරාගැනීමේ සීමාවන් ඇතුළත් වාර්තාව සමාලෝචනය සඳහා අවදානම් හා පාලන අංශය සහ තොරතුරු සුරක්ෂිතතා විගණකවරයා වෙත භාරදෙනු ලැබේ.

මෘදුකාංග, දෘඩාංග සහ යටිතල පහසුකම වල ප්‍රධාන තාක්ෂණික වෙනස්වීම් සඳහා තොරතුරු තාක්ෂණ වෙනස්වීම් කළමනාකරණ අවදානම් ඇගයුමද සිදුකෙරෙන අතර සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත භාරදෙනු ලැබේ.

# අවදානම් කළමනාකරණ විමර්ශනය

### අවදානම් ප්‍රතිකර්මය

- අවදානම් සමාලෝචනයන් මත පදනම්ව තොරතුරු ආරක්ෂණ නිලධාරීවරයා විසින් ක්‍රියාත්මක සලකුණ සහ කාලසීමාවන් සහිතව අවදානම් ප්‍රතිකර්ම සැලසුම සකසනු ලැබේ.
- අදාළ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම අවදානම් හා පාලන අංශය මගින් සමාලෝචනය කෙරේ.
- අවශ්‍ය අවස්ථාවන්හිදී, ඊ දැන්වීම් සහ ඊ මේල් ඔස්සේ තොරතුර සුරක්ෂිතතා අවදානම පිළිබඳව සමාගම පුරා දැනුවත් කෙරේ.

### අවදානම් සමාලෝචනය

- විධායක ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ ක්‍රියාවලියෙහි බලාත්මකබව සමාලෝචනය කෙරේ.
- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් කාර්තුමය වශයෙන් තොරතුරු තාක්ෂණ අවදානම් ඇගයුම් වාර්තාව සමාලෝචනය කොට අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලැබේ.
- වසර තුළදී, තොරතුරු තාක්ෂණ නියමු කමිටුව කළමනාකරණ මට්ටමේ කමිටුවක් වශයෙන් පිහිටුවන ලද අතර, අදාළ අවදානම් නිරාවරනයන් කළමනාකරණය සඳහා සමාගම පුරා තොරතුරු සුරක්ෂිතතා සහ සයිබර් ආරක්ෂණ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම එහි වගකීම වේ.

### වෙනත් අවදානම්

### මානව සම්පත් අවදානම

අප විසින් නිපුණත්වයෙන් යුතු ශ්‍රම බලකායක් ආකර්ශනය, සංවර්ධනය සහ රඳවාගැනීම තහවුරු කරමින්, සමාගමෙහි ක්‍රමෝපායික අරමුණු සපුරාගැනීම උදෙසා මානව සම්පත් අවදානම් කළමනාකරණය අතිශය වැදගත් වේ. පුහුණු නිපුණ සේවකයින්ගේ ඉවත්වීම සමාග මෙහි හැකියාව සහ ලබාගත හැකි ඵලදායිත්වය කෙරේ හානි පමුණුවන අතර එහිදී ඉහළ/මධ්‍යම සේවකයින්ගේ ඉවත්වීම විශේෂිත වේ.

සේවක ඉවත්වීමේ අනුපාතය - 21/22




**මානව සම්පත් අවදානම කළමනාකරණය**

ආර්ථික අර්බුදයකදී නිපුණ ශ්‍රම බලකායක් රඳවාගැනීම ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. ඒ අනුව, මෙම අවදානම කළමනාකරණය සඳහා අප විසින් පහත දැක්වෙන පියවර ගන්නා ලදී:

- සේවකයින් හට සේවා ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දැනුම හා නිපුණතා වර්ධනයය කරගැනීම උදෙසා අන්තර්ජාලගත හා භෞතික පුහුණු පැවැතිවිනි.
- වසර තුළ එළිදක්වන ලද අධ්‍යයන කළමනාකරණ පද්ධතිය, අන්තර්ජාලගත පාඨමාලා ඇතුලු විවිධ විෂයන් අළලා වන අන්තර්ජාලගත පුහුණු වලින් සමන්විත වේ. අධ්‍යයන කළමනාකරණ පද්ධතියෙහි පාඨමාලා වෙත සහභාගීවීම සේවකයින්ගේ කාර්යසාධන ඇගයුමට සම්බන්ධ කොට ඇත.
- නිරන්තර කාර්යසාධන ඇගයුම්, ආයතනික හා වෘත්තීය ඉලක්ක ගළපා ගැනීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව සඳහා උපකාරී වන අතර එමගින් සේවක ගැටලු අවබෝධ කරගැනීම සහ කාර්යසාධනය සම්බන්ධ ප්‍රතිචාර දැක්වීම සඳහා පදනම සකසනු ලැබේ.
- සමාගම මගින් සැමවිටම කළමනාකාරීත්ව අනුප්‍රාප්තික සැලසුමක් නිර්මාණය කිරීම සඳහා හැකියාවන් සහිත සේවකයින් හඳුනාග නු ලබන අතර ධාරිතා ගොඩනැංවීමේ පියවරක් වශයෙන් ඔවුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍යමය සහාය පිරිනැමේ.
- ඔවුන්ගේ සේවා ආශ්‍රිත ගැටලු සාකච්ඡා කිරීමේදී, ඕනෑම අවස්ථාවකදී සිය ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හමුවීමේ අවස්ථාව සියලුම සේවකයින් සතු වේ.

### කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු, ඉපැයුම්, වත්කම්, වගකීම් හා සන්නාම වටිනාකම වෙත අහිතකර බලපෑමක් ඇති කල හැකි අවස්ථාවක් හෝ සිදුවීමක් වේ. අවදානම් අන්තර් රඳා පැවැත්ම සමාගම මගින් කීර්තිනාම අවදානම වශයෙන් හඳුනාගනු ලබන අතර ඒ සඳහා ණය, වෙළඳපොළ සහ මෙහෙයුම් වැනි අවදානම් රැසක් බලපෑ හැක.

සමාජ ජාල භාවිතයක් සමග කීර්තිනාම අවදානමෙහි විෂයපථය පළල් විය. ණය, වෙළඳපොළ සහ මෙහෙයුම් වැනි අවදානම් නිසි පරිදි කළමනාකරණය ඔස්සේ සමාග මෙහි කීර්තිනාම අවදානම පුළුල් අයුරින් කළමනාකරණය කෙරේ.

ආයතනික පාලන ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන්, සන්නිවේදන ප්‍රතිපත්ති, චර්යාධර්ම සංග්‍රහය සහ ආචාරධර්මද පවතින අතර ව්‍යතිරේකයකින් තොරව සියලුම සේවකයින් ඒවා අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ.

**ප්‍රධාන විශේෂතා**

- ගනුදෙනුකාර පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය සඳහා වෙනම ඒකකයක් පිහිටුවන ලදී.
- වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙන් මුදල් ප්‍රවාහ කෙරෙහි අහිතකර බලපෑම් ඇති වූ ගනුදෙනුකරුවන් හට ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි පමාසහනයක් පිරිනමන ලදී.
- කෝවිඩ් ආශ්‍රිත ගැටලු වහාම පාලනය කල හැකි පරිදි සමාගම මගින් කෝවිඩ් 19 ප්‍රතිචාර කණ්ඩායමක් සකසන ලදී.
- සමාගමෙහි මෙහෙයුම් වල අඛණ්ඩත්වය තහවුරු කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩත්ව කළමනාකරණය සවිමත් කරන ලදී.
- ගනුදෙනුකාර සේවා ස්ථාන නිසි පරිදි ක්‍රියාත්මක වන බවට තහවුරු කරමින් සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන් ගේ සෞඛ්‍ය සුරැකීම සඳහා ආරක්ෂණ පියවර ගන්නා ලදී.
- වසර තුළදී සමාගම සම්මාන රැසකින් පිදුම් ලැබීය. පිටු අංක 82 සිට 83

### ක්‍රමෝපායික අවදානම

අහිතකර ව්‍යාපාරික තීරණ, අක්‍රමවත් තීරණ ක්‍රියාවේ යෙදවීම් හෝ ව්‍යාපාරික පරිසරයේ වෙනස්කම් වෙත ප්‍රමාණවත් නොවන ප්‍රතිචාරයක් දැක්වීම හේතුවෙන් ක්‍රමෝපායික අවදානම උද්ගත වේ.

ක්‍රමෝපායික සැලසුම් සහ අයවැය සැකසීමේ ක්‍රියාවලීන් සහ සමාගමෙහි දර්ශනය, මෙහෙවර, ක්‍රමෝපායික අරමුණු, සහ අවදානම් අභරුචිය සහ දරාගැනීමේ ප්‍රකාශය වෙත ඒවායේ ගැලපීම මගින් ක්‍රමෝපායික අවදානම කළමනාකරණය කෙරේ.

ඒ සම්බන්ධ කළමනාකාරීත්ව යාවත්කාලීනයන් සමගින් අයවැය සහ ක්‍රියාකාරී සැලසුම් සපුරාග ැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ රැස්වීම් වලදී සමාලෝචනය කෙරේ.

## සමූහ අවදානම් කළමනාකරණය

විවිධ ක්ෂේත්‍රයන් හා විවිධ ව්‍යාපාරික මාදිලි තුළ මෙහෙයුම් සිදුකරන බැවින් එක් එක් පරිපාලිතයෙහි අවදානම් ස්වරූපය එකිනෙකට වෙනස් වේ. එමනිසා, අවදානම් වෙන වෙනම ඇගයුම සහ පහත හෙළීම සිදුකල යුතු වේ. පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී විශාලතම පරිපාලිතය වන අතර එය ශ්‍රී ලංකා රක්ෂන නියාමන කොමිසමෙහි (ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යනුවෙන් පෙර හැඳින්වුනු) නියාමනයට ලක් වේ.

පීපල්ස් ලීසිංහි සභාපතිවරයා සියලුම පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩල වල සාමාජිකයකු වේ. සියලුම අන්තර් සමාගම් ගනුදෙනු කිසියම් දුරස්ථභාවයකින් යුතුව සිදුකෙරේ. සමූහයේ විශාලතම ශේෂ පත්‍රය පීපල්ස් ලීසිං සතු වන අතර සමූහයේ සමස්ත වත්කම් හා වගකීම් වලින් 87% ක් එය සතු වේ.

අවදානම් හා පාලන අංශය මගින් පීපලස් ලීසිංහි ඉහත දක්වන ලද පරිපාලිතයන් සමග සම්බන්ධීකරණයෙන් යුතුව අදාළ අවදානම් වාර්තා විවාදය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත භාරදෙන ලදී.

| සමාගම | සබඳතාවය | ව්‍යාපාරික මෙහෙයුම් | BIRMC වෙත භාරදෙන වාර්තා | වාර්තාකරණ අන්තර්කාලය |
|---|---|---|---|---|
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | පරිපාලිතයකි | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම | අවදානම් පුවරු වාර්තාව සහ සන්සන්දනාත්මක වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයකි | තක්සේරුකරණ සේවාවන් | අවදානම් පුවරු වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් මයික්‍රෝ - කොමර්ස් ලිමිටඩ් | පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයකි | සම්ප්‍රදායික බැංකුකරණ සේවාවන් ලබාගැනීම අසීරු පුද්ගලයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවා ලබාදීම | අවදානම් පුවරු වාර්තාව සහ සන්සන්දනාත්මක වාර්තාව කාර්තුමය | කාර්තුමය |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයකි | දේපළ සංවර්ධනය | අවදානම් දර්ශක වාර්තාව | කාර්තුමය |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයකි | දේපළ සංවර්ධනය | අවදානම් දර්ශක වාර්තාව | කාර්තුමය |

පීපල්ස් ලීසිං, සමූහ අවදානම පහත හෙළීම සඳහා මූල්‍ය, රක්ෂණ, ක්ෂුද්‍ර මූල්‍ය සහ දේපළ සංවර්ධන ක්ෂේත්‍රයෙන්හි ව්‍යාපාරික වටපිටාවේ වර්ධනයන්ට සමාගාමීව කටයුතු කරයි.



අපගේ තිරසාර ප්‍රයත්නයන් වෙත සම්බන්ධ වෙමින්



# මූල්‍ය වාර්තා

Financial Calendar 199
මූල්‍ය දින දර්ශනය 199
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම 200
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව 202
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 203
ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම් ප්‍රකාශය 204
ස්වාධීන විගණකවරයාගේ ප්‍රකාශය 205
මූල්‍ය ප්‍රකාශය - අන්තර්ගතය පිළිබඳ වගුව 208
ආදායම් ප්‍රකාශය 209
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 210
මූල්‍ය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය 211
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 212
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 214
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 215

# මූල්‍ය දින දර්ශනය

| | | 2021/22 | 2022/23 |
|---|---|---|---|
| අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශයන් ප්‍රකාශනය | ජුනි 30න් අවසන් වූ 1 වැනි කාර්තුව | 2021 අගෝස්තු 9 | 2022 අගෝස්තු 15 ට පෙර |
| | සැප්තම්බර් 30න් අවසන් වූ / අවසන්වන 2 වැනි කාර්තුව | 2021 නොවැම්බර් 11 | 2022 නොවැම්බර් 15 ට පෙර |
| | කාර්තුව 3 දෙසැම්බර් 31 අවසන් වූ / දෙසැම්බර් 31 අවසන් වන | 2022 පෙබරවාරි 14 | 2023 පෙබරවාරි 15 ට පෙර |
| | කාර්තුව 4 මාර්තු 31 අවසන් වූ / මාර්තු 31 අවසන් වන | 2022 මැයි 31 | 2023 මැයි 30 ට පෙර |
| මූල්‍ය ප්‍රකාශන නිවේදනය (ප්‍රසිද්ධ කිරීම) | 2021 සැප්තැම්බර් 30න් අවසන් වූ මාස 6 | 2021 නොවැම්බර් 24 | |
| | 2022 මාර්තු 31න් අවසන් වූ වසර | 2022 ජුනි 29 | |
| | 2022 සැප්තැම්බර් 30න් අවසන් වන මාස 6 | | 2022 දෙසැම්බර් 31 ට පෙර |
| | 2023 මාර්තු 31න් අවසන් වන වසර | | 2023 ජුනි 30 ට පෙර |
| වාර්ෂික වාර්තා ප්‍රසිද්ධියට පත් කරීම | වාර්ෂික වාර්තාව | 2022 අගෝස්තු | 2023 ජුනි |
| වාර්ෂික මහා සභා රැස්වීම | වාර්ෂික මහා සභා රැස්වීම | 26 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2022 සැප්තැම්බර් | 27 වැනි වාර්ෂික මහා සභා රැස්වීම 2023 ජුනි 30 ට පෙර |
| ලාභාංශ ගෙවීම | අන්තර්කාලීන ලාභාංශ - කොටස්කර 2022 මාර්තු 31 අවසන් වූ වසර සඳහා කොටස්කර ලාභාංශ | 2022 ජනවාරි | |

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරණ සමාගම් පනත ප්‍රකාරව, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශයන් සහ සමාගම සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම, මෙම ප්‍රකාශයෙන් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් බාහිර විගණකවරුන්ගේ වගකීම් පිටු අංක 205 සිට 207 දක්වා "ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ" ඉදිරිපත් කෙරේ.

මූල්‍ය ප්‍රකාශයන් මගින් 2022 මාර්තු 31 දිනට මූල්‍යමය තත්ත්වය සහ එදින අවසන් වූ වසරෙහි මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරන බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන අතර ඒවා වාර්ෂික මහා සභා රැස්වීමට පෙරාතුව ඉදිරිපත් කෙරේ. මෙකී මූල්‍ය ප්‍රකාශයන් පහත දැක්වෙන ප්‍රකාශයන්ගෙන් සමන්විත වේ:

- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
- ආදායම් ප්‍රකාශය
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍ය ප්‍රකාශයන්හි සුපිළිපන් බව සහ වාස්තවිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම භාරගනී. මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී පහත දැක්වෙන කරුණු ඉටු කරන ලද බව අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි:

- යෝග්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගෙන සංගතව භාවිත කරන ලද අතර, ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම්, හෙළිදරව් කොට පැහැදිලි කරනු ලැබ ඇත:
- සියළුම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ පරිදි අනුගමනය කරන ලදී: සහ
- සාධාරණ හා විචක්ෂණශීලී විනිසුම් සහ ඇස්තමේන්තු උපයෝගී කරගන්නා ලදී.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 150 (1), 151, 152 සහ 153(1) සහ (2) ප්‍රකාරව සමාගම සහ සමූහය මගින් සියළුම ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

අධ්‍යක්ෂවරුන් විසින් මෙහෙයුම් සිදුකිරීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවට තහවුරු කරමින් මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගැනීම සාධාරණීකරණය කරන ලදී. තවද, සමාගමෙහි මූල්‍ය තත්ත්වය, සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව, හෙළිදරව් කිරීම සඳහා සමාගම මගින් ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ වගකීමද අධ්‍යක්ෂවරුන් සතු වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 150 (1) (ආ) සහ 152 (1) (ආ) හි අවශ්‍යතාවය අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ වගකීම සහිත නිලධාරියා වශයෙන් ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා විසින් සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් සහතික කරන ලදී. එයට අමතරව, සමාගම් පනතෙහි 151 (1) (ඇ) වගන්තියෙහි සහ සෙසු නියාමන අවශ්‍යතා ප්‍රකාරව 2022 ජූනි 24 වැනි දින සමාගමෙහි අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් වෙත අත්සන් තබන ලදී.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 148 (1) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සමාගම් පනතට අනුකූලව සැකසීමට හැකි වන පරිදි සහ අදාළ මූල්‍ය ප්‍රකාශ පහසුවෙන් සහ නිසි පරිදි විගණනය කළ හැකි වන පරිදි, කවර හෝ අවස්ථාවකදී සමාගමෙහි ගනුදෙනු පැහැදිලි කෙරෙන සහ සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව සමාගමෙහි මූල්‍ය තත්ත්වය නිර්ණය කළ හැකි වන ආකාරයේ නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන යනු ලබන බවට තහවුරු කිරීමේ වගකීම ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. මෙම වාර්ෂික වාර්තාවෙහි සකසා ඉදිරිපත් කරනු ලබන වසර 2021/2022 සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්, පාදක වන ගිණුම් පොත් සමග එකඟත්වයෙන් යුතුවන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත හා ඒ යටතේ නිකුත් කරන ලද නියෝග, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගතවීමේ නීතිරීති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සාංගමික පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

සමාගම සහ සමූහය මගින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීම උදෙසා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය නිල රැස්වීම් වලදී සහ විගණන කමිටුව ඔස්සේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිරන්තර විමර්ශනයට ලක් කරනු ලබන අතර, එහි වාර්තාව පිටු අංක 162 සිට 163 දක්වා ඉදිරිපත් කොට ඇත. සමාගම සහ සමූහය මගින් ප්‍රකාශිත අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශයන්ද විගණන කමිටුවෙහි සමාලෝචනයෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කෙරේ.

සමාගම සහ සමූහයට අයත් වත්කම් සුරැකීම සඳහා සාධාරණ පියවර ගැනීම සම්බන්ධයෙන්ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳෙන අතර, මෙහිදී සමාගම සහ සමූහයෙහි සැළකිය යුතු අවදානම් කළමනාකරණය සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම කෙරෙහි නිසි අවධානය යොමු කිරීමද ඔවුන්ගේ වගකීම වේ. 'මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය' පිටු අංක 203 හි දැක්වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 56 (2) වගන්තිය ප්‍රකාරව, කොටස්කරයක ආකාරයෙන් අන්තර්මධ්‍ය ලාභාංශයක් ලබාදීම සඳහා අනුමැතිය පළ කරන ලද බව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම්දෙයි. මෙයට අදාළව, 1:21.400002326 ක කොටස්කර ලාභාංශය ප්‍රකාරව, සමාගමෙහි ඡන්ද බලය සහිත සාමාන්‍ය කොටස් 84,249,776 ක් 2022 ජනවාරි 13 දින දිට බලපැවැත්වෙන පරිදි ලැයිස්තුගත කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත අන්තර්මධ්‍ය ලාභාංශය සහ යෝජිත අවසන් ලාභාංශය අනුමත කරනු ලැබ ඇත්තේ, 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 57 වගන්තිය ප්‍රකාරව එවැනි බෙදාහැරීම් වලින් අනතුරුව සමාගම මගින් වහාම ද්‍රවශීලතා පරීක්ෂාව සපුරාලනු ලබන බවට සෑහීමකට පත් වෙමින් වන අතර, ගෙවන ලද ලාභාංශ සම්බන්ධයෙන්, බාහිර විගණකවරයාගෙන් ද්‍රවශීලතා සහතික ලබාගෙන ඇත.

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි 166 (1) සහ 167 (1) වගන්ති ප්‍රකාරව, මෙම වාර්ෂික වාර්තාව කල්තබා පිළියෙල කරන ලද බවටත් එහි පිටපත් කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති අංක 7.5 (අ) සහ (ආ) ප්‍රකාරව නිර්දේශිත කාලසීමාව ඇතුළත කොටස් හිමිකරුවන් වෙත යවනු ලබන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති අංක 7.5 (අ) සහ (ආ) ප්‍රකාරව පිටපත් නිර්දේශිත කාලසීමාව ඇතුළත කොටස් හිමිකරුවන් වෙත යවනු ලබන බවට තහවුරු කෙරෙන අතර, මෙම වාර්ෂික වාර්තාවේ මෘදු පිටපත සංයුක්ත තැටියකින් ලබාදෙනු වෙනුවට කොළඹ කොටස් වෙළඳපොල වෙබ් අඩවියෙහි පවතින මෘදු පිටපතට අමතරව සමාගම මගින් මෙම වාර්තාවේ මෘදු පිටපතක් (https://www.plc.lk/financial-information-and-kpi/annual-reports/) සමාගමෙහි වෙබ් අඩවියෙහි මූල්‍යමය තොරතුරු සහ ප්‍රමුඛ කාර්යසාධන දර්ශක කොටස යටතේ පළ කොට ඇත.

අධ්‍යක්ෂවරුන් විසින් මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කොට ස්වකීය විගණන මතය ලබාදීම සඳහා යෝග්‍ය වේ යැයි හැඟී යන කවර හෝ පරීක්ෂාවන් සිදුකිරීම සහ කවර හෝ පියවරක් ගැනීම සඳහා විගණකවරයා වෙත සියළු අවස්ථාවන් සැලසිය යුතු වේ. පීපල්ස් ලීසිං ඇන් ෆයිනෑන්ස් පීඑල්සී 'විගණනලාභී සමාගමක්'' යන නිර්වචනය යටතට අයත් වන අතර විගණකාධිපතිවයා හෝ විගණකාධිපතිවරයා

විසින් අනුමැති ලබාදෙන කවර හෝ පුද්ගලයකු හට සමාගමෙහි විගණනය සිදු කල හැකි වන අතර මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම් පිටු අංක 205 සිට 207 දක්වා 'ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවෙහි' දක්වේ.

සමාගමෙහි විගණකවරයා වන, විගණකාධිපතිවරයා 2018 අංක 19 දරණ විගණන පනත ප්‍රකාරව පත්කරන ලද අතර ඔවුන් විසින් යෝග්‍ය යැයි සළකනු ලබන පරීක්ෂාවන් සිදුකිරීම සඳහා සෑම අවස්ථාවක්ම ලබාදෙන ලදී. ඔවුන් විසින්, මූල්‍ය ප්‍රකාශයන් සහ ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ ඔවුන්ගේ මතය ප්‍රකාශ කිරීමේදී යෝග්‍ය හා අවශ්‍ය යැයි සළකන බැවින් ඔවුන් විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධ සමාලෝචනයන් හා නියැදි පරීක්ෂාවන් සිදුකරන ලදී. ඔවුන් විසින් සියලුම මූල්‍ය වාර්තා, ආශ්‍රිත දත්ත, කොටස් හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තා සමගින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් වෙත ලබාදෙන ලද මූල්‍ය ප්‍රකාශයන් පරීක්ෂා කොට සිය මතය පිටු අංක 205 සිට 207 දක්වා ඉදිරිපත් කෙරන ''ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ'' ප්‍රකාශ කරන ලදී. සමාගම සහ එහි ලැයිස්තුගත පරිපාලිතය මගින් අදාළ අවස්ථාවන්හිදී: කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත වීමේ නීතිරීති සම්බන්ධ ලැයිස්තුගතවීමේ අවශ්‍යතා පවත්වාගෙන යාම හි වගන්ති 07 යටතේ සියලුම අවශ්‍යතා සපුරාලනු ලැබ ඇත.

සිය පරම දැනුම අනව සමාගම සහ සමූහය විසින් ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ ගාස්තු, සමාගම සහ සමූහය විසින් සමාගමෙහි සේවකයින්, සමූහය සහ රජය සහ සෙසු ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු සහ බදු වාර්තාකරණ දිනට ගෙවනු ලැබ හෝ, අදාළ අවස්ථාවන්හිදී වෙන්කිරීම් සිදුකරනු ලැබ ඇති බවට අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කරනු ලැබේ. ඒ අනුව, මෙම ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි ඔවුන් විසින් සිය වගකීම් ඉටු කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



**ෂාලිනි සිල්වා**
*අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්*

2022 ජූලි 26
කොළඹ

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකත්ව වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

My No. BAN/D/PLF/2022/01 | Your No. | Date 05 July 2022

සභාපති
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

## පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව සම්බන්ධ විගණකාධිපතිවරයාගේ සහතිකත්ව වාර්තාව

### හැඳින්වීම

මෙම වාර්තාව මගින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය වාර්තාකරණය පිළිබඳ පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය (ප්‍රකාශය) සම්බන්ධ සම්බන්ධයෙන් සහතිකත්වයක් සැපයෙන අතර එය 2022 මාර්තු 31 දිනට අවසන් වූ වසර සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ.

### කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද, මූල්‍ය සමාගම් (සාංගමික පාලනය) 2008 නියෝග අංක 3 වගන්ති (10) 2 (ආ)/ 2009 මූල්‍ය කල්බදු (සාංගමික පාලනය) නියෝග අංක 4 වගන්ති (10) (2) ට අනුකූලව පිළිවෙළ කොට ඉදිරිපත් කරන ලද මෙම ප්‍රකාශය පිළිබඳව - මූල්‍ය සමාගම් මූල්‍ය කල්බදු සමාගම් වල අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ මාලාවට අනුව කළමනාකාරිත්වය වගකීමෙන් බැඳෙයි.

### මාගේ වගකීම සහ SLSAE 3051 සමග අනුකූලතාවය

මාගේ වගකීම වනුයේ සමාගමෙහි අභ්‍යන්තර පාලනයේ නිර්මිතිය සහ බලාත්මක භාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය අධ්‍යක්ෂකවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලේඛනවලින් තහවුරු වන්නේ ද යන්න ඇගයුමට ලක් කිරීමයි.

මා විසින් මාගේ සහභාගිත්වය ශ්‍රී ලංකා සහතිකත්ව සහභාගිත්වයන් සම්බන්ධ SLSAE 3051 සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද බලපත්‍රලාභී මූල්‍ය සමාගම්/මූල්‍ය කල්බදු සමාගම් වල අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පිළිබඳ සහතිකත්ව වාර්තාව අනුව සිදුකරන ලදී.

මෙම ප්‍රමිතිය මගින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශයෙහි සියලු ප්‍රමාණාත්මක සම්බන්ධව කළමනාකාරිත්වය විසින් පිළියෙල කිරීමේදී සීමිත සහතිකත්වයක් ලබා ගනිමින් මා විසින් අදාළ ක්‍රියපටිපාටිය සැලසුම්කොට ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

මෙම සහභාගිත්වයේ අරමුණු සඳහා කවර හෝ වාර්තාවක් යාවත්කාලීන කිරීම් හෝ සහතික කිරීම සම්බන්ධයෙන් මා වගකීමෙන් නොබැඳෙන අතර එහිදී මූල්‍ය තොරතුරු සම්බන්ධව විගණනයක් හෝ සමාලෝචනයක් සිදු නොකරන ලදී.

### සිදුකරන ලද කාර්යය පිළිබඳ සාරාංශය

මාගේ සහභාගිත්වයේදී සමාගමෙහි අභ්‍යන්තර පාලනයේ නිර්මිතිය සහ බලාත්මකභාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය අධ්‍යක්ෂකවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලේඛනවලින් තහවුරු වන්නේ ද යන්න ඇගයුමට ලක් කරන ලදී.

මා විසින් අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටීන් අධ්‍යක්ෂවරුන් විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය සම්බන්ධයෙන් පුද්ගලයන්ගෙන් කරන ලද විමසීම් සහ නියැදි පදනමක් මත පැවැති ලේඛන වලට සීමා වේ.

SLSAE 3051 මගින් මා විසින් අදාල ප්‍රකාශය මගින් සියලු අවදානම් සහ පාලනයන් ආවරණය වන්නේ ද යන්න හෝ සමාගමෙහි අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටීන් වල බලාත්මක භාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම් අවශ්‍ය නොවේ. එමෙන්ම SLSAE 3051 මගින් මා විසින් වාර්ෂිකව වාර්තාවේ අනාවරණය කරන ලද කවර හෝ සැලකිය යුතු අර්බුදයන් සම්බන්ධ ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලනයන් මගින් ඒවා නිරාකරණය කෙරෙන බවට සලකා බැලීම ද අවශ්‍ය නොවේ.

මෙහිදී තෝරා ගන්නා ලද ක්‍රියාපටිපාටිය මාගේ විනිශ්චය මත රඳා පැවති අතර එහිදී සමාගමෙහි ස්වභාවය සහ ප්‍රකාශය පිළියෙල කිරීම සම්බන්ධ සිදුවීම් හෝ ගනුදෙනු පිළිබඳ මාගේ අවබෝධය යොදා ගැනිණි.

මාගේ නිගමනය කෙරෙහි මතයක් සැපයීම් සඳහා මා විසින් ලබා ගන්නා ලද සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

### නිගමනය

ක්‍රියාවේ යොදවන ලද ක්‍රියාපටිපාටීන් මත පදනම්ව සමාගමෙහි මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයෙහි නිර්මිතිය සහ බලාත්මකභාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය මාගේ අවබෝධය අනුව මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය සමඟ පටහැනි වන කිසිදු කරුණක් කෙරෙහි මාගේ අවධානය යොමු නොවිය.

ඩබ්. පී. සී. වික්‍රමරත්න
*විගණකාධිපති*

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

### වගකීම

මූල්‍ය සමාගම් (සාංගමික පාලනය - සංශෝධන) 2013 නියෝග අංක 06 මගින් සංශෝධිත, 2008 අංක 03 දරණ මූල්‍ය සමාගම් නියෝග අංක 03 හි 10 (2) (ආ) වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය (''මණ්ඩලය'') පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (''සමාගම'') හි ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණවත්භාවය සහ බලාත්මකභාවය සම්බන්ධයෙන් වගකීමෙන් බැඳේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම මුහුණපාන ලද අවදානම් හඳුනාගැනීම, වාර්තා කිරීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය සම්බන්ධ ඵලදායක වූද පරිපූර්ණ වූද අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීමට කටයුතු කරන ලද අතර, එහිදී මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියක්ද ඇතුළත් වූ අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තර විමර්ශනයන් සිදු කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය සවිමත් හා ප්‍රමාණවත් බව ද බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා නියාමන අවශ්‍යතා අනුව සිදු කරන ලද බව ද අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

මුහුණදෙන අවදානම්, නිර්මිතිය, මෙහෙයුම් හඳුනාගනිමින්ද ඇගයුමට ලක් කරමින්ද මෙම අවදානම් අවම කිරීමට සහ පාලනය කිරීමට අවශ්‍ය සුදුසු අභ්‍යන්තර පාලනයන් නිරීක්ෂණය කරමින්ද කළමනාකාරිත්වය, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය ආශ්‍රිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වයි.

### මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනයෙහි නිර්මිතිය සහ බලාත්මකභාවය සමාලෝචනය කිරීමේදී යොදාගනු ලබන ක්‍රියාවලියෙහි ප්‍රධාන විශේෂතා

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණවත්බව සහ සුපිළිපන් බව සමාලෝචනය කිරීම සඳහා ස්ථාපනය කොට ඇති ප්‍රධාන යාන්ත්‍රණයන් පහත දැක්වේ:

- සමාගමෙහි දෛනික මෙහෙයුම් කටයුතු වල ඵලදායීතාවය සහ මෙහෙයුම්වල සංස්ථාපිත අරමුණු, ක්‍රමෝපායන් සහ වාර්ෂික අයවැය කෙරෙහි මෙන්ම අනුමත ප්‍රතිපත්ති හා ව්‍යාපාරික නියෝගයන් කෙරෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දැක්වීම උදෙසා මණ්ඩලය විසින් විවිධ කමිටු ස්ථාපනය කෙරිණි.
- සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් ප්‍රතිපත්ති/ප්‍රඥප්ති මගින් පාලනය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පැතීමට පෙර එබඳු ප්‍රතිපත්ති/ප්‍රඥප්ති සමාලෝචනය කොට නිර්දේශ කරනු ලබයි. එබඳු ප්‍රතිපත්ති/ප්‍රඥප්ති නිරන්තරයෙන් සමාලෝචනය කොට, යාවත්කාලීන කොට අධ්‍යක්ෂ මන්ඩලය විසින් අනුමත කරනු ලබයි.
- සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය මගින්, නියැදි හා ආවර්තිත ක්‍රියාපටිපාටීන් භාවිත කරමින් අඛණ්ඩවම අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් කෙරෙහි අනුකූලතාව සහ ඵලදායීත්වය පරීක්ෂා කරනු ලැබේ. මෙමගින් අනනුකූලතාවය සම්බන්ධ කවර හෝ සැළකිය යුතු සොයාගැනීමක් විශේෂ කොට දක්වනු ලැබේ. වාර්ෂික විගණන සැලසුම අනුව විගණනයන් සිදුකෙරෙන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කෙරේ. ස්වාධීන හා විෂයමූලික වාර්තාවක් ලබාදීමේ අරමුණින් යුතුව, ඇගයීමට ලක්වන අවදානමෙහි මට්ටම අනුව වාර ගණන තීරණය කරමින්, සියළුම ඒකකයන් සහ ශාඛාවන් ආශ්‍රිතව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකෙරේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත භාරදෙනු ලැබේ.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, අභ්‍යන්තර විගණන අංශය, නියාමන අධිකාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කරනු ලබයි. ඔවුන් විසින් විගණනයන්හි විෂයපථය හා තත්ත්වය සම්බන්ධ නිශ්චිත අවධානයකින් යුතුව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සමාලෝචනයද සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වාර්තා ආවර්තිත පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ ඉදිරිපත් කෙරේ.
- මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයුමට ලක් කිරීමේදී, සමාගමෙහි හඳුනාගත් නිලධාරීන් විසින් අඛණ්ඩවම, සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළුම ක්‍රියාපටිපාටීන් සහ පාලනයන් විශ්ලේෂණය හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. සමාගමෙහි අභ්‍යන්තර විගණන අංශය මගින් අඛණ්ඩ පදනමක් මත මෙම ක්‍රියාපටිපාටීන් හා පාලනයන්ගේ සැකසුම හා ඵලදායීතාවය සම්බන්ධ යෝග්‍යතාවය නිර්ණය කරන ලදී.

හඳුනාගැනීම, මිනුම්කරණය, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම සම්බන්ධ අවශ්‍යතා වෙත අනුගත වීම සම්බන්ධයෙන් සමාගම මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS සහ SLFRS යොදාගනු ලබන අතර, අදාළ ක්‍රියාවලීන් වෙත ප්‍රගතිගාමී වැඩිදියුණු කිරීම් සිදුකරමින් මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකාරිත්ව තොරතුරු සම්බන්ධ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සිදුකෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, SLFRS 9 ''මූල්‍යමය උපකරණ'' අනුගමනය කිරීමේ කෙරෙහි නිසි අවධානය යොමු කරන ලදී. එහිදී අවශ්‍ය මොඩියුලයන් ක්‍රියාවට නංවන ලද අතර කළමනාකාරීත්ව තොරතුරු පද්ධතීන් සහ ආකෘතික වලංගු කිරීම් සහ SLFRS 9 වෙත අනුගත වීම සඳහා අවශ්‍ය වාර්තා සම්බන්ධයෙන් වන ක්‍රියාවලීන් සහ පාලනයන් කෙරෙහි ප්‍රගතිගාමී වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

### තහවුරු කිරීම

ඉහත දක්වන ලද ක්‍රියාවලීන් මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණහි විශ්වසනීයබව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ කොළඹ කොටස් වෙළඳපොලෙහි අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

### බාහිර විගණකවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධ සමාලෝචනය

බාහිර විගණකවරයා විසින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ඉහත දැක්වෙන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනයට ලක් කොට, සමාගමෙහි අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සැකසුම සහ ඵලදායීත්වය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය සම්බන්ධයෙන්, ඔවුන්ගේ අවබෝධය අනුව ප්‍රකාශය අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු වන අකාරයේ කිසිදු කරුණක් ඔවුන්ගේ අවධානයට ලක් නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

**කොරළී පීටර්ස්**
*සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව*

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

**රොහාන් පතිරගේ**
*අධ්‍යක්ෂ*

2022 ජූලි 05
කොළඹ

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

2022 මාර්තු 31 වැනි දිනට පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශයන් සහ සමාගම හා එහි පරිපාලිතයන් (සමූහය) හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පහත සඳහන් සම්මතයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කෙරේ:

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති;
- 2007 අංක 07 දරණ සමාගම් පනත;
- 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත;
- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලත් මූල්‍ය සමාගම් වෙත නිකුත් කරන ලද නියෝග;
- කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති, සහ
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය.

සමූහය මගින්, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගතවීමේ නීතිරීති වලට අනුකූලව සිය කොටස් හිමිකරුවන් වෙත කාර්තුමය පදනමක් මත අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් උචිත වන අතර සමූහය මගින් සංස්ථිතිකව භාවිත කොට ඇත. ඒවායේ ආදේශනයේදී පූර්ව නිර්දේශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ කිසිදු වෙනසක් සිදු නොකෙරිනි. වර්තමාන ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණාත්මක වෙනස්වීම් සිදුවී ඇත්නම්, අනුගත වීම සඳහා අවශ්‍ය ස්ථානයන්හිදී සන්සන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කොට ඇති අතර ඒවා හෙළිදරව් කොට පැහැදිලි කරන ලදී. ඉහළ මට්ටමේ විනිසුමක් සහ සංකීර්ණත්වයක් සහිත සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ඇස්තමේන්තු සම්බන්ධයෙන් සමාගමෙහි බාහිර විගණකවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සුපිළිපන්බව සහ වාස්තවිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් භාරගැනේ. සමාගමෙහි ගනුදෙනු වල ස්වභාවය සහ යථා ස්වරූපය, සමාගමෙහි කටයුතු වල තත්ත්වය මූල්‍ය ප්‍රකාශයන් ඔස්සේ සත්‍ය හා සාධාරණ අයුරින් පිළිබිඹු වන අයුරින්, මෙම මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ ඇස්තමේන්තු හා විනිශ්චයන් විචක්ෂණශීලී වූද සාධාරණ වූද ආකාරයෙන් සිදුකරනු ලැබ ඇත. අඛණ්ඩව මෙහෙයුම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සමූහය සතු වන බවට අප විසින් තහවුරු කරනු ලබන අතර මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගැණිනි.

මේ බව තහවුරු කිරීම සඳහා, සමාගම සහ සමූහය මගින් වත්කම් සුරැකීම සඳහා ද වංචා මෙන්ම අක්‍රමිකතා හඳුනාගැනීම හා වළකාලීම සඳහාද අභ්‍යන්තර පාලන හා ගිණුම්කරණ වාර්තා පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන අතර එය නිරන්තර පදනමක් මත විමර්ශනය, තක්සේරුව සහ යාවත්කාලීන කිරීම සිදුවේ.

සමාගම සහ සමූහය මගින් ස්ථාපිත ප්‍රතිපත්තීන් හා ක්‍රියාපටිපාටීන් අනුගමනය කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් ආවර්තිත විමර්ශනයන් සිදු කරනු ලැබේ. කෙසේවුවද, කවර හෝ අභ්‍යන්තර පාලන හෝ ගිණුම්කරණ පද්ධතියක් මගින් සපයනු ලබන සහතිකය තුලනය කිරීමේදී හඳුනාගත යුතු නෛසර්ගික සීමාවන් පවතී.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සියළුම අභ්‍යන්තර හා බාහිර විගණන පරීක්ෂා වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධතීන් හා ක්‍රියාපටිපාටීන්හි කාර්යක්ෂමතාවය, ගිණුම්කරණ ප්‍රමිතීන්හි තත්ත්වය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතා කෙරෙහි ඒවායේ අනුගතවීම සහ කළමනාකාරීත්ව ලිපිය සමාලෝචනයට ලක් කරන ලද අතර ව්‍යවස්ථාපිත විගණනයේදී ඉස්මතු කරන ලද කවර හෝ කරුණක් සම්බන්ධයෙන් පසුවිපරම් ද සිදු කරන ලදී. ඒ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 162 සහ 163 හි "අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ" දැක්වේ. සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් සහ සමූහයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර ඔහුගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 205 සිට 207 දක්වා ඉදිරිපත් කෙරේ.

අප විසින් පහත සඳහන් කරුණු තහවුරු කරනු ලැබේ;

- සමූහය සියළුම නීති, රෙගුලාසි සහ විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කොට ඇති අතර කිසිදු ප්‍රමාණාත්මක අනනුකූලතාවයක් සිදු නොවීය.
- මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 303 හි සටහන 50.1.1. හි දක්වනු ලැබ ඇති කරුණු වලට අමතරව සමාගමට එරෙහිව කිසිදු මූර්ත නඩු මාර්ගයට එළඹීමක් සිදු නොවීය.

2022 මාර්තු 31 දින වන විට සමූහයෙහි සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු හා බදු මුදල් ගෙවනු ලැබ ඇති අතර අදාළ කවර හෝ අවස්ථාවන්හිදී අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇත.



**ශමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී*



**ඔමාල් සුමනසිරි**
*ප්‍රධාන කළමනාකරු - මූල්‍ය*

2022 ජූලි 26
කොළඹ

# ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

## ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAN/D/PLF/2022/01    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 29 June 2022

සභාපති
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.**

### 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මතය

2022 මාර්තු 31 අවසන් වූ වසර සඳහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශයන් සහ සමාගම හා එහි පරිපාලිතයන්ගේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්, 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රමිතීන් වලින් සමන්විතව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් මට සහාය විය. ව්‍යවස්ථාවේ වගන්ති 156 (6) ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

මෙහි ඉදිරිපත් කෙරෙන සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශනවලින් 2022 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

### 1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කරුණු යනු වර්තමාන කාලපරිච්ඡේදයෙහි මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ විගණනයෙහි, මාගේ වෘත්තීයමය විනිසුම අනුව, වඩාත්ම සැළකිය යුතු කරුණු වේ. සමස්තයක් වශයෙන් සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ විගණනයේ සන්දර්භය තුළ මෙම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද අතර, ඒ අනුව මාගේ විගණන මතය සකසා ගැනීමේදී, මවිසින් මෙකී කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් සපයනු නොලැබේ. පහත දැක්වෙන එක් එක් කරුණ සඳහා, අදාළ කරුණ සම්බන්ධයෙන් මාගේ විගණනය තුළ කටයුතු කල ආකාරය පිළිබඳ විග්‍රහය එම සන්දර්භය තුළ සපයා ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

| ප්‍රධාන විගණන කරුණ | අදාළ කරුණ සම්බන්ධයෙන් මාගේ විගණනය තුළ කටයුතු කල ආකාරය |
|---|---|
| **ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායන වෙන්කිරීම**<br>2022 මාර්තු 31 දිනට, රු. මිලියන 163,321 ක අපහායන වෙන්කිරීමෙන් ශුද්ධව, සමූහයේ මුළු වත්කම් වලින් 82% ක් ණය සහ ලැබිය යුතු දෑ වලින් සමන්විත වූ අකර එය සටහන 25හි දක්වේ. මෙය සාමූහිකව සමූහයේ සමස්ත වත්කම් වලින් 79% සඳහා දායක විය.<br><br>පහත සඳහන් හේතුන් නිසා මෙය ප්‍රධාන විගණන කරුණක් විය:<br><br>• සංකීර්ණ ගණනයන් ඇතුළත් වූ වාර්තාගත ප්‍රතිපාදනයෙහි ප්‍රමාණාත්මක බව: සහ<br>• වර්තමාන වසර, කොවිඩ් 19 ණය පමාසහහනයේ අඛණ්ඩ බලපෑම සහ ඉදිරි දැකුම් තොරතුරු මත වර්තමාන ආර්ථික තත්ත්වයන්හි වෙනස්වීම ඇගයුමට ලක් කිරීමේ අවශ්‍යතාවයේ බලපෑමට ලක්වීම හේතුවෙන්, සටහන 25.6 හි දක්වා ඇති උපකල්පනයන් සහ ඇස්තමේන්තු සඳහා කළමනාකාරීත්වය විසින් සිදුකොට ඇති සැළකිය යුතු විනශ්වයන්. | සෙසු කරුණු අතර ඇතුළත් වූ මාගේ විගණන ක්‍රියාපටිපාටීන් පහත දක්වේ:<br><br>• අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් අපහායන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් අධීක්ෂණය, සමාලෝචනය සහ අනුමත කරන ලද මට්ටම අගයන ලදී.<br>• මවිසින්, ආශ්‍රිත පද්ධති පාලනයන් ඇතුලුව, අපහායන ප්‍රතිපාදනය ඇස්තමේන්තු කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනයන්හි බලාත්මකභාවය තක්සේරු කරන ලදී.<br>• මවිසින්, සමූහයෙහි මූලාශ්‍ර ලේඛණ සහ ගිණුම් වාර්තා කෙරෙහි එකඟවෙමින් ගණනයන් සඳහා යොදාගන්නා ලද පාදක වූ දත්ත වල පරිපූර්ණත්වය සහ නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී.<br><br>• **අපහායනය සඳහා සමූහික පදනමකින් තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු දේ සඳහා:**<br>- මවිසින්, අපහායන ප්‍රතිපාදන සඳහා භාවිත කරන ලද ප්‍රධාන ගණනයන් පරීක්ෂා කරන ලදී.<br>- මවිසින්, පාදක වන ක්‍රමවේදය තුළ කළමනාරීත්වය විසින් සිදුකරන ලද උපකල්පන සහ ඇසත්මේන්තු සඳහා යොදාගන්නා ලද සැළකිය යුතු විනිසුම් සහ කළමනාකාරීත්ව අතිපිහිතයන් සාධාරණද යන්න තක්සේරු කරන ලදී. මවිසින්, යොදාගත් ඉදිරි දැකුම් තොරතුරු වල, සළකා බලන ලද ආර්ථික තත්වයන්ගේ සහ ඒ එක් එක් තත්ත්වය වෙත අනුයුක්ත කරන ලද සම්භාවිතා බරතැබීම සාධාරණද යන්නද ඇගයුමට ලක් කරන ලදී. මාගේ ක්‍රියාකාරකම් මාගේ වාර්ත දිනට පැවති ප්‍රශස්ත තොරතුරු මත පදනම් විය.<br><br>• **අපහායනය සඳහා කේවල පදනමකින් තක්සේරු කරන ලද ණය සහ ලැබිය යුතු දේ සඳහා:**<br>- මවිසින්, ණයගැතියාගේ නිශ්චිත තත්ත්වයන් මත පදනම්ව කළමනාකාරීත්වයේ අභ්‍යන්තර තක්සේරු වල සාධාරණත්වය සහ කාලසීමාවන් තක්සේරු කරන ලදී.<br>- මවිසින්, පාදක වන කේවල අපහායන ගණනයන්හි නිවැරදිබව පරීක්ෂා කරන ලදී.<br>- මවිසින්, වර්තමාන ආර්ථික තත්ත්වයන් වෙත නිශ්චිත අවධානයකින් යුතුව සිදුකරන ලද ණය අපහායන ප්‍රතිපාදනය තුළ යොදාගත් ප්‍රධාන ආදානයන්ගේ සාධාරණත්වය තක්සේරු කරන ලදී. එබදු තක්සේරු සිදුකරන ලද්දේ, ඉහළගිය අවදානම් ක්ෂේත්‍ර, අයකරගැනීමේ ක්‍රියාමාර්ග වල තත්ත්වය සහ ඇප වටිනාකම් වෙත නිශ්චිතවම සම්බන්ධ වන මුදල් ප්‍රවාහ වල වටිනාකම සහ කාලගණනය සැළකිල්ලට ගනිමිනි.<br>- මවිසින්, පිටු අංක 11 සහ 25 හි දක්වා ඇති ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් වල ප්‍රමාණවත්බව තක්සේරු කරන ලදී. |
| **සමූහයේ මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති මත පදනම් වූ අභ්‍යන්තර පාලනයන්**<br>සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියෙහි සැළකිය යුතු කොටසක් මූලිකවම ස්වයංක්‍රීය ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලනයන් සහිත බහුවිධ තොරතුරු තාක්ෂණ පද්ධතීන් මත විශ්වාසය තබයි. තවද, පැතිරුම් පත්‍රිකා භාවිතයෙන් සම්පාදිත සහ නිර්මිත, තොරතුරු තාක්ෂණ පද්ධතීන් මගින් උත්පාදිත දත්ත හා වාර්තා ආශ්‍රයෙන් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් පිළියෙල කෙරේ.<br><br>ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු තාක්ෂණ පද්ධති මත පදනම් වූ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් වශයෙන් සැළකේ. | මාගේ විගණන ක්‍රියාපටිපාටීන් වෙත පහත දැක්වෙන කරුණු ඇතුළත් විය:<br><br>• මවිසින්, මූල්‍ය වාර්තාකරණය සහ ආශ්‍රිත හෙළදරව් කිරීම් සම්බන්ධ ක්‍රියාවලීන්හි අභ්‍යන්තර පාලන වටිපිටාව පිළිබඳ අවබෝධයක් ලබාගැනිනි.<br>• මවිසින්, සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ආශ්‍රිත ප්‍රධාන තොරතුරු තාක්ෂණ පද්ධතීන්හි අදාළ පාලනයන් හඳුනාගනිමින් පරීක්ෂා කරන ලදී.<br>• මවිසින්, භාවිත පිවිසුම් සහ වෙනස්වීම් කළමනාකරනය ඇතුලුව, තොරතුරු තාක්ෂණ පාලනයන්හි නිර්මිතිය සහ මෙහෙයුම් බලාත්මකභාවය තක්සේරු කරන ලදී.<br>• මවිසින්. අදාළ අවස්ථාවන්හිදී පද්ධති වාර්තා සහ මූලාශ්‍ර දත්ත අතර හරස් පරීක්ෂාවන් වලින් සමන්විත කළමනාකාරීත්වයේ සාමාන්‍ය ලෙජර් සැසඳුම් ක්‍රියාමාර්ගයන්හි සාධාරණත්වය ඇගයුමට ලක් කරන ලදී. |

## 1.4 සමූහයෙහි 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

සමූහයෙහි 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශයන් සහ ඒ සම්බන්ධ මාගේ මතය හැර වෙනත් කරුණු වලින් සමන්විත වන අතර, එය විගණකවරයාගේ වාර්තා දිනට පසු මා වෙත ලැබීමට නියමිත වේ. වෙනත් තොරතුරු සඳහා කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරනය නොකෙරෙන අතර ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක සහතිකත්ව නිගමනයක් ප්‍රකාශයට පත් කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ විගණනය ආශ්‍රිතව, මාගේ වගකීම වනුයේ ඒවා පවතින විට ඉහත හඳුනාගනු ලැබූ වෙනත් තොරතුරු කියවා බැලීම සහ එසේ කිරීමේදී, වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශයන් සමග ප්‍රමාණාත්මකව අසංගත වේද නැතිනම් විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයට පත් වීමක් සහිත වේද යන්න සළකාබැලීමයි.

සමූහයේ 2022 වාර්ෂික වාර්තාව කියවා බලන ලද අවස්ථාවේදී, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය කරුණු පවතී යැයි මා විසින් නිගමනය කරනු ලැබුවහොත්, මා විසින් අදාළ නිවැරදි කිරීම් සඳහා එය පාලන අධිකාරිය වෙත සන්නිවේදනය කල යුතු වේ. තවදුරටත් නිවැරදි නොකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය කරුණු පැවතියහොත්, ඒවා ව්‍යවස්ථාවේ වගින්ත 154 (6) ප්‍රකාරව යථා කාලයේදී ඉදිරිපත් කිරීමට නියමිත පාර්ලිමේන්තුව වෙත මාගේ වාර්තාවේ ඇතුළත් කෙරේ.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දක්මක් ලබාදෙන අයුරින් පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

In preparing the financial statements,

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද මණ්ඩලයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමූහය විසින් සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණ භාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනානොගැනීමට වඩා වැඩි ය, මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇතිකිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.
- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි, නමුත් එසේ සිදුකරන්නේ සමාගමේ ඵලදායීතාවය සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකාරීත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.
- කළමනාකාරීත්වය ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් ඇතිවීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණයන් පිළිබඳව මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් මඟින් සමූහය අඛණ්ඩව පැවැත්ම නැවැත්වීමට හේතු විය හැක.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මඟින් ඒ සඳහා පාදක වන ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ වේලාව සහ සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

### 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ පහත සඳහන අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත්යඃ

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනෙන පරිදි සමාගම හා සමූහය විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(1) (ඈ) වගන්තිය අනුව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය අනුව නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත්තේය.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල වේ.
- ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වර්ෂය හා සංගත වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ නියමයන්ට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි මා විසින් පසුගිය වර්ෂය සඳහා සිදුකරන ලද සියළුම නිර්දේශ කිරීම් අන්තර්ගත වේ.

ක්‍රියාවට නංවන ලද ක්‍රියාපටිපාටීන් සහ ප්‍රමාණාත්මක කරුණු වලට සීමාව රැස් කරගනු ලැබූ සාක්ෂි මත පදනම්ව, පහත දැක්වෙන කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය;

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ නියමයට අනුව සමාගම විසින් අත්සන් කරන ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් පිළිබඳව ව්‍යාපාරයේ සාමාන්‍ය හේතුවට පිටින් ඇති සෘජු හෝ වක්‍ර උනන්දුවක් සමාගමේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට ඇති බව සඳහන් කිරීමට;
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ නියමයට අනුව සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ වන ඕනෑම ලිඛිත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් වලට සමාගම අනුකූල වී නොමැති බව සඳහන් කිරීමට;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ නියමයට අනුව සමාගම සිය බලතල, කාර්යයන් සහ යුතුකම් අනුව කටයුතු කර නොමැති බව සඳහන් කිරීමට;
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ නියමයට අනුව සමාගමේ සම්පත් කාල රාමුව තුළ
- සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම් සහිත ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය හා උපයෝජනය කර නොමැති බවට සඳහන් කිරීමට කිසිවක්, සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් ප්‍රමාණාත්මක කරුණු වලට පමණක් සීමා වූ සාක්ෂි අනුව මගේ අවධානයට යොමු වී නැත.



**ඩබ්. පී. සී. වික්‍රමරත්න**
*විගණකාධිපති*

# මූල්‍ය ප්‍රකාශය - පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **මූල්‍ය ප්‍රකාශ** | | |
| | ආදායම් ප්‍රකාශය | 209 |
| | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 210 |
| | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 211 |
| | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 212 |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 214 |
| **මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්** | | |
| 1. | ආයතනික සහ සමූහය පිළිබඳ තොරතුරු | 215 |
| 2. | පිළියෙල කිරීමේ පදනම සහ වෙනත් සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් | 215 |
| 3 | පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති | 218 |
| 4 | නිකුත් කරන ලද නමුත් තවමත් බලාත්මක නොවන ප්‍රමිතීන් | 222 |
| **ආදායම් වාර්තාව** | | |
| 5. | දළ ආදායම | 224 |
| 6. | ශුද්ධ ඉපැයූ ආදායම | 224 |
| 7. | ශුද්ධ ඉපැයුම් වාරිකය | 226 |
| 8. | ගාස්තු හා කොමිස් ආදායම | 227 |
| 9. | මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - FVTPL | 228 |
| 10. | වෙනත් මෙහෙයුම් ආදයම | 228 |
| 11. | ණය සහ ලැබීම් සඳහා අපහායනය සහ අනෙකුත් අලාභ | 229 |
| 12. | කාර්ය මණ්ඩල වියදම් | 232 |
| 13. | ක්ෂය සහ ක්‍රමක්ෂය | 232 |
| 14. | ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 233 |
| 15. | වෙනත් මෙහෙයුම් වියදම් | 234 |
| 16. | මූල්‍ය සේවා මත බදු | 234 |
| 17. | ආදායම් බදු වියදම | 235 |
| 18. | මූලික/තනුක සාමාන්‍ය කොටසකට ඉපැයුම | 238 |
| 19. | සාමාන්‍ය කොටසකට ලාභාංශ | 238 |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වත්කම්** | | |
| 20. | මිනුම්කරණ පදනම මත මූල්‍ය සාධනපත්‍රයන්හි විශ්ලේෂණය | 238 |
| 21. | වත්කම් හා වගකීම් වල සාධාරණ අගය | 241 |
| 22 | මුදල් සහ මුදලට සමාන දේ | 248 |
| 23 | බැංකු සහ මූල්‍ය ආයතන වල ශේෂයන් | 248 |
| 24 | මූල්‍ය වත්කම් - සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් වාර්තාව තුලින් | 249 |
| 25 | ණය සහ ලැබිය යුතු දේ - ක්‍රමක්ෂය පිරිවැය | 251 |
| 26 | රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ | 267 |

| | | පිටු අංකය |
|---|---|---|
| 27 | මූල්‍ය වත්කම් - සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් | 268 |
| 28 | ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | 269 |
| 29 | පරිපාලිත සමාගම්වල ආයෝජන | 271 |
| 30 | ආයෝජන දේපළ | 273 |
| 31 | වෙනත් වත්කම් | 274 |
| 32 | දේපළ, පිරියත සහ උපකරණ | 275 |
| 33 | භාවිතයට අයිතිය ඇති වත්කම් | 280 |
| 34 | කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 281 |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වගකීම්** | | |
| 35 | බැංකු වෙත ගෙවිය යුතු | 283 |
| 36 | ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 285 |
| 37 | නිකුත් කරන ලද ණය සුරැකුම්පත් | 287 |
| 38 | වෙනත් මූල්‍ය වගකීම් | 289 |
| 39 | රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 290 |
| 40 | මෙහෙයුම් කල්බදු වගකීම් | 292 |
| 41 | ප්‍රවර්තන බදු වගකීම් | 293 |
| 42 | වෙනත් වගකීම් | 294 |
| 43 | විශ්‍රාම ප්‍රතිලාභ බැදීම | 294 |
| 44 | විලම්බිත බදු වගකීම්/(වත්කම්) | 297 |
| **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - හිමිකම්** | | |
| 45 | ප්‍රකාශිත ප්‍රාග්ධනය | 299 |
| 46 | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 300 |
| 47 | රදවාගත් ඉපැයුම් | 301 |
| 48 | වෙනත් සංචිත | 301 |
| 49 | සුළු කොටස්හිමි අයිතිය | 302 |
| **වෙනත් මූල්‍යමය හෙළිදරව් කිරීම්** | | |
| 50 | අසම්භාව්‍ය වගකීම් සහ බැදීම් | 303 |
| 51 | කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම | 304 |
| 52 | ජංගම/ජංගම නොවන විශ්ලේෂණය | 305 |
| 53 | ආංශික මූල්‍ය වාර්තාකරණය | 306 |
| 54 | ඇපයට තබන ලද වත්කම් | 308 |
| 55 | සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය | 308 |
| 56 | අවදානම් කළමනාකරණය | 314 |
| 57 | සන්සන්දනාත්මක තොරතුරු | 339 |
| 58 | වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් | 339 |

# ආදායම් ප්‍රකාශය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමාගම වෙනස % | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| දළ ආදායම | 5 | 224 | 26,741,380 | 27,103,798 | (1.34) | 32,630,986 | 33,645,265 | (3.01) |
| පොලී ආදායම | 6.1 | 225 | 23,881,526 | 24,983,445 | (4.41) | 25,926,792 | 26,821,838 | (3.34) |
| අඩු කිරීම: පොලී වියදම | 6.2 | 225 | 10,832,186 | 13,064,310 | (17.09) | 11,205,126 | 13,375,197 | (16.22) |
| ශුද්ධ පොලී ආදායම | 6 | 224 | 13,049,340 | 11,919,135 | 9.48 | 14,721,666 | 13,446,641 | 9.48 |
| ශුද්ධ ඉපැයුම් වාරිකය | 7 | 226 | - | - | - | 4,939,071 | 5,028,549 | (1.78) |
| ගාස්තු හා කොමිස් ආදායම | 8 | 227 | 1,876,524 | 1,818,675 | 3.18 | 1,321,513 | 1,198,054 | 10.30 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය) - FVTPL | 9 | 228 | 26,783 | 162,616 | (83.53) | 86,525 | 228,258 | (62.09) |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 228 | 956,547 | 139,062 | 587.86 | 357,085 | 368,566 | (3.12) |
| මුළු මෙහෙයුම් ආදායම | | | 15,909,194 | 14,039,488 | 13.32 | 21,425,860 | 20,270,068 | 5.70 |
| අඩු කිරීම: ණය සහ ලැබීම් සඳහා අපහායනය සහ වෙනත් අලාභ | 11 | 229 | 655,425 | 1,043,837 | (37.21) | 951,756 | 1,352,489 | (29.63) |
| කීර්තිනාමය සඳහා අපහායනය | 34 | 281 | 121,611 | 99,209 | 22.58 | 121,611 | 99,209 | 22.58 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | | | 15,132,158 | 12,896,442 | 17.34 | 20,352,493 | 18,818,370 | 8.15 |
| අඩුකිරීම : වියදම | | | | | | | | |
| කාර්ය මණ්ඩල වියදම් | 12 | 232 | 4,002,414 | 3,465,373 | 15.50 | 4,946,747 | 4,354,636 | 13.60 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | 13 | 232 | 700,043 | 722,994 | (3.17) | 638,664 | 647,693 | (1.39) |
| ප්‍රතිලාභ, හිමිකම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 14 | 233 | - | - | - | 3,228,475 | 2,663,347 | 21.22 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 15 | 234 | 2,134,497 | 1,612,859 | 32.34 | 2,607,480 | 2,048,058 | 27.31 |
| මුළු මෙහෙයුම් වියදම් | | | 6,836,954 | 5,801,226 | 17.85 | 11,421,366 | 9,713,734 | 17.58 |
| මූල්‍ය සේවා මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය | | | 8,295,204 | 7,095,216 | 16.91 | 8,931,127 | 9,104,636 | (1.91) |
| අඩු කිරීම: මූල්‍ය සේවා මත බදු | 16 | 234 | 1,645,111 | 1,222,628 | 34.56 | 1,705,797 | 1,273,966 | 33.90 |
| ආදායම් බදු වියදමට පෙර ලාභය | | | 6,650,093 | 5,872,588 | 13.24 | 7,225,330 | 7,830,670 | (7.73) |
| අඩු කිරීම: ආදායම් බදු වියදම | 17 | 235 | 1,991,084 | 1,839,568 | 8.24 | 2,407,161 | 2,234,336 | 7.73 |
| වසර සඳහා ලාභය | | | 4,659,009 | 4,033,020 | 15.52 | 4,818,169 | 5,596,334 | (13.90) |
| ලාභය බෙදා හැරීම | | | | | | | | |
| සමාගමෙහි කොටස් හිමිකරුවන් | | | 4,659,009 | 4,033,020 | 15.52 | 4,805,731 | 5,294,015 | (9.22) |
| සුළු කොටස්හිමි අයිතිය | 49 | 302 | - | - | - | 12,438 | 302,319 | (95.89) |
| වසර සඳහා ලාභය | | | 4,659,009 | 4,033,020 | 15.52 | 4,818,169 | 5,596,334 | (13.90) |
| සාමාන්‍ය කොටසකට මූලික/තනුක ඉපැයුම් (රු.) | 18 | 238 | 2.47 | 2.14 | 15.42 | 2.55 | 2.81 | (9.25) |
| සාමාන්‍ය කොටසකට ලාභාංශ (රු.) | 19 | 238 | 1.25 | 0.60 | 108.33 | | | |

පිටු අංක 215 සිට 339 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය කෙරේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමාගම වෙනස % | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| වසර සඳහා ලාභය | | | 4,659,009 | 4,033,020 | 15.52 | 4,818,169 | 5,596,334 | (13.90) |
| වෙනත් විස්තීර්ණ ආදායම, බදු වලින් ශුද්ධව | | | | | | | | |
| එළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත අයිතම (බදු වලින් ශුද්ධව): | | | | | | | | |
| විදේශ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශයන් පරිවර්තනයෙන් උද්ගත වන ශුද්ධ ලාභ/(අලාභ) | 48.4 | 302 | - | - | - | 1,439,171 | 141,728 | 915.45 |
| එළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත ශුද්ධ අයිතම | | | - | - | - | 1,439,171 | 141,728 | 915.45 |
| එළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත නොවන අයිතම (බදු වලින් ශුද්ධව): | | | | | | | | |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ශුද්ධ ආයුගණක ලාභ/(අලාභ) | | | | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත ශුද්ධ ආයුගණක ලාභ/(අලාභ) | 43 | 294 | (31,732) | 107,003 | (129.66) | (28,272) | 106,891 | (126.45) |
| ආයුගණක ලාභ සහ අලාභ මත විලම්බිත බදු බලපෑම | 44.1 | 298 | 7,616 | (29,961) | 125.42 | 7,795 | (27,690) | 128.15 |
| මූල්‍ය වත්කම් - සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් | | | | | | | | |
| ප්‍රතිමිනුම්කරණය මත ලාභ/(අලාභ) | 48.3 | 302 | (207,831) | (15,263) | (1,261.67) | (207,831) | (5,512) | (3,670.52) |
| ඉහත දේ මත විලම්බිත බදු වගකීම | 44.1 | 298 | 49,817 | - | 100.00 | 49,817 | - | 100.00 |
| අපහායනය සඳහා ආදයම් ප්‍රකාශය වෙත ප්‍රතිවක්‍රීකරණය | | | - | - | - | - | - | - |
| එළඹෙන වසර වලදී ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කිරීමට නියමිත නොවන අයිතම | | | (182,130) | 61,779 | 394.81 | (178,491) | 73,689 | 342.22 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු වලින් ශුද්ධව | | | (182,130) | 61,779 | 394.81 | 1,260,680 | 215,417 | 485.23 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | 4,476,879 | 4,094,799 | 9.33 | 6,078,849 | 5,811,751 | 4.60 |
| ලාභය බෙදාහැරීම: | | | | | | | | |
| සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත | | | (182,130) | 61,779 | 394.81 | 555,132 | 212,979 | 160.65 |
| සුළු කොටස්හිමි අයිතිය වෙත | 49 | 302 | - | - | - | 705,548 | 2,438 | 28,839.62 |
| වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම, බදු වලින් ශුද්ධව | | | (182,130) | 61,779 | 394.81 | 1,260,680 | 215,417 | 485.23 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | 4,476,879 | 4,094,799 | 9.33 | 6,078,849 | 5,811,751 | 4.60 |

පිටු අංක 215 සිට 339 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය කෙරේ.

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමාගම වෙනස % | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 | සමූහය වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | | |
| මුදල් සහ මුදලට සමාන දෑ | 22 | 248 | 4,668,830 | 2,703,031 | 72.73 | 5,402,587 | 3,844,694 | 40.52 |
| බැංකු සහ මූල්‍ය ආයතන ශේෂයන් | 23 | 248 | 5,117,866 | 5,399,071 | (5.21) | 9,529,518 | 8,231,101 | 15.77 |
| මූල්‍ය වත්කම් - ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 24 | 249 | 25,140 | 109,787 | (77.10) | 849,298 | 1,281,753 | (33.74) |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය | 25 | 251 | 151,274,454 | 141,387,907 | 6.99 | 163,320,846 | 147,004,004 | 11.10 |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ | 26 | 267 | - | - | - | 1,322,528 | 1,024,461 | 29.10 |
| මූල්‍ය වත්කම් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 27 | 268 | 1,333,278 | 309,118 | 331.32 | 1,632,941 | 735,494 | 122.02 |
| ණය සුරැකුම්පත් - ක්‍රමක්ෂය පිරිවැය | 28 | 269 | 9,827,221 | 6,994,206 | 40.51 | 16,013,525 | 10,931,714 | 46.49 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 29 | 271 | 3,213,788 | 3,213,788 | - | - | - | - |
| ආයෝජන දේපළ | 30 | 273 | - | - | - | 820,664 | 820,664 | - |
| වෙනත් වත්කම් | 31 | 274 | 749,154 | 575,660 | 30.14 | 831,826 | 932,458 | (10.79) |
| දේපළ, පිරියත හා උපකරණ | 32 | 275 | 1,413,776 | 1,049,250 | 34.74 | 4,090,682 | 4,034,265 | 1.40 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 33 | 280 | 1,972,380 | 2,242,444 | (12.04) | 1,539,484 | 1,591,297 | (3.26) |
| විලම්බිත බදු වත්කම් | 44 | 297 | 1,146,726 | 415,841 | 175.76 | 1,444,813 | 594,495 | 143.03 |
| කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම් | 34 | 281 | 21,965 | 146,446 | (85.00) | 139,603 | 265,506 | (47.42) |
| මුළු වත්කම් | | | 180,764,578 | 164,546,549 | 9.86 | 206,938,315 | 181,291,906 | 14.15 |
| **වගකීම්** | | | | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 35 | 283 | 11,749,332 | 6,439,310 | 82.46 | 15,300,361 | 9,003,873 | 69.93 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 36 | 285 | 103,367,904 | 101,502,931 | 1.84 | 111,453,750 | 103,743,716 | 7.43 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 37 | 287 | 17,244,313 | 13,825,553 | 24.73 | 17,103,223 | 13,684,516 | 24.98 |
| වෙනත් මූල්‍ය වගකීම් | 38 | 289 | 3,636,528 | 4,132,110 | (11.99) | 4,043,322 | 4,111,235 | (1.65) |
| රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 39 | 290 | - | - | - | 5,903,363 | 5,015,885 | 17.69 |
| කල්බදු වගකීම් | 40 | 292 | 2,059,050 | 2,286,386 | (9.94) | 1,588,115 | 1,614,660 | (1.64) |
| ප්‍රවර්තන බදු වගකීම් | 41 | 293 | 1,851,676 | 362,450 | 410.88 | 2,098,784 | 883,900 | 137.45 |
| වෙනත් වගකීම් | 42 | 294 | 1,369,054 | 1,069,121 | 28.05 | 1,399,030 | 1,156,822 | 20.94 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 43 | 294 | 668,411 | 587,257 | 13.82 | 748,944 | 657,778 | 13.86 |
| විලම්බිත බදු වගකීම් | 44 | 297 | - | - | - | 323,621 | 297,568 | 8.76 |
| මුළු වගකීම් | | | 141,946,268 | 130,205,118 | 9.02 | 159,962,513 | 140,169,953 | 14.12 |
| **හිමිකම්** | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 45 | 299 | 17,071,961 | 14,892,036 | 14.64 | 17,071,961 | 14,892,036 | 14.64 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 46 | 300 | 2,639,946 | 2,406,995 | 9.68 | 2,729,351 | 2,464,951 | 10.73 |
| රඳවාගත් ඉපැයුම් | 47 | 301 | 19,481,611 | 17,159,777 | 13.53 | 23,122,852 | 20,682,106 | 11.80 |
| වෙනත් සංචිත | 48 | 301 | (375,208) | (117,377) | 219.66 | 897,111 | 421,319 | 112.93 |
| සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත බෙදා හරින මුළු හිමිකම් | | | 38,818,310 | 34,341,431 | 13.04 | 43,821,275 | 38,460,412 | 13.94 |
| සුළු කොටස්හිමි අයිතිය | 49 | 302 | - | - | - | 3,154,527 | 2,661,541 | 18.52 |
| මුළු හිමිකම් | | | 38,818,310 | 34,341,431 | 13.04 | 46,975,802 | 41,121,953 | 14.24 |
| මුළු වගකීම් සහ හිමිකම් | | | 180,764,578 | 164,546,549 | 9.86 | 206,938,315 | 181,291,906 | 14.15 |
| අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් | 50 | 303 | 6,852,234 | 10,998,111 | (37.70) | 6,899,223 | 11,045,100 | (37.54) |
| සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.) | 51 | 304 | 20.57 | 20.15 | 2.10 | 23.22 | 22.56 | 2.91 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලද බව අපි සහතික කරමු.

**ඔමාල් සුමනසිරි**
*ප්‍රධාන කළමනාකරු - මූල්‍ය*

**ශමින්ද්‍ර මර්සලින්**
*ප්‍රධාන විධායක නිලධාරී*

මෙම මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී:

**සුජීව රාජපක්ෂ**
*සභාපති*

**රොහාන් පතිරගේ**
*අධ්‍යක්ෂ*

පිටු අංක 215 සිට 339 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය කෙරේ.

2022 ජූනි 24
කොළඹ

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| සමාගම | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | වෙනත් සංචිත<br>සාධාරණ අගය සංචිතය | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 13,915,414 | 2,205,344 | (102,114) | 14,227,988 | 30,246,632 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| වසර සඳහා ලාභය/ (අලාභය) | - | - | - | 4,033,020 | 4,033,020 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු වලින් ශුද්ධව) | - | - | (15,263) | 77,042 | 61,779 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | (15,263) | 4,110,062 | 4,094,799 |
| **ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු** | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 201,651 | - | (201,651) | - |
| ගෙවන ලද ලාභාංශ - අතුරු | - | - | - | (162,770) | (162,770) |
| - අවසාන | 976,622 | - | - | (813,852) | 162,770 |
| **ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු** | 976,622 | 201,651 | - | (1,178,273) | - |
| **2021 මාර්තු 31 දිනට ශේෂය** | 14,892,036 | 2,406,995 | (117,377) | 17,159,777 | 34,341,431 |
| **2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය** | 14,892,036 | 2,406,995 | (117,377) | 17,159,777 | 34,341,431 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | | |
| වසර සඳහා ලාභය/ (අලාභය) | - | - | - | 4,659,009 | 4,659,009 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු වලින් ශුද්ධව) | - | - | (207,831) | 25,701 | (182,130) |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | (207,831) | 4,684,710 | 4,476,879 |
| **ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු** | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 232,950 | (50,000) | (182,950) | - |
| ගෙවන ලද ලාභාංශ - අතුරු | 2,179,925 | - | - | (2,179,925) | - |
| **ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු** | 2,179,925 | 232,950 | (50,000) | (2,362,875) | - |
| **2022 මාර්තු 31 දිනට ශේෂය** | 17,071,961 | 2,639,945 | (375,208) | 19,481,612 | 38,818,310 |

පිටු අංක 215 සිට 339 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය කෙරේ.

| සමූහය | ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | වෙනත් සංචිත<br>සාධාරණ අගය සංචිතය | වෙනත් සංචිත<br>විදේශ මුදල් පරිවර්තන සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව | සුළු කොටස්හිමි අයිතිය | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 13,915,414 | 2,235,077 | (116,005) | 401,108 | 16,517,824 | 32,953,418 | 2,356,784 | 35,310,202 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | | | | |
| වසර සඳහා ලාභය/ (අලාභය) | - | - | - | - | 5,294,015 | 5,294,015 | 302,319 | 5,596,334 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු වලින් ශුද්ධව) | - | - | (5,512) | 141,728 | 76,763 | 212,979 | 2,438 | 215,417 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (5,512) | 141,728 | 5,370,778 | 5,506,994 | 304,757 | 5,811,751 |
| ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු | | | | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 229,874 | - | - | (229,874) | - | - | - |
| ගෙවන ලද ලාභාංශ - අතුරු | - | - | - | - | (162,770) | (162,770) | - | (162,770) |
| අවසන් | 976,622 | - | - | - | (813,852) | 162,770 | - | 162,770 |
| ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු | 976,622 | 229,874 | - | - | (1,206,496) | - | - | - |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 14,892,036 | 2,464,951 | (121,517) | 542,836 | 20,682,106 | 38,460,412 | 2,661,541 | 41,121,953 |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 14,892,036 | 2,464,951 | (121,517) | 542,836 | 20,682,106 | 38,460,412 | 2,661,541 | 41,121,953 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | | | | | | | |
| වසර සඳහා ලාභය/ (අලාභය) | - | - | - | - | 4,805,731 | 4,805,731 | 12,438 | 4,818,169 |
| වෙනත් විස්තීර්ණ ආදායම (බදු වලින් ශුද්ධව) | - | - | (207,831) | 733,623 | 29,340 | 555,132 | 705,548 | 1,260,680 |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | (207,831) | 733,623 | 4,835,071 | 5,360,863 | 717,986 | 6,078,849 |
| ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු | | | | | | | | |
| සංචිත වෙත මාරු කිරීම් | - | 264,401 | (50,000) | - | (214,401) | - | - | - |
| ගෙවන ලද ලාභාංශ - අතුරු | 2,179,925 | - | - | - | (2,179,925) | - | (225,000) | (225,000) |
| ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු | 2,179,925 | 264,401 | (50,000) | - | (2,394,326) | - | (225,000) | (225,000) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 17,071,961 | 2,729,352 | (379,348) | 1,276,459 | 23,122,851 | 43,821,275 | 3,154,527 | 46,975,802 |

පිටු අංක 215 සිට 339 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය කෙරේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ගිණුම්කරණ ප්‍රමිතිය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ මෙහෙයුම් ක්‍රියාකාරකම්, ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් වෙන වෙනම හඳුනාගනු ලබන, 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 7 ට අනුකූලව 'සෘජු ක්‍රමවේදය' භාවිත කරමිනි. මුදල් හා මුදල් සමාන දෑ කෙටිකාලීන, සහ ඕනෑම අවස්ථාවක දන්නා මුදල් වටිනාකම් බවට හරවාගත හැකි ඉහළ ද්‍රවශීලතාවකින් යුතු ආයෝජනයන්ගෙන් සමන්විත වන අතර, ඒවා වටිනාකම වෙනස්වීම පිළිබඳ සැළකිය යුතු අවදානමකට භාජනය නොවේ.

| | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | පිටු | 2022 | 2021 | 2022 | 2021 |
| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | අංකය | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | | |
| මුදල් හා මුදලට සමාන දෑ වලින් ආදායම | 6.1 | 225 | 159,743 | 73,753 | 176,533 | 103,501 |
| ණය සහ ලැබිය යුතු දෑ වෙත ගෙවීම් | | | (123,938,484) | (47,647,269) | (128,649,697) | (51,042,311) |
| ණය සහ ලැබිය යුතු දෑ වෙතින් ලැබීම් | | | 137,014,283 | 78,976,592 | 139,838,871 | 81,166,978 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ආයෝජන | | | (30,785,830) | (24,145,286) | (34,428,160) | (26,225,019) |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ශේෂයන්ගෙන් ලැබීම් | | | 31,510,851 | 22,294,433 | 34,065,096 | 25,405,664 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධනපත්‍රවල ආයෝජන | | | (31,590,690) | (22,598,347) | (37,483,431) | (23,561,339) |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධනපත්‍රවලින් ලැබීම් | | | 29,316,856 | 20,089,756 | 31,022,471 | 20,339,756 |
| ගනුදෙනුකරුවන් වෙත සිදුකල යුතු ගෙවීම් | | | (122,737,129) | (99,054,813) | (124,719,248) | (97,571,015) |
| ගනුදෙනුකරුවන් වෙතින් ලැබීම් | | | 116,799,179 | 83,652,942 | 124,371,580 | 83,337,190 |
| වෙනත් ආදයම් වෙතින් ලැබීම් | | | 2,079 | 1,711 | 219,280 | 216,256 |
| මූල්‍ය වත්කම් වල ආයෝජන - සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් වාර්තාව තුලින් | | | (4,573,220) | (8,881,716) | (5,221,552) | (10,028,730) |
| මූල්‍ය වත්කම් වලින් ආදායම - සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් වාර්තාව තුලින් | | | 4,684,650 | 9,966,264 | 5,740,532 | 10,173,826 |
| මූල්‍ය වත්කම් වලින් ලැබීම් - සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් | | | 3,756 | - | 156,320 | 979,028 |
| මූල්‍ය වත්කම් වල ආයෝජන - සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් | | | (1,150,081) | - | (1,175,931) | (264,333) |
| කාර්ය මණ්ඩල වියදම් සඳහා ගෙවීම | | | (3,709,482) | (3,575,458) | (4,653,596) | (4,377,522) |
| කල්බදු වගකීම් සඳහා ගෙවීම | | | (667,068) | (655,969) | (385,273) | (409,587) |
| වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ගෙවීම | | | (3,444,374) | (872,388) | (3,623,513) | (885,891) |
| ගනුදෙනුකරුවන් වෙතින් ලද වාරික | | | - | - | 4,641,005 | 5,199,021 |
| ගෙවන ලද හිමිකම්පෑම් | | | - | - | (2,340,996) | (2,712,682) |
| ආයෝජනවලින් ලැබූ ලාභාංශ ආදායම | | | 711,841 | 110,673 | 6,216 | 918 |
| ගෙවන ලද පාරිතෝෂික | 43 | 294 | (33,471) | (10,353) | (39,309) | (13,148) |
| ගෙවන ලද ආදායම් බදු | 41.1 | 294 | (1,175,310) | (3,349,938) | (1,958,933) | (3,534,648) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත/(භාවිත කල) ශුද්ධ මුදල්** | | | (3,601,901) | 4,374,587 | (4,841,735) | 6,295,913 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | 32 | 275 | (385,714) | (104,690) | (307,456) | (152,324) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | | 14,005 | 54,832 | 131,604 | 210,359 |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | 34 | 281 | (10,325) | (360) | (12,835) | (11,661) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වල (භාවිත කල)/වලින් උත්පාදිත ශුද්ධ මුදල** | | | (382,034) | (50,218) | (188,687) | 46,374 |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | | | | |
| බැංකු වෙත සිදුකල යුතු ගෙවීම් | 35.1 | 283 | (1,946,889) | (3,886,355) | (2,504,664) | (5,315,691) |
| බැංකු වලින් ණය ලබාගැනීම් | 35.1 | 283 | 7,000,000 | 1,000,000 | 7,250,000 | 1,500,000 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් සඳහා ගෙවීම | 37.1 | 287 | (8,456,772) | (6,589,468) | (8,440,722) | (6,570,514) |
| නිකුත් කරන ලද ණය සුරැකුම් වෙතින් ණය ලබාගැනීම | | | 10,000,000 | - | 10,000,000 | - |
| කොටස් හිමිකරුවන් වෙත ගෙවන ලද ලාභාංශ | | | 80 | (1,345) | 80 | (1,345) |
| සුළු කොටස්හිමි අයිතිය වෙත ගෙවන ලද ලාභාංශ | | | - | - | (150,000) | - |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් (භාවිතාකළ)/ උත්පාදිත ශුද්ධ මුදල්** | | | 6,596,419 | (9,477,168) | 6,154,694 | (10,387,550) |
| **මුදල් සහ මුදලට සමාන දෑ වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම** | | | 2,612,484 | (5,152,799) | 1,124,272 | (4,045,263) |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ | | | 1,986,657 | 7,139,456 | 2,952,815 | 6,998,078 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ** | | | 4,599,141 | 1,986,657 | 4,077,087 | 2,952,815 |
| මුදල් සහ මුදලට සමාන දෑ | | | 4,668,831 | 2,703,031 | 5,402,587 | 3,844,694 |
| බැංකු අයිරාව | | | (69,690) | (716,374) | (1,325,500) | (891,879) |
| වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ | | | 4,599,141 | 1,986,657 | 4,077,087 | 2,952,815 |

පිටු අංක 215 සිට 339 දක්වා ඉදිරිපත් කෙරෙන සටහන් මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් කොටසක් නිර්මාණය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සංස්ථාපිත සහ සමූහ තොරතුරු

### 1.1 සංස්ථාපිත තොරතුරු

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී යනු 1995 අගෝස්තු 22 දින සංස්ථාපිත ශ්‍රී ලංකාව තුළ ස්ථිර පදිංචිය සහිත පොදු සීමාසහිත සමාගමකි. එය 2011 අංක. 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූලය සමාගමකි. සමාගම 2011 නොවැම්බර් 24 දින කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කොට ඇත. සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත.

සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 08, මරදාන පාර, අංක 1161 දරණ ස්ථානයේ පිහිටා ඇත.

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්**

2022 මාර්තු 31 දින අවසන් වූ වසර සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී (මව් සමාගම), සහ එහි පරිපාලිතයන්ගෙන් (එක්ව 'සමූහය' වශයෙන් හැඳින්වෙන) සමන්විත වේ.

**මව් සමාගම සහ පරම මව් සමාගම**

සමාගමෙහි මව් සමාගම වනුයේ ශ්‍රී ලංකා රජයේ හිමිකාරීත්වය සහිත මහජන බැංකුව වේ.

**සේවක සංඛ්‍යාව**

2022 මාර්තු 31 දින වන විට සමාගමෙහි සහ සමූහයෙහි සේවක සංඛ්‍යාව පිළිවෙළින් 2,245 ක් සහ 3,148 ක් විය. (2021 මාර්තු 31 දිනට 2,343 සහ 3,304).

### 1.2 සමූහය පිළිබඳ තොරතුරු

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය**

**සමාගම**

***පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී***

ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ මූල්‍ය කල්බදු ලබදීම, කුලී පිට ගැනුම් වත්කම් මූල්‍යකරණය, කාලසීමා ණය, ඉස්ලාමීය මූල්‍යකරණය, ආන්තික වෙළඳාම, කොටස් ව්‍යාපාර, ණය සාධනපත්‍ර නිකුත් කිරීම, සාධකකරණය, රන් ණය ලබාදීම සහ මහජන තැන්පතු ජංගමකරණය වේ.

**පරිපාලිතයන්**

| පරිපාලිතයන්හි නම | ප්‍රධාන ක්‍රියාකාරකම් | සංස්ථාපිත රට | ස්කන්ධ හිමිකමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|
| | | | 2022 | 2021 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | රථවාහන සමූහ කළමනාකරණය, රථවාහන තක්සේරුකරණය, රථවාහන අලෙවිය රක්ෂණ ඇස්තමේන්තු කිරීම සහ රථවාහන අළුත්වැඩියාව | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | මිශ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | රක්ෂණ ව්‍යාපාර කටයුතු සිදුකිරීම | ශ්‍රී ලංකාව | 75% | 75% |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම සහ මෙහෙයවීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | අඩු ආදායම්ලාභීන් වෙත සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවා සැපයීම | ශ්‍රී ලංකාව | 100% | 100% |
| ලංකන් එලායන්ස් ෆයිනෑන්ස් ලිමිටඩ් | නිශ්චල හා චංචල දේපළ වෙත කල්බදු ලබාදීම සහ ණය ලබාදීම ණය සාධනපත්‍ර නිකුත් කිරීම සහ මහජන තැන්පතු ජංගමකරණය | බංග්ලාදේශය | 51% | 51% |

විමර්ශනයට ලක් වන වසර තුළදී සමාගමෙහි සහ සමූහයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසිදු සැළකිය යුතු වෙනසක් සිදුනොවිය.

## 2. සකස් කිරීමේ පදනම සහ වෙනත් සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන්

### 2.1 අනුකූලතා ප්‍රකාශය

සමූහ මූල්‍ය ප්‍රකාශයන් සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනත, 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත හා පසුකාලීනව එය වෙත කෙරුනු සංශෝධනයන්ගේ අවශ්‍යතාවයන්ට සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගතවීමේ නීතිරීති වලට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත. මෙම මූල්‍ය ප්‍රකාශයන්, මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු හැර, පහත දැක්වෙන ගිණුම්කරණ උපචිත පදනම අනුව පිළියෙල කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 'www.casrilanka.com / www.slaasc.lk' වෙබ් අඩවියෙහි පවතී.

සමූහය මගින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ පාලනය සම්බන්ධ SLFRS සහ LKAS ප්‍රමිතීන් සහ රෙගුලාසි වලට අනුකූල නොවන, කිසිදු ගිණුම්කරණ ක්‍රමවේදයක් භාවිත නොකරන ලදී.

වසර තුළ අනුගමනය කරන ලද සමූහයේ පොදු ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු පිටු අංක 218 හි සටහන 3 හි දැක්වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි වගකීම් සහගතබව

2007 අංක 07 දරණ සමාගම් පනත සහ SLFRS සහ LKAS ප්‍රමිතීන් අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

''සමාගමෙහි කටයුතු සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව'' සහ 'මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම'' ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහතික කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම භාරගනී.

මෙම මූල්‍ය ප්‍රකාශයන් පහත සඳහන් සංරචකයන්ගෙන් සමන්විත වේ:

- විමර්ශනයට ලක්වන වසර තුළ සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ විස්තර සපයනු ලබන ආදායම් ප්‍රකාශයක් සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයක්;

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

- වසර අවසානය වන විට සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය තත්ත්වය සම්බන්ධ විස්තර සපයනු ලබන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්;
- විමර්ශනයට ලක්වන වසර තුළ සමාගමෙහි සහ සමූහයෙහි කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධ සම්බන්ධ සියළුම වෙනස්වීම් විදහා දක්වනු ලබන ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයක්,
- පරිශීලනය කරන්නන් හට මුදල් සහ මුදල් සමාන දෑ උත්පාදනය කිරීම සඳහා සමාගම සහ සමූහය සතු හැකියාව සහ අදාළ මුදල් ප්‍රවාහයන් භාවිත කිරීම සඳහා ආයතනයන්හි අවශ්‍යතාවයන් පිළිබඳ විස්තර සපයනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශයක්, සහ:
- ගිණුම්කරණ ප්‍රමිතීන් සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශයන් ආශ්‍රිත සටහන්.

## 2.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශයන් සඳහා අනුමත කිරීම

2022 ජූනි 24 වැනි දින සිදුකරන ලද අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට අනුව 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා (සන්සන්දනයන්ද ඇතුළුව) සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් අනුමත කිරීම සහ නිකුත් කිරීම සඳහා අවසර ලබාදීම 2022 ජූනි 24 වැනි දින සිදුකෙරිණි.

## 2.4 මිනුම්කරණ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතම හැරුනුවිට සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය:

| අයිතමය | මිනුම්කරණ පදනම | සටහන් අංකය |
|---|---|---|
| සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් වාර්තාව තුලින් මූල්‍ය වත්කම් | සාධාරණ අගය | 24 |
| සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම තුලින් මූල්‍ය වත්කම් | සාධාරණ අගය | 27 |
| ආයෝජන දේපළ | සාධාරණ අගය | 30 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමෙහි ප්‍රවර්තන වටිනාකම සහ ආයුගණන ලාභ සහ අලාභ වශයෙන් වගකීම හඳුනාගැනේ. | 43 |

## 2.5 මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් වත්කම් හා වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කොට ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතා සහ කල්පිරීමේ විලාශය පිළිබිඹු වන පරිදි අනුපිළිවෙලින් ලැයිස්තුගත කෙරිණි. වාර්තාකරණ දිනයෙන් පසු (ජංගම) මාස 12 ක් ඇතුළත සහ වාර්තාකරණ දිනයෙන් පසු (ජංගම නොවන) මාස 12 කට පසු අයකරගැනීමේ හෝ පියවීමේ කාලසීමාව පිළිබඳ සමාලෝචනයක් පියු අංක 305 හි සටහන 52 හි (ජංගම සහ ජංගම නොවන විමර්ශනය) යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇත. මූල්‍ය ප්‍රකාශයන් සඳහා බලපාන්නා වූ උද්ධමනකාරී සාධක සඳහා ගැලපුම් කිසිවක් සිදු කොට නොමැත.

## 2.6 හිලව් කිරීම

හඳුනාගත් මුදල් ප්‍රමාණයන් හිලව් කිරීම සම්බන්ධ නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට අදහස් කරන අවස්ථාවකදී, හෝ වත්කම් උපලබ්ධි කොට ඒ හා සමගාමීව වගකීම පියවනු ලබන අවස්ථාවකදී පමණක්, මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කිරීමෙන් අනතුරුව ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ. සමූහයෙහි කවර හෝ ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ දැක්වීමකින් අවශ්‍යතාවයක් හෝ අනුමැතියක් පවතින අවස්ථාවකදී හැරුනු විට, සහ සමාගමෙහි ගිණුම්කරණ ප්‍රමිතීන්හි විශේෂිතව දක්වනු ලැබ ඇති පරිදි ආදායම් හා වියදම් ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය තුළ හිලව් කිරීමක් සිදුනොවේ.

## 2.7 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ඉදිරිපත් කරන අතර එය සමූහය ක්‍රියාත්මක ප්‍රාථමික ආර්ථික පරිසරය තුල ව්‍යවහාර මුදල වේ. (සමූහ ක්‍රියාකාරී මුදල් ඒකකය)

## 2.8 වැටයීම

වෙනත් අයුරකින් දක්වා නොමැති නම් හැර, මූල්‍ය ප්‍රකාශයන්හි අගයයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 "මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම" මගින් අනුමත කොට ඇති පරිදි ආසන්නතම රුපියල් දහසට වටයනු ලැබ ඇත.

## 2.9 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 "මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම" අනුව සමාන අයිතමයන්හි එක් එක් ප්‍රමාණාත්මක වර්ගය වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හා කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලැබ ඇත.

## 2.10 සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

SLFRS සහ LKAS ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරෙහි අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගනු ලැබ ඇත. තවද, වාර්තා කරනු ලබන දින වන විට මීළඟ මූල්‍ය වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම් වල ධාරණ අගයයන් කෙරෙහි ප්‍රමාණාත්මක ගැළපුම් සිදුකිරීමට හේතුවන ආකාරයේ අනාගත හා වෙනත් ප්‍රධාන අස්ථාරභාව ඇස්තමේන්තුගත කිරීමේ මූලයන් සම්බන්ධයෙන් ද මූලික උපකල්පනයන් සිදුකිරීම කෙරෙහි කළමනාකාරිත්වය විසින් අවධානය යොමුකිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස්වීමේ හැකියාව පවතී.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වූ පාදක වූ උපකල්පන නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තු වලට අදාළ ප්‍රතිශෝධන ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කාලසීමාව තුළදී හා බලපෑමට ලක් වන කවර හෝ ඉදිරි කාලසීමාවන් හිදී හඳුනාගැනේ.

අවිනිශ්චිතතාවයට ආශ්‍රිත ප්‍රධාන සැළකිය යුතු මට්ටමේ ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත සාකච්ඡාවට භාජනය කරෙන අතර, එබඳු වත්කම් හා වගකීම් සම්බන්ධ අදාළ ධාරණ අගයයන් ආශ්‍රිත සටහන් වල දක්වනු ලැබ ඇත.

### 2.9.1 අඛණ්ඩතා පැවැත්ම

ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදු කරනු ලැබ ඇති අතර, කල්තබා දැකිය හැකි අනාගතය තුළ අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්ව සිටී. තවද, ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් සුරක්ෂිතව පැවැත්ම සඳහා

සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත්ව නොසිටී. එමනිසා අඛණ්ඩවම මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩතා පැවැත්ම යන පදනම මත සිදු කෙරේ.

2022 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේ පදනම නිර්ණය කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම සැළකිල්ලට ගැනීමේදී, පවතින තොරතුරු මත පදනම්ව, කළමනාකාරීත්වය විසින් සමූහයේ සමාගම් වෙත කෝවිඩ් 19 හි පවතින සහ අපේක්ෂිත බලපෑම් සහ අඛණ්ඩතා පැවැත්ම පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය ඇගයුමට ලක් කරන ලදී.

සමූහය විසින් අපේක්ෂිත පිරිවැය කළමනාකරණය, ලාභදායිත්වය, අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් විලම්බන හැකියාව, භාවිත නොකරන ලද ණය ප්‍රවාහ වැනි පුළුල් පරාසයක පැතිරුණ බහුවිධ ආතති පරීක්ෂා තත්ත්වයන් රැසක් සැළකිල්ලට ගනිමින් සිදුවිය හැකි බලපෑම හමුවේ සේවා සැපයීමේ සහ ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව ඇගයුමට ලක් කරන ලදී. සමූහ සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමූහයේ එක් එක් ක්ෂේත්‍රයෙහි ස්වභාවය පිළිබඳව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සහ ඉහත කරුණු කළමනාකාරීත්වය විසින් ඇගයුමට ලක් කිරීමෙන් පසු, සහ ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව නිසි පරිදි සැළකිල්ලට ගනිමින්, අනාවැකි පළ කල හැකි අනාගත කාලයක් සඳහා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් සමාගම සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වෙමින් ඉදිරියටත් මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම ආදේශ කරගැනීමට තීරණය කෙරිණි.

**මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය**
SLFRS 9 අනුව, සමූහයේ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් මගින්, පහත දැක්වෙන ක්‍රියාපටිපාටිය යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණය කොට පසුව ඒවා නම් වශයෙන් ක්‍රමක්ෂය පිරිවැය අනුව, සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින්, සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් වාර්තාව තුලින් වශයෙන් විවිධ කාණ්ඩයන් යටතේ මිනුම්කරණය කිරීම සඳහා අවශ්‍ය විෂයපථය සැකසෙනු ලැබේ.

- පිටු අංක 219 හි සටහන 3.5.2. හි දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් කළමනාකාරණය සඳහා සමාගමෙහි ව්‍යාපාර ආකෘතිය
- පිටු අංක 219 හි සටහන 3.5.2. හි දක්වා ඇති පරිදි මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ

**මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ**
SLFRS 9 යටතේ සියළුම මූල්‍ය වත්කම් කාණ්ඩයන් පුරා හානිකරණ අලාභ මිනුම්කරණයේදී, විනිසුම, විශේෂයෙන්ම අනාගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රමාණය හා කාලගණනය ඇස්තමේන්තු කිරීමේදී සහ හානිකරණ අලාභ නිර්ණය කිරීමේදී ඇප වටිනාකම් සැළකිල්ලට ගැනීම වැදගත් වේ.

සමූහය/සමාගම මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට ලක්ව ඇති බවට කවර හෝ වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න ඇගයුමට ලක් කෙරේ.

**ණය සහ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ**
සමූහය මගින් ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් සඳහා වෙන්කිරීමක් සිදු කල යුතුද යන්න තක්සේරු කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සිය කේවල වශයෙන් සැළකිය යුතු ණය හා අත්තිකාරම් සමාලෝචනයට ලක් කෙරේ. විශේෂයෙන්ම, අනාගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රමාණය හා කාලගණනය ඇස්තමේන්තු කිරීමේදී සහ හානිකරණ අලාභ නිර්ණය කිරීමේදී කළමනාකාරීත්වයේ විනිසුම වැදගත් වේ.

මෙම ඇස්තමේන්තු සාධක රැසක් පිළිබඳ උපකල්පනයන් මත පදනම් වන බැවින් වෙනස් විය හැකි වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදුකෙරෙන හානිකරණ වෙන්කිරීම වෙත අනාගත වෙනස්වීම් සිදුවිය හැක.

'ණය සහ ලැබිය යුතු දෑ මත හානිකරණ අලාභ' පිළිබඳ විස්තර පිටු අංක 260 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 25.6 හි දැක්වේ.

**මූල්‍ය ආයෝජන මත හානිකරණ ගාස්තු**
SLFRS 9 - මූල්‍ය ආයෝජන වලට අනුව මූල්‍ය ආයෝජන හානිකරණයට යටත්ව ක්‍රමක්ෂය පිරිවැය යටතේ කාණ්ඩගත කෙරේ. සමාග ම/සමූහය සතුව ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධනපත්‍රවල අලාභයක් සම්බන්ධ ඓතිහාසික අත්දැකීමක් නොමැත. එමනිසා, සමූහය මගින් බ්ලූම්බර්ග් වැනි බාහිර ණය ශ්‍රේණිගත කිරීම් මගින් ප්‍රකාශිත පැහැර හැරීමේ සම්භාවිතාව (PD). ශ්‍රී ලංකා රජය මගින් රුපියල් වලින් නිකුත් කරන ලද ණය සුරැකුම් සඳහා පැහැර හැරීම් නිසා සිදුවූ අලාභය (LGD) 0% වශයෙන්, සහ සෙසු සියළුම සාධනපත්‍රයන් සඳහා (LGD) වශයෙන් ක්ෂේත්‍රයේ සාමාන්‍යයද සැළකිල්ලට ගැනේ.

මූලික හඳුනාගැනීමේ සිට, මූල්‍ය ආයෝජන ආශ්‍රිතව ණය අවදානම කැපීපෙනෙන අයුරින් ඉහළ ගොස් නොමැත. එමනිසා, සමූහය මගින් එබඳු ආයෝජන සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අපේක්ෂිත ණය අලාභ වාර්තා නොකරන ලදී.

**සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් (FVOCI) හානිකරණය**
'වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට (FVOCI) හානිකරණය' පිළිබඳ විස්තර පිටු අංක 268 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 27 හි දැක්වේ.

**දේපළ, පිරියත සහ උපකරණ වල සඵල ජීව කාලය**
සමූහය මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී දේපළ, පිරියත සහ උපකරණ වල අවශේෂ වටිනාකම්, සඵල ජීව කාලයන් සහ ක්ෂයවීමේ ක්‍රමවේදයන් සමාලෝචනයට ලක් කෙරේ. ඒවා අවිනිශ්චිතතාවන්ට ලක් විය හැකි බැවින් එකී වටිනාකම්, අනුපාතයන්, ක්‍රමවේදයන් ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරීත්වයේ විනිසුම යොදා ගැනේ.

**අස්පෘශ්‍ය වත්කම් වල සඵල ජීව කාලය**
'අස්පෘශ්‍ය වත්කම් වල සඵල ජීව කාලය' පිළිබඳ විස්තර පිටු අංක 281 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 34 හි දැක්වේ.

GRI | 207-1, 207-2, 207-4

**මිල හුවමාරු රෙගුලාසිය**
සමාගම මිල හුවමාරු රෙගුලාසි ඇතුළු ආදායම් බදු හා වෙනත් බදු වලට යටත් වේ. අදාළ මිල හුවමාරු රෙගුලාසි සම්බන්ධ පවතින අවිනිශ්චිතතාවන් හේතුවෙන් මිල හුවමාරු රෙගුලාසි වල බලපෑම පිළිබඳව නිර්ණය කිරීම සඳහා කළමනාකාරීත්වයේ විනිසුම අවශ්‍ය විය. ඒ අනුව ආශ්‍රිත ප්‍රතිඥාවන් හඳුනා ගැනීම, අදාළ නුදුරු මිළ ඇස්තමේන්තු කිරීම සහ උචිත මිළකරණ යාන්ත්‍රණයන් තෝරාගැනීම ඇතුළත්ව එනමුත් ඒවාට සීමා නොවී රෙගුලාසි ආදේශ කරගැනීමේදී විනිශ්චයන් සහ ඇස්තමේන්තු යොදා ගැණිනි. ප්‍රවර්තන බදු ගාස්තුව එවැනි විනිශ්චයන්ට භාජනය විය. පැවරුම් මිළකරණ ප්‍රතිපත්ති සම්බන්ධ කළමනාකාරීත්වයේ අර්ථනිරූපනයෙහි සහ ක්‍රියාවේ යෙදවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇස්තමේන්තුගත ආදායම් බදු ගාස්තුව සහ තථ්‍ය ගෙවීමේ ප්‍රමාණය අතර වෙනස්කම් උද්ගත විය හැක.

GRI | 207-1, 207-2, 207-4

**විලම්බිත බදු**
විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 297 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 44 හි දැක්වේ.

**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම පිළිබඳ විස්තර පිටු අංක 294 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 43 හි දැක්වේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**පරිපාලිත සමාගමක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධ තක්සේරුකරණය**
වාර්තාකරණ දිනට වාර්තාගත හිමිකම්පෑම් වල අපේක්ෂිත පරම පිරිවැය සහ වාර්තාකරණ දිනට දරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) හිමිකම්පෑම් සම්බන්ධ අපේක්ෂිත පරම පිරිවැය යන ද්විත්වය සම්බන්ධයෙන්ම සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් සැකසීම අවශ්‍ය වේ. ස්ථාවරවම පරම හිමිකම්පෑම් පිරිවැය ස්ථාපනය කරගැනීම සඳහා සැළකිය යුතු කාලයක් ගත වේ. හිඟ හිමිකම්පෑම් අගයයන් ඇස්තමේන්තු කිරීම සඳහා පාදක වන ප්‍රධාන උපකල්පනය අතීත හිමිකම්පෑම් වර්ධන අත්දැකීමයි.

විශාල හිමිකම්පෑම් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් වෙන වෙනම කටයුතු කෙරෙන අතර, එහිදී අලාභ ගලපන ලද ඇස්තමේන්තු වල මුහුනත අගය මත වෙන්කිරීම හෝ ඒවායේ අනාගත වර්ධනයන් පිළිබිඹු වන අයුරින් වෙන වෙනම ප්‍රක්ෂේපනය කිරීම සිදු කෙරේ. බොහෝ අවස්ථාවන්හිදී, හිමිකම්පෑම් වල අනාගත අනුපාතයන්, උද්ධමනය හෝ අලාභ අනුපාතයන් සම්බන්ධයෙන් නිශ්චිත උපකල්පන සිදු නොකෙරේ.

## 2.11 සන්සන්දනාත්මක තොරතුරු
වර්තමාන වසරේ මූල්‍ය වාර්තා වඩාත් හොඳින් අවබෝධ කරගනු හැකි වන පරිදි හා අන්තර් කාලපරිච්ඡේද සන්සන්දන හැකියාව ඉහළ නංවනු පිණිස පසුගිය වසර ආශ්‍රිත ප්‍රමාණාත්මක, වාර්තාගත හා විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කෙරේ. අදාළ අවසථාවන්හිදී, වර්තමාන වසරේ තොරතුරු සමග සන්සන්දනය කළ හැකි වන පරිදි, අවශ්‍ය ස්ථානයන්හිදී, පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන ඉදිරිපත් කිරීම් හා වර්ගීකරණයන් සංශෝධනය කරනු ලැබ ඇත.

## 3. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්
## 3.1 ඒකාබද්ධකරණයේ පදනම
3.1 ඒකාබද්ධකරණයේ පදනම 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් වෙත සමාගම, එහි පරිපාලිතයන් සහ එහි හවුල්කාර සමාගම් ඇතුළත් වේ. දෙසැම්බර් 31 දිනෙන් මූල්‍ය වර්ෂය අවසන් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් හි පාරිපාලිතයක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස් හැරුනුවිට, සමාගම, එහි පරිපාලිතයන් සහ එහි හවුල්කාර සමාගම් වල මූල්‍ය ප්‍රකාශයන් එකම වාර්තාකරණ වසරක් සඳහා පිළියෙල කෙරේ. ඒකාබද්ධකරණ කාර්ය උදසා සමාන වාර්තාකරණ වසරක් භාවිත කෙරේ.

### 3.1.1. ව්‍යාපාර සංයෝජනය සහ කීර්තිනාමය
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 03 (ව්‍යාපාර සංයෝජන) හි අවශ්‍යතාවන්ට අනුකූලව ව්‍යාපාර සංයෝජනයන් අත්පත් කරගැනීමේ ක්‍රමය යොදා ගනිමින් ගිණුම්ගත කෙරේ.

සමාගම සහ සමූහය මගින් කීර්තිනාමය මනිනු ලබන්නේ, අත්පත් කරගැනීමට ලක් වූ ආයතනයෙහි කවර හෝ පාලනයට නතු නොවන හඳුනාගත් වටිනාකමක්ද ඇතුළුව මාරු කරන ලද ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගයෙන් හඳුනාගත හැකි අත්පත් කරගත් වත්කම් සහ උපකල්පිත වගකීම් වල ශුද්ධ හඳුනාගත් වටිනාකම අඩුකිරීමෙන් වන අතර, සියළුම මිනුම් අත්පත් කරගන්නා ලද දිනට සිදු කෙරේ. අතිරික්තය සෘණාත්මක වන විටදී, කේවල් කිරීමේ මිළදී ගැනීමේ ලාභයක් වහාම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්තිනාමය මූලිකව පිරිවැය අනුව මනිනු ලබන අතර, එය අත්පත් කරගන්නා ලද හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වගකීම් සම්බන්ධ සමූහයේ අයිතිය මත ව්‍යාපාර සංයෝජන පිරිවැයෙහි අතිරික්තය වේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, කීර්තිනාමය මනිනු ලබන්නේ පිරිවැය අනුව කවර හෝ සමුච්චිත හානිකරණ අලාභයන් අඩු කිරීමෙනි. සිදුවීම් හෝ තත්ත්වයන් සම්බන්ධ වෙනස්වීම් මගින් ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බවට දැක්වෙන්නේ නම්, කීර්තිනාමය හානිකරණය සඳහා වාර්ෂිකව හෝ එයට වඩා නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. හානිකරණ පරීක්ෂාවන් සඳහා, ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්තිනාමය, අත්පත් කරගන්නා ලද දිනයේ සිට, අදාළ සංයෝජනයෙහි හවුල්කාරීත්වයන් මගින් ප්‍රතිලාභ ලබතැයි අපේක්ෂිත සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක (CGU) හෝ මුදල් උත්පාදන ඒකක සමූහයන් (CGU) වෙත බෙදා වෙන් කෙරෙන අතර, එහිදී එකී ඒකකයන් වෙත අත්පත් කරගැනීමට ලක් වූ ආයතනයෙහි වෙනත් වත්කම් හෝ වගකීම් පවරා ඇති බවක් හෝ නොමැති බවක් සැළකිල්ලට නොගැනේ.

කීර්තිනාමය මගින් මුදල් උත්පාදන ඒකකයක (CGU) (හෝ (CGU) සමූහයක) කොටසක් නිර්මාණය වන සහ එකී ඒකකය තුළ මෙහෙයුම බැහැර කරනු ලබන අවස්ථාවකදී, බැහැර කරන ලද මෙහෙයුම ආශ්‍රිත කීර්තිනාමය, අදාළ මෙහෙයුම් බැහැර කිරීමේ ලාභය හෝ අලාභය නිර්ණය කිරීමේදී මෙහෙයුමහි ධාරණ අගය තුළ ඇතුළත් කෙරේ. මෙකී තත්ත්වයන් තුළ බැහැර කරන ලද කීර්තිනාමය මනිනු ලබන්නේ බැහර කරන ලද මෙහෙයුමෙහි සාපේක්ෂ වටිනාකම් සහ මුදල් උත්පාදන ඒකකය (CGU) මගින් රඳවා ගන්නා ලද කොටස පදනම් කර ගනිමිනි.

පරිපාලිතයන් විකුණා දමනු ලබන අවස්ථාවේදී, විකිණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වටිනාකම සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් සහ කීර්තිනාමය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

### 3.1.2. පොදු පාලන ව්‍යාපාර සංයෝජන
පොදු පාලන ව්‍යාපාර සංයෝජන ගිණුම්ගත කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද නිර්දේශිත ක්‍රියාකාරකම් ප්‍රකාශය - පොදු පාලන ව්‍යාපාර සංයෝජන සඳහා ඒකාබද්ධ ගිණුම්කරණයට අදාළ මාර්ගෝපදේශයන් භාවිත කරමිනි.

### 3.1.3. පාලනය අහිමිවීම
පාලනය අහිමි වීමෙන් අනතුරුව, සමූහය මගින් පරිපාලිතයෙහි වත්කම් හා වගකීම් කවර හෝ පාලනය රහිත අයිතයක් සහ පරපාලිතයෙහි ස්කන්ධ ස්කන්ධ ආශ්‍රිත සෙසු සංරචකයන් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. පාලනය අහිමි වීමෙන් උද්ගත වන කවර හෝ අතිරික්තයක් හෝ ඌනයක් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. සමූහය මගින් පෙර පරිපාලිතයහි කවර හෝ අයිතියක් රඳවාගනු ලබන්නේ නම්, එබඳු අයිතියක් පාලනය අහිමි වන දිනයේදී සාධාරණ අගය අනුව මනිනු ලැබේ.

### 3.1.4. ඒකාබද්ධකරණයේදී ඉවත් කරන ලද ගනුදෙනු
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අභ්‍යන්තර - සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අභ්‍යන්තර - සමූහ ගනුදෙනු වලින් උද්ගත වන කවර හෝ උපලබ්ධි නොවූ ආදායම් හෝ වියදම් ඉවත් කෙරේ. ස්කන්ධ ගිණුම්ගත ආයෝජිතයන් සමග වන ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධ නොවූ ලාභයන්, ආයෝජිතයා කෙරෙහි සමූහයේ අයිතිය පවතින තාක් දුරට ආයෝජනයට එරෙහිව ඉවත් කෙරේ. උපලබ්ධ නොවූ අලාභයන්ද උපලබ්ධි නොවූ ලාභයන් ආකාරයටම ඉවත් කෙරෙන නමුත්, එය සිදු කෙරනුයේ කිසිදු හානිකරණ සාක්ෂියක් නොමැති තාක් දුරට පමණි.

## 3.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්
සියළුම විදේශ මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනු සිදුකෙරුනු දිනයේ පැවති එතැන් හුවමාරු අනුපාත අනුව ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. මේ සම්බන්ධයෙන්, සමූහයෙහි ක්‍රියාමාර්ගය වනුයේ ගනුදෙනු දිනයේ මධ්‍ය හුවමාරු අනුපාතය යොදා ගැනීමයි.

වාර්තාකරණ දිනයේදී විදේශ මුදල් ඒකක වලින් දැක්වෙන මුදල් වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනයේ පවතින එතැන් හුවමාරු අනුපාතය අනුව ක්‍රියාකාරී මුදල් ඒකකය වෙත ප්‍රතිපරිවර්තනය කෙරේ. මුදල් අයිතම මත විදේශ මුදල් ඒකක ලාභය හෝ අලාභය වනුයේ, සඵල පොලී අනුපාතයට ගලපන ලද වසර ආරම්භයේදී

ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි ක්‍රමක්ෂය පිරිවැය හා වසර තුළ සිදුකරන ලද ගෙවීමේ සහ වාර්තාකරණ දිනයේදී හුවමාරු අනුපාතය අනුව පරිවර්තනය කරන ලද විදේශ මුදල් ඒකකයන්හි ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස වේ.

විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැයට අදාළව මනින ලද මුදල් නොවන අයිතම හඳුනාගැනීමේ දිනයේදී එතැන් හුවමාරු අනුපාතය යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ මුදල් ඒකකයකින් සාධාරණ අගයට මනින ලද මුදල් නොවන අයිතම සාධාරණ අගය නිර්ණය කරන ලද දිනයේ පැවති එතැන් හුවමාරු අනුපාත අනුව පරිවර්තනය කෙරේ.

### 3.3. SLFRS 15 - ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ආදායම

SLFRS 15 මගින් ''ආදායම'' සම්බන්ධ LKAS 18 ප්‍රමිතිය, ''ඉදිකිරීම් ගිවිසුම්'' සම්බන්ධ LKAS 11 ප්‍රමිතිය සහ ''ගනුදෙනුකාර හිතෛෂීත්ව වැඩසටහන්' සම්බන්ධ IFRIC 13 ප්‍රමිතිය ඇතුළුව ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශයන් ප්‍රතිස්ථාපනය කෙරෙන අතර එය 2018 අප්‍රියෙල් 01 දින හෝ එයට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ.

SLFRS 15 මගින් ආදායම කොපමණ ප්‍රමාණයක්, කුමන අවස්ථාවේදී හඳුනාගන්නේද යන්න තීරණය කිරීම සඳහා විස්තරාත්මක රාමුවක් ලබාදේ. SLFRS 15 අනුව නව තුලනාත්මක හා ප්‍රමාණාත්මක අනාවරණවලින් ගණුදෙනුකරුවි සමග ගිවිසුම්වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන්හි ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාව අවබෝධ කර ගැනීමට මූල්‍ය ප්‍රකාශ භාවිතා කරන පරිශීලකයන්ට හැකියාව ඇති කිරීමට තැත් කරයි.

මෙහිදී සමාගම් මගින් ආදායම කුමන කාලයකදී සහ කවර වටිනාකමක් ද යන්න හඳුනාගැනීම සඳහා පියවර පහක ආකෘතියක් යොදාගැනීම අවශ්‍ය වේ. මෙම ආකෘතිය මගින් සමාගමක් විසින් එය අපේක්ෂා කරන ආදායම ලබාගැනීම සඳහා කිසියම් ගනුදෙනුකරුවකු වෙත භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය මාරු කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනාගත යුතු බවට විශේෂ කොට දක්වේ.

### 3.4 බලාත්මක වීමට නියමිත සහ සංශෝධිත සම්මතය සහ අර්ථදැක්වීම

මෙම මූල්‍ය ප්‍රකාශයන්හිදී, සමූහය මගින් මූල්‍ය වාර්තාකරණ්‍ය සඳහා, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 වෙත සංශෝධන සහ SLFRS 16 - පොලී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණ සහ පළමු වරට 2020 ජනවාරි 1 දිනට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන්ට බලාත්මක වූ - SLFRS 16 වෙත සංශෝධන - කොවිඩ් 19 ආශ්‍රිත කුලී සහන යොදා ගනු ලැබිය. සමූහය මගින්, නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන කිසිදු වෙනත් ප්‍රමිතියක්, අර්ථදැක්වීමක් හෝ සංශෝධනයක් කල්තබා ආදේශ කර නොගැනුනි.

### 3.4.1. SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 වෙත සංශෝධන

SLFRS 9, LKAS 39 වෙත සංශෝධන මගින් පොලී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණ වල සෘජු බලපෑමට ලක් වූ සියලුම හෙජින් සබඳතා වලට අදාළ වන සහන රැසක් සපයනු ලැබේ. ප්‍රතිසංස්කරණය මගින්, හෙජින් අයිතමයේ හෝ හෙජින් සාධනපත්‍ර කඩඉම් මත පදනම් වූ මුදල් ප්‍රවාහයන්හි කාලගණනය සහ/හෝ වටිනාකම සම්බන්ධ අවිනිශ්චිතතාවක් උද්ගත වන්නේ නම් එය හෙජින් සබඳතාවයකට බලපායි.

IBOR ප්‍රතිසංස්කරණ අදියර 2 හි සහන සහ අමතර හෙළිදරව් කිරීම් රැසක් ඇතුළත් වේ. ප්‍රතිසංස්කරණය හේතුවෙන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හෝ හෙජින් සබඳතා වෙත වෙනස්කම් සිදුකරන ලද අවස්ථාවකදී, SLFRS ආදේශ කරගැනීම සඳහා සමාගම් අදාළ සංශෝධනයෙ සහාය හිමි වේ.

විවිධ සම්මතයන් වෙත සිදුකරන ලද මෙකී සංශෝධන 2021 ජනවාරි 1 ට පසු ඇරඹෙන වාර්ෂික වාර්තා කාලපරිච්ඡේදයන් කෙරෙහි බලපැවැත්වේ. මෙම සංශෝධනය මගින් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම සමාගම විසින් ඇගයුමට ලක් කරමින් පවතී.

### 3.4.2 SLFRS 16 වෙත සංශෝධන - කොවිඩ් 19 ආශ්‍රිත කුලී සහන

සංශෝධන මගින් කෝවිඩ් 19 වසංගතයෙහි සෘජු ප්‍රතිවිපාකයක් වශයෙන් උද්ගත වන කුලී සහන සඳහා කල්බදු නවීකරණ ගිණුම්කරණය සම්බන්ධ SLFRS 16 උපදෙස් යොදාගැනීම මගින් බදු ගැණුම්කරුවන් වෙත සහන සපයනු ලැබේ.

ප්‍රායෝගික උපායමාර්ගයක් වශයෙන්, බදුකරුවකු වෙතින් වන කෝවිඩ් 19 කුලී සහනයක් කල්බදු නවීකරණයක්ද යන්න ඇගයුමට ලක් කිරීමට බදු ගැණුම්කරුවකු ඉදිරිපත් නොවිය හැක. මෙම තෝරාගැනීම සිදුකරන බදු ගැණුම්කරුවකු, අදාළ වෙනස කල්බදු නවීකරණයක් නොවන්නේ නම්, SLFRS16 යටතේ වෙනස සඳහා ගිණුම්ගත වන ආකාරයෙන්ම කෝවිඩ් 19 ආශ්‍රිත කුලී සහනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් වන කවර හෝ කල්බදු ගෙවීමේ වෙනසක් සඳහා ගිණුම්ගත වේ.

මෙම සංශෝධනය 2020 ජූනි 01 හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා අදාළ වේ. මෙම සංශෝධනය සම්බන්ධ කල්තබා අයැදුම්කිරීමේ අනුමැතිය පවතී. කිසියම් සමාගමක් විසින් කල්තබා මෙම සංශෝධනය ආදේශ කරගනු ලැබුවේ නම් ඉහත හෙළිදරව් කිරීම එළඹෙන සම්මත සටහන යටතේ ඇතුළත් නොකල යුතු වේ - එය ''ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්/වසර තුළදී ආදේශ කරගන්නා ලද නව සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිතීන්'' සටහන යටතේ පිළිබිඹු විය යුතු වේ. සමාගම/සමූහය මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

### 3.5 මූල්‍ය සාධනපත්‍ර - මූලික හඳුනාගැනීම සහ පශ්චාත් මිනුම්කරණය

#### 3.5.1. හඳුනාගැනීමේ දිනය

'නිත්‍ය මාර්ග වෙළඳාම' හැර සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව වෙළඳාම් දිනයේදී හඳුනාගැනේ. එනම්, සමූහය සාධනපත්‍රයෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදන වෙත පාර්ශවයක් බවට පත්වන දිනය වේ. 'නිත්‍ය මාර්ග වෙළඳාම' යනු රෙගුලාසි හෝ වෙළඳපොල සම්මුතිය මගින් පොදුවේ ස්ථාපිත කාලසීමාවක් තුළ වත්කම් බෙදාහැරීම අවශ්‍ය වන ආකාරයේ මූල්‍ය වත්කම් මිළදී ගැනීම් හෝ විකිණීම් වේ. එම වෙළඳාම් පියවීම් දිනයේදී මූලිකව හඳුනාගැනේ.

#### 3.5.2. මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පශ්චාත් මිනුම්කරණය

SLFRS 9 අනුව, සමූහය මගින් ස්වකීය සියළුම මූල්‍ය වත්කම් අදාළ වත්කම් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතිය අනුව වර්ගීකරණය කෙරෙන අතර වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි පහත දක්වෙන අයුරින් මනිනු ලැබේ:

- ක්‍රමක්ෂය පිරිවැය අනුව
- සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුලින් (FVOCI)
- සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් ප්‍රකාශය තුලින් (FVTPL)

මූල්‍ය වත්කම් වල පශ්චාත් මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**ව්‍යාපාර ආකෘතිය ඇගයුම**

2018 අප්‍රියෙල් 1 වැනි දින සිය බලපැවැත්වෙන පරිදි, සමූහය මගින් වත්කමක් කළඹ මට්ටමේ රඳවාගනිමින් සාධනපත්‍රයෙන් සාධනපත්‍රයට පදනමින් ඇගයුමට ලක් නොකරන ආකාරයේ ව්‍යාපාර ආකෘතියක අරමුණ සම්බන්ධ ඇගයුමක් සිදුකරනු ලබන අතර මෙහිදී ව්‍යාපාරය කළමනාකරණය කෙරෙන ආකාරය සහ කළමනාකාරීත්වය වෙත තොරතුරු සැපයෙන ආකාරය පිළිබිඹු කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සැළකිල්ලට ගැනුනු තොරතුරු පහත දක්වෙන පරිදි වේ:

- කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රමිතීන් හා අරමුණු සහ අදාළ ප්‍රමිතීන් ප්‍රායෝගිකව මෙහෙයවීම. නිශ්චිතවම, කළමනාකාරීත්වයේ ක්‍රමෝපාය මගින් ගිවිසුම්ගත පොළී ආදායම උපයාග ැනීම, නිශ්චිත පොළී අනුපාත ස්වභවයක් පවත්වා ගෙන යාම, මූල්‍ය වත්කම් වල කාලසීමාව අදාළ වත්කම් සඳහා මූල්‍යකරණය සිදුකරනු ලබන වගකීම් වල කාලසීමාව සමග ගැළපීම හෝ අදාළ වත්කම් විකිණීම ඔස්සේ මුදල් ප්‍රවාහ උපලබ්ධි කිරීම කෙරෙහි අවධානය යොමු වන්නේද යන වග:
- කළඹෙහි කාර්යසාධනය ඇගයුමට ලක් කෙරෙන සහ සමූහ කළමනාකාරීත්වය වෙත වාර්තා කෙරෙන ආකාරය:
- ව්‍යාපාර ආකෘතියෙහි කාර්යසාධනය කෙරෙහි බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගැනෙන මූල්‍ය වත්කම්) සහ අදාළ අවදානම් කළමනාකරණය කරනු ලබන ආකාරය:
- ව්‍යාපාරයෙහි කළමනාකරුවන් වෙත ප්‍රතිලාභ පිරිනැමෙන ආකාරය - උදා: ප්‍රතිලාභය කළමනාකරණය කරනු ලබන වත්කම් වල සාධාරණ අගය මත පදනම් වන්නේද නැතිනම් එක්රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම් වන්නේද යන්න: සහ
- පෙර වාර්තාවන්හි විකිණුම් සම්බන්ධ වාර ගණන, පරිමාව සහ කාලගණනය, එබඳු විකිණුම් සඳහා හේතු සහ අනාගත විකිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාව. කෙසේවුවද, විකිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු හුදෙකලාව සැළකිල්ලට ගනු නොලබන අතර, මූල්‍ය වත්කම් කළමනාකරණය සම්බන්ධ සමූහයේ ප්‍රකාශිත අරමුණ සපුරාලන ලද ආකාරය සහ මුදල් ප්‍රවාහ උපලබ්ධි වූ ආකාරය සම්බන්ධ සමස්ත ඇගයුමක කොටසක් වශයෙන් සැළකිල්ලට ගැනේ.

ව්‍යාපාර ආකෘති ඇගයුම සාධාරණ ලෙස අපේක්ෂිත තත්ත්වයන් මත පදනම් වන අතර එහිදී ''නරකම තත්ත්වය' හෝ 'ආතති තත්ත්වය' සැළකිල්ලට නොගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ සමූහයේ මුල් අපේක්ෂාවන්ට වෙනස් ආකාරයකින් උපලබ්ධි වුවහොත්, සමූහය මගින් එම ව්‍යාපාර ආකෘතිය තුළ රඳවාගෙන ඇති ඉතිරි මූල්‍ය වත්කම් වල වර්ගීකරණය වෙනස් නොකරන නමුත්, ඉදිරියට යාමේදී අළුතින් අරඹන ලද හෝ අළුතින් මිලදී ගන්නා ලද මූල්‍ය වත්කම් ඇගයීමේදී අදාළ තොරතුරු ඇතුළත් කෙරේ.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තනිකරම මුල් මුදල සහ පොලිය ගෙවීම්ද යන්න තක්සේරු කිරීම**
සිය වර්ගීකරණ ක්‍රියාවලියෙහි දෙවැනි පියවරක් වශයෙන් සමූහය මගින් සපුරාලන්නේදැයි හඳුනාගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි ඇගයුමට ලක් කෙරේ.

මෙම ඇගයුම සඳහා, ''මුල් මුදල'' යන්න මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය වශයෙන් සහ එය මූල්‍ය වත්කමෙහි ජීව කාලය පුරා වෙනස් විය හැකි බවට නිර්වචනය කෙරේ. (උදාහරණයක් වශයෙන්, මුල් මුදල ආපසු ගෙවීම් හෝ වාරික/වට්ටම හි ක්‍රමක්ෂය).

''පොලිය'' යන්න නිර්වචනය කෙරෙනුයේ මුදලෙහි කාල වටිනාකම සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා හිඟ මුල් මුදල ආශ්‍රිත ණය අවදානම සඳහා සහ සෙසු මූලික ණය දීමේ අවදානම් සහ පිරිවැය මෙන්ම ආන්තික සඳහා ද වන ප්‍රතිශ්ඨාව වශයෙනි.

මෙයට එරෙහිව, අවදානම කෙරෙහි නිරාවරනය අවම කිරීම සඳහා හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත කොන්දේසි හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් උද්ගත නොකරන මූලික ණය ලබාදීමේ කටයුත්ත ආශ්‍රිත නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි උච්චාවචනයන් තනිකරම හිඟ මුල් මුදලෙහි මුල් මුදල සහ පොළී ගෙවීම් වේ. එවැනි අවස්ථාවන්හිදී, අදාළ මූල්‍ය වත්කම ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මැනිය යුතු වේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම හිඟ මුල් මුදලෙහි ගෙවීම සහ පොළී ගෙවීම්ද යන්න ඇගයුමට ලක් කිරීමේදී, සමූහය මගින් සාධනපත්‍රයෙහි ගිවිසුම්ගත කොන්දේසි සැළකිල්ලට ගනු ලැබේ. මෙයට අදාළ මූල්‍ය වත්කම මෙම කොන්දේසිය සපුරාලීමට අපොහොසත් වන ආකාරයෙන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි කාලගණනය හෝ වටිනාකම වෙනස් කල හැකි ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසියකින් යුක්ත වේද යන්න ඇගයුමට ලක් කිරීම ඇතුළත් වේ. ඇගයුම සිදුකිරීමේදී සමූහය මගින් පහත දක්වෙන කරුණු සැළකිල්ලට ගැනේ:

- මුදල් ප්‍රවාහයන්හි කාලගණනය හෝ වටිනාකම වෙනස් කල හැකි අසම්භාව්‍ය සිදුවීම්:
- වගකීම් ඉටු කිරීම (Leverage) පිළිබඳ විශේෂාංග:
- පෙරදායකවීම් සහ විස්තාරණ කොන්දේසි:
- විශේෂිත වත්කම් වලින් මුදල් ප්‍රවාහ සඳහා සමූහයෙහි හිමිකම්පෑම සීමා කෙරෙන කොන්දේසි: සහ
- මුදලෙහි කාල වටිනාකමෙහි ප්‍රතිශ්ඨාව වෙනස් කරන ආකාරයේ විශේෂාංග

සමූහය හට ආවර්තිත ප්‍රතිසැකසුම් දිනයන්හිදී පොළී අනුපාතය සංශෝධනය කිරීම සඳහා යෝජනා කළ හැකි ආකාරයේ වරණයක් සහිත දිගු කාලීන ස්ථාවර අනුපාත ණය කළඹක් සමූහය සතු වේ. මෙම ප්‍රතිසැකසුම් අයිතීන් අදාළ සංශෝධනය සිදු කරනු ලබන අවස්ථාවේ පවතින වෙළඳපොළ අනුපාතයන්ට සීමා වේ. මෙහිදී ණයගැතියන් හට සංශෝධිත අනුපාතය පිළිගැනීම හෝ දඩ මුදලකින් තොරව ණය මුදල පිරිමුදනු ලැබීම සිදුකල හැකි වේ. සමූහය මගින් මෙම ණය මුදල් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තනිකරම මුල් මුදල සහ පොලිය ගෙවීම් වශයෙන් නිශ්චර කරනු ලැබ ඇති අතර එයට හේතුව මෙම වරණය මගින් හිඟ මුල් මුදල් වටිනාකම ආශ්‍රිත මුදලෙහි කාල වටිනාකම, ණය අවදානම, සෙසු මූලික ණය ලබාදීමේ අවදානම් සහ පිරිවැය සඳහා ප්‍රතිශ්ඨාවට බලපාන අයුරින් පොළී අනුපාතය විචලනය වීමයි.

විවිධ වර්ගයේ මූල්‍ය වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

**ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය වත්කම්**
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කමක් මනිනු ලබන්නේ එය පහත දක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් වන අතර එය ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට වශයෙන් නම් නොකෙරේ:

- වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමේ අරමුණින් වත්කම් රඳවාගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ රඳවාගෙන පැවතීම: සහ
- මූල්‍ය වත්කමෙහි ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දිනයන්හිදී තනිකරම හිඟ මුල් මුදලෙහි සහ පොළී ගෙවීම් වන මුදල් ප්‍රවාහ උද්ගත කරවීම.

ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය වත්කම් පිටු අංක 248,249,251,267,269 සහ 283 සිට 293 දක්වා සටහන් 22,23,25,26,28 සහ 35 සිට 41 දක්වා ඉදිරිපත් කෙරේ.

**සාධාරණ අගයේ වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශය ඔස්සේ මනින ලද මූල්‍ය වත්කම්**
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද ණය සහ ස්කන්ධ සාධනපත්‍ර වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් පිටු අංක 268 හි සටහන 27 හි දක්වේ.

**සාධාරණ අගයේ වෙනස්වීම් ආදායම් ප්‍රකාශය ඔස්සේ මනින ලද මූල්‍ය වත්කම්**
SLFRS 9 අනුව, ක්‍රමක්ෂය පිරිවැය අනුව හෝ වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනින ලද වශයෙන් වර්ගීකරණය නොකරන ලද සියළුම මූල්‍ය වත්කම් ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබේ. ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා රඳවාගත් හෝ කළමනාකරණය කෙරෙන මූල්‍ය වත්කම් සහ ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සඳහා රඳවාගෙන හෝ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම හා පිටු අංක 249 හි සටහන 24 හි සාකච්ඡා කෙරෙන මූල්‍ය වත්කම් සහ ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට මූලික හඳුනාගැනීමෙන් පසු නම් කරන ලද මූල්‍ය වත්කම් විකිණීම යන දෙකම සඳහා නොවන බැවින් සාධාරණ අගය පදනම මත කාර්යසාධනය ඇගයුමට ලක් කෙරෙන මූල්‍ය වත්කම් වලින් සමන්විත වේ.

**ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද මූල්‍ය වත්කම්**
SLFRS 9 අනුව, මූලික හඳුනාගැනීමේදී, සමූහය මගින් මූල්‍ය වත්කමක් නැවත අවලංගු නොකල හැකි පරිදි නම් කරනු ලබන්නේ, නැතිනම් එය ක්‍රමක්ෂය පිරිවැය අනුව හෝ FVTPL හිදී FVOCI අනුව මැනීම සඳහා අවශ්‍යතා සපුරාලමින් එකී නම් කිරීම ඉවත්වීම හෝ නැතිනම් වත්කම් හෝ වගකීම් හෝ ලාභ හෝ අලාභ හෝ වෙනස් පදනමකින් මැනීමෙන් ඇති විය හැකි ගිණුම්කරණ නොගැළපීම සැළකිය යුතු අන්දමින් පහත හෙළීම උදෙසාය.

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් වන විට සමූහය මගින් කිසිදු මූල්‍ය වත්කමක් මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරනු ලැබ නොමැත.

### 3.5.3. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම

**මූල්‍ය වත්කම්**
මූල්‍යමය වත්කමක් (හෝ අදාළ වන අවස්ථාවන්හිදී මූල්‍යමය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍යමය වත්කම් සමූහයක කොටසක්) පහත අවස්ථාවලදී හඳුනා නොගැනේ

- අදාළ මූල්‍යමය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් අහෝසි වූ විට
- සමූහය සහ සමාගම මගින් මූල්‍යමය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් පවරන ලද විට හෝ 'පාස් ත්‍රෘ' වැඩපිළිවෙලක් යටතේ තෙවන පාර්ශ්වයක් වෙත මූර්ත ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීම සඳහා බැඳීමක් උපකල්පනය කරන ලද අවස්ථාවකදී: සහ
  - සමූහය සහ සමාගම මගින් වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පවරන ලද අවස්ථාවකදී හෝ
  - සමූහය සහ සමාගම මගින් වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පැවරීම හෝ රඳවාගැනීම සිදුකොට නැතත්, වත්කමෙහි පාලනය පවරා ඇති විටකදී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය සහ ලද ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගන්නා ලද කවර හෝ සමුච්චිත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

සමූහය සහ සමාගම මගින් මූල්‍යමය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අයිතීන් පවරන ලද විට හෝ 'පාස් ත්‍රෘ' වැඩපිළිවෙලක් වෙත ඇතුළත් වුනු විට, සහ වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ වාස්තවිකව පැවරීම හෝ රඳවාගැනීම සිදුනොකොට, වත්කමෙහි පාලනයද පවරා නොමැති අවස්ථාවකදී වත්කම ආශ්‍රිතව සමූහයේ අඛණ්ඩ සහභාගීත්වය තාක් දුරට වත්කම හඳුනාගැනේ. එහිදී, සමූහය මගින්ද ආශ්‍රිත වගකීමක් හඳුනාගනේ. සමූහය මගින් රඳවාගන්නා ලද හිමිකම් සහ බැඳීම් පිළිබිඹු වන පදනමකින් පවරන ලද වත්කම සහ ආශ්‍රිත වගකීම මනිනු ලැබේ.

පවරන ලද වත්කම මත ඇපකරයක ස්වභාවය ගන්නා අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ වත්කමෙහි මුල් ධාරණ අගය සහ සමූහය හට ආපසු ගෙවීමට සිදුවිය හැකි ප්‍රතිශ්ඨාවේ උපරිම වටිනාකම යන දෙකෙන් පහළ අගය අනුවය.

**මූල්‍ය වගකීම්**
වගකීම යටතේ ඇති බැඳීම නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමට ලක් කරනු ලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එකම ණයහිමියා වෙතින් වෙනත් පාර්ශ්වයක් විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කර ඇති විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සලකනු ලබන අතර නව වගකීමක් හඳුනා ගැනේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය හා ගෙවන ලද ප්‍රතිශ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ

### 3.5.4. මූල්‍ය සාධනපත්‍ර හිලව් කිරීම
වටිනාකම් හිලව් කිරීම සඳහා නෛතික හිමිකමක් පවතින විට පමණක් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධි කොට සමගාමීව වගකීම පියවීමට අදහස් කරන විටකදී මූල්‍ය සාධනපත්‍ර හිලව් කොට ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

LKASs / SLFRSs මගින් අනුමත අවස්ථාවන්හිදී පමණක් හෝ සමූහයේ වෙළඳ ක්‍රියාකාරකම් වැනි සමාන ආකාරයේ ගනුදෙනු කාණ්ඩයකින් උද්ගත වන ලාභ හෝ අලාභ සඳහා ආදායම සහ වියදම ශුද්ධ පදනමකින් ඉදිරිපත් කෙරේ.

### 3.5.5. සාධාරණ අගය නිර්ණය කිරීම
වාර්තාකරණ දිනයේදී ක්‍රියාකාරී වෙළඳපොළ වල වෙළඳාමේ යෙදවෙන මූල්‍ය සාධනපත්‍රයන්හි සාධාරණ අගය ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුකිරීමකින් තොරව, ඒවායේ සඳහන් වෙළඳපොල මිළ හෝ අලෙවි නියෝජිත මිලකැඳවුම් (දිගු තත්ත්වයන් සඳහා ලංසු මිළ සහ කෙටි තත්ත්වයන් සඳහා ඉල්ලුම් මිළ) මත පදනම් වේ.

මූල්‍ය සාධනපත්‍රයන්හි සාධාරණ අගයයන් පිළිබඳ සමාලෝචනයක් සහ මිනුම්කරණය පිළිබඳ වැඩිදුර විස්තර පිටු අංක 241 හි සටහන 21 හි දක්වේ.

### 3.6 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය
සමූහය මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී වත්කමක හානිකරණය පිළිබඳ කවර හෝ දර්ශකයක් පවතීද යන්න ඇගයුමට ලක් කෙරේ. එවැනි කවර හෝ දර්ශකයක් පවතී නම්, හෝ කිසියම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය වේ නම්, සමූහය මගින් අදාළ වත්කමෙහි පියවාගත හැකි වටිනාකම ඇස්තමේන්තුගත කෙරේ. කිසියම් වත්කමක පියවාගත හැකි වටිනාකම යනු අදාළ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි සාධාරණ අගය අඩුකිරීම් එහි විකිණුම් පිරිවැය සහ එහි ප්‍රයෝජ්‍ය වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. කිසියම් වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක ධාරණ අගය එහි පියවාගත හැකි වටිනාකම ඉක්මවා ගිය විට, අදාළ වත්කම හානිකරණයට ලක්වූ වශයෙන් සැළකෙන අතර එහි පියවාගත හැකි වටිනාකමට ලියා දමනු ලැබේ.

ප්‍රයෝජ්‍ය වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලෙහි කාල වටිනාකම සහ අදාළ වත්කමට විශේෂිත අවදානම් සම්බන්ධ වාර්තමාන වෙළඳපොල ඇගයුම් පිළිබිඹු කරන්නා වූ, පූර්ව බදු වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ. සාධාරණ අගය අඩු කිරීම විකිණුම් පිරිවැය තීරණය කිරීමේදී, යෝග්‍ය වූ තක්සේරුකරණ ආකෘතියක් යොදාගැනේ. මෙම ගණනයන් ආගණන ගුණිත, ප්‍රසිද්ධියේ වෙළඳාම් සිදුකරනු ලබන පරිපාලිත වල ප්‍රකාශිත කොටස් ලැයිස්තු මිළ ගණන් හා සෙසු පවතින වටිනාකම් සූචක මගින් සනාථ කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

කීර්තිනාමය හැර සෙසු වත්කම් සම්බන්ධයෙන්, එක් එක් වර්තාකරණ දිනයේදී, පෙර හඳුනාගත් හානිකරණ අලාභ සම්බන්ධ කවර හෝ දර්ශකයක් තවදුරටත් නොපවතීද නැතිනම් පහළ ගොස් ඇතිද යන්න ඇගයුමට ලක් කෙරේ. එබඳු දර්ශකයක් පැවතියහොත්, සමාගම මගින් අදාළ වත්කම හෝ මුදල් උත්පාදන ඒකකයෙහි පියවාගත හැකි වටිනාකම ඇස්තමේන්තුගත කෙරේ. පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ, අවසන් හානිකරණ අලාභය හඳුනාගන්නා ලද අවස්ථාවේ සිට අදාළ වත්කමෙහි පියවාගත හැකි වටිනාකම නිර්ණය කිරීම සඳහා යොදාගනු ලැබූ උපකල්පනයන්හි වෙනසක් පැවතියහොත් පමණි. මෙම ප්‍රතිවර්තනය, වත්කමෙහි ධාරණ අගය එහි පියවාගත හැකි වටිනාකම ඉක්මවා නොයාම, නැතහොත් ක්ෂය අඩු කළ පසුව නිශ්චය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයාම, පෙර වසර වලදී කිසිදු හානිකරණ අලාභයක් හඳුනානොගැනීම යන කරුණු වලට සීමා වේ. එබඳු ප්‍රතිවර්තනයන් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

### 3.7 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින විට, සහ අදාළ බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ආශ්‍රිත සම්පත් වල පිටතට ගලායාමක් පැවතීමේ හැකියාවක් ඇති විට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 37 - ''වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව'' එම බැඳීමේ අගය පිළිබඳව විශ්වසනීය අයුරින් ඇස්තමේන්තුවක් සිදුකළ හැකි විටකදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. අදාළ දිනයේදී බැඳීම ආශ්‍රිත අවදානම් හා අවිනිශ්චිතතාවන් සැළකීමේදී, හඳුනාගනු ලබන වටිනාකම වාර්තාකරණ දිනයේදී වර්තමාන බැඳීම බේරුම් කිරීම සඳහා වන ප්‍රශස්තතම ප්‍රතිශ්ඨාව සම්බන්ධ ඇස්තමේන්තුව වේ. කිසියම් වෙන්කිරීමකට අදාළ වියදමක් කවර හෝ ප්‍රතිපූරණයකින් ශුද්ධව ආදායම් ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

### 3.8 ණය ලබාගැනීමේ පිරිවැය

''ණය ලබාගැනීමේ පිරිවැය'' සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 23 අනුව, සමූහය මගින් වත්කමක් සුදුසුකම් ලැබීම සඳහා වන අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා ඍජුව ආරෝපණය කල හැකි ණය ලබාගැනීම් පිරිවැය අදාළ වත්කමෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධනීකරණය කෙරේ. සුදුසුකම් ලබන වත්කමක් යනු එහි අභිප්‍රේත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට සැළකිය යුතු කාලයක් ගතවන වත්කමකි. සෙසු ණය ලබාගැනීමේ පිරිවැය ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

GRI | 207-1, 207-2, 207-4

### 3.9 ආදායම් බදු

'ආදායම් බදු වියදම' පිළිබඳ විස්තර පිටු අංක 235 සටහන 17 හි දැක්වේ.

GRI | 207-1, 207-2, 207-4

### 3.10 විලම්බිත බදු

'විලම්බිත බදු' පිළිබඳ විස්තර පිටු අංක 297 සටහන 44 හි දැක්වේ.

### 3.11 වගා රක්ෂණ ගාස්තුව

2013 අංක 12 දරණ මුදල් පනතෙහි වගන්ති 14 ප්‍රතිපාදන අනුව, 2013 අප්‍රියෙල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ ගාස්තුව හඳුන්වාදෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. වර්තමානයේදී, වගා රක්ෂණ ගාස්තුව බදු වලට පසු ලාභයෙන් 1% කි.

### 3.12 මූල්‍ය සේවා මත බදු

එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැංවීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ ගාස්තුව පිළිබඳ විස්තර පිටු අංක 234 සටහන 16 හි දැක්වේ.

### 4 නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොවන ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති පහත දැක්වෙන SLFRS ගිණුම්කරණ ප්‍රමිතීන් නිකුත් කරන ලද නමුත් ඒවා 2022 මාර්තු 31 දිනට බලාත්මක නොවීය. ඒ අනුව මෙම ගිණුම්කරණ ප්‍රමිතීන් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී යොදා නොගැනුනි. පහත දැක්වෙන සංශෝධනය අනාවැකි පළ කල හැකි අනාගත කාලයක් සඳහා සමාගමෙහි/සමූහයෙහි මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි වාස්තවික බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 17 - රක්ෂණ ගිවිසුම්**

SLFRS 17 යනු රක්ෂණ ගිවිසුම් ආශ්‍රිත හඳුනාගැනීම සහ මිනුම්කරණය, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම ආවරනය කෙරෙන පරිපූර්ණ නව ගිණුම්කරණ ප්‍රමිතියකි. බලාත්මක වීමෙන් අනතුරුව, SLFRS 17 මගින් IFRS 4 රක්ෂණ ගිවිසුම් (SLFRS 4) ප්‍රතිස්ථාපනය කෙරේ. නිකුත් කරනු ලබන සමාගම් පිළිබඳ සැළකිල්ලට ගැනීමකින් තොරව, SLFRS 17 සියළුම වර්ග වල රක්ෂණ ගිවිසුම් (එනම්: ජීවිත, ජීවිත නොවන, ඍජු රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ) කෙරෙහි අදාළ වන අතර, ඇතැම් ඇපකර සහ අභිමත සහභාගීත්ව අංග සහිත මූල්‍ය සාධනපත්‍රයන් කෙරෙහිද එය අදාළ වේ.

2013 ජනවාරි 01 හෝ එයට පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ. සමාගමක් මගින් එය පළමු වරට SLFRS 17 ආදේශ කර ගනු ලබන දින හෝ එයට පෙර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 9 ''මූල්‍ය සාධනපත්‍ර'' සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - SLFRS 15 ''ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින් ආදායම'' යන ද්විත්වය සඳහාම අයදුම් කරනු ලබන්නේ නම් කල්තබා අයදුම් කිරීම සඳහා අනුමැතිය හිමි වේ.

**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ සම්මතයන් පළමු වරට ආදේශනය - පරිපාලිතය පළමු වරට ආදේශකයකු වශයෙන්**

සිය SLFRS ප්‍රමිතීන් වෙත සිය 2018 - 2020 වාර්ෂික වැඩිදියුණු කිරීම් ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් SLFRS 1 වෙත සංශෝධනයක් නිකුත් කරමින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ සම්මතයන් SLFRS 1පළමු වරට ආදේශන හඳුන්වාදෙන ලදී. මෙහිදී සංශෝධනය මගින් පරිපාලිතයට, SLFRS වෙත මාරුවීමේ මව් සමාග මෙහි දිනය මත පදනම්ව, මව් සමාගම මගින් වාර්තා කරන ලද අගයයන් භාවිත කරමින් සමුච්චිත පරිවර්තන වෙනස්කම් මැනීම සඳහා SLFRS 1 හි D16(a) ඡේද සඳහා අයදුම් කිරීම තෝරාගැනීමේ අවස්ථාව උදා වේ. SLFRS 1 හි D16(a) ඡේද සඳහා අයදුම් කිරීම තෝරාගනු ලබන සහායක හෝ හවුල්කාර සමාගමක් සඳහාද මෙම සංශෝධනය අදාළ විය.

2022 ජනවාරි 01 දිනෙන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තා කාලපරිච්ඡේදයන් සඳහා සංශෝධනය බලාත්මක වන අතර කල්තබා ආදේශ කරගැනීමේ අවසරය හිමි වේ.

**SLFRS 9 මූල්‍ය සාධනපත්‍ර - මූල්‍ය වගකීම් හඳුනාගැනීමෙන් බැහැරකිරීම සඳහා '10 per cent' පරීක්ෂාවෙහි ගාස්තු**

සිය SLFRS ප්‍රමිතීන් වෙත සිය 2018 - 2020 වාර්ෂික වැඩිදියුණු කිරීම් ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් SLFRS 9 මූල්‍ය සාධනපත්‍ර වෙත සංශෝධනයක් නිකුත් කරන ලදී (SLFRS 9). සංශෝධනය මගින්, කිසියම් නව හෝ නවීකරණය කරන ලද මූල්‍ය වගකීම කොන්දේසි සැළකිය යුතු අයුරින් මුල් මූල්‍ය වගකීමෙහි කොන්දේසි වලින් වෙනස්වීම තක්සේරු කිරීමේදී යම් සමාග මක් මගින් ඇතුළත් කරනු ලබන ගාස්තු පිළිබඳව පැහැදිලි කෙරේ. මෙම ගාස්තු වෙත ඇතුළත් වන්නේ ණයගැතියා සහ ණයහිමියා අනිත් තැනැත්තා වෙනුවෙන් ගෙවූ හෝ ලද ගාස්තු ඇතුලුව, ණයගැතියා සහ ණයහිමියා අතර ගෙවන ලද හෝ ලැබුනු ගාස්තු පමණි. සමාගම මගින් මෙම සංශෝධනය පළමු වරට අදාළ කරගනු ලබන වාර්ෂික වාර්තා කාලපරිච්ඡේදයේ

ආරම්භයේදී හෝ එයට පසුව නවීකරණය කරන ලද හෝ හුවමාරු කරගන්නා ලද මූල්‍ය වගකීම් වෙත සමාගමක් විසින් මෙම සංශෝධනය අදාළ කර ගැනේ.

**SLFRS 3 - වෙත සංශෝධන**

සංශෝධන මගින් SLFRS 3 ප්‍රමිතිය යාවත්කාලීන කෙරෙන අතර එහිදී 1989 රාමුව වෙනුවට 2018 සංකල්පීය රාමුව ක්‍රියාත්මක වනු ඇත. ඒවා මගින් SLFRS 3 වෙත, LKAS 37 විෂයපථය ඇතුළත වන බැඳීම් සඳහා, අත්පත් කරගැනීමේ දිනයේදී අතීත සිදුවීම් හේතුවෙන් වර්තමාන බැඳීමක් පවතීද යන්න නිර්ණය කිරීම සඳහා අත්පත් කරගනු ලබන්නා විසින් LKAS 37 යොදාගැනීමේ අවශ්‍යතාවයක්ද එක් කොට ඇත. IFRIC 21 ගාස්තු වල විෂයපථය ඇතුළත පවතින ගාස්තුවක් සඳහා, අත්පත් කරගැනීමේ දිනය වන විට ගාස්තුව ගෙවීමට වගකීමක් උද්ගත කරන්නා වූ බැඳීම් සිදුවීමක් පවතීද යන්න නිර්ණය කිරීම සඳහා අත්පත් කරගනු ලබන්නා විසින් IFRIC 21 යොදා ගනී. අවසානයේදී, සංශෝධන මගින්, අත්පත් කරගනු ලබන්නකු විසින් ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගනු ලබන අසම්භාව්‍ය වත්කම් හඳුනාගනු නොලබන බවට නිශ්චිත ප්‍රකාශයක් එක් කරනු ලබයි.

මෙම සංශෝධන අත්පත් කරගැනීමේ දිනය 2022 ජනවාරි 1 හෝ ඉන්පසු ඇරඹෙන පළමු වාර්ෂික කාලපරිච්ඡේදය හෝ ඉන්පසුව වන ව්‍යාපාර සංයෝජනයන් සඳහා බලාත්මක වේ. සමාගම මගින් එකම අවස්ථාවේ හෝ කලින් සියළුම සෙසු යාවත්කාලීන කල විමසුම් (යාවත්කාලීන කල සංකල්පීය රාමුව සමග ප්‍රකාශිත) සඳහා අයැදුම් කරන්නේ නම් කල්තබා අයැදුම් කිරීමේ අනුමැතිය හිමි වේ. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරනු ලබයි.

**දේපළ, පිරියත සහ උපකරණ : අභිප්‍රේත භාවිතයට පෙර ලබන මුදල් - LKAS 16 වෙත සංශෝධන**

2021 මාර්තු මස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ : අභිප්‍රේත භාවිතයට පෙර ලබන මුදල් වෙත සංශෝධන ආදේශ කරන ලද අතර, එමගින් සමාගම් වෙත දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැයෙන්, අදාළ වත්කම කළමනාකාරීත්වයේ අභිමතය පරිදි මෙහෙයුම් සිදු කල හැකි තත්ත්වයට පත්කිරීමේදී සහ පරිශ්‍රය වෙත වත්කම රැගෙන ඒමේදී නිෂ්පාදනය කරන ලද අයිතම විකිණීමෙන් ලද කවර හෝ මුදලක් අඩු කිරීම කෙරෙහි තහනමක් පනවන ලදී. ඒ වෙනුවට, සමාගමක් මගින් එබඳු අයිතම විකිණීමෙන් ලද මුදල් සහ එම අයිතම නිෂ්පාදනය කිරීමේ පිරිවැය අදායම් ප්‍රකාශයෙහි වාර්තා කරනු ලැබේ.

මෙම සංශෝධනය 2022 ජනවාරි 01 සහ ඉන්පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන අතර, සමාගම මගින් පළමු වරට සංශෝධනය යොදාගන්නා ලද අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද කලින්ම කාලපරිච්ඡේදය ආරම්භයේදී හෝ ඉන්පසුව භාවිතය සඳහා පැවති දේපළ, පිරියත සහ උපකරණ සඳහා එය අතීතයට බලපාන පරිදි අදාළ කරගත යුතු වේ. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරමින් සිටියි.

**භාරදූර ගිවිසුම් - ගිවිසුමක් සපුරාලීමේ පිරිවැය - LKAS 37 වෙත සංශෝධන**

2021 මාර්තු මස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින්, කිසියම් ගිවිසුමක් භාරදූර හෝ අලාභ ගෙන දෙන බවත් ඇගයීමේදී සමාගමක් විසින් ඇතුළත් කල යුතු පිරිවැය විශේෂිතව දැක්වීම සඳහා LKAS 37 වෙත සංශෝධන ආදේශ කරන ලදී.

සංශෝධන මගින් "සෘජුව සම්බන්ධිත පිරිවැය එළඹුමක්" භාවිත කෙරේ. භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන ගිවිසුමක් වෙත සෘජුව සම්බන්ධිත පිරිවැය වෘද්ධ පිරිවැය සහ ගිවිසුම් ක්‍රියාකාරකම් වෙත සෘජුව සම්බන්ධිත පිරිවැය වෙන්කිරීමක් යන දෙකෙන්ම සමන්විත වේ. සාමාන්‍ය සහ පරිපාලන පිරිවැය ගිවිසුමක් වෙත සෘජුව සම්බන්ධ නොවන අතර ඒවා ගිවිසුම යටතේ නිශ්චිතව ප්‍රතිපාර්ශ්වයෙන් අයකර ගත නොහැකි නම් බැහැර කෙරේ.

මෙම සංශෝධන 2022 ජනවාරි 01 සහ ඉන්පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ. සමූහය මගින්, එය මෙම සංශෝධන පළමු වරය යොදාගන්නා වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේදී සිය බැඳීම් තවමත් සපුරා නොමැති ගිවිසුම් වෙත මෙම සංශෝධන අදාළ කර ගනු ඇත. සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරමින් සිටියි.

**LKAS 1 - ජංගම හෝ ජංගම නොවන වශයෙන් වගකීම් වර්ගීකරණය : වෙත සංශෝධනඃ**

2021 මාර්තු මස, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින්, ජංගම හෝ ජංගම නොවන වශයෙන් වගකීම් වර්ගීකරණය සම්බන්ධ අවශ්‍යතා විශේෂිතව දැක්වීම සඳහා LKAS 1 හි ඡේද 69 සිට 76 දක්වා වෙත සංශෝධන ආදේශ කරන ලදී. සංශෝධනයන් මගින් පහත දැක්වෙන කරුණු පැහැදිලි කෙරේ:

- කල්දැමීමට අයිතිය යන්නෙහි අදහස
- කල්දැමීමට අයිතිය වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී පැවතිය යුතුය යන්න
- කිසියම් සමාගමක් කල්දැමීමට අයිතිය භාවිත කිරීමට ඇති අවස්ථාව හේතුවෙන් වර්ගීකරණය වෙත බලපෑමක් ඇති නොවේය යන්න
- පරිවර්ත්‍ය වගකීමක අන්තර්ගත ව්‍යුත්පන්නයක් එයම ස්කන්ධ සාධනපත්‍රයක් වන්නේ නම් වගකීමක කොන්දේසි එහි වර්ගීකරණය කෙරෙහි බලනොපායි.

මෙම සංශෝධන 2022 ජනවාරි 01 සහ ඉන්පසු ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන අතර ඒවා අතීතයට බලපාන පරිදි අදාළ කොට ගත යුතු වේ.

සමාගම/සමූහය මගින් මේ වන විට මෙම සංශෝධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිය මූල්‍ය ප්‍රකාශයන් වෙත සිදුවිය හැකි බලපෑම ඇගයුමට ලක් කරමින් සිටියි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 5. දළ ආදායම

**ගිණුම්කරණ ප්‍රමිතිය**

ආර්ථික ප්‍රතිලාභ සමාගම/සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාව සහ ආදායම විශ්වසනීය අයුරින් මැනිය හැකි තාක් දුරට ආදායම හඳුනාගැනේ. එක් එක් වර්ගයේ ආදායම් සඳහා, විශේෂිත හඳුනාගැනීමේ ක්‍රියාපටිපාටිය, අදාළ ආදායම් සටහන් යටතේ දක්වා ඇත.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 225 | 23,881,526 | 24,983,445 | 25,926,792 | 26,821,838 |
| ශුද්ධ ඉපැයුම් ආදායම | 7 | 226 | - | - | 4,939,071 | 5,028,549 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 8 | 227 | 1,876,524 | 1,818,675 | 1,321,513 | 1,198,054 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 9 | 228 | 26,783 | 162,616 | 86,525 | 228,258 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 10 | 228 | 956,547 | 139,062 | 357,085 | 368,566 |
| එකතුව | | | 26,741,380 | 27,103,798 | 32,630,986 | 33,645,265 |

## 6. ශුද්ධ පොලී ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**ආදායම් සහ වියදම් හඳුනාගැනීම**

ආදායම හඳුනාගැනෙනුයේ සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදුවිය හැකි ප්‍රමාණයට සහ එය විශ්වසනීය අයුරින් මැනිය හැකි තාක් දුරට වේ.

**පොලී ආදායම සහ වියදම්**

ක්‍රම ක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන සියලුම මූල්‍ය සාදනපත්‍රයන් සඳහා පොලී ආදායම හෝ වියදම එලදායී පොලී අනුපාතික (EIR) භාවිත කරමින් වාර්තා කෙරේ. එලදායී පොලී අනුපාතිකය යනු මූල්‍යමය සාදන පත්‍රය මගින් එහි ජීව කාලය හෝ යෝග්‍ය අවස්ථාවන්හිදී කෙටි කාලයකට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් අදාල මූල්‍ය වත්කම් එහි හෝ මූල්‍ය වගකීම් එහි ශුද්ධ ධාරණ අගයට වට්ටම් කරනු ලබන අලුත් අනුපාතය වන අතර එහිදී එලදායී පොලී අනුපාත යෙහි සාධනීය අංගයක් වන සාදන පත්‍රයට සෘජුව ආරෝපණය කළ හැකියි කවර හෝ ගාස්තු හෝ වර්ධන පිරි පිරිවැය ඇතුළත් වන අතර නමුත් අනාගත ණය අලාභ ඇතුලත් නොවේ.

සමූහය මගින් එහි ගෙවීම් හෝ ලැබීම් ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් මූල්‍ය වත්කම් හි හෝ වගකීම් වල ධාරණ අගය ගලපනු ලැබේ. ගලපන ලද ධාරන අගය මුල් එලදායී පොලී අනුපාතිකය පදනම් කරගනිමින් ගණනය කෙරෙන අතර ධාරණ අගයෙහි වෙනස මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම ලෙස සහ මූල්‍ය වගකීම් සඳහා පොලී වියදම වශයෙන් වාර්තා කෙරේ. කෙසේ වුවද, අදාල මුදල් ලැබීම් වල අයකර ගැනීමේ හැකියාව හල යාමේ ප්‍රතිඵලයක් වශයෙනි සමාගම මගින් පසුව අනාගත මුදල් ලැබීම් වල ඇස්තමේන්තු පසුව ඉහළ නංවන අවස්ථාවක ප්‍රති වර්ගීකරණය කරන ලද වත්කමක් සඳහා, ඉහළ යාමේ බලපෑම් ඇස්තමේන්තුව වෙනස් කල දිනයේ සිට එලදායී පොලී අනුපාතිකය වෙත ගැලපුමක් වශයෙන් හා හඳුනා ගැනේ.

SLFRS 9 යටතේ, පිළිවෙලින් ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා පොලී ආදායම සහ පොලී වියදම එලදායී පොලී අනුපාතිකය භාවිත කරමින් වාර්තා කෙරේ.

ආදායම් හඳුනාගත හැකි වන්නේ ගනුදෙනුව ආශ්‍රිත හිමිවිය හැකි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ දී පමණි. කෙසේ වුවද, අයකර ගැනීම් පිළිබඳ අවිනිශ්චිතතාවක් පැනනැගුනහොත් ආදායම් හඳුනාගැනීම අවසන් වේ. SLFRS 9 - මූල්‍ය සාධනපත්‍ර ගනුදෙනුකාර පැහැර හැරීමේ අවස්ථාව (අයකර ගැනීම් පිළිබඳ අවිනිශ්චිතතාව)ආදේශ කර ගැනීමත් සමග ගෙවිය යුතු දිනයෙන් දින අනුවක් වශයෙන් වෙනස් කෙරිනි. ඒ අනුව පොලී ආදායම හඳුනාගත හැක්කේ ගෙවිය යුතු දිනයෙන් දින (90) ක් දක්වා පමණි.

**හිග කුලී මත පොලිය**

හිග කුලී මත පොලිය මුදල් පදනමකින් ගිණුම්ගත කොට ඇත.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| පොලී ආදායම | 6.1 | 225 | 23,881,526 | 24,983,445 | 25,926,792 | 26,821,838 |
| පොලී වියදම | 6.2 | 225 | 10,832,186 | 13,064,310 | 11,205,126 | 13,375,197 |
| ශුද්ධ පොලී ආදායම | | | 13,049,340 | 11,919,135 | 14,721,666 | 13,446,641 |

### 6.1 පොලී ආදායම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| මුදල් සහ මුදලට සමාන දෑ | | | 159,743 | 73,753 | 176,533 | 103,501 |
| බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ශේෂයන් | | | 443,816 | 340,778 | 587,209 | 471,229 |
| ණය සහ ලැබිය යුතු දෑ - ක්‍රමක්ෂය පිරිවැය අනුව | 6.1.1 | 225 | 22,633,122 | 24,190,261 | 24,170,060 | 25,589,345 |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය අනුව | | | 644,845 | 378,653 | 992,990 | 657,763 |
| මුළු පොලී ආදායම | | | 23,881,526 | 24,983,445 | 25,926,792 | 26,821,838 |

### 6.1.1 පොලී ආදායම - ණය සහ ලැබිය යුතු දේ

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 12,449,735 | 14,176,359 | 12,453,101 | 14,178,588 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | 1,628 | 5,479 | 791,468 | 823,834 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දෑ | 10,181,759 | 10,008,423 | 10,925,491 | 10,586,923 |
| | 22,633,122 | 24,190,261 | 24,170,060 | 25,589,345 |

### 6.2 පොලී වියදම්

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| බැංකු වෙත ගෙවිය යුතු | 6.2.1 | 226 | 903,595 | 671,106 | 1,117,531 | 949,639 |
| ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 6.2.1 | 226 | 7,802,922 | 10,228,458 | 8,057,701 | 10,316,632 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | 6.2.1 | 226 | 1,875,532 | 1,935,761 | 1,859,429 | 1,916,991 |
| SLFRS 16 - වාරිකමය ණයගැනීමේ පිරිවැය | 40 | 292 | 250,137 | 228,985 | 170,465 | 191,935 |
| මුළු පොලී වියදම් | | | 10,832,186 | 13,064,310 | 11,205,126 | 13,375,197 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 6. ශුද්ධ පොලී ආදායම සබැදේ...

### 6.2.1. පොලී වියදම් - නිෂ්පාදනය අනුව

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| **බැංකු වෙත ගෙවිය යුතු** | | | | | | |
| බැංකු අයිරාව මත පොලිය | | | 1,027 | 1,272 | 34,866 | 25,769 |
| කෙටි කාලීන ණය මත පොලිය | | | - | 14,963 | 11 | 16,372 |
| කාලසීමා ණය මත පොලිය | | | 235,166 | 4,980 | 415,253 | 257,608 |
| සුරක්ෂිතකරණය මත පොලිය | | | 667,402 | 649,891 | 667,401 | 649,890 |
| අනුඑකතුව | | | 903,595 | 671,106 | 1,117,531 | 949,639 |
| **ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු** | | | | | | |
| තැන්පතු මත පොලී පිරිවැය | | | 7,802,922 | 10,228,458 | 8,057,701 | 10,316,632 |
| අනුඑකතුව | | | 7,802,922 | 10,228,458 | 8,057,701 | 10,316,632 |
| **නිකුත් කරන ලද ණය සුරැකුම්** | | | | | | |
| ණයකර මත පොලිය | 37.1 | 287 | 1,875,532 | 1,935,761 | 1,859,429 | 1,916,991 |
| අනුඑකතුව | | | 1,875,532 | 1,935,761 | 1,859,429 | 1,916,991 |
| **මෙහෙයුම් කල්බදු වගකීම්** | | | | | | |
| SLFRS 16-වාරිකමය ණය ලබාගැනීමේ පිරිවැය | | | 250,137 | 228,985 | 170,465 | 191,935 |
| අනුඑකතුව | | | 250,137 | 228,985 | 170,465 | 191,935 |
| | | | | | | |
| මුළු පොලී වියදම් | | | 10,832,186 | 13,064,310 | 11,205,126 | 13,375,197 |

### 7. ශුද්ධ ඉපැයුම් වාරිකය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**රක්ෂණ ගිවිසුම් සහ ආයෝජන ගිවිසුම් වල සැලසුම් වර්ගීකරණය**

SLFRS (4) ''රක්ෂණ ගිවිසුම්'' සඳහා පවරනු ලබන රක්ෂණ අවදානම් මට්ටම මත පදනම්ව රක්ෂකයා විසින් රක්ෂණ ගිවිසුම් හෝ ආයෝජන ගිවිසුම් වශයෙන් වර්ගීකරණය කරමින් ලියන ලද ගිවිසුම් වීම අවශ්‍ය වේ.

රක්ෂණ ගිවිසුම් යනු රක්ෂණ වර හිමියන් වෙත විශේෂිත අවිනිශ්චිත අනාගත සිදුවීමක් (රක්ෂිත සිදුවීම්) හේතුවෙන් අහිතකර බලපෑමක් ඇති වූ විට අදාල රක්ෂණ වර හිමියන් වෙත හානිපූරණය කෙරෙහි සමූහය (රක්ෂකයා) එකග වෙමින්වෙනත් පාර්ශ්වයක් (රක්ෂණ වර හිමියන්) වෙතින් සැලකිය යුතු රක්ෂණ අවදානම්ක් බාරගන්නා ගිවිසුම් වේ. පොදු මාර්ගෝපදේශයක් වශයෙන්, රක්ෂිත සිදුවවීම සිදු නොවුවහොත් සමාගම මගින් ගෙවන ලද ප්‍රතිලාභ සහ ගෙවිය යුතු ප්‍රතිලාභ සංසන්දනය කරමින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් ඇති ද යන්න නිර්ණය කරන අතර රක්ෂණ ගිවිසුම් වලදී මූල්‍ය අවදානම පැවරීමද සිදුකළ හැකිවේ.

ආයෝජන ගිවිසුම් යනු සැලකිය යුතු රක්ෂණ අවදානමක් නොමැති සැලකිය යුතු මූල්‍ය අවදානමක් පැවරෙන ගිවිසුම් වේ. මූල්‍ය අවදානම යනු නිශ්චිත පොලී අලුත් අනුපාතයක, මූල්‍ය සාදනපත්‍ර මිලක, විදේශ විනිමය අනුපාතයක, මිල හෝ අනුපාත ලැයිස්තුවක , ණය ශ්‍රේණිගත කිරීම් හෝ වෙනත් විචල්‍යයන්වල සිදුවිය හැකි අනාගත වෙනසක් හේතුවෙන් උද්ගත වන අවදානම වේ.

රක්ෂණ ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් වර්ග වර්ගීකරණය කළ පසු, හිමිකම් සහ බැදීම් අවසන් වීම හෝ කල් ඉකුත් වීම සිදු නොවුණේ නම්, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදාන ම සැලකිය යුතු ආකාරයෙන් අඩු වුවද රක්ෂණ ගිවිසුම්ක් එහි ඉතිරි ජීව කාලය තුළ රක්ෂණ ගිවිසුමක් වශයෙන් පවතී. කෙසේ වුවද රක්ෂණ අවදානම ආරම්භ වීම සැලකිය යුතු මට්ටමකට පැමිණි පසු ආයෝජන ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කළ හැකි වේ.

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ( පීපල්ස් ලීසිං හි පරිපාලිතය) අලෙවි කරනු ලබන සියලුම සැලසුම් රක්ෂණ සැලසුම් වන බැවින් SLFRS 4 - රක්ෂණ ගිවිසුම් යටතේ රක්ෂණ ගිවිසුම් වශයෙන් වර්ග කෙරේ. එම නිසා වාර්තා කරන දින වන විට නිෂ්පාදන සැලසුම් කළඹ තුළ කිසිදු ආයෝජන ගිවිසුමක් නොවිය.

**දළ ලිඛිත වාරිකයෙහි ආදායම් හඳුනාගැනීම**
දළ ලිඛිත වාරිකය (GWP) මගින් අවදානම් භාරගැනීම වෙනුවෙන් සමාගම් විසින් අයකරනු ලබන වාරිකය නියෝජනය කෙරෙන අතර උපචිත පදනමක් මත ගිණුම්ගත කෙරේ.

දළ ලිඛිත වාරිකය, ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරන කාලපරිච්ඡේදයට අදාළ ලද/ලැබිය යුතු සමස්ත වාරික වලින් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනාගැනේ.

හිමිකම් නොපෑමේ ප්‍රතිදානය වැනි වාරික අනුපාතයෙහි කොටසක් නිර්මාණය කරනු ලබන ප්‍රතිදානයන් දළ ලිඛිත වාරිකයෙන් අඩු කෙරේ.

**රක්ෂණ - දළ ලිඛිත වාරිකයෙහි ආදායම් හඳුනාගැනීම**
ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය, ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරන කාලපරිච්ඡේදයට අදාළ ලැබිය යුතු සමස්ත වාරික වලින් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනාගැනේ.

**ප්‍රතිරක්ෂණ වාරිකය**
ජීවිත නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය, කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරණයට අදාළ ගෙවිය යුතු සමස්ත ප්‍රතිරක්ෂණ වාරිකයෙන් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී ඒවා හඳුනාගැනේ. පෙර ගිණුම්කරණ කාලපරිච්ඡේදයන්හිදී ඇරඹුනු ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන්, මෙම ගිණුම්කරණ කාලපරිච්ඡේදයේදී උද්ගත වූ කවර හෝ ගැළපුම් ද වාරිකයෙහි ඇතුළත් වේ.

**නොඉපැයූ වාරික සංචිතය**
නොඉපැයූ වාරික සංචිතය මගින් කල්ඉකුත් නොවූ ආවරණ කාලසීමාවට අදාළ වසර තුළදී ලියන ලද වාරික කොටස නියෝජනය වේ. නොඉපැයූ වරික 365 පදනමින් ගණනය කෙරේ.

**නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය**
නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය යනු, වසරකදී ලියන ලද වාර්තාකරණ දිනයෙන් පසු අවදානම් කාලපරිච්ඡේදයන් හා සම්බන්ධ වාරිකයේ කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය පාදක වන සෘජු රක්ෂණවරයන්ගේ කාලසීමාව පුරා වෙනස් වේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| දළ ලිඛිත වාරිකය | - | - | 6,049,693 | 6,133,052 |
| අඩුකිරීම: ප්‍රතිරක්ෂකයින් වෙත පවරා දෙන ලද වාරිකය | - | - | 1,142,976 | 956,324 |
| අඩු කිරීම: නොඉපැයූ වාරික සංචිතයේ වෙනස | - | - | (32,354) | 148,179 |
| එකතුව | - | - | 4,939,071 | 5,028,549 |

## 8. ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**ගාස්තු හා කොමිස් ආදායම**
සමූහය මගින් සිය ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන සේවා රාශිය වෙනුවෙන් ගාස්තු හා කොමිස් ආදායම අයකරගැනේ. කොමිස් ආදායම උපචිත පදනමක් මත හඳුනාගැනේ. ගාස්තු ආදායම පහත දක්වෙන කාණ්ඩ දෙකට බෙදිය හැකි වේ.

**නිශ්චිත කාලසීමාවක් තුළ සපයන ලද සේවාවන්ගේ උපයන ගාස්තු ආදායම**
යම් කාලසීමාවක් තුළ සපයන ලද සේවාවන්ගේ උපයන ගාස්තු එම කාලසීමාව පුරා උපචිත කෙරේ.

**ගනුදෙනු සේවාවන් සැපයීම මගින් ගාස්තු ආදායම**
ලේඛණ සැකසීම සහ මෝටර් රථයක් පරීක්ෂා කිරීම වැනි ගනුදෙනුවක් සාකච්ඡා කිරීමෙන් හෝ තෙවන පාර්ශ්වයක් සඳහා ගනුදෙනුවක් සාකච්ඡා කිරීමකදී උපදින ගාස්තු එයට පාදක වන ගනුදෙනුව සම්පූර්ණ වීමේදී හඳුනාගැනේ. කිසියම් කාර්ය සාධනයක් සම්බන්ධ ගාස්තු හෝ සංරචක අදාළ ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කිරීමෙන් පසු හඳුනාගැනේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 8. ගාස්තු සහ කොමිස් ආදායම (සබැදේ)

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| සේවා ගාස්තු | 522,316 | 583,452 | 160,404 | 149,021 |
| සෙසු ගාස්තු සහ කොමිස් | 1,354,208 | 1,235,223 | 1,161,109 | 1,049,033 |
| එකතුව | 1,876,524 | 1,818,675 | 1,321,513 | 1,198,054 |

## 9. මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට | | | | |
| ශුද්ධ වෙළඳපොල (අලාභ)/ලාභ | (8,496) | (10,455) | 30,325 | 25,864 |
| ශුද්ධ ප්‍රාග්ධන ලාභය | 35,279 | 173,071 | 56,200 | 202,394 |
| එකතුව | 26,783 | 162,616 | 86,525 | 228,258 |

## 10. වෙනත් මෙහෙයුම් ආදායම

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

වෙනත් මෙහෙයුම් ආදායම, සමූහයේ සාමාන්‍ය මෙහෙයුම් වලට සෘජුව සම්බන්ධ නොවූ වෙනත් මූලයන්ගෙන් උපයන ලද ආදායම් වලින් සමන්විත වන අතර ඒවා උපචිත පදනමන්ක මත හඳුනාගැනේ.

**ලාභාංශ ආදායම**

ගෙවීම ලැබීම් අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගැනේ

**මෝටර් රථ අලෙවි කිරීමෙන් ශුද්ධ වෙළඳ ආදායම**

ආනයනිත මෝටර් රථ අලෙවියෙන් ලැබෙන ආදායම සාමාන්‍යයෙන් අදාළ රථය ලබාදීමේදී එනම් හිමිකාරීත්වය සම්බන්ධ සැළකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීමෙන් පසු හඳුනාගැනේ.

**මෙහෙයුම් කල්බදු ආදායම**

මෙහෙයුම් කල්බදු ආදායම දැනට පවතින කල්බදු වල කොන්දේසි අනුව සරල මාර්ගික පදනමින් ගිණුම්ගත කෙරෙන අතර ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම යටතේ වාර්තා කෙරේ.

**දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය**

දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය හෝ අලාභය අදාළ අලෙවිය සිදුකරන ලද කාලපරිච්ඡේදයේදී ආදායම ප්‍රකාශයෙහි මුදල් පදනමින් ගිණුම්ගත කෙරේ.

**කුලී ආදායම**

වසර සඳහා හිමිකරු සහ කුලීකරු අතර ඇති වූ එකගත්වය මත මෝටර් රථ කුලියට දීමෙන් වන කුලී ආදායම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

**තක්සේරු ආදායම**

ඒවා උපලබ්ධි වූ පසු හෝ උපලබ්ධි කල හැකි විට තක්සේරු ආදායම හඳුනාගැනේ

**රක්ෂණ ගාස්තු ආදායම**

රක්ෂණවර පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම්ගත ගාස්තු වෙනුවෙන් රක්ෂණවර හිමියන්ගෙන් අය කිරීම් සිදු කෙරේ ලද පසු හෝ ගෙවීමට නියමිත වූ විට මෙම ගාස්තු හඳුනාගැනේ .

**වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවි කිරීම මත වන ලාභය | 17,529 | 22,823 | 55,778 | 74,774 |
| කුලී ආදායම | - | - | 2,436 | 24,939 |
| මෙහෙයුම් කල්බදු ආදායම | - | - | 25,030 | 27,487 |
| ආයෝජන දේපල වලින් කුලී ආදායම | - | - | 75,712 | 72,248 |
| මෝටර් රථ අලෙවි කිරීමෙන් ශුද්ධ වෙළඳ ආදායම | 99 | 4,620 | 99 | 4,620 |
| ලාභාංශ ආදායම - විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 5,591 | 640 | 5,591 | 640 |
| - පරිපාලිත | 930,625 | 110,000 | - | - |
| - ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට | 625 | 33 | 625 | 278 |
| තක්සේරු ආදායම | - | - | 106,662 | 92,166 |
| රක්ෂණ ගාස්තු ආදායම | - | - | 57,588 | 55,761 |
| වෙනත් ආදායම් | 2,078 | 946 | 27,564 | 15,653 |
| එකතුව | 956,547 | 139,062 | 357,085 | 368,566 |

## 11. ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායන සහ වෙනත් අලාභ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමූහයේ සමාගම මගින් SLFRS) (9) අනුව මූල්‍ය සාදනපත්‍ර ඇගයුමට ලක් කරමින් ණය සහ ලැබිය යුතු දෑ ද සම්බන්ධ අපහායන ප්‍රතිපාදන වල වෙනස්වීම් හඳුනාගනු ලැබේ සමාගම් සහ සමූහය මගින් ඒ සඳහා යොදාගනු ලබන ක්‍රමවේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිටු අංක 251 සටහන 25 හි පැහැදිලි කෙරේ.

**කපාහැරීම ඇතුළුව ඇප බැහැර කිරීම් මත අලාභය**

අයකරගැනීමේ ප්‍රායෝගික අවස්ථාවක් නොමැති විටදී ණය සහ ලැබිය යුතු දෑ කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් කපා හැරේ. ණය සහ ලැබිය යුතු දෑ පියවා ගැනීමේ දී සාමාන්‍යයෙන් ඇපය උපලබ්ධි කිරීමෙන් කවර හෝ ආදායමක් ලැබීමෙන් මෙය සිදු කෙරේ.

**අයකරගත් බොල් ණය**

බොල් ණය සහ අවිනිශ්චිත ණය වශයෙන් කපා හැරුණු මුදල් අය කර ගැනීම මුදල් පදනමකින් හඳුනා ගැනේ.

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | | | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | පිටු | 2022 | 2021 | 2022 | 2021 |
| | සටහන | අංකය | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| කේවල අපහායනය | 11.3/11.4 | 231 | 487,288 | (148,063) | 487,288 | (260,794) |
| සාමූහික අපහායනය | 11.3/11.4 | 231 | 132,344 | 665,766 | 442,868 | 971,185 |
| වෙනත් ලැබිය යුතු දේ | | | 6,760 | 18,672 | (5,623) | 55,707 |
| කපාහැරීම ඇතුළුව ඇප බැහැර කිරීම් මත අලාභය | | | 104,746 | 603,692 | 104,746 | 683,057 |
| කපා හැරුනු ණය/ බැහැර කරන ලද අලාභ අය කර ගැනීම | | | (75,713) | (96,230) | (77,523) | (96,666) |
| එකතුව | 11.1/11.2 | 230 | 655,425 | 1,043,837 | 951,756 | 1,352,489 |

## 11. ණය සහ ලැබිය යුතු දෑ සඳහා අපහායන ගාස්තු සහ වෙනත් අලාභ (සබැදේ)

### 11.1 ණය සඳහා අපහායනය/(ප්‍රතිවර්තනය) සහ සෙසු අලාභ (විස්තරාත්මක බෙදීයාම) - සමාගම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) රු.'000 | ගාස්තුව රු.'000 | (ප්‍රතිවර්තනය) රු.'000 | ශුද්ධ වටිනාකම රු.'000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 28,415 | 2,766,525 | (2,187,125) | 607,815 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | (6,795) | 17,586 | (10,232) | 559 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | 7,413 | 2,078,221 | (2,045,342) | 40,292 |
| වෙනත් ලැබිය යුතු දේ | - | 389,417 | (382,658) | 6,759 |
| එකතුව | 29,033 | 5,251,749 | (4,625,357) | 655,425 |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) රු.'000 | ගාස්තුව රු.'000 | (ප්‍රතිවර්තනය) රු.'000 | ශුද්ධ වටිනාකම රු.'000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 293,766 | 1,538,226 | (1,733,151) | 98,841 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | (5,316) | 68,635 | (10,712) | 52,607 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | 219,012 | 3,096,373 | (2,441,668) | 873,717 |
| වෙනත් ලැබිය යුතු දේ | - | 18,672 | - | 18,672 |
| එකතුව | 507,462 | 4,721,906 | (4,185,531) | 1,043,837 |

### 11.2 ණය සඳහා අපහායනය/(ප්‍රතිවර්තනය) සහ සෙසු අලාභ (විස්තරාත්මක බෙදීයාම) - සමූහය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) රු.'000 | ගාස්තුව රු.'000 | (ප්‍රතිවර්තනය) රු.'000 | ශුද්ධ වටිනාකම රු.'000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 28,415 | 2,766,525 | (2,187,125) | 607,815 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | (6,795) | 73,823 | (10,232) | 56,796 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | 5,603 | 2,332,507 | (2,045,342) | 292,768 |
| වෙනත් ලැබිය යුතු දේ | - | 377,035 | (382,658) | (5,623) |
| එකතුව | 27,223 | 5,549,890 | (4,625,357) | 951,756 |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | බැහැර කිරීමේ අලාභය/ කපාහැරීම් (අයකර ගැනීමෙන් ශුද්ධව) රු.'000 | ගාස්තුව රු.'000 | (ප්‍රතිවර්තනය) රු.'000 | ශුද්ධ වටිනාකම රු.'000 |
| ලැබිය යුතු කල්බදු/ඉජාරා | 293,766 | 1,538,226 | (1,733,151) | 98,841 |
| ලැබිය යුතු කුලී පිට ගැනුම්/මුරාබා | (5,316) | 188,858 | (10,712) | 172,830 |
| කාලසීමා ණය සහ ලැබිය යුතු දේ | 297,941 | 3,168,837 | (2,441,667) | 1,025,111 |
| වෙනත් ලැබිය යුතු දේ | - | 55,707 | - | 55,707 |
| එකතුව | 586,391 | 4,951,628 | (4,185,530) | 1,352,489 |

11.3 ආදායම් ප්‍රකාශය වෙත අපහායන ගාස්තුව - සමාගම

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු.'000 | අදියර 2 රු.'000 | අදියර 3 රු.'000 | එකතුව රු.'000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| කේවල අපහායනය | - | - | 487,288 | 487,288 |
| සාමූහික අපහායනය | 506,739 | (222,248) | (152,147) | 132,344 |
| එකතුව | 506,739 | (222,248) | 335,141 | 619,632 |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු.'000 | අදියර 2 රු.'000 | අදියර 3 රු.'000 | එකතුව රු.'000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| කේවල අපහායනය | - | - | (148,063) | (148,063) |
| සාමූහික අපහායනය | 156,312 | (69,899) | 579,353 | 665,766 |
| එකතුව | 156,312 | (69,899) | 431,290 | 517,703 |

11.4 ආදායම් ප්‍රකාශය වෙත අපහායන ගාස්තුව - සමූහය

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2022 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු.'000 | අදියර 2 රු.'000 | අදියර 3 රු.'000 | එකතුව රු.'000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| කේවල අපහායනය | - | - | 487,288 | 487,288 |
| සාමූහික අපහායනය | 720,725 | (226,076) | (51,781) | 442,868 |
| එකතුව | 720,725 | (226,076) | 435,507 | 930,156 |

| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2021 | | | |
|---|---|---|---|---|
| | අදියර 1 රු.'000 | අදියර 2 රු.'000 | අදියර 3 රු.'000 | එකතුව රු.'000 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දේ | | | | |
| කේවල අපහායනය | - | - | (260,794) | (260,794) |
| සාමූහික අපහායනය | 244,872 | (71,348) | 797,661 | 971,185 |
| එකතුව | 244,872 | (71,348) | 536,867 | 710,391 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 12. කාර්ය මණ්ඩල වියදම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

කාර්ය මණ්ඩල වියදම් වැටුප්, දිරිදීමනා, සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ සහ සෙසු ආශ්‍රිත වියදම් වලින් සමන්විත වේ. බැඳීමක් පියවීම් සඳහා ආර්ථික ප්‍රතිලාභ ආශ්‍රිත සම්පත් ඉවතට ගලා යෑමක් සිදු කළ යුතු බවට සහ බැඳීමේ වටිනාකම පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදුකල හැකි විටකදී දිරිදීමනා සඳහා ප්‍රතිපාදන හඳුනාගැනේ

| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 838,601 | 111,603 | 488,498 | 1,438,702 |
| හඳුනාගැනීමෙන් බැහැර කල හෝ නැවත ගෙවන ලද වත්කම් (කපා හැරීම් හැර) | (137,607) | (384,216) | (437,025) | (958,848) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (207,147) | 103,722 | 103,425 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 10,196 | (119,665) | 109,469 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 89,110 | 14,417 | (103,526) | - |
| වසර තුලදී අදියර අතර මාරුකරන ලද නිරාවරනයන්හි වසර අවසාන අපේක්ෂිත ණය අලාභ කෙරෙහි බලපෑම | (236,302) | (24,672) | 29,079 | (231,896) |
| අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා භාවිත කරන ලද ආකෘතීන් සහ ආදානයන් වෙත කළ වෙනස්කම් | 312,924 | 65,995 | 202,231 | 581,150 |
| කපා හරින ලද අගයන් | - | - | (5,063) | (5,063) |
| විදේශ විනිමය ගැලපීම් | 80,733 | 6,740 | 48,420 | 135,894 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 1,745,742 | 1,036,189 | 8,060,205 | 10,842,136 |

අපහායනය වෙනස්වීම 2020/21 - සමූහය

| | අදියර 1<br>රු.'000 | අදියර 2<br>රු.'000 | අදියර 3<br>රු.'000 | එකතුව<br>රු.'000 |
|---|---|---|---|---|
| SLFRS 9 යටතේ 2020 අප්‍රියෙල් 1 දිනට අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම | 749,718 | 1,333,159 | 7,087,069 | 9,169,946 |
| උත්පාදිත හෝ මිලට ගත් නව වත්කම් | 482,566 | 212,977 | 205,397 | 900,940 |
| හඳුනාගැනීමෙන් බැහැර කල හෝ නැවත ගෙවන ලද වත්කම් (කපා හැරීම් හැර) | 395,853 | (411,288) | (198,112) | (213,547) |
| අදියර 2 සහ 3 වෙත මාරුකිරීම් | (880,310) | 299,071 | 581,239 | - |
| අදියර 1 සහ 3 වෙත මාරුකිරීම් | 125,361 | (738,941) | 613,580 | - |
| අදියර 1 සහ 2 වෙත මාරුකිරීම් | 71,935 | 311,982 | (383,917) | - |
| වසර තුලදී අදියර අතර මාරුකරන ලද නිරාවරනයන්හි වසර අවසාන අපේක්ෂිත ණය අලාභ කෙරෙහි බලපෑම | (271,960) | (25,867) | 147,364 | (150,463) |
| අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා භාවිත කරන ලද ආකෘතීන් සහ ආදානයන් වෙත කළ වෙනස්කම් | 322,070 | 281,172 | (283,528) | 319,714 |
| කපා හරින ලද අගයන් | - | - | (144,394) | (144,394) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 995,233 | 1,262,265 | 7,624,698 | 9,882,196 |

## 26. රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**රක්ෂණ සැලසුම් වර්ගීකරණය**

රක්ෂණ ගිවිසුම් යනු සමූහය මගින් (රක්ෂකයා) තවත් පාර්ශ්වයකින් වෙතින් (රක්ෂණවර හිමියන්) සැලකිය යුතු රක්ෂණ අවදානමක් භාර ගනිමින් රක්ෂණවර හිමියන් වෙත අහිතකර ලෙස බලපාන විශේෂිත අවිනිශ්චිත සිදුවීමකදී (සිදුවීම) රක්ෂණ වර හිමියන් වෙත වන්දි ලබාදීමට එකඟ වීමයි. පොදු මාර්ගොපදේශයක් වශයෙන් සමූහය මගින් සැලකිය යුතු රක්ෂණ අවදානමක් ඇති ද යන්න නිර්ණය කරනු ලබන්නේ අදාළ සිදුවීම් සිදු නොවූයේ නම් ගෙවන ලද ප්‍රතිලාභ සහ ගෙවිය යුතු ප්‍රතිලාභ සංසන්දනය කිරීමෙනි.

කිසියම් ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් වර්ගීකරණය කළ පසු, සියලුම හිමිකම් ඉවත්වීම හෝ කල් ඉකුත් වීම සිදු නොවුණේ නම්, මෙම කාල සීමාව තුළ රක්ෂණ අවදානම සැලකිය යුතු අයුරින් පහළ ගියද, එය එහි ජීව කාලය පුරා රක්ෂණ ගිවිසුමක් වශයෙන් පවතී.

**රක්ෂණ ලැබිය යුතු දෑ**

තනිකරම මූලික මුදල හා පොලිය නියෝජනය කරන බැවින් රක්ෂණ ලැබිය යුතු දෑ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාවෙන් සුදුසුකම් ලබයි. රක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් පොලී ගාස්තුවක් නොමැති වුවද, ඒවා කෙටි කාලින හා සහ පොලියක් අය කිරීම සඳහා ණය අවදානමක් රහිත වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව (SPPI) සමත් වේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මේවා ස්වභාවයෙන් කෙටි කාලීන වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සඳහා වන ව්‍යාපාර ආකෘතියක් සඳහා සහ සාධන පත්‍රය ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් සිය අභිමතය පළ කරන ලදී. මේවා මූල්‍යමය සංරචකයක් රහිත කෙටිකාලීන ශේෂයන් වන බැවින් ක්‍රමක්ෂය පිරිවැය ධාරණ අගයට සමාන වේ. සක්‍රීය (1 අදියර) ,අවක්‍රීය (2 අදියර) සහ අක්‍රීය (3 අදියර) යන අදියර තුනක් මත පදනම්ව, සමාගම මගින් තත්ත්වයන් කිහිපයක් යටතේ මාස 12 අපේක්ෂිත ණය අලාභ සහ ජීව කාල ණය අලාභ වශයෙන් අපේක්ෂිත ණය අලාභ සපයනු ලැබේ.

**නීතිරීති හා කොන්දේසි වල කැපී පෙනෙන සංශෝධන හේතුවෙන් හඳුනාගැනීමෙන් බැහැරකිරීම**

කැපී පෙනෙන ආකාරයෙන්, එය නව රක්ෂණ ගිවිසුමක් බවට පත්වන තාක් දුරට නැවත සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සමාගම මගින් ලැබිය යුතු වාරික හඳුනාගැනීමෙන් බැහැර කෙරෙන අතර, අදාළ වෙනස වෙනම වත්කමක් හෝ වගකීමක් වශයෙන් හඳුනාගැනේ. අළුතින් හඳුනාගත් රක්ෂණ ගිවිසුම් අපේක්ෂිත ණය අලාභ කාර්යයන් උදෙසා අදියර 1 වශයෙන් වර්ගීකරණය කෙරේ.

ලැබිය යුතු රක්ෂණ වාරික හඳුනාගැනීමෙන් බැහැර කරන්නේද නොකරන්නේද යන්න තීරණය කිරීමේදී සමාගම මගින් පහත දැක්වෙන සාධක සළකා බලනු ලැබේ:

- රක්ෂණය කළ හැකි අවදානම අහිමි වීම
- ගනුදෙනු කරුවන්ගේ වෙනස්වීම

**රක්ෂණ ලැබිය යුතු ද සම්බන්ධ අපහායන තක්සේරුකරණය**

සමූහය මගින් රක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධ අපහායන වෙන්කිරීම අපේක්ෂිත ණය අලාභ ක්‍රමය යොදාගනිමින් තක්සේරු කරනු ලැබේ.

**ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සමාගම මගින් ප්‍රතිරක්ෂකයින් වෙත අවදානම පවරනු ලැබේ. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ මගින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු හිඟ ශේෂයන් නියෝජනය වේ. ප්‍රතිරක්ෂකයින්ගෙන් පියවා ගත යුතු වටිනාකම් හිඟ හිමිකම්පෑම් වෙන්කිරීමට ගැළපෙන පරිදි හෝ ප්‍රතිරක්ෂකයාගේ රක්ෂණවරයන් ආශ්‍රිත පියවන ලද හිමිකම්පෑම් ආකාරයෙන් සහ ආශ්‍රිත ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව ඇස්තමේන්තුගත කෙරේ.

පවරන ලද ප්‍රතිරක්ෂණ කටයුතු මගින් සමූහය ස්වකීය රක්ෂණවරහිමියන් කෙරෙහි වන බැඳීම් වලින් නිදහස් නොකෙරේ.

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධ ගතිලක්ෂණ අනුව, ආදායම තනිකරම මූලික මුදල හා පොලිය නියෝජනය කරන බැවින් අදාළ සාධන පත්‍රයන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාවෙන් සුදුසුකම් ලබයි. ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් පොලී ගාස්තුවක් නොමැති වුවද, ඒවා කෙටි කාලීන හා සහ පොලියක් අය කිරීම සඳහා ණය අවදානමක් රහිත වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව සමත් වේ. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මේවා ස්වභාවයෙන් කෙටි කාලීන වන බැවින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සඳහා වන ව්‍යාපාර ආකෘතියක් සඳහා සහ සාධනපත්‍රය ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය අභිමතය පළ කරන ලදී. මේවා මූල්‍යමය සංරචකයක් රහිත කෙටිකාලීන ශේෂයන් වන බැවින් ක්‍රමක්ෂය පිරිවැය ධාරණ අගයට සමාන වේ.

**ප්‍රතිරක්ෂණ ලැබිය යුතු ද සම්බන්ධ අපහායන තක්සේරුකරණය**

SLFRS 4 - රක්ෂණ ගිවිසුම් ඡේදය 20 මත පදනම්ව සමාගමෙහි ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ අපේක්ෂිත ණය අලාභ ආකෘතිය සඳහා සුදුසුකම් නොලබන අතර, ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ ආශ්‍රිත අපහායන අලාභ හඳුනාගැනෙනුයේ ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් පසු සිදුවීමක් හේතුවෙන් ගිවිසුමෙහි කොන්දේසි අනුව සමාගම වෙත සියළු හිඟ මුදල් නොලැබී යා හැකි අන්දමේ වාස්තවික සාක්ෂි පවතින විට සහ අදාළ සිදුවීම සමාගම වෙත ප්‍රතිරක්ෂකයාගෙන් ලැබිය යුතු වටිනාකම කෙරෙහි මැනිය හැකි බලපෑමක් සහිත වුවක් වූ විටකදීය.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 26. රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ (සබැදේ)

**විලම්බිත වියදම්**

***විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC)***

කොමිස්, ප්‍රාරක්ෂණය, අලෙවිකරණය සහ රක්ෂණවර නිකුත් කිරීමේ වියදම් ඇතුළුව ව්‍යාපාර අත්පත්කර ගැනීමේ පිරිවැය වැනි නව ව්‍යාපාර සැකසුම් සඳහා සෘජුව සම්බන්ධ සහ විචලනය වන වියදම්, අනාගත වාරික මගින් මෙකී පිරිවැය අයකරගැනීමට හැකිතාක් දුරට විලම්භනය කරනු ලැබේ. සෙසු සියලු අත්පත්කර ගැනීමේ පිරිවැය ඒවා දරන ලද අවස්ථාවේදී වියදමක් වශයෙන් හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය, උපයන නොලද වාරික ක්‍රමක්ෂය කරන ලද පදනම මත අදාල කාලසීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ.

සඵල ජීව කාලයෙහි හෝ වත්කම හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජන මාදිලිවල වෙනස්කම් ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කරමින් ගිණුම්ගත කෙරෙන අතර එය ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් වශයෙන් සලකනු ලැබේ.

ආශ්‍රිත ගිවිසුම් කල් ඉකුත් වූ විට හෝ අවලංගු වූ පසු විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

කිසියම් හානිකරන දර්ශකයන් උද්ගත වූ පසු විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය සම්බන්ධ අපහායන සමාලෝචනයක් එක් එක් වාර්තාකරණ දිනයේ දී හෝ වඩාත් නිරන්තරව සිදු කෙරේ. අයකර ගත හැකි මුදල ධාරණ වටිනාකමට වඩා අඩු නම්, ආදායම් ප්‍රකාශයෙහි අපහායන අලාභයක් හඳුනාගැනේ. එක් එක් වාර්තාකර කාලපරිච්ඡේදයේදී වගකීම් ප්‍රමාණවත් පරීක්ෂාව තුළද විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය සැලකිල්ලට ගැනේ.

**ප්‍රතිරක්ෂණ කොමිස්**

බාහිර පැතිර ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධ ලැබිය යුතු කොමිස් විලම්භනය කොට අපේක්ෂිත ගෙවිය යුතු වාරික කාලසීමාව පුරා සරල මාර්ග පදනමකින් ක්‍රමක්ෂය කෙරේ.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| ප්‍රතිරක්ෂණ ලැබීම් | - | - | 606,386 | 277,279 |
| රක්ෂණ ලැබීම් | - | - | 716,142 | 747,182 |
| එකතුව | - | - | 1,322,528 | 1,024,461 |
| සාධාරණ අගය | - | - | 1,322,528 | 1,024,461 |

## 27. මූල්‍ය වත්කම්- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සමාගම මගින්, ඒවා විකිණීම සඳහා රඳවා නොගත් අවස්ථාවකදී ක්‍රමෝපායක අරමුණක් උදෙසා රඳවා ගන්නා ලද ඇතැම් මූල්‍ය ආයෝජන සාමාන්‍යයෙන් අවලංගු කළ නොහැකි පරිදි ඒවා - LKAS 32 හි මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම - අදාළ නිර්වචනය සපුරාලන අවස්ථාවකදී යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ සාධනපත්‍ර වශයෙන් වර්ගීකරණය කරනු ලබයි. එබඳු වර්ගීකරණයක් තීරණය කෙරෙනුයේ සාධනපත්‍රයෙන් සාධනපත්‍රයට පදනම මතය.

මෙකී මූල්‍ය සාධනපත්‍ර බැහැර කිරීමේදී, සාධාරණ අගය සංචිතයෙහි පෙර හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය රඳවාගත් ඉපැයුම් වෙත මාරු කෙරේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් රඳවාගෙන සිටිය දී උපයන ලද ලාභාංශය ගෙවීම් ලබාගැනීමේ අයිතිය ස්ථාපනය වූ පසු වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ. වෙනත් විස්තීරණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ සාධනපත්‍ර අපහායන ඇගයීමකට ලක් නොවේ.

උපලබ්ධි නොවූ ලාභ හා අලාළ සාධාරණ අගය සංචිතය තුළ වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ ස්කන්ධ වශයෙන් හඳුනාගැනේ. මෙකී මූල්‍ය ආයෝජන බැහැර කරන ලද විටකදී, පෙර සාධාරණ අගය සංචිතයෙහි හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ රඳවාගත් ඉපැයුම් වෙත මාරු කෙරේ. වත්කම රඳවා තබා ගැනුනු කල වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට උපයන ලද ලාභාංශ අදාළ ගෙවීම් හිමිකර ගැනීමේ අයිතිය ස්ථාපනය වූ පසු ආදායම් ප්‍රකාශයෙහි මෙහෙයුම් ආදායම වශයෙන් හඳුනාගැනේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය හඳග | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2022 | 2021 | 2022 | 2021 |
| | | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| ස්කන්ධ සුරැකුම් | 27.1 | 269 | 231,838 | 309,118 | 231,838 | 309,118 |
| භාණ්ඩාගාර බිල්පත් | | | - | - | 299,663 | 426,376 |
| ණයකර | | | 1,101,440 | - | 1,101,440 | - |
| එකතුව | | | 1,333,278 | 309,118 | 1,632,941 | 735,494 |
| සාධාරණ අගය | | | 1,333,278 | 309,118 | 1,632,941 | 735,494 |

### 27.1 ස්කන්ධ ආයෝජන සහ ණයකර ආයෝජන - සමාගම සහ සමූහය

| මාර්තු 31 දිනට | | | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සටහන | පිටු අංකය | කොටස් සංඛ්‍යාව | ආයෝජන පිරිවැය රු.000 | වෙළඳපොල වටිනාකම රු.000 | කොටස් සංඛ්‍යාව | ආයෝජන පිරිවැය රු.'000 | වෙළඳපොල වටිනාකම රු.'000 |
| **ස්කන්ධ ආයෝජන** | | | | | | | | |
| පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී | | | 25,014,002 | 237,633 | 135,076 | 25,014,002 | 237,633 | 180,100 |
| ආසිරි රෝහල | | | 500,000 | 20,730 | 18,750 | | | |
| සණස සංවර්ධන බැංකුව පීඑල්සී | | | 2,271,260 | 213,853 | 67,002 | 2,271,260 | 213,853 | 129,008 |
| | | | | 472,216 | 220,828 | | 451,486 | 309,108 |
| ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය | 27.2.1 | 269 | 100 | 10 | 10 | 100 | 10 | 10 |
| ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී | | | 5,000,000 | 50,000 | 11,000 | 50,000,000 | 50,000 | - |
| උප එකතුව | | | - | - | 231,838 | - | - | 309,118 |
| **ණයකර ආයෝජන** | | | | | | | | |
| ලංකා විදුලිබල මණ්ඩලය | | | 9,180,900 | 1,000,086 | 891,470 | - | - | - |
| සම්පත් බැංකුව | | | 2,025,000 | 211,149 | 209,970 | - | - | - |
| එකතුව | | | | 1,733,461 | 1,333,278 | | 501,496 | 309,118 |

### 27.2 මට්ටම 3 ධූරාවලිය යටතේ වන අප්‍රකාශිත ස්කන්ධ සුරකුම් සඳහා සාධාරණ අගය මිනුමෙහි සැසඳුම

#### 27.2.1 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යංශය

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 10 | 10 | 10 | 10 |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගත් ප්‍රතිමිනුම | - | - | - | - |
| මාර්තු 31 දිනට ශේෂය | 10 | 10 | 10 | 10 |

### 28. ණය සාධනපත්‍ර- ක්‍රමක්ෂය පිරිවැය

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

SLFRS 9 අනුව, ආදායම් ප්‍රකාශය ඔස්සේ සාධාරණ අගයට නම් කොට නොමැති නම් සහ පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් මූල්‍ය සාධනපත්‍ර ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීමේ අරමුණින් යුතුව වත්කම් රඳවාගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම් රඳවා ගැනීම සහ
- මූල්‍ය වත්කමෙහි ගිවිසුම්ගත කොන්දේසි මගින් නනිකරම හිඟ මුල් මුදලෙහි මූලික මුදල සහ පොලිය ගෙවීම් සඳහා වන මුදල් ප්‍රවාහ සඳහා නිශ්චිත දිනයන් උද්ගත වන්නේ නම්.

මූලික මිනුමින් අනතුරුව, මේවා ක්‍රමක්ෂය පිරිවැය අනුව පසුව මනිනු ලැබේ. ( හානිකරන වෙන්කිරීම අඩු කොට සඵල පොලී අනුපාතිකය භාවිත කරමින් දළ ධාරණ අගය) සඵල පොලී අනුපාතිකය ගණනය කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන අත්පත් කර ගැනීම සම්බන්ධ කවර හෝ වට්ටම් හෝ වාරික සහ ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. ක්‍රමක්ෂය පොලී ආදායම තුළ ඇතුලත් කරනු ලබන අතර අපහායනයෙන් උද්ගතවන අලාභ ආදායම් ප්‍රකාශයෙහි - ණය සහ වෙනත් අලාභ සඳහා අපහායන ගාස්තු යටතේ හඳුනාගැනේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 28. ණය සාධනපත්‍ර- ක්‍රමක්ෂය පිරිවැය (සබැඳේ)

| මාර්තු 31 දිනට | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 9,827,221 | 6,319,142 | 9,827,221 | 6,319,142 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 675,064 | 2,750,582 | 1,539,558 |
| අප්‍රකාශිත වරණීය කොටස් | - | - | 918,504 | 734,686 |
| වාණිජ පත්‍රිකා | - | - | 152,475 | 155,245 |
| ණයකර | - | - | 2,364,743 | 2,183,083 |
| එකතුව | 9,827,221 | 6,994,206 | 16,013,525 | 10,931,714 |
| සාධාරණ අගය | 9,804,639 | 6,984,078 | 15,765,803 | 11,200,604 |

### 28.1 ණයකර

| | අනුපාතය | කල්පිරීමේ දිනය | සමූහය 2022 ණයකර සංඛ්‍යාව | සමූහය 2022 ධරණ අගය රු.'000 | සමූහය 2021 ණයකර සංඛ්‍යාව | සමූහය 2021 ධරණ අගය රු.'000 |
|---|---|---|---|---|---|---|
| සම්පත් බැන්ක් පීඑල්සී | 8.25% | 14-Dec-19 | - | - | - | - |
| | 9.90% | 18-Nov-20 | 500,000 | - | 500,000 | - |
| | 12.50% | 20-Mar-23 | 1,000,000 | 100,366 | 1,000,000 | 100,401 |
| | 13.90% | 24-Feb-24 | 1,000,000 | 101,152 | 1,000,000 | 101,152 |
| සියපත ෆිනෑන්ස් පීඑල්සී | 13.33% | 8-Aug-24 | 1,500,000 | 162,630 | 1,500,000 | 162,632 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 11.00% | 10-Sep-22 | 1,000,000 | 105,940 | 1,000,000 | 105,941 |
| නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී | 9.40% | 24-Jun-20 | 282,800 | - | 282,800 | - |
| | 13.95% | 30-Mar-24 | 2,000,000 | 200,149 | 2,000,000 | 200,163 |
| ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී | 9.40% | 10-Jun-20 | 332,100 | - | 332,100 | - |
| | 12.75% | 9-Nov-23 | 1,000,000 | 104,925 | 1,000,000 | 104,925 |
| | 13.00% | 29-Mar-25 | 844,500 | 84,538 | 844,500 | 84,538 |
| | 13.50% | 28-03-2024 | 1,000,000 | 100,143 | 1,000,000 | 100,143 |
| | 11.00% | 12-Jun-25 | 1,190,000 | 129,415 | 1,190,000 | 128,912 |
| සෙලාන් බැන්ක් පීඑල්සී | 12.85% | 29-Mar-23 | 750,000 | 75,026 | 750,000 | 75,051 |
| එම්ටීඩී වෝකර්ස් පීඑල්සී | 11.75% | 30-Sep-19 | 254,784 | 26,954 | 254,784 | 26,954 |
| කොමර්ෂල් බැන්ක් පීඑල්සී | 10.75% | 8-Mar-21 | 2,000,000 | - | 2,000,000 | - |
| | 12.00% | 27-Oct-21 | - | - | 421,900 | 44,316 |
| | 12.00% | 22-Jul-23 | 881,700 | 90,106 | 881,700 | 90,106 |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | 11.25% | 28-Mar-21 | 2,000,000 | - | 2,000,000 | - |
| | 13.00% | 1-Nov-23 | 193,300 | 20,332 | 193,300 | 20,332 |
| | 12.30% | 22-Sep-24 | 413,300 | 43,900 | 413,300 | 43,900 |
| නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී | 12.65% | 8-Nov-21 | - | - | 2,000,000 | 209,851 |
| | 12.80% | 23-Dec-24 | 2,000,000 | 206,553 | 2,000,000 | 206,568 |
| හේලීස් පීඑල්සී | 12.50% | 31-Jul-23 | 1,000,000 | 101,978 | 1,000,000 | 101,978 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 9.35% | 15-Apr-26 | 4,000,000 | 435,694 | | |
| හේලීස් පීඑල්සී | 10.25% | 24-Feb-26 | 3,000,000 | 302,819 | 3,000,000 | 302,819 |
| උප එකතුව | | | | 2,392,620 | | 2,210,684 |
| අඩු කිරීම: අපේක්ෂිත ණය අලාභ සඳහා ප්‍රතිපාදන | | | | (27,877) | | (27,601) |
| එකතුව | | | | 2,364,743 | | 2,183,083 |

මෙම කාණ්ඩය යටතේ වන සියලුම ආයෝජන ආයෝජන ශ්‍රේණියේ සාධනපත්‍ර වන බැවින් අපේක්ෂිත ණය අලාභ සඳහ වන සමස්ත ප්‍රතිපාදන මාස 12 අපේක්ෂිත ණය අලාභ වලින් උකහා ගන්නා ලදී.

## 29. පරිපාලිතයන් හි ආයෝජන

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ඒකාබද්ධ සහ වෙන් වෙන් වූ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 27 අනුව, පරිපාලිතයන්හි ආයෝජන මූල්‍ය ප්‍රකාශ සම්බන්ධව කවර හෝ අපහායන අලාභ වලින් ශුද්ධව මූල්‍ය ප්‍රකාශන වල ආදායම් ප්‍රකාශයට අය කෙරෙන අතර පිරිවැය අනුව ප්‍රකාශයට පත් කෙරේ.

පරිපාලිතයන් යනු සමාගම මගින් පාලනය කරනු ලබන ආයතන වේ. සමාගම මගින් පරිපාලිතයින් පාලනය අත්පත් කර ගත් දිනයේ සිට පරිපාලිතයන් ඒකාබද්ධකරණය කෙරෙන අතර එම පාලනය අහිමිවන තෙක් අඛණ්ඩව ඒකාබද්ධකරණය කෙරේ. සමාගම මගින් එය නිරාවරණය වූ පසු හෝ ආයෝජිතයා සමග සිය ආයෝජනයෙන් විචල්‍ය ආදායම් ලබා ගැනීමේ අයිතිය හිමි වූ පසු ආයෝජිතයා පාලනය කරනු ලබන අතර ආයෝජිතයා මත පවතින සිය බලය ඔස්සේ අදාල ආදායම් වලට බලපෑම් කිරීමේ හැකියාව සමාගමට හිමි වෙයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී අභ්‍යන්තර සමූහ ශේෂයන් සහ ගනුදෙනු, ආදායම්, වියදම් සහ කවර හෝ අභ්‍යන්තර සමූහ ගනුදෙනු වලින් වන උපලබ්ධි නොවූ ලාභ ඉවත් කෙරේ.

සුළු කොටස් හිමි අයිතිය මගින් සමාගම වෙත ඍජුව හෝ වක්‍රව හිමිකමක් නොමැති පරිපාලිතයන් ගේ ලාභ හෝ අලාභ සහ ශුද්ධ වත්කම් කොටස නියෝජනය වේ.

සුළු කොටස්හිමි අයිතිය ස්කන්ධ සමග ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරන අතර, එනමුත් මව් සමාගමෙහි කොටස් හිමිකරුවන්ගේ ස්කණ්ධ වලින් වෙනම ප්‍රකාශයට පත් කෙරේ. ඍණාත්මක ශේෂයක් කෙරෙහි හේතු වුවද සුළු කොටස්හිමි අයිතියට අදාල වන කවර හෝ අලාභයක් පාලනය අහිමි වූ අයිතිය හිමිකමට සාපේක්ෂව වෙන් කරනු ලැබේ. සුළු කොටස් හිමි අයිතිය මගින් අත්පත් කරගැනීම් මව් සමාගම් ව්‍යාප්ති ක්‍රමවේදය යොදාගනිමින් ගිණුම් ගත කෙරෙන අතර ගෙවන ලද හෝ ලද ප්‍රතිශ්ධාවෙහි සහ අත්පත්කොට ගත් ශුද්ධ වත්කම් වල සාධාරණ අගය අතර වෙනස ස්කන්ධ වල හඳුනාගනු ලැබේ.

බංග්ලාදේශයෙහි සංස්ථාපිත ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හැරුණුවිට සමාගමේ සියලුම පරිපාලිතයන් ශ්‍රී ලංකාවේ සංස්ථාපිතය. පරිපාලිතයන් පිළිබඳ ලැයිස්තුවක් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව පිටු අංක 215 සටහන 1.2 හි දැක්වේ.

| මාර්තු 31 දිනට | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| සමාගම | හිමිකාරීත්වය % | පිරිවැය රු.'000 | අධ්‍යක්ෂවරුන්ගේ/ වෙළඳපොල තක්සේරුව රු.'000 | හිමිකාරීත්වය % | පිරිවැය රු.'000 | අධ්‍යක්ෂවරුන්ගේ/ වෙළඳපොල තක්සේරුව රු.'000 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 100.00 | 175,000 | 385,556 | 100.00 | 175,000 | 332,983 |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ් | 100.00 | 550,000 | 985,396 | 100.00 | 550,000 | 1,013,914 |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 100.00 | 600,000 | 728,694 | 100.00 | 600,000 | 626,158 |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | 100.00 | 150,000 | 504,701 | 100.00 | 150,000 | 367,437 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 75.00 | 600,000 | 4,515,000 | 75.00 | 600,000 | 2,955,000 |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් | 51.00 | 1,138,788 | 2,272,595 | 51.00 | 1,138,788 | 1,482,658 |
| එකතුව | | 3,213,788 | 9,391,942 | | 3,213,788 | 6,778,150 |

පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී හැරුනුවිට පරිපාලිතයන් කොළඹ කොටස් වෙළඳපොලෙහි ප්‍රකාශිත නොවේ. පරිපාලිතයන්හි ආයෝජන පිළිබද අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව ශුද්ධ වත්කම් පදනමක් මත ධාරණය කොට ඇත. පීපල්ස් ඉන්ෂ්වරන්ස් පීඑල්සී වෙළඳපොල වටිනාකම් පදනමක් මත තක්සේරු කොට ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 29. පරිපාලිතයන් හි ආයෝජන (සබැඳේ)

ප්‍රමාණාත්මක සුළු කොටස් හිමි අයිතියක් සහිත සමූහයේ පරිපාලිතයන් සම්බන්ධ තොරතුරු පහත වගුවෙහි සාරාංශගත කෙරේ.

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී රු.'000 | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් රු.'000 | එකතුව රු.'000 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී රු.'000 | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් රු.'000 | එකතුව රු.'000 |
| සුළු කොටස් හිමි අයිතිය (NCI) ප්‍රතිශතය | 25% | 49% | | 25% | 49% | |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 4,562,288 | 449,753 | 5,012,041 | 5,294,873 | 361,819 | 5,656,692 |
| අඩු කිරීම: මෙහෙයුම් වියදම් | 4,254,559 | 478,043 | 4,732,602 | 3,728,072 | 303,451 | 4,031,523 |
| ආදායම් බදු වලට පෙර ලාභය | 307,729 | (28,290) | 279,439 | 1,566,801 | 58,368 | 1,625,169 |
| අඩු කිරීම: ආදායම් බදු වියදම් | 217,338 | (7,556) | 209,782 | 363,208 | 55,468 | 418,676 |
| බදු වලට පසු ලාභය | 90,391 | (20,734) | 69,657 | 1,203,593 | 2,900 | 1,206,493 |
| සුළු කොටස් හිමි අයිතිය (NCI) වෙත වෙන්කරන ලද ලාභය | 22,598 | (10,160) | 12,438 | 300,898 | 1,421 | 302,319 |

| මාර්තු 31 දිනට | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී රු.'000 | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් රු.'000 | එකතුව රු.'000 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී රු.'000 | ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් රු.'000 | එකතුව රු.'000 |
| මුදල් සහ මුදලට සමාන දේ | 642,756 | 124,218 | 766,974 | 1,045,082 | 42,604 | 1,087,686 |
| බැංකු සහ මූල්‍ය ආයතන වල ශේෂයන් | 2,561,413 | 1,997,930 | 4,559,343 | 2,815,391 | 505,607 | 3,320,998 |
| ණය සහ ලැබීම් | 2,709,882 | 10,964,065 | 13,673,947 | 2,558,607 | 4,735,863 | 7,294,470 |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබීම් | 1,931,657 | - | 1,931,657 | 1,643,629 | - | 1,643,629 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 299,663 | - | 299,663 | 426,376 | - | 426,376 |
| ක්‍රමක්ෂය පිරිවැය අනුව ණය සාධනපත්‍ර | 2,750,582 | 918,504 | 3,669,086 | 864,494 | 691,274 | 1,555,768 |
| දේපළ පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් | 106,954 | 183,036 | 289,990 | 182,322 | 147,778 | 330,100 |
| වෙනත් වත්කම් | 1,099,636 | 356,326 | 1,455,962 | 1,597,954 | 204,811 | 1,802,765 |
| මුළු වත්කම් | 12,102,543 | 14,544,079 | 26,646,622 | 11,133,855 | 6,327,937 | 17,461,792 |
| බැංකු වෙත ගෙවිය යුතු | 184,738 | 796,993 | 981,731 | 3,020 | 105,449 | 108,469 |
| ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | - | 8,665,037 | 8,665,037 | - | 2,944,262 | 2,944,262 |
| වෙනත් මූල්‍ය වගකීම් | 969,610 | 528,323 | 1,497,933 | 691,728 | 273,396 | 965,124 |
| වෙනත් වගකීම් | 216,897 | 97,658 | 314,554 | 482,995 | 97,658 | 580,653 |
| රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | 5,982,246 | - | 5,982,246 | 5,089,039 | - | 5,089,039 |
| මුළු වගකීම් | 7,353,491 | 10,088,011 | 17,441,501 | 6,266,782 | 3,420,765 | 9,687,547 |
| ශුද්ධ වත්කම් වටිනාකම | 4,749,052 | 4,456,068 | 9,205,120 | 4,867,073 | 2,907,172 | 7,774,245 |
| සුළු කොටස් හිමි අයිතියෙහි ධාරණ අගය | 1,187,263 | 2,183,473 | 3,370,736 | 1,216,768 | 1,424,514 | 2,641,283 |

## 30. ආයෝජන දේපල

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආයෝජන දේපල යනු භාණ්ඩ හෝ සේවා සේවා සැපයීම් හෝ පරිපාලන අවස්ථා වෙනුවෙන් භාවිත කෙරෙන, නමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිණීම සඳහා නොපවතින, කුලී ආදායම් උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීම සඳහා හෝ මෙම අරමුණු දෙකම සඳහා රඳවාගත් දේපළ වේ.

ආයෝජන දේපල මූලිකව පිරිවැය අනුව හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනයේ දී වෙළෙඳපොළ තත්ත්වයන් පිලිබිඹු වන පරිදි අයෝජන දේපළ සාධාරණ අගය අනුව ප්‍රකාශයට පත් කෙරේ. සාධාරණ අගය වෙනස් වීම හේතුවෙන් උද්ගතවන ලාභ හෝ අලාභ ඒවා උද්ගත වන වසරේ ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

එක් සමූහ සමාගමක් මගින් තවත් සමූහ සමාගමක ආයෝජන දේපළ වලින් සැලකිය යුතු කොටසක් අත්පත් කොටගෙන ඇති නම්, එවැනි ආයෝජන දේපල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි දේපල, පිරියත හා උපකරණ වශයෙන් සැලකෙන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කෙරේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම්**
ආයෝජන දේපළක් බැහැර කිරීමේදී හෝ එහි බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි අවස්ථාවකදී ආයෝජන දේපල හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. ආයෝජන දේපළක් විශ්‍රාම ගැන්වීමෙන් හෝ බැහැර කිරීමෙන් උද්ගත වන කවර හෝ ලාභ හෝ අලාභ අදාල විශ්‍රාම ගැන්වීම හෝ බැහැර කිරීම සිදුකළ වසරේ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

**ආයෝජන දේපල වෙත/ ආයෝජන දේපල වෙතින් පසුකාලීන මාරුකිරීම්**
ආයෝජන දේපල වෙත මාරු කිරීම් සිදු කෙරෙනුයේ අවසන් හිමිකරුගේ හිමිකාරිත්වය සහිතව භාවිතය වෙනසක් පවතින විට, වෙනත් පාර්ශවයක් ලෙස මෙහෙයුම් කල්බදු අරඹන විට හෝ ඉදිකිරීම් හෝ සංවර්ධනයක් සම්පූර්ණ කිරීමේ දී පමණි.

ආයෝජන දේපල වෙතින් මාරු කිරීමක් සිදු කරනුයේ හිමිකරුගේ සහ හිමිකාරිත්වය සහිතව භාවිතයේ වෙනසක් සිදු වූ විට හෝ විකිණීමේ අදහසක් සහිතව සංවර්ධන ආරම්භ කළ අවස්ථාවකදී පමණි.

හිමිකරුගේ හිමිකාරිත්වය සහිත දේපළ හෝ තොග වෙත ආයෝජන දේපල වලින් මාරු කිරීම්, භාවිතය වෙනස් වූ දිනයේ දී සාධාරණ අගය අනුව පසුකාලීන ගිණුම්ගත කිරීම් සඳහා දේපළෙහි උපකල්පිත පිරිවැය වේ. හිමිකරු සතු දේපලක් වශයෙන් සමාගම සතු දේපල දේපළක් ආයෝජන දේපළක් බවට පත්වන්නේ නම්, සමාගම මගින් භාවිතයේ වෙනස සිදු වූ දිනය දක්වා දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තිය අනුව එවැනි දේපල ගිණුම්ගත කෙරේ.

හිමිකරු සතු දේපළ සහ තොග වලින් ආයෝජන දේපල වෙත මාරු කිරීම සඳහා, අදාළ දිනයේ දී දේපළෙහි සාධාරණ අගය සහ එහි පෙර ධාරණ අගය අතර වෙනස ආදායම් ප්‍රකාශයෙහි හඳුනා හඳුනාගැනේ. සමාගම මගින් ස්වයං ඉදිකිරීම් ආයෝජන දේපලක් ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කළ පසු, අදාල දිනයෙහි දේපළෙහි සාධාරණ අගය සහ එහි පෙර ධාරණ අගය අතර කවර හෝ වෙනසක් ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

**ආයෝජන දේපලවල සාධාරණ අගය**
සමාගමේ සහ සමූහයේ ආයෝජන දේපල සාධාරණ අගය අනුව නිරූපණය කෙරේ. සමාන ආකාරයේ වත්කම් වල ප්‍රවර්තන වෙළෙඳපොළ මිල පවතින විට, එවැනි සාක්ෂි මෙකී වත්කම් වල සාධාරණ අගයන් ඇස්තමේන්තු ගත කිරීමේදී සැලකිල්ලට ගැනේ. එබඳු තොරතුරු නොමැති විටකදී, සමූහය සහ සමාගම මගින් සමාන ආකාරයේ දේපළවල ප්‍රවර්තන වෙළෙඳපොළ කුලී වලින් උකහාගත් ඇස්තමේන්තු මත පදනම් වූ වට්ටම්ගත මුදල් ප්‍රවාහ අනාවැකි සැලකිල්ලට ගනිමින් සාධාරණ අගයන් වශයෙන් ආරෝපණය කළ හැකි වටිනාකම් සාධාරණ පරිදි සාධාරණ අගය ඇස්තමේන්තු ආශ්‍රයෙන් නිර්ණය කෙරෙන අතර එහිදී මුදල් ප්‍රවාහයන්හි වටිනාකම සහ කාලගණනය පිළිබිඹු වේ.

**සාධාරණ අගය නිර්ණය කිරීම**
තක්සේරුකරනයට ලක් වන දේපල වල පරිශ්‍රය සහ කාණ්ඩය පිළිබඳ මෑත කාලීන අත්දැකීම් සහිත පිළිගත් සුදුසුකම් ලත් සහිත බාහිර හා ස්වාධීන තක්සේරුකරුවන් විසින් සෑම වසරකදීම ආයෝජන දේපල කළඹ තක්සේරු කරන ලැබේ. අදාල කාලසීමාව තුළ වන මූල්‍ය කාල පරිච්ඡේදයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාධාරණ අගය නිර්ණය කෙරේ.

මිනුම්කරණ දිනයේ දී වෙළඳවෙළෙඳපොළ සහභාගිකයින් අතර සාමාන්‍ය ගනුදෙනුවකදී අදාළ දේපළ විකිණිය හැකි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවක් ආශ්‍රයෙන් හෝ භාවිතයේදී එහි වෙළෙඳපොළ වටිනාකම මත පදනම්ව සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

**සමූහය තුළ කල්බදු පදනමට දෙන ලද ආයෝජන දේපළ**
මව් සමාගමට හෝ කවර හෝ පරිපාලිතයක් වෙත කල්බදු පදනමට දෙන ලද දේපළක් සමූහය පාර්ශවයෙන් හිමිකරුගේ හිමිකාරීත්වය සහිත වශයෙන් සැළකෙන අතර සාමෝධානික අරමුණු උදෙසා ගැළපුම් සිදුකෙරේ.

**හිමිකරුගේ පදිංචිය සහිත දේපල සහ ආයෝජන දේපල**
කිසියම් දේපලක් ආයෝජන දේපළක් වශයෙන් සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කිරීමේදී සමූහය/සමාගම මගින් අදාළ දේපළ වෙත ආරෝපණය කළ හැකි මුදල් ප්‍රවාහ පමණක් නොව වෙනත් වත්කම් වලට ද අදාළ වන මුදල් ප්‍රවාහ ස්වාධීනව උත්පාදනය කරන්නේදැයි විනිශ්වයක් සිදු කරයි.
අනුශාංගික සේවා සැලකියයුතු මට්ටමක පවතීද යන්න සහ නිර්ණය කිරීමේදී අදාල දේපල ආයෝජන දේපලක් වශයෙන් සුදුසුකම් නොලබන අවස්ථාවකදීද මෙම විනිශ්වය භාවිත කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 30. ආයෝජන දේපල (සබැඳේ)

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | - | - | 820,664 | 1,131,596 |
| වසර තුළදී එක්කිරීම් | - | - | - | - |
| වසර තුළදී මාරුකිරීම් | - | - | - | (310,932) |
| මාර්තු 31 දිනට ශේෂය | - | - | 820,664 | 820,664 |

කොළඹ 7, හැව්ලොක් පාර, අංක 7 සහ 9 දරන ස්ථානයේ පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මහජන බැංකුව, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී වෙත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් මගින් කුලියට දෙන ලදී. සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් හි, එබඳු දේපල වෙන් කොට ඇති අතර මහජන බැංකුව වෙත කුලියට දෙන ලද කොටස සමූහයේ ආයෝජන දේපළ වශයෙන් වර්ග කොට ඇත. වර්ග කිරීමෙහි පදනම වශයෙන් කුලියට දෙන ලද වර්ග අඩි සංඛ්‍යාව පදනම් කරගෙන ඇත.

ඉහත ආයෝජන දේපළෙහි වෙළඳපොළ වටිනාකම 2021 දෙසැම්බර් 31 වැනි දිනට සමාගම සහ සමූහය සමඟ සම්බන්ධ නොවූ ස්වාධීන තක්සේරුකරුවකු වන කේ.ටී.ඩී. තිසේරා මහතා විසින් තක්සේරු කරන ලදී.

ඉහත ආයෝජන දේපල සම්බන්ධ හඳුනාගත් කුලී ආදායම් පිටු අංක 228 හි සටහන 10 හි අනාවරණය කොට ඇත.

ඉහත ආයෝජන දේපල සම්බන්ධව හඳුනාගත් සෘජු මෙහෙයුම් වියදම් පිටු අංක 234 හි සටහන 15 හි හෙළිදරව් කොට ඇත.

## 31. වෙනත් වත්කම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගම සහ සමූහය මගින් ඔවුන්ගේ සියලුම වෙනත් වත්කම්, වෙනත් මූල්‍ය වත්කම් සහ වෙනත් මූල්‍ය නොවන වත්කම් වශයෙන් වර්ග කරනු ලැබේ. වෙනත් මූල්‍ය නොවන වත්කම් ප්‍රධාන වශයෙන් අයකර ගත හැකි එකතු කළ අගය මත බදු, තොග සහ වෙනත් අයකර ගත හැකි දේ වලින් සමන්විත වේ. අත්තිකාරම් ගෙවීම් ඓතිහාසික පිරිවැය අනුව ධාරණය කරනු ලැබේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| වෙනත් මූල්‍ය වත්කම් - රක්ෂණ කොමිස් | | | 108,493 | 126,949 | - | - |
| මූල්‍ය නොවන වත්කම් | 31.1 | 274 | 640,661 | 448,711 | 831,826 | 932,458 |
| එකතුව | | | 749,154 | 575,660 | 831,826 | 932,458 |

### 31.1 මූල්‍ය නොවන වත්කම්

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| | | | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| අත්තිකාරම් ගෙවීම් | | | 111,524 | 105,693 | 81,928 | 68,320 |
| ලැබිය යුතු ලාභාංශ | | | 225,000 | - | - | - |
| තොග | | | 33,015 | 58,380 | 40,815 | 65,708 |
| පෙරදාගෙවූ වියදම් | | | 94,605 | 72,367 | 100,814 | 81,759 |
| සේවක ණය මත ක්‍රමක්ෂය නොකල පිරිවැය (1 වැනි දින වෙනස) | 31.2 | 275 | 54,211 | 78,624 | 54,360 | 78,924 |
| විලම්බිත වියදම් | | | - | - | 151,388 | 210,104 |
| වෙනත් ලැබීම් | | | 122,306 | 133,647 | 402,521 | 427,643 |
| එකතුව | | | 640,661 | 448,711 | 831,826 | 932,458 |

### 31.2 සේවක ණය මත ක්‍රමක්ෂය නොකළ පිරිවැය (1 වැනි දින වෙනස)

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 78,624 | 123,264 | 78,924 | 123,264 |
| වසර සඳහා අයකිරීම | (24,413) | (44,640) | (24,564) | (44,340) |
| මාර්තු 31 දිනට ශේෂය | 54,211 | 78,624 | 54,360 | 78,924 |

## 32. දේපළ, පිරියත හා උපකරණ

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**හඳුනාගැනීමේ පදනම**

දේපළ, පිරියත හා උපකරණ යනු සේවා හෝ පරිපාලන කාර්යයන් සඳහා රඳවාතබා ගනු ලබන භෞතිකමය අයිතමයන් වන අතර, ඒවා වසරකට වැඩි කලක් භාවිතයට අපේක්ෂිතය.

වත්කමක් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇති නම් සහ අදාළ වත්කමෙහි පිරිවැය සාධාරණ අයුරින් මැනිය හැකි නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනේ.

**මිනුම්කරණ පදනම**

හඳුනාගැනීම සඳහා යෝග්‍ය වන දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් එහි පිරිවැය අනුව මූලිකව හඳුනාගැනේ. එම පිරිවැය අදාළ වත්කම අත්පත් කරගැනීම සඳහා සෘජුව ආරෝපනය කල හැකි දරන ලද වියදම සහ පසුව එයට කොටස් එක් කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට යොදන ලද පිරිවැයෙන් සමන්විත වේ. ස්වයං නිර්මිත වත්කමක පිරිවැය අමුද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රමය, එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන් සඳහා දරන ලද කවර හෝ පිරිවැය, අයිතමයන් ඉවත් කිරීමේ හා අදාළ පරිශ්‍රයේ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයෙන් සමන්විත වේ. ආශ්‍රිත උපකරණයෙහි ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් වන මිලදී ගත් මෘදුකාංග පරිඝනක උපකරණයෙහි කොටසක් වශයෙන් ප්‍රාග්ධනීකරණය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ සඵල ජීවකාල සහිත වන විට, ඒවා දේපළ, පිරියත හා උපකරණ වල වෙනම අයිතමයන් (ප්‍රධාන සංරචක) වශයෙන් ගිණුම්ගත කෙරේ.

සමාගම සහ සමූහය මගින් පිරියත හා උපකරණ සඳහා පිරිවැය ආකෘතියක් යොදවමින් කවර හෝ අවස්ථාමය පිරිවැය සමගින් මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා කවර හෝ සමුච්චිත අපහායනය අලාභයන් අඩු කොට වාර්තා කෙරේ.

**පසුකාලීන පිරිවැය**

කිසියම් කොටසක් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය අයුරින් මැනිය හැකි නම් දේපල පිරියත සහ උපකරණ කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ධාරණ අගය තුළ හඳුනා ගැනේ. දේපල පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීමේ පිරිවැය ඒවා වැය කළ අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

**අළුත්වැඩියාව සහ නඩත්තුව**

අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද මූල්‍යමය කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයට අය කෙරේ. ප්‍රධාන පෙළේ අළුත්වැඩියාවන් සම්බන්ධ පිරිවැය, පවතින වත්කම් වල ආසන්නතම තක්සේරු කරන ලද සම්මත කාර්යසාධනයට වැඩි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලාඒමක් සිදුවන අවස්ථාවේදී සහ අළුත්වැඩියාවේදී අදාළ වත්කමෙහි හඳුනාගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේදී, ධාරණ අගය තුළ ඇතුළත් කෙරේ. ආශ්‍රිත වත්කමෙහි අවශේෂ සඵල ජීවකාලය තුළ ප්‍රධාන පෙළේ අලුත්වැඩියාවන් ක්ෂය කෙරේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**

දේපළ, පිරියත හා උපකරණ ඒවා ඉවත් කිරීමේදී හෝ එමගින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ නොහැකි විටකදී හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමෙන් උද්ගත වන ලාභය හෝ අලාභය අදාළ අයිතමය හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වසරේදී වෙනත් මෙහෙයුම් ආදායම යටතේ ආදායම් ප්‍රකාශය වෙත ඇතුළත් කෙරේ.

**ක්ෂයවීම්**

වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පරිභෝජන රටාව පැහැදිලිව දක්වෙන බැවින්, දේපළ පිරියත සහ උපකරණ වල පිරිවැය වල එක් එක් අයිතමයන්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල මාර්ග ක්‍රමයක් භාවිත කරමින් ආදායම් ප්‍රකාශයෙහි ක්ෂය වශයෙන් හඳුනාගැනේ. ඉඩම් ක්ෂයවීමට භාජනය නොවේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 32. දේපළ, පිරියත හා උපකරණ (සබැදේ)

ඇස්තමේන්තුගත සඵල ජීව කාලයන් පහත දක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | වසරකට % | කාලසීමාව |
|---|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 2 | වසර 50 |
| බදු දේපළ වල වැඩිදියුණු කිරීම් | 25 | වසර 4 |
| මෝටර් රථ | 12.5 - 20 | වසර 5 - 8 |
| පරිඝනක දෘඩාංග | 20 | වසර 5 |
| කාර්යාල උපකරණ | 10 - 20 | වසර 5 -10 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 20 | වසර 5 |

ඉහත අනුපාතයන් සමූහයේ සියලුම සමාගම් මගින් සංගතව භාවිත කෙරේ. දේපල, පිරියත සහ උපකරණ වල එක් එක් සැලකිය යුතු කොටස් සඳහා ක්ෂයවීමේ අනුපාතයන් වෙන වෙනම නිර්ණය කෙරෙන අතර, ඒවා කළමනාකාරිත්වය අදහස් කරන පරිදි මෙහෙයවීම් සඳහා අවශ්‍ය පරිශ්‍රය සහ තත්වය තුළ භාවිතයට සුදුසු බවට පත්වූ පසු ක්ෂයවීම ආරම්භ කෙරේ. වත්කමක ක්ෂයවීම, අදාල වත්කම විකිණීම සඳහා රඳවාගත් වශයෙන් වර්ග කරන ලද දිනය සහ වත්කම හඳුනාගැනීමෙන් බැහැර කරන ලද දිනය යන දෙකෙන් කලින් එළඹෙන දිනයේදී අවසන් වේ. ක්ෂයවීමේ ක්‍රමවේදයන්, සඵල ජීව කාල සහ අවශේෂ වටිනාකම් එක් එක් වාර්තාකරන දිනයේ දී නැවත සමාලෝචනය කර අවශ්‍ය නම් ගැලපුම් සිදු කෙරේ.

**දේපළ, පිරියත හා උපකරණ වල සඵල ජීවකාලය**

සමූහය සහ සමාගම මගින් ඒවායේ ඇස්තමේන්තු ගත අවශේෂ වටිනාකම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා සරල මාර්ගික ක්‍රමවේදය භාවිතා කරමින් දේපල, පිරියත සහ උපකරණ ක්ෂය කරනු ලැබේ. සඵල ජීව කාලය මගින් , සමූහයේ දේපල, පිරියත සහ උපකරණ භාවිතයෙන් සමාගම සහ සමූහය අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට අදහස් කරන කාලසීමාව සම්බන්ධ කළමනාකාරිත්වයෙහි ඇස්තමේන්තුව නියෝජනය වේ. අවශේෂ වටිනාකම මගින් , වත්කමක් දැනටමත් එහි ජීව කාලයේ අවසානයට ළඟා වූ බවට සහ එහි සඵල ජීව කාලයේ අවසානයේ දී අපේක්ෂිත තත්ත්වයට පත්ව ඇති බවට සල්කමින්, බැහැර කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමෙන් පසු, අදාල වත්කම විකිණීමෙන් සමූහය/ සමාමම් වර්තමානයේදී ලබාගත හැකි කළමනාකාරීත්වයෙහි ඇස්තමේන්තුගත වටිනාකම් නියෝජනය වේ. අපේක්ෂිත භාවිත මට්ටමෙහි සහ තාක්ෂණික වර්ධනයන් වල වෙනස්කම් මෙකී වත්කම් වල ආර්ථික තත්වය, සඵල ජීව කාලය සහ අවශේෂ වටිනාකම් කෙරෙහි බලපෑ හැකි අතර එවිට එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගත ක්ෂය අයකිරීම වෙත බලපෑම් ඇති වෙයි.

### 32.1 දේපළ, පිරියත හා උපකරණ - සමාගම

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු.'000 | බදු දේපළ වල වැඩිදියුණු කිරීම් රු.'000 | මෝටර් රථ රු.'000 | පරිඝනක දෘඩාංග රු.'000 | කාර්යාල උපකරණ රු.'000 | ගෘහභාණ්ඩ සහ උපාංග රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 573,840 | 56,872 | 225,723 | 760,265 | 683,850 | 459,981 | 2,760,531 |
| එකතු කිරීම් | 149,702 | - | 215,101 | 122,169 | 39,451 | 8,993 | 535,416 |
| බැහැර කිරීම් | - | - | (2,020) | (7,327) | (57,335) | (28,476) | (95,158) |
| මාරු කිරීම් | - | - | - | (160) | 160 | - | - |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 723,542 | 56,872 | 438,804 | 874,947 | 666,126 | 440,498 | 3,200,789 |
| **අඩු කිරීම: සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 3,234 | 56,872 | 75,255 | 612,873 | 547,487 | 415,560 | 1,711,281 |
| වසර සඳහා අයකිරීම | 471 | - | 23,466 | 69,806 | 55,899 | 18,922 | 168,564 |
| බැහැර කිරීම් | - | - | (1,052) | (7,016) | (56,294) | (28,470) | (92,832) |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 3,705 | 56,872 | 97,669 | 675,663 | 547,092 | 406,012 | 1,787,013 |
| 2022 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 719,837 | - | 341,135 | 199,284 | 119,034 | 34,486 | 1,413,776 |

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු.'000 | බදු දේපළ වල වැඩිදියුණු කිරීම් රු.'000 | මෝටර් රථ රු.'000 | පරිගනක දෘඩාංග රු.'000 | කාර්යාල උපකරණ රු.'000 | ගෘහභාණ්ඩ සහ උපාංග රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 573,840 | 56,872 | 278,163 | 766,212 | 704,670 | 450,446 | 2,830,203 |
| එකතු කිරීම් | | - | | 33,922 | 54,104 | 16,664 | 104,690 |
| බැහැර කිරීම් | - | - | (52,440) | (39,869) | (74,924) | (7,129) | (174,362) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 573,840 | 56,872 | 225,723 | 760,265 | 683,850 | 459,981 | 2,760,531 |
| **අඩු කිරීම: සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 2,763 | 56,794 | 85,461 | 586,278 | 556,502 | 398,476 | 1,686,274 |
| වසර සඳහා අයකිරීම | 471 | 78 | 15,841 | 63,242 | 64,589 | 23,139 | 167,360 |
| බැහැර කිරීම් | - | - | (26,047) | (36,647) | (73,604) | (6,055) | (142,353) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 3,234 | 56,872 | 75,255 | 612,873 | 547,487 | 415,560 | 1,711,281 |
| 2021 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 570,606 | - | 150,468 | 147,392 | 136,363 | 44,421 | 1,049,250 |

## 32.2 දේපළ, පිරියත හා උපකරණ - සමූහය

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු.'000 | බදු දේපළ වල වැඩිදියුණු කිරීම් රු.'000 | මෝටර් රථ රු.'000 | පරිගනක දෘඩාංග රු.'000 | කාර්යාල උපකරණ රු.'000 | ගෘහභාණ්ඩ සහ උපාංග රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 3,537,387 | 58,583 | 510,821 | 879,870 | 1,006,726 | 531,985 | 6,525,372 |
| එකතු කිරීම් | 149,702 | - | 92,205 | 137,696 | 45,225 | 32,330 | 457,158 |
| බැහැර කිරීම් | - | - | (177,260) | (7,712) | (57,795) | (29,786) | (272,553) |
| මාරු කිරීම් | - | - | - | (160) | 160 | - | - |
| විනිමය අනුපාත විචල්‍ය | - | - | 6,240 | 9,363 | 4,178 | 10,109 | 29,890 |
| සාධාරණ අගය ගැළපුම | - | - | - | - | - | - | - |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 3,687,089 | 58,583 | 432,006 | 1,019,057 | 998,494 | 544,638 | 6,739,867 |
| **අඩු කිරීම: සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 381,717 | 57,349 | 175,372 | 700,009 | 709,051 | 467,609 | 2,491,107 |
| එකතු කිරීම් | 63,805 | - | 43,592 | 84,197 | 72,835 | 32,029 | 296,458 |
| බැහැර කිරීම් | - | - | (71,508) | (7,016) | (56,294) | (28,470) | (163,288) |
| මාරු කිරීම් | - | - | - | - | - | - | - |
| විනිමය අනුපාත විචල්‍ය | - | - | 1,105 | 6,210 | 9,999 | 7,594 | 24,908 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 445,522 | 57,349 | 148,561 | 783,400 | 735,591 | 478,762 | 2,649,185 |
| 2022 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 3,241,567 | 1,234 | 283,445 | 235,657 | 262,903 | 65,876 | 4,090,682 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 32. දේපළ, පිරියත හා උපකරණ (සබැඳේ)

| | සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි රු.'000 | බදු දේපළ වල වැඩිදියුණු කිරීම් රු.'000 | මෝටර් රථ රු.'000 | පරිඝනක දෘඩාංග රු.'000 | කාර්යාල උපකරණ රු.'000 | ගෘහභාණ්ඩ සහ උපාංග රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 3,226,454 | 58,583 | 693,357 | 881,755 | 999,658 | 530,039 | 6,389,846 |
| එකතු කිරීම් | - | - | 9,440 | 37,085 | 81,547 | 24,252 | 152,324 |
| බැහැර කිරීම් | (55) | - | (191,976) | (39,869) | (74,924) | (22,599) | (329,423) |
| මාරු කිරීම්/ගැළපුම් | 310,988 | - | - | - | - | - | 310,988 |
| විනිමය අනුපාත විචල්‍ය | - | - | - | 899 | 445 | 293 | 1,637 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 3,537,387 | 58,583 | 510,821 | 879,870 | 1,006,726 | 531,985 | 6,525,372 |
| **අඩු කිරීම: සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 317,912 | 57,271 | 205,642 | 658,593 | 706,349 | 445,709 | 2,391,476 |
| වසර සඳහා අයකිරීම | 63,805 | 78 | 44,373 | 74,400 | 75,807 | 33,782 | 292,245 |
| බැහැර කිරීම් | - | - | (74,643) | (33,611) | (73,604) | (11,980) | (193,838) |
| විනිමය අනුපාත විචල්‍ය | - | - | - | 627 | 499 | 98 | 1,224 |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 381,717 | 57,349 | 175,372 | 700,009 | 709,051 | 467,609 | 2,491,107 |
| 2021 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 3,155,670 | 1,234 | 335,449 | 179,861 | 297,675 | 64,376 | 4,034,265 |

### 32.3 සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනට තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණ වල මූලික පිරිවැය පහත දැක්වෙන පරිදි වේ:

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| බදු දේපළ වල වැඩිදියුණු කිරීම් | 56,872 | 53,282 | 56,872 | 53,282 |
| මෝටර් රථ | 33,013 | 37,971 | 33,013 | 37,971 |
| පරිඝනක දෘඩාංග | 489,153 | 440,942 | 548,306 | 490,175 |
| කාර්යාල උපකරණ | 359,878 | 397,383 | 395,812 | 431,165 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 76,861 | 327,178 | 89,089 | 338,727 |
| එකතුව | 1,015,777 | 1,256,756 | 1,123,092 | 1,351,320 |

### 32.4 සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි

| ස්ථානය | ලිපිනය | තක්සේරු දිනය | තක්සේරු ක්‍රමය | ඉඩම් ප්‍රමාණය (පර්චස්) | ගොඩනැගිලි අංකය | ගොඩනැගිලි ක්ෂේත්‍රය (වර්ග අඩි) | 2022 පිරිවැය රු.'000 | 2022 ප්‍රත්‍යාගණනය රු.'000 | 2021 ප්‍රත්‍යාගණනය රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී මෝටර් රථ අංගන** | | | | | | | | | |
| මාකොල | අංක 496, මාකොල උතුර, මාකොල | 31.12.2019 | MCM | 90 | 1 | 11,600 | 7,632 | 49,000 | 49,000 |
| මාබිම | 225/ඩී, නයාගල පාර, හෙයියන්තුඩුව, මාබිම | 31.12.2019 | MCM | 330.75 | 1 | 820 | 22,532 | 75,000 | 75,000 |
| මීගහමුල්ල | කන්දෙපල්ල, බෙලිගමුව, ගලේවෙල | 31.12.2019 | MCM | 260 | 1 | 1,836 | 27,558 | 24,000 | 24,000 |
| මොණරාගල | අංක 10, පොතුවිල් පාර මොණරාගල | 31.12.2019 | MCM | 125.9 | 1 | 1,376 | 46,905 | 50,000 | 50,000 |
| **පරිපාලන කාර්යය** | | | | | | | | | |
| බණ්ඩාරවෙල | අංක 35/2ඩී, වැලිමඩ පාර, බණ්ඩාරවෙල | 31.12.2019 | MCM | 8.3 | 1 | 5,194 | 31,257 | 45,000 | 45,000 |
| යාපනය | අංක 10, මහත්මා ගාන්ධි පාර, යාපනය | 31.12.2019 | MCM | 44.72 | - | - | 45,764 | 155,063 | 155,063 |
| මාතර | අංක 367, අනගාරික ධර්මපාල මාවත, මාතර | 31.12.2019 | MCM | 40 | - | - | 93,599 | 100,000 | 100,000 |
| මහනුවර | අංක 296, සේනානායක පාර, මහනුවර | 31.12.2019 | MCM | 47.1 | - | - | 142,711 | 183,700 | 183,700 |
| අනුරාධපුර | අංක 50, මෛත්‍රීපාල සේනානායක පාර, අනුරාධපුර | 31.12.2019 | MCM | 40.51 | - | - | 155,882 | 182,295 | 182,295 |
| කොළඹ | අංක 10ඩී/8 කඩුවෙල | 23.03.2021 | MCM | 94.3 | | | 149,702 | 183,885 | - |
| **උප එකතුව** | | | | | 5 | | 723,542 | 1,047,943 | 864,058 |
| **පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්** | | | | | | | | | |
| බොරැල්ල | අංක 1161, මරදාන පාර, කොළඹ 8 | 31.12.2021 | MCM | 104.9 | 2 | 127,621 | 1,532,414 | 2,650,000 | 2,500,000 |
| උප එකතුව | | | | | 2 | | 1,532,414 | 2,650,000 | 2,500,000 |
| **පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටිස් ලිමිටඩ්** | | | | | | | | | |
| කොළඹ 5* | අංක 7, හැව්ලොක් පාර, කොළඹ 5 | 31.12.2021 | MCM | 111.45 | 1 | 84,024 | 2,059,690 | 2,600,000 | 2,600,000 |
| **උප එකතුව** | | | | | 1 | | 2,059,690 | 2,600,000 | 2,600,000 |
| **එකතුව** | | | | | 8 | | 4,315,646 | 6,297,943 | 5,964,058 |

MCM : වෙළෙඳපොළ සැසඳුම් ක්‍රමය

* සමූහයේ මූල්‍ය ප්‍රකාශයන්හි රුපියල් 628,556,600 ක ඉඩම් සහ ගොඩනැගිලි පිරිවැයක් ආයෝජන දේපල වශයෙන් වර්ග කරන ලද අතර රුපියල් 1,431,133,056 ක් දේපල, පිරියත සහ උපකරණ වශයෙන් වර්ග කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 32. දේපළ, පිරියත හා උපකරණ (සබැදේ)

ඉහත ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරුව සිදුකරන ලද්දේ සමාගම සමග සම්බන්ධයක් නොමැති ස්වාධීන තක්සේරුකරුවකු වන කේ ටී ඩී තිසේරා FRICS (Eng) මහතා විසිනි. තක්සේරුව සඳහා ආයෝජන ක්‍රමවේදය, කොන්ත්‍රාත්කාර පරික්ෂා ක්‍රමවේදය සහ සැසඳුම් ක්‍රමවේදය භාවිත කෙරිණි. සමාගමෙහි සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සාධාරණ අගය ධුරාවලියේ මට්ටම (3) යටතේ සැලකිල්ලට ගැනේ.

**තාවකාලිකව භාවිතයට නොගැනෙන දේපල, පිරියත සහ උපකරණ**

2022 මාර්තු 31 සහ 2021 මාර්තු 31 දිනට සමූහයේ/ සමාගමේ කිසිදු භාවිතයට නොගැනෙන දේපල, පිරියත සහ උපකරණ නොපැවතිණි.

**සක්‍රීය භාවිතයෙන් විශ්‍රාම ගන්වන ලද දේපල, පිරියත සහ උපකරණ**

2022 මාර්තු 31 දින ට සහ 2021 මාර්තු 31 දිනට සමූහයේ/ සමාගමේ කිසිදු සක්‍රීය භාවිතයෙන් විශ්‍රාම ගන්වන ලද දේපල, පිරියත සහ උපකරණ නොපැවතිණි.

**දේපල, පිරියත සහ උප උපකරණ මත ඔප්පු සීමාවක්**

2022 මාර්තු 31 දිනට සහ 2021 මාර්තු 31 දින ට සමූහයේ/ සමාගමේ දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධ කිසිදු ඔප්පු සීමාවක් නොපැවතිණි.

**වගකීම් සඳහා සුරකුම් වශයෙන් ඇපයට තබන ලද දේපල, පිරියත සහ උපකරණ**

මූල්‍ය ප්‍රකාශයන්හි පිටු අංක 308 සටහන 54 හි (ඇපයට තබන ලද වත්කම්) හෙළිදරව් කර ඇති කරුණු හැර සමූහය/ සමාගම මගින් කිසිදු දේපල, පිරියත හා උපකරණ අයිතමයක් වගකීම් සඳහා සුරකුම් වශයෙන් ඇපයට තබා නොමැත.

**දේපල, පිරියත හා උපකරණ අයිතම සඳහා වන පාර්ශවයන්ගෙන් වන්දි**

සමූහයේ/සමාගමෙහි හානිකරනයට ලක් වූ, අහිමි වූ හෝ අත්හැර දමන ලද දේපල, පිරියත සහ උපකරණ සඳහා වසර තුළ දී තෙවන පාර්ශ්වයන්ගෙන් කිසිදු වන්දියක් නොලැබුණි. (2021: ශුන්‍ය)

**සාධාරණ අගය මැනීමේදී භාවිත කෙරෙන නිරීක්ෂණය කළ නොහැකි ආදානයන්**

සාධාරණ අගය ධුරාවලියේ මට්ටම 3 වශයෙන් වර්ග කොට ඇති මූල්‍ය නොවන වත්කම් මැනීමේ දී භාවිත කරන ලද සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි ආදානයන් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් පිටු අංක 241 සටහන 21.6 යටතේ හෙළිදරව් කොට ඇත.

## 33. භාවිතයට අයිතිය ඇති වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**SLFRS 16 - කල්බදු**

**නැවත අලුත් කිරීමේ සහ අවසන් කිරීමේ වරණයන් සහිත කල්බදු ගිවිසුම් සඳහා කල්බදු කාල සීමාව නිර්ණය කිරීම**

**(සමූහය බදු ගැනුම්කරු වශයෙන්)**

සමූහය මගින්, එය සිදුකල හැකි බව සාධාරණව නිශ්චිතව නම් කල්බදු දී දීර්ඝ කිරීමෙන් වරණයක් මගින් ආවරණය වන කවර හෝ කාලසීමාවක් හෝ එය සිදුකළ නොහැකි බව සාධාරණව නිශ්චිත නම් කල්බදු අවසන් කිරීමේ වරණයක් මගින් ආවරණය වන කවර හෝ කාල සීමාවන් ද සමගින්, කල්බදු කාල සීමාව අවලංගු කළ නොහැකි කල්බදු කොන්දේසියක් වශයෙන් නිර්ණය කරයි. ශාඛාවන්/ ප්‍රධාන කාර්ය කාර්යාලය සඳහා දීර්ඝ කිරීමේ සහ අවසන් කිරීමේ වරණයන් සහ සහිත කල්බදු ගිවිසුම් කිහිපයක් සමූහය සතු වේ. කල්බදු නැවත අලුත් කිරීම හෝ අවසන් කිරීම සම්බන්ධ වරණය භාවිතා කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් සාධාරණව නිශ්චිත ද යන්න නිර්ණය කිරීමේදී සමූහය මගින් විනිසුම යොදාගැනේ. එනම්, එමගින් නැවත අලුත් කිරීම හෝ අවසන් කිරීමේ වරණය භාවිත කිරීම සඳහා ආර්ථික දිමනාවක් නිර්මාණය කරනු ලබන සියලුම අදාළ සාධක සැලකිල්ලට ගැනේ. ආරම්භක දිනයෙන් පසු, නැවත අලුත් කිරීමේ හෝ අවසන් කිරීමේ වරණය භාවිත කිරීම හෝ නොකිරීම සඳහා සිය හැකියාව කෙරෙහි බලපාන, සිය පාලනය යටතේ පවතින සැලකිය යුතු සිදුවීමක් හෝ තත්වයන්ගේ වෙනස් වීමක් පවතීද යන්න තීරණය කිරීම සඳහා සමූහය කල්බදු කාලසීමාව ප්‍රතිඇගයුමට ලක් කරයි.( උදාහරණ - සැලකිය යුතු බදු පදනමට ගත් වැඩි දියුණු කිරීම් ඉදිකිරීම හෝ කල්බදු වත්කමෙහි සැලකිය යුතු නවීකරණය)

ඉඩම් භාවිත කිරීමේ අයිතිය අත්පත් කර ගැනීමට සඳහා පෙර දායක වූ කල් බදු කුලී සපයනු ලබන ප්‍රතිලාභ මාදිලිය අනුව කල්බදු කාල සීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ. ඉඩම් භාවිත කිරීමේ අයිතිය ඇතුළත් බදු දේපල ඉතිරි කල්බදු සීමාව පුරා සරල මාර්ගික ක්‍රමය උපයෝගී කරගනිමින් ක්‍රමක්ෂය කෙරේ.

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22 රු.'000 | 2020/21 රු.'000 | 2021/22 රු.'000 | 2020ශ21 රු.'000 |
| පිරිවැය | | | | |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 3,349,114 | 2,522,565 | 2,290,888 | 2,017,197 |
| වෙනත් වත්කමකින් මාරුකිරීම (ගෙවූ කුලී) | 52,790 | 50,600 | 52,790 | 50,600 |
| | 3,401,904 | 2,573,165 | 2,343,678 | 2,067,797 |
| එකතු කිරීම් | 239,437 | 858,510 | 238,105 | 292,305 |
| බැහැර කිරීම් | (138,773) | (69,214) | (112,147) | (69,214) |
| මාරුකිරීම් | - | (13,347) | - | - |
| මාර්තු 31 දිනට ශේෂය | 3,502,568 | 3,349,114 | 2,469,636 | 2,290,888 |
| අඩු කිරීම: සමුච්චිත ක්‍රමක්ෂය | | | | |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 1,106,670 | 583,115 | 699,591 | 377,715 |
| | 1,106,670 | 583,115 | 699,591 | 377,715 |
| ක්‍රමක්ෂය | 518,284 | 543,769 | 325,327 | 340,349 |
| කල්බදු තුළ ශුද්ධ ආයෝජන වෙත මාරුකිරීම් | - | (1,741) | - | |
| බැහැර කිරීම් | (94,766) | (18,473) | (94,766) | (18,473) |
| අපහායනය | - | - | - | - |
| මාර්තු 31 දිනට ශේෂය | 1,530,188 | 1,106,670 | 930,152 | 699,591 |
| මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 1,972,380 | 2,242,444 | 1,539,484 | 1,591,297 |

## 34. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයෙහි අස්පෘශ්‍ය වත්කම් අතරට කීර්තිනාමය සහ ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කරගන්නා ලද ගණුදෙනුකාර ලැයිස්තුව සහ මෘදුකාංග වල වටිනාකම ඇතුළත් වේ.

**හඳුනාගැනීමේ පදනම**

කිසියම් වත්කමක් වෙත ආරෝපනය කල හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය/ සමාගම වෙත ගලා ඒම සිදුවේ නම් සහ අදාළ වත්කමෙහි පිරිවැය විශ්වසනිය අයුරින් මිනුම්ගත කළ හැකි නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 - අස්පෘශ්‍ය වත්කම් යටතේ එය අස්පෘශ්‍ය වත්කමක් වශයෙන් හඳුනාගැනේ.

වෙන වෙනම අත්පත් කරගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී පිරිවැය අනුව මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, කවර හෝ සමුච්චිත ක්‍රමක්ෂය හෝ කවර හෝ සමුච්චිත අපහායනයක් ඇත්නම් අඩු කොට, පිරිවැය අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

**පසුකාලීන වියදම්**

අස්පෘශ්‍ය වත්කම් වෙත පසුකාලීනව සිදුකරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එමගින් එය ආශ්‍රිත විශේෂිත වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ නංවන ලද විට පමණි. සියලු සෙසු වියදම් දරන ලද විට වියදමක් වශයෙන් සැලකේ.

**සඵල ජීවකාල, ක්‍රමක්ෂය සහ අපහායනය**

පරිමිත හෝ අපරිමිත වශයෙන් අස්පෘශ්‍ය වත්කම් වල ප්‍රයෝජ්‍ය ජීව කාල ඇගයුමට ලක් කෙරේ.

පරිමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඵල ආර්ථික ජීව කාලය පුරා ක්‍රමක්ෂය කෙරේ. පරිමිත සඵල ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් සම්බන්ධ ක්‍රමක්ෂය කාලසීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමවේදය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනයට ලක් කෙරේ. අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීව කාලය හෝ වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත විලාශය, සුදුසු පරිදි, ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමවේදය වෙනස් කිරීමෙන් ගිණුම්ගත කෙරෙන අතර, ඒවා LKAS 8 අනුව ගිණුම්කරණ ඇස්තමේන්තු තුළ වෙනස්වීම් වශයෙන් සළකනු ලැබේ. පරිමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය වියදම අදාළ අස්පෘශ්‍ය වත්කමෙහි ක්‍රියාකාරීත්වය හා සමගාමීව ආදායම් ප්‍රකාශයෙහි වියදම් කාණ්ඩය තුළ හඳුනාගැනේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 34. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් (සබැදේ)

පහත විශේෂිතව දක්වන ලද අනුපාතයන් අනුව ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා ඒවායේ අවශේෂ වටිනාකම් වලට අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය ලියා තැබීම සඳහා සරල මාර්ගික ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂය ගණනය කෙරේ.

| වත්කම් කාණ්ඩය | වසරකට % | කාලසීමාව |
|---|---|---|
| පරිඝණක මෘදුකාංග | 20 | වසර 5 |

පරිමිත ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය නොකරන ලද ශේෂයන් වාර්ෂිකව අපහායනය සඳහා සමාලෝචනය කෙරෙන අතර අපහායනය පිළිබඳ දර්ශකයක් පවතින අවස්ථාවකදී අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ වලින් තවදුරටත් ඒවා අයකරගත නොහැකි තාක් දුරට ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

පරිපාලිතයන් අත්පත්කර ගැනීමේදී උද්ගතවන කීර්තිනාමය අස්පෘශ්‍ය  වත්කම් වල ඇතුලත් කෙරේ. කීර්තිනාමය මූලිකව පිරිවැය අනුව මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, කීර්තිනාමය සමුච්චිත අපහායන අලාභ අඩු කොට පිරිවැය අනුව මනිනු ලැබේ. ස්කන්ධ ගිණුම් ගත ආයෝජකයන් සම්බන්ධයෙන්,  කීර්තිනාමයෙහි ධාරණ වටිනාකම් ආයෝජනයෙහි ධාරණ වටිනාකම තුළ ඇතුළත් කෙරෙන අතර, කීර්තිනාමයද ඇතුළුව,  එවැනි ආයෝජනවල අපහායන අලාභය කිසිදු වත්කමක් වෙත ආරෝපණය නොකෙරේ.

අපරිමිත ජීවකාලයන් සහිත කීර්තිනාමය වාර්ෂිකව හානිකරණය සඳහා ඇගයීමට ලක් කෙර්. අපරිමිත ජීව කාලය අඛණ්ඩවම උපකාරී වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා අපරිමිත ජීව කාලයෙහි ඇගයුම වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
අස්පෘශ්‍ය වත්කමක් ඉවත් කිරීමේදී හෝ එමගින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂ නොකරනු ලබන අවස්ථාවකදී එය හඳුනාගැනීමෙන් ඉවත් කෙරේ. එබඳු අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කිරීම මගින් උද්ගත වන ලාභය හෝ අලාභය, (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කෙරෙන) අදාළ අයිතමය හඳුනාගැනීමෙන් බැහැර කරන ලද අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

| | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | පරිඝනක මෘදුකාංග රු.'000 | කීර්තිනාමය රු.'000 | එකතුව රු.'000 | පරිඝනක මෘදුකාංග රු.'000 | කීර්තිනාමය රු.'000 | එකතුව රු.'000 |
| පිරිවැය | | | | | | |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 199,853 | 308,545 | 508,398 | 233,461 | 417,099 | 650,560 |
| එකතු කිරීම් | 10,325 | - | 10,325 | 12,835 | - | 12,835 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| විනිමය අනුපාත විචලනය | - | - | - | 773 | - | 773 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 210,178 | 308,545 | 518,723 | 247,069 | 417,099 | 664,168 |
| අඩු කිරීම: සමුච්චිත ක්‍රමක්ෂය | | | | | | |
| 2021 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 175,018 | 186,934 | 361,952 | 198,120 | 186,934 | 385,054 |
| ක්‍රමක්ෂය | 13,195 | - | 13,195 | 16,879 | - | 16,879 |
| අපහායනය | - | 121,611 | 121,611 | - | 121,611 | 121,611 |
| විනිමය අනුපාත විචලනය | - | - | - | 1,021 | - | 1,021 |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 188,213 | 308,545 | 496,758 | 216,020 | 308,545 | 524,565 |
| 2022 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 21,965 | - | 21,965 | 31,049 | 108,554 | 139,603 |
| පිරිවැය | | | | | | |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 199,914 | 308,545 | 508,459 | 222,221 | 417,099 | 639,320 |
| එකතු කිරීම් | 360 | - | 360 | 11,661 | - | 11,661 |
| බැහැර කිරීම් | 421 | - | 421 | 421 | - | 421 |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 199,853 | 308,545 | 508,398 | 233,461 | 417,099 | 650,560 |
| අඩු කිරීම: සමුච්චිත ක්‍රමක්ෂය | | | | | | |
| 2020 අප්‍රියෙල් 1 දිනට ශේෂය | 163,153 | 87,725 | 250,878 | 183,021 | 87,725 | 270,746 |
| ක්‍රමක්ෂය | 11,865 | - | 11,865 | 15,099 | - | 15,099 |
| අපහායනය | - | 99,209 | 99,209 | - | 99,209 | 99,209 |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 175,018 | 186,934 | 361,952 | 198,120 | 186,934 | 385,054 |
| 2021 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 24,835 | 121,611 | 146,446 | 35,341 | 230,165 | 265,506 |

2022 මාර්තු 31 දිනට, වාර්තා කරන දිනට තවමත් භාවිතයේ පවතින, අස්පෘශ්‍ය වත්කම් සමාගම සඳහා රු. 147,975,983 වටිනාකමින් යුතු සහ සමූහය සඳහා රු.148,877,483 වටිනාකමින් යුතු පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරන ලද මෘදුකාංග වලින් සමන්විත වේ. (2021 මාර්තු 31 දිනට සමාගම සඳහා රු.139,001,271 සහ සමූහය සඳහා 139,001,271)

**කීර්තිනාමය සඳහා හඅපහායන පරීක්ෂාවන්**
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුමත කරනු ලබන අයවැය මත පදනම්ව මුදල් ප්‍රවාහ අනාවැකි භාවිත කරමින් භාවිතයේ පවතින වටිනාකම මත පදනම් සමූහය මගින් වාර්ෂිකව හානිකරණ පරීක්ෂාවක් සිදු කරනු ලැබේ. සමාගමෙහි ස්කන්ධ වල පිරිවැයෙහි ප්‍රතිශතමය සාමාන්‍යය මත පදනම්ව වට්ටම් අනුපාතය ඇස්තමේන්තු කෙරෙයි. ඒකක වල ධාරණ වටිනාකම ඒවායෙහි අයකර ගත හැකි වටිනාකම ඉක්මවා යෑම කෙරෙහි හේතු වන ආකාරයේ ප්‍රධාන උපකල්පනයන්හි සාධාරණ අයුරින් සිදුවිය හැකි වෙනසක් නොමැති බව කළමනාකාරිත්වයෙහි විශ්වාසයයි.

වාර්තාකරන දිනට සමාගමෙහි/ සමූහයෙන් අස්පෘශ්‍ය වත්කම් වල ඔප්පු මත කිසිදු සීමාවක් නොපැවතිණි. තවද, වගකීම් සඳහා සුරැකුම් වශයෙන් කිසිදු අයිතමයක් ඇපයට නොතබන ලදී. වසර 2001/22 දී අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් සඳහා කිසිදු ප්‍රාග්ධනීකරණය කරන ලද ණය ලබා ගැනීමේ පිරිවැයක් නොවීය.

## 35. බැංකු වෙත ගෙවිය යුතු

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

බැංකු වෙත ගෙවිය යුතු දෑ බැංකු අයිරා සහ බැංකු වෙතින් ලබා ගත් දිගු කාලීන සහ කෙටි කාලීන ණය වලින් සමන්විත වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, මේවා සඵල පොලී අනුපාතික ක්‍රමය භාවිත කරමින් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොලී අනුපාතිකය මනිනු ලබන්නේ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන නිකුතු හෝ පිරිවැය මත කවර හෝ වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගනිමිනි. සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයෙහි පොලී වියදම් යටතේ හඳුනාගැනේ. සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය ඔස්සේ මෙන්ම වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

2021/22 හෝ 2020/21 දී සමාගම, බැංකු වලට ගෙවිය යුතු දෑ සම්බන්ධයෙන් මූලික මුදල, පොලිය හෝ වෙනත් පැහැර හැරීම් කිසිවක් සිදුකොට නැත.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| බැංකු අයිරා | 69,690 | 716,374 | 1,325,500 | 891,879 |
| කෙටි කාලීන ණය | - | - | 796,993 | 105,449 |
| දිගු කාලීන ණය | 6,432,218 | - | 7,930,444 | 2,283,609 |
| වත්කම් පිටුබලය සහිත සුරැකුම්පත් | 5,247,424 | 5,722,936 | 5,247,424 | 5,722,936 |
| එකතුව | 11,749,332 | 6,439,310 | 15,300,361 | 9,003,873 |
| සාධාරණ අගය | 11,750,052 | 6,936,408 | 15,389,574 | 9,739,721 |

## 35.1 බැංකු වෙත ගෙවිය යුතු දේ හි වෙනස්වීම

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 5,722,936 | 7,938,185 | 8,111,994 | 10,978,046 |
| වසර තුළදී ණයට ලබාගත් ප්‍රමාණය | 7,000,000 | 1,000,000 | 7,250,000 | 1,500,000 |
| වසර තුළදී ආපසු ගෙවීම් | (1,946,889) | (3,886,355) | (2,504,664) | (5,315,691) |
| වසර තුළදී පොලී වියදම් | 903,595 | 671,106 | 1,117,531 | 949,639 |
| උප එකතුව | 11,679,642 | 5,722,936 | 13,974,861 | 8,111,994 |
| අයිරා | 69,690 | 716,374 | 1,325,500 | 891,879 |
| මාර්තු 31 දිනට ශේෂය | 11,749,332 | 6,439,310 | 15,300,361 | 9,003,873 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 35. බැංකු වෙත ගෙවිය යුතු දේ (සබැදේ)
### 35.2 දිගු කාලීන ණය තොරතුරු

| ණයකරුගේ නම | පිරිනමන ලද දිනය | පහසුකමෙහි වටිනාකම රු.'000 | කාලසීමාව | පොලී අනුපාතය | ඇප තත්ත්වය |
|---|---|---|---|---|---|
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 14.07.2015 | 2,000,000 | වසර 4 | 7.25% - 10.5% | සුරකුම්ලත් |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 08.09.2016 | 1,000,000 | වසර 4 | 14.00% | සුරකුම්ලත් |
| සම්පත් බැංකුව පීඑල්සී | 31.12.2014 | 2,000,000 | වසර 5 | 7.00% - 8.5% | සුරකුම්ලත් |
| ඇක්සිස් බැන්ක් | 27.03.2017 | 150,000 | වසර 4 | AWPLR+1.25% | සුරකුම්ලත් |
| ඇක්සිස් බැන්ක් | 27.03.2017 | 250,000 | වසර 4 | AWPLR+1.25% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 26.05.2015 | 4,250,000 | වසර 4 | 8.50% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 27.11.2015 | 2,000,000 | වසර 4 | 10.00% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 15.03.2016 | 2,000,000 | වසර 4 | AWPLR+1.75% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 02.06.2016 | 2,500,000 | වසර 4 | 06 month SLIBOR+1.75% | සුරකුම්ලත් |
| ලංකා බැංකුව | 07.07.2016 | 3,000,000 | වසර 4 | 11.50% | සුරකුම්ලත් |
| ආර්එච්බී බැංකුව | 27.04.2017 | 5,355,000 | වසර 3 | 13.50% | සුරකුම්ලත් |
| එම්සීබී බැංකුව | 26.09.2017 | 500,000 | වසර 4 | AWPLR+1.5% | සුරකුම්ලත් |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 11.11.2021 | 3,000,000 | වසර 3 | 9.25% | සුරකුම්ලත් |
| හැටන් නැෂනල් බැංකුව පීඑල්සී | 16.11.2021 | 4,000,000 | වසර 3 | AWPLR + 0.5% | සුරකුම්ලත් |

**වත්කම් පිටුබලැති සුරකුම්**

| ණයකරුගේ නම | පිරිනමන ලද දිනය | පහසුකමෙහි වටිනාකම රු.'000 | කාලසීමාව | පොලී අනුපාතය | ඇප තත්ත්වය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 30.09.2016 | 2,146,200 | වසර 4 | 13.81% | සුරකුම්ලත් |
| ඩොයිෂ් බැන්ක් පීඑල්සී | 03.07.2015 | 3,000,000 | වසර 4 | 8.82% | සුරකුම්ලත් |
| ඩොයිෂ් බැන්ක් පීඑල්සී | 28.10.2016 | 1,769,900 | වසර 4 | 14.47% | සුරකුම්ලත් |
| ඩොයිෂ් බැන්ක් පීඑල්සී | 25.02.2016 | 4,250,700 | වසර 4 | 11.75% | සුරකුම්ලත් |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | 29.06.2018 | 2,000,000 | වසර 5 | 12.27% | සුරකුම්ලත් |
| හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | 13.03.2019 | 2,000,000 | වසර 5 | 13.08% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 18.08.2016 | 3,000,000 | වසර 4 | 13.32% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 09.02.2018 | 1,000,000 | වසර 2 | 11.71% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 10.09.2018 | 2,000,000 | වසර 2 | 13.15% | සුරකුම්ලත් |
| මහජන බැංකුව | 23.05.2019 | 1,000,000 | වසර 3 | 11.16% | සුරකුම්ලත් |

* එක් එක් සුරක්ෂිතකරණයෙහි පොලී අනුපාතය බරතබන ලද සාමාන්‍යය පොලී අනුපාතය වශයෙන් දක්වා ඇත.

ඇප පිළිබඳ විස්තර සටහන 54 පිටු අංක 308 - මූල්‍ය ප්‍රකාශයන්හි ඇපයට තබන ලද වත්කම් යටතේ ඉදිරිපත් කෙරේ

### 35.3 ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය
#### 35.3.1. බැංකු වෙත ගෙවිය යුතු අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමාගම

| 2022 මාර්තු 31 දිනට | වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| අයිරා | 69,690 | - | - | 69,690 |
| දිගු කාලීන ණය | 2,353,092 | 4,079,126 | - | 6,432,218 |
| වත්කම් පිටුබලැති සුරකුම් | 3,111,337 | 2,136,087 | - | 5,247,424 |
| එකතුව | 5,534,119 | 6,215,213 | - | 11,749,332 |

| 2021 මාර්තු 31 දිනට | වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| අයිරා | 716,374 | - | - | 716,374 |
| වත්කම් පිටුබලැති සුරැකුම් | 2,249,108 | 3,473,828 | - | 5,722,936 |
| එකතුව | 2,965,482 | 3,473,828 | - | 6,439,310 |

### 35.3.2 බැංකු වෙත ගෙවිය යුතු අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමූහය

| 2022 මාර්තු 31 දිනට | වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| අයිරා | 1,325,500 | - | - | 1,325,500 |
| කෙටිකාලීන ණය | 796,993 | - | - | 796,993 |
| දිගු කාලීන ණය | 3,113,993 | 4,816,451 | - | 7,930,444 |
| වත්කම් පිටුබලැති සුරැකුම් | 3,111,337 | 2,136,087 | - | 5,247,424 |
| එකතුව | 8,347,823 | 6,952,538 | - | 15,300,361 |

| 2021 මාර්තු 31 දිනට | වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| අයිරා | 891,879 | - | - | 891,879 |
| කෙටිකාලීන ණය | 105,449 | - | - | 105,449 |
| දිගු කාලීන ණය | 936,819 | 1,346,790 | - | 2,283,609 |
| වත්කම් පිටුබලැති සුරැකුම් | 2,249,108 | 3,473,828 | - | 5,722,936 |
| එකතුව | 4,183,255 | 4,820,618 | - | 9,003,873 |

## 36. ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දේ අතරට ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් පසු, මේවා සඵල පොලී අනුපාතිකය කරමින් භාවිත කරමින් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොලී අනුපාතිකය මනිනු ලබන්නේ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන නිකුතු හෝ පිරිවැය මත කවර හෝ වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයෙහි පොලී වියදම් යටතේ ඇතුලත් කෙරේ. වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේ දී ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දේ වෙත තැන්පතු වලට එරෙහිව ඇප වශයෙන් රඳවාගත් රුපියල් බිලියන 8.0 ක් ඇතුළත් වේ. (2020/21 - රුපියල් බිලියන 8.1)

2010 මූල්‍ය සමාගම් (තැන්පතු වගකීම් රක්ෂණය කිරීම්) නියෝග අංක 2 ප්‍රකාරව ගණුදෙනුකරුවන්ගේ අයිතිය සහ විශ්වාසය සුරක්ෂිත කිරීමේ ආරක්ෂණ ශුද්ධ පියවරක් වශයෙන් සියලුම සුදුසුකම්ලත් තැන්පතු වගකීම් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා සහායක සැලසුම යටතේ රක්ෂණය කොට ඇත. වසර තුළ දී සමාගම මඟින් ඉහත රක්ෂණ සැලසුමෙහි වාරිකය වශයෙන් රුපියල් මිලියන 148.67 ගෙවා ඇත. ( (2020/21 - රුපියල් මිලියන 151.87)

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 36. ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු (සබැඳේ)

| මාර්තු 31 දිනට | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 95,145,802 | 92,999,765 | 103,375,767 | 95,378,121 |
| ඉතුරුම් තැන්පතු | 8,222,102 | 8,503,166 | 8,077,983 | 8,365,595 |
| එකතුව | 103,367,904 | 101,502,931 | 111,453,750 | 103,743,716 |
| සාධාරණ අගය | 102,854,237 | 102,019,672 | 110,876,896 | 104,256,546 |

## 36.1 ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමාගම

| මාර්තු 31 දිනට | 2022 වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 78,112,290 | 17,033,512 | - | 95,145,802 |
| ඉතුරුම් තැන්පතු | 7,973,377 | 75,044 | 173,681 | 8,222,102 |
| එකතුව | 86,085,667 | 17,108,556 | 173,681 | 103,367,904 |

| මාර්තු 31 දිනට | 2021 වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 74,108,732 | 18,891,033 | - | 92,999,765 |
| ඉතුරුම් තැන්පතු | 8,288,671 | 50,466 | 164,029 | 8,503,166 |
| එකතුව | 82,397,403 | 18,941,499 | 164,029 | 101,502,931 |

## 36.2 ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමූහය

| මාර්තු 31 දිනට | 2022 වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 86,149,370 | 17,226,397 | - | 103,375,767 |
| ඉතුරුම් තැන්පතු | 7,829,258 | 75,044 | 173,681 | 8,077,983 |
| එකතුව | 93,978,628 | 17,301,441 | 173,681 | 111,453,750 |

| මාර්තු 31 දිනට | 2021 වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 76,487,088 | 18,891,033 | - | 95,378,121 |
| ඉතුරුම් තැන්පතු | 8,151,100 | 50,466 | 164,029 | 8,365,595 |
| එකතුව | 84,638,188 | 18,941,499 | 164,029 | 103,743,716 |

## 37. නිකුත් කරන ලද ණය සුරැකුම්පත්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

ණය සුරැකුම් මගින් සමාගම හා සමූහය විසින් කෙටි කාලීන ද්‍රවශීලතා අරමුදල් අවශ්‍යතා වෙනුවෙන් ණයට ගනු ලබන අරමුදල් නියෝජනය වේ. මූලික හඳුනාගැනීමෙන් පසු, මේවා සඵල පොලී අනුපාතිකය කරමින් භාවිත කරමින් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. සඵල පොලී අනුපාතිකය මනිනු ලබන්නේ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන නිකුතු හෝ පිරිවැය මත කවර හෝ වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමිනි. සඵල පොලී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයෙහි පොලී වියදම් යටතේ ඇතුලත් කෙරේ. වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේ දී ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 |
| ලැයිස්තුගත ණයකර | 17,244,313 | 13,825,553 | 17,103,223 | 13,684,516 |
| එකතුව | 17,244,313 | 13,825,553 | 17,103,223 | 13,684,516 |
| සාධාරණ අගය | 16,266,084 | 14,675,439 | 16,124,318 | 14,522,493 |

### 37.1 නිකුත් කරන ලද ණය සුරැකුම් වල වෙනස්වීම

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 |
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 13,825,553 | 18,479,260 | 13,684,516 | 18,338,039 |
| වසර තුළදී ණයට ගත් අගය | 10,000,000 | - | 10,000,000 | - |
| නිකුත් කරන ලද ණය සුරැකුම් වල මුදාහැරීම | (6,798,610) | (4,500,657) | (6,798,610) | (4,500,657) |
| නිකුත් කරන ලද ණය සුරැකුම් මත පොලී වියදම් | 1,875,532 | 1,935,761 | 1,859,429 | 1,916,991 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් මත ගෙවන ලද පොලිය | (1,658,162) | (2,088,811) | (1,642,112) | (2,069,857) |
| මාර්තු 31 දිනට ශේෂය | 17,244,313 | 13,825,553 | 17,103,223 | 13,684,516 |

### 37.2 ලැයිස්තුගත ණයකර

| නිකුත් කරන ලද දිනය | කල්පිරීමේ දිනය | මුහුණත අගය රු.'000 | පොලී අනුපාතය | ආපසු ගෙවීමේ කාලසීමාව | වර්ගය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ට, සුරැකුම් නොකල, නිදහස් කල හැකි, AA(-) ශ්‍රේණිගත | | | | | | | | | |
| 16-නොවැ-2016 | 16-නොවැ-2021 | 6,798,610 | 12.60% | අර්ධ වාර්ෂිකව | වර්ගය C | - | 7,108,347 | - | 7,108,347 |
| 18-අප්‍රි-2018 | 18-අප්‍රි-2022 | 704,600 | 12.40% | වාර්ෂිකව | වර්ගය A | 785,163 | 784,097 | 785,163 | 784,097 |
| 18-අප්‍රි-2018 | 18-අප්‍රි-2023 | 5,295,400 | 12.80% | වාර්ෂිකව | වර්ගය B | 5,941,109 | 5,933,109 | 5,800,019 | 5,792,072 |
| 5-අගෝ-2021 | 5-අගෝ-2024 | 2,942,940 | 8.00% | වාර්ෂිකව | වර්ගය A | 3,087,136 | - | 3,087,136 | - |
| 5-අගෝ-2021 | 5-අගෝ-2024 | 2,419,929 | 8.00% | කල්පිරීමේදී | වර්ගය B | 2,538,385 | - | 2,538,385 | - |
| 5-අගෝ-2021 | 5-අගෝ-2026 | 4,272,360 | 9.00% | වාර්ෂිකව | වර්ගය C | 4,507,686 | - | 4,507,686 | - |
| 5-අගෝ-2021 | 5-අගෝ-2026 | 364,766 | 9.00% | කල්පිරීමේදී | වර්ගය D | 384,834 | - | 384,834 | - |
| | | 29,999,995 | | | | 17,244,313 | 13,825,553 | 17,103,223 | 13,684,516 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 37. නිකුත් කරන ලද ණය සුරැකුම්පත් (සබැඳේ)

### 37.2.1 ප්‍රාග්ධන වෙළඳපොල ඔස්සේ උපයන ලද අරමුදල් භාවිතය

| සංස්ථා ප්‍රකාශය අනුව අරමුණ | සංස්ථා ප්‍රකාශය අනුව වෙන්කරන ලද වටිනාකම රු. .000 වලින් | සංස්ථා ප්‍රකාශය අනුව භාවිත කිරීමට යෝජිත දිනය | ආදායමෙන් වෙන්කරන ලද වටිනාකම රු. .000 වලින් (A) | සම්පූර්ණ ආදායමෙහි % | භාවිත කරන ලද වටිනාකම් රු. .000 වලින් (B) | වෙන්කිරීමට සාපේක්ෂව භාවිත කරන ලද% (B/A) | අරමුදල් අයෝජනය කල ස්ථානය ඇතුලුව සම්පූර්ණයෙන් භාවිත නොකලේ නම් පැහැදිලි කිරීම |
|---|---|---|---|---|---|---|---|
| **වසර 2015/2016 දී ලැයිස්තුගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| පීපල්ස් ලීසිං සමාගමෙහි මධ්‍ය හා දිගු කාලීන ණය ලබාදීම් වෙත ගැලපීම සඳහා සහ පොලී අනුපාත අවදානම අවම කිරීම සඳහා මෙම ණයකර නිකුතුව ඔස්සේ උපයන ලද අරමුදල් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යකරණය සඳහා යොදා ගනු ඇත | 6,000,000 | වෙන්කරන ලද දිනයේ සිට එළඹෙන මාස 12 ඇතුළත | 6,000,000 | 100 | 6,000,000 | 100 | N/A |
| **වසර 2016/17 දී ලැයිස්තුගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| මෙම ණයකර නිකුතුව ඔස්සේ උපයාගත් අරමුදල් අයවැය සැලසුම් ගත ණය ලබාදීමේ කළඹ සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යකරණය සඳහා යොදා ගනු ඇත. | 8,000,000 | වෙන්කරන ලද දිනයේ සිට එළඹෙන මාස 12 ඇතුළත | 8,000,000 | 100 | 8,000,000 | 100 | N/A |
| **වසර 2018/19 දී ලැයිස්තුගත, ජ්‍යෙෂ්ට, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| මෙම ණයකර නිකුතුව ඔස්සේ උපයාගත් අරමුදල් 2018 මාර්තු 26 වැනි දින කල්පිරුණු ණයකර පියවීම සඳහා ලබාගත් කෙටි කෙටිකාලීන ණය පහසුකම් ආපසු ගෙවීම් සහ සමාගමෙහි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා යොදාගනු ඇත | 6,000,000 | වෙන්කරන ලද දිනයේ සිට එළඹෙන මාස 12 ඇතුළත | 6,000,000 | 100 | 6,000,000 | 100 | N/A |
| **වසර 2021/22 දී ලැයිස්තුගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් නොලත්, නිදහස් කළ හැකි, ශ්‍රේණිගත ණයකර නිකුතුව** | | | | | | | |
| මෙම ණයකර නිකුතුව ඔස්සේ උපයාගත් අරමුදල් සමාගමෙහි ණය ලබාදීමේ කළඹ ව්‍යාප්ත කිරීම සඳහා යොදා ගනු ඇත. | 10,000,000 | වෙන්කරන ලද දිනයේ සිට එළඹෙන මාස 06 ඇතුළත | 10,000,000 | 100 | 10,000,000 | 100 | N/A |

### නිකුත් කරන ලද ණය සුරැකුම් වල අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමාගම

| මාර්තු 31 දිනට | 2022 | | | |
|---|---|---|---|---|
| | වසරක් තුළ රු.'000 | වසර 1-5 රු.'000 | වසර 5 ට වැඩි රු.'000 | එකතුව රු.'000 |
| ලැයිස්තුගත ණයකර | 1,977,853 | 15,266,460 | - | 17,244,313 |
| එකතුව | 1,977,853 | 15,266,460 | - | 17,244,313 |

| මාර්තු 31 දිනට | 2021 | | | |
|---|---|---|---|---|
| | වසරක් තුළ<br>රු.'000 | වසර 1-5<br>රු.'000 | වසර 5 ට වැඩි<br>රු.'000 | එකතුව<br>රු.'000 |
| ලැයිස්තුගත ණයකර | 7,835,316 | 5,990,237 | - | 13,825,553 |
| එකතුව | 7,835,316 | 5,990,237 | - | 13,825,553 |

නිකුත් කරන ලද ණය සුරැකුම් වල අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශ්ලේෂණය - සමූහය

| මාර්තු 31 දිනට | 2022 | | | |
|---|---|---|---|---|
| | වසරක් තුළ<br>රු.'000 | වසර 1-5<br>රු.'000 | වසර 5 ට වැඩි<br>රු.'000 | එකතුව<br>රු.'000 |
| ලැයිස්තුගත ණයකර | 1,962,543 | 15,140,680 | - | 17,103,223 |
| එකතුව | 1,962,543 | 15,140,680 | - | 17,103,223 |

| මාර්තු 31 දිනට | 2021 | | | |
|---|---|---|---|---|
| | වසරක් තුළ<br>රු.'000 | වසර 1-5<br>රු.'000 | වසර 5 ට වැඩි<br>රු.'000 | එකතුව<br>රු.'000 |
| ලැයිස්තුගත ණයකර | 7,820,059 | 5,864,457 | - | 13,684,516 |
| එකතුව | 7,820,059 | 5,864,457 | - | 13,684,516 |

## 38. වෙනත් මූල්‍ය වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

වෙනත් මූල්‍ය වගකීම් සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු දෑ, ගෙවිය යුතු රක්ෂණ, ගෙවිය යුතු ලාභාංශ සහ වෙනත් ගෙවිය යුතු දෑ වලින් සමන්විත වේ. මෙකී වගකීම් පොලී නොදරන අතර වාර්තා කරන දිනයේ දී ගෙවිය යුතුය යැයි අපේක්ෂිත වටිනාකම් අනුව වාර්තා කෙරේ.

සියලුම වෙනත් මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගැනෙන අතර ඉන් අනතුරුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ.

**සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු වටිනාකම්**

සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු වටිනාකම් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී මෝටර් රථ සපයනු ලබන්නන් වෙත ගෙවීමට ඇති බැඳීමෙන් සමන්විත වේ.

**ගෙවිය යුතු රක්ෂණ**

ගෙවිය යුතු රක්ෂණ මෝටර් රථ සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් වෙත ගෙවිය යුතු වාරික වටිනාකමින් සමන්විත වේ.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 |
| සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු වටිනාකම | 2,181,519 | 2,923,794 | 2,243,619 | 2,981,030 |
| ගෙවිය යුතු රක්ෂණ | 609,130 | 619,168 | - | - |
| වෙනත් ගෙවිය යුතු දේ | 845,879 | 589,148 | 1,799,703 | 1,130,205 |
| එකතුව | 3,636,528 | 4,132,110 | 4,043,322 | 4,111,235 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 39. රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**ශුද්ධ නොඉපැයූ වාරිකය සඳහා වෙන්කිරීම**

ශුද්ධ නොඉපැයූ වාරිකය සඳහා වෙන්කිරීම මගින් තවමත් කල් ඉකුත් නොවූ අවදානම් සඳහා ලද වාරික නියෝජනය වේ. සාමාන්‍යයෙන්, මෙම සංචිතය ගිවිසුම් කාලසීමාව පුරා උපලබ්ධි කෙරෙන අතර වාරික ආදායම වශයෙන් හඳුනාගැනේ. එක් එක් වාර්තාකරණ දිනයේදී, සමූහය මගින් ස්වකීය කල් ඉකුත් නොවූ අවදානම විමර්ශනයට ලක් කරනු ලබන අතර අපේක්ෂිත හිමිකම්පෑම් වල කවර හෝ සමස්ත අතිරික්තයක් ඇතිද සහ නොඉපැයූ වාරික මත විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය පවතීද යන්න නිර්ණය කිරීම සඳහා වගකීම් ප්‍රමාණවත්භාව පරීක්ෂාවක් සිදු කෙරේ. සාමාන්‍ය රක්ෂණ තාක්ෂණික වෙන්කිරීම් වලට සම්බන්ධ, වත්කම් මත උද්ගත වේ යැයි අපේක්ෂිත ආයෝජන ආදායමක් ගණන් ගැනීමෙන් අනතුරුව අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රවර්තන ඇස්තමේන්තු යොදා ගනිමින් මෙම ගණනය සිදුකෙරේ. මෙම ඇස්තමේන්තු මගින් නොඉපැයූ වාරික වල ධාරණ අගය ප්‍රමාණවත් නොවන බව දැක්වුණහොත්, වගකීම් ප්‍රමාණවත්භාවය සඳහා වෙන්කිරීමක් සකසමින් ඌණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

SLFRS 4 - රක්ෂණ ගිවිසුම්හි අවශ්‍යතාවය පරිදි, බාහිර ආයුගණකවරයාගේ සහයෝගයෙන් යුතුව සමූහය මගින් සාමාන්‍ය ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණවත්භාව පරීක්ෂාවක් සිදුකෙරේ.

**දළ හිඟ හිමිකම්පෑම් සඳහා වෙන්කිරීම්**

සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් ගත වගකීම්, අදාළ ගිවිසුමට එළඹුනු විට සහ වාරික අය කරගත්විට හඳුනාගැනේ. මෙම වගකීම්, ආශ්‍රිත හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පිරිවැය සහ අවශේෂයන් හා වෙනත් පියවීම් වල අපේක්ෂිත වටිනාකම අඩුකිරීමෙන් පසු, වාර්තාගත ගත කරනු ලැබුවද නොලැබුවද, වාර්තාකරන දිනයේදී දරණ ලද නමුත් නොපියවන ලද සියළු හිමිකම්පෑම් සම්බන්ධ ඇස්තමේන්තු ගත අවසාන පිරිවැය මත පදනම් වූ, හිඟ හිමිකම්පෑම් වෙන්කිරීම වශයෙන් හැඳින්වේ.

වගකීම මුදලෙහි කාල වටිනාකමට වට්ටම් නොකෙරේ. මෙහිදී කිසිදු සමකරණය සඳහා වෙන්කිරීමක් හෝ ආපදා සංචිත හඳුනා නොගැනේ. ගිවිසුම කල් ඉකුත් වූවිට, ඉටුකරන ලද විට හෝ අවලංගු කරන ලද විට වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

**දරන ලද නමුත් වාර්තා නොකළ දළ හිමිකම්පෑම් සඳහා වෙන්කිරීම්**

ඇතැම් හිමිකම්පෑම් කාණ්ඩයන් දැනුම්දීමේදී හා පියවීමේදී ප්‍රමාදවීම් සිදුවිය හැකි අතර, එමනිසා මේවායේ අවසන් පිරිවැය ස්ථිර වශයෙන් වාර්තා කරන දිනයේදී දැනගත නොහැකි වේ. හානිකර අපගමනය සඳහා වන තීරුවක්ද ඇතුළත් විය හැකි වර්තමාන උපකල්පන සහ ආනුභූතික දත්ත මත පදනම්ව, සම්මත ආයු ගණන හිමිකම්පෑම් අනාවැකි ශිල්පක්‍රම රැසක් යොදාගනිමින් වාර්තා කරන දිනයේදී වගකීම ගණනය කෙරේ.

සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් සඳහා වාර්තා කරන දිනයේදී වාර්තාවූ හිමිකම්පෑම් වල අපේක්ෂිත අවසාන පිරිවැය සඳහා සහ වාර්තාකරණ දිනට දරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) හිමිකම්පෑම් වල අපේක්ෂිත අවසාන පිරිවැය යන කරුණු ද්විත්වය සම්බන්ධයෙන්ම ඇස්තමේන්තු සකස් කළයුතු වේ. නිශ්චිතව අවසාන හිමිකම්පෑම් පිරිවැය ස්ථාපනය කිරීමට පෙර සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ගතවිය හැකි අතර, ඇතැම් කාණ්ඩ වල රක්ෂණවරයන් සඳහා, IBNR හිමිකම්පෑම් මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි දැක්වෙන වගකීමෙහි බහුතර කොටස සකසනු ලබයි.

හිඟ හිමිකම්පෑම් වල අවසාන පිරිවැය, "චේන් ලැඩර්" ක්‍රමය, "බෝන්හුටර්-ෆර්ගයුසන්" ක්‍රමය සහ සංඛ්‍යාතය/ප්‍රබලත්වය ක්‍රමවේදය වැනි, සම්මත ආයුගණන හිමිකම්පෑම් ප්‍රක්ෂේපණ ශිල්පක්‍රම රැසක් යොදාගනිමින් ඇස්තමේන්තු ගත කෙරේ.

මෙම ශිල්පක්‍රම කෙරෙහි පාදක වන ප්‍රධාන උපකල්පනය වනුයේ සමාගමක අතීත හිමිකම්පෑම් වර්ධන අත්දැකීම අනාගත හිමිකම්පෑම් වර්ධනය ප්‍රක්ෂේපණය කිරීම සඳහා සහ එමගින් අවසාන හිමිකම්පෑම් පිරිවැය හඳුනාගැනීම සඳහා යොදාගත හැකි බවය. ඒ අයුරින්, මෙම ක්‍රමවේදයන් මගින් ගෙවන ලද සහ දරණ ලද අලාභ වර්ධනයන්, පසුගිය වසර වල නිරීක්ෂණය කරන ලද වර්ධනයන් සහ අපේක්ෂිත අලාභ අනුපාතිකයන් මත පදනම්ව හිමිකමක් සහ හිමිකම් සංඛ්‍යාවක් සඳහා සාමාන්‍යය පිරිවැය තක්සේරු කෙරේ. ඓතිහාසික හිමිකම්පෑම් වර්ධනයන් ප්‍රධාන වශයෙන් හදිසි අනතුරු වසර ආශ්‍රයෙන් විශ්ලේෂණය කෙරෙන නමුත් භූගෝලීය ප්‍රදේශය විශ්ලේෂණය කරමින් මෙන්ම සැලකිය යුතු ව්‍යාපාර කාණ්ඩයන් සහ හිමිකම්පෑම් කාණ්ඩයන් ඔස්සේද විශ්ලේෂණය කළ හැකි වේ. බොහෝ අවස්ථාවන් වලදී හිමිකම්පෑම් උද්ධමනය හෝ අලාභ අනුපාතිකයන්හි අනාගත අනුපාතිකයන් සම්බන්ධයෙන් පැහැදිලි උපකල්පන සිදුනොකෙරේ. ඒ වෙනුවට, භාවිත කරනු ලබන උප කල්පනයන්, ප්‍රක්ෂේපනයන් පදනම් වන ඓතිහාසික හිමිකම්පෑම් වර්ධන දත්තයන් තුළ පවතින ඒවා වේ.

පවතින සියළුම අවිනිශ්චිතතාවන් සැලකිල්ලට ගනිමින්, ප්‍රතිඵල පරාසයක් තුළින් සිදුවිය හැකි ප්‍රතිඵල ඉදිරිපත්කරනු ලබන හිමිකම්පෑම්වල ඇස්තමේන්තුගත අවසන් පිරිවැය හඳුනාගැනීම සඳහා අතීත ප්‍රවණතා අනාගතයේදී අදාළ නොවුනු ඇති තාක් දුරට තක්සේරු කිරීම සඳහා (උදාහරණයක් වශයෙන් එක්වරක් සිදුවන සිදුවීම්, හිමිකම්පෑම කෙරෙහි ජනතා ආකල්පය වැනි බාහිර සහ වෙළඳපොල සාධකයන්හි වෙනස්වීම්, ආර්ථික තත්ත්වයන්, හිමිකම්පෑම් උද්ධමන මට්ටම්, අධිකරණ තීන්දු හා ව්‍යවස්ථා, මෙන්ම කළඹ මිශ්‍රය වැනි රක්ෂණ සැගසුම් විශේෂාංග සහ හිමිකම්පෑම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාදාමයන් ආදිද පිළිබිඹු වන පරිදි) අමතර ගුණාත්මක විනිසුම
යොදාගැනේ.

නොඉපැයූ වාරික සඳහා වෙන්කිරීම් වල ප්‍රමාණාවත්භාවය තක්සේරුකරණයේදී ද සමාන ආකාරයේ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදාගැනේ.

**රක්ෂණ ගිවිසුම් වගකීම්**

**සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම්**

ගිවිසුම් වෙත එළඹීමේදී සහ වාරික අයකිරීමේදී සාමාන්‍ය රක්ෂණ වගකීම් හඳුනාගැනේ. මෙකී වගකීම් හිඟ හිමිකම්පෑම් ප්‍රතිපාදන වශයෙන් දක්වෙන අතර, ඒවා ආශ්‍රිත හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පිරිවැය සහ අබලි ද්‍රව්‍ය සහ වෙනත් පියවාගැනීම් වල අපේක්ෂිත පිරිවැය අඩු කිරීමෙන් අනතුරුව, වාර්තාගත වුවද නොවුවද, වාර්තාකරණ දිනට දරන ලද නමුත් නොපියවන ලද සියලු හිමිකම්පෑම් වල ඇස්තමේන්තුගත පරම පිරිවැය මත පදනම් වේ. ඇතැම් කාණ්ඩයන්හි හිමිකම්පෑම් සම්බන්ධ දැනුම්දීමේ සහ පියවීමේ ප්‍රමාදයන් සිදුවිය හැකි අතර, එමනිසා මේවායේ පරම පිරිවැය වාර්තාකරණ දිනට නිශ්චිතව දැනගත නොහැකි වේ. වාර්තාකරණ දිනට වගකීම පුලුල් පරාසයක පැතිරුනු සම්මත ආයුගණන පුරෝකථන ශිල්පක්‍රම භාවිතයෙන් ගණනය කෙරේ. වගකීම මුදලෙහි කාල වටිනාකම සඳහා වට්ටම්ගත නොකෙරේ. සමානිකරණය සඳහා ප්‍රතිපාදන හෝ ආපදාමය සංචිත හඳුනානොගැනේ. ගිවිසුම කල් ඉකුත් වූ පසු, වගකීම් ඉටු කලපසු හෝ අවලංගු වූ පසු වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

නොඉපැයූ වාරිකය සඳහා වන ප්‍රතිපාදනය මගින් තවමත් කල් ඉකුත් නොවූ අවදානම් සඳහා ලද වාරික නියෝජනය වේ. සාමාන්‍යයෙන්, ගිවිසුම් කාලසීමාව පුරා සංචිතය මුදාහැරෙන අතර එය වාරික ආදායම වශයෙන් හඳුනාගැනේ. එක් එක් වාර්තාකරණ දිනයේදී සමූහය මගින් සිය කල් ඉකුත් නොවූ අවදානම සමාලෝචනය කෙරෙන අතර, නොඉපැයූ වාරිකය සම්බන්ධ විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය සහ අපේක්ෂිත හිමිකම්පෑම් සම්බන්ධ කිසියම් සමස්ත අතිරික්තයකි පවතීද යන්න නිර්ණය කිරීම සඳහා වගකීම් ප්‍රමාණවත්තා පරික්ෂාවක් සිදුකරනු ලැබේ. මෙම ගණනය කිරීම සඳහා, අදාළ සාමාන්‍ය රක්ෂණ තාක්ෂණික ප්‍රතිපාදන සම්බන්ධ වත්කම් මත උද්ගත වේයැයි අපේක්ෂිත ආයෝජන ආදායම සැළකිල්ලට ගැනීමෙන් අනතුරුව අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ වල වර්තමාන ඇස්තමේන්තු යොදා ගැනේ. මෙකී ඇස්තමේන්තු මගින් නොඉපැයූ වාරිකයේ ධාරණ අගය ප්‍රමාණවත් නොවන බව නිරූපනය වුවහොත්, අදාළ හිඟය වගකීම් ප්‍රමාණවත්තා ප්‍රතිපාදනයක් සකසමින් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ.
ගෙවිය යුතු රක්ෂණ හඳුනාගැනීමෙන් බැහැර කිරීම

වගකීම ඉටු කිරීමෙන්, අවලංගු වීමෙන් හෝ කල් ඉකුත් වීමෙන් අනතුරුව ගෙවිය යුතු රක්ෂණ හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

**කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය**

වාරික වගකීම ගණනය කිරීම සඳහා, සැළකිය යුතු කළමනාකාරිත්ව විනිසුමක් මත පදනම්ව විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය අඩු කොට සමාගම මගින් රඳවාගන්නා ලද නොඉපැයූ වාරිකය සම්බන්ධ සැසඳුමක් අවශ්‍ය වේ. කල් ඉකුත් නොවූ අවදානම් වගකීම ඇස්තමේන්තු කිරීමේදී, මෙකී රක්ෂණවරයන් හිමිකම්පෑම් සඳහා තවමත් නිරාවරනය වන පසුබිමක් තුළ එක් එක් ව්‍යාපාරය සඳහා අපේකක්ෂිත ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය සහ දරන ලද හිමිකම්පෑම් කළමනාකරණ වියදම් මත පදනම්ව උපකල්පන සිදුකෙරේ.

**සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම්**

සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා, වාර්තාකරණ දිනයේදී වාර්තාගත හිමිකම්පෑම් වල අපේක්ෂිත පරම පිරිවැය සහ වාර්තාකරණ දිනට දරන ලද නමුත් තවමත් වාර්තා නොවූ (IBNR) හිමිකම්පෑම් වල අපේක්ෂිත පරම පිරිවැය යන ද්විත්වය සඳහාම ඇස්තමේන්තු සකස් කල යුතු වේ. ඇතැම් රක්ෂණවර සම්බන්ධයෙන් පරම හිමිකම්පෑම් පිරිවැය නිර්ණය කිරීම සඳහා සැළකිය යුතු කාලසීමාවක් ගත විය හැක.

හිඟ හිමිකම්පෑම් වල අවසාන පිරිවැය, "චේන් ලැඩර්" ක්‍රමය, "බෝන්හුටර්-ෆර්ගයුසන්" ක්‍රමය සහ සංඛ්‍යාතය/ප්‍රබලත්වය ක්‍රමවේදය වැනි, සම්මත ආයුගණන හිමිකම්පෑම් ප්‍රක්ෂේපණ ශිල්පක්‍රම රැසක් යොදාගනිමින් ඇස්තමේන්තු ගත කෙරේ.

මෙකී ශිල්පක්‍රම සඳහා පාදක වන ප්‍රධාන උපකල්පනය වනුයේ, අනාගත හිමිකම්පෑම් වර්ධනයන් සහ පරම හිමිකම්පෑම් පිරිවැය පුරෝකථනය කිරීම සඳහා සමාගමෙහි අතීත හිමිකම්පෑම් වර්ධන අත්දැකීම් යොදා ගැනීමයි. එනයින් බලන කල,මෙකී ක්‍රමවේදයන් මගින් පෙර වසර වල නිරීක්ෂනය කරන ලද වර්ධනයන් සහ අපේක්ෂිත අලාභ අනුපාතයන් මත පදනම්ව ගෙවන ලද සහ දරන ලද අලාභ, හිමිකම්පෑමකට සාමාන්‍යය පිරිවැය සහ හිමිකම්පෑම් සංඛ්‍යාව විග්‍රහ කෙරේ. ඓතිහාසික හිමිකම්පෑම් වර්ධනයන් ප්‍රධාන වශයෙන් අහඹු කාලසීමාවන් සහ සැළකිය යුතු ව්‍යාපාර ධාරාවන් ඔස්සේ විශ්ලේෂනය කෙරෙන අතර, එනමුත් භූගෝලීය කළාපය සහ හිමිකම්පෑම් කාණ්ඩය අනුව තවදුරටත් විශ්ලේෂණය කල හැකි වේ. විශාල හිමිකම්පෑම් සම්බන්ධයෙන් වෙනම කටයුතු කෙරෙන අතර, එහිදී අලාභ ගැළපුම් ඇස්තමේන්තු වල මුහුණත අගය සංචිතකරණය හෝ ඒවායේ අනාගත වර්ධනය පිළිබිඹු වන පරිදි වෙනම පුරෝකථනය කිරීමක් සිදුකෙරේ. බොහෝ අවස්ථාවන්හිදී, හිමිකම්පෑම් උද්ධමනයන්හි වල අනාගත අනුපාතයන් හෝ අලාභ අනුපාතයන් සම්බන්ධ නිශ්චිත උපකල්පනයන් සිදු නොකෙරේ. ඒ වෙනුවට, පුරෝකථනයන් පදනම් වන ඓතිහාසික හිමිකම්පෑම් දත්ත සම්බන්ධ අනුමානිත උපකල්පන භාවිත කෙරේ. අදාළ සියලුම අවිනිශ්චිතතා සැළකිල්ලට ගනිමින්, ප්‍රතිඵල පරාසයක් අතුරින් සිදුවිය හැකි ප්‍රතිපලය නියෝජනය කරන්නා වූ හිමිකම්පෑම් වල ඇස්තමේන්තුගත පරම පිරිවැය නිශ්චය කිරීම සඳහා අතීත ප්‍රවණතා අනාගතය සඳහා අදාළ නොවන පරාසය තක්සේරු කිරීම සඳහා අමතර ගුණාත්මක විනිසුම භාවිත කෙරේ. (උදාහරණයක් වශයෙන් එක් වරක් සිදුවන සිදුවීම්, හිමිකම්පෑම් සම්බන්ධ ජනතා ආකල්ප, ආර්ථික තත්ත්වයන්, හිමිකම්පෑම් උද්ධමන මට්ටම, අධිකරණ තීරණ සහ ව්‍යවස්ථා මෙන්ම කළඹ මිශ්‍රය, රක්ෂණවර විශේෂතා සහ හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාදාමයන් පිළිබිඹු වන පරිදි)

නොඉපැයූ වාරිකය සඳහා වන ප්‍රතිපාදන වල ප්‍රමාණවත්තාව තක්සේරු කිරීමේදී සමාන ආකාරයේ විනිසුම්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිත කෙරේ. කාල වෙන්කිරීම හැර වන පදනමකින් නොඉපැයූ වාරිකය ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය ආකාරයේ ගිවිසුම් මගින් සපයනු ලබන රක්ෂණ සේවා වර්ගය නිර්ණය කිරීමේදී විනිසුම අවශ්‍ය වේ.

සියලුම සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් ප්‍රාග්ධන ප්‍රමාණවත්තා පරීක්ෂාවන්ට යටත් වේ. මෙම පරීක්ෂාව මෙසර්ස් එන්එම්ජී ෆිනෑන්ෂල් සර්විසස් කන්සල්ටින්ග් පුද්ගලික සමාගම, සිංගප්පූරුව මගින් සිදු කරන ලදී.

ප්‍රතිරක්ෂණ වගකීම් මගින්, රක්ෂණ සමාගම් වෙත ගෙවිය යුතු ශේෂයන් නියෝජනය වේ. ගිවිසුම්ගත හිමිකම් අවසන් වූ හෝ කල් ඉකුත් වූ හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයක් වෙත පවරන ලද අවස්ථාවකදී ප්‍රතිරක්ෂණ වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 39. රක්ෂණ වගකීම් සහ ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ (සබැඳේ)

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| රක්ෂණ වගකීම් | 39.1 | 292 | - | - | 5,314,549 | 4,717,294 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | | | - | - | 588,814 | 298,591 |
| එකතුව | | | - | - | 5,903,363 | 5,015,885 |

### 39.1 රක්ෂණ වගකීම්

| මාර්තු 31 දිනට | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|
| රක්ෂණ වගකීම් | - | - | 1,652,891 | 1,207,374 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | - | - | 3,661,658 | 3,509,920 |
| එකතුව | - | - | 5,314,549 | 4,717,294 |

## 40. මෙහෙයුම් කල්බදු වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගම මගින් කල්බදු ආරම්භ වන දිනයේදී, කල්බදු කාලසීමාව පුරා ගෙවීම් වල ප්‍රවර්තන වටිනාකම අනුව මැන, කල්බදු වගකීම් හඳුනාගනී. කල්බදු ගෙවීම් වල ප්‍රවර්තන වටිනාකම ගණනය කිරීමේදී, කල්බදු වල ඇතුළත් පොලී අනුපාතය පැහැදිලිව තීරණය කල නොහැකි බැවින්, සමාගම මගින් කල්බදු ආරම්භක දිනයේ සිය වාරිකමය ණය ලබාගැනීමේ අනුපාතය භාවිත කෙරේ. ආරම්භක දිනයෙන් පසු, පොලියෙහි විවර්ධනය පිළිබිඹු වන පරිදි කල්බදු වගකීම් වල වටිනාකම ඉහළ නැංවෙන අතර සිදුකරන ලද කල්බදු ගෙවීම් සඳහා අඩු කෙරේ. එයට අමතරව, නවීකරණයක්, කල්බදු කාලසීමාවෙහි වෙනසක්, කල්බදු ගෙවීම් වල වෙනසක් පැවතියහොත් කල්බදු වගකීම වල ධාරණ අගය ප්‍රතිමිනුම්ගත කෙරේ.

සමූහය මගින් ප්‍රමිතීන් ආදේශ කරගැනීමේදී 2019 අප්‍රියෙල් 1 වැනි දින SLFRS 16 ප්‍රමිතිය අනුව නවීකරණය කරන ලද ප්‍රත්‍යාවලෝකන එළඹුම යොදාගන්නා ලද අතර භාවිත හිමිකම් වත්කම් සහ කල්බදු වගකීම් වාර්තා කිරීම සඳහා බරතබන ලද සාමාන්‍යය වාරිකමය ණය ලබාගැනීමේ අනුපාතය වශයෙන් 12.62% භාවිත කරන ලදී. (2021 - 12.45%)

| මාර්තු 31 දිනට | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|
| අප්‍රියෙල් 1 දිනට ශේෂය | 2,286,386 | 1,909,098 | 1,614,660 | 1,594,245 |
| වසර තුළදී එක් කිරීම්/නැවත අලුත්කිරීම් | 239,437 | 858,510 | 238,105 | 292,305 |
| පොලියෙහි විවර්ධනය | 250,137 | 228,985 | 170,465 | 191,935 |
| කල්බදු ණයහිමියන් වෙත ගෙවීම් | (667,068) | (655,969) | (385,273) | (409,587) |
| වසර තුළදී කල්බදු ගිවිසුම් අවසන් වීම | (49,842) | (54,238) | (49,842) | (54,238) |
| මාර්තු 31 දිනට ශේෂය | 2,059,050 | 2,286,386 | 1,588,115 | 1,614,660 |

**කල්බදු වගකීමෙහි සංවේදීතා විශ්ලේශනය**

වාරිකමය ණය ලබාගැනීමේ අනුපාතයෙන් සිදුවිය හැකියි වෙනස්වීම් හේතුවෙන් කල් බදු වගකීම කෙරෙහි ඇති විය හැකි බලපෑම් 56.4.1 අවදානම් කළමනාකරන හෙළිදරව් කිරීමෙහි අනාවරණය කොට ඇත.

### කල්බදු වගකීම සම්බන්ධ අවශේෂ ගිවිසුම්ගත කල්පිරීමේ විශේලේෂණය - සමාගම

| සමාගම මාර්තු 31 දිනට | 2022 වසරක් තුළ රු.'000 | 2022 වසර 1-5 රු.'000 | 2022 වසර 5 ට වැඩි රු.'000 | 2022 එකතුව රු.'000 |
|---|---|---|---|---|
| කල්බදු වගකීම | 440,316 | 1,407,356 | 211,378 | 2,059,050 |
| | 440,316 | 1,407,356 | 211,378 | 2,059,050 |

| සමූහය<br>මාර්තු 31 දිනට | 2022<br>වසරක් තුළ<br>රු.'000 | <br>වසර 1-5<br>රු.'000 | <br>වසර 5 ට වැඩි<br>රු.'000 | <br>එකතුව<br>රු.'000 |
|---|---|---|---|---|
| කල්බදු වගකීම | 117,807 | 1,267,240 | 203,068 | 1,588,115 |
| | 117,807 | 1,267,240 | 203,068 | 1,588,115 |

| සමාගම<br>මාර්තු 31 දිනට | 2021<br>වසරක් තුළ<br>රු.'000 | <br>වසර 1-5<br>රු.'000 | <br>වසර 5 ට වැඩි<br>රු.'000 | <br>එකතුව<br>රු.'000 |
|---|---|---|---|---|
| කල්බදු වගකීම | 404,863 | 1,509,462 | 372,061 | 2,286,386 |
| | 404,863 | 1,509,462 | 372,061 | 2,286,386 |

| සමූහය<br>මාර්තු 31 දිනට | 2021<br>වසරක් තුළ<br>රු.'000 | <br>වසර 1-5<br>රු.'000 | <br>වසර 5 ට වැඩි<br>රු.'000 | <br>එකතුව<br>රු.'000 |
|---|---|---|---|---|
| කල්බදු වගකීම | 236,268 | 1,038,946 | 339,446 | 1,614,660 |
| | 236,268 | 1,038,946 | 339,446 | 1,614,660 |

GRI | 207-1, 207-2, 207-4

## 41. ප්‍රවර්තන බදු වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

සමාගම සහ එහි උප සමාගම් ආදායම් බදු සහ මූල්‍ය සේවා සඳහා වැට් සහ එන්බීටී ඇතුළු අනෙකුත් බදු වලට යටත් වේ. වර්තමාන, කල් දැමූ සහ අනෙකුත් බදු සඳහා වූ සම්පූර්ණ ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා සැලකිය යුතු නිර්ණය කිරීමක් අවශ්‍ය වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට දී බදු නීති වල අදාළ වීම අර්ථ නිරූපණය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයන් පැවතියේය.

අතිරේක බදු ගෙවිය යුතුද යන ඇස්තමේන්තුව මත පදනම්ව සමූහය සහ සමාගම විසින් වත්මන්, දැනට කල් දමා ඇති සහ අනෙකුත් බදු සඳහා වත්කම් හා බැරකම් හඳුනා ගැනීම සිදු කළේය. මෙම කාරණාවල අවසාන බදු ප්‍රතිඵලය මුලින් සටහන් වූ ප්‍රමාණයට වඩා වෙනස් වූ විට, එවැනි වෙනස්කම්, ආදායමට මෙන්ම තීරණය කළ කාල සීමාව තුළ විලම්බිත බදු ප්‍රමාණයට බලපායි.

| මාර්තු 31 දිනට | සමාගම<br>2022<br>රු.'000 | <br>2021<br>රු.'000 | සමූහය<br>2022<br>රු.'000 | <br>2021<br>රු.'000 |
|---|---|---|---|---|
| ගෙවිය යුතු ප්‍රවර්තන බදු | 1,851,676 | 362,450 | 2,098,784 | 883,900 |
| එකතුව | 1,851,676 | 362,450 | 2,098,784 | 883,900 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 41. ප්‍රවර්තන බදු වගකීම් (සබැඳේ)
### 41.1 ප්‍රවර්තන බදු වගකීම

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | 362,450 | 1,803,309 | 883,900 | 2,077,418 |
| වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන | 2,712,280 | 1,999,971 | 3,221,561 | 2,601,140 |
| පසුගිය වසරට අදාළව අඩු/ (වැඩි) ප්‍රතිපාදන | (47,744) | (90,892) | (47,744) | (95,886) |
| ආදායම් බදු ගෙවීම | (1,175,310) | (3,349,938) | (1,958,933) | (3,534,648) |
| බදු බැර | - | - | - | - |
| ආර්ථික සේවා ගාස්තුව | - | - | - | (164,124) |
| මාර්තු 31 වන විට ශේෂය | 1,851,676 | 362,450 | 2,098,784 | 883,900 |

### 41.2 ආර්ථික සේවා ගාස්තුව (ESC)
2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු (ESC) පනතේ විධිවිධාන හා පසුව සිදු කරන ලද සංශෝධන වලට අනුව, ආර්ථික සේවා ගාස්තුව "නිදහස් කළ පිරිවැටුම" මත 0.5% ක් ගෙවිය යුතු අතර ආදායම් බදු ගෙවීම් වලින් අඩු කළ හැකිය. හිමිකම් නොපෑ ආර්ථික සේවා ගාස්තු, තිබේ නම්, ඉදිරි වසර තුන තුළ ගෙවිය යුතු ආදායම් බද්දට සාපේක්ෂ ව ඒවා ඉදිරියට ගෙනයාමට හැකිය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2020 ජනවාරි 1 දා ප්‍රකාශයට පත් කරන ලද නිවේදනයට අනුව, 2020 ජනවාරි 01 දා සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තුව අහෝසි කරන ලදී.

### 41.3 ස්ථාවර තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා රඳවා ගැනීමේ බද්ද (WHT)
2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 137 වන වගන්තියට සහ එහි සංශෝධන වලට අනුව, ගෙවීමක දී හෝ ගිණුමට බැර කරන අවස්ථාවේදී ස්ථාවර තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා රඳවා ගැනීමේ බද්ද වාර්ෂිකව 10% කින් අඩු වන අයුරින් සමාගමක් ස්ථාවර තැන්පතු හා ඉතුරුම් ගිණුම් පොලී ආදායමක් ලබා ගනී. මෙම බදු අඩු කිරීම ආදායම් බදු ගෙවීම් සඳහා වන බදු බැර ලෙස සලකනු ලැබේ. 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 84 වෙනි වගන්තියට අනුව, 2018 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන පරිදි පුද්ගල අනුපාතයකට ගෙවනු ලබන පොලී හෝ වට්ටම් මත ගෙවනු ලබන ස්ථාවර තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා රඳවා ගැනීමේ බද්ද 5% දක්වා අඩු කරන ලදි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිවේදනයට අනුව ස්ථාවර තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා රඳවා ගැනීමේ බද්ද අඩු කිරීම 2020 ජනවාරි 1 වන දින සිට ඉවත් කර ඇත.

## 42. වෙනත් වගකීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

වෙනත් වගකීම් අතරට ගෙවීමට නියමිත ව ඇති මූල්‍ය සේවා සඳහා වන වැට් බදු, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT), වෙනත් බදු ගෙවිය යුතු සහ ගෙවිය යුතු වෙනත් දේ ඇතුළත් වේ. මෙම මූල්‍ය නොවන වගකීම් මැනිය යුත්තේ වර්තමාන වගකීම් හෝ ශේෂ පත්‍ර දිනයේදී ගෙවීම් සඳහා තුන්වන පාර්ශවයකට පවරා තිබීම සඳහා වූ තාර්කික මුදලෙනි.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| ගෙවිය යුතු මූල්‍ය සේවා සඳහා වැට් බද්ද | 428,150 | 351,885 | 441,687 | 367,928 |
| එකතු කළ අගය මත බද්ද (වැට්) | 6,985 | 19,590 | 51,216 | 61,394 |
| ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද | - | 7,192 | 178 | 7,370 |
| ගෙවිය යුතු වගා රක්ෂණ බද්ද | 13,595 | 18,372 | 13,595 | 16,132 |
| පාරිභෝගිකයින්ට ගෙවිය යුතු මුදල | 498,011 | 320,699 | 498,650 | 321,655 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 62,106 | 61,790 | 64,546 | 64,295 |
| වෙනත් ගෙවිය යුතු ගාස්තු | 360,207 | 289,593 | 329,158 | 318,048 |
| එකතුව | 1,369,054 | 1,069,121 | 1,399,030 | 1,156,822 |

## 43. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම
**සේවක ප්‍රතිලාභ**

**විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම - පාරිතෝෂිකය**

සමූහය/සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' වෙත අනුකූල වන පරිදි 'ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය' (PUC) යටතේ ස්වාධීන වෘත්තීය සංඛ්‍යා ලේඛනඥයෙකුගේ උපදෙස් පරිදි පාරිතෝෂික සඳහා පොරොන්දු වූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම මනිනු ලබන අතර, එය ඉහත කී කොන්දේසි අනුව සකස් කරන ලද විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මකි.

2021 අංක 28 දරණ අවම විශ්‍රාම ගැන්වීමේ කම්කරු පනත අනුව බලාත්මක කරන ලද විශ්‍රාම ලැබීමේ වයස ඉහළ නැංවීම හේතුවෙන් සමාගමෙහි විශ්‍රාම ගැනීමේ වයස සංශෝධනය කරන ලදී.

**ආයුගණක ලාභ හා පාඩු හඳුනා ගැනීම**
සමාලෝචනය සිදු වන කාල සීමාව තුළදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සැලැස්ම අනුව සමාගමේ වගකීම ගණනය කිරීමේදී පැන නගින සමස්ත ආයුගණක ලාභ සහ අලාභයන් හඳුනාගැනීම සමූහය/සමාගම සිදු කරයි.

**අරමුදල් සම්පාදනය**
පාරිතෝෂික වගකීම සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත.

**නිර්වචනය කරන ලද දායක සැලසුම් - සේවකයින්ගේ අර්ථසාධක අරමුදල සහ නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක භාරකාර අරමුදල**
නිර්වචනය කරන ලද දායක සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එමගින් යම් ආයතනයක් වෙනම දායක ආයතනයකට (අරමුදලකට) ස්ථාවර දායක මුදල් ගෙවන අතර සියලුම සේවකයින්ට ගෙවීමට අරමුදලේ ප්‍රමාණවත් වත්කම් නොමැති නම් තවදුරටත් දායක මුදල් ගෙවීමට නීත්‍යානුකූල හෝ නිර්මාණාත්මක බැඳීමක් එහි දී නොමැත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 19 (සේවක ප්‍රතිලාභ) හි දක්වා ඇති පරිදි වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදයන්හි සේවාවන්ට අදාළ ප්‍රතිලාභ සඳහා මෙය අදාළ වේ.

සේවකයින් විසින් සමාගම තුළ ඉටු කරන ලද සේවාවන්ට සමානුපාතිකව දායක සැලැස්මකට ගෙවිය යුතු දායක මුදල ගෙවීම සිදු වන අතර ගෙවීම සාර්ථක ලෙසින් සිදු නොවූ විට නොගෙවූ දායක මුදල් වගකීමක් ලෙස සටහන් වේ.

සෑම සේවකයෙකුගේම දළ වැටුප මත සමූහය/සමාගම සහ සේවකයින් පිළිවෙලින් 12% ක් සහ 8% ක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

සෑම සේවකයෙකුගේම දළ වැටුපෙන් 3% ක ප්‍රතිශතයක් සමූහය/සමාගම විසින් සේවක භාරකාර අරමුදලට දායක කරයි.

**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමෙහි පිරිවැය ආයුගණක තක්සේරුවක් භාවිත කරමින් නිර්ණය කෙරේ. එකී ආයුගණන තක්සේරුව වට්ටම් අනුපාතයන්, වත්කම් මත ආදායම සම්බන්ධ අපේක්ෂිත අනුපාතයන්, අනාගත වැටුප් වර්ධක, මර්ත්‍යතා අනුපාත සහ අනාගත පාරිතෝෂික වර්ධක සම්බන්ධ උපකල්පනයන්ගෙන් සමන්විත වේ. මෙවැනි බැඳීම් වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන්, මෙකී ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතභාවයකින් යුක්ත වේ. සියලු උපකල්පනයන් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කෙරේ.

| මාර්තු 31 දිනට | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් 1 වන විට ශේෂය | | | 587,257 | 592,871 | 657,778 | 647,929 |
| ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් මුදල | 43.1 | 295 | 82,893 | 111,742 | 102,203 | 129,888 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගත් මුදල | 43.2 | 296 | 31,732 | (107,003) | 28,272 | (106,891) |
| වර්ෂය තුළ ගෙවූ ප්‍රතිලාභ | | | (33,471) | (10,353) | (39,309) | (13,148) |
| මාර්තු 31 වන විට ශේෂය | | | 668,411 | 587,257 | 748,944 | 657,778 |

### 43.1 ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් මුදල

| මාර්තු 31 දිනට | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|
| පූර්ව සේවා පිරිවැය | (20,736) | - | (23,590) | - |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 57,412 | 52,455 | 94,744 | 69,823 |
| ශුද්ධ පදනමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම අනුව ශුද්ධ පොලී අනුපාත | 46,217 | 59,287 | 51,785 | 60,065 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගත් මුළු මුදල | 82,893 | 111,742 | 102,203 | 129,888 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 43. විශ්‍රාම ප්‍රතිලාභ බැදීම (සබැදේ)

### 43.2 වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් මුදල

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 |
| උපකල්පනවල වෙනස්කම් හේතුවෙන් සිදු වූ පාඩු/(ලාභ) | 9,555 | (38,363) | 22 | (42,779) |
| වසර තුළ ඇති වූ අලාභ/(ලාභ) අත්දැකීම් | 22,177 | (68,640) | 28,250 | (64,112) |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් සම්පූර්ණ ආයුගණිත (පාඩු)/ලාභ | 31,732 | (107,003) | 28,272 | (106,891) |

විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම සම්බන්ධ ආගණිත තක්සේරු කිරීම 2022 මාර්තු 31 දින වන විට ඇක්ෂුවරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්සි පෞද්ගලික සමාගම විසින් සිදු කරන ලද අතර එම සමාගම ආගණනය සම්බන්ධ වෘත්තීය සමාගමක් වේ. (31 මාර්තු 2021 වන දිනට ආගණනය මෙසර්ස් ඇක්ෂුවරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්සි (පුද්ගලික) සමාගම විසිනි. වගකීම් අගය කිරීම සඳහා ඔවුන් විසින් භාවිතා කරන ලද තක්සේරු ක්‍රමය වූයේ 'ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC)' ක්‍රමය වන අතර, එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන, LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' මගින් නිර්දේශ කරන ලද ක්‍රමයකි.

| මාර්තු 31 දින වන විට | 2022 | 2021 |
|---|---|---|
| සමාගම /සමූහය | | |
| ආයුගණන උපකල්පන | | |
| වට්ටම් අනුපාතය | 15.00% | 7.87% |
| අනාගත වේතන ඉහළ නැංවීමේ අනුපාතය | 13.00% | 6.00% |
| මෘත්‍යතා ප්‍රවණතාව | A1967/70 උපරිම මරණ අනුපාතය | A1967/70 උපරිම මරණ අනුපාතය |
| අබාධ සිදු වීම | සම්මත RI අනුපාත | |
| විශ්‍රාම ගැන්වීමේ වයස | අවුරුදු 60 | අවුරුදු 55 |

මෙම නියැදියේ ක්‍රියාකාරී සහභාගීකරුවන්ගේ අපේක්ෂිත සාමාන්‍ය සේවා කාලය 2022 මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා වසර 8.58 කි. (10.68 - 2021)

### 43.3 ආගණිත තක්සේරුවේ නියුක්ත උපකල්පනවල සංවේදීතාව

රැකියා ප්‍රතිලාභ වගකීම් මැනීමේදී නියතව පවතින අනෙකුත් විචල්‍යයන් සමඟ භාවිතා කෙරෙන ප්‍රධාන උපකල්පනවල සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය ස්ථාවරත්වය ප්‍රකාශයේ සංවේදිත යනුවසරේ රැකියා ප්‍රතිලාභ වගකීම මත වට්ටම් අනුපාතය සහ වැටුප් වර්ධන අනුපාතයේ උපකල්පිත වෙනස්කම්වල බලපෑමයි.

| | | 2022 | | 2021 | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය සඳහා වූ පතිඵලවල වර්ධනය/ (ඌනනය) විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය කෙරෙහි බලපෑම<br>රු.'000 | වගකීම් වල වර්ධනය/ (ඌනනය) සේවක ප්‍රතිලාභ වගකීම් කෙරෙහි බලපෑම<br>රු.'000 | වර්ෂය සඳහා වූ පතිඵලවල වර්ධනය/ (ඌනනය) විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය කෙරෙහි බලපෑම<br>රු.'000 | වගකීම් වල වර්ධනය/ (ඌනනය) සේවක ප්‍රතිලාභ වගකීම් කෙරෙහි බලපෑම<br>රු.'000 |
| අනුපාතය ඉහළයාම/ (පහළයාම) | | | | | |
| | 1% | 46,958 | (46,958) | 37,667 | (37,667) |
| | -1% | (53,552) | 53,552 | (42,606) | 42,606 |
| වැටුප් වර්ධක වල ඉහළයාම/ (පහළයාම | | | | | |
| | 1% | (53,830) | 53,830 | (42,735) | 42,735 |
| | -1% | 47,935 | (47,935) | 38,416 | (38,416) |

### 43.4 කල් පිරීමේ සවිස්තරය අනුව විශ්‍රාම යාමේ ප්‍රතිලාභ වගකීම විශ්ලේෂණය කිරීම

පහත සඳහන් සටහන මඟින් එක් එක් සේවකයාගේ අපේක්ෂිත අනාගත සේවා කාලය අනුව අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම විශ්ලේෂණය කෙරිණ. අපේක්ෂිත අනාගත වැඩ කරන කාලය විශ්‍රාම ගැන්වීමේ දිනයට පෙර සේවයෙන් ඉවත් වීම, මරණය හෝ අකර්මන්‍යතාවය වැනි කරුණු මත සලකා බැලේ.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| ඉදිරි මාස 12 තුළ | 54,921 | 90,630 | 62,636 | 92,778 |
| අවුරුදු 1-5 අතර | 246,811 | 197,715 | 275,960 | 223,127 |
| වසර 5 කට පසු | 366,679 | 298,912 | 410,348 | 341,873 |
| එකතුව | 668,411 | 587,257 | 748,944 | 657,778 |

GRI | 207-1, 207-2, 207-4

## 44. විලම්බිත බදු වගකීම් / (වත්කම්)

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

වත්කම් හා බැරකම් වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කටයුතු සඳහා ඒවායේ ඉදිරියට රැගෙන යන ප්‍රමාණයන් අතර වාර්තා කරන දිනයේදී තාවකාලික වෙනස්කම් මත කල් දැමූ බදු නිර්මාණය වේ. පහත සඳහන් අවස්ථාවන්හි දී හැර, බදු අය කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීම් හඳුනාගනු ලැබේ:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන ගණුදෙනුවක හොඳහිත හෝ වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් පිළිගැනීමෙන් සහ ගණුදෙනුවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු ගෙවිය යුතු ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති  ආකාරයෙන් විලම්බිත බදු වගකීම පැන නැගෙන්නේ නම්; හා
- තාවකාලික වෙනස්කම්වල ආපසු හැරවීමේ කාලය පාලනය කළ හැකි සහ අනාගතයේදී තාවකාලික වෙනස්කම් ආපසු හැර නොවීමට ඉඩ ඇති බවට ඒත්තු යන විටදී අනුබද්ධිත සමාගම්වල ආයෝජනය සමඟින් සම්බන්ධ වන තාවකාලික වෙනස්කම්වලට අදාළව.

  විලම්බිත බදු වත්කම් සියළුම අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා පිළිගෙන ඇති අතර, භාවිතයට නොගත් බදු ණය හා භාවිතා නොකළ බදු අලාභයන් ඉදිරියට ගෙන යන අතර, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සමඟ බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට ඉඩ ඇති අතර, භාවිතයට නොගත් බදු ණය ඉදිරියට ගෙන යාම කළ හැකි වන අතර භාවිතා නොකළ බදු අලාභ මතු දැක්වෙන තත්ත්වයන්හි දී හැර ප්‍රයෝජන ගත හැකිය:

- අඩු කළ හැකි තාවකාලික වෙනසට අදාළව විලම්බිත බදු වත්කම් ව්‍යාපාර සංකලනයක් නොවන ගණුදෙනුවක වත්කම් හෝ වගකීම් වශයෙන් පිළිගැනීමෙන් පැන නගින අවස්ථා වලදී සහ ගනුදෙනුවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු ගෙවිය හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති විට ; හා
- අනුබද්ධ සමාගම් වල ආයෝජන හා සම්බන්ධ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් අපේක්ෂා කළ හැකි කාලයක් තුළ ආපසු හැරවීමට ඉඩ ඇති තත්ත්වයන් යටතේ දී වන අතර තාවකාලික වෙනස්කම් භාවිතා කළ හැකි තත්ත්වයකට සාපේක්ෂව බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට ඉඩ ඇති අවස්ථාවල දී.

විලම්බිත බදු වත්කම්වල ඉදිරියට රැගෙන යන ප්‍රමාණය එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කෙරෙන අතර, විලම්බිත බදු වත්කම් වලින් කොටසක් හෝ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට නොහැකි වන ආකාරයට ඌනනය කෙරේ. වාර්තා කරන සෑම දිනකට ම අදාල ව හඳුනානොගත් විලම්බිත බදු වත්කම් නැවත තක්සේරු කෙරෙන අතර අනාගත බදු අය කළයුතු ලාභය මඟින් විලම්බිත බදු වත්කම් ආපසු ලබා ගැනීමට ඉඩ සැලසෙන මට්ටමට පිළිගැනීම සිදු කෙරේ.

වාර්තා කරන දිනයේදී බලාත්මක කර ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත (සහ බදු නීති) මත පදනම්ව වත්කම් සම්පූර්ණ වූ විට හෝ වගකීම් පියවන විට බලපැවැත්වෙන  පරිදි වර්ෂය තුළදී බදු අනුපාතයන් මත විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලැබේ.

ඍජුවම සාධාරණව පිළිගත් අයිතමයන්ට අදාළ වත්මන් බද්ද සහ කල් දැමූ බද්ද ද ලාභයෙන් හෝ අලාභයෙහි ප්‍රකාශයෙන් නොව ස්කන්ධයේ පිළිගනේ.

වර්තමාන බදු වගකීම්වලට හා විලම්බිත බදු  එකම ආයතනයකට සහ එකම බදු අධිකාරියට අයත් වීමට සාපේක්ෂව වත්මන් බදු වත්කම් අහෝසි කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් කල් දැමූ බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් පියවනු ඇත.

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| වත්කම් යටතේ හඳුනාගත් | (1,146,726) | (415,841) | (1,444,813) | (594,495) |
| වගකීම් යටතේ හඳුනාගත් | - | - | 323,621 | 297,568 |
| විලම්බිත බදු වගකීම/(වත්කම) | (1,146,726) | (415,841) | (1,121,192) | (296,927) |

පියවීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ නොහැකි අයිතියක් නැති හෙයින් එක් ආයතනයක ශුද්ධ විලම්බිත බදු වත්කම්/වගකීම් වෙනත් ආයතනයක වත්කම්/වගකීම් වලට එරෙහිව පියවිය නොහැක. එබැවින් විවිධ ආයතන වල ශුද්ධ විලම්බිත බදු වත්කම් සහ වගකීම්, මූල්‍ය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය තුළ වෙන වෙනම හඳුනාගෙන ඇත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 44. විලම්බිත බදු වගකීම් / (වත්කම්) (සබැඳේ)

### 44.1 විලම්බිත බදුවල වෙනස්වීම

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22<br>රු.'000 | 2020/21<br>රු.'000 | 2021/22<br>රු.'000 | 2020/21<br>රු.'000 |
| අප්‍රේල් 01 වන විට ශේෂය | (415,841) | (376,291) | (296,924) | (53,709) |
| වර්ෂය සඳහා අය කිරීම | (673,452) | (69,511) | (766,656) | (270,905) |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සංරචක වලට අදාළව විලම්බිත බදු අය කිරීම | (57,433) | 29,961 | (57,612) | 27,690 |
| මාර්තු 31 වන විට ශේෂය | (1,146,726) | (415,841) | (1,121,192) | (296,924) |

| 2022 මාර්තු 31 වන විට | සමාගම | | | | | සමූහය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විලම්බිත බදු වත්කම් රු.'000 | විලම්බිත බදු වගකීම් රු.'000 | ආදායම් ප්‍රකාශය රු.'000 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය රු.'000 | ස්කන්ධය තුල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය රු.'000 | විලම්බිත බදු වත්කම් රු.'000 | විලම්බිත බදු වගකීම් රු.'000 | ආදායම් ප්‍රකාශනය රු.'000 | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය රු.'000 | ස්කන්ධය තුල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය රු.'000 |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම | 127,122 | - | 39,501 | (7,616) | (7,616) | 242,236 | - | (234,413) | (7,795 ) | (7,795 ) |
| ඉදිරියට ගෙන ආ බදු අලාභ | - | - | - | - | - | - | - | 171,164 | - | - |
| ණය ලැබිය යුතු දේ සම්බන්ධ සඳහා අපහායන ප්‍රතිපාදන | 1,936,823 | 787,070 | 178,514 | - | - | 2,127,250 | 787,071 | 306,055 | - | - |
| සංක්‍රාන්ති ගැලපීම් සඳහා වූ විලම්බිත බදු | 214,911 | - | - | - | - | 214,911 | - | 13,512 | - | - |
| බදු අරමුණ සඳහා කඩිනම් ක්ෂය වීමේ දීමනාව (කල්බදු) | - | 382,094 | (862,128) | - | - | - | 382,094 | (862,128) | - | - |
| බදු අරමුණ සඳහා කඩිනම් ක්ෂය වීමේ දීමනාව (PPE) | - | 26,322 | (6,363) | - | - | - | 201,939 | (22,111) | - | - |
| SLFRS 16 මත විලම්බිත බදු | 49,677 | 36,138 | (22,976) | - | - | 49,677 | 36,138 | (59,114) | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට විලම්බිත බදු | 49,817 | - | - | (49,817) | (49,817) | 49,817 | - | - | (49,817) | (49,817) |
| සාධාරණ අගය මත ලාභ/පාඩු - ආයෝජන දේපල | - | - | - | - | - | - | 155,457 | (79,621) | - | - |
| | 2,378,350 | 1,231,624 | (673,452) | (57,433) | (57,433) | 2,683,891 | 1,562,699 | (766,656) | (57,612) | (57,612) |
| වර්ෂය සඳහා වූ ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් මත විලම්බිත බදු බලපෑම | | | (673,452) | (57,433) | | | | (766,656) | (57,612) | |
| ස්කන්ධ පදනම යටතේ හඳුනාගැනේ | | | | | (57,433) | | | | | (57,612) |
| වත්කම් යටතේ හඳුනාගැනේ | | (1,146,726) | | | | | (1,444,813) | | | |
| වගකීම් යටතේ හඳුනාගැනේ | | - | | | | | 323,621 | | | |
| මාර්තු 31 දිනට ශුද්ධ විලම්බිත බදු වගකීම්/(වත්කම්) | | (1,146,726) | | | | | (1,121,192) | | | |

| 2021 මාර්තු 31 වන විට | සමාගම | | | | | සමූහය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විලම්බිත බදු වත්කම් රු.'000 | විලම්බිත බදු වගකීම් රු.'000 | ආදයම් ප්‍රකාශය රු.'000 | විස්තීර්ණ ආදයම් ප්‍රකාශය රු.'000 | ස්කන්ධය තුල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය රු.'000 | විලම්බිත බදු වත්කම් රු.'000 | විලම්බිත බදු වගකීම් රු.'000 | ආදයම් ප්‍රකාශනය රු.'000 | විස්තීර්ණ ආදයම් ප්‍රකාශය රු.'000 | ස්කන්ධය තුල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය රු.'000 |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම | 166,597 | - | (30,564) | 29,961 | 29,961 | 171,164 | - | 18,973 | 27,690 | 27,690 |
| ඉදිරියට ගෙන ආ බදු අලාභ | - | - | - | - | - | - | - | 268 | - | - |
| ණය ලැබිය යුතු දේ සම්බන්ධ සඳහා අපහායන ප්‍රතිපාදන | 1,786,426 | 465,774 | 172,933 | - | - | 2,078,889 | 465,774 | 59,002 | - | - |
| සංක්‍රාන්ති ගැලපීම් සඳහා වූ විලම්බිත බදු | 214,911 | - | 35,818 | - | 250,729 | 228,423 | - | 38,071 | - | - |
| බදු අරමුණ සඳහා කඩිනම් ක්ෂය වීමේ දීමනාව (කල්බදු) | - | 1,244,197 | (243,171) | - | - | - | 1,244,197 | (243,171) | - | - |
| බදු අරමුණ සඳහා කඩිනම් ක්ෂය වීමේ දීමනාව (PPE) | - | 32,685 | 28,197 | - | - | - | 224,050 | 92,393 | - | - |
| SLFRS 16 මත විලම්බිත බදු | 26,701 | 36,138 | (32,724) | - | - | 26,701 | 36,138 | (37,787) | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට විලම්බිත බදු | - | - | - | - | - | 51,899 | 289,990 | (198,654) | - | - |
| | 2,194,635 | 1,778,794 | (69,511) | 29,961 | 280,690 | 2,557,076 | 2,260,149 | (270,905) | 27,690 | 27,690 |
| වර්ෂය සඳහා වූ ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් මත විලම්බිත බදු බලපෑම | | | (69,511) | 29,961 | | | | (270,905) | 27,690 | |
| ස්කන්ධ පදනම යටතේ හඳුනාගැනේ | | | | | 280,690 | | | | | 27,690 |
| වත්කම් යටතේ හඳුනාගැනේ | | (415,841) | | | | | (594,495) | | | |
| වගකීම් යටතේ හඳුනාගැනේ | | - | | | | | 297,568 | | | |
| මාර්තු 31 දිනට ශුද්ධ විලම්බිත බදු වගකීම්/(වත්කම්) | | (415,841) | | | | | (296,927) | | | |

බදු වත්කම්/වගකීම් ගණනය කර ඇත්තේ එක් එක් සමාගමට විශේෂිත වූ අනුපාතයටය.

## 45. ප්‍රකාශිත ප්‍රාග්ධනය

### ප්‍රාග්ධනය

ව්‍යාපාරයේ ආවේනික අවදානම් ආවරණය කිරීම සඳහා සමාගම සක්‍රීයව කළමනාකරණය කරන ලද ප්‍රාග්ධන පදනමක් පවත්වාගෙන යන අතර ම එය ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නියම කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අවශ්‍යතා සපුරාලයි. සමාගමේ ප්‍රාග්ධනයේ ප්‍රමාණවත්භාවය අධීක්ෂණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපිත කරන ලද නීති රීති සහ අනුපාතයන් හා වෙනත් ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් සිදු කෙරේ.

සමාගම මඟින්, ආර්ථික තත්ත්වයන්ගෙ වෙනස්වීම් සහ සිය ක්‍රියාකාරකම් වල අවදානම් ගතිලක්ෂණ අනුව සිය ප්‍රාග්ධන ව්‍යුහය කළමනාකරණය කරමින් අදාළ පරිදි ගැළපුම සිදුකරනු ලැබේ. ප්‍රාග්ධන ව්‍යුහය පවත්වාගෙන යාම හෝ ගැළපුම් සිදුකිරීම උදෙසා, සමාගම මඟින් කොටස්හිමිකරුවන් වෙත ලාභාංශ වටිනාකම, කොටස් හිමිකරුවන් වෙත ප්‍රාග්ධන ආදායම ගැළපීම හෝ ප්‍රාග්ධන සුරැකුම් නිකුතුව සිදුකෙරේ.

### ප්‍රාග්ධන කළමනාකරණය

සමාගමේ ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියේ මූලික අරමුණ නම් සමාගම විසින් ව්‍යාපාර සඳහා සහයෝගය දැක්වීම සඳහා සහ කොටස් හිමියන්ගේ වටිනාකම උපරිම කිරීම සඳහා බාහිරව පනවා ඇති ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල වීම සහ ශක්තිමත් ණය ශ්‍රේණිගත කිරීම් සහ මනා ප්‍රාග්ධන අනුපාතයන් පවත්වා ගැනීම සහතික කිරීමයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 45. ප්‍රකාශිත ප්‍රාග්ධනය (සබැඳේ)

| | සමාගම/සමූහය 2022 | | සමාගම/සමූහය 2021 | |
|---|---|---|---|---|
| | කොටස් ගණන | රු.'000 | කොටස් ගණන | රු.'000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | 1,704,602,760 | 14,892,036 | 1,627,703,388 | 13,915,414 |
| කොටස්කර ලාභාංශ | 182,592,242 | 2,179,925 | 76,899,372 | 976,622 |
| මාර්තු 31 වන විට ශේෂය | 1,887,195,002 | 17,071,961 | 1,704,602,760 | 14,892,036 |

### ප්‍රාග්ධන පන්ති වල අයිතිවාසිකම්, වරණයන් සහ සීමා කිරීම්

සමාගමේ සාමාන්‍ය කොටස් උද්ධෘත කර ඇත්තේ කොළඹ කොටස් වෙළඳපොලේ ය. වරින් වර ප්‍රකාශ කරන පරිදි සාමාන්‍ය කොටස් හිමි අයට ලාභාංශ ලබා ගැනීමේ අයිතිය ඇති අතර සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේදී එක් කොටසකට එක් ඡන්දයක් හිමි වේ.

### නියාමන ප්‍රාග්ධනය

| මාර්තු 31 වන විට | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | සත්‍ය රු.'000 | අවශ්‍ය වන රු.'000 | සත්‍ය රු.'000 | අවශ්‍ය වන රු.'000 |
| ස්ථර 1 ප්‍රාග්ධනය / මූලික ප්‍රාග්ධනය | 36,445,056 | 2,000,000 | 33,109,148 | 2,000,000 |
| ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය/මූලික ප්‍රාග්ධන අනුපාතය | 18.76% | 7.00% | 17.72% | 7.00% |
| මුළු ප්‍රාග්ධන අනුපාතය/සමස්ත අවදානම් බරතබන ලද ප්‍රාග්ධන අනුපාතය | 19.67% | 11.00% | 18.58% | 11.00% |

2018 අංක 3 දරණ මුදල් ව්‍යාපාර පනතේ නියෝගයන්ට අනුව, නියාමන ප්‍රාග්ධනය 1 වන ස්ථරයේ ප්‍රාග්ධනයෙන් සමන්විත වන අතර එයට ප්‍රකාශිත ප්‍රාග්ධනය, ව්‍යවස්ථාපිත සංචිත අරමුදල, වත්මන් වර්ෂයේ ලාභය ඇතුළු රඳවා ගත් ආදායම්, සාමාන්‍ය සහ අනෙකුත් අඩු අපේක්ෂාවන් සහිත සංචිත, වෙනත් අස්පෘශ්‍ය වත්කම් සහ අනෙකුත් පුළුල් ආදායම් අලාභ මෙන් ම කල් දැමූ බදු වත්කම්, සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා සමුච්චිත හානිකරණ හිඟය සහ සම්පිණ්ඩිත පොලී සහ බැංකු හා මූල්‍ය සමාගම් වල ආයෝජනයෙන් 50%ක් ඇතුළත් වේ.

2017 අංක 2 දරණ මූල්‍ය ව්‍යාපාර පනතේ නියෝගය යටතේ සෑම බලපත්‍රලාභී මූල්‍ය සමාගමක්ම අවම මූලික ප්‍රාග්ධනය 2021 ජනවාරි 1 වෙනිදා වන විට රු. බිලියන 2.5 ක්, පවත්වා ගත යුතු වුව ද"කොරෝනා වයිරස් රෝගය (COVID-19) ව්‍යාප්ත වීම හේතුවෙන් ව්‍යාපාර සහ පීඩාවට පත් පුද්ගලයින්ට ආධාර කිරීම සඳහා බලපත්‍රලත් මූල්‍ය සමාගම්වලට නම්‍යශීලීභාවය ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ නියාමන පියවරයන්" යන මාතෘකාව යටතේ 2020 මාර්තු 31 දිනැති ලිපිය මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද දැනුම් දීම අනුව සහන ලබා දීමට කටයුතු කෙරුණු අතර අවම මූලික ප්‍රාග 'ධන අවශ්‍යතාවය 2022 ජනවාරි 1 වන දින දක්වා බිලියන රු. 2.5 ඉක්මවා පවත්වා ගෙන යෑමට සිදු විය. තවද, එම ලිපිය මඟින් දැනුම් දුන් පරිදි ප්‍රාග්ධන ප්‍රමාණවත්තා නඩත්තු කිරීම සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතා 2020.07.01 හා 2021.07.01 වන දිනට අනුකූලව 2018 අංක 03 දරණ මුදල් ව්‍යාපාර පනතේ නියෝග අංක 3 යටතේ පිළිවෙලින් 01.07.2021 සහ 01.07.2022 දක්වාකල් දමන ලැබිණ.

## 46. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22 රු.'000 | 2020/21 රු.'000 | 2021/22 රු.'000 | 2020/21 රු.'000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | 2,406,995 | 2,205,344 | 2,464,951 | 2,235,077 |
| වර්ෂය තුළ මාරු කිරීම | 232,951 | 201,651 | 264,400 | 229,874 |
| මාර්තු 31 වන විට ශේෂය | 2,639,946 | 2,406,995 | 2,729,351 | 2,464,951 |

### පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පීඑල්සී

2003 හි අංක 1 දරණ මූල්‍ය සමාගම් (ප්‍රාග්ධන අරමුදල්) 3 (අ) ඡේදය අනුව, සෑම මූල්‍ය සමාගමක්ම සංචිත අරමුදල් පවත්වා ගත යුතු අතර, එම උපදෙස්වල 3 (ආ) (ස) ඡේදය අනුව, ප්‍රාග්ධන අරමුදල මුළු තැන්පතු වගකීම් වලින් සියයට විසිපහකට (25)වඩා නොඅඩු විය යුතු වන අතර, සෑම වසරකම ශුද්ධ ලාභයෙන් සියයට පහකට (5) නොඅඩු මුදලක් සංචිත අරමුදලට මාරු කළ යුතුය.

ප්‍රාග්ධන අරමුදල් සමස්ත තැන්පතු වගකීම් වලින් සියයට විසිපහකට (25) නොඅඩු වූ අතර සමාගම ශුද්ධ ලාභයෙන් සියයට පහක් (5) සංචිත අරමුදලට මාරු කර ඇත.

### ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්

බංග්ලාදේශයේ 1994 මූල්‍ය රෙගුලාසි වලට අනුව, සෑම බැංකු නොවන මූල්‍ය ආයතනයක්ම එහි ගෙවූ කොටස් ප්‍රාග්ධනය හා සමාන වාරිකයක් (අදාළ වන්නේ නම්) දක්වා සමාන සංචිත අරමුදල ලැබෙන තෙක් එහි වර්තමාන වාර්ෂික ලාභයෙන් අවම වශයෙන් 20% ක් වත් අරමුදලට මාරු කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලව ලාභාංශය ප්‍රකාශයට පත් කිරීමට පෙර සමාගම ශුද්ධ ලාභයෙන් 20% ක් ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කර ඇත.

## 47. රඳවාගත් ඉපැයීම්

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22 රු.'000 | 2020/21 රු.'000 | 2021/22 රු.'000 | 2020/21 රු.'000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | 17,159,777 | 14,227,988 | 20,682,106 | 16,517,824 |
| වර්ෂය සඳහා ලාභය | 4,659,009 | 4,033,020 | 4,805,731 | 5,294,015 |
| විස්තීර්ණ ආදායම | 25,701 | 77,042 | 29,340 | 76,763 |
| සංචිත වෙත මාරු කිරීම | (182,950) | (201,651) | (214,401) | (229,874) |
| සංචිත වලින් මාරු කිරීම | - | - | - | - |
| ලාභාංශ ගෙවීම | (2,179,925) | (976,622) | (2,179,925) | (976,622) |
| මාර්තු 31 වන විට ශේෂය | 19,481,611 | 17,159,777 | 23,122,852 | 20,682,106 |

## 48. වෙනත් සංචිත

**කොටස් සංචිත**

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත කොටස්හි  සටහන් කර ඇති සංචිතවලට (විස්තීර්ණ ආදායම් ප්‍රකාශය)ඇතුළත් වන්නේ;

- සාධාරණ අගය සංචිතය සමන්විත වන්නේ අනෙකුත් වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයකින් මනිනු ලබන මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම්වල සමුච්චිත ශුද්ධ වෙනස් වීම ද ඇතුළත්වයි. (302 පිටුවේ සටහන 48.3 බලන්න).
- පොදු සංචිතය මගින් අධ්‍යක්ෂවරුන් විසින් පොදු යෙදවුම් සඳහා රඳවාගනු ලබන වටිනාකම් නියෝජනය වේ. පොදු සංචිතය ස්ථාපනය කිරීමේ අරමුණ වනුයේ, අනාගතයෙහිදී උද්ගත විය හැකි අනපේක්ෂිත වගකීම් සපුරාලීමයි.
- බදු සමානීකරණ සංචිතය, අධ්‍යක්ෂවරුන් විසින් අනාගතයෙහි උද්ගත විය හැකි කවර හෝ බදු වගකීමක් සපුරාලීම සඳහා වෙන්කොට ඇති වටිනාකම් වලින් සමන්විත වේ.
- ප්‍රත්‍යාගණන සංචිතය, දේපළ, පිරියත සහ උපකරණ වලින් මාරුකරන ලද ආයෝජන දේපළ වල ප්‍රත්‍යාගණන ගැළපුම හා සම්බන්ධ වේ.
- විදේශ විනිමය පරිවර්තන සංචිතය

වාර්තාකරණ දිනය වන විට, සමාගමේ අනුබද්ධ ආයතනයක් වන ලංකන් එලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් හි වත්කම් හා බැරකම් වාර්තා කරන දිනයේ විනිමය අනුපාතිකය යටතේ ඉදිරිපත් කරන මුදලට (ශ්‍රී ලංකා රුපියල්) පරිවර්තනය කරන ලද අතර ආදායම් ප්‍රකාශනය සහ එම කාලය තුළ අනෙකුත් විස්තීර්ණ ආදායම සාමාන්‍ය විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කෙරිණි. මෙම මූල්‍ය ප්‍රකාශය පරිවර්තනය කිරීමේදී මතුවන හුවමාරු වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළින් විදේශ මුදල් පරිවර්තන සංචිතයට ගෙන යනු ලැබේ (302 පිටුවේ සටහන 48.4 බලන්න).

### 48.1 2022 ප්‍රවර්තන වර්ෂය

| | | | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සටහන | පිටු අංකය | 01-04-2021වන විට ආරම්භක ශේෂය රු.'000 | සංචලනයන්/ සම්ප්‍රේෂණයනි රු.'000 | 31-03-2022වන විට අවසාන ශේෂය රු.'000 | 01-04-2021වන විට ආරම්භක ශේෂය රු.'000 | සංචලනයන්/ සම්ප්‍රේෂණයනි රු.'000 | 31-03-2022වන විට අවසාන ශේෂය රු.'000 |
| සාධාරණ අගය සංචිතය | 48.3 | 302 | (117,377) | (257,831) | (375,208) | (121,517) | (257,831) | (379,348) |
| විදේශ මුදල් පරිවර්තන සංචිතය | 48.4 | 302 | - | - | - | 542,836 | 733,623 | 1,276,459 |
| එකතුව | | | (117,377) | (257,831) | (375,208) | 421,319 | 475,792 | 897,111 |

### 48.2 2021 පෙර වසර

| | | | සමාගම | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සටහන | පිටු අංකය | 01-04-2020වන විට ආරම්භක ශේෂය රු.'000 | සංචලනයන්/ සම්ප්‍රේෂණයනි රු.'000 | 31-03-2021වන විට අවසාන ශේෂය රු.'000 | 01-04-2020වන විට ආරම්භක ශේෂය රු.'000 | සංචලනයන්/ සම්ප්‍රේෂණයනි රු.'000 | 31-03-2021වන විට අවසාන ශේෂය රු.'000 |
| සාධාරණ අගය සංචිතය | 48.3 | 302 | (102,114) | (15,263) | (117,377) | (116,005) | (5,512) | (121,517) |
| විදේශ මුදල් පරිවර්තන සංචිතය | 48.4 | 302 | - | - | - | 401,108 | 141,728 | 542,836 |
| එකතුව | | | (102,114) | (15,263) | (117,377) | 285,103 | 136,216 | 421,319 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 48. වෙනත් සංචිත (සබැඳේ)

### 48.3 සාධාරණ අගය සංචිතය

සාධාරණ අගය සංචිතයට ඇතුළත් වන්නේ එවැනි ආයෝජන හඳුනාගැනීමෙන් බැහැර කෙරෙන තුරු හෝ අපහායනය වන තුරු වෙනත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම් වල සමුච්චිත ශුද්ධ වෙනස් වීමයි.

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22 රු.'000 | 2020/21 රු.'000 | 2021/22 රු.'000 | 2020/21 රු.'000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | (117,377) | (102,114) | (121,517) | (116,005) |
| රඳවාගත් ඉපැයුම් වලින් මාරු කිරීම් | (50,000) | - | (50,000) | - |
| මූල්‍ය ආයෝජන නැවත තක්සේරු කිරීමේදී ශුද්ධ සාධාරණ අගය ලාභ/(අලාභ) | (207,831) | (15,263) | (207,831) | (5,512) |
| මාර්තු 31 වන විට ශේෂය | (375,208) | (117,377) | (379,348) | (121,517) |

### 48.4 විදේශ මුදල් පරිවර්තන සංචිතය

විදේශ මුදල් පරිවර්තන සංචිතය සමන්විත වන්නේ විදේශ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමේදී පැන නගින සියලුම විදේශ මුදල් වෙනස්කම් වලිනි.

| | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2021/22 රු.'000 | 2020/21 රු.'000 | 2021/22 රු.'000 | 2020/21 රු.'000 |
| අප්‍රේල් 1 වන විට ශේෂය | - | - | 542,836 | 401,108 |
| මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමෙන් ඇතිවන ශුද්ධ ලාභ/(පාඩු) | - | - | 1,439,171 | 141,728 |
| සුළු කොටස්හිමි අයිතිය වෙත මාරුකිරීම | | | (705,548) | |
| මාර්තු 31 වන විට ශේෂය | - | - | 1,276,459 | 542,836 |

## 49. සුළු කොටස් හිමි අයිතිය

අත්පත් කර ගත් දිනයේදී අත්පත් කර ගනු ලැබීමට ලක්වන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකමේ සමානුපාතික කොටස අනුව පාලනය කළ නොහැකි අයිතිය මනිනු ලැබේ. පරිපාලිතයක පාලනය ගිලිහීමක් සිදු නොවුනු අයිතිය ඇති විට සමූහයේ අයිතිය පිළිබඳ වෙනස්කම් ගණනය කෙරෙන්නේ සමකොටස් ගනුදෙනු වශයෙනි අනුබද්ධිත සමාගමක් වන පීපල්ස් ඉන්ෂුවරන්ස්හි පාලනය කළ නොහැකි අයිති මට්ටම ශුද්ධ වත්කම් වලින් 25% ක් සහ අනුබද්ධිත සමාගමක් වන ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්හි ශුද්ධ වත්කම්වලින් 49% කි.

| මාර්තු 31 දිනට | සමූහය | |
|---|---|---|
| | 2021/22 රු.'000 | 2020/21 රු.'000 |
| අප්‍රෙල් 1 වන විට ශේෂය | 2,661,541 | 2,356,784 |
| වසරේ ලාභය | 12,438 | 302,319 |
| වෙනත් විස්තීර්ණ ආදායම | 705,548 | 2,438 |
| වසර සඳහා ගෙවූ ලාභාංශ | (225,000) | - |
| මාර්තු 31 වන විට ශේෂය | 3,154,527 | 2,661,541 |

## 50. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

**බැඳීම් සහ අනිශ්චිතතාවයන්**

අසම්භාව්‍ය වගකීම් යනු පැවැත්ම තහවුරු කළ හැකි අනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම්වලින් පමණක් තහවුරු විය හැකි ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු විය නොහැකි හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 37 'මගින් අර්ථ දක්වා ඇති පරිදි වගා මැනීමට නොහැකි වගකීම් ය. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අසම්භාව්‍ය වගකීම් හඳුනා නොගන්නා නමුත් ඒවා සිදුවීම දුරස්ථ නොවේ නම් සාමාන්‍යයෙන් හෙළිදරව් කරනු ලැබේ.

| මාර්තු 31 වන විට | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| අසම්භාව්‍ය වගකීම් | 50.1 | 303 | 469,000 | 697,502 | 515,989 | 744,491 |
| බැඳීම් | 50.2 | 304 | 6,383,234 | 10,300,609 | 6,383,234 | 10,300,609 |
| එකතුව | | | 6,852,234 | 10,998,111 | 6,899,223 | 11,045,100 |

### 50.1 අසම්භාව්‍ය වගකීම්

සාමාන්‍ය ව්‍යාපාර තත්ත්වයන් යටතේ සමූහය සහ සමාගම විවිධාකාර අය කරගත නොහැකි බැඳීම් ඇති කර ගන්නා අතර සිය ගනුදෙනුකරුවන්ට නීතිමය පිළිසරණ ලබා දීමෙන් යම් යම් අනිශ්චිත වගකීම් දරන අතර නඩු පැවරීමේ පාර්ශවයක් වන අවස්ථා ද ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේදී මෙම බැඳීම් පිළිගැනීම සිදු නොවූව ද , ඒවායේ මෙහෙයුම් අවදානම අත් නොහැරෙන අතර එම නිසා සමූහයේ සහ සමාගමේ සමස්ත අවදානම් ස්වරූපයෙහි කොටසක් බවට එය පත් වේ. කෙසේ වෙතත්, මෙම ගනුදෙනු හේතුවෙන් ප්‍රාමාණික අලාභයක් අපේක්ෂා නොකෙරේ

| මාර්තු 31 වන විට | සටහන | පිටු අංකය | සමාගම 2022 රු.'000 | සමාගම 2021 රු.'000 | සමූහය 2022 රු.'000 | සමූහය 2021 රු.'000 |
|---|---|---|---|---|---|---|
| සමාගමට එරෙහිව නඩු කටයුතු | 50.1.1 | 303 | 242,797 | 182,451 | 242,797 | 182,451 |
| ඇපකර - සම්බන්ධිත පාර්ශවයන් | 50.1.2 | 303 | - | 300,000 | - | 300,000 |
| ඇපකර - වෙනත් | 50.1.3 | 303 | 175,250 | 164,098 | 175,250 | 164,098 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තක්සේරුව | 50.1.4 | 304 | 50,953 | 50,953 | 97,942 | 97,942 |
| අපේක්ෂිත බිල් විශ්‍රාම | | | - | - | - | - |
| එකතුව | | | 469,000 | 697,502 | 515,989 | 744,491 |

#### 50.1.1. සමාගමට එරෙහිව නඩු පැවරීම

පවත්වා ගෙන යන ව්‍යාපාරයේ ස්වභාවය හේතුවෙන් මූල්‍ය කර්මාන්තය තුළ නඩු පැවරීම සාමාන්‍ය දෙයකි. නෛතික හිමිකම් කළමනාකරණය සඳහා සමාගමට විධිමත් පාලනයන් සහ ප්‍රතිපත්ති ඇත. සමාගම විසින් සිය මූල්‍ය ප්‍රකාශන තුළින් සිදුවිය හැකි පාඩු සඳහා ප්‍රතිපාදන සලසා ඇත්නම් හෝ හානි පියවීම සඳහා සාධාරණ ආරක්තිබේ නම්, අපේක්ෂිත නීතී හිමිකම් පෑම් පහතින් ඇතුළත් නොකෙරෙන්නේ සමාගම එවැනි හිමිකම් වලින් මුදල් ලැබේ යැයි බලාපොරොත්තු නොවන බැවිනි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ඉදිරිපත් කළ දිනය වන විට සේවාදායකයින් හතළිස් හයක් (46) සමාගමට එරෙහිව නඩු පවරා තිබේ. සමාගමේ නීති උපදේශකගේ අදහස වන්නේ දැනට විභාග වෙමින් පවතින නඩු මගින් වාර්තා වන මූල්‍ය ප්‍රතිඵල හෝ සමාගමේ අනාගත මෙහෙයුම් කටයුතු කෙරෙහි කිසිදු ප්‍රාමාණික බලපෑමක් සිදු නොවන බවයි.

#### 50.1.2 ඇපකර - සම්බන්ධිත පාර්ශව

මයික්‍රො කොමර්ස් ලිමිටඩ් සමාගම විසින් යම් බැංකුවකින් අයිරා පහසුකම ලබා ගැනීම සඳහාලබා දෙන සහතිකය ඔස්සේ පිළිගැනේ, මයික්‍රො කොමර්ස් ලිමිටඩ් සමාගමට ණය ආපසු ගෙවීමට නොහැකි වුවහොත්, පරිපාලිතය වෙනුවෙන් ණය ගෙවීමට සමාගම කැප වේ.

#### 50.1.3 ඇපකර - වෙනත්

ස්ථාවර තැන්පතු පාරිභෝගිකයින්ගෙන් තෙවන පාර්ශවයක් සඳහා කරන ලද ඉල්ලීමක් මත සමාගම විසින් නිකුත් කරන ලද සහතිකයකට අනුව පාරිභෝගිකයාට ගෙවීම් පියවීමට නොහැකි වූ විට පාරිභෝගිකයා වෙනුවෙන් අදාළ වගකීම් පියවීමට කටයුතු කෙරේ.

## 50. අසම්භාව්‍ය වගකීම් (සබැඳේ)

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 50.1.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබූ තක්සේරුව

2010/11 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සමාගම තක්සේරුව (VATFS/BFSU/2014/581) ලැබූ අතර එය රු. 50,953,390/- ක් වූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පක්ෂව එම තීරණය ලබා දී ඇත. මෙම තීරණය සම්බන්ධයෙන් සාධාරණ හේතු සහිතව අභියාචනාධිකරණයේදී සමාගම විසින් අභියාචනය කර ඇත. බදු උපදේශකයින් සමාගම වෙනුවෙන් පෙනී සිටී.

### 50.2 බැඳීම්

මාර්තු 31 දින වන විට පහත සඳහන් පරිදි සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියට අදාළ දේපල, පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ ප්‍රයෝජනයට නොගත් පහසුකම් ලබා ගැනීම සඳහා සමූහය/සමාගම කැපවී සිටී:

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| ප්‍රාග්ධන බැඳීම් | | | | |
| අනුමත කර ගිවිසුම් ගත කරන ලද | - | - | - | - |
| අනුමත කර ඇති නමුත් ඒ සඳහා ගිවිසුම් ගත කර නොමැති | 1,093,909 | 1,485,544 | 1,093,909 | 1,485,544 |
| අනු එකතුව | 1,093,909 | 1,485,544 | 1,093,909 | 1,485,544 |
| ප්‍රයෝජනයට නොගත් පහසුකම් | | | | |
| ආන්තික වෙළඳාම | 4,263,065 | 6,646,678 | 4,263,065 | 6,646,678 |
| ෆාස්ට් ට්‍රැක් | 577,652 | 828,677 | 577,652 | 828,677 |
| සාධකකරණය | 448,608 | 1,339,710 | 448,608 | 1,339,710 |
| අනු එකතුව | 5,289,325 | 8,815,065 | 5,289,325 | 8,815,065 |
| එකතුව | 6,383,234 | 10,300,609 | 6,383,234 | 10,300,609 |

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, භාවිතා නොකරන ලද චක්‍රීය පහසුකම් වටිනාකම පිළිබඳව සලකා බැලිණ. එබැවින් ප්‍රයෝජනයට නොගත් පහසුකම් සඳහා දීමනාව 263 පිටුවේ 25.7 දරණ සටහනට ඇතුළත් කර ඇත.

### 51. සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය

| මාර්තු 31 වන විට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| සමාගමේ කොටස් හිමියන්ට ආරෝපණය කළ යුතු සමස්ත කොටස් (රුපියල් '000) | 38,818,310 | 34,341,431 | 43,821,275 | 38,460,412 |
| මුළු කොටස් ගණන | 1,887,195,002 | 1,704,602,760 | 1,887,195,002 | 1,704,602,760 |
| සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම (රු.) | 20.57 | 20.15 | 23.22 | 22.56 |

## 52. ජංගම/ජංගම නොවන විශ්ලේෂණය

| සමාගම | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | මාස 12ක් ඇතුළත රු.'000 | මාස 12කින් පසු රු.'000 | එකතුව රු.'000 | මාස 12ක් ඇතුළත රු.'000 | මාස 12කින් පසු රු.'000 | එකතුව රු.'000 |
| **වත්කම්** | | | | | | |
| මුදල් හා මුදලට සමාන වූ දේ | 4,668,830 | - | 4,668,830 | 2,703,031 | - | 2,703,031 |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂයන් | 5,117,866 | - | 5,117,866 | 5,399,071 | - | 5,399,071 |
| මූල්‍ය වත්කම් - ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ වටිනාකම | 25,140 | - | 25,140 | 109,787 | - | 109,787 |
| ණය සහ ලැබිය යුතු දේ | 59,713,721 | 91,560,733 | 151,274,454 | 60,898,074 | 80,489,833 | 141,387,907 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 1,333,268 | 10 | 1,333,278 | 309,108 | 10 | 309,118 |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | 9,827,221 | - | 9,827,221 | 6,994,206 | - | 6,994,206 |
| පරිපාලිතයන්හි ආයෝජන | - | 3,213,788 | 3,213,788 | - | 3,213,788 | 3,213,788 |
| වෙනත් වත්කම් | 589,938 | 159,216 | 749,154 | 414,777 | 160,883 | 575,660 |
| දේපළ, පිරියත සහ උපකරණ | - | 1,413,776 | 1,413,776 | - | 1,049,250 | 1,049,250 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | - | 1,972,380 | 1,972,380 | - | 2,242,444 | 2,242,444 |
| විලම්බිත බදු වත්කම් | - | 1,146,726 | 1,146,726 | - | 415,841 | 415,841 |
| කීර්ති නාමය සහ අස්පෘශ්‍ය වත්කම් | - | 21,965 | 21,965 | - | 146,446 | 146,446 |
| මුළු වත්කම් | 81,275,984 | 99,488,594 | 180,764,578 | 76,828,054 | 87,718,495 | 164,546,549 |
| **වගකීම්** | | | | | | |
| බැංකු වෙත ඇති ණය | 5,534,119 | 6,215,213 | 11,749,332 | 2,965,482 | 3,473,828 | 6,439,310 |
| පාරිභෝගිකයින් වෙත ඇති ණය | 86,085,667 | 17,282,237 | 103,367,904 | 82,397,403 | 19,105,528 | 101,502,931 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 1,977,853 | 15,266,460 | 17,244,313 | 7,835,316 | 5,990,237 | 13,825,553 |
| වෙනත් මූල්‍ය වගකීම් | 3,636,528 | - | 3,636,528 | 4,132,110 | - | 4,132,110 |
| මෙහෙයුම් කල්බදු වගකීම් | 440,316 | 1,618,734 | 2,059,050 | 404,863 | 1,881,523 | 2,286,386 |
| ප්‍රවර්තන බදු වගකීම් | 1,851,676 | - | 1,851,676 | 362,450 | - | 362,450 |
| වෙනත් වගකීම් | 1,369,054 | - | 1,369,054 | 1,069,121 | - | 1,069,121 |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම | 54,921 | 613,490 | 668,411 | 90,630 | 496,627 | 587,257 |
| මුළු වගකීම් | 100,950,134 | 40,996,134 | 141,946,268 | 99,257,375 | 30,947,743 | 130,205,118 |
| ශුද්ධ වත්කම් | (19,674,150) | 58,492,460 | 38,818,310 | (22,429,321) | 56,770,752 | 34,341,431 |

| සමූහය | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | මාස 12ක් ඇතුළත රු.'000 | මාස 12කින් පසු රු.'000 | එකතුව රු.'000 | මාස 12ක් ඇතුළත රු.'000 | මාස 12කින් පසු රු.'000 | එකතුව රු.'000 |
| **වත්කම්** | | | | | | |
| මුදල් හා මුදලට සමාන වූ දේ | 5,402,587 | - | 5,402,587 | 3,844,694 | - | 3,844,694 |
| බැංකු හා මූල්‍ය ආයතන සමග ශේෂයන් | 9,529,518 | - | 9,529,518 | 8,231,101 | - | 8,231,101 |
| මූල්‍ය වත්කම් - ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ වටිනාකම | 849,298 | - | 849,298 | 1,281,753 | - | 1,281,753 |
| ණය සහ ලැබිය යුතු දේ | 69,526,174 | 93,794,672 | 163,320,846 | 61,399,922 | 85,604,082 | 147,004,004 |
| රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ | 1,322,528 | - | 1,322,528 | 1,024,461 | - | 1,024,461 |
| මූල්‍ය වත්කම් - වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට | 1,632,931 | 10 | 1,632,941 | 735,484 | 10 | 735,494 |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය | 12,964,438 | 3,049,087 | 16,013,525 | 9,975,284 | 956,430 | 10,931,714 |
| ආයෝජන දේපළ | - | 820,664 | 820,664 | - | 820,664 | 820,664 |
| වෙනත් වත්කම් | 672,610 | 159,216 | 831,826 | 771,575 | 160,883 | 932,458 |
| දේපළ, පිරියත සහ උපකරණ | - | 4,090,682 | 4,090,682 | - | 4,034,265 | 4,034,265 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | - | 1,539,484 | 1,539,484 | - | 1,591,297 | 1,591,297 |
| විලම්බිත බදු වත්කම් | - | 1,444,813 | 1,444,813 | - | 594,495 | 594,495 |
| කීර්ති නාමය සහ අස්පෘශ්‍ය වත්කම් | - | 139,603 | 139,603 | - | 265,506 | 265,506 |
| මුළු වත්කම් | 101,900,084 | 105,038,231 | 206,938,315 | 87,264,274 | 94,027,632 | 181,291,906 |
| **වගකීම්** | | | | | | |
| බැංකු වෙත ඇති ණය | 8,347,823 | 6,952,538 | 15,300,361 | 4,183,255 | 4,820,618 | 9,003,873 |
| පාරිභෝගිකයින් වෙත ඇති ණය | 93,978,628 | 17,475,122 | 111,453,750 | 84,638,188 | 19,105,528 | 103,743,716 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 1,962,543 | 15,140,680 | 17,103,223 | 7,820,059 | 5,864,457 | 13,684,516 |
| වෙනත් මූල්‍ය වගකීම් | 4,043,322 | - | 4,043,322 | 4,111,235 | - | 4,111,235 |
| ගෙවිය යුතු රක්ෂණ හා ප්‍රතිරක්ෂණ | - | 5,903,363 | 5,903,363 | - | 5,015,885 | 5,015,885 |
| මෙහෙයුම් කල්බදු වගකීම් | - | 1,588,115 | 1,588,115 | - | 1,614,660 | 1,614,660 |
| ප්‍රවර්තන බදු වගකීම් | 117,807 | 1,470,308 | 2,098,784 | 236,268 | 1,378,392 | 883,900 |
| වෙනත් වගකීම් | 1,399,030 | - | 1,399,030 | 1,156,822 | - | 1,156,822 |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම | 62,636 | 686,308 | 748,944 | 92,778 | 565,000 | 657,778 |
| විලම්බිත බදු වගකීම් | - | 323,621 | 323,621 | - | 297,568 | 297,568 |
| මුළු වගකීම් | 112,010,573 | 47,951,940 | 159,962,513 | 103,122,505 | 37,047,448 | 140,169,953 |
| ශුද්ධ වත්කම් | (10,110,489) | 57,086,291 | 46,975,802 | (15,858,231) | 56,980,184 | 41,121,953 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 53. කාණ්ඩ යටතේ මූල්‍ය වාර්තාකරණය

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහයේ කාණ්ඩගත වාර්තාකරණය පදනම් වී ඇත්තේ ව්‍යාපාරික අංශය මත ය.

කාණ්ඩයක් යනු නිෂ්පාදන හා සේවා සැපයීමේ යෙදී සිටින සමූහයේ කැපී පෙනෙන අංශයකි. (ව්‍යාපාර අංශය ගත් විට අනෙකුත් අංශවලට වඩා වෙනස් අවදානම් සහ ප්‍රතිලාභ ලබයි).

කාණ්ඩයේ ප්‍රතිඵල, වත්කම් හා වගකීම් වලට ඍජුවම ආරෝපණය කළ හැකි මෙන්ම සාධාරණව වෙන් කළ හැකි අයිතමයන් ඇතුළත් වේ.

කාණ්ඩ සම්බන්ධයෙන් වාර්තාකරණය සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති නම් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මය.

අන්තර් කාණ්ඩ ගනුදෙනුවලදී වෙනත් සමාගම්වලින් අය කරන ආකාරයට ම තරඟකාරී සාධාරණ වෙළෙඳපොළ මිල ගණන් යටතේ අය කිරීම් සිදු කෙරිණ. ගිණුම් ඒකාබද්ධ කිරීමේදී එවැනි සේවාවන් ඉවත් කෙරේ.

ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිති - SLFRS - 8 හි විධිවිධානයට අනුව, කණ්ඩායමේ මෙහෙයුම් අංශය හඳුනා ගැනීමට ලක් ව ඇත්තේ වෙනස් ආකාරයකින් වන අතර අවදානම් මට්ටම සහ වරප්‍රසාද අනෙක් කාණ්ඩයන්ගෙන් සැලකිය යුතු ලෙස වෙනස් වන අතර එහි දී නිෂ්පාදන සහ සේවාවන් පදනම් කර ගැනේ.

සමූහයේ ඉහළ කළමනාකාරීත්වය එහි තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සහ කාර්ය සාධන ඇගයීමේදී එහි ව්‍යාපාරික අංශ වල මෙහෙයුම් ප්‍රතිඵල සහ තත්වය සලකා බලයි. සෑම මෙහෙයුම් අංශයක්ම එහි ආදායම ලබන නිෂ්පාදන සහ සේවා වර්ග පහත පරිදි විස්තර කර ඇත;

**කල්බදු සහ කුලී පිට ගැනුම්**
ගනුදෙනුකරුවන්ට පිරිනමන කල්බදු සහ කුලී පිට ගැනුම් සැලසුම් මෙම අංශයට ඇතුළත් ය.

**ණය**
මෙම අංශයේ පාරිභෝගිකයින්ට පිරිනමන ණය සැලසුම් ඇතුළත් වේ.

**ඉස්ලාමීය**
මෙම අංශයට පාරිභෝගිකයින්ට පිරිනමන ඉජාරා, මුරාබා, මුෂාරකා සහ වෙළඳ මුරබා සැලසුම් ඇතුළත් වේ.

**රක්ෂණ ව්‍යාපාර**
රක්ෂණ ව්‍යාපාර අංශයට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය අයත් වේ.

**වෙනත් ව්‍යාපාර**
ඉහත කොටසේ හැර සමූහයේ යෙදී සිටි අනෙකුත් සියලු ව්‍යාපාරික කටයුතු මෙම කොටසට ඇතුළත් වේ.

| | කල්බදු සහ කුලී පිට ගැනුම් | | ණය | | ඉස්ලාමීය | | රක්ෂණ | | වෙනත් | | ඉවත් කිරීම් | | සමූහය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාර්තු 31 අවසන් වූ වසර සඳහා | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| පොලී ආදායම | 12,462,608 | 14,076,446 | 10,530,761 | 10,175,781 | 1,035,736 | 1,180,184 | 701,136 | 718,734 | 1,415,774 | 872,270 | (219,223) | (201,577) | 25,926,792 | 26,821,838 |
| ශුද්ධ උපයන වාරිකය | - | - | - | - | - | - | 5,123,003 | 5,198,693 | - | - | (183,932) | (170,144) | 4,939,071 | 5,028,549 |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 1,120,503 | 1,147,474 | 946,812 | 829,502 | 93,122 | 96,205 | - | - | 202,123 | 209,887 | (1,041,047) | (1,085,014) | 1,321,513 | 1,198,054 |
| ශුද්ධ වෙළදාම් ආදායම | - | - | - | - | - | - | 71,272 | 65,631 | 15,253 | 162,627 | - | - | 86,525 | 228,258 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 146,024 | 90,553 | 123,389 | 65,460 | 12,136 | 7,592 | 58,022 | 61,820 | 1,124,879 | 311,463 | (1,107,365) | (168,322) | 357,085 | 368,566 |
| දළ ආදායම | 13,729,135 | 15,314,473 | 11,600,962 | 11,070,743 | 1,140,994 | 1,283,981 | 5,953,433 | 6,044,878 | 2,758,029 | 1,556,247 | (2,551,567) | (1,625,057) | 32,630,986 | 33,645,265 |
| පොලී වියදම් | 5,366,101 | 7,114,388 | 4,534,295 | 5,142,949 | 445,963 | 596,477 | - | - | 1,077,990 | 722,960 | (219,223) | (201,577) | 11,205,126 | 13,375,197 |
| මුළු මෙහෙයුම් ආදායම | 8,363,034 | 8,200,085 | 7,066,667 | 5,927,794 | 695,031 | 687,504 | 5,953,433 | 6,044,878 | 1,680,039 | 833,287 | (2,332,344) | (1,423,480) | 21,425,860 | 20,270,068 |
| ණය අලාභ වියදම් | 785,927 | 670,935 | 194,519 | 693,649 | (23,067) | (67,802) | - | - | (5,623) | 55,707 | - | - | 951,756 | 1,352,489 |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 7,577,107 | 7,529,150 | 6,872,148 | 5,234,145 | 718,098 | 755,306 | 5,953,433 | 6,044,878 | 1,685,662 | 777,580 | (2,332,344) | (1,423,480) | 20,474,104 | 18,917,579 |
| ක්ෂය වීම | 282,547 | 343,502 | 324,649 | 316,567 | 29,548 | 21,563 | 102,316 | 97,289 | 69,411 | 57,405 | (169,807) | (188,633) | 638,664 | 647,693 |
| කාණ්ඩ ප්‍රතිඵලය | 4,252,022 | 4,037,333 | 3,592,909 | 2,918,564 | 353,375 | 338,494 | 995,844 | 1,570,221 | 854,183 | 410,271 | (1,117,206) | (170,247) | 8,931,127 | 9,104,636 |
| අඩු වීම්: මුල්‍ය සේවා සඳහා බදු | | | | | | | | | | | | | 1,705,797 | 1,273,966 |
| පරිපාලිතයක අලාභ කොටස (බදු වලින් ශුද්ධව) | | | | | | | | | | | | | - | - |
| ආදායම් බදු වියදම | | | | | | | | | | | | | 2,407,161 | 2,234,336 |
| කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු ලාභය | | | | | | | | | | | | | 4,818,169 | 5,596,334 |
| මාර්තු 31 දිනට කාණ්ඩ වත්කම් | 81,759,467 | 82,140,914 | 91,065,698 | 75,700,016 | 8,524,799 | 5,156,381 | 12,102,543 | 11,133,855 | 20,032,202 | 13,727,582 | (6,546,396) | (6,566,842) | 206,938,315 | 181,291,906 |
| මුළු වත්කම් | 81,759,467 | 82,140,914 | 91,065,698 | 75,700,016 | 8,524,799 | 5,156,381 | 12,102,543 | 11,133,855 | 20,032,202 | 13,727,582 | (6,546,396) | (6,566,842) | 206,938,315 | 181,291,906 |
| | | | | | | | | | | | | | - | |
| කාණ්ඩ වගකීම් | 63,645,543 | 64,265,746 | 70,889,964 | 59,226,490 | 6,636,118 | 4,034,271 | 7,353,491 | 6,266,782 | 15,594,039 | 10,740,339 | (4,156,642) | (4,363,675) | 159,962,513 | 140,169,953 |
| මුළු වගකීම් | 63,645,543 | 64,265,746 | 70,889,964 | 59,226,490 | 6,636,118 | 4,034,271 | 7,353,491 | 6,266,782 | 15,594,039 | 10,740,339 | (4,156,642) | (4,363,675) | 159,962,513 | 140,169,953 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 54. ඇපයට තබන ලද වත්කම්

පහත සඳහන් වත්කම් වෙනුවෙන් වගකීම් සඳහා ඇප වශයෙන් තබා ඇත.

| වත්කම්වල ස්වභාවය | වගකීම්වල ස්වභාවය | ඇපයට තබන ලද ධාරණ වටිනාකම - සමාගම මාර්තු 31 2022 රු.'000 | සමාගම මාර්තු 31 2021 රු.'000 | සමූහය මාර්තු 31 2022 රු.'000 | සමූහය මාර්තු 31 2021 රු.'000 | යටතේ ඇතුළත් කරන ලද |
|---|---|---|---|---|---|---|
| කල් බදු මත ලැබිය යුතු කුලී | සුරක්ෂිතකරණය | 7,472,455 | 10,701,499 | 7,472,455 | 10,701,499 | ණය සහ ලැබිය යුතු දේ |
| | කාලසීමා ණය | 7,611,638 | - | 7,611,638 | - | ණය සහ ලැබිය යුතු දේ |
| | කෙටිකාලීන ණය | 16,307,463 | 17,408,077 | 16,307,463 | 17,408,077 | ණය සහ ලැබිය යුතු දේ |
| කුලී පිට ගැනුම් මත ලැබිය යුතු කුලී | සුරක්ෂිතකරණය | - | - | - | - | ණය සහ ලැබිය යුතු දේ |
| | කාලසීමා ණය | - | - | 1,037,255 | 1,037,255 | ණය සහ ලැබිය යුතු දේ |
| | කෙටිකාලීන ණය | - | 2,340 | 46,705 | 49,045 | ණය සහ ලැබිය යුතු දේ |
| ණය මත ලැබිය යුතු කුලී | සුරක්ෂිතකරණය | 413,373 | 1,315,592 | 413,373 | 1,315,592 | ණය සහ ලැබිය යුතු දේ |
| | කාලසීමා ණය | 9,195,305 | 3,754,149 | 9,195,305 | 3,754,149 | ණය සහ ලැබිය යුතු දේ |
| ස්ථාවර තැන්පතු | තක්සේරුව සඳහා බැංකු ඇපකරය | - | - | 14,553 | 14,000 | අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් |
| ස්ථාවර තැන්පතු | අයිරා | - | - | 75,000 | 75,000 | බැංකු සහ මූල්‍ය ආයතන වල ශේෂයන් |
| සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි | කාලසීමා ණය | - | - | 3,818,007 | 3,818,007 | දේපළ, පිරියත සහ උපකරණ |

## 55. සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 24 ( සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම) අනුව සම්බන්ධිත පාර්ශවයන් ලෙස අර්ථ දක්වා ඇති පාර්ශවයන් සමඟ සමාගම සහ සමූහ ව්‍යාපාර සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී ගණුදෙනු සිදුකරන අතර ඒ පිළිබඳ විස්තර පහත දක්වා ඇත:

### 55.1 මව් සමාගම සහ පරම පාලක පාර්ශ්ව

මහජන බැංකුව සමාගමේ මව් සමාගම වන අතර එය රජයට අයත් ආයතනයකි.

### 55.2 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS -24) - " සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව්" කිරීමේ ප්‍රතිපත්තිය අනුව, ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට සමාගමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලතල සහ වගකීම් පවතී. ඒ අනුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, මව් සමාගම සහ සමාග මේ ආයතනික කළමනාකරණ සාමාජිකයින් සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත.

සමාගම සැලකිය යුතු දුරස්ථභාවයක් පවත්වා ගෙන යෑමේ පදනම යටතේ වාණිජමය මිල ගණන් මත ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින් සමඟ ව්‍යාපාරික කටයුතු කරයි.

ප්‍රධාන කළමනාකරණ පිරිස්හි සමීපතම පවුලේ සාමාජිකයින් නම් ආයතනය සමඟ කටයුතු කිරීමේදී ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට බලපෑම් කිරීමට හෝ බලපෑම් කිරීම සිදුකිරීමේ විභවයක් ඇති පවුලේ සාමාජිකයන්ය.

### 55.2.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින් සමග ගණුදෙනු

**ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා පාරිතෝෂික**

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පාරිතෝෂික

| මාර්තු 31න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| සේවකයින් සඳහා වන කෙටිකාලීන ප්‍රතිලාභ | 4,939 | 3,863 | 12,711 | 7,919 |
| එකතුව | 4,939 | 3,863 | 12,711 | 7,919 |

(ආ) ආයතනික කළමනාකාරිත්වය සඳහා පාරිතෝෂික

| මාර්තු 31න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 163,457 | 153,815 | 227,342 | 213,700 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | 15,529 | 14,351 | 17,605 | 16,235 |
| සමස්ත | 178,986 | 168,166 | 244,947 | 229,935 |

ඉහත සඳහන් කරුණු වලට අමතරව සමාගමේ අනුමත සේවා කොන්දේසි වලට අනුකූලව සමාගම විසින් නඩත්තු කරන ලද වාහන වැනි මුදල් නොවන ප්‍රතිලාභ ද ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ලබා දී ඇත.

### 55.2.2 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග කොටස් ගණුදෙනු සිදු කිරීම

| මාර්තු 31න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| සතු වූ සාමාන්‍ය කොටස් ගණන | 673,685 | 1,147,720 | 855,185 | 1,326,220 |
| කොටස්කර ලාභාංශය (කොටස් ගණන) | 64,892 | 51,773 | 69,392 | 51,773 |

### 55.2.3 ප්‍රධාන කළමනාකරණ පිරිස්, ඔවුන්ගේ සමීප පවුල් සාමාජිකයින් සහ අනෙකුත් අදාළ ආයතන සම්බන්ධ ගනුදෙනු, විධිවිධාන සහ ගිවිසුම්.

(අ) ආදායම් ප්‍රකාශයෙහි අයිතම

| මාර්තු 31න් අවසන් වූ වසර සඳහා | අධ්‍යක්ෂ මණ්ඩලය | | ආයතනික කළමනාකරණය | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| පොලී ආදායම | 26 | 26 | 312 | 5,488 | 338 | 5,514 |
| පොලී වියදම් | 4,495 | 9,179 | 21,702 | 37,140 | 26,197 | 46,319 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 55. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම (සබැදේ)

(ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අයිතම

| මාර්තු 31 දිනට | අධ්‍යක්ෂ මණ්ඩලය | | ආයතනික කළමනාකරණය | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 |
| **වත්කම්** | | | | | | |
| ණය සහ ලැබිය යුතු දේ | - | - | 8,921 | 10,317 | 8,921 | 10,317 |
| | - | - | 8,921 | 10,317 | 8,921 | 10,317 |
| **වගකීම්** | | | | | | |
| ගණුදෙනුකරුවන් වෙත ඇති ණය | 63,263 | 59,748 | 286,951 | 351,430 | 350,214 | 411,178 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | - | - | - | - | - | - |
| | 63,263 | 59,748 | 286,951 | 351,430 | 350,214 | 411,178 |

## 55.3 ශුද්ධ පහසුකම් සහ ප්‍රාග්ධන අරමුදල් වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පහසුකම්

| මාර්තු 31 දිනට | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>% | 2021<br>% |
|---|---|---|---|---|
| මහජන බැංකුව | - | - | - | - |
| පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම | 560,310 | 599,301 | 1.44 | 1.75 |
| පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම | 3,528 | - | 0.01 | - |
| පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම | 835,187 | 830,096 | 2.15 | 2.42 |
| පීපල්ස් මයික්‍රො කොමර්ස් සමාගම | 1,495 | 2,700 | - | - |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 35,236 | 49,908 | 0.09 | 0.15 |
| ලංකන් එලායන්ස් ෆිනෑන්ස් පීඑල්සී | 27,155 | 27,155 | 0.07 | 0.08 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | - | - | - | - |
| ආයතනික කළමනානකරණය | 8,921 | 10,317 | 0.02 | 0.03 |
| මුළු ශුද්ධ පහසුකම් | 1,471,832 | 1,519,477 | 3.78 | 4.42 |

## 55.4 අදාළ ආයතන සමග ගනුදෙනු

**ශ්‍රී ලංකා රජය සහ රජයට සම්බන්ධ ආයතන සමග ගනුදෙනු**

සමාගමේ සමීපතම මව් සමාගම වන්නේ රජයට අයත් මහජන බැංකුවයි. සමාගම ශ්‍රී ලංකා රජය සහ ඒ හා අදාළ ආයතන සමග ගනුදෙනු, විධිවිධාන හා ගිවිසුම්වලට එළඹේ. වසර තුළදී සැළකිය යුතු මූල්‍යමය ගනුදෙනු මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පහත දැක්වෙන පරිදි වේ:

(අ) ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන අයිතම

| මාර්තු 31න් අවසන් වූ වසර සඳහා | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022<br>රු.'000 | 2021<br>රු.'000 | 2022<br>රු.'000 | 2021<br>රු.'000 |
| පොලී ආදායම | 7,663 | 4,542 | 7,663 | 4,542 |
| පොලී වියදම් | 746,204 | 563,910 | 746,204 | 563,910 |

(ආ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ අයිතම

| මාර්තු 31 දිනට | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| ණය සහ ලැබිය යුතු දේ | 49,571 | 28,308 | 49,571 | 28,308 |
| එකතුව | 49,571 | 28,308 | 49,571 | 28,308 |
| වගකීම් | | | | |
| බැංකු වෙත ඇති ණය | 263,602 | 951,073 | 263,602 | 951,073 |
| ගණුදෙනුකරුවන් වෙත ඇති ණය | 1,031,702 | 1,128,019 | 1,031,702 | 1,128,019 |
| නිකුත් කරන ලද ණය සුරැකුම් | - | - | - | - |
| එකතුව | 1,295,304 | 2,079,092 | 1,295,304 | 2,079,092 |

තවද, සාමාන්‍ය ව්‍යාපාර ක්‍රමයට අදාළ ගනුදෙනු පහත විස්තර කර ඇති පරිදි සිදු කර තිබෙන අතර, ශ්‍රී ලංකා රජය සහ ඊට අදාළ ආයතන සමඟ එම ක්‍රියාවලිය අනුව ගණුදෙනුවලට එළැඹී තිබේ.

- භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන
- ව්‍යවස්ථාපිත ගාස්තු සහ බදු ගෙවීම්
- ප්‍රධාන වශයෙන් දුරකථන, විදුලිය සහ ජල ආදී උපයෝගිතා සඳහා ගෙවීම්
- රැකියා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා ගෙවීම් - සේවක භාර අරමුදල ETF
- සම්මත ගාස්තු මත පදනම්ව ගෙවන මෝටර් රථ රෙජිස්ට්‍රාර් සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශ ගාස්තු

ඇ) කේවල වශයෙන් වැදගත් ගනුදෙනු
දෛනික ව්‍යාපාරික මෙහෙයුම් හැරුණු විට, ශ්‍රී ලංකා රජය හෝ රජයට සම්බන්ධ ආයතන සමග කේවල වශයෙන් වැදගත් ගනුදෙනු සිදු නොවීය.

### 55.4.1 සමාගම

සමාගම විසින් මූල්‍ය වර්ෂය තුළ පහත සඳහන් අදාළ ආයතන සමඟ මතු දැක්වෙන මූල්‍ය ගනුදෙනු සිදු කර ඇත.
(අ) ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන අයිතම

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | මව් සමාගම | | පරිපාලිතයන් | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| පොලී ආදායම | 1,142,425 | 755,692 | 153,122 | 131,352 |
| පොලී වියදම් | 103,669 | 118,748 | 162,077 | 126,096 |
| ගාස්තු සහ කොමිෂන් ආදායම් | - | - | 655,763 | 715,240 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | - | - | 945,670 | 110,000 |
| ප්‍රතිලාභ, හිමකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | - | - | 167,402 | - |
| ක්ෂය වීම සහ ක්‍රමක්ෂය වීම | 13,719 | 22,928 | 215,791 | 231,555 |
| වෙනත් මෙහෙයුම් වියදම් | - | - | 20,561 | 195,950 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 55. සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම (සබැඳේ)

(ආ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ අයිතම

| මාර්තු 31 දිනට | මව් සමාගම | | පරිපාලිතයන් | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **වත්කම්** | | | | |
| මුදල් සහ මුදලට සමාන දෑ | 3,500,703 | 1,755,592 | - | - |
| බැංකු සහ මූල්‍ය ආයතන සමග ඇති ශේෂයන් | 5,117,866 | 5,399,071 | - | - |
| ණය සහ ලැබිය යුතු දේ | - | - | 1,471,124 | 1,509,160 |
| මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැය | 9,827,221 | 6,319,142 | - | - |
| පරිපාලිත/හවුල්කාර සමාගම් වල ආයෝජන | - | - | 3,213,788 | 3,213,788 |
| වෙනත් වත්කම් | - | - | 376,555 | 168,802 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 21,753 | 134,618 | 584,173 | 798,632 |
| **එකතුව** | 18,467,543 | 13,608,423 | 5,645,640 | 5,690,382 |
| **වගකීම්** | | | | |
| බැංකු වෙත ඇති ණය | 333,018 | 1,398,943 | - | - |
| ගණුදෙනුකරුවන් වෙත ඇති ණය | 1,031,702 | 1,128,019 | 564,298 | 703,477 |
| නිකුත් කරන ලද ණය සුරැකුම්පත් | - | - | 141,090 | 141,037 |
| වෙනත් මූල්‍ය වගකීම් | - | - | 682,454 | 685,294 |
| වෙනත් වගකීම් | 1,118 | 3,018 | 8,769 | 11,109 |
| කල්බදු වගකීම් | 24,424 | 149,204 | 647,548 | 835,759 |
| **එකතුව** | 1,390,262 | 2,679,184 | 2,044,159 | 2,376,676 |

ඇ) ගණුදෙනු

| | මව් සමාගම | | පරිපාලිතයන් | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| ණයකර නිකුතුව සහ සුරක්ෂිතකරණය සම්බන්ධ ගණුදෙනු පිරිවැය | 178 | 478 | - | - |
| මෝටර් රථ මිලදී ගැනීම | - | - | 215,100 | - |
| ගෙවන ලද ගොඩනැගිලි කුලී | 27,435 | 36,231 | 284,352 | 282,917 |
| ලද ගොඩනැගිලි කුලී | - | 18,293 | 8,992 | |
| මුදල් සහ මුදල් සමාන - නැවත මිළ දී ගැනීමේ ආයෝජන | 48,312,210 | 4,950,000 | - | - |
| මුදල් සහ මුදල් සමාන - නැවත මිළ දී ගැනීමේ පියවීම් | 47,856,467 | 10,117,940 | - | - |
| බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ඇති ශේෂයන් - ස්ථාවර තැන්පතු ආයෝජන | 30,785,830 | 24,145,286 | - | - |
| බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ඇති ශේෂයන් - ස්ථාවර තැන්පතු ආපසු ගැනීම් | 31,510,851 | 22,294,433 | - | - |
| ණය සහ ලැබිය යුතුදේ - ප්‍රදාන | - | - | 326,170 | 537,481 |
| ණය සහ ලැබිය යුතුදේ - ආපසු ගෙවීම් | - | - | 348,048 | 663,796 |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය - ආයොජන | 31,590,690 | 22,598,347 | - | - |
| ණය සාධනපත්‍ර - ක්‍රමක්ෂය පිරිවැය - පියවීම් | 28,631,105 | 20,089,756 | - | - |
| බැංකු වෙත ගෙවිය යුතු - ණය ලබාගැනීම් | - | 1,000,000 | - | - |
| බැංකු වෙත ගෙවිය යුතු - ආපසු ගෙවීම් | 472,626 | 1,575,922 | - | - |
| ගණුදෙනකරුවන් වෙත ගෙවිය යුතු - ආයෝජන | 389,246 | 516,030 | 1,063,578 | 702,487 |
| ගනුදෙනකරුවන් වෙත ගෙවිය යුතු - පියවීම් | 292,930 | 186,774 | 945,304 | 441,997 |
| වෙනත් මූල්‍ය වගකීම් - ලබාගත් සේවාවන් | - | 8,489 | 9,306 | |
| වෙනත් මූල්‍ය වගකීම් - ආපසු ගෙවීම් | - | 8,488 | 9,270 | |
| ගෙවන ලද ලාභාංශ | 1,634,944 | 732,467 | - | - |
| ලද ලාභාංශ | - | - | 930,625 | 110,000 |
| පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පීඑල්සී විසින් හඳුන්වා දුන් පාරිභෝගිකයින් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවන ලද | - | - | 2,959,667 | 3,397,566 |
| **එකතුව** | 221,504,512 | 108,243,664 | 7,108,114 | 6,163,812 |

(ඇ) ශේෂ පත්‍රයෙන් පිටත අයිතම

| මාර්තු 31 දිනට | මව් සමාගම | | පරිපාලිතයන් | |
|---|---|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 |
| ඇපකර | - | - | - | 300,000 |
| එකතුව | - | - | - | 300,000 |

### 55.4.2 සමූහය

සමූහය විසින් මූල්‍ය වර්ෂය තුළ පහත සඳහන් අදාළ ආයතන සමඟ මතු දැක්වෙන මූල්‍ය ගනුදෙනු සිදු කර ඇත.

(අ) ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන අයිතම

| මාර්තු 31 න් අවසන් වූ වසර සඳහා | ආසන්නතම මව් සමාගම | |
|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 |
| පොලී ආදායම | 1,218,355 | 800,369 |
| පොලී වියදම් | 112,817 | 113,534 |
| ශුද්ධ උපයන වාරික | 253,839 | 404,434 |
| ගාස්තු සහ කොමිෂන් ආදායම් | 32,987 | 33,601 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 111,796 | 132,221 |
| ප්‍රතිලාභ, හිමිකම්පෑම් සහ ප්‍රාරක්ෂණ වියදම් | 25,650 | 74,736 |
| ක්ෂය වීම සහ ක්‍රමක්ෂය වීම | 13,719 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | - | 22,928 |

(ආ) මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ අයිතම

| මාර්තු 31 වන විට | ආසන්නතම මව් සමාගම | |
|---|---|---|
| | 2022 රු.'000 | 2021 රු.'000 |
| **වත්කම්** | | |
| මුදල් සහ මුදලට සමාන දෑ | 3,907,522 | 2,054,940 |
| බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ඇති ශේෂයන් | 5,722,035 | 6,137,065 |
| ණය සහ ලැබිය යුතු දේ | - | - |
| රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ | 190,536 | 184,548 |
| මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැය | 9,827,221 | 6,319,142 |
| පරිපාලිත/හවුල්කාර සමාගම් වල ආයෝජන (අපහායනයෙන් ශුද්ධව) | - | - |
| වෙනත් වත්කම් | 7,432 | 10,166 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 21,753 | 134,618 |
| **එකතුව** | 19,676,499 | 14,840,479 |
| **වගකීම්** | | |
| බැංකු වෙත ඇති ණය | 607,755 | 1,524,537 |
| නිකුත් කරන ලද ණය සුරැකුම්පත් | 1,031,702 | 1,128,019 |
| වෙනත් වගකීම් | 10,126 | 10,940 |
| කල්බදු වගකීම් | 24,424 | 149,204 |
| **එකතුව** | 1,674,007 | 2,812,700 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 55. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම (සබැදේ)

### 55.5 සමාගමේ දළ ආදායමෙන් 10% ඉක්මවන ගනුදෙනු.

| | | | ගණුදෙනු වල වටිනාකම | | ගනුදෙනු වටිනාකම දළ ආදායමෙන් % ක් ලෙස | | |
|---|---|---|---|---|---|---|---|
| සම්බන්ධිත පාර්ශවයේ නම | සම්බන්ධතාව | ගණුදෙනුවේ ස්වභාවය | 2022 රු.'000 | 2021 රු.'000 | 2022 රු.'000 | 2021 රු.'000 | නියමයන් හා කොන්දේසි |
| මහජන බැංකුව | ආසන්නතම මව් සමාගම | ප්‍රතිමිලදීගැනීමේ ආයෝජන | 48,312,210 | 4,950,000 | 180.66% | 18.26% | සාමාන්‍ය කොන්දේසි |
| | | ප්‍රතිමිලදීගැනීමේ ආයෝජන | 47,856,467 | 10,117,940 | 178.96% | 37.33% | සාමාන්‍ය කොන්දේසි |
| | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම් | 31,510,851 | 22,294,433 | 117.84% | 82.26% | සාමාන්‍ය කොන්දේසි |
| | | භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 31,590,690 | 22,598,347 | 118.13% | 83.38% | සාමාන්‍ය කොන්දේසි |
| | | භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 28,631,105 | 20,089,756 | 107.07% | 74.12% | සාමාන්‍ය කොන්දේසි |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | පරිපාලිතය | රක්ෂණ වාරිකය | 2,959,667 | 3,397,566 | 11.07% | 12.54% | සාමාන්‍ය කොන්දේසි |

## 56. අවදානම් කළමනාකරණය (සමාගම/සමූහය)

### 56.1 හැඳින්වීම

සමූහ ක්‍රියාකාරකම් වලදී අවදානම් ආවේණික වන නමුත් අවදානම් සීමාවන් සහ අනෙකුත් පාලනයන්ට යටත්ව එම අවදානම් අඛණ්ඩව හඳුනා ගැනීම, මැනීම සහ අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ඔස්සේ ඒවා කළමනාකරණය කර ගැනීමට කටයුතු කෙරේ. සමාගමේ අඛණ්ඩ ලාභදායිතාව, තිරසාරභාවය සඳහා මෙම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ඉතා වැදගත් වන අතර සමාගමේ සිටින සෑම පුද්ගලයෙකුම ඔහුගේ හෝ ඇයගේ වගකීම්වලට අදාළ අවදානම් හෙළිදරව් සඳහා වග කිව යුතුය. සමාගම මූලික වශයෙන් ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපල අවදානම සඳහා නිරාවරණය වී ඇත. සමාගම විවිධ මෙහෙයුම් අවදානම් වලට ද යටත් වේ. අවදානම් කළමනාකරණ කොටසේ දී අවදානම් විශ්ලේෂණය සම්බන්ධයෙන් විස්තරාත්මකව කරුණු දක්වා ඇත.

### අවදානම් කළමනාකරණ ව්‍යුහය

සමස්ත අවදානම් කළමනාකරණ ප්‍රවේශය සහ අවදානම් කළමනාකරණ උපාය මාර්ග සහ මූලධර්ම අනුමත කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම තුළ සමස්ත අවදානම් ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ වගකීම ඇති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවක් අනුකමිටුවක් වශයෙන් පත් කර ඇත.

අවදානම් උපාය මාර්ග සකස් කිරීමේ මූලධර්ම, රාමු, ප්‍රතිපත්ති සහ සීමාවන් ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම අවදානම් කළමනාකරණ කමිටුවට පැවරේ. අවදානම් සම්බන්ධ තීරණ කළමනාකරණය කිරීම සහ අවදානම් මට්ටම් නිරීක්ෂණය කිරීම සහ වරින් වර මණ්ඩලයට වාර්තා කිරීම එම කමිටුවේ වගකීම වේ.

සමාගම පුරා අවදානම් මූලධර්ම, ප්‍රතිපත්ති සහ සීමාවන් වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා අවදානම් සහ පාලන ඒකකය වගකිව යුතුය.

### වත්කම් හා වගකීම් කමිටුව (ALCO)

වත්කම් හා වගකීම් කමිටුවෙහි ප්‍රධානත්වය ප්‍රධාන විධායක නිලධාරියා විසින් උසුලනු ලබයි. කමිටුවෙහි අනෙකුත් ස්ථිර සාමාජිකයින් අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මෙහෙයුම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-මෙහෙයුම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-අවදානම් සහ පාලන, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- ප්‍රතිසාධන සහ පරිපාලන, තැන්පතු අංශයේ ප්‍රධානී, මූල්‍ය අංශයේ ප්‍රධානී, භාණ්ඩාගාර ප්‍රධානී සහ කමිටු ලේකම් සිටී. නියාමන අවශ්‍යතා සපුරාලන අතරම, සමාගමේ වත්කම් හා වගකීම් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සහ සමාගමේ ද්‍රවශීලතාවය නිරෝගී මට්ටමක පවත්වා ගැනීම සඳහා සමස්ත ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව කමිටු රැස්වීම් අවම වශයෙන් මසකට වරක්වත් පැවැත්විය යුතුය. ඊළඟ නිතිපතා රැස්වීම එනතෙක් කල්ගත නොහැකි ගැටලුවක් මතු වූ විට ඕනෑම නිත්‍ය සාමාජිකයෙකු කරන ඉල්ලීමක් මත කමිටුවෙහි සභාපතිවරයාට කාරක සභා විශේෂ රැස්වීමක් කැඳවිය හැකිය.

### ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව (හෝ "කමිටුව") කළමනාකරණ මට්ටමේ කමිටුවක් ලෙස පිහිටුවා ඇති අතර එමගින් සමාගමේ අවදානම් පාලන ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩල අනුකමිටු සහ ආයතන කළමනාකරණය වෙත අවදානම් කළමනාකරණය සඳහා සහාය වීම උදෙසා සමාගමේ ව්‍යාපාර කටයුතු සමඟ ඒකාබද්ධව කටයුතු කරයි.

කමිටුවේ යොමු නිර්දේශ මගින් පැහැදිලිවම එහි අධිකාරිය, ව්‍යවස්ථාව, රැස්වීමේ වාර ගණන, වගවීම සහ වගකීම්, ගණපූරණය, වාර්තා කිරීම සහ අනෙකුත් ක්‍රියා පටිපාටි දක්වා ඇත. මෙම යොමු නිර්දේශ 2021 දී යාවත්කාලීන කරන ලද අතර මණ්ඩලය විසින් අනුමත කොට ආදේශනය කරන ලදී.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුවෙහි ප්‍රධානත්වය අවදානම් ප්‍රධානියා විසින් දරනු ලබයි. කාරක සභාවේ සාමාජිකයින්ට ආයතනික කළමනාකරණ සාමාජිකයින් ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ අවදානම් දරා ගැනීමේ සීමාවන් තුළසිටිමින් ගනුදෙනුකරුවන් සමඟ අවදානම් සම්බන්ධයෙන් ගනුදෙනු කරන බැවින් සමාගමේ මෙහෙයුම් වලට සම්බන්ධ සියළුම ව්‍යාපාර කළමනාකරුවන් "අවදානම් හිමියන්" ලෙස හඳුනා ගත හැකිය. ඒ අනුව ව්‍යාපාර මෙහෙයුම්වලට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයින් ජ්‍යෙෂ්ඨ අවදානම් හිමිකරුවන් ලෙස සැලකිය හැකිය. එම නිසා, කමිටුව තුළ දී, සමාගමේ ජ්‍යෙෂ්ඨ අවදානම් හිමියන් විසින් ඉහළ මට්ටමක සහභාගීත්වයක් සිදු කිරීම අනිවාර්ය වේ.

කමිටුව අවධානය යොමු කළ යුත්තේ ඉදිරි පෙළේ උපකල්පිත අවදානම් සමාලෝචනය කිරීම, විශේෂයෙන් ණය අවදානම්, මෙහෙයුම් අවදානම සහ අනුකූල වීමේ අවදානම කෙරෙහි ය.

කමිටුව අවශ්‍ය වූ විට අවම වශයෙන් මාසික වශයෙන් හෝ අවශ්‍ය විටකදී හමුවිය යුතුය. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුව වෙත වග කිව යුතුය. කමිටුවේ අදහස්, එකඟතාවය සහ නිශ්චිත උපදෙස් ලබා ගැනීම සඳහා කමිටුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෙහෙයුම් කමිටුවේ රැස්වීම් විශේෂ සටහන්වල කරුණු ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වෙත ඉදිරිපත් කළේය.

### මෙහෙයුම් අවදානම

COVID-19 ව්‍යාප්තිය නිසා කිසි දිනෙක සිදු නොවූ පරිදි සමාගමේ කටයුතු කෙරෙහි සහ සේවකයන්ගේ කාර්යයන් වෙනුවෙන් බාධා ඇති වී තිබේ. වසංගතය හේතුවෙන් සමහර සේවකයින් දුරස්ථව වැඩ කිරීම අවශ්‍ය වන බැවින් සමහර ශාඛා තාවකාලිකව වසා දැමීමට සිදු විය. දුරස්ථව සේවා ඉටු කරන සේවකයින් සඳහා අවශ්‍ය වන පහසුකම් මිලදී ගැනීමේ අතිරේක මෙහෙයුම් පිරිවැය ද සමාලෝචනයට ලක් වන වසරේ ආදායමට බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. ලැප්ටොප්, සේවාදායක සහ ජාලකරණ උපකරණ සඳහා ඇණවුම් ප්‍රමාද වීම ද සේවක ඵලදායිතාව කෙරෙහි තවදුරටත් බලපෑම් කළ හැකි අතර එහි බලපෑම ද සමාගමට එල්ල වනු ඇත. COVID-19 ආරම්භයේ සිට ලොව පුරා මෘදුකාංග සහ අන්තර්ජාලය ඔස්සේ වෛරස සහ වංචා සිදුවීම් ඉහළ ගොස් තිබේ. නිවසේ සිට වැඩකිරීම තුළ සපයන ලද දුරස්ථ පිවිසුම් ආශ්‍රිත සයිබර් ආරක්ෂණ අවදානම ෆයර්වෝල් ඔස්සේ වීපීඑන් පිවිසුම, වීපීඑන් ප්‍රතිපත්තිය සහ පිවිසුම් පාලනයන් මගින් අවම කරන ලදී,

### 56.2 ණය අවදානම

ණය අවදානම යනු සමාගමේ ගනුදෙනුකරුවන් හෝ සගයන් ගිවිසුම්ගත බැඳීම් පැහැර හැරීම නිසා සමාගමට පාඩු සිදු වීමේ අවදානම යි. සමාගම විසින් කේවල ප්‍රතිපාර්ශවයන් සහ කණ්ඩායම් සඳහා අවදානම් ප්‍රමාණය කෙරෙහි සීමා පැනවීම සහ එවැනි සීමාවන් හෙළිදරව් කිරීම අධීක්ෂණය කර ණය අවදානම කළමනාකරණය කර පාලනය කරයි.

### ණය අවදානම -මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය හානි අනුව හානයන් හඳුනා ගැනීම

දේශීය වශයෙන්, කොවිඩ් -19 ව්‍යාප්තිය බොහෝ සමාගම් වලට සෘණාත්මක ලෙස බලපානු ඇත. ප්‍රධාන වශයෙන් නිෂ්පාදන සැපයුම් දාමයන්, ගෘහස්ත පරිභෝජනය, සංචාරක කර්මාන්තය සහ අපනයනවල ඇති විය හැකි බාධා හේතුවෙන් ඉපැයීම් අපේක්ෂාවන් පහත වැටීමේ අවදානම වී තිබේ. අක්‍රීය ණයවල වැඩිවීමට තුඩු දෙන ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට සමාගම් සතු හැකියාව කෙරෙහි මෙය අහිතකර ලෙස බලපෑවේය.

